## බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 44

සූත්‍රාන්ත පිටකයෙහි

35 වන ග්‍රන්ථය

# පෙටකොපදෙසො

ලංකා බෞද්ධ මණ්ඩලයේ ආරාධනයෙන්

මොල්ලිගොඩ ප්‍රවචනොදය පරිවෙණාධිපති

**රාජකීය පණ්ඩිත ලබුගම ලංකානන්ද**

මහානායක ස්ථවිරයන් වහන්සේ විසින් කරනලද

පාඨශොධන පූර්වක සිංහල අනුවාදය

**ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය**

විසින් සම්මතයි.

බු. ව. 2557

ක්‍රි. ව. 2013

Buddha Jayanti Tripitaka Series, Volume 44

The Thirty-fifth Book in the

**Suttanta-Pitaka**

**Khuddaka-Nikāya (19)**

**35**

# PETAKOPADESO

With the Sinhala translation & edition

by

**The Venerable Pandita Labugama Lankānanda Mahānāyaka Thero**

Principal of Pravacanodaya Pirivena, Molligoda, Wadduwa

**Published by**

**Dharma Chakkra Child Foundation**

Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka

Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /

**Co-published, printed and donated by**

**The Corporate Body of the Buddha Educational Foundation**

11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.

Tel: +886 2 23951198, Fax: +886 2 23913415

Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/

**B.E. 2557**

**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. ධම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කූඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රු මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතව කෙරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්දකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගීති, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපීතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමඟ කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

*තෙරුවන් සරණයි.*


**බෝදාගම චන්දිම නායක ස්ථවිර**

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
විදාගම,
බණ්ඩාරගම.


- 2557 / 2013 -

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ

බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක
වි.ජ.මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි
තායිවානයේ ප්‍රධාන සංඝනායක

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි

## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මගින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදි.

**මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉත සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.**

- පූජ්‍ය අත්තුඩාවේ ඤාණානන්ද නාහිමි
- පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි
- දර්ශනපති පූජ්‍ය කරගහඋල්පත සුගතනන්ද හිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- පූජ්‍ය බබරැන්දේ ධම්මසිරි හිමි
- පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- මිලිනා සුමතිපාල මැතිණිය
- ජගත් සුමතිපාල මැතිතුමා
- ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර මහත්මා
- දොස්තර අරුණ රබෙල් මහත්මා
- සුජිත් මොහොට්ටි මහත්මා
- රංජිත් අමරසිංහ මහත්මා
- ගාමිණී කාරියවසම් මහත්මා
- අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- සිරිසේන හේරත් මැතිතුමා
- විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහලවේවායි ප්‍රාර්ථනා කරමු.*

සුත්තන්තපිටකෙ

# පෙටකොපදෙසො

සූත්‍රාන්තපිටකයෙහි

# පෙටකොපදෙශ

'' තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති, නො පටිච්ඡන්නො. ''

'' මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි, වැසුණේ නො මැ බබළයි, ''

(අඞ්ගුත්තරනිකාය තිකනිපාත භරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

# පටුන

## CONTENTS


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය | | ... | ... | .. | ... | xxi |
| සංඥපනය | ... | ... | ... | ... | ... | xxiii |
| පාළි හෝඩිය | ... | ... | ... | ... | ... | xxxiii |
| සංකේත නිරූපනය | ... | ... | ... | ... | ... | xxxiv |
| විසය සූචි | ... | ... | ... | ... | | .xxxv-xxxvi |
| පෙටකොපදෙස පෙළ හා සිංහල පරිවර්තනය | | | ... | ... | ... | 2 – 331 |
| ගාථාදිපාදනුක්කමණිකා | | ... | ... | ... | ... | 333–342 |
| සද්දනාමානුක්කමණිකා | | ... | ... | .. | ... | 343– |
| විසෙසපදනුක්කමණිකා | | ... | ... | ... | ... | 344–354 |

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක :**

අග්ගමහාපණ්ඩිත බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ

**සභාපති හා ප්‍රධාන සම්පාදක :**

මොල්ලිගොඩ ප්‍රවචනොදය පිරිවෙන් විහාරාධිපති ශ්‍රී මහා විහාරවංශාලඞ්කාර විමලකීර්ති ශ්‍රී ත්‍රිපිටකවාගීශ්වර, සාහිත්‍ය චක්‍රවර්ති ප්‍රවචන විශාරද රාජකීය පණ්ඩිත ලබුගම ශ්‍රී ලඞ්කානන්ද – කෝට්ටෙ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සඞ්ඝසභායෙහි මහානායක ස්ථවිරයන් වහන්සේ

**සම්පාදක :**

කොළඹ මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනෙහි ආචාර්ය, රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, බෙල්ලන ඤාණවිමල නායක ස්ථවිරයන් වහන්සේ

කොළඹ මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනෙහි උප ප්‍රධානාචාර්ය, රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, හැගොඩ ඛෙමානන්ද – බස්නාහිර පළාතේ ප්‍රධාන අධිකරණ සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ

මොරටුව – එගොඩඋයන (දකුණ) ශ්‍රී ජිනෙන්ද්‍රචෛත්‍යාරාමාධිපති, රාජකීය පණ්ඩිත නරමානේ බුද්ධරක්ඛිත ස්ථවිරයන් වහන්සේ

**ලේකම් :**

කොළඹ බෞද්ධාලොක මාවතෙහි බෞද්ධාලොක විහාරාධිපති, පණ්ඩිත දෙරගමුවේ සිරි ධම්මපාල – කොළඹ දිසාවෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ

## පෙටකොපදෙස

# සංඥාපනය

පෙටකොපදෙස සංශෝධනය සඳහා මා මෙහෙයන ලද්දහු මොල්ලිගොඩ ප්‍රවචනොදය පරිවෙණාධිපති වැ වැඩවිසූ එල්ලාවල සිරි සංකිච්චාභිධාන නායක මාහිමියන් වහන්සේ යි. 1940 පමණ කාලයෙහි නායක මාහිමියන් වහන්සේ විසින් පෙටකොපදෙසය ශුද්ධ කොට මුද්‍රණය කරවන ලෙස විධාන කරමින් බුරුම අක්ෂරයෙන් මුද්‍රණය කළ පැරණි පොතක් ද සපයා දෙන ලද්දේ යැ. ඒ නියමය භාරගත් මා විසින් එවක පිරිවෙනේ උසස් පන්තියෙකැ ඉගෙනීම ලබමින් සිටි මහියඞගණ ප්‍රදේශයෙහි — බරවර්දනඔය — වීගොල් ලේ විහාරාධිපති උඩිස්පත්තුවේ — සොමරතන නායක ස්ථවිරයනුද්‍ර සහායකොටගෙනැ බුරුමපොත සිංහල අක්ෂරයෙන් පිටපත් කොට ශෝධනය ආරම්භ කරන ලද්දේ යැ. මේ සඳහා අපට හමුවූයේ, 1909 වර්ෂයෙහි බුරුමරට හංසාවතී නගරයෙහි දී මුද්‍රණය කරවන ලද දෙෂගහණයෙන් දූෂිත වැ — හැම තැන්හි ව්‍යාකුල වැ — තුබූ ග්‍රන්ථය පමණෙකි.

අනතුරු වැ සිංහල අක්ෂරයෙන් ලියැවුණු පෙටකොපදෙසයක් ඇද්දැයි සෙවීමට මහත් පරිශ්‍රමයෙක යෙදුනෙමි. පෙටකොපදෙසය කුද්දගත්සඟියේ අවසානයෙහි තිබියැ යුතු ග්‍රන්ථයක් හෙයින් පැරණි පුස්තකාලය බොහෝ ගණනෙකැ කුද්දගත්සඟි විමසා බලන ලද්දේ යැ. අපට සමුවූ කුද්දගත්සඟි වැඩිගණනක් මැ චරියාපිටකයෙන් අවසාන වැ තුබූ අතර ඇතැම් කුද්දගත්සඟියෙකැ අවසානයෙහි නෙත්තිප්පකරණය හා "අනාගත බුද්ධවංස" නම් නිබන්ධය ද දක්නට ලැබිණ. එහෙත් අපට හමු වූ කිසිදු කුද්දගත්සඟියෙකැ පෙටකොපදෙසය දක්නට නොලැබිණ. එහෙයින් මහාවිහාරිය ආචාර්‍යවරයන් විසින් පෙටකොපදෙසය ත්‍රිපිට ග්‍රන්ථයන් අතුරෙහි ලා නොගිණුබව ද නෙත්තිප්පකරණය මෙන් ගුරුත්වයෙන් සලකා නැති බව ද නිගමනය කරන්නට සිදුවිය.

පසුවැ කිහිපතැනෙකැ — සිංහල අක්ෂරයෙන් ලියැවුණු පෙටකොපදෙසයක් ඇතැයි සැලවූයෙන්, පානදුරේ වලපොල — " සද්ධර්මොදය " පිරුවන් විහාරස්ථානයට අයත් පුස්තකාලයෙහි තුබූ නෙත්තිප්පකරණය හා පෙටකොපදෙසය එක්කොට ලියනලද පුස්කොලපොත ගෙනවුත් පරීක්ෂා කෙළෙමි. එය 1909 වැන්නෙහි බුරුමරට — හංසා වතියෙහි — මුද්‍රණය කළ පැරණි ග්‍රන්ථයෙන් පිටපත් කරන ලද්දෙක් විය. පිටුවක් පාසා ව්‍යාකුල වැ ගිය දෙෂජාල ගහන වූ ඒ ග්‍රන්ථයෙන් පෙටකොපදෙස ශොධනයට කිසිදු පිටුවහලක් නොවී යැ.

රෝමන් අක්ෂරයෙන් මුද්‍රණය කළ පෙටකෝපදේසයෙක් ඇත. එය අරබින්ද බරුවා (පී.එච්.ඩී.) මහතා විසින් 1949 වර්ෂයෙහි සංස්කරණය කරන ලදුවැ ලන්ඩන් නුවර පාලි පොත් සමාගම මගින් කොළඹ — ලේක්හවුස් ආයතනයෙහි ' ලංකා ඩේලිනිවුස් ' මුද්‍රණාලයේ මුද්‍රණය කරවන ලද්දේ යැ. ඒ මහතා කියන පරිදි ඔහුගේ සංස්කරණයට බුරුම අත්පිටපත් තුනක් හා සිංහල අක්ෂරයෙන් ලියැවුණු අත්පිටපතක් ද හමුවී ඇත. සිංහල අත්පිටපත අප මුලදී සඳහන් කළ — හංසාවතියෙහි මුද්‍රිත — පොතෙන් පිටපත් කරන ලද්දක් වියැයුතු යැ. ඊට වඩා පැරණි සිංහල පිටපතක් දිවයිනෙහි සුලභ නොවන හෙයිනි.

තමහට හමුවූ බුරුම හා සිංහල පිටපත් ඉතා ව්‍යාකූල බව ද පෙටකයෙහි උද්ධෘත පාඨවල මුල් පොත් ද සම්පූර්ණයෙන් සොයාගැනීමට නොහැකි වූ බව ද එහෙයින් මේ පොත ශුද්ධ කිරීමේ වැයම අතහැර හැකි පමණින් සකසා මුද්‍රණය කරවූ බව ද හේ කියයි. මේ සැකැසීමේදී පෙටකොපදෙසයේ මුල් ස්වරූපය ද — එක්තරා ප්‍රමාණයෙකින් හෝ — ' වෙනස් වූයේයැ ' යි නොකියැ හැකි ද ?

බුරුමරට — ඡට්ඨසඞගීතිකාරකයන් විසිනුදු " දෙදහස්පන්සියවැනි — බුද්ධජයන්තිය " අනුස්මරණය සඳහා සිදුකළ ත්‍රිපිටක ශොධනයෙහි ලා " පෙටක — ශොධනය " ගැන උත්සුක වූ බවක් ද නොපෙනේ. ඒ තෙරවරුන් විසින් අරබින්ද බරුවා මහතාගේ සංස්කරණය මැ බුරුම අක්ෂරයෙන් මුද්‍රණය කරවා ඇතිබව කියැයුතු යැ. ව්‍යාකූලවැ ගිය වාක්‍යප්‍රදේශ හා උද්ධෘත " දේශනාපාලියෙහි " පවා ශොධනයට නොපැමිණිතැන් ද පොත් දෙකෙහි මැ සමාන වැ එන හෙයිනි. එහෙත් කිසි තැනෙකැ ශුද්ධ කර ඇති බව ද කියැයුතු යැ.

(i) පදට්ඨානං ච ලක්ඛණං P. T. S. — පදට්ඨානො ච ලක්ඛණො ම. ජ. සං.

(ii) පරිදසො P. T. S. — පරිළාහො ම. ජ. සං.

(iii) අතියාතා P. T. S. — අභියාතා ම. ජ. සං.

මේ එබඳු තැන් කිහිපයෙකි.

**පෙටකොපදෙස ශබ්දාර්ථ**

සම්බුද්ධභාෂිත වූ පයණිප්තියට භාජන වූයෙන් ' ධර්මා'භිධර්ම විනය ' — " පිටක යැ " යි ව්‍යවහාර කරනු ලැබේ. පිටකයන්ගේ සංවර්ණනාව " පෙටකයැ " යි ද, පිටක සංවර්ණනාවට දක්වන උපදේශය " පෙටකොපදෙස නමැ " යි ද කියනු ලැබේ. තත් ප්‍රකාශක ග්‍රන්ථය ද උපචාර විසින් " පෙටකොපදෙස " නම් වී යැ.

**පෙටකොපදෙස කතුවරයාගේ අභිමතාර්ථය ?**

පෙටකොපදෙසය නෙත්තිප්‍රකරණයට අනුව මැ සකස් වූ ග්‍රන්ථයෙකි. එහෙත් නෙත්තිප්‍රකරණය විස්තර නොකළ ධර්ම කරුණු පිළිබඳ (වැඩි) විස්තර ඉදිරිපත් කිරීමට කතුවරයාණෝ විශේෂ අවධානය යොමුකරති.

1. ග්‍රන්ථය ආරම්භවනුයේ ද ධම්මචක්කප්පවත්තන සූත්‍රාන්ත දේශනාවට විශේෂ විස්තර සපයමිනි. මෙහිදී — නවඞ්ගසත්ථු සාසනයත් බුද්ධත්වයේ පටන් සම්බුද්ධ පරිනිර්වාණය තෙක් ම — දේශිත හැම බුද්ධ වචනයනුත් එහි අන්තර්ගතවන අයුරු පළමුවෙන් ම පැහැදිලි කරති.

2. නෙත්තිප්‍රකරණයෙහි අවසන්හි දක්වෙන — සාසනපට්ඨානය වනාහී (1) සංකි ලෙසභාගිය සූත්‍ර යැ (2) වාසනාභාගිය සූත්‍ර යැ — ආදී " සූත්‍ර ධර්මවර්ග " දහසයක් (16) පිළිබඳවැ කෙරෙන විවරණයෙකි. පෙටකොපදෙස කතුවරයාණෝ " සාසනපට්ඨානය " ද්විතීය භූමිය වශයෙන් ගනිමින් " සූත්‍ර ධර්ම වර්ග " එකුන් පණසක් (49) පිළිබඳවැ විස්තර ඉදිරිපත් කරති.

3. (අ) තුදුස් (14) අධිෂ්ඨානයන් පිළිබඳ විස්තර දක්වෙන තෘතීය (සුත්තාධිට්ඨාන) භූමිය.

(ආ) සූත්‍රා'ර්ථ විවරණය පිළිබඳ උපදෙස් දක්වෙන " සුත්තවිචය " නම් වූ චතුර්ථ භූමිය.

(ඉ) " සුත්තත්ථ සමුච්චය " නම් වූ ෂෂ්ඨ භූමිය.

(ඊ) සත්තම භූමියෙහි එන " ප්‍රකීර්ණක ධර්ම " විස්තරය හා එහි මැ හමුවන —

(උ) ධ්‍යාන — භාවනා පිළිබඳ විශේෂ විස්තර කථාදිය — ද

පේටකොපදේසයට " විශේෂ වූ අංගයන් " වශයෙන් දක්විය යුතු යැ.

මේ අනුවැ පේටකෝපදෙසය ලියන ලද්දේ නෙත්තිප්‍රකරණයෙහි නො එන " ධර්ම — විස්තර " ඉදිරිපත් කරනු සඳහා යැ'යි කරනු ලබන නිගමනය ද සනාථ වෙයි.

**ගත්කතුවරයාණෝ**

නෙත්තිප්‍රකරණ ග්‍රන්ථාවසානයෙහි පැනෙන " එත්තාවතා සමත්තා නෙත්ති, යා ආයස්මතා මහා කච්චායනෙන භාසිතා, භගවතා අනුමොදිතා —" යන පාඨයෙනුදු නෙත්තිසඞ්ගාහක තෙරුන් විසින් තබනලදැයි සැලකෙන (සඞ්ගහවාරයෙහි—), " මහා කච්චානෙන නිද්දිට්ඨා," (හාරවිභඞ්ග වාරයෙහි) " තෙනාහ ආයස්මා මහා කච්චා නො —" ආදී පාඨයන්ගෙනුදු මෙම කෘතිය මහා කච්චායන මහ රහතුන් වහන්සේ විසින් දේශිතබව පැහැදිලි වේ. නෙත්ති — අටුවාහිදු එය මැ සනාථ කෙරෙයි. වැලිත් ඔබ වනාහී ගෞතම බුදුරදුන්ගේ මහා ශ්‍රාවකවරුන් අතරෙ — සංක්ෂිප්ත දේශනාවන් අර්ථ-ව්‍යඤ්ජන විසින් සපුරා විභාග කිරීමෙහි සමර්ථයනට අග්‍රස්ථානලද (එතදග්ග පාළියට අනුවැ) දසවැනි තැනට නම සඳහන්වන මහරහතුන් වහන්සේත් වෙති.

' පේටකෝපදෙශය ' ද " මහා කච්චායන " නම් වූ මහ තෙරකෙනෙකුන්ගේ මැ කෘතියෙකි. ඒබව පෙටකොපදෙශයෙහි මැ—

" පෙටකොපදෙසෙ මහා කච්චායනෙන භාසිතෙ
අරියසච්චප්පකාසනා නාම පඨම භූමි සමත්තා

(30 වැනි පිටුව)

තවද එහි මැ — පඤ්චම හා අට්ඨම භූමිවලැ —

" සුවීරස්ස මහා කච්චායනස්ස ජම්බුවනවාසිනො
පෙටකොපදෙසෙ හාරවිභඞ්ගො නාම පඤ්චම භූමි සමත්තා — "

ආදී වශයෙන් දක්වේ. (144 වැනි පිටුව)

මෙහි එන " ජම්බුවන-වාසය " පිළිබඳ වැ ථෙරවාද — සාහිත්‍ය කෘතිවලැ විස්තර නො පැනේ. නෙත්තිප්පකරණ කතුවරයාණන්සේ පිළිගනු ලබන මහා කච්චායන මහ රහතුන් වහන්සේ (දක්ෂිණා පථයෙහි—) අවන්තිදේශයේ බ්‍රාහ්මණ කුලපුත්‍රයාණ කෙනෙකි.

සම්බුද්ධපරිනිර්වාණයෙන් වසර 300කට පමණ පසුවැ රචිත කෘතියක් සේ සැලකෙන, සර්වාස්තිවාදීන්ගේ මහා අභිධර්ම ග්‍රන්ථය වශයෙන් ද පිළිගනු ලබන, " ඥානප්‍රස්ථානය " සම්පාදනය කළාහු ද " මහා කාත්‍යායනීපුත්‍ර " නම්වූ මහතෙර කෙනෙක් වෙති. මෙම පේටකොපදේශය ද ඔබගේ මැ කෘතියක් විය නොහැකිද ? යි කෙනෙක් විමසති.

කතුවරයාණන් කවුරුන්වුව ද මෙම ග්‍රන්ථදෙක අතර ඇත්තේ දැඩි සමතාවයෙකි. ග්‍රන්ථදෙක්හි මැ ප්‍රධාන වශයෙන් විස්තර කරනු ලබන්නේ එක මැ මාතෘකාවන් වේ.

(i) සොළසහාර
(ii) පඤ්ච නය හා
(iii) අට්ඨාරස මූලපද — ඒවායි.

(අ) සොළසහාරා නෙත්ති — පඤ්ච නය සාසනස්ස පරියෙට්ඨී
අට්ඨාරස මූලපදා — මහා කච්චානෙන නිද්දිට්ඨා

(නෙත්ති පු. 2 වන පිටුව)

සොළසහාරා නෙත්ති — පඤ්ච නයා සාසනස්ස පරියෙට්ඨී
අට්ඨාරස මූලපදා — කච්චායන ගොත්ත නිද්දිට්ඨා

(පෙටකොපදෙස — 4 වන පිටුව)

(ආ) ' හාර විභඞ්ග ' නම් වූ පඤ්චම භූමියෙහිදී — පෙටකොපදෙස කතුවරයා

(3) යුත්තිහාර
(4) පදට්ඨානහාර
(5) ලක්ඛණහාර හා
(7) ආවට්ටහාරයන් — විස්තර කරනු වස්

පළමුවැ දක්වනුයේත් නෙත්තිප්‍රකරණයෙහි — එම හාරයන් දැක්වීම සඳහා එළ වූ ගාථාවන් මැ වේ.

(6) චතුබ්‍යුහහාර හා
(10) වෙවචනහාර — දැක්වීමට ද නෙත්තිප්‍රකරණ ගාථාවන් මැ මද වශයෙන් වෙනස්කොටැ දක්වයි.

(ඉ) අට්ඨමභූමියෙහි උද්දාන ගාථාවන්හි (328 පිටුව) පළමුවැ එන ගාථා තුන මැ නෙත්තිප්‍රකරණයෙහි උද්දෙසවාරයෙහි එන (නෙත්ති පු. 6 වන පිටුව) ගාථාවන් මැ වේ.

එහිමැ අවසනැ දැක්වෙන ගාථා පහ (5) මැ නෙත්තිප්‍රකරණයෙහි — නිද්දෙසවාර යෙහි — (නෙත්ති පු. 10 පිටුව) දැක්වෙන ගාථාවන් මැ වෙයි. මේවාහි ඇත්තේ ඉතා සුළු වෙනස්කම් පමණෙකි.

මේ අනුවැ පෙටකොපදෙශය ආරම්භ වනුයේත් අවසන් වනුයේත් නෙත්තිප්‍රකරණය මැ ඇසුරු කරමින් බව මැනවින් පැහැදිලි වෙයි.

**එහෙත්, මෙ ද ' විමැසියැ යුතුයැ ' යි හඟිමුන :**

නෙත්තිප්‍රකරණය ආරම්භ වනුයේ—

යං ලොකො පූජයතෙ — ස ලොකපාලො සද නමස්සති ච
තස්සෙ'තං සාසනවරං — විදූහි ඤෙය්‍යං නරවරස්ස

යන නමස්කාර ගාථාවෙකිනි. ඒ ගෞතම ශාක්‍යමුනීන්ද්‍රයාණන් වහන්සේ මැ වෙති.

පෙටකොපදෙශය ආරම්භ කරනුයේ මෙසේයැ :

" නමො සම්මා සම්බුද්ධානං පරමත්ථදස්සීනං
සීලාදිගුණ පාරමිප්පත්තානං — " යනුවෙනි.

මෙහි නමස්කාරය බොහෝ බුදුවරුනට යැ.

තවද, මෙහි " දස වත්ථුකා කිලෙසා " – (268 පිටුව) පරම්පර පච්චය – සමනන්තර පච්චය (102 පිටුව) හා පරික්ඛාර හාරය (136 පිටුව) ආදී තැන්හි එන ධම්විස්තර පාළි ත්‍රිපිටකාගත ධම් හා සැසඳියැයුතු. මෙම කරුණු ද සලකමින් ගත්කතුවරයාණන් විමැසියැයුතු සේ හඟිම්හ.

### ග්‍රන්ථාගත කරුණු

පේටකොපදේශයෙහි භූමි (පරිච්ඡෙද) අටෙකි. මෙසේ යැ :

1. පඨමභූමි — අරියසච්චප්පකාසනා
2. දුතියභූමි — සාසනපට්ඨාන
3. තතියභූමි — සුත්තාධිට්ඨාන
4. චතුත්ථභූමි — සුත්තවිචය
5. පඤ්චමභූමි — හාරවිභඞ්ග
6. ඡට්ඨභූමි — සුත්තත්ථසමුච්චය
7. සත්තමභූමි — හාරසම්පාත
8. අට්ඨමභූමි — සුත්තවෙභඞ්ගිය යනුවෙනි.

### උද්දාන ගාථා

මෙහි භූමියෙකැ අවසන්හි — එහි අන්තර්ගත ධර්ම කරුණු හෝ දේශනා පාඨ හා ගාථාවන් හෝ උද්දාන ගාථා මගින් ද (නැවත) සංග්‍රහකොටැ දක්වා ඇත. (1) පඨම (2) දුතිය (3) තතිය (4) චතුත්ථ හා (8) අට්ඨම භූමිවලැ අගැ මෙබඳු ගාථාවන් පිළිවෙලින් 5 – 21 – 9 – 1 හා 8 බැගින් දක්වේ. එහෙත් ඇතැම් භූමියෙකැ මධ්‍යයෙහිදු මෙබඳු (උද්දාන) ගාථාවන් හමු වේ. දුතිය භූමිය (පෙටක — 56 පිටුව) එබඳු තැනෙකි.

මේ සියලු උද්දාන ගාථාවන් ධර්ම සංග්‍රාහක තෙරවරුන්ගේ නිබන්ධන වියහැක. එහෙත්, ඇතැම් භූමියෙකැ — එනම්, (5) පඤ්චම (6) ඡට්ඨ හා (7) සත්තම භූමිවලැ උද්දාන ගාථා නො පැනේ. ඒවා ගිලිහීගියා හෝ වියහැක. මෙසේ ගිලිහීගිය තැන් තවත් හමුවෙයි. 294 පිටුවෙහි එබඳු තැනෙක් හමුවෙයි. එසේමැ ආකුලවැ ගියතැන් ද වරෙක හමුවෙයි. 215 වැනි පිටුවෙහි එබඳු තැනෙක් ඇත. එමෙනි.

### විමැසිය යුතු ස්ථාන

(අ) සත්තම භූමියෙහි (පිටු 302—304) එන " සඞ්ගීති සුත්තවණ්ණනා පාඨය " කවර කරුණක් සඳහා දක්වන ලද්දෙද ? යි අපැහැදිලි යැ.

(ආ) නෙත්තිප්පකරණය මෙන් මැ පේටකොපදේසය ද සුත්‍රපිටකය මැ ගුරුකොටගත් බවක් පෙනේ. උභය ග්‍රන්ථයන්හි මැ එකසේ දක්වෙන අට්ඨාරස මූලපද අතරෙන් නමයක් (9) අකුසලයන් වේ. මෙසේය :

| | | |
|---|---|---|
| 1. තණ්හා | 4. දොසො | 7. සුඛසඤ්ඤා |
| 2. අවිජ්ජා | 5. මොහො | 8. නිච්චසඤ්ඤා |
| 3. ලොභො | 6. සුභසඤ්ඤා | 9. අත්තසඤ්ඤා |

යනුවෙනි.

ථෙරවාද – අභිධර්ම පිටකයෙහි දක්වෙන පරිදි කිලෙස (අකුසල) දසයෙකි. ධම්ම සඞගනිප්පකරණයෙහි (බු.ජ.මු. ධම්මසඞගනී 458 පිටුව) දක්වෙන පරිදි ඒවා මෙසේය :

| | | |
|---|---|---|
| 1. ලොභො | 4. මාන | 7. ථීන |
| 2. දොසො | 5. දිට්ඨි | 8. උද්ධච්ච |
| 3. මොහො | 6. විචිකිච්ඡා | 9. අහිරික භා |

10. අනොත්තප්ප යනුවෙනි.

ථෙරවාද – අභිධර්ම පිටකයට අනුවැ " තණ්හා " හා ' ලොභ ' යනු එක මැ චෛතසික යෙකැ නම් දෙකෙකි. මේ අනුවැ " අකුසල මූල පද " දක්වීමෙහිදී – සූත්‍ර පිටකය පමණක් මැ ගුරුකොටගත් සේ යැ.

(ඉ) තවද, නෙත්ති අටුවාවෙහි " වුත්තඤ්හෙතං පෙටකෙ – :" යි

යත්ථ ච සබ්බෙ හාරා – සම්පතමානා නයන්ති සුත්තත්ථං
බ්‍යඤ්ජනවිධිපුථුත්තා – සා භූමි ' හාරසම්පාතො – '

යන ගාථාව පෙටකයෙහි කියනලදැයි පවසයි. එහෙත් අප හමුයෙහි ඇති පෙටකොපදෙය යන්හි මේ ගාථාව දක්නට නැත.

(ඊ) එසේමැ ' සමාධි කාමච්ඡන්දස්ස, පටිපක්ඛො පීති බ්‍යාපාදස්ස, විතක්කො ථීන මිද්ධස්ස සුඛං උද්ධච්ච'කුක්කුච්චස්ස, විචාරො විචිකිච්ඡායාති පෙටකෙ වුත්තං – " යි

(i) විනයට්ඨකථා (91 වැනි පිටු) යෙහි ද
(ii) විසුද්ධිමග්ග (104 වැනි පිටු) යෙහි ද

දක්නට ඇත. එහෙත් අප හමුයෙහි ඇති පෙටකොපදෙසයෙහි එය දක්නට නැත.

(උ) ඛුද්දක නිකායට අයත් — ධම්මපදයෙහි — මුල් ම ගාථාව මනොපුබ්බඞ්ගමා ධම්මා — මනො සෙට්ඨා මනොමයා යනුවෙන් — හැමතැන්හි මැ — දැක් වේ. එහෙත්, පෙටකොපදෙසයෙහි මෙය දැක්වෙනුයේ මෙසේ යැ :

මනො පුබ්බඞ්ගමා ධම්මා – මනො සෙට්ඨා මනො ජවා යනුවෙනි.

(ඌ) සුත්තනිපාතයට අයත් – රතනසූත්‍රයෙහි – II වැනි ගාථායෙහි මුල්පද මෙසේ යැ:

කිඤ්චා'පි සො කම්මං කරොති පාපකං — යනුවෙනි මෙය පෙටකොපදෙසයෙහි එනුයේ මෙසේ යි :

කිඤ්චා'පි සෙඛො'පි කරෙය්‍ය පාපං

මෙබඳු තැන් – තවදුරටත් – විමැසියැ යුතු සේ හඟිම්හ.

## 1. පඨම භූමි

පේටකොපදේශයෙහි පළමුවැ එනුයේ, '' අරිය සච්චප්පකාසනා '' නම් වූ පඨමභූමිය යි. නෙත්තිප්‍රකරණයෙහි මෙන් සංග්‍රහවාරයෙක් හෝ උද්දෙස — නිද්දෙය හා පටිනිද්දෙයවාර හෝ මෙහි නොමැත.

(i) සොළසහාර

(ii) පඤ්චනය හා

(iii) අට්ඨාරස මූලපද

නාම මාත්‍රයෙන් දක්වා, අනතුරුවැ ගෞතම ශාක්‍ය මුනීන්ද්‍රයාණන් වහන්සේගේ මංගල ධර්මදේශනාය වන '' ධම්මචක්කප්පවත්තන සූත්‍රාන්ත දේශනය '' පසුබිම්කොටැ නවඞ්ගසත්ථුශාසනය මැ එහි බැස සිටුනා අයුරු පැහැදිලිකොට ඇත.

ධම්මචක්ක දේශනාන්තර්ගත චතුර්විධ ආර්‍ය සත්‍ය ධර්මයන් හා ආර්‍යමාර්ගාඞ්ගයන් වෙන් වශයෙන් විවිධ දේශනා පාඨ ගෙනහැර පාමින් විග්‍රහ කරනුයේ මෙයටඅනතුරුව යැ. ආර්‍යසත්‍ය ධර්ම විග්‍රහයට මැ වෙන් වූ ' පඨමභූමිය ' ද මෙතෙකින් සමාප්ත වේ.

## 2. දුතියභූමි

දෙ-වන භූමිය '' සාසන පට්ඨාන '' නම්. (1) සංකිලෙසභාගිය සූත්‍ර යැ (2) වාසනා භාගිය සූත්‍ර යැ — ඈ විසින් නගාගත් මාතෘකා පස් පණසකට (55) උදහරණ එලවමින් කරනු ලබන විස්තර කථා මෙහි දක්වේ.

එහෙත්, අවසන්හි දක්වෙන (50) සකවචනාධිට්ඨානයැ (51) පරවචනාධිට්ඨානයැ (52) සකවචනාධිට්ඨාන හා පරවචනාධිට්ඨාන යැ (53) කිරිය යැ (54) ඵල යැ (55) කිරිය හා ඵලය යැ යන මේ සය (6) නිදසුන් දක්වීමෙන් පටික්ඛිත්ත යැ.

## 3. තතියභූමි

'' සුත්තාධිට්ඨාන '' තෘතීය භූමිය වේ.

(1) ලොභ

(2) දොස හා

(3) මොහ යන — අකුසල චෛතසිකයන් හා

(4) අලොභ

(5) අදොස හා

(6) අමොහ — යන කුසල චෛතසිකයන් ද

(7) කාය

(8) වාචා හා

(9) මනො — යන ද්වාර ත්‍රය ද එයේමැ

(10) සද්ධා

(11) සති

(12) විරිය

(13) සමාධි හා

(14) ප්‍රඥා — යන පඤ්ච විධ වූ ඉන්ද්‍රිය ධර්මයන් පිළිබඳව ද විස්තර කථා මෙහි දක්වේ. සූත්‍රපිටකාගත දේශනා පාඨ හා ගාථා ධර්ම නිදසුන් වශයෙන් ගෙනහැර පාමින් මෙසේ තුදුස් අධිට්ඨානයන් විග්‍රහ කරනුයෙන් මෙම භූමිය ද '' සුත්තාධිට්ඨාන '' නම් වී යැ.

## 4. චතුත්ථභූමි

තථාගත ධර්මය මැනවින් විවරණයකොටැ — විභජනයකොටැ — පිරික්සා බැලියැ යුතු පිළිවෙළ පහදනු ලබනුයෙන් චතුත්ථ භූමිය '' සුත්තවිචය '' නම් වී යැ. වැලිදු අකුසල ධර්මයන්ගේ ප්‍රහානය මෙන් මැ කුසල ධර්මයන්ගේ වර්ධනය සිදුවන පිළිවෙලත් මේ සඳහා සූත්‍ර ධර්ම (බුදු දහම) හදළ යුතු අයුරුත් දක්වමින් සතර මහා පදෙස පිළිබඳව ද කරනු ලබන විස්තර මෙහි දක්වේ. සූත්‍රපිටකාගත — ගොපාලකූපම සූත්‍ර යැ - මැදුම් සඟියැ දෙවධාවිතක්ක සූත්‍රයැ ආදී නිදසුන් එළවමින් බුදුරදුන්ගේ ධර්මය සෙස්සන් විසින් දක්වනවිටැ — එය සම්බුදු දහමට උචිත ද ? යි පිරික්සා බලමින් — සැසඳෙන අයුරු මැ (අනුඥතය මැ) ගතයුතු පිළිවෙල පැහැදිලි කරනු වස් ' සූත්‍ර සංකරය ' හා ' සූත්‍ර විචය ' ද මෙහි දක්වා ඇත.

## 5. පඤ්චම භූමි

'' හාරවිභඞ්ග '' නම් වූයේ පඤ්චම භූමිය යි. නෙත්තිප්‍රකරණයෙහි එන සොළොස් වැදෑරුම් වූ හාරයන් මැ — එම පිළිවෙලට මැ — මෙහි ද විස්තරකොට ඇත.

නෙත්තිප්‍රකරණ කතුවරයා පළමුවැ එක් එක් හාරය ( (2) නිද්දෙස වාරයෙහි — ) ගාථාවෙකින් හඳුන්වමින් යලි (3) පටිනිද්දෙස වාරයෙහි මැ නිදසුන් ද දක්වමින් පැහැදිලි කරයි. එහෙත් පෙටකොපදෙස කතුවරයා මෙම පිළිවෙත අනුගමනය කොට නැත.

මෙහි — හාරවිභඞ්ග වාරයෙහි මැ — පළමුවැ ගාථාවකින් හඳුන්වමින් එතැනදී මැ නිදසුන් ද දක්වමින් විස්තරය ද සපයයි. මෙහිදී—

(3) යුත්තිහාර යැ

(4) පදට්ඨානහාර යැ

(5) ලක්ඛණහාරය හා

(7) ආවට්ටහාරයන්ගේ විග්‍රහය සඳහා යොදගෙනැ ඇත්තේ, නෙත්තිප්‍රකරණය මේ සඳහා යොදගත් ගාථාවන් මැ වේ.

(1) දේශනාහාර යැ

(2) විචයහාර යැ හා

(16) සමාරොපනහාරය ද විග්‍රහකරනු වස් විශේෂ (වෙනස් වූ) ගාථා යොදගනියි.

(6) චතුබ්‍යුහ හාරය ද

(10) වෙවචන හාරය ද හඳුන්වනුයේ නෙත්තිප්‍රකරණාගත ගාථාව මැ මද වශයෙන් වෙනස්කොටැ දක්වමිනි. මේ අතර — සෙසු හාරයන් හැඳින්වීමට ගාථා යොදගෙන මැ නැත.

## 6. ඡට්ඨභූමි

' සුත්තත්ථ සමුච්චය ' නමින් එනුයේ පේටකොපදේශයෙහි ඡට්ඨභූමිය යි. මෙහිදී ධර්ම කරුණු සොළොසක් පිළිබඳව විස්තර එයි :

1. පඤ්චක්ඛන්ධා
2. අට්ඨාරස ධාතුයො

3. ද්වාදසායතනානි

4. චත්තාරි අරියසච්චානි

5. සත්තතිංස බොධිපක්ඛිකා ධම්මා

6. අවිජ්ජා

7. විපල්ලාසා

8. සමථො

9. විපස්සනා

10. අලොභො කුසල මූලං

11. අදොසො කුසල මූලං

12. අමොහො කුසල මූලං

13. චත්තාරි චක්කානි

14. එකාදස සීලමූලකා ධම්මා

15. චතස්සො අරියභූමියො හා

16. නව අනු පුබ්බසමාපත්තියො — යනු එම සොළොස් කරුණු වේ.

බුදුරදුන්ගේ ශාසනය තුන් පරිච්ඡේදකින් සංග්‍රහ වන බවත් ඒ (i) ස්කන්ධ (ii) ධාතු හා (iii) ආයතනයන්හි බවත් ආරම්භයෙහි මැ දක්වේ. අනතුරුවැ ඉහත සඳහන් මාතෘකා වනට අනුවැ — සූත්‍රධර්මානුසාරයෙන් එක් එක් කරුණු පැහැදිලි කොට ඇත. නව අනුපූර්වසමාපත්තීන් පිළිබඳ ක්‍රම කීපයෙකින් කරනු ලබන විග්‍රහයෙන් ' ඡට්ඨභූමිය ' සමාප්ත වේ.

**7. සත්තම භූමි**

මෙහි විශාලතම පරිච්ඡේදය '' හාරසම්පාතභූමිය '' යි. මෙහිදූ පළමුවැ එනුයේ ' සමථ හා විපස්සනා ' භාවනාවන් පිළිබඳ ප්‍රකීර්ණක විග්‍රහයෙකි. 186 පිටුව පටන් 308 වැනි පිටුව තෙක් මැ — '' හාරසම්පාතභූමිය '' වෙයි.

පළමුවැ '' කාමෙසු සත්තා — කාම සඞ්ග සත්තා —'' ආදී ගය නගා ගෙනැ සොළොස් හාරයනට අනුවැ එය විග්‍රහකොට ඇත. මෙසේ '' දදතො පුඤ්ඤං පවඩ්ඪති —'' යන ගාථා ධර්මයතෙක් සොළොස් විධ ධර්ම පාඨ සූත්‍රාන්ත දේශනයෙන් වෙන්කොට ගනිමින් එම ධර්ම පාඨකුලැ සොළොස් වැදෑරුම් හාරයන් බැස සිටුනා අයුරු පැහැදිලිකොට ඇත.

මෙහි එන මාතෘකා පාඨ මෙසේයි :

1. කාමෙසු සත්තා — කාම සඞ්ග සත්තා

2. මනොපුබ්බඞ්ගමා ධම්මා

3. මහානාම සක්කස්ස සුත්ත

4. උද්ධං අධො සබ්බධිවිප්පමුත්තො



2—ඒ 078576

5. සිලානි භන්තෙ, කිමත්ථියානි, කිමානිසංසානි ?

6. යස්ස සෙලූපමං චිත්තං

7. ඉන්ද්‍රියභාවනා සුත්ත

8. ජන්නමති වස්සති

9. තමො තමපරායන සුත්ත

10. න තං දළහං බන්ධනමාහු ධීරා

11. යං චෙතෙති — යං විකප්පෙති

12. අයං ලොකො සන්තාපජාතො

13. එවමෙතං යථාභූතං — සම්මප්පඤ්ඤාය පස්සතො

14. චත්තාරො පුග්ගලා අනුසොතගාමී

15. චත්තාරො ආනිසංසා සොතානුධතානං යාව දිට්ඨියා සුප්පටිවිද්ධානං

16. දදතො පුඤ්ඤං පවඩ්ඪති — මොහු එමැ ධර්මපාඨයෝ වෙති.

8. අට්ඨමභූමි

'සුත්තවෙභඞ්ගිය' නමින් එනුයේ අට්ඨමභූමිය යි. නයසමුට්ඨානය පළමුවෙන් ම දක්වේ :

(1) නන්දියාවට්ට

(2) තිපුක්ඛල

(3) සීහවික්කීළිත

(4) දිසාලොචන හා

(5) අඞ්කුස — යන පඤ්චවිධ වූ නය ක්‍රමයන් හඳුන්වාදෙමින් සූත්‍රධර්මයන්හි අන්තර්ගතවන ලීනාර්ථයන් පස් වැදෑරුම් වූ නය ක්‍රමානුසාරයෙන් නගාගන්නා පිළිවෙල නිදසුන් මගින් පැහැදිලි කොට ඇත. අනතුරුව අටළොස් මූලපදයන් පිළිබඳවැ නැවතත් කරනු ලබන විස්තරයෙන් පෙටකොපදෙශය සමාප්ත වේ.

උපකාරා'නුස්මෘති

"තථාගත ධර්මය" මැනවින් වටහාගනු පිණිස පරිශීලනය කළයුතු ග්‍රන්ථ අතරැ නෙත්තිප්‍රකරණයට මෙන් මැ පේටකොපදේසයට ද අති විශේෂස්ථානයක් හිමිවෙයි. විනයට්ඨ කථා — විසුද්ධිමග්ග ආදියෙහි පවා — මෙම පේටකොපදේසය ගැන සඳහන් වන හෙයිනි. එහෙත් පේටකොපදේසය (මෑත භාගයෙහි—) දීර්ඝ කාලයක් ම ලක්දිවැ — ධර්මධරයන් අතරැ භාවිත වූ බවක් නම් නො පැනේ.

පේටකොපදේසය සිය බසින් තබාලීමට වඩා අපට අතිශයින් ම ආයාසකර වූයේ, මෙහි පාඨ ශොධනය මැ යි. නොයෙක් වරැ නොයෙක් තැනැ අවියත් ලේඛකයන් විසින් කරන ලද කලුෂයෝ ද එසේමැ අල්පශ්‍රැත ශෝධකයන් හෙලා ලූ අප පාඨයෝ ද ග්‍රන්ථයෙහි බහුල මැ වූහ. මේ හැම දුෂ්කරතා මැඩැපියා ඉමහත් පරිශ්‍රමයක් දරා — නිදර්ශිත මූල පාඨයන් ද සොයා යමින්, හැකිතරම් දුරට — අපට අවකාශ ලද පරිද්දෙන් පාඨ ශොධනය හා අර්ථ ව්‍යාඛ්‍යානය ද නිමහම් කළම්හ.

මෙහි ශොධ්‍යපත්‍ර බැලීමාදී කාර්‍ය්‍යයන්හි දී ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ නියුතු — මොරටුව එගොඩඋයන (දකුණ) — ශ්‍රී ජිනෙන්ද්‍ර චෛත්‍යාරාම පුරාණ විහාරාධිපති, අපගේ ධර්මාන්තේවාසී වූ රාජකීය පණ්ඩිත, නරමානේ — බුද්ධරක්ඛිත ස්ථවිරයන් ගෙන් ලද සහාය විශේෂයෙන් ම සඳහන් කරම්හ.

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ පළකරවාලීමෙහි පූර්වනියෝජක වූ ලඞකා බෞද්ධ මණ්ඩලයට සමග්‍ර බෞද්ධ ලෝකයාගේ මැ ප්‍රශංසාව හිමිවියැ යුතු යැ. ත්‍රිපිටක මණ්ඩලයට අනුග්‍රාහක වූ ශ්‍රී ලඞකාද්වීපයෙහි පූර්ණ විධායක බලධාරී ශ්‍රීමත් ආර්. ප්‍රේමදස ජනාධිපති උතුමාණන්ට අපගේ ශුභාශිර්වාදය පිරිනමමින් ශ්‍රී ලඞකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගරු අධ්‍යාපන, සංස්කෘතික කටයුතු හා ප්‍රවෘත්ති අමාත්‍ය වි. ජ. මු. ලොකුබණ්ඩාර මැතිතුමාට ද, සංස්කෘතික කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ආර්. එම්. පී. බී. කවිරත්න මැතිතුමාණන් ඇතුළු අමාත්‍යාංශයේ නිලධාරි මහතුන්ට ද, රජයේ මුද්‍රණාලයාධිපතිතුමාට හා එහි ත්‍රිපිටක මුද්‍රණකාර්‍ය්‍යයෙහි නියුක්ත සේවක මණ්ඩලයට ද ඉෂ්ටාශංසනය කරම්හ.

තථාගත ධර්ම ප්‍රවර්තක කුශලයෙන් හැම දෙන සුබභාගී වෙත්වා! යි ආශංසනය කරම්හ.

ලබුගම ලඞකානන්ද මහානායක ස්ථවිර,
ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ ප්‍රධා නසම්පාදක.

1990 ජනවාරි 01 ද,
මොල්ලිගොඩ ප්‍රවචනොදය පිරුවන්
විහාරස්ථානයේ දී යැ.

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ a | ආ ā | ඉ i | ඊ ī | උ u | ඌ ū | එ ē | ඔ ō |

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං ṃ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො ko |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ gē | ගො gō |

### Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| කක kka | ඤඤ ñña | ත්‍ර tra | මඵ mpha |
| කඛ kkha | ණහ ṇha | ද්ද dda | මබ, ඹ mba |
| ක්‍ය kya | ඤච ñca | ද්ධ ddha | මභ mbha |
| ක්‍රි kri | ඤඡ ñcha | ද්‍ර dra | මම mma |
| ක්ව kva | ඤජ, ඦ ñja | ද්ව, දව dva | මහ mha |
| ඛ්‍ය khya | ඤඣ ñjha | ධව dhva | ය්‍ය yya |
| ඛව khva | ටට ṭṭa | නත nta | යහ yha |
| ගග gga | ටඨ, ට්ඨ ṭṭha | නථ ntha | ලල lla |
| ගඝ ggha | ඩඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞක ṅka | ඩඪ ḍḍha | නධ ndha | ලහ lha |
| ග්‍ර gra | ණණ ṇṇa | නන nna | වහ wha |
| ඞඛ ṅkha | ණට ṇṭa | නහ nha | සස ssa |
| ඞග ṅga | ණඨ ṇṭha | පප ppa | සම sma |
| ඞඝ ṅgha | ණ්ඩ, ඬ ṇḍa | පඵ ppha | සව sva |
| චච cca | ණහ ṇha | බබ bba | හම hma |
| චඡ ccha | තත tta | බභ bbha | වහ vha |
| ජජ jja | තථ ttha | බ්‍ර bra | ළහ ḷha |
| ජඣ jjha | ත්ව tva | මප mpa | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ා ā | ි i | ී ī | ු ු u | ූ ූ ū | ෙ e | ො ō |

# සඞ්කෙත නිරූපණය
# ABBREVIATIONS

| | | |
|---|---|---|
| අඞ්ගුත්තර නි. | — | අඞ්ගුත්තර නිකාය |
| ඉති· වු. | — | ඉතිවුත්තක |
| නෙත්ති | — | නෙත්තිප්පකරණ |
| ම.<br>ම. ඡ සං. | — | මරම්ම ඡට්ඨ සංගීතියා සොධිත<br>පෙටකොපදෙසො |
| සී. උ. පා. | — | උදාන පාළි :<br>(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව) |
| සු. නි.<br>සුත්ත නි. | — | සුත්ත නිපාත |
| P.T.S. | — | PĀLI TEXT SOCIETY |

## පෙටකොපදෙස – විසය සූචි


| | පිට්ඨඞ්කං |
|---|---|
| 1. පඨම භූමි – අරියසච්චප්පකාසන | 1 - 31 |
| 1. සොළස හාරා | 4 |
| 2. පඤ්ච නයා | 6 |
| 3. අට්ඨාරස මූලපදා | 6 |
| 4. දුක්ඛ අරියසච්ච | 10 |
| 5. දුක්ඛ සමුදයො | 14 |
| 6. දුක්ඛ නිරොධො | 14 |
| 7. මග්ගො | 14 |
| 8. චත්තාරි අරියසච්චානි | 16 |
| 9. අනුපාදිසෙසානිබ්බානධාතු | 16 |
| 2. දුතිය භූමි – සාසනපට්ඨාන | 32 - 79 |
| 3. තතිය භූමි – | 80 - 97 |
| 4. චතුත්ථ භූමි – | 98 - 105 |
| 1. සුත්තවිචයො | 98 |
| 5. පඤ්චම භූමි – හාර විභඞ්ග | 106 - 145 |
| 1. දෙසනා හාරො | 106 |
| 2. විචයො හාරො | 108 |
| 3. යුත්ති හාරො | 116 |
| 4. පදට්ඨානො හාරො | 116 |
| 5. ලක්ඛණො හාරො | 118 |
| 6. චතුබ්‍යූහො හාරො | 120 |
| 7. ආවත්තො හාරො | 122 |
| 8. විභත්ති හාරො | 126 |
| 9 පරිවත්තනො හාරො | 126 |
| 10. වෙවචනො හාරො | 126 |
| 11. පඤ්ඤත්ති හාරො | 128 |
| 12 ඔතරණො හාරො | 128 |
| 13. සොධනො හාරො | 132 |
| 14 අධිට්ඨානො හාරො | 134 |
| 15. පරික්ඛාරො හාරො | 136 |
| 16. සමාරොපනො හාරො | 142 |

පිට්ඨඞ්කං


**6. ඡට්ඨ භූමි - සුත්තත්ථසමුච්චය - — — 146 - 179**

1. පඤ්චක්ඛන්ධා — — — 146
2. අට්ඨාරස ධාතුයො — — — 146
3. ද්වාදසායතනානි — — — 148
4. චත්තාරි අරියසච්චානි — — 148
5. සත්තතිංස බොධිපක්ඛිකාධම්මා — — 148
6. අවිජ්ජා — — — 154
7. විපල්ලාසා — — — 154
8. සමථො — — — 158
9. විපස්සනා — — — 158
10. අලොභොකුසලමූලං — — 160
11. අදොසො කුසලමූලං — — 160
12 අමොහො කුසලමූලං — — 162
13. චත්තාරි චක්කානි — — — 166
14. එකාදස සීලමූලකාධම්මා — — 166
15. චතස්සො අරියභූමියො — — 166
16. නව අනුපුබ්බ සමාපත්තියො — — 174

**7. සත්තම භූමි - හාරසම්පාත — — 180 - 307**

1. පකිණ්ණක නිද්දෙසො — — 180
2. හාරසම්පාත භූමි — — — 186

**8. අට්ඨම භූමි - සුත්තවෙභඞ්ගිය — — 308 - 331**

1. නය සමුට්ඨානං — — — 308

# පෙටකොපදෙසො

# පෙටකොපදෙශ

3—ට 78576

# පෙටකොපදෙසො

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

## 1. පඨමභූමි

**නමො සම්මාසම්බුද්ධානං පරමත්ථදස්සිනං
සීලාදිගුණපාරමිප්පත්තානං**

1. ද්වෙ හෙතු ද්වෙ පච්චයා සාවකස්ස සම්මාදිට්ඨියා උප්පාදාය: පරතො ච ඝොසො සච්චානුසන්ධි, අජ්ඣත්තං ච යොනිසො මනසිකාරො.

2. තත්ථ කතමො පරතො ඝොසො: යා පරතො දෙසනා ඔවාදො අනුසාසනී සච්චකථා සච්චානුලොමො. චත්තාරි සච්චානි: දුක්ඛං සමුදයො නිරොධො මග්ගො. ඉමෙසං චතුන්නං සච්චානං යා දෙසනා සන්දස්සනා විවරණා විභජනා උත්තානීකිරියා පකාසනා. අයං වුච්චති සච්චානුලොමො ඝොසො'ති.

3 තත්ථ කතමො අජ්ඣත්තං යොනිසො මනසිකාරො: අජ්ඣත්තං යොනිසො මනසිකාරො නාම: යො යථා දෙසිතෙ ධම්මෙ බහිද්ධා ආරම්මණං අනභිනීහරිත්වා යොනිසො මනසිකාරො, අයං වුච්චති අජ්ඣත්තං යොනිසො මනසිකාරො. තං ආකාරං යොනිසො ද්වාරං විධි උපායො.

යථා පුරිසො සුක්ඛ කට්ඨෙ විගතස්නෙහෙ සුක්ඛාය උත්තරාරණියා ථලෙ අභිමත්ථමානං භබ්බා ජොතිස්ස අධිගමාය. තං කිස්ස හෙතු: යොනිසො අග්ගිස්ස අධිගමාය. එවමෙවං යො යමිදං දුක්ඛසමුදයනිරොධමග්ගානං අවිපරීතධම්මදෙසනං මනසිකරොති. අයං වුච්චති අජ්ඣත්තං යොනිසො මනසිකාරො.

4 යථා තිස්සො උපමායො[1] පුබ්බෙ අස්සුතා ච අස්සුතපුබ්බා ච පටිභන්ති. 'යො හි කොචි කාමෙසු අවීතරාගො'ති -පෙ- ද්වෙ උපමා අයොනිසො කාතබ්බා පච්ඡිමා යොනිසො වුත්තා.[2]

තත්ථ යො ච පරතො ඝොසො යො ච අජ්ඣත්තං යොනිසො මනසිකාරො ඉමෙ ද්වෙ පච්චයා, පරතො ඝොසෙන යා උප්පජ්ජති පඤ්ඤා අයං වුච්චති සුතමයී පඤ්ඤා. යා අජ්ඣත්තං යොනිසො මනසිකාරෙන උප්පජ්ජති පඤ්ඤා, අයං වුච්චති චින්තාමයී පඤ්ඤාති. ඉමා ද්වෙ පඤ්ඤා වෙදිතබ්බා, පුරිමකා ච ද්වෙ පච්චයා. ඉමෙ ද්වෙ හෙතු ද්වෙ පච්චයා සාවකස්ස සම්මාදිට්ඨියා උප්පාදාය.

---

1. උපමා - මජසං
2. පච්ඡිමාසු වුත්තං - මජසං.

# පෙටකොපදෙශ

භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට
නමස්කාර වේවා.

## ප්‍රථම භූමි

පරමාර්ථදර්ශී වූ ශීලාදි ගුණයන්හි පාරමීප්‍රාප්ත වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේට නමස්කාරවේවා.

1. ශ්‍රාවකයාගේ සම්‍යග්දෘෂ්ටිය ඉපදීම පිණිස හේතුහු දෙදෙනෙක් වෙති. ප්‍රත්‍යයෝ දෙදෙනෙක් වෙත් : චතුස්සත්‍ය සහිත වූ පරතොඝෝසය ද අධ්‍යාත්මයෙහි වූ යෝනිසො මනසිකාරය ද යන දෙක යි.

2. එහි පරතෝඝෝසය කවරෙ යත් : මෙරමාගේ වශයෙන් යම් දේශනායෙක් අවවාදයෙක් අනුශාසනායෙක් සත්‍යකථායෙක් සත්‍යානුලොම ධර්මයෙක් වේ ද එය යි. සත්‍යයෝ සතර දෙනෙකි : දුක යැ සමුදය යැ නිරොධ යැ මාර්ග යි. මේ සතර සත්‍ය යන්ගේ යම් දෙසුමෙක් සැපැදීමෙක් විස්තර කිරීමෙක් විභාග කිරීමෙක් ප්‍රකට කිරීමෙක් ප්‍රකාශ කිරීමෙක් වේ ද, මේ සත්‍යානුලොම වූ ඝෝෂ යයි කියනු ලැබේ යි.

3. එහි අධ්‍යාත්මයෙහි යෝනිසො මනසිකාරය කවරෙ යත් : අධ්‍යාත්මයෙහි යෝනිසො මනසිකාර නම් : යමෙක් දහම් දෙසන කල්හි බාහිර අරමුණු නො ගෙන නුවණින් මෙනෙහි කෙරේ ද මේ අධ්‍යාත්මයෙහි යෝනිසො මනසිකාර යි කියනු ලැබේ. යම් සේ පුරුෂයෙක් තෙත පහවැගිය වියළි කාෂ්ඨයෙක මතුයෙහි වියළි උත්තරාරණියකින් මදිනුයේ ගිනි ඉපැදවීමට සුදුසු වෙයි, කවර හෙයින යත් ගිනි ඉපැදවීමට කාරණ වන හෙයිනි. එපරිදි මැ හෙ දුක්ඛ–සමුදය–නිරොධ–මග්ගයන්ගේ අවිපරිත ධර්මදේශනාව මෙනෙහි කෙරෙයි. මේ අධ්‍යාත්මයෙහි යෝනිසො මනසිකාර' යි කියනු ලැබේ.

4. පෙර නො ඇසූ නො ඇසූවිරූ තුන් උපමා කෙනෙක් වටහති : ''කාමයන්හි අවීතරාග වූ යම් කිසිවෙක් ... එහි උපමා දෙකක් අයොනිසො මනසිකාරයෙනැයි කියැ යුතු ය. පශ්චිම උපමා ව යෝනිසො මනසිකාරය කියන ලදූ.

එහි යම් පරතෝඝෝසයෙකුත් අධ්‍යාත්මයෙහි යෝනිසො මනසිකාරයෙකුත් වේ ද, මේ දහම්හු දෙදෙන ප්‍රත්‍යය වෙති. පරතෝඝෝසයෙන් යම් ප්‍රඥාවක් උදප දී මේ සුතමයී පඤ්ඤා' යි කියනු ලැබේ. අධ්‍යාත්මයෙහි යෝනිසො මනසිකාරයෙන් යම් ප්‍රඥාවක් උපදී ද මේ චින්තාමයී පඤ්ඤා' යයි කියනු ලැබේ. මේ ප්‍රඥා දෙක දත යුතු යැ. පූර්ව වූ ප්‍රත්‍යය දෙක ද දතයුතු යි. මෙසේ ශ්‍රාවකයාගේ සම්මාදිට්ඨිය ඉපදීම පිණිස මේ හේතු දෙක ප්‍රත්‍යය දෙක වෙත්,

5. තත්ථ පරතො ඝොසස්ස සච්චානුසන්ධිස්ස දෙසිතස්ස අත්ථං අවිජානන්තො අත්ථපටිසංවෙදී[1] භවිස්සතීති නෙතං ඨානං විජ්ජති, න ච අත්ථපටිසංවෙදී[1] යොනිසො මනසිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති. පරතො ඝොසස්ස සච්චානුසන්ධිස්ස දෙසිතස්ස අත්ථං විජානන්තො අත්ථපටිසංවෙදී[1] භවිස්සතී'ති ඨානමෙතං විජ්ජති, අත්ථපටිසංවෙදී[1] ච යොනිසො මනසිකරිස්සතී'ති ඨානමෙතං විජ්ජති. එස හෙතු එතං ආරම්මණං එසො උපායො සාවකස්ස නිය්‍යානස්ස තත්ථෙකදද.

6. සො 'යං න ච සුත්තස්ස අත්ථවිජානනාය සහ සුතෙන, නාපි ඝොසානුයොගෙන. පරතො ඝොසස්ස අත්ථං අවිජානන්තෙන න සක්කා උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනං අධිගන්තුං, තස්මා නිබ්බසිතු කාමෙන සුත්තමයෙන අත්ථො පරියෙසිතබ්බො. තත්ථ පරියෙසනාය අයං ආනුපුබ්බී[2] භවති : සොළසහාරා, පඤ්ච නයා, අට්ඨාරස මූලපදානි.

තත්ථායං අනුගීති :[3]

(1) සොළස හාරා නෙත්ති – පඤ්ච නයා සාසනස්ස පරියෙට්ඨී
අට්ඨාරස මූලපදා – කච්චායනගොත්තනිද්දිට්ඨා.[4]

7. තත්ථ කතමෙ සොළස හාරා :

දෙසනා විචයො යුත්ති පදට්ඨානො[5] ලක්ඛණො[6] චතුබ්‍යූහො ආවට්ටො විභත්ති පරිවත්තනො වෙවචනො පඤ්ඤත්ති ඔතරණො සොධනො අධිට්ඨානො පරික්ඛාරො සමාරොපනො. ඉමෙ සොළස හාරා :

තත්ථායං අනුගීති :

2. දෙසනා විචයො යුත්ති – පදට්ඨානො ච ලක්ඛණො
චතුබ්‍යූහො ච ආවට්ටො – විභත්ති පරිවත්තනො,

3. වෙවචනො ච පඤ්ඤත්ති – ඔතරණො ච සොධනො
අධිට්ඨානො පරික්ඛාරො – සමාරොපනො සොළස.[7]

---

1 අත්ථප්පටිසංවෙදී - මජ්ඣං.
2. අනුපුබ්බී - මජ්ඣං, PTS..
3. උද්දානගාථා – මජ්ඣං, PTS..
4. මහාකච්චානෙන නිද්දිට්ඨා – නෙත්ති.
5. පදට්ඨානං – මජ්ඣං.
6. ලක්ඛණං – මජ්ඣං.
7. සොළසො – මජ්ඣං.

5. එහි පරතො ඝෝස වූ සත්‍යානුසන්ධි ඇති දේශිතයාගේ අර්ථය නො දන්නේ අත්ථපටිසංවෙදී (පෙළ අරුත් දන්නේ) වන්නේය යන තෙල කරුණ නො වේ. නො ද අත්ථපටිසංවෙදී වූයේ නුවණින් මෙනෙහිකරන්නේය යන තෙල කරුණ නො වේ. පරතො ඝෝස වූ සත්‍යානුසන්ධි ඇති දේශිතයාගේ අරුත් දන්නේ අත්ථපටිසංවෙදී වෙයි යන තෙල කරුණ ඇත. පෙළ අරුත් දන්නේ නුවණින් මෙනෙහි කරන්නේය යන තෙල කරුණ ඇත. ශ්‍රාවකයාගේ නියර්‍යාණය සඳහා තෙල හේතු යැ තෙල අරමුණ යැ තෙල උපාය වේ. අන් උපායෙක් නැති.

6. ඒ උපාය සූත්‍රයාගේ අරුත් දැනීම සමග නො ද යෙදුණේ යැ සොසානුයොගය සමග ද නො යෙදුණේ යැ. පරතො ඝෝසයාගේ අරුත් නො දන්නහු විසින් මිනිස් දහමින් මතුයෙහි ආර්‍ය භාවකරණයට සමර්ථ ඥනදර්ශනය ලබන්නට නො ද හැකි වෙයි. එහෙයින් කෙලෙසුන් නිවනු රිසි වූ ශ්‍රැතමයඥන ඇතියහු විසින් අර්ථ පර්‍යෙෂණ කළ යුතු ය. එහි පර්‍යෙෂණයට මේ අනුපිළිවෙළ වෙයි. සොළොස් හාරයෝ යැ, පඤ්ච නය යැ අටළොස් මූලපදයෝ යි.

එහි මේ අනුගීති යැ :

(1) නෙත්ති සංඛ්‍යාත අවිපරීත සූත්‍රාර්ථාවබොධයට කාරණ වූ දේසනාදි සොළොස් හාරයෝ යැ, පර්‍යාප්ති ශාසනයාගේ අර්ථ පර්‍යෙෂණ කරන නන්දියාවට්ටාදි පස් නය යැ, කුශලාකුශල විසින් භේද වූ අටළොස් මූලපදයෝ යැ යන මොහු කාත්‍යායන ගොත්‍ර ඇති මහතෙරුන් විසින් දක්වන ලද්දහු යැ.

7. එහි සොළොස් හාරයෝ කවරහ :

ආස්වාදදිය විභාග කිරීම ලක්ෂණ කොට ඇති 'දේශනා' හාර යැ, සූත්‍රයෙහි එන පද ප්‍රශ්නාදිය විමසීම ලක්ෂණ වූ 'විචය' හාර යැ, සූත්‍රාගත අර්ථ ව්‍යඤ්ජනයන්ගේ යුක්ති-අයුක්ති විචාරණ ලක්ෂණ වූ 'යුක්ති' හාර යැ, සූත්‍රාගත කුශලාකුශලාදි ධර්මයන්ගේ පදට්ඨාන (—ආසන්න කාරණ) නිශ්චය කිරීම ලක්ෂණ වූ 'පදට්ඨාන' හාර යැ, සමාන ලක්ෂණ ධර්මයන් නහා දක්වන 'ලක්ඛණ' හාර යැ, ව්‍යඤ්ජනද්වාරයෙන් නිර්වචනාදිය දැක්වීම ලක්ෂණ වූ 'චතුබ්‍යූහ' හාර යැ, සභාගවිෂභාග ධර්මයන් ආවර්තන ලක්ෂණ වූ 'ආවත්ත' හාර යැ, සංකිලෙස වොදන ධර්මයන් විභාගකිරීම ලක්ෂණ වූ 'විභත්ති' හාර යැ, කුශලාකුශල ධර්මයන්ට ප්‍රතිපක්ෂ වශයෙන් පරිවර්තන ලක්ෂණ වූ 'පරිවත්තන' හාර යැ, පර්‍යායශබ්ද දැක්වීම ලක්ෂණ කොට ඇති 'වෙවචන'හාර යැ, එක් ධර්මාර්ථයක් විවිධ ප්‍රඥප්තීන් විභාවනය ලක්ෂණ වූ 'පඤ්ඤත්ති' හාර යැ, ප්‍රතීත්‍ය සමුත්පාදදිද්වාරයෙන් සූත්‍රාර්ථයාගේ අවතරණ ලක්ෂණ වූ 'ඔතරණ' හාර යැ, සූත්‍රාගත පදපදර්ථාදීන්ගේ ශෝධනය ලක්ෂණ වූ 'සොධන' 'හාර යැ, සූත්‍රාගතධර්මයන්ගේ සාමාන්‍ය විශෙෂඥ නිර්ධාරණ ලක්ෂණ වූ 'අධිට්ඨාන' හාර යැ, ධර්මයන්ගේ හේතුප්‍රත්‍යය නිර්ධාරණ ලක්ෂණ 'පරික්ඛාර' හාර යැ, පදට්ඨානාදි මුඛයෙන් ධර්මයන්ගේ සමාරොපණ ලක්ෂණ වූ 'සමාරොපණ' හාර යැ යන මොහු සෝළස හාරයෝ යි :

ඒ හාරෝද්දෙසයෙහි සුඛග්‍රහණ පිණිස අනුගීති වෙයි :

2. දේසනා යැ විචය යැ යුක්ති යැ පදට්ඨාන යැ ලක්ඛණ යැ චතුබ්‍යූහ යැ ආවට්ට යැ විභත්ති යැ පරිවත්තන යැ–

3. වෙවචන යැ පඤ්ඤත්ති යැ ඔතරණ යැ සෝධන යැ අධිට්ඨාන යැ පරික්ඛාර යැ සමාරොපණ යැ යි සොළසහාර වෙත්.

තත්ථ කතමෙ පඤ්ච නයා: නන්දියාවට්ටො, තිපුක්ඛලො සීහවික්කීළිතො දිසාලොචනො අඞ්කුසො'ති

තත්‍රායං අනුගීති:

4. පඨමො නන්දියාවට්ටො – දුතියො ච තිපුක්ඛලො
සීහවික්කීළිතො නාම – තතියො හොති සො නයො,

5. දිසාලොචනමාහංසු – චතුත්ථො නය ලඤ්ජකො
පඤ්චමො අඞ්කුසො නාම – සබ්බෙ පඤ්ච නයා'ගතා

තත්ථ කතමානි අට්ඨාරස මූලපදානි: අවිජ්ජා තණ්හා ලොභො දොසො මොහො සුභසඤ්ඤා සුඛසඤ්ඤා නිච්චසඤ්ඤා අත්තසඤ්ඤා, සමථො විපස්සනා අලොභො අදොසො අමොහො අසුභසඤ්ඤා දුක්ඛසඤ්ඤා අනිච්චසඤ්ඤා අනත්තසඤ්ඤා ඉමානි අට්ඨාරස මූලපදානි. තත්ථ නව පදානි අකුසලානි, යත්ථ සබ්බං අකුසලං සමොසරති. නව පදානි කුසලානි, යත්ථ සබ්බං කුසලං සමොසරති.

කතමානි නව පදානි අකුසලානි යත්ථ සබ්බං අකුසලං සමොසරති: අවිජ්ජා – යාව අත්තසඤ්ඤා, ඉමානි නව පදානි අකුසලානි, යත්ථ සබ්බං අකුසලං සමොසරති. කතමානි නව පදානි කුසලානි, යත්ථ සබ්බං කුසලං සමොසරති: සමථො – යාව අනත්තසඤ්ඤා, ඉමානි නව පදානි කුසලානි, යත්ථ සබ්බං කුසලං සමොසරති. ඉමානි අට්ඨාරස මූලපදානි.

තත්‍රායං අනුගීති:

6 තණ්හා ච අවිජ්ජා'පි ච[1] – ලොභො දොසො තථෙව මොහො ච
චතුරො[2] ච විපල්ලාසා – කිලෙසභූමි නව පදානි.

7. සමථො ච විපස්සනා ච – කුසලානි ච යානි තීණි මූලානි
යෙ'පි ච සතිපට්ඨානා – ඉන්ද්‍රියභූමි නව පදානි,[3]

8. නවහි ච පදෙහි කුසලං[4] – නවහි ච යුජ්ජති අකුසලං සබ්බං
එතෙ නව මූලපදා – භවන්ති අට්ඨාරස පදානි.

ඉමෙසං අට්ඨාරසන්නං මූලපදානං යානි නවපදානි අකුසලානි, අයං දුක්ඛසමුදයො. යානි නවපදානි කුසලානි, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා. ඉති සමුදයස්ස දුක්ඛං ඵලං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය නිරොධං ඵලං. ඉමානි චත්තාරි අරියසච්චානි භගවතා බාරාණසියං දෙසිතානි.

---

1. අවිජ්ජා - ම.
2. චත්තාරො – ම.
3. අයංගාථා - මජ්ඣං, ව්‍යාකුලා දිස්සති.
4. සබ්බං කුසලං නවහි පදෙහි – ම.

එහි පඤ්ච නය කවරහ : (තෘෂ්ණා අවිද්‍යා දෙකින් සංකිලෙස පක්ෂයෙහි ද ශමථ විදර්ශනා දෙකින් වොදන පක්ෂයෙහි ද සූත්‍රාර්ථය සිව්සස් සමග යෙදීමෙන් වර්ණනා කරන) 'නන්දියාවට්ට' නය යැ' (අකුශලමූලයෙන් හා කුශලමූලයෙන් සංකිලෙස වොදන පක්ෂයෙහි සූත්‍රාර්ථ සිව්සස් සමග යොදන)–'තිපුක්ඛල'නය යැ, (විපයර්‍යාසයන්ගෙන් සංකිලෙස පක්ෂයෙහි ද ඉන්ද්‍රියයන්ගෙන් වොදන පක්ෂයෙහි ද සූත්‍රාර්ථ සිව්සස් සමග යොදන) 'සීහවික්කීළිත' නය යැ (අර්ථනයත්‍රයට දිශා භූත ධර්මයන් විමසන) ,, 'දිසාලොචන' නය යැ, (දිශාභූත කුශලාකුශලයන්ගේ සමානයන ලක්ෂණවූ)–අංකුස නය යැ යන මොහු යි.

මේ එහි අනුගීති යැ :

4. සූත්‍රාර්ථ ප්‍රකාශ කරන පළමුවැනි නන්දියාවට්ටනය ද දෙවැනි තිපුක්ඛල' නය ද තුන්වැනි 'සීහවික්කීළිත' නම් නය ද වෙයි.

5. සතරවැනි නය ලක්ෂණය 'දිසාලොචන' යයි කීහු, පස්වැන්න 'අංකුස' නම් වෙයි. සියල්ල පස් නය කෙනෙක් ආවාහු යි.

එහි අටළොස් මූලපදයෝ කවරහ : අවිජ්ජා යැ තණ්හා යැ ලොභ යැ දෙස යැ මොහ යැ සුභසඤ්ඤා යැ සුඛසඤ්ඤා යැ නිච්චසඤ්ඤා යැ අත්තසඤ්ඤා යැ සමථ යැ විපස්සනා යැ අලොභ යැ අදෙස යැ අමොහ යැ අසුභසඤ්ඤා යැ දුක්ඛසඤ්ඤා යැ අනිච්චසඤ්ඤා යැ අනත්තසඤ්ඤා යි.—මොහු අටළොස් මූලපදයෝ යි. එහි යම් තැනෙක සියලු අකුශලය බැසගෙන සිටී ද ඒ නවපදය අකුශල යැ, යම් තැනෙක සියලු කුශලය බැසගෙන සිටී ද ඒ නව පදය කුශල යි.

සියලු අකුශලය බැසගෙන සිටුනා අකුශල නව පදයෝ කවරහ : අවිජ්ජා ආදි කොට අත්තසඤ්ඤා තෙක් සියලු අකුශලය බැසගෙන සිටුනා මේ නවපදයෝ අකුශලයෝ යැ. සමථය ආදි කොට අනත්තසඤ්ඤා තෙක් සියලු කුශලය බැසගෙන සිටුනා මේ නවපදයෝ කුශලයෝ යි. මේ අටළොස් මූලපදයෝ යි.

එහි මේ අනුගීති යැ :

6. තෘෂ්ණාව ද අවිද්‍යාව ද ලෝභය ද ද්වෙෂය ද එසෙයින් මැ මොහය ද සතර විපයර්‍යාසයෝ ද යන නව පදයෝ ක්ලේශභූමි වෙති.

7. ශමථය ද විදර්ශනා ද තුන් කුශල මූලයෝ ද අශුභ සංඥදි සතර සතිපට්ඨානයෝ ද යන නව පදයෝ (ශ්‍රද්ධාදි විමුක්තිපරිපාචනීය ඉන්ද්‍රිය සමොසරණස්ථාන හෙයින්) ඉන්ද්‍රිය භූමි නම් වෙති.

8. සමථාදි නවපදයෙන් සියලු කුශලපක්ෂය ද තණ්හාදි නව පදයෙන් සියලු අකුශල පක්ෂය ද යෙදෙයි. තෙල නව මූලපදයෝ අටළොස් මූල පදයෝ වෙත්.

මේ අටළොස් මූලපදයන් අතුරෙන් අකුශල වූ යම් නව පද කෙනෙක් ඇද්ද මේ දුක්ඛ සමුදය යැ, කුශල වූ යම් නව පද කෙනෙක් ඇද්ද මේ දුක්ඛනිරොධගාමිනීපටිපද යැ, මෙසේ සමුදයයාගේ ඵලය 'දුක්ඛ' යැ, දුක්ඛනිරොධගාමිනීපටිපදවගේ ඵලය 'නිරොධ යි. මේ සතර ආර්‍යසත්‍යයෝ භගවත්හු විසින් බරණැස ඉසිපතන මුවළැව්හි දී දෙසන ලදහු.

තත්ථ දුක්ඛස්ස අරියසච්චස්ස අපරිමාණානි අක්ඛරානි පදානි බ්‍යඤ්ජනානි ආකාරානි නිරුත්තියො නිද්දෙසා දෙසිතා, එතස්සෙවත්ථස්ස සඞ්කාසනාය පකාසනාය විවරණාය විභජනාය උත්තානීකම්මාය පඤ්ඤපනායාති. යා එවං සබ්බෙසං සච්චානං. ඉති එකමෙකං සච්චං අපරිමාණෙහි අක්ඛරපදබ්‍යඤ්ජනආකාරනිරුත්තිනිද්දෙසෙහි පරියෙසිතබ්බං, තං ච අත්ථපුට්ඨෙන පන අත්ථො බ්‍යඤ්ජනපුට්ඨෙන බ්‍යඤ්ජනං.

යො හි කොචි සමණො වා බ්‍රාහ්මණො වා එවං වදෙය්‍ය: 'අහං ඉදං දුක්ඛං පච්චක්ඛාය අඤ්ඤං දුක්ඛං පඤ්ඤපෙස්සාමී'ති. තස්ස තං වාචාවත්ථුකමෙවස්ස, පුට්ඨො ච න සම්පායිස්සති, එවං සච්චානි.

යං ච රත්තිං භගවා අභිසම්බුද්ධො, යං ච රත්තිං අනුපාදාය පරිනිබ්බුතො, එත්ථන්තරෙ යං කිඤ්චි භගවතා භාසිතං සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං, සබ්බං තං ධම්මචක්කං පවත්තිතං න කිඤ්චි බුද්ධානං භගවන්තානං ධම්මදෙසනාය ධම්මචක්කතො බහිද්ධා, තස්ස සබ්බං සුත්තං අරියධම්මෙසු පරියෙසිතබ්බං. තත්ථ පරිගණ්හනාය[1] ආලොකසනාගානි[2] චත්තාරි ඨාවරානි ඉමානි.

තත්ථ කතමං දුක්ඛං: ජාති ජරා ව්‍යාධි[3] මරණං සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා.

තත්ථායං ලක්ඛණනිද්දෙසො: පාතුභාවලක්ඛණා ජාති, පරිපාකලක්ඛණා ජරා, දුක්ඛදුක්ඛතාලක්ඛණො ව්‍යාධි, චුතිලක්ඛණං මරණං, පියවිප්පයොගවිපරිණාමපරිතාපනලක්ඛණො සොකො, ලාලප්පනලක්ඛණො පරිදෙවො, කායසම්පීළනලක්ඛණං දුක්ඛං, චිත්තසම්පීළනලක්ඛණං දොමනස්සං, චිත්තපරිදහනලක්ඛණො[4] උපායාසො, අමනාපසමොධානලක්ඛණො අප්පියසම්පයොගො, මනාපවිනාභාවලක්ඛණො පියවිප්පයොගො, අධිප්පායවිච්ඡින්නලක්ඛණො අලාභො, අපරිඤ්ඤාලක්ඛණා පඤ්චුපාදානක්ඛන්ධා, පරිපාකචුතිලක්ඛණං ජරාමරණං, චුතිපාතුභාවලක්ඛණා චුතූපපත්ති,[5] පටිසන්ධිබන්ධනලක්ඛණො සමුදයො, සමුදයපරිජහනලක්ඛණො නිරොධො, අනුසයසමුච්ඡෙදලක්ඛණො මග්ගො, බ්‍යාධිලක්ඛණං දුක්ඛං, සඤ්ජනනලක්ඛණො[6] සමුදයො, නිය්‍යානිකලක්ඛණො මග්ගො, සන්තිලක්ඛණො නිරොධො, අපටිසන්ධිභාවනිරොධලක්ඛණා අනුපාදිසෙසා නිබ්බානධාතු.

---

1. පරිගණ්හනාය - ම.
2. ආලොකසභානි - ම. ආලොකසතානි - PTS.
3. බ්‍යාධි - ම.
4. කිලෙසපරිදහන - ම. PTS.
5. චුතොපපත්ති - මජසං.
6. සඤ්ජානන - ම.

ඒ සිව් සසුන් කෙරෙහි දුඃඛාය්‍යසත්‍යයාගේ අපරිමාණ වූ අක්ෂර – පද – ව්‍යඤ්ජන – ආකාර – නිරුක්ති – නිර්දේශයෝ, තෙල දුඃඛසංඛ්‍යාත අර්ථයාගේ මැ සංකාසන – පකාසන – විවරණ – විභජන – උත්තානීකරණ – පඤ්ඤාපනය සඳහා දෙසන ලද්දහු ය. සියලු සත්‍යයන්ගේ දේශනාව මෙසේ යි. මෙසෙයින් එකෙකි සත්‍යය අපරිමාණ වූ අක්ඛර – පද – ව්‍යඤ්ජන – ආකාර – නිරුක්ති – නිද්දේසයන්ගෙන් පයෙසීෂණ කළ යුතු යි. යළි එ ද අර්ථබාහුල්‍යයෙන් අර්ථය ද බ්‍යඤ්ජනබාහුල්‍යයෙන් බ්‍යඤ්ජනය ද පයෙසීෂණ කළ යුතු.

යම් කිසි ශ්‍රමණයෙක් වේවයි බ්‍රාහ්මණයෙක් වේවයි මෙසේ කියා නම් : 'මම මේ දුඃඛ සත්‍යය හැරපියා අන් දුඃඛ සත්‍යයක් පනවන්නෙමි'යි ඔහුගේ ඒ බස වාග්වස්තුක මැ වන්නේ යැ, පුළුවුස්නා ලදුයේ සම්පාදනය කොට නො කියැහෙන්නේ යැ. සත්‍යයෝ මෙසේ යි.

යම් රාත්‍රියෙකැ භාග්‍යවත්හු අභිසම්බුද්ධ වූවාහු ද, යම් රාත්‍රියෙකැ අනුත්පාදනිරොධයෙන් (ග්‍රහණ නො කොට) පිරිනිවි සේක් ද, මේ අතුරෙහි භාග්‍යවත්හු විසින් යම් කිසි 'සුත්ත – ගෙය්‍ය – වෙය්‍යාකරණ – ගාථා – උදාන – ඉතිවුත්ත – ජාතක – අබ්භුතධම්ම – වෙදල්ල යන නවාංග පය්‍යාප්තියක් වදරන ලද ද එ හැම පවත්වන ලද ධර්මචක්‍ර යි. භාග්‍යවත් බුදුවරයන්ගේ ධර්මදේශනායෙහි ධර්ම චක්‍රයෙන් පිටත් කිසිවක් නැති. ඒ ධර්ම චක්‍රයාගේ සියලු සූත්‍රය ආය්‍යධර්මයෙහි ලා පයෙසීෂණය කළ යුතු යැ. එහි පරිග්‍රහණය සඳහා ආලොක බඳු වූ මේ සතර ස්ථාවර ධර්මයෝ වෙත් :

එහි දුක්ඛ (ආය්‍ය සත්‍යය) කවරෙ යත් : ජාති යැ ජරා යැ ව්‍යාධි යැ මරණ යැ සැකෙවින් පඤ්ච උපාදානස්කන්ධයෝ දුක් වෙති.

එහි මෙ ලක්ෂණ නිර්දේශ යැ ; ජාතිය පහළවීම ලක්ෂණ කොට ඇත්තී යැ, ජරාව පරිපාක (මිහිකිරීම) ලක්ෂණ යැ, ව්‍යාධිය දුක්ඛදුක්ඛතාව (ස්වභාවයෙන් දුක්ඛව) ලක්ෂණ කොට ඇත්තේ යැ, මරණය ච්‍යුත වීම ලක්ෂණ කොට ඇත්තෙ යැ, සෝකය ප්‍රියවිප්‍රයෝගය විපරිණාමය යන මෙයින් තැවීම ලක්ෂණ යැ, පරිදේවය වැලැපීම ලක්ෂණ යැ, දුක්ඛය කායසම්පීඩන ලක්ෂණ යැ, දෙමනස්සය චිත්තසම්පීඩන ලක්ෂණ යැ, උපායාසය සිත දවන ලකුණු ඇතියේ යැ, අප්‍රියසම්ප්‍රයොගය අමනාපය හා සමාගම ලකුණු කොට ඇතියේ යැ, ප්‍රිය විප්‍රයොගය මනාප වස්තූන්ගේ නැසීම ලකුණු කොට ඇතියේ යැ, අලාභය අභිප්‍රෙතය පෙරළීම ලකුණු කොට ඇත්තේ යැ, පඤ්ච උපාදනස්කන්ධයෝ නො දනීම (නො ඉක්මැවීම) ලක්ෂණ කොට ඇත්තාහුය. ජරාමරණය මිහින්රීම ච්‍යුත වීම ලක්ෂණ යැ, චුති–උප්පත්ති ච්‍යුත වීම පහළ වීම ලක්ෂණ යැ, සමුදය පිළිසඳහි ඉපැදීම ලක්ෂණ යැ, නිරොධ ය සමුදය දුරැලීම ලකුණු කොට ඇත්තේ යැ, මාර්ගය අනුසය මුලුසුන් කිරීම ලකුණු කොට ඇත්තේ යි. දුක්ඛය පෙළීම ලකුණු කොට ඇත්තේ යැ, සමුදය ඉපැදීම ලක්ෂණ යැ, මාර්ගය නෛය්‍යාණික ලක්ෂණ යැ, නිරෙධය ශාන්ති ලක්ෂණ යැ, අනුපාදිසෙස නිබ්බානධාතුව අප්‍රතිසන්ධි භාවයෙන් නිරුද්ධ වීම ලක්ෂණ යි.

දුක්ඛං ච සමුදයො ච, දුක්ඛං ච නිරොධො ච, දුක්ඛං ච මග්ගො ච, සමුදයො ච දුක්ඛං ච, සමුදයො ච නිරොධො ච, සමුදයො ච මග්ගො ච, නිරොධො ච සමුදයො ච, නිරොධො ච දුක්ඛං ච නිරොධො ච මග්ගො ච, මග්ගො ච නිරොධො ච, මග්ගො ච සමුදයො ච, මග්ගො ච දුක්ඛං ච.

තත්ථිමානි සුත්තානි :

තත්ථ කතමා ජාති :*

1. යමෙකරත්තිං පඨමං - ගබ්භෙ වසති මානවො
අබ්භුට්ඨිතොව සයාති[1] ස ගච්ඡං න නිවත්තතී'ති

"අට්ඨිමා ආනන්ද දුන්නුපපත්තියො" එකුත්තරිකෙ සුත්තං. අයං ජාති.

තත්ථ කතමා ජරා :

2. අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනෙ ධනං
ජිණ්ණකොඤ්චාව ඣායන්ති - ඛීණමච්ඡෙව පල්ලලෙ.

"පඤ්ච පුබ්බනිමිත්තානි දෙවෙසු" අයං ජරා.

තත්ථ කතමො ව්‍යාධි :

3. සාමං තෙන කුතො රාජ - තුවමපි ජරායන්ති වෙදෙහි,
ඛත්තිය කම්මස්ස ඵලො - ලොකො න හි කම්මං පනයති.(?)

"තයො ගිලානා" අයං ව්‍යාධි.

තත්ථ කතමං මරණං :

4. යථා'පි කුම්භකාරස්ස - කතං මත්තිකභාජනං,
ඛුද්දකං ච මහන්තං ච - යං පක්කං යං ච ආමකං,
සබ්බං භෙදනපරියන්තං - එවං මච්චාන ජීවිතං.

5 මමායිතෙ පස්සථ ඵන්දමානෙ
මච්ඡෙව අප්පොදකෙ ඛීණසොතෙ,
එතම්පි දිස්වා අමමො චරෙය්‍ය
භවෙසු ආසත්තිමකුබ්බමානො.

"උදකප්පන සුත්තං" ඉදං මරණං.

තත්ථ කතමො සොකො :

6. ඉධ සොචති පෙච්ච සොචති
පාපකාරී උභයත්ථ සොචති,
සො සොචති සො විහඤ්ඤති
දිස්වා කම්ම කිලිට්ඨමත්තනො.

"තීණි දුච්චරිතානි" අයං සොකො.

---

1 සො යාති - මජ්ඣං, PTS, - සයති - ජාතක
* ඉදං, මජ්ඣං - PTS, පොත්ථකෙසු තත්ථ

දුක්ඛ හා සමුදය ද, දුක හා නිරොධ ය ද, දුක හා මාර්ගය ද, සමුදය හා දුක ද, සමුදය හා නිරොධ ය ද, සමුදය හා මාර්ගය ද, නිරොධ ය හා සමුදය ද, නිරොධය හා දුක ද, නිරොධය හා මාර්ගය ද. මාර්ගය හා නිරොධය ද, මාර්ගය හා සමුදය ද, මාර්ගය හා දුක ද (වදළ සූත්‍රයෝ වෙත්.)

එහි මේ සූත්‍රයෝ යෑ :

එහි ජාති කවර යෑ :

1. සත්ත්ව තෙමේ යම් එක් රැයෙක (හෝ දවසෙක) පළමු පිළිසඳ කෙණෙහි මව්කුසැ වෙසේ ද, අහසට නැඟුණු අභ්‍රයක් (වලාකුළක්) සෙයින් හේ මරණයට අභිමුඛව යෙයි. මෙසේ යන හෙතෙම් (ඇසිල්ලකුදු) නො නවතී.

'ආනන්දය, මේ දනහේතුයෙන් උපප්‍රාප්තීහු අට දෙනෙකි : අංගුත්තරනිකායෙහි සූත්‍ර යි. (අට්ඨකංගුත්තර-දනවග්ග)

මේ ජාති යි.

එහි 'ජරා' කවර යෑ :

2. පැවිද්දට නිසි තුරුණුවියෙහි බඹසරවස් නො වැස ගිහිගෙට නිසි ධනය නො ලැබැ (පමාවූවාහු) මසුන් නැති (දිය සුන්) මඩිත්තෙක මහලු කොස් ලිහිණින් සෙයින් තැවෙත්.

'දෙවියන් කෙරෙහි පස් පෙරනිමිති පහළ වෙති.' (ඉතිවුත්තක චතුත්ථවග්ග) මේ ජරා යි.

එහි 'ව්‍යාධි ; කවරෙ යෑ :

3. (මේ ගාථායෙහි ශුද්ධියක් නැත ?)

ගිලන්හු තිදෙනෙක් වෙති'' (තිකංගුත්තර) මේ ව්‍යාධි යි.

එහි මරණ කවරෙ යෑ :

4. යම්සේ කුම්භකාරයා විසින් කරන ලද කුඩා වූ ද මහත් වූ ද පැසුණාවූ ද අමු වූ ද යම් මැටි බඳුනෙක් ඇද්ද, ඒ සියල්ල බිඳීම අන්ත කොට ඇත, මිනිසුන්ගේ ජීවිතය ද එබඳු යි.

5. සිඳීගිය දියත්තෙකැ පොපියන මසුන් මෙන් 'මාගේ' යැයි ගන්නා ලද කාමවස්තු-යෙහි පොපියන සත්ත්වයන් බලවු, (මමායිතයෙහි) තෙල ආදීනව දක මමායන නැතියේ කාමාදි භවයන්හි ඇලුම් නො කෙරෙමින් හැසිරෙන්නේ යෑ.

'උදකප්පන' සූත්‍රය (දතයුතු) මේ මරණ යි.

එහි 'සෝක' කවරෙ යෑ :

6. පව් කරන පුද්ගල මෙලොවැ දී (මරණසමයෙහි කර්මානුස්මරණයෙන්) ශෝක කෙරෙයි. පරලොවැ දී (විපාකානුභවයෙන්) ශෝක කෙරෙයි. (මෙසේ) දෙලොවැ ම ශෝක කෙරෙයි, හේ තමාගේ කිලිටි කම් දක ශෝක කෙරෙයි, හේ වෙසෙසින් පෙළෙයි.

තිකංගුත්තරයෙහි තුන් දුශ්චරිත දක්විය යුතු. මේ 'සෝක' යි.

තත්‍ථ කතමො පරිදෙවො :

7. කාමේසු ගිද්ධා පසුතා පමූළ්හා[1]
අවදානියා තෙ විසමෙ නිවිට්ඨා
දුක්ඛූපනීතා පරිදෙවයන්ති
කිං සු භවිස්සාම ඉතො චුතාසෙ.

"තිස්සො විපත්තියො" අයං පරිදෙවො.

තත්‍ථ කතමං දුක්ඛං :

8. සතං ආසි අයොසඞ්කු - සබ්බෙ පච්චත්තවෙදනා,
ජලිතා ජාතවෙදුව - අච්චිසංඝසමාකුලා.

"මහා වත නො පරිළාහො" සංයුත්තකෙ සුත්තං. සච්චසංයුත්තෙසු, ඉදං දුක්ඛං.

තත්‍ථ කතමං දොමනස්සං :

9. සඞ්කප්පෙහි පරෙතො සො - කපණො විය ඣායති,
සුත්වා පරෙසං නිග්ඝොසං - මිඞ්කු හොති තථාවිධො.

"ද්වෙ'මෙ තපනීයා ධම්මා" ඉදං දොමනස්සං.

තත්‍ථ කතමො උපායාසො :

10. කම්මාරානං යථා උක්කා - අන්තො ඣායති නො බහි,
එවම්පි හදයං මය්හං අන්තො ඣායති නො බහි[2]

"තයො අග්ගී" අයං උපායාසො.

තත්‍ථ කතමො අප්පියසම්පයොගො :

11. අයසාව මලං සමුට්ඨිතං - තදුට්ඨාය තමෙව ඛාදති,
එවං අතිධොනචාරිනං - සානි කම්මානි නයන්ති දුග්ගතිං.

"ද්වෙ'මෙ තථාගතං අබ්භාචික්ඛන්ති" එකුත්තරිකෙ සුත්තං දුකෙසු. අයං අප්පියසම්පයොගො.

තත්‍ථ කතමො පියවිප්පයොගො :

12. සුපිනෙන යථාපි සඞ්ගතං - පටිබුද්ධො පුරිසො න පස්සති.
එවම්පි මම පියං[3] ජනං - පෙතං කාලකතං[4] න පස්සති.

"තෙ දෙවා චවනධම්මං විදිත්වා තීහි වාචාහි අනුසාසන්ති" අයං පියවිප්පයොගො.

යම්පිච්ඡං න ලභති : "තිස්සො මාරධීතරො."

13. තස්ස චෙ කාමයානස්ස - ඡන්දජාතස්ස ජන්තුනො,
තෙ කාමා පරිහායන්ති - සල්ලවිද්ධොව රුප්පති.

"සඞ්ඛිත්තෙන පඤ්චුපාදනක්ඛන්ධා දුක්ඛා"

---

1. සමුළ්හා - සුත්තනි.
2. එවං ඣායති මෙ හදයං - සුත්වා නිබ්බන්තමම්බුජං - ම.
3. පියායිතං - ම.
4. කාලඞ්කතං - ම.

එහි 'පරිදේව' කවරෙ යත් :

7. ක්ලේශකාමයෙන් වස්තුකාමයන්හි ගිජු වූ කාමෙෂණයෙහි ඇලුණු ප්‍රමුඨ වූ (නිරයට යන හෙයින් මයුරු බැවින් හෝ) බුද්ධාදීන්ගේ බස් නො ගන්නා හෙයින් අවදනිය වූ විෂම වූ කායකර්මාදියෙහි යෙදුණු ඔහු මරණ දුකට පැමිණියාහු "මෙයින් සැවැ පරලොව ගියමෝ කුමක් වන්නාමෝ" හො යි පරිදේවනා කෙරෙත්.

තුන් විපත්තිහු දුක්වියයුත්තාහ' මේ 'පරිදේව' යි.

එහි 'දුක්ඛ' කවරෙ යැ :

8. ගිනිසිළු සමූහයෙන් ගැවැසිගත් දල්වෙන ගිනි බඳු වූ සියල්ල වෙන වෙන මැ වෙදනා උපදවන යහුල් සියයෙක් විය.

"එකාන්තයෙන් හේ මහත් පරිදහයෙකැ" (යනාදි) සංයුත් සඟියැ සච්ච සංයුත්තයෙහි (පපාතවර්ගයෙහි) 'පරිළාහ 'සූත්‍ර' යැ.

එහි දෙමනස්ස කවරෙ යැ :

9. කාමාදි සංකල්පයන් විසින් මඩනා ලද ඒ සිවුරළු කෘපණයකු සෙයින් සිතයි. එබඳු වූයේ (උපාධ්‍යායාදි) අන්‍යයන්ගේ බස් අසා මකු වෙයි.

"මේ තපනීය ධර්මයෝ දෙදෙනෙකි" (දුකඞ්ගුත්තර) මේ 'දෙමනස්ස'යි

එහි උපායාස කවරෙ යත් :

10. කඹුරන්ගේ උදුන යම්සේ ඇතුළත දැවේ ද, පිටත්හි නො දැවේ ද, එපරිද්දෙන් මැ මා සිත ඇතුළත දැවෙයි, පිටත්හි නො දැවේ.

'අග්නිහු තිදෙනෙකි' (ඛුද්දකවත්ථුවිභංග) මේ උපායාස යි.

එහි අප්පිය සම්පයොග කවරෙ යැ :

11. යකඩින් මැ නැඟුණු මලය එයින් නැඟී ඒ යකඩය මැ කයි. එසෙයින් පස්විකුන් නුවණ ඉක්මවා (නො පස්විකා) සිවුපසය වළඳන මහණහු ස්වකීය කර්මයෝ දුගතියට පමුණුවත්.

"මේ පුද්ගලයෝ දෙදෙන තථාගතයනට අභ්‍යාඛ්‍යාන කෙරෙති. දුකඞ්ගුත්තරයෙහි සූත්‍ර ය.

මේ "අප්පියසම්පයෝග" යි.

එහි පියවිප්පයොග කවරෙ යත් :

12. පුරුෂ සිහිනයෙන් දක්නාලද (චන්ද්‍රාදි) වස්තුව පිබිදියේ යම්සේ නො දකී ද, එසෙයින් මමායන කළ පරලොව ගිය කලුරිය කළ ජනයා නො දකී.

'ඒ දෙවියෝ ච්‍යුත වන සැහැවි ඇතියහු දුන වචන තුනෙකින් අනුශාසනා කෙරෙත්. (ඉතිවුත්තක–චතුත්ථවග්ග) මේ 'පියවිප්පයොග' යි.

"යම්පිච්ඡං න ලභති" යනු තුන් මාරධීතෘහු යැ. (මාර සංයුත්ත)

13. කාමවස්තූන් කැමැති වන උපන් ඡන්ද රාග ඇති ඒ පුහුල්හුගේ ඒ කාමවස්තු ඉදින් පිරිහෙත් නම් එකල්හි හේ විෂපි ශල්‍යයෙකින් විදනා ලද්දකු සෙයින් වෙහෙසට පැමිණේ.

"සැකෙවින් පඤ්ච උපාදනස්කන්ධයෝ දුක් වෙති."

14. චක්ඛුං[1] සොතං ච ඝානං ච – ජිව්හා කායො තථා මනං,
එතෙ ලොකාමිසා ඝොරා – යත්ථ සත්තා පුථුජ්ජනා.

"පඤ්චිමෙ භික්ඛවෙ ඛන්ධා." ඉදං දුක්ඛං.

තත්ථ කතමා ජරා ච මරණං ච:

15. අප්පං වත ජීවිතං ඉදං – ඔරං වස්සසතා'පි මීයති,[2]
යො චෙ'පි අතිච්ච ජීවති[2] – අථ ඛො සො ජරසාපි මීයති.[3]

"අත්‍යකා මෙ කාලකතා".[4] සංයුත්තකෙ පසෙනදිසංයුත්තකෙ සුත්තං. අයං ජරා ච මරණං ච

තත්ථ කතමා චුති ච උපපත්ති ච.

16. සබ්බෙ සත්තා මරිස්සන්ති · · මරණන්තං හි ජීවිතං,
යථාකම්මං ගමිස්සන්ති – පුඤ්ඤපාප[5] ඵලූපගා.

අයං චුති ච උපපත්ති ච.

ඉමෙහි සුත්තෙහි එකසදිසෙහි ච අඤ්ඤෙහි නවවිධං සුත්තං තං අනුපවිට්ඨෙහි ලක්ඛණතො දුක්ඛං ඤත්වා සාධාරණං ච අසාධාරණං ච දුක්ඛං අරියසච්චං නිද්දිසිතබ්බං. ගාථාහි ගාථා අනුමිනිතබ්බා, බ්‍යාකරණෙහි වා බ්‍යාකරණං. ඉදං දුක්ඛං.

(2) තත්ථ කතමො දුක්ඛසමුදයො:

17. කාමෙසු සත්තා කාමසඞ්ගසත්තා
සඤ්ඤොජනෙ වජ්ජමපස්සමානා,
න හි ජාතු සඤ්ඤොජනසඞ්ගසත්තා
ඔඝං තරෙය්‍යුං පුථුලං මහන්තං.

"චත්තාරො ආසවා" සුත්තං. අයං දුක්ඛසමුදයො.

තත්ථ කතමො දුක්ඛනිරොධො:

18. යම්හි න මායා වසති න මානො
යො වීතලොභො අමමො නිරාසො,
පනුණ්ණකොධො[6] අභිනිබ්බුතත්තො
සො බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛු.

"ද්වෙ'මා භික්ඛවෙ විමුත්තියො: රාගවිරාගො ච චෙතොවිමුත්ති, අවිජ්ජාවිරාගො ච පඤ්ඤාවිමුත්ති". අයං නිරොධො.

තත්ථ කතමො මග්ගො:

19. එසො'ව මග්ගො නත්ථඤ්ඤො – දස්සනස්ස විසුද්ධියා,
එතං හි තුම්හෙ පටිපජ්ජථ[7] – මාරසෙනං පමොහනං.

"සත්ති'මෙ භික්ඛවෙ බොජ්ඣඞ්ගා." අයං මග්ගො.

---

1. චක්ඛු – ම
2. අථවාපි අතිච්චං ජීවිතං – මජසං. PTS.
3. මීයතෙ – මජසං. PTS.
4. කාලඞ්කතා – ම. PTS.
5. අත්තකම්ම – ම. PTS.
6. පනුන්නකොධො – සිළුපා,
7. අරියො අට්ඨඞ්ගිකො මග්ගො – මජසං. PTS.

14. පුහුදුන්හු යම් ලොකාමිසයෙකැ ඇලුණාහු ද චක්ෂුස ද ශ්‍රොත්‍රය ද ඝ්‍රාණ ද ජිහ්වා ද කාය ද යළි මනස ද යන තෙල ලොකාමිසයෝ දරුණු වෙත්.

''මහණෙනි මේ ස්කන්ධයෝ පස්දෙනෙකි' මේ ''දුක්ඛ'' යි.

එහි ජරා-මරණ කවරෙ යැ :

15. මේ මිනිස් ජීවිතය නියතයෙන් අල්ප වෙයි, සියවසකින් මෙපිට (කලලාදි, අවස්ථායෙහි) ද මියැයෙයි. ඉදින් යමෙක් සියවස් ඉක්මැ ජීවත් වේ නම්, එකල හේ ජරායෙනුදු යුක්ත වැ මියැයේ.

'මාගේ මිත්තණිය කලුරිය කළා යැ' සංයුත්සඟියැ කොසල සංයුත්තයෙහි සූත්‍රය. මේ ජරා හා මරණ යි.

එහි චුති ද උප්පත්ති ද කවර යැ :

16. සියලු සත්හු මැරෙන්නාහු යැ, ජීවිතය මරණය අන්ත කොට ඇති හෙයිනි. පින් පව් ඵලය අනුව ගියාහු කම් වූ පරිදි පරලොව යෙත්.

මේ චුති හා උප්පත්ති යි.

එක්බඳු වූ මේ සූත්‍රයන්ගෙන් ද, නවවිධ සූත්‍රයට පිවිසි අන්‍යසූත්‍රයන්ගෙන් ද ලක්ෂණ වශයෙන් සාධාරණ වූත් දුක්ඛය දන දුඃඛායතනය දක්වියැ යුතු යැ, ගාථායෙන් ගාථා පමණ කළ යුතු යැ, වෙය්‍යාකරණයෙන් වෙය්‍යාකරණ පමණ කළ යුතු, මේ 'දුක්ඛ' යි.

එහි දුක්ඛ සමුදය කවරෙ යත් :

17. වස්තු කාමයන්හි ක්ලෙශකාමයෙන් ඇලුණු කාමයන්හි රාගාදි සඞ්ගයෙන් ලැගුණු සංයොජනයෙහි දෙස් නොදක්නා සංයොජන සංඛ්‍යාත සඞ්ගයෙන් ත්‍රෛභූමික ධර්මයන්හි ඇලුණු සත්ත්වයෝ පුළුල් වූ මහත් වූ චතුරොඝය කිසි කලෙකත් නොමැ තරණය කරන්නාහු ය.

''ආස්‍රවයෝ සතරදෙනෙකි, (දික්සඟියැ) දසුත්තර සූත්‍රය.

එහි දුක්ඛ නිරොධය කවරෙ යත් :

18. යමක්හු කෙරෙහි මායාවෙක් නො පවතී ද මානය නැද්ද යමෙක් වීතලොභ වේ ද මමායන රහිත ද ආශා රහිත ද මුලුසුන් කළ ක්‍රොධ ඇද්ද (කෙලෙස් පිරිනිවනින්) නිවුණු සිත් ඇත් ද හේ (බාහිත පාපී) බ්‍රාහ්මණ වෙයි. හේ (ශමිත පාපී) ශ්‍රමණ වෙයි, හේ භික්ෂු වූයේත් වේ.

''මේ විමුත්තීහු දෙදෙනෙකි : රාගයාගේ ක්ෂය විරාග වූ චිත්තවිමුක්තිය ද අවිද්‍යාවගේ ක්ෂයවිරාග වූ ප්‍රඥාවිමුක්තිය ද යන දෙක යැ. මේ දුක්ඛනිරොධ යි.

එහි මග්ග කවරෙ යත් :

19. මාර්ගඵලදර්ශනයාගේ විශුද්ධිය පිණිස මෙය මැ මාර්ග වෙයි, අන් මඟෙක් නැති, එහෙයින් තෙපි තෙල මඟ මැ පිළිපදිවු. තෙල මඟ මරහුගේ ප්‍රමොහන යි.

''මහණෙනි මේ බොධ්‍යංගයෝ සත්දෙනෙකි. (සත්තකංගුත්තර) මේ 'මග්ග' යි

තත්ථ කතමානි චත්තාරි අරියසච්චානි:

20. යෙ ධම්මා හෙතුප්පභවා - තෙසං හෙතුං තථාගතො ආහ,
තෙසං ච යො නිරොධො - එවං වාදී මහාසමණො'ති.

හෙතුප්පභවා ධම්මා දුක්ඛං, හෙතු සමුදයො, යං භගවතො වචනං අයං මග්ගො, තෙසං යො නිරොධො, අයං නිරොධො.

යෙ හි තෙවී සංයොජනියෙසු ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරන්ති, කිලෙසා තණ්හා පවඩ්ඪන්ති තණ්හාපච්චයා උපාදානං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. තත්ථ යං සංයොජනං, අයං සමුදයො. යෙ සංයොජනියා ධම්මා, යෙ ච සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති, ඉදං දුක්ඛං. යා සංයොජනියෙසු ධම්මෙසු ආදීනවානුපස්සනා, අයං මග්ගො. පරිමුච්චති ජාතියා ජරාය ව්‍යාධීහි මරණෙන[1] සොකෙහි පරිදෙවෙහි, යාව උපායාසෙහි. ඉදං නිබ්බානං.

ඉමානි චත්තාරි සච්චානි.

තත්ථ කතමා අනුපාදිසෙසා නිබ්බානධාතු:

21. අත්ථඞ්ගතස්ස න පමාණමත්ථි (උපසීවාති භගවා)
යෙන නං වජ්ජු තං තස්ස නත්ථි,[2]
සබ්බෙසු ධම්මෙසු සමූහතෙසු
සමූහතා වාදපථා'පි සබ්බෙ'ති.

'සංයුත්තකෙ ගොධික සුත්තං.'

අයං අනුපාදිසෙසා නිබ්බානධාතු.

ඉමානි අසාධාරණානි සුත්තානි, යහිං යහිං සච්චානි නිද්දිට්ඨානි. තහිං තහිං සච්චලක්ඛණතො ඔතාරෙත්වා අපරිමාණෙහි බ්‍යඤ්ජනෙහි සො අත්ථො පරියෙසිතබ්බො. තත්ථ අත්ථානුපරිවත්තිබ්‍යඤ්ජනෙන පුන බ්‍යඤ්ජනානුපරිවත්තිඅත්ථෙන තස්ස එකමෙකස්ස අපරිමාණානි බ්‍යඤ්ජනානි ඉමෙහි සුත්තෙහි යථානික්ඛිත්තෙහි චත්තාරි අරියසච්චානි නිද්දිසිතබ්බානි. පඤ්චනිකායෙ අනුපවිට්ඨාහි ගාථාහි ගාථා අනුමිනිතබ්බා. බ්‍යාකරණෙහි බ්‍යාකරණං. ඉමානි අසාධාරණානි සුත්තානි.

---

1. මරණෙහි - මජසං.
2. මජසං PTS. - පොත්ථකෙසු විසදිසා දිස්සති.

එහි සතර ආය්‍යීසත්‍යයෝ කවරහ යත් :

20. හේතුයෙන් උපන් යම් ධර්ම කෙනෙක් ඇද්ද, තථාගතයෝ ඒ ධර්මයන්ගේ ප්‍රභවහේතුව වදළහ. යළි ඔවුන්ගේ යම් නිරොධයෙක් ඇද්ද, එ ද වදළහ, මහාශ්‍රමණ වූ තථාගතයෝ මෙබඳු වාද ඇත්තාහ'යි.

හෙතුයෙන් ප්‍රභව වූ ධර්මයෝ 'දුක්ඛ' යැ, හෙතුව සමුදය යැ, භාග්‍යවත්හුගේ යම් (දෙශනා) වචනයෙක් ඇද්ද මේ මාර්ග යැ, ඒ ධර්මයන්ගේ යම් නිරොධයෙක් ඇද්ද මේ නිරොධ යි.

යම් කිසි කෙනෙක් සංයෝජනයන්ට හිත වූ ධර්මයන්හි ආස්වාද විසින් දක්නාසුලු වැ වාස කෙරෙත් ද, ඔවුනට කෙලෙස් වූ තෘෂ්ණාව වැඩෙයි, තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදන වෙයි ......... මෙසෙයින් තෙල හුදු දුඃඛරාශිහුගේ සමුදය වේ. එහි යම් සංයෝජනයෙක් ඇද්ද, මේ 'සමුදය' යැ. යම් සංයොජනියධර්ම කෙනෙක් ඇද්ද, යම් සොක–පරිදෙව–දුක්ඛ–දෙමනස්ස–උපායාස කෙනෙකුත් උපදිත් ද, මේ 'දුක්ඛ' යැ. සංසොජනිය ධර්මයන්හි යම් ආදීනව විසින් පුනපුනා බැලීමෙක් වේ ද, මේ මාර්ග යැ. ජාතියෙන් ජරායෙන් ව්‍යාධියෙන් මරණයෙන් ශොකයෙන් පරිදෙවයෙන්—උපායාසය දක්වා—මිදෙයි. මෙ නිබ්බාන'යි.

මේ සතර සත්‍යයෝ යි.

එහි අනුපාදිසෙසනිබ්බානධාතු කවර යත් :

21. (බුදුහු මෙසේ වදළහ : උපසීව මාණවකය) අස්තයට ගියහුට (අනුපාදිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවියහුට) රූපාදිප්‍රමාණකරධර්මයෙක් නැත. රාගාදි යම් ධර්මයකින් ඔහුට කියන්නාහු නම් එය ඔහුට නැත (ස්කන්ධාදි) සියලු ධර්මයන් නැසූ කල්හි (ඔහු විසින්) හැම වාදපථයෝ ද නසන ලදහ' යි.

සංයුත්සඟියැ ගොධික සූත්‍රය (දක්වියැ යුතු.)

මේ අනුපාදිසේසනිබ්බානධාතු යි.

මේ අසාධාරණ සූත්‍රයෝ යැ, යම් යම් තැනෙක සිවුසස් දක්වන ලද්දහු ද ඒ ඒ තැන්හි සත්‍ය ලක්ෂණයෙන් අවතරණ කොට අපරිමාණ ව්‍යඤ්ජනයෙන් ඒ අර්ථය සෙවියැ යුතු. එහි අර්ථය අනුව වැටෙන ව්‍යඤ්ජනයෙන් යළි ව්‍යඤ්ජන අනුව වැටෙන අර්ථයෙන් යුත් ඒ එකෙකි අර්ථයාගේ අපරිමාණ ව්‍යඤ්ජනයෝ වෙති. නික්ෂෙප කළ පරිදි මේ සූත්‍රයන්ගෙන් චතුරාය්‍ය සත්‍යයෝ දක්විය යුත්තාහ. පස්මහසඟියෙහි පිවිසැගෙන සිටි ගාථායෙන් ගාථා පමණ කළ යුතු යැ, ව්‍යාකරණයෙන් ව්‍යාකරණය පමණ කළ යුතු. මොහු අසාධාරණ සූත්‍රයෝ යි.

**තෙසං ඉමා උද්දානගාථා :**

(1) යමෙකරත්තිං පඨමං – අච්ඡන්දනුප්පත්තියො,
අචරිත්වා බ්‍රහ්මචරියං – පඤ්ච පුබ්බනිමිත්තකං.

(2) සාමං තෙන කුතො රාජ – තයො ගිලානකාපි'ච,
යථා'පි කුම්භකාරස්ස – මමාසිතොදකප්පකං.

(3) ඉධ සොචති පෙච්ච සොචති – තීණි දුච්චරිතානි ච,
කාමෙසු ගිද්ධා පසුතා – යාව තිස්සො විපත්තියො.

(4) සතං ආයි අයොසඞ්කු – පරිළාහො මහන්තරො,
සඞ්කප්පෙහි පරෙතො සො – තපනීයා දුවෙ තථා.

(5) කම්මාරානං යථා උක්කා – තයො අග්ගී පකාසිතා,
අයතො වලම්බුපදන්තං – අබ්භක්ඛානං තථාගතෙ.

(6) සුපිනෙන යථාපි සංගතං – තිවිධං දෙවානුසාසනං,
තිස්සො ච මාරධීතරො – සල්ලවිද්ධො'ච රුප්පති

(7) චක්ඛු සොතං ච ඝානං ච – පඤ්චක්ඛන්ධා පකාසිතා,
අප්පං වත ජීවිතං ඉදං – අයුතා මෙ මහල්ලිකා.

(8) සබ්බෙ සත්තා මරිස්සන්ති – උප්පත්ති චුතී ච'යං,
කාමෙසු සත්තා සංයුත්තා – චත්තාරො පනානවා.

(9) යම්හි න මායා වසති – ධොමා චෙතොවිමුත්තියො,
එසො'ව මග්ගො සත්ථෙසද – බොජ්ඣඞ්ගා ච සුදෙසිතා

(10) යෙ ධම්මා හෙතුප්පභවා – සංයොජනානුපස්සිනො,
අත්ථඞ්ගතස්ස න පමාණමත්ථි – ගොධිකො පරිනිබ්බුතො.

**ඉමා දස තෙසං උද්දානගාථා.**

තත්ථිමානි සාධාරණානි සුත්තානි, යෙසු සුත්තෙසු සාධාරණානි සච්චානි දෙසිතානි අනුලොමම්පි පටිලොමම්පි වොමිස්සකම්පි තත්ථ අයං ආදි :

22. අවිජ්ජාය නිවුතො ලොකො (අජිතාති භගවා,)
විවිච්ඡා පමාදා නප්පකාසති,
ජප්පාභිලෙපනං බ්‍රූමි – දුක්ඛමස්ස මහබ්භයං.

තත්ථ යා අවිජ්ජා ච විවිච්ඡා ච අයං සමුදයො. යං මහබ්භයං ඉදං දුක්ඛං. ඉමානි ද්වෙ සච්චානි දුක්ඛං ච සමුදයො ච.

“සංයොජනං සංයොජනියා ච ධම්මා”ති සංයුත්තකෙ චිත්ත සංයුත්තකෙසු බ්‍යාකරණං.

තත්ථ යං සංයොජනං, අයං සමුදයො. යෙ සංයොජනියා ධම්මා ඉදං දුක්ඛං, ඉමානි ද්වෙ සච්චානි : දුක්ඛං ච සමුදයො ච.

එහි මේ උද්දාන ගාථා යැ :

(1–10) (යමෙකරත්තිං පඨමං' යනාදි ජාතක (අයොඝර) ගාථායෙහි පටන් සංයුත් සඟියැ ගොධික සූත්‍රය දක්වා ජාති ආදි ධර්මයනට නිදර්ශිත අසාධාරණ සූත්‍රයන්ගේ අනුපිළිවෙළ උද්දානගාථාවන්ගෙන් දක්වන ලද්දේය, එය පාළි වශයෙන් මැ දතහැකි වේ.)

ඒ අසාධාරණ සූත්‍රයන්ගේ උද්දානගාථා දසයෙකි.

එහි මේ සාධාරණ සූත්‍රයෝ යැ, යම් සූත්‍රයෙක්හි අනුලෝම ව ද, ප්‍රතිලෝම ව ද ව්‍යති මිශ්‍ර කොට ද සාධාරණ සත්‍යයෝ දෙසන ලද්දහු ද එහි මේ ආදිය යැ :

22. (අජිත යි බුදුහු මෙසේ වදරති) ධර්ම ස්වභාව ප්‍රතිච්ඡාදන ලක්ෂණ වූ සත්ත්ව ලොකය වසන ලද විචිකිත්සා ප්‍රමාද හේතුයෙන් ප්‍රකාශයට නො පැමිණෙයි, තෘෂ්ණාව අභිලෙපන (ඇලීම) යයි කියමි. ඒ ලෝවැසිහට ජාත්‍යාදි වට්ටදුක්ඛය මහත් භය හේතුව වේ.

එහි යම් අවිද්‍යාවකුත් විචිකිත්සාවකුත් වේ ද, මේ 'සමුදය යැ, යම් මහත් භයෙක් වේ ද මේ 'දුක්ඛ' යැ, දුක්ඛ ද සමුදය ද යි මේ සත්‍ය දෙක යි.

''සංයෝජන ද සංයෝජනිය ධර්මයෝ ද'' යන සංයුත් සඟියැ චිත්ත සංයුත්තයෙහි වෙය්‍යාකරණය වෙයි.

එහි යම් සංයෝජනයෙක් ඇද්ද මේ 'සමුදය' යැ, සංයොජනයන්ට හිත වූ යම් ධර්ම කෙනෙක් ඇද්ද, මේ 'දුක්ඛ' යැ. දුක්ඛ ද සමුදය ද යි මේ සත්‍ය දෙකෙකි.

තත්ථ කතමං දුක්ඛං ච නිරොධො ච :

23\. උච්ඡින්නභවතණ්හස්ස - සන්තචිත්තස්ස[1] භික්ඛුනො,
වික්ඛීණො[2] ජාතිසංසාරො - නත්ථි තස්ස[3] පුනබ්භවො.

තත්ථ යං චිත්තං ඉදං දුක්ඛං, යො භවතණ්හාය උපච්ඡෙදො අයං දුක්ඛනිරොධො. "වික්ඛීණො ජාතිසංසාරො නත්ථි තස්ස පුනබ්භවො"ති නිද්දෙසො. ඉමානි ද්වෙ සච්චානි : දුක්ඛං ච නිරොධො ච.

"ද්වෙ'මා භික්ඛවෙ විමුත්තියො : රාගවිරාගා ච චෙතොවිමුත්ති, අවිජ්ජාවිරාගා ච පඤ්ඤාවිමුත්ති." තත්ථ යං චිත්තං, ඉදං දුක්ඛං. යා විමුත්ති, අයං නිරොධො. ඉමානි ද්වෙ සච්චානි : දුක්ඛං ච නිරොධො ච.

තත්ථ කතමං දුක්ඛං මග්ගො ච :

24\. කුම්භූපමං කායමිමං විදිත්වා
නගරූපමං චිත්තමිදං ඨපෙත්වා,
යොධෙථ මාරං පඤ්ඤාවුධෙන
ජිතං ච රක්ඛෙ අනිවෙසනො සියා.

තත්ථ යො ච[4] කුම්භූපමො කායො යං ච නගරූපමං චිත්තං ඉදං දුක්ඛං, යං 'පඤ්ඤාවුධෙන මාරං යොධෙථා'ති අයං මග්ගො. ඉමානි ද්වෙ සච්චානි.

"යං භික්ඛවෙ න තුම්හාකං තං පජහථ".[5] තත්ථ යා පජහනා,[6] අයං මග්ගො. යෙ තෙ ධම්මා අනත්තනියා පහාතබ්බා, රූපං යාව විඤ්ඤාණං, ඉදං දුක්ඛං. ඉමානි ද්වෙ සච්චානි : දුක්ඛං ච මග්ගො ච.

තත්ථ කතමං දුක්ඛං ච සමුදයො ච නිරොධො ච :

25\. යෙ කෙචි සොකා පරිදෙවිතා ච,
දුක්ඛා ච ලොකස්මිං අනෙකරූපා,
පියං පටිච්ච පභවන්ති එතෙ
පියෙ අසන්තෙ න භවන්ති එතෙ.

තත්ථ යෙ සොකපරිදෙවා, යං ච අනෙකරූපං දුක්ඛං, යං පෙමතො භවති, ඉදං දුක්ඛං. යං පෙමං, අයං සමුදයො. යො ඡන්දරාගවිනයො පියස්ස අකිරියා, අයං නිරොධො. ඉමානි තීණි සච්චානි.

---

1. නෙත්තිවච්ඡින්නස්ස - ම, PTS.
2. විතිණ්ණො - සුති.
3. නත්ථිදානි - ම. PTS,
4. යං ච - ම. PTS,
5. පජහිතබ්බං - ම.
6. යා සංයොජනා - ම.

එහි දුක්ඛයත් නිරොධයත් කවරෙ යැ :

23. මගනුවණින් මුලුසුන් කළ භවතෘෂ්ණා ඇති කෙලෙස් නැත්යෙන් සන්හුන් සිත් ඇති මහණහු විසින් ජාති සංඛ්‍යාත සංසාරය වෙසෙසින් ක්ෂය කරන ලද. ඔහුට පුනර්භව යෙක් නැති.

එහි යම් චිත්තයෙක් ඇද්ද මේ 'දුක්ඛ' යැ. භවතෘෂ්ණාවගේ යම් උපච්ඡෙදයෙක් වේ ද, මේ 'දුක්ඛ නිරොධ' යැ, 'වික්ඛීණො ජාතිසංසාරො නත්ථි තස්ස පුනබ්භවො'' යනු නිද්දෙස යි. දුක්ඛ යැ නිරොධ යැ යි මේ සත්‍යයෝ දෙදෙනෙකි.

මහණෙනි, යම් විමුත්තිහු, දෙ දෙනෙක් වෙති : රාගවිරාග චේතො විමුත්තිය ද අවිජ්ජාවිරාග පඤ්ඤාවිමුත්තිය ද යන මොහු යැ. එහි යම් චිත්තයක් වේ ද, මේ දුක යැ. යම් විමුත්තයක් වේ ද මේ නිරොධ යි. දුඃඛ සත්‍යයද නිරොධ සත්‍යය දුයි මෙ සත්‍යයෝ දෙ දෙනෙකි.

එහි දුක්ඛ ද මග්ග ද කවරෙ යත් :

24. මේ කය කුඹල්බඳුනක් වැන්නැ යි දැන මේ විදර්ශනාචිත්තය නගරූපම කොට තබා ප්‍රඥ නමැති අවියෙන් කෙලෙස් මරුට පහර දෙන්නේ යැ. දිනන (උපදවන) ලද තරුණ විදර්ශනාව රක්නේ යැ. සමවත නිවෙසන කොට (එහි) නො වසන්නේ යි.

එහි යම් කුම්භූපම කයකුත් නගරූපම සිතකුත් වේ ද, මේ 'දුක්ඛ' යැ. 'ප්‍රඥයුධයෙන් මාර ප්‍රහාරය යන යමක් වේ ද මේ මාර්ග යි. මේ (දුක්ඛ මග්ග) සත්‍ය දෙක යි.

'මහණෙනි යමක් තොපගේ නො වේ ද, එය දුරැලවු, (ඛන්ධසංයුත්ත) එහි යම් දුරැලීමෙක් වේ ද මේ 'මග්ග' යැ, තමා සතු නොවූ (එහෙයින්) ප්‍රහාතව්‍ය වූ රූපාදිවිඤ්ඤාණ දක්වා යම් ධර්ම කෙනෙක් ඇත් ද මේ 'දුක්ඛ' යැ. මේ දුක්ඛ මග්ග' යන දෙ සත්‍යයෝ යි.

එයි 'දුක්ඛ, සමුදය හා නිරොධ' කවරෙ යැ :

25. ලොවැ නන්වැදෑරුම් වූ යම් කිසි සොක පරිදෙව දුක්ඛයෝ වෙත් ද තෙල (සොකාදීහු) ප්‍රියවස්තු නිසා උපදිති, ප්‍රියවස්තුවක් නැති කල්හි තුලුහු (සොකාදීහු) නො වෙත්.

එහි යම් සෝකපරිදේවයෝ වෙත් ද යම් අනෙකරූප වූ දුකකුත් වේ ද, ප්‍රේමහේතුයෙන් යම් දුකකුත් වේ ද මෙ 'දුක්ඛ' යැ, යම් ප්‍රෙමයෙක් වේ ද, මේ 'සමුදය' යැ. යම් ඡන්දරාග විනයයෙක් ප්‍රිය නො කිරීමෙක් වේ ද, මෙ 'නිරොධ' යි. මේ තුන් සත්‍යයෝ යි.

තිම්බරුකො පරිබ්බාජකො පුච්ඡති: "සයං කතං පරං කත"න්ති. යථෙසා වීමංසා, ඉදං දුක්ඛං. යා එතෙ ද්වෙ අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා, අවිජ්ජාපච්චයා සඞ්ඛාරා යාව ජාතිපච්චයා ජරාමරණං, ඉදම්පි දුක්ඛං ච සමුදයො ච. විඤ්ඤාණං නාමරූපං සළායතනං ඵස්සො වෙදනා භවො ජාති ජරාමරණං, ඉදං දුක්ඛං. අවිජ්ජා සඞ්ඛාරා තණ්හා උපාදානං, අයං සමුදයො. ඉති ඉදං 'සයං කතං වීමංසෙය්‍යා'ති යං ච පටිච්චසමුප්පාදෙ දුක්ඛං, ඉදං දුක්ඛං එසො සමුදයො නිද්දිට්ඨො. අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො, යාව ච ජරාමරණනිරොධො'ති අයං නිරොධො ඉමානි තීණි සච්චානි: දුක්ඛං ච සමුදයො ච නිරොධො ච.

**තත්ථ කතමං දුක්ඛං ච සමුදයො ච මග්ගො ච**

26 යො දුක්ඛමද්දක්ඛි යතො නිදානං
කාමෙසු සො ජන්තු කථං නමෙය්‍ය,
කාමා හි ලොකෙ සඞ්ගාති ඤත්වා
තෙසං සතිමා විනයාය සික්ඛෙ'ති

තත්ථ යො දුක්ඛමද්දක්ඛි, ඉදං දුක්ඛං, යතො භවති ඉදං සමුදයො, යං දිට්ඨං[1] යතො භවති යාව තස්ස විනයාය සික්ඛා, අයං මග්ගො. ඉමානි තීණි සච්චානි.

"එකාදසඞ්ගුත්තරෙසු ගොපාලකූපම[2] සුත්තං".

තත්ථ යා ච රූපඤ්ඤුතා[3] යං ච සළායතනං, යථා වණ්ණං පටිච්ඡාදෙති, යං ච තිත්ථං, යථා ච ලභති ධම්මූපසංහිතං උළාරං පීතිපාමොජ්ජං, චතුබ්බිධං ච අත්තභාවතො වත්ථු, ඉදං දුක්ඛං. යාව ආසාටිකං සාටෙතා[4] හොති, අයං සමුදයො. රූපඤ්ඤුතා[5] ආසාටිකසාටනං,[6] වණ්ණපටිච්ඡාදනං, විපිඤ්ඤුතා, ගොචරකුසලං ච, අයං මග්ගො අවසෙසා ධම්මා, අත්ථි හෙතු, අත්ථි පච්චයා, අත්ථි නිස්සයා, සාවසෙසදෙසිතා අනෙකපූජා ච කල්‍යාණමිත්තතාපච්චයා[7] ධම්මා, විපිඤ්ඤුතා ච හෙතු ඉමානි තීණි සච්චානි.

**තත්ථ කතමං දුක්ඛං ච මග්ගො ච නිරොධො ච :**

27. සති කායගතා උපට්ඨිතා
ඡසු ඵස්සායතනෙසු සංවුතො,
සතතං භික්ඛු සමාහිතො
ජඤ්ඤා නිබ්බානමත්තනො.

---

1. සන්දිට්ඨං - ම.
2. ගොපාලකොපම - ම. PTS.
3. යාව රූපඤ්ඤුතා - ම PTS.
4. සාරෙතා - ම. PTS.
5. රූපඤ්ඤුතා - ම. PTS
6. ආසාටකහරණං - ම.
7. කල්‍යාණමිත්තතපච්චයා - ම.

තිම්බරුක පරිව්‍රාජක 'සුවදුක් තමා විසින් කරන ලද ද, පරා විසින් කරන ලද ද යි පුළුවුස්සි. (අභිසමය සංයුක්ත) තෙල වීමංසාව බඳු යම් දහමක් ඇද්ද, මේ දුක්ඛ යැ. තෙල අන්තද්වයට නො පැමිණ යම් මධ්‍යම ප්‍රතිපදවක් ඇද්ද, 'අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති' (යනු ආදි කොට) 'ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වෙයි' යනු දක්වා මෙ ද 'දුක්ඛ' හා 'සමුදය' ද වෙයි. විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වෙදනා භව ජාති ජරාමරණ යන මේ 'දුක්ඛ' යැ, අවිජ්ජා සංඛාර තණ්හා උපාදන යන මේ 'සමුදය' යැ. මෙසේ මේ 'ස්වයං කෘතය විමසන්නේ යැ' යනු ද පටිච්චසමුප්පාදයෙහි 'දුක්ඛ'ය ද තෙල දුක් වූ 'සමුදය' ද 'අවිජ්ජානිරොධයෙන් සංඛාරනිරොධය වෙයි' යනු පටන් ජරාමරණනිරොධය තෙක් මේ ' නිරොධ' යි. 'දුක්ඛ සමුදය හා නිරොධය' ද යන මොහු තුන් සත්‍යයෝ යි.

එහි දුක්ඛ සමුදය හා මග්ග කවරෙ යැ :

26. ආරබ්ධ විදර්ශක වූ යමෙක් ත්‍රෛභූමික දුඃඛය දුටුයේ ද යම් හෙතුයෙකින් දුක උපදී නම් ඒ නිදන වූ තෘෂ්ණාවත් දුටුයේ ද පටිපන්නක වූ ඒ පුහුල් සවස්තුක ක්ලෙශ කාමයන්හි කිසෙයින් නැමේ ද, (නො නැමේ මැ යැ). යම් හෙයෙකින් මෙ ලොවැ කාමයෝ (පසමිතුරු වෙත් ද එ හෙයින්) සංගයෙකැ යි දැන ඒ කාමයන්ගේ ප්‍රහාණ විනය පිණිස ස්මෘතිමත් වැ ත්‍රිවිධ ශික්ෂායෙහි හික්මෙන්නේ යි.

එහි 'යො දුක්ඛමද්දක්ඛි' යන මේ 'දුක්ඛ' යැ. යම් කරුණෙකින් වේ ද මේ 'සමුදය' යැ, යමක් දක්නා ලද ද, යමකින් වේ ද, යම්තාක් ඒ හෙතුහුගේ විනය පිණිස හික්මීමෙක් වේ ද, මේ ' මග්ග 'යැ මොහු තුන් සත්‍යයෝ යි.

''එකාදසකංගුත්තරයෙහි ගොපාලකූපම සූත්‍රය :''

එහි යම රූපඤ්ඤුතායෙක් වේ ද, යම් සළායතනයෙක් වේ ද, යම්සේ වණපටිච්ඡාදනය කෙරේ ද, යම් තිර්ථයෙක් වේ ද. යම්සේ ධම්මූපසංහිත උළාර පීතිපාමොජ්ජ ලබා ද, ආත්මභාව හෙයින් චතුර්විධ වස්තුයෙක් වේ ද ,මේ 'දුක්ඛ' යැ. 'ආසාටික (කාමවිතර්ක) බැහැර කරනුයේ වෙයි' යනු දක්වා මේ 'සමුදය' යැ, රූපඥ බව ආසාටික දුරලීම ව්‍රණ ප්‍රතිච්ඡාදනය, වීථි දන්නා බව හා ගොචරකුසල බව ද යන මේ 'මග්ග' යැ, අවශේෂ ධර්මයෝ : හේතුහු ඇත, ප්‍රත්‍යයෝ ඇත, නිශ්‍රයයෝ ඇත. සාවශෙෂ කොට දෙවන බව හා අනේක පූජා ද කල්‍යාණ මිත්‍රතාවට ප්‍රත්‍ය ය වූ ධර්මයෝ ද වීථි දන්නා බව ද හෙතු යි. මොහු තුන් සත්‍යයෝ යි.

එහි 'දුක්ඛ මග්ග හා නිරොධ' කවරෙ යැ :

27. යමක්හට කායගතාසතිය එළඹැසිටියා ද යමෙක් ස්පර්ශයට කාරණ වූ චක්ෂුරාදි ෂඩායතනයෙහි සංවෘත වූයේ ද නිරතුරු විදර්ශනාසමාධියෙන් සමාහිත වූ ඒ මහණ තමාගේ ක්ලේශපරිනිර්වාණය දන්නේ යි.

තත්ථ යා[1] ච කායගතා සති, යං ච සළායතනං, සබ්බං චෙතං දුක්ඛං. යා ච කායගතා සති, යො ච සීලසංවරො යො ච සමාධි යඤ යා සති, අයං පඤ්ඤාක්ඛන්ධො. සබ්බම්පි සීලක්ඛන්ධො සමාධික්ඛන්ධො, අයං මග්ගො. එවංවිහාරිනා ඤාතබ්බං නිබ්බානං, අයං නිරොධො ඉමානි තීණි සච්චානි :

සීලෙ පතිට්ඨාය ද්වෙ ධම්මා භාවෙතබ්බා : සමථො ච විපස්සනා ච තත්ථ යෙ[2] චිත්තසහජාතා ධම්මා, ඉදං දුක්ඛං, යො ච සමථො යා ච විපස්සනා, අයං මග්ගො. රාගවිරාගා ච චෙතොවිමුත්ති, අවිජ්ජාවිරාගා ච පඤ්ඤාවිමුත්ති, අයං නිරොධො. ඉමානි තීණි සච්චානි.

තත්ථ කතමො සමුදයො ච නිරොධො ච :

28. ආසා පිහා ච[2] අභිනන්දනා ච
අනෙකධාතූසු සරා පතිට්ඨිතා,
අඤ්ඤාණමූලප්පභවා පජප්පිතා
සබ්බා මයා බ්‍යන්තිකතා සමූලකා

තත්ථ අඤ්ඤාණමූලප්පභවා'ති පුරිමකෙහි සමුදයො. සබ්බා මයා බ්‍යන්තිකතා සමූලකාති නිරොධො. ඉමානි ද්වෙ සච්චානි :

"චතුන්නං ධම්මානං අනනුබොධා අප්පටිවෙධා" විත්ථාරෙන කාතබ්බං. අරියස්ස සීලස්ස සමාධිනො පඤ්ඤාය විමුත්තියා. තත්ථ යො ඉමෙසං චතුන්නං ධම්මානං අනනුබොධො අපටිවෙධො[3], අයං සමුදයො. පටිවෙධො භවනෙත්තියා, අයං නිරොධො. අයං සමුදයො ච නිරොධො ච.

තත්ථ කතමො සමුදයො ච මග්ගො ච :

29. යානි සොතානි ලොකස්මිං (අජිතාති භගවා)
සති තෙසං නිවාරණං,
සොතානං සංවරං බ්‍රූමි පඤ්ඤායෙතෙ පිථීයරෙ.[4]

'යානි සොතානී'ති අයං සමුදයො. යා ච පඤ්ඤා, යං ච සති නිවාරණං පිධානං ච, අයං මග්ගො ඉමානි ද්වෙ සච්චානි.

'සචෙතනියං සුත්තං' දළ්හනෙමියාරථකාරො ජිඟි මානෙහි නිද්දිට්ඨො. තත්ථ යං කායකම්මං සවඞ්කං සදොසං සකසාවං, යා සවඞ්කතා සදොසතා සකසාවතා, අයං සමුදයො. එවං වචීකම්මං, මනොකම්මං. යං කායකම්මං[5] අවඞ්කං අදොසං අකසාවං, යා අවඞ්කතා අදොසතා අකසාවතා, අයං මග්ගො. එවං වචීකම්මං මනොකම්මං. ඉමානි ද්වෙ සච්චානි සමුදයො ච මග්ගො ච.

---

1 තත්ථ යං – ම.
2 ආසා ච පිහා – ම.
3. අනනුබොධො අප්පටිවෙධො – ම.
4. පිධීයරෙ – ම.
5. 'යං කායකම්මං' මජ්ඣං, ඌනං.

එහි යම් කායගතාසතියක් ඇද්ද, යම් සළායතනයෙක් වේ ද, තෙල සියල්ල 'දුක්ඛ' යැ. යම් කායගතාසතියක් වූ ද යම් සීලසංවරයෙක් වේ ද යම් සමාධියෙක් වේ ද යම් අරමුණෙක යම් සතියක් වූ ද මෙ 'පඤ්ඤාක්ඛන්ධ' යැ. හැම සීලක්ඛන්ධ සමාධික්ඛන්ධ (එයින් ගන්නා ලද) මේ 'මග්ග' යැ. මෙබඳු විහරණ ඇතියහු විසින් නිර්වාණය දතයුතු යැ, මේ 'නිරොධ' යි. මේ තුන් සත්‍යයෝ යි.

සීලයෙහි පිහිටා සමථ යැ විපස්සනා යැ යන ධර්මයෝ දෙදෙන වැඩිය යුත්තාහ. එහි යම් චිත්තසහජාත ධර්මයෝ වෙත් ද, මේ 'දුක්ඛ' යැ, යම් සමථයෙක් වේ ද යම් විපස්සනාවක් වේ ද මේ 'මග්ග' යැ, රාගවිරාග–චෙතොවිමුක්තිය ද අවිජ්ජාවිරාග–පඤ්ඤාවිමුක්තිය ද යන මේ 'නිරොධ' යි. මේ තුන් සත්‍යයෝ යි.

එහි 'සමුදය ද නිරොධය ද' කවරෙ යත් :

28. අනාගතාර්ථ ආශංසනය කරන (පතන) ආශාව ද වර්තමානාර්ථ ප්‍රාර්ථනා කරන පිහාව ද නිෂ්පන්නාර්ථ ප්‍රතිපාලන කරන අභිනන්දනාව ද චක්ඛුධාතු ආදි අනෙකධාතු විෂයෙහි පිහිටි අවිද්‍යාමූලය ප්‍රභව කොට ඇති තෘෂ්ණා සංඛ්‍යාත සියලු ප්‍රජල්පිතයෝ මා විසින් මූල සහිත ව විගතාන්ත කරන ලද්දහු යැ.

එහි 'අඤ්ඤාණමූලප්පභවා' යි පූර්වපදයන්ගෙන් 'සමුදය' කියන ලද, 'සබ්බා මයා බ්‍යන්තිකතා සමූලකා'යි නිරොධය කියන ලදී, මේ දෙ සත්‍යයෝ යි.

"සතර ධර්ම කෙනකුන්ගේ අනවබොධයෙන් අප්‍රතිවෙධයෙන්" විස්තර කළයුතු යැ. ආර්‍ය්‍ය ශීලය සමාධිය ප්‍රඥව විමුක්තිය (නො පිළිවිදීමෙනැයි චතුක්කංගුත්තර – භණ්ඩගාමවග්ග විස්තර කළයුතු) එහි සතර ධර්මයන්ගේ යම් අනනුබොධයෙක් අපටිවෙධයෙක් වේ ද මේ "සමුදය" යැ. පටිවෙධය භවනෙත්ති සංඛ්‍යාත තෘෂ්ණාව දුරුලීම යැ, මේ 'නිරොධ' යි. මේ සමුදය හා නිරොධ යි.

එහි 'සමුදයත් මග්ගයත්' කවරෙ යැ :

29. (අජිතයෙනි'යි බුදුහු වදරති) ලොවැ යම් ස්‍රොතස් කෙනෙක් වෙත් නම් ස්මෘතිය ඔවුන්ගේ නිවාරණ යැ. (ඒ ස්මෘතිය) ස්‍රොතසුන්ගේ සංවරය යි කියමි. මාර්ගඥනයෙන් තෙල ස්‍රොතස්හු පියනු ලැබෙත්.

"යානි සොතානි" යන මේ 'සමුදය' යැ. යම් ප්‍රඥවකුත් යම් ස්මෘතියකුත් වේ ද, නිවාරණය හා විධානය ද මේ 'මග්ග' යැ. මේ දෙ සත්‍යයෝ යි.

'සඤ්චෙතනිය සූත්‍රය (දසකංගුත්තරයෙහි) ද, දළ්හනෙමියානකාර සමසකින් දක්වන ලද රියසක ද වේ. එහි යම් සවංක වූ සදෙස වූ කසට සහිත වූ කාය කර්මයක් වේ ද යම් සවංකබවක් සදෙසබවක් සකසාවබවක් වේ ද මේ 'සමුදය' යැ. වචීකම්ම මනොකම්ම ද මෙසේ යි. අවංක අදෙස අකසාව වූ යම් කායකර්මයක් වේ ද යම් අවංකබවක් අදෙස බවක් අකසාව බවක් වේ ද මේ "මග්ග" යැ. වචීකම්ම මනොකම්ම ද මෙසේ යැ. මේ සමුදය ද මග්ග ද යන දෙ සත්‍යයෝ යි.)

තත්ථ කතමො සමුදයො ච නිරොධො ච මග්ගො ච:

"නිස්සිතස්ස චලිතං, අනිස්සිතස්ස චලිතං නත්ථි, චලිතෙ අසති පස්සද්ධි, පස්සද්ධියා සති නති න හොති, නතියා අසති ආගති ගති න හොති, ආගතිගතියා අසති චුතූපපාතො න හොති, චුතූපපාතෙ අසති නෙවිධ න හුරං න උභයමන්තරෙන එසෙවන්තො දුක්ඛස්සා"ති.

තත්ථ යො නිස්සයො, අයං සමුදයො. යො ච අනිස්සයො, යා ච අනති අයං මග්ගො යා ආගතිගති න හොති, චුතූපපාතො ච, යො එසෙවන්තො දුක්ඛස්සා'ති, අයං නිරොධො. ඉමානි තීණි සච්චානි.

"අනුපට්ඨිතකාය සති[1] -පෙ- යං විමුත්තිඤාණදස්සනං අයං සමුදයො, එකාදස[2] උපනිස්සයා විමුත්තියො යාව උපනිස්සයසම්පදා[3] උපට්ඨිතකායසතිස්ස විහරති සීලසංවරො සොසන්තියො[4] හොති.

යං ච විමුත්තිඤාණදස්සනං අයං මග්ගො, යා ච විමුත්ති අයං නිරොධො. ඉමානි තීණි සච්චානි, සමුදයො ච නිරොධො ච මග්ගො ච.

තත්ථ කතමො නිරොධො ච මග්ගො ච:

30. සයං කතෙන කම්මෙන[5]
තෙන අත්තනා අභිනිබ්බානගතො විතිණ්ණකඞ්ඛො,
විභවං ච ඤත්වා ලොකස්මිං
තාව ඛීණපුනබ්භවො ස භික්ඛු.

යං 'කම්මෙන, අයං මග්ගො. යං ඛීණපුනබ්භවො' අයං නිරොධො. ඉමානි ද්වෙ සච්චානි.

"පඤ්ච විමුත්තායතනානි, සත්ථා වා ධම්මං දෙසෙති අඤ්ඤතරො වා විඤ්ඤූ සබ්‍රහ්මචාරී"ති" විත්ථාරෙන කාතබ්බා. තස්ස අත්ථපටිසංවෙදිස්ස[6] පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, අයං නිරොධො. එවං පඤ්ච විමුත්තායතනානි විත්ථාරෙන. ඉමානි ද්වෙ සච්චානි; නිරොධො ච මග්ගො ච.

ඉමානි සාධාරණානි සුත්තානි. ඉමෙහි සාධාරණෙහි සුත්තෙහි යථානිද්දිට්ඨෙහි පටිවෙධතො ච ලක්ඛණතො ච ඔතාරෙත්වා අඤ්ඤානි සුත්තානි නිද්දිසිතබ්බානි අපරිහාපෙන්තෙන.[7] ගාථාහි ගාථා අනුමිනිතබ්බා, බ්‍යාකරණෙහි බ්‍යාකරණං.

---

1. කායගතාසති - මජසං.
2. එකාරස - මජසං. PTS.
3. උපනිස්සයඋපසම්පදා - මජසං.
4. සොතානියො - මජසං.
5 සචෙවන - මජසං.
6. අත්ථප්පපටිසංවෙදිස්ස - ම.
7. අපරිහායන්තෙන - ම.[8]

එහි 'සමුදය නිරොධ හා මග්ග' කවරෙ යත් :

'(තණ්හාදිට්ඨීන්) නිඃශ්‍රය ඇතියහුට (චිත්තසන්තානයාගේ) කම්පනය වෙයි, අනිස්සිතයහට චලිතයෙක් නැති, චලිතය නැති කල්හි පස්සද්ධි (කාය චිත්ත දරථයන්ගේ සන්හිඳීම) වෙයි. පස්සද්ධිය ඇති කල්හි කාමාදිභවයෙහි නතිය (නැමීම) නො වෙයි. නතිය නැති කල්හි භවයෙන් භවයට පැමිණීමෙක් යෑමෙක් නො වෙයි. ආගති ගති නැති කල්හි චුති උත්පත්ති නො වෙයි. චුතුපපාත නැති කල්හි මෙ ලොවැ නො මැ වෙයි, පරලොවැ නො වෙයි. එ දෙලොවැ මැ නො වෙයි, තෙල උභය ලොකයාගේ නො පැවැත්ම මැ වට්ටදුක්ඛයාගේ අන්තය වේ'' යයි. (උද.න–පාටලිගාමියවග්ග, වෙදනා සංයුක්ත–ඡන්නවග්ග)

එහි (තණ්හා, දිට්ඨී, විසින්) නිස්සය දෙකෙකි, මේ 'සමුදය' යැ. යම් අනිඃශ්‍රයෙක් යම් අනතියක් වේ ද මේ 'මග්ග' යැ, යම් ආගති ගති නො වීමෙක් චුතුපපාත නො වීමෙක් වේ ද, යම් වට්ටදුක්ඛයාගේ අන්තයෙක් වේ ද, මේ 'නිරොධ' යි. මේ තුන් සත්‍යයෝ යි.

නො එළැඹැ සිටි කාගියා සී ඇතියේ ......... යම විමුක්ති ඥාන දර්ශනයක් ඇද්ද මේ නිරොධ යැ, සමුදය යැ (?) (එකාදස උපනිස්සයා ......... සොසනියො හොති ?)

යම් විමුක්ති ඥාන දර්ශන යක් ඇද්ද මේ මාර්ග යැ, යම් විමුක්තියක් ඇද්ද මෙ නිරොධ යැ, මොහු සමුදය ද නිරොධය ද මාර්ගය ද යන තුන් සත්‍යයෝ යි.

එහි නිරොධය ද මාර්ගය ද කවරෙ යැ :

30. (ස යං කතෙන ......... ?)

'කම්මෙන' යන මේ මාර්ග යැ, 'ඛිණපුනබ්භවො' යන මේ නිරොධ යැ. මේ සත්‍ය දෙකයි.

''විමුක්ති කාරණයෝ පස් දෙනෙකි—ශාස්තෲන් වහන්සේ හෝ විඥ වූ අන්‍යතර සබ්‍රම්සර කෙනෙක් හෝ දහම් දෙසන සේක'' යන (පඤ්චකංගුත්තර–පඤ්චංගිකවග්ග) මේ සූත්‍රය විස්තරයෙන් දක්විය යුතු. අර්ථප්‍රතිසංවෙදී වූ ඔහුට ප්‍රාමොද්‍යය (තරුණප්‍රීතිය) උපදී. ප්‍රමුදිත වූවහුට බලවත් ප්‍රීතිය උපදී ''නිබ්බින්දන්තො විරජ්ජති' යනු දක්වා විස්තර කළ යුතු ය, මේ 'මග්ග' යැ, (එහි) යම් විමුක්තියක් ඇද්ද මේ 'නිරොධ'' යි. මෙසේ පඤ්ච විමුත්තායතනයෝ විස්තරයෙන් දක්වියැ යුතු. මේ නිරොධය ද මග්ගය ද යන දෙ සත්‍යයෝ යි.

මේ සාධාරණ සූත්‍රයෝ යැ. නිර්දේශ කළ පරිදි මේ සාධාරණ සූත්‍රයන්ගෙන් ප්‍රතිවෙධ හෙයින් ද ලක්ෂණ හෙයින් ද අවතරණය කොට නො පිරිහෙළනුවහු විසින් අන්‍ය සූත්‍රයෝ දක්විය යුත්තාහු යැ. ගාථායෙන් ගාථා වෙය්‍යාකරණයෙන් වෙය්‍යාකරණය ප්‍රමාණ කළ යුත්තාහ.

ඉමෙ ච සාධාරණා දසපරිවජ්ජනා එකො ච චතුක්කො නිද්දෙසො සාධාරණො. අයං ච පකිණ්ණකනිද්දෙසො. එතං පඤ්ච ඡ ච සවෙතදෙසො සබ්බං. ඉමෙ ද්වෙ පරිවජ්ජනා පුරිමකා ච දස, ඉමෙ අට්ඨාදස පරිවජ්ජනා සච්චානි.

එත්තාවතා සබ්බං සුත්තං නත්ථි තං බ්‍යාකරණං වා ගාථා වා[1] ඉමෙහි අට්ඨාදසහි පරිවජ්ජනෙහි න ඔතරිතුං, අප්පමත්තෙන පරියෙසිත්වා නිද්දිසිතබ්බා.

තත්ථායං සඞ්ඛෙපො: සබ්බං දුක්ඛං සත්තහි පදෙහි සමොසරණං ගච්ඡති. කතරෙහි සත්තහි: අප්පියසම්පයොගො ච පියවිප්පයොගො ච ඉමෙහි ද්වීහි පදෙහි සබ්බං දුක්ඛං නිද්දිසිතබ්බං. තස්ස ද්වෙ නිස්සයා: කායො ච චිත්තං ච, තෙන වුච්චති "කායිකං දුක්ඛං චෙතසිකං ච"ති නත්ථි තං දුක්ඛං න කායිකං වා, න චෙතසිකං, සබ්බං දුක්ඛං ද්වීහි නිද්දිසිතබ්බං: කායිකෙන ච චෙතසිකෙන ච, තීහි දුක්ඛතාහි සඞ්ගහිතං: දුක්ඛදුක්ඛතාය සඞ්ඛාරදුක්ඛතාය විපරිණාමදුක්ඛතාය. ඉති තං සබ්බං දුක්ඛං තීහි දුක්ඛතාහි සඞ්ගහිතං, ඉති ඉදං ච දුක්ඛං තිවිධං, දුවිධං දුක්ඛං කායිකං ච චෙතසිකං ච, දුවිධං අප්පියසම්පයොගො ච පියවිප්පයොගො ච, ඉදං සත්තවිධං දුක්ඛං.

තත්ථ තිවිධො සමුදයො අවභූතො අපක්ඛමො.

කතමො තිවිධො: තණ්හා ච දිට්ඨි ච කම්මං ච.

තත්ථ තණ්හා ච භවසමුදයො. කම්මං තථාභිබ්බත්තස්ස හීනප්පණීතතා[2] අයං සමුදයො. ඉති යාපි භවගතීසු හීනතා ච පණීතතා ච, යාපි තීහි දුක්ඛතාහි සඞ්ගහිතා, යො'පි ද්වීහි මූලෙහි සමුදානීතො අවිජ්ජාය නිවුතස්ස භවතණ්හාසංයුත්තස්ස සවිඤ්ඤාණකො කායො, සො'පි තීහි දුක්ඛතාහි සඞ්ගහිතො.

තථා විපල්ලාසතො දිට්ඨි අවගාහතබ්බා[3] යා සත්තවිධා[4] නිද්දිසිතබ්බා එකො විපල්ලාසො තීණි නිද්දෙසානි චත්තාරි විපල්ලාසවත්ථූනි.

තත්ථ කතමො එකො විපල්ලාසො: යො විපරීතගාහො[5] පච්චක්ඛෙපෙන ඔතරණං යථා 'අනිච්චෙව නිච්චම්'ති විපරීතං ගණ්හාති. එවං චත්තාරො විපල්ලාසා. අයමෙතො විපල්ලාසීයති සඤ්ඤා චිත්තං දිට්ඨි.

කතමානි චත්තාරි විපල්ලාසවත්ථූනි: කායො වෙදනා චිත්තං ධම්මා.

එවං විපල්ලාසගතස්ස අකුසලං ච පවඩ්ඪති. තත්ථ සඤ්ඤාවිපල්ලාසො දොසං අකුසලමූලං පවඩ්ඪෙති. චිත්තවිපල්ලාසො ලොභං අකුසලමූලං පවඩ්ඪෙති, දිට්ඨිවිපල්ලාසො මොහං අකුසලමූලං පවඩ්ඪෙති. තත්ථ දොසස්ස අකුසලමූලස්ස තීණි මිච්ඡත්තානි ඵලං: මිච්ඡාවාචා, මිච්ඡාකම්මන්තො මිච්ඡාආජීවො. ලොභස්ස අකුසලමූලස්ස තීණි මිච්ඡත්තානි ඵලං: මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවායාමො මිච්ඡාසමාධි.

---

1. ගාථා විය – ම.
2. හීනපණීතතා – ම.
3. ආගනතබ්බා – PTS.
4. යා සත්තවිධා – PTS.
5. විසරීතගාහො – ම.

(ඉමෙ ච සාධාරණා ......... පරියෙසිත්වා නිද්දිසිතබ්බා ?)

එහි මේ සංක්ෂෙපය යැ : සියලු දුක්ඛය සත් පදයකින් සමොසරණයට (සංග්‍රහයට) යෙයි. කවර සත් පදයකින යත් : අප්‍රියසම්ප්‍රයොගය ද ප්‍රියවිප්‍රයොගය ද යන මේ දෙ පදයෙන් සියලු දුක්ඛය දක්විය යුතු. ඒ දුකට නිශ්‍රය දෙකෙකි : කය ද සිත ද යන දෙක යි. එයින් 'කායික දුක්ඛය ද චෛතසිකදුක්ඛය දැ'යි කියනු ලැබේ. කායික නො වූ හෝ චෛතසික නො වූ හෝ දුක්ඛයෙක් නැති. එහෙයින් සියලු දුක්ඛය කායික දුකින් ද චෛතසික දුකින් ද යන දෙකින් දක්විය යුතු. දුක්ඛදුක්ඛතායෙන් සංඛාරදුක්ඛතායෙන් විපරිණාම දුක්ඛතායෙන් යන තුන් දුක්ඛතායෙන් සංගෘහිත යැ. මෙසේ ඒ සියලු දුක්ඛය තුන් දුක්ඛතායෙන් සංගෘහිත යි. මෙසේ මේ ත්‍රිවිධ දුක්ඛය ද, කායික චෛතසික යන ද්විවිධ දුක්ඛය ද අප්පියසම්පයොග පියවිප්පයොග යන ද්විවිධ දුක්ඛය දැයි මේ සත්වැදෑරුම් දුක්ඛය වේ.

එහි සමුදය ත්‍රිවිධ වෙයි, සතරවැන්නෙක් නැත, පස්වැන්නෙක් නැති.

කවර ත්‍රිවිධයෙකැ යත් : තණ්හා යැ දිට්ඨි යැ, කම්ම යැ.

එහි තෘෂ්ණාව මැ සමුදය වේ. කර්මය නම් එසේ උපන්නහුගේ යම් හීන ප්‍රණීතතායෙක් වේ ද, මේ සමුදය යි. මෙසේ භවගතියෙහි යම් හීනප්‍රණීත බවක් ඇද්ද, තුන් දුඃඛතායෙන් සංගෘහිත වූ (යම් තණ්හාවක් ?) ඇද්ද, (තණ්හා අවිජ්ජා) ද්විමූලයෙන් උපදවන ලද අවිද්‍යාවෙන් නිවෘත වූ භවතෘෂ්ණායෙන් සංයුක්ත වූවහුගේ යම් සවිඥ්ඥාණක (පඤ්ච ස්කන්ධ)කයෙක් වේ ද එ ද තුන් දුඃඛතායෙන් සංගෘහීත යි.

එපරිදි විපල්ලාසයන්ගේ වශයෙන් දෘෂ්ටිය දතයුතු. යම දෘෂ්ටියක් සත්වැදෑරුම් කොට දක්වියයුත්තී ද එයයි. එක් විපල්ලාසයෙක් තුන් විපල්ලාස වස්තුවක් දක්වයි. විපල්ලාසවස්තු සතරක් වෙත්.

එහි එක් විපර්‍ය්‍යාසය කවරෙ යත් : යම් විපරීතග්‍රාහයෙක් ඇද්ද එය යි. ප්‍රතික්ෂෙප විසින් අවතරණය මෙසේ යැ : අනිත්‍යයෙහි නිත්‍ය යයි විපරීත කොට ගනී. මෙසේ සතර විපර්‍ය්‍යාසයෝ වෙත්. (විපරීත කොට ගනිත්). මේ එක් විපර්‍ය්‍යාසයෙක් සඤ්ඤා චිත්ත දිට්ඨී යන මේ විපර්‍ය්‍යස්ත කෙරෙයි.

සතර විපර්‍ය්‍යාස වස්තු කවරහ යත් : කාය වෙදනා චිත්ත ධර්ම යන මොහු යි.

මෙසේ විපර්‍ය්‍යාසයට ගියහුට අකුශලය ද වැඩෙයි. එහි සංඥාවිපර්‍ය්‍යාසය දෙසඅකුසල මූලය වඩයි. චිත්තවිපර්‍ය්‍යාසය ලොභ අකුසලමූලය වඩයි. දෘෂ්ටිවිපර්‍ය්‍යාසය මොහ අකුසලමූලය වඩයි. එහි දෙස අකුසලමූලයාගේ මිථ්‍යා වචන මිථ්‍යා කර්මාන්ත මිථ්‍යාආජීව යන තුන් මිච්ඡත්තයෝ ඵල යැ, ලොභ අකුශල මූලයාගේ මිථ්‍යාසංකල්ප මිථ්‍යා ව්‍යායාම මිථ්‍යා සමාධි යන තුන් මිච්ඡත්තයෝ ඵල යැ.

මොහස්ස අකුසලමූලස්ස ද්වෙ මිච්ඡත්තානි ඵලං : මිච්ඡාදිට්ඨි ච මිච්ඡාසති ච. එවං අකුසලං සහෙතු සප්පච්චයං විපල්ලාසා ච පච්චයො. අකුසලමූලානි සහෙතු, එතෙනෙව පටිපක්ඛෙන අනූනා අනධිකා ද්වීහි පච්චයෙහි නිද්දිසිතබ්බා. නිරොධො ච මග්ගො ච විපල්ලාසමූලපාදාය පරතො[1] පටිපක්ඛෙන.[2]

තත්ථිමා උද්දානගාථා :

(1) අවිජ්ජාය නිවුතො ලොකො - චිත්තං සංයොජනම්පි ච,
යා උච්ඡින්න[3]භවතණ්හා - ද්වෙධා චෙව විමුත්තියො.

(2) කුම්භූපමං කායමිමං - යං න කුම්භාකං ජහාථ,
සෙ තෙවී සොකා පරිදෙවා[4] - තිම්බරූකො[5] ච සයං කතං.

(3) දුක්ඛං දිට්ඨි ච උප්පන්නං - යං ච ගොපාලකූපමං,
සති කායගතා මාහු - සමථො ච විපස්සනා.

(4) ආසා පිහා ච අභිනන්දනා ච - චතුක්කමනනුබොධනා,
යානි සොතානි ලොකස්මිං - දළ්හනෙමියානකාරො.

(5) යං නිස්සිතස්ස චලිතං - අනුපට්ඨිතකාය සති,[6]
සයං කතෙන කම්මෙන[7] - විමුත්තායතනෙහි ච.

පෙටකොපදෙසෙ මහාකච්චායනෙන භාසිතෙ
අරියසච්චප්පකාසනා නාම පඨමභූමි සමත්තා.

---

1. පරිතො - PTS.
2. පටිපක්ඛෙන චතස්සො - මජසං.
3. සපච්ඡින්න - PTS.
යා පච්ඡින්න - මජසං
4. සොකපරිදෙවා - මජසං, PTS.
5. තිබ්බදූකො - PTS.
6. කායගතා සති - මජසං.
7. සයං කතෙන සචෙවන - මජසං PTS.

මොහ අකුසල මූලයාගේ මිථ්‍යා දෘෂ්ටි ද මිථ්‍යාස්මෘති ද යන දෙවැදෑරුම් මිච්ඡත්තයෝ එල යි. මෙසේ අකුශලය සහෙතු සප්‍රත්‍යය වෙයි. විපල්ලාසයෝ ද ප්‍රත්‍යය වෙයි. අකුශල මූලයෝ හෙතුසහිතයෝ යැ, තෙල අකුශලයෝ මැ ප්‍රතිපක්ෂ විසින් අනූන අනධික වූවාහු ප්‍රත්‍යය දෙකකින් දෑක්වියයුත්තාහු යි. නිරොධයෙහි ද මාර්ගයෙහි ද විපර්‍යාසය ගෙන පරභාවයෙන් ප්‍රතිපක්ෂ විසින් දෑක්වියයුත්තාහු යි.

එහි මේ උද්දාන ගාථා යැ :

(1) අවිජ්ජාය නිවුතො ලොකො යනු ද, චිත්තසංයුක්තයෙහි සංයොජන සූත්‍රය ද, 'උච්ඡින්නභවතණ්හස්ස' යනාදි ගය ද, දෙවැදෑරුම් විමුත්තීහු ද–

(2) 'කුම්භූපමං' යනාදි ගය ද, 'යං භික්ඛවෙ න තුම්හාකං' යනාදි දෙශනාව ද 'යෙ කෙචි සොකා' යනාදි ගය ද, 'සයංකතං, යනාදිය විචාළ තිම්බරුක පිරිවැජියා ද–

(3) දුඃඛ දෘෂ්ටි ප්‍රකාශිත ,'යො දුක්ඛමද්දක්ඛි' යනාදි ගය ද, ගොපාලකූපම සූත්‍රය ද, 'සති කායගතා යනාදි ගය ද, ශමථය හා විදර්ශනාව ද–

(4) 'ආසා පිහා ච' යනාදි ගය ද, 'චතුන්නං ධම්මානං' යනාදි දෙශනාව ද, 'යානි සොතානි' යනාදි ගය ද, 'දළ්හනෙමි' යානකාර ද–

(5) 'නිස්සිතස්ස චලිතං' යනාදි දෙශනාව ද 'අනුපට්ඨිත කායසති, යනාදිය ද, 'සයං කතෙන කම්මෙන' යනාදි ගය ද, විමුත්තායතනයන් ගෙන් ද සාධාරණ සූත්‍ර නිදර්ශිත යිං

මහාකාත්‍යායන තෙරණුවන් විසින් භාෂිත වූ පෙටකොපදෙසයෙහි
අරියසච්චප්පකාසනා නම් ප්‍රථම භූමිය සමාප්ත යි.

# 2. දුතියභූමි

තත්‍ථ කතමං සාසනපට්ඨානං:

1. සංකිලෙසභාගියං සුත්තං, 2. වාසනාභාගියං[1] සුත්තං, 3. නිබ්බෙධභාගියං සුත්තං, 4 අසෙඛභාගියං සුත්තං, 5. සංකිලෙසභාගියං ච වාසනාභාගියං ච[2], 6. සංකිලෙසභාගියං ච නිබ්බෙධභාගියං ච, 7. සංකිලෙසභාගියං ච නිබ්බෙධභාගියං ච අසෙඛභාගියං ච, 8. වාසනාභාගියං[3] ච නිබ්බෙධභාගියං ච. 9. ආණත්ති, 10. ඵලං, 11. උපායො, 12. ආණත්ති ච ඵලං ච, 13. ඵලං ච උපායො ච, 14. ආණත්ති ච ඵලං ච උපායො ච, 15. අස්සාදො, 16. ආදීනවො, 17. නිස්සරණං, 18. අස්සාදො ච ආදීනවො ච, 19. අස්සාදො ච නිස්සරණං ච, 20. ආදීනවො ච නිස්සරණං ච, 21. අස්සාදො ච ආදීනවො ච නිස්සරණං ච, 22. ලොකියං, 23 ලොකුත්තරං, 24. ලොකියං ච ලොකුත්තරං ච, 25. කම්මං, 26. විපාකො, 27. කම්මං ච විපාකො ච, 28. නිද්දිට්ඨං, 29. අනිද්දිට්ඨං, 30 නිද්දිට්ඨං ච අනිද්දිට්ඨං ච, 31. ඤාණං, 32. ඤෙය්‍යං, 33. ඤාණං ච ඤෙය්‍යං ච, 34. දස්සනං, 35. භාවනා, 36. දස්සනං ච භාවනා ච, 37. විපාකකම්මං, 38. න විපාකකම්මං, 39. නෙවවිපාකන විපාකකම්මං, 40. සකවචනං, 41. පරවචනං, 42. සකවචනං ච පරවචනං ච, 43. සත්තාධිට්ඨානං, 44. ධම්මාධිට්ඨානං, 45. සත්තාධිට්ඨානං ච ධම්මාධිට්ඨානං ච, 46. ථවො, 47. අනුඤ්ඤාතං, 48. පටික්ඛිත්තං, 49. අනුඤ්ඤාතං ච පටික්ඛිත්තං ච, 50. සකවචනාධිට්ඨානං, 51. පරවචනාධිට්ඨානං, 52 සකවචනාධිට්ඨානං ච පරවචනාධිට්ඨානං ච, 53. කිරියං, 54. ඵලං, 55. කිරියං ච ඵලං ච.

[තත්‍ථ, සකවචනාධිට්ඨානං, පරවචනාධිට්ඨානං, සකවචනාධිට්ඨානං ච පරවචනාදිට්ඨානං ච, කිරියං, ඵලං, කිරියං ච – ඉමානි ඡ පටික්ඛිත්තානි.]

(1) තත්‍ථ කතමං සංකිලෙසභාගියං සුත්තං:

1. කාමන්ධා ජාලසඤ්ඡන්නා – තණ්හාඡදනඡාදිතා,
පමත්තබන්ධනා[3] බද්ධා – මච්ඡාව කුම්ඹිනාමුඛෙ,
ජරාමරණමන්වෙන්ති – වච්ඡො ඛීරපකොව මාතරං.
"පඤ්චිමෙ භික්ඛවෙ නීවරණා".

(2) තත්‍ථ කතමං වාසනාභාගියං සුත්තං:

2. මනොපුබ්බඞ්ගමා ධම්මා – මනොසෙට්ඨා මනොමයා,
මනසා චෙ පසන්නෙන – භාසති වා කරොති වා,
තතො නං සුඛමන්වෙති – ඡායාව අනපායිනී.

සංයුත්තකෙ සුත්තං:[4] මහානාමස්ස සක්කස්ස ඉදං භගවා සක්‍යානං කපිලවත්ථුස්මිං නගරෙ නයවිහාරෙන, සද්ධාසීලපරිභාවිතං චිත්තං භාවනාඤ්ඤාන පරිභාවිතං තං නාම පච්ඡිමෙ කාලෙ.[ ? ]

1. වොදානභාගියං – නෙත්ති
2. අසෙක්ඛභාගියං – මජ්ඣං, PTS.
3. පමත්තබන්ධුනා – ම. PTS.
4 සුත්තං [illegible], PTS.

# 2. ද්විතීය භූමිය

එහි සාසනපට්ඨාන කවරෙ යත් :

1. සංකිලෙසභාගිය සූත්‍ර යැ 2. වාසනාභාගිය සූත්‍ර යැ 3. නිබ්බෙධභාගිය සූත්‍ර යැ 4. අසෙඛභාගිය සූත්‍ර යැ 5. සංකිලෙසභාගිය ද වාසනාභාගිය ද සූත්‍ර යැ 6. සංකිලෙසභාගිය ද නිබ්බෙධ භාගිය ද සූත්‍ර යැ 7. සංකිලෙසභාගිය ද නිබ්බෙධභාගිය ද අසෙඛභාගිය ද සූත්‍ර යැ 8. වාසනාභාගිය ද නිබ්බෙධභාගිය ද සූත්‍ර යැ 9. ආනත්ති යැ 10. ඵල යැ 11. උපාය යැ 12. ආනත්ති හා ඵල යැ 13. ඵලය හා උපාය යැ 14. ආනත්ති හා ඵලය හා උපාය යැ 15. අස්සාද යැ 16. ආදීනව යැ 17. නිස්සරණ යැ 18. අස්සාද හා ආදීනව යැ 19. අස්සාද හා නිස්සරණ යැ 20. ආනදීව හා නිස්සරණ යැ 21. අස්සාද හා ආදීනව හා නිස්සරණ යැ 22. ලෞකික යැ 23. ලොකොත්තර යැ 24. ලෞකික හා ලොකොත්තර යැ 25. කම්ම යැ 26. විපාක යැ 27. කම්ම හා විපාක යැ 28. නිර්දිෂ්ට යැ 29. අනිර්දිෂ්ට යැ 30. නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට යැ 31. ඥාන යැ 32. ඥෙය යැ 33. ඥාන හා ඥෙය යැ 34. දර්ශන යැ 35. භාවනා යැ 36. දර්ශන හා භාවනා යැ 37. විපාකකර්ම යැ 38. නවිපාක කර්ම යැ 39. නෙවවිපාක නවිපාක කර්ම යැ 40. සකවචන යැ 41. පරවචන යැ 42. සක වචන හා පරවචන යැ 43. සත්තාධිට්ඨාන යැ 44. ධම්මාධිට්ඨාන යැ 45. සත්තාධිට්ඨාන හා ධම්මාධිට්ඨාන යැ 46. ස්තව යැ 47. අනුඥ්ඥාත යැ 48. පටික්ඛිත්ත යැ 49. අනුඥ්ඥාත හා පටික්ඛිත්ත යැ 50. සකවචනාධිට්ඨාන යැ 51. පරවචනාධිට්ඨාන යැ 52. සකවචනාධිට්ඨාන හා පරවචනාධිට්ඨාන යැ 53. කිරිය යැ 54. ඵල යැ 55. කිරිය හා ඵල යි.

[එහි සකවචනාධිට්ඨාන යැ, පරවචනාධිට්ඨාන යැ, සක වචන හා පරවචනාධිට්ඨාන යැ, කිරිය යැ, ඵලයැ, කිරිය හා ඵලයැ, යන මේ සය (නිදසුන් දැක්වීමෙන්) පටික්ඛිත්ත යි.]

(1) එහි සංකිලෙස භාගිය සූත්‍රය කවරෙ යත් :

1. ක්ලෙශකාමයෙන් අන්ධ වූ තෘෂ්ණාජාලයෙන් වෙළුණු තෘෂ්ණා සංඛ්‍යාත අන්ධකාරයෙන් වැසුණු (සත්ත්වයෝ) කෙමින මුවෙහි (බැඳුණු) මසුන් මෙන් ප්‍රමාද නමැති බන්ධනයෙන් බැඳුණාහු මවුදෙන කරා එන කිරි බොන වස්සකු මෙන් ජරාවට හා මරණයට පුනපුනා පැමිණෙත්.

"පඤ්චිමෙ භික්ඛවෙ නීවරණා" (යනාදි සූත්‍රය දක්විය යුතු.)

(2) එහි වාසනාභාගිය සූත්‍රය කවරෙ යත් :

2. වෙදනාදි ස්කන්ධත්‍රය සංඛ්‍යාත ධර්මයෝ චාතුර්භූමක චිත්තය පෙරදැරි කොට ඇත්තාහු යැ, සිත අධිපති කොට ඇත්තාහු යැ, සිතින් මැ නිපන්නාහු යැ. ඉදින් අනභිධ්‍යාදීන් ප්‍රසන්න වූ සිතින් යුක්ත වැ කියා නම් හෝ කෙරේ නම් හෝ ඒ හේතුයෙන් තමා නො පියා යන සෙවණැල්ල සෙයින් කායික චෛතසික විපාකසුඛය ඒ පුද්ගලයා කැටිවැ යේ යයි.

සංයුත් සඟියෙහි සූත්‍රය : (සරකානිවග්ග–මහානාමසුත්ත) මේ සූත්‍රයෙහි බුදුහු ශාක්‍යයන්ගේ කිඹුල්වත් නුවරදී මහානාම ශාක්‍යහට නයවිස්තරයෙන් සද්ධා සීලාදි පරිභාවිතචිත්තය වදළහ. ......... (මෙහි පාඨය ආකුලය.)



5—ඒ 78576

(3) තත්ථ කතමං නිබ්බෙධභාගියං සුත්තං :

3 උද්ධං අධො සබ්බධි විප්පමුත්තො
අයමහමස්මී'ති අනානුපස්සී,
එවං විමුත්තො උදතාරි ඔඝං
අතිණ්ණපුබ්බං අපුනබ්භවාය.

"කිමත්ථියානි භන්තෙ කුසලානි සීලානි"[1] ආනන්දෙන පුච්ඡිති සත්ථාරං.

(4) තත්ථ කතමං අසෙඛභාගියං සුත්තං :

4. යස්ස සෙලූපමං චිත්තං – ඨිතං නානුපකම්පති
විරත්තං රජනීයෙසු – කොපනෙය්‍යෙ න කුප්පති,
යස්සෙවං භාවිතං චිත්තං – කුතො තං දුක්ඛමෙස්සතී'ති.

"ආයස්මා මං භන්තෙ සාරිපුත්තො ආසජ්ජ අප්පටිනිස්සජ්ජ චාරිකං පක්කන්තො"[2] සාරිපුත්තස්ස බ්‍යාකරණං කාතබ්බං. "යස්ස නූන භන්තෙ කායෙ කායගතාසති අනුපට්ඨිතා අස්ස"[3] විත්ථාරෙන කාතබ්බං.

(5) තත්ථ කතමං සංකිලෙසභාගියං ච වාසනාභාගියං ච සුත්තං :

5. ඡන්නමතිවස්සති – විවටං නාති වස්සති,
තස්මා ඡන්නං විවරෙථ – එවං තං නාතිවස්සති.

"ඡන්නමතිවස්සතී'ති සංකිලෙසො, "විවටං නාතිවස්සතී"ති වාසනා,

"තමොතමපරායනො"ති විත්ථාරෙන. තත්ථ යො ච තමො යො ච තමපරායනො, අයං සංකිලෙසො. යො ච ජොති, යො ච ජොතිපරායනො, අයං වාසනා.

(6) තත්ථ කතමං සංකිලෙසභාගියං ච නිබ්බෙධභාගියං ච සුත්තං :

6. න තං දළ්හං බන්ධනමාහු ධීරා
යදායසං දාරුජං බබ්බජං ච[4]
සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු,
පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා.

7. එතං දළ්හං බන්ධනමාහු ධීරා
ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං,
එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති[5]
අනපෙක්ඛිනො කාමසුඛං පහාය.*

---

1. සීලානි නුඛො භවන්ති කිමත්ථියානි – මජ්ඣං.
2. සාරිපුත්තො නාම භගවා ථෙරඤ්ඤතරො ගොමං ආසජ්ජ .... මජ්ඣං.
3. යස්ස නූන භගවා කායගතාසති අනුපට්ඨිතා අස්ස අබහුලීකතා – මජ්ඣං.
4. දාරුජපබ්බජඤ්ච – මජ්ඣං.
5. වජන්තිධීරා – ජ තත.
*. මජ්ඣං. – පොත්ථකෙ ඌනං.

(3) එහි නිබ්බෙධභාගිය සූත්‍රය කවරෙ යත් :

3. උඩ රූපාරූපධාතුයෙහි ද යට කාමධාතුයෙහි ද යන සියලු ත්‍රෛධාතුක ලොකයෙහි අශෛක්ෂ විමුක්තියෙන් මිදුණු රහත් මහණ 'මේ' මම වෙමි නො දක්නේ මෙසේ සෙබා සෙබවිමුක්තියෙන් මිදුණේ පුනර්භවය නොවනු පිණිස පෙර තරණය නො කළවිරූ කාමාදි චතුරොඝය තරණය කෙළේ යයි.

'වහන්ස අනවද්‍ය ශීලයෝ කුමක් අර්ථ කොට ඇත්තාහු දැයි අනඳ තෙරණුවෝ ශාස්තෲන් වහන්සේ විචාරති. (දසකංගුත්තර-ආනිසංසවග්ග).

(4) එහි අසෙඛභාගිය සූත්‍රය කවරෙ යත් :

4. යමක්හුගේ සිත ශෛලපර්වතයක් සෙයින් සිටියේ (අටලෝ දහමින් )නො සැලේ ද රාගොත්පත්තියට කාරණ වූ ත්‍රෛභූමක ධර්මයන්හි නො ඇලුණේ ද කෝප ඉපැද්මට කාරණ වූ ආඝාතවස්තු විෂයෙහි නො කිපේ ද යමක්හුගේ සිත මෙසේ භාවිත ද ඔහු කරා දුකෙක් කොයිබින් එන්නේ දැයි.

'වහන්ස, ආයුෂ්මත් ශාරිපුත්‍ර මා ගටා ඇවත නො දෙසා චාරිකාවට නික්මුණේ ය'යි (නවකංගුත්තර-සීහනාදවග්ග) වහන්ස යමකුට එකැතින් කයෙහි කාගියායි නො එළැඹ සිටී නම්'' යනාදි සාරිපුත්ත වෙයාකරණය විස්තර කළයුතු.

(5) එහි සංකිලෙසභාගිය ද වාසනාභාගිය ද සූත්‍රය කවරෙ යත් :

5. වසන ලද ඇවැත් ඇතියහු කෙලෙස් වැසි අතිශයින් තෙමයි, විවෘත වූයේ අතිශයින් නො තෙමයි. එහෙයින් ප්‍රතිච්ඡන්න වූ ඇවත ප්‍රකට කරවූ. මෙසේ ඒ දෙෂය හෙවත් ඇවැත් ඇතියහු කෙලෙස් වැසි අතිශයින් නො තෙමා.

''ඡන්නමතිවස්සති'' යනු සංකිලෙස යැ, ''විවටං නාතිවස්සති'' යනු වාසනා යි.

''තමොතමපරායනො'' යනාදිය විස්තරයෙන් කියැයුතු (කොසල සංයුත්ත.). එහි යම් තම පුහුලෙක් තමපරායන පුහුලෙකුත් වේ ද මේ සංකිලෙස යැ, යම් ජොති පුහුලෙක් යම් ජොතිපරායණ පුහුලෙකුත් වේ ද මේ වාසනා යි.

(6) එහි සංකිලෙසභාගිය ද නිබ්බෙධභාගිය ද සූත්‍රය කවරෙ යත් :

6. හැකිලිබැඳුම් සංඛ්‍යාත යමුවා වූ ද අන්දුබන්ධන සංඛ්‍යාත දැවමුවා වූ ද රජ්ජුබන්ධන සංඛ්‍යාත බබුස්තණ මුවා වූ ද යම් බන්ධනයෙක් ඇද්ද එය බුද්ධාදි පණ්ඩිත පුරුෂයෝ දෘඪ බැඳුමෙකැයි නො කියති, (අයි ආදියෙන් සිඳලියැ හැකි හෙයිනි.) මිණි කොඩොල් අඹුදරුවන් කෙරෙහි බලවත් රාගයෙන් ඇලුණු යම් අපේක්ෂායෙක් ඇද්ද—

7. (සිවු අපායෙහි හෙළන හෙයින්) යටට ඇදලන ලිහිල් වූ සිඳීමට දුෂ්කර වූ තෙල බන්ධනය දෘඪ වූයෙකැයි ධීරයෝ කියති, කාමයන්හි අපේක්ෂා රහිත වූවාහු තෙල බන්ධනය ද සිඳ කාමසුඛය හැරපියා ගිහිගෙන් නික්මැ යෙත්,

"න තං දළ්හං බන්ධනමාහු ධීරා -පෙ- පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා" අයං සංකිලෙසො. "එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති අනපෙක්ඛිනො කාමසුඛං පහාය"ති අයං නිබ්බෙධො.

"යං චෙතසිකං පකප්පිතං අනුසයිතං යා ච නාමරූපස්ස අවක්කන්ති හොති", ඉමෙහි චතූහි පදෙහි සංකිලෙසො. පච්ඡිමකෙහි චතූහි නිබ්බෙධො.

(7) තත්ථ කතමං සංකිලෙසභාගියං ච නිබ්බෙධභාගියං ච අසෙඛභාගියං ච සුත්තං :

8. අයං ලොකො සන්තාපජාතො
ඵස්සපරෙතො රොදං[1] වදති අත්තනො,
යෙන යෙන හි මඤ්ඤති
තතො තං හොති අඤ්ඤථා.

9. අඤ්ඤථාභාවී භවසත්තො ලොකො
භවපරෙතො භවමෙවාභිනන්දති,
යදභිනන්දති තං භයං
යස්ස භායති තං දුක්ඛං.

භවවිප්පහානාය ඛො පනිදං බ්‍රහ්මචරියං වුස්සති.

යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා භවෙන භවස්ස විප්පමොක්ඛමාහංසු, සබ්බෙ තෙ අවිප්පමුත්තා භවස්මා'ති වදාමි.

යෙ වා පන කෙචි සමණා වා බ්‍රාහ්මණා වා විභවෙන භවස්ස නිස්සරණමාහංසු, සබ්බෙ තෙ අනිස්සටා භවස්මා'ති වදාමි, උපධිං හි[2] පටිච්ච දුක්ඛමිදං සම්භොති.

සබ්බුපාදානක්ඛයා නත්ථි දුක්ඛස්ස සම්භවො,

ලොකමිමං පස්ස, පුථූ අවිජ්ජාය පරෙතං භූතං භූතරතං භවා අපරිමුත්තං.[3] යෙ හි කෙචි භවා සබ්බධි සබ්බත්ථතාය,[4] සබ්බෙ තෙ භවා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා'ති.

10. එවමෙතං යථාභූතං – සම්මප්පඤ්ඤාය පස්සතො
භවතණ්හා පහීයති – විභවං නාභිනන්දති.

සබ්බසො තණ්හානං ඛයා – අසෙසවිරාගනිරොධා නිබ්බානං.

11. තස්ස නිබ්බුතස්ස භික්ඛුනො
අනුපාදා පුනබ්භවො න හොති,
අභිභූතො මාරො විජිතසඞ්ගාමො
උපච්චගා[5] සබ්බභවානි තාදී'ති.

---

1. රොගං – උදාන, මජ්ඣං
2. උපධිං – උදාන. / උපදිං හි – මජ්ඣං.
3. පරෙතා භූතා භූතාරතා භවා අපරිමුත්තා – මජ්ඣං.
4. සබ්බත්ථතාය – මජ්ඣං.
5. උපෙච්චගා – මජ්ඣං.

''න තං දළ්හං බන්ධනමාහු ධීරා ......... පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා'' මේ සංකිලෙස යැ, ''එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති අනපෙක්ඛිනො කාමසුඛං පහාය'' යන මේ නිබ්බෙධ යි.

අකුශලචෙතනා විසින් යම් සිතීමක් කයින් වචසින් කරන ලද්දක් අනුසය වශයෙන් පැවැත්මක් වේ ද යම් නාමරූපයාගේ අවක්‍රාන්තියක් වේ ද, මේ සතර පදයෙන් සංකිලෙසය වෙයි. පසුව දැක්වූ සතරපදයෙන් නිබ්බෙධ යි (නෙත්ති 226 පිට)

(7) එහි සංකිලෙසභාගිය ද නිබ්බෙධභාගිය ද අසෙඛභාගිය ද සූත්‍රය කවරෙ යත් :

8. මේ සත්ත්වලොක තෙමේ (ඥාතිව්‍යසනාදීන්) උපන් ශොක සන්තාප ඇත්තේ දුක්පහසින් මඩනා ලදුයේ (මෙබඳු දුකක් මාගේ සතුරකුටත් නො වේවයි) වැලැපෙමින් කියයි. යම් යම් පරිද්දෙකින් මැ තමාගේ දුකට පිළියම් සිතයි ද ඒ දුකට එයින් අන් පරිද්දෙකින් පිළියම් කටයුතු වේ.

9. කාමාදි භවයෙහි හෝ අභිවෘද්ධියෙහි ඇලුණු ලෝ වැසි තෙමේ (තමා සිතන සැටියෙන්) අන් පරිද්දෙකින් මැ වනසුලු වෙයි, එතෙකුදුවත් භවයෙහි ඇලුණේ භවය මැ කැමැති වෙයි, යම් භවයක් හෝ අභිවෘද්ධියක් කැමැති වේ ද එය බියෙකි, යම් ජරාමරණාදියකින් බිය වේ ද එය දුකෙකි.

කාමාදි භවයාගේ ප්‍රහාණය පිණිස මැ මේ මාර්ගබ්‍රහ්මචර්යාව පුරයි.

යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ කාමාදි භවයෙන් භවයාගේ විමුක්තිය කීවාහු ද ඔහු සියල්ලෝ භවයෙන් නොමිදුණාහ'යි කියමි.

යළි යම් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ රූපාරූපභවයෙන් භවයාගේ නිස්සරණය කියත් ද ඔහු සියල්ලෝ භවයෙන් නො මිදුණහ'යි කියමි. බන්ධාදි උපධීන් නිසා මැ මේ සසරදුක හටගනී.

සියලු කාමාදි උපාදනයන්ගේ ක්ෂය වීමෙන් දුඃඛයාගේ සම්භවයෙක් නැත.

(බුදුහු තමන් වහන්සේගේ සිත අමතන සේක.) වෙන වෙන පඤ්චස්කන්ධ වූ අවිද්‍යායෙන් මඩනා ලද ස්ත්‍රී පුරුෂයන් ඔවුනොවුන් කෙරෙහි ඇලුණු එහෙයින් මැ භවයෙන් නොමිදුණු මේ සත්ත්වලොකය බල. යම් කිසි කාමාදි භවයෝ වෙත් ද උඩයට ආදි සියලු තන්හි සර්වභාවයෙන් එ හැම භවයෝ අනිත්‍යයහ, දුඃඛයහ, විපරිණාම ස්වභාව වූහ යි.

10. මෙයේ ත්‍රිලක්ෂණප්‍රතිවෙධාකාරයෙන් තෙල භව සංඛ්‍යාත පඤ්චස්කන්ධය තත්වූ පරිදි විදර්ශනා සහිත මාර්ගඥානයෙන් දක්නාහට භවතෘෂ්ණාව ප්‍රහීණ වෙයි, උච්ඡෙදය ද නො කැමැති වේ.

සර්වප්‍රකාරයෙන් තෘෂ්ණාවන්ගේ ක්ෂය වීමෙන් අශෙෂ කොට ආර්‍යමාර්ගයෙන් වූ අනුත්පාදනිරොධය නිර්වාණ යි.

11. ඒ කෙලෙස්පිරිනිවනින් නිවුණු මහණහට උපාදන රහිත හෙයින් පුනර්භවය නො වේ. ක්ලේශාදි පඤ්චමාර මඩනාලද. ක්ලේශසංග්‍රාමය දිනනලද, සුඛදුක්ඛාදියෙහි තාදී වූයේ සියලු භවයන් ඉක්මැවූයේ යි.

“අයං ලොකො සන්තාපජාතො” යාව “දුක්ඛ”න්ති අයං තණ්හාසංකිලෙසො.

(යං පුනාහ භගවා) යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා භවෙන භවස්ස විප්පමොක්ඛමාහංසු, සබ්බෙ තෙ අවිමුත්තා භවස්මා’ති වදාමි, යෙ වා පන කෙචි සමණා වා බ්‍රාහ්මණා වා විභවෙන භවස්ස නිස්සරණමාහංසු, සබ්බෙ තෙ අනිස්සටා භවස්මා’ති වදාමි. අයං දිට්ඨිසංකිලෙසො.

තං දිට්ඨිසංකිලෙසො ච තණ්හාසංකිලෙසො ච උභයමෙතං සංකිලෙසභාගියං.[1]

(යං පුනාහ භගවා) භවවිප්පහානාය ඛො පනිදං බ්‍රහ්මචරියං වුස්සතී.” යාව “සබ්බූපාදානක්ඛයා නත්ථි දුක්ඛස්ස සම්භවො”[2] “සබ්බසො තණ්හානං ඛයා අසෙසවිරාගනිරොධො නිබ්බානං..” ඉදං නිබ්බෙධභාගියං.

“තස්ස නිබ්බුතස්ස භික්ඛුනො” යාව “උපච්චගා සබ්බභවානි තාදී”ති ඉදං අසෙඛභාගියං.

“චත්තාරො පුග්ගලා: අනුසොතගාමී සංකිලෙසො, ඨිතත්තො ච පටිසොතගාමී ච නිබ්බෙධො, ථලෙ තිට්ඨතී’ති අසෙඛභූමි.

(8) තත්ථ කතමං වාසනාභාගියං ච නිබ්බෙධභාගියං ච සුත්තං:

12. දදතො පුඤ්ඤං පවඩ්ඪති
සංයමතො වෙරං න චීයති,
කුසලො ච ජහාති පාපකං
රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො’ති.

“දදතො පුඤ්ඤං පවඩ්ඪති සංයමතො වෙරං න චීයතී”ති වාසනා, කුසලො ච ජහාති පාපකං රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො”ති නිබ්බෙධො.

“සොතානුධතෙසු[3] ධම්මෙසු වචසා පරිචිතෙසු මනසානුපෙක්ඛිතෙසු දිට්ඨියා සුප්පටිවිද්ධෙසු පඤ්චානිසංසා පාටිකඞ්ඛා: ඉධෙකච්චස්ස බහුස්සුතා ධම්මා හොන්ති ධාතා[4] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා, සො යුඤ්ජන්තො ඝටෙන්තො වායමන්තො.[5] දිට්ඨෙව ධම්මෙ විසෙසං පප්පොති. නො චෙ දිට්ඨෙව ධම්මෙ විසෙසං පප්පොති, ගිලානො පප්පොති. නො චෙ ගිලානො පප්පොති, මරණකාලසමයෙ පප්පොති. නො චෙ මරණකාලසමයෙ පප්පොති, දෙවභූතො පාපුණාති. නො චෙ දෙවභූතො පාපුණාති, තෙන ධම්මරාගෙන තාය ධම්මනන්දියා පච්චෙකබොධිං පාපුණාති.

---

1. සංකිලෙසො - ම. PTS.
2. පාඨො’යං මජ්ඣං, ව්‍යාකුලො දිස්සති.
3. ගතෙසු - මජ්ඣං, PTS.
4. ධාතා අපමුට්ඨා - මජ්ඣං. PTS.
5. වායාමන්තො - ම.

"අයං ලොකො සන්තාපජාතො" යනු පටන් 'දුක්ඛං' යනු දක්වා මේ තණ්හාසංකිලෙස යැ.

(යට කියන ලද) "යෙහි කෙචි සමණාවා බ්‍රාහ්මණා වා –පෙ– සබ්බෙ තෙ අවිමුත්තා භවස්මාති වදමි. යෙවා පන කෙචි –පෙ– සබ්බෙ තෙ අනිස්සටා භවස්මාති වදමි", මේ දිට්ඨිසංකිලෙස යි.

ඒ දිට්ඨිසංකිලෙසය ද තණ්හාසංකිලෙසය ද යන දෙක මැ සංකිලෙසභාගිය යි.

(යට කියන ලද) "භවවිප්පහානාය ඛො පනිදං බ්‍රහ්මචරියං වුස්සති" යනු පටන් "සබ්බුපාදානක්ඛයා නත්ථි දුක්ඛස්ස සම්භවො" "සබ්බසො තණ්හානං ඛයා අසෙස විරාගනිරොධො නිබ්බානං" යනු දක්වා මේ නිබ්බෙධභාගිය යැ.

"තස්ස නිබ්බුතස්ස භික්ඛුනො" යනු පටන් "උපච්චගා සබ්බභවානි තාදී" යනු දක්වා මේ අසෙඛභාගිය යි.

පුද්ගලයෝ සතර දෙනෙකි : අනුසොතගාමී වූයේ සංකිලේස යැ, ඨිතත්ත පුද්ගල හා පටිසොතගාමී වූයේ ද නිබ්බෙධභාගී යැ, නිවන්තෙලෙහි සිටී යනු අසෙඛ භූමි යි.

(8) එහි වාසනාභාගිය ද නිබ්බෙධභාගිය ද සූත්‍රය කවරෙ යත් :

12. දන් දෙනුවහුට දානමය පින වැඩෙයි, ශීලසංයමයෙන් සංවරයෙහි සිටියහුට වෛරය නො පවතී, ඥානසම්පන්න වූයේ ලාමක වූ කාමච්ඡන්දදිය (වික්ඛම්භණ සමුච්ඡෙද විසින්) දුරුලයි, හේ රාග දෙස මොහයන්ගේ ක්ෂය වීමෙන් පිරිනිවියේ වේ යයි.

"දදතො පුඤ්ඤං පවඩ්ඪති සංයමතො වෙරං න චීයති" යනු වාසනා යැ, "කුසලො ච ජහාති පාපකං රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො" යනු නිබ්බෙධ යි.

නවාංග පර්‍යාප්තිධර්මය ප්‍රසාදශ්‍රොත්‍රය යොමු කොට නුවණින් නිශ්චය කළ කල්හි වචනයෙන් පුහුණු කළ කල්හි සිතින් විමසූ කල්හි නුවණින් ප්‍රතිවෙධ කළ කල්හි පඤ්ච ආනිසංස කෙනෙක් කැමැති විය යුත්තාහ : මෙ සස්නෙහි ඇතැම් පුහුලක්හු විසින් පර්‍යාප්තිධර්මයෝ බොහෝ කොට අසන ලද්දහු වෙති, වචනයෙන් පුහුණු කරන ලද්දහු සිතින් විමසන ලද්දහු නුවණින් ප්‍රතිවෙධ කරන ලද්දහු වෙති. හේ යොගයෙහි යෙදෙමින් ගැටෙමින් වෑයම් කරනුයේ දිට්ඨධම්යෙහි මැ නිවනට පැමිණෙයි, ඉදින් දිට්ඨධම්යෙහි විශෙෂයට නො පැමිණියේ නම් ගිලන් වූයේ පැමිණෙයි, ඉදින් ගිලන් වූයේ නො පැමිණේ නම් මරණකාලයෙහි පැමිණෙයි, ඉදින් මරණකාලයෙහි නො පැමිණියේ නම් දෙව් වූයේ පැමිණෙයි, ඉදින් දෙව්වූයේ නො පැමිණේ නම් ඒ ධර්මරාගයෙන් ඒ ධර්මනන්දියෙන් පසේබුදුබවට පැමිණේ.

තත්ථ යං[1] දිට්ඨෙව ධම්මෙ පාපුණාති, අයං නිබ්බෙධො. යං සම්පරායෙ පච්චෙකබොධිං පාපුණාති, අයං වාසනා.

ඉමානි සොළස සුත්තානි සබ්බසාසනං අභිගණ්හෙත්වා තිට්ඨන්ති. ඉමෙහි සොළසහි සුත්තෙහි නවවිධො සුත්තන්තො විභත්තො භවති. සො ච පඤ්ඤවතො නො දුප්පඤ්ඤස්ස, සුතවතස්ස නො අස්සුතවතස්ස, අකම්මස්ස විහාරිස්ස.

පකතීයා ලොකො[2] සංකිලෙසො චරති. සො සංකිලෙසො තිවිධො: තණ්හාසංකිලෙසො දිට්ඨිසංකිලෙසො දුච්චරිතසංකිලෙසො. තතො සංකිලෙසතො උට්ඨහන්තා සංකිලෙසධම්මෙසු[3] පතිට්ඨහන්ති ලොකියෙසු පතිට්ඨහන්ති, තත්ථාකුසලො දිට්ඨිතො[4] සචෙ තං සීලං ච දිට්ඨිං ච පරාමසති, තස්ස සො තණ්හාසංකිලෙසො හොති. සචෙ පනස්ස එවං හොති: 'ඉමිනා'හං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි[5] දෙවඤ්ඤතරො වා'ති, සාස්ස[6]. හොති මිච්ඡාදිට්ඨි, සො තස්ස[6] මිච්ඡාදිට්ඨිසංකිලෙසො භවති.

සචෙ පන සීලෙ පතිට්ඨිතො අපරාමට්ඨස්ස හි සීලවතං හොති, තස්ස තං සීලවතං[7] යොනිසො ගහිතං අවිප්පටිසාරං[8] ජනෙති, (යාව-විමුත්තිඤාණදස්සනං) තං ච තස්ස දිට්ඨෙව ධම්මෙ කාලකතස්ස[9] වා තමහියෙව වා පන අපරපරියායෙ[10] වා අඤ්ඤෙසු ඛන්ධෙසු එවං සුත්තං: 'සුචරිතං වාසනාය සංවත්තතී'ති වාසනාභාගියං සුත්තං වුච්චති.

තත්ථ සීලෙසු ඨිතස්සපි නීවරණචිත්තං, තං තතො සක්කාය-දිට්ඨිප්පහානාය භගවා ධම්මං දෙසෙති, සො අච්චන්තනිට්ඨං නිබ්බානං පාපුණාති; යදි වා සාසනන්තරෙ අච්චන්තනිට්ඨං නිබ්බානං පාපුණාති, යදි වා එකාසනෙ ඡඅභිඤ්ඤො. තත්ථ ද්වෙ පුග්ගලා අරියධම්මෙ පාපුණන්ති; සද්ධානුසාරී ච ධම්මානුසාරී ච. තත්ථ ධම්මානුසාරී උග්ඝටිතඤ්ඤූ සද්ධානුසාරී නෙය්‍යො. තත්ථ උග්ඝටිතඤ්ඤූ දුවිධො: කොචි තික්ඛින්ද්‍රියො කොචි මුදින්ද්‍රියො. තත්ථ නෙය්‍යොපි දුවිධො කොචි තික්ඛින්ද්‍රියො කොචි මුදින්ද්‍රියො. තත්ථ යො ච උග්ඝටිතඤ්ඤූ මුදින්ද්‍රියො, යො ච නෙය්‍යො තික්ඛින්ද්‍රියො, ඉමෙ පුග්ගලා අසමින්ද්‍රියා හොන්ති. තත්ථ ඉමෙ පුග්ගලා සමින්ද්‍රියා[11] පරිහායන්ති ච උග්ඝටිතඤ්ඤුතො, විපඤ්චිතඤ්ඤූ නෙය්‍යතො, ඉමෙ මජ්ඣිමා භූමිගතා විපඤ්චිතඤ්ඤූ හොන්ති ඉමෙ තයො පුග්ගලා.

---

1. තත්ථායං – ම PTS.
2. ලොකො – ම, PTS.
3. සංකිලෙසො ධම්මෙසු – මජසං, PTS.
4. දිට්ඨතො – මජසං, PTS.
5. භවිස්සං – ම.
6. යස්ස – ම
7. සීලවතො – මජසං, PTS,
8. අප්පටිසාරං – PTS.
9. කාලඞ්කතස්ස – ම.
10. අපරාපරියායෙන – මජසං
11. සද්ධින්ද්‍රියා – PTS

එහි ඉහාත්මයෙහි මැ නිවනට පැමිණේ ද මේ නිබ්බෙධ යැ, සම්පරායභවයෙහි පසේබුදු බවට පැමිණේ ද මේ වාසනා යි.

මේ සොළොස් සූත්‍රයෝ සියලු ශාසනය ඇතුළත් කොට ගනිමින් සිටිත්. මේ සොළොස් සූත්‍රයෙන් නවවිධ සූත්‍රාන්තය විභාග කරන ලද්දේ වෙයි. හෙ ද නුවණැත්තහුට යැ දුෂ්ප්‍රාඥහට නො වෙයි, යොගයෙහි යෙදුණහුට යැ අයුක්තයහට නො වෙයි, අකර්මවිහාරි හූට යැ.

පියවින් ලෝවැයි තෙම සංකිලෙස ඇති වැ හැසිරෙයි. ඒ සංකිලෙසය ත්‍රිවිධ ය තණ්හාසංකිලෙස යැ දිට්ඨිසංකිලෙස යැ දුච්චරිතසංකිලෙය යි. ඒ සංකිලෙසයෙන් නැඟී සිටිනුයේ සංකිලෙස ධර්මයන්හි පිහිටයි. ලෞකික ධර්මයන්හි පිහිටන හෙයිනි. එහි, අදක්ෂ වූයේ ඉදින් දිට්ඨි විසින් ඒ ශීලයත් දෘෂ්ටියත් පරාමර්ශ කෙරේ ද, ඔහුට ඒ පරාමර්ශය තණ්හාසංකිලෙස වෙයි. ඉදින් ඔහුට මෙබඳු සිතෙක් වේ ද, ''මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍යයෙන් හෝ දෙවියෙක් හෝ දෙවාන්‍යතරයෙක් හෝ වන්නෙමි'යි ඒ ඔහුට මිථ්‍යාදෘෂ්ටි වෙයි, ඒ ඔහුට මිච්ඡාදිට්ඨිසංකිලෙසය වේ.

ඉදින් වැලිත් සීලයෙහි පිහිටියේ වේ ද යම්හෙයකින් දෘෂ්ටිපරාමර්ශ නො කළහුගේ ශීලව්‍රතය වේ ද, ඔහුට නුවණින් ගන්නා ලද ඒ ශීලව්‍රතය අවිප්‍රතිසාරය උපදවයි. (විමුත්ති ඤාණදස්සනය දක්වා විස්තර කළයුතු-දසකංගුත්තර ආනිසංසවග්ගං) එ ද ඔහුට ඉහාත්ම යෙහි මැ වෙයි, කලුරිය කළහුට හෝ ඒ අත්බැව්හි මැ හෝ අපරපරියාය වශයෙන් අන්‍ය ස්කන්ධයන්හි හෝ (අවිප්පටිසාරාදිය වෙයි.) 'සුචරිතය වාසනා පිණිස පවතී' යයි මෙසේ අසන ලද ද මේ වාසනාභාගිය සූත්‍ර යයි කියනු ලැබේ.

එහි ශීලයෙහි සිටියහුට ද නීවරණවිත්තය වෙයි එහෙයින් බුදුහු සත්කායදෘෂ්ටිප්‍රහාණය පිණිස දහම් දෙයනසේක. හේ අත්‍යන්ත නිෂ්ඨා වූ නිවනට පැමිණෙයි, නොහොත් අන්‍ය ශාසනයෙක්හි අත්‍යන්තනිෂ්ඨා වූ නිවනට පැමිණෙයි. නොහොත් එක් ආසනයෙහි හුන්නේ ෂඩභිඥ වෙයි. එහි පුද්ගලයෝ දෙදෙනෙක් ආර්‍යධර්මයන්ට පැමිණෙති ; සද්ධානුසාරී ද ධම්මානුසාරී ද යන මොහු යි. එහි ධම්මානුසාරී වූයේ උද්ඝටිතඥ යැ, සද්ධානුසාරී වූයේ නෙයපුද්ගල යි. එහි උද්ඝටිතඥ ද්විවිධ යැ : කිසිවෙක් තික්ඛින්ද්‍රිය යැ කිසි වෙක් මුදින්ද්‍රිය යි. එහි නෙයපුද්ගල ද ද්විවිධ යැ ; කිසිවෙක් තික්ඛින්ද්‍රිය යැ, කිසිවෙක් මුදින්ද්‍රිය යි. එහි යම් උග්ඝටිතඥඥ මුදින්ද්‍රිය පුද්ගලයෙකුත් යම් නෙයාතික්ඛින්ද්‍රිය පුද්ගලයෙකුත් වේ ද, මේ පුද්ගලයෝ අසමඉන්ද්‍රිය ඇත්තාහු වෙති, එහි මේ පුද්ගලයෝ සම ඉන්ද්‍රිය ඇත්තාහු උද්ඝටිතඥයා කෙරෙන් පිරිහෙන්නාහු ද වෙති, විපඤ්චිතඥ නෙයපුද්ගලයා කෙරෙන් පිරිහෙයි, මොහු මධ්‍යම භූමිගත වූවාහු විපඤ්චිතඥ වෙත්. මේ තුන් පුද්ගලයෝ යි.

තත්ථ චතුත්ථා පන පඤ්චමා උග්ඝටිතඤ්ඤූ විපඤ්චිතඤ්ඤූ නෙය්‍යො ච. තත්ථ උග්ඝටිතඤ්ඤූ පුග්ගලො ඉන්ද්‍රියානි පටිලභිත්වා දස්සනභූමියං ඨිතො සොතාපත්තිඵලං ච පාපුණාති එකබීජී හොති පඨමො සොතාපන්නො. තත්ථ විපඤ්චිතඤ්ඤූ පුග්ගලො ඉන්ද්‍රියානි පටිලභිත්වා දස්සනභූමියං ඨිතො සොතාපත්තිඵලං ච පාපුණාති, කොලංකොලො ච හොති දුතියො සොතාපන්නො. තත්ථ නෙය්‍යො පුග්ගලො ඉන්ද්‍රියානි පටිලභිත්වා දස්සනභූමියං ඨිතො සොතාපත්තිඵලං ච පාපුණාති, සත්තක්ඛත්තුපරමො ච හොති, අයං තතියො සොතාපන්නො. ඉමෙ තයො පුග්ගලා ඉන්ද්‍රියවෙමත්තතාය සොතාපත්තිඵලෙ ඨිතා. උග්ඝටිතඤ්ඤූ එකබීජී හොති. විපඤ්චිතඤ්ඤූ කොලංකොලො හොති, නෙය්‍යො සත්තක්ඛත්තුපරමො හොති.

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

සචෙ පන භද්දුත්තරිං වායමති, අච්චන්තනිට්ඨං නිබ්බානං පාපුණාති. තත්ථ උග්ඝටිතඤ්ඤූ පුග්ගලො යො තික්ඛින්ද්‍රියො, තෙ ද්වෙ පුග්ගලා හොන්ති: අනාගාමිඵලං පාපුණිත්වා අන්තරාපරිනිබ්බායී ච උපහච්චපරිනිබ්බායී ච. තත්ථ විපඤ්චිතඤ්ඤූ පුග්ගලො යො තික්ඛින්ද්‍රියො, තෙ ද්වෙ පුග්ගලා හොන්ති: අනාගාමිඵලං පාපුණිත්වා[1] අසඞ්ඛාරපරිනිබ්බායී ච සසඞ්ඛාරපරිනිබ්බායී ච. තත්ථ නෙය්‍යො අනාගාමිඵලං පාපුණන්තො උද්ධංසොතො අකනිට්ඨගාමී හොති. උග්ඝටිතඤ්ඤූ ච විපඤ්චිතඤ්ඤූ ච ඉන්ද්‍රියනානත්තෙන උග්ඝටිතඤ්ඤූ පුග්ගලො තික්ඛින්ද්‍රියො අන්තරාපරිනිබ්බායී හොති උග්ඝටිතඤ්ඤූ මුදින්ද්‍රියො උද්ධංසොතො අකනිට්ඨගාමී හොති. උග්ඝටිතඤ්ඤූ ච විපඤ්චිතඤ්ඤූ ච ඉන්ද්‍රියනානත්තෙන උග්ඝටිතඤ්ඤූ පුග්ගලො තික්ඛින්ද්‍රියො සසඞ්ඛාරපරිනිබ්බායී හොති, තික්ඛින්ද්‍රියො අන්තරාපරිනිබ්බායී හොති, උග්ඝටිතඤ්ඤූ මුදින්ද්‍රියො අසඞ්ඛාරපරිනිබ්බායී හොති. විපඤ්චිතඤ්ඤූ තික්ඛින්ද්‍රියො අසඞ්ඛාරපරිනිබ්බායී හොති, විපඤ්චිතඤ්ඤූ මුදින්ද්‍රියො සසඞ්ඛාරපරිනිබ්බායී හොති, නෙය්‍යො උපහච්චපරිනිබ්බායී හොති, විපඤ්චිතඤ්ඤූ තික්ඛින්ද්‍රියො අසඞ්ඛාරපරිනිබ්බායී හොති, විපඤ්චිතඤ්ඤූ මුදින්ද්‍රියො සසඞ්ඛාරපරිනිබ්බායී හොති, නෙය්‍යො උද්ධංසොතො අකනිට්ඨගාමී හොති, ඉති පඤ්ච අනාගාමිනො, ඡට්ඨො සකදාගාමී, තයො ච සොතාපන්නාති ඉමෙ නව සෙක්ඛා.

තත්ථ උග්ඝටිතඤ්ඤූ පුග්ගලො තික්ඛින්ද්‍රියො අරහත්තං පාපුණන්තො ද්වෙ දුග්ගලා හොන්ති: උභතොභාගවිමුත්තො පඤ්ඤාවිමුත්තො ච. තත්ථ උග්ඝටිතඤ්ඤූ පුග්ගලො මුදින්ද්‍රියො අරහත්තං පාපුණන්තො ද්වෙ පුග්ගලා හොන්ති: ඨිතකප්පී ච පටිවෙධනභාවො ච. තත්ථ විපඤ්චිතඤ්ඤූ පුග්ගලො ච තික්ඛින්ද්‍රියො අරහත්තං පාපුණන්තො ද්වෙ පුග්ගලා හොන්ති: චෙතනාභබ්බො ච රක්ඛණභබ්බො ච. තත්ථ විපඤ්චිතඤ්ඤූ මුදින්ද්‍රියො අරහත්තං පාපුණන්තො ද්වෙ පුග්ගලා හොන්ති: සචෙ චෙතෙති න පරිනිබ්බාති, නො චෙ අනුරක්ඛති පරිනිබ්බායී'ති. තත්ථ නෙය්‍යො පුග්ගලො භාවනානුයොගමනුයුත්තො පරිහානධම්මො හොති කම්මනියතො වා සමසීසී වා. ඉමෙ නව අරහන්තො.

1. පාපුණන්ති – ම.

යළි එහි සතරවැනි පස්වැනි පුද්ගලයෝ උද්ඝටිතඥ විපඤ්චිතඥ නෙය ද වෙති. එහි උද්ඝටිතඥ පුද්ගල ඉන්ද්‍රියයන් ප්‍රතිලාභ කොට දර්ශනභූමියෙහි සිටියේ සොතාපත්ති ඵලයට ද පැමිණෙයි. එකබීජී ප්‍රථම ස්‍රොතාපන්න වෙයි. එහි විපඤ්චිතඥ පුද්ගල ඉන්ද්‍රිය ප්‍රතිලාභ කොට දර්ශන භූමියෙහි සිටියේ ස්‍රොතාපත්තිඵලයට ද පැමිණෙයි. ද්විතීය ස්‍රොතාපන්න වූ කොලංකොල ද වෙයි. එහි නෙයපුද්ගල ඉන්ද්‍රියප්‍රතිලාභ කොට දර්ශන භූමියෙහි සිටියේ සොවත්ඵලයට ද පැමිණෙයි, සත්තක්ඛත්තුපරම ද වෙයි. මේ තුන්වැනි ස්‍රොතාපන්න යි. මේ තුන් පුද්ගලයෝ ඉන්ද්‍රියවෙමත්තතායෙන් සොවත්ඵලයෙහි සිටියාහු, උද්ඝටිතඥ එකබීජී වෙයි. විපඤ්චිතඥ පුද්ගල කොලංකොල වෙයි, නෙයපුද්ගල සත්තක්ඛත්තුපරම වේ.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යි.

තවද ඉදින් එයින් මතුයෙහි වැයම් කෙරේ නම් අත්‍යන්ත නිෂ්ඨා වූ නිවනට පැමිණෙයි, එහි යම් තික්ඛින්ද්‍රිය වූ උද්ඝටිතඥ පුද්ගලයෙක් වේ ද ඔහු පුද්ගලයෝ දෙදෙනෙක් වෙති : අනාගාමීඵලයට පැමිණ අන්තරාපරිනිබ්බායී ද උපහච්චපරිනිබ්බායී ද වෙති. එහි යම් තික්ඛින්ද්‍රිය වූ විපඤ්චිතඥ පුද්ගලයෙක් වේ ද ඔහු පුද්ගලයෝ දෙදෙනෙක් වෙති : අනාගාමීඵලයට පැමිණ අසංඛාරපරිනිබ්බායී ද සසංඛාරපරිනිබ්බායී ද වෙති. එහි නෙයපුද්ගල අනාගාමීඵලයට පැමිණෙනුයේ උද්ධංසොතඅකනිට්ඨගාමී වෙයි. උද්ඝටිතඥ ද විපඤ්චිතඥ ද දෙදෙන ඉන්ද්‍රියනානාත්වයෙන් උද්ඝටිතඥ පුද්ගල තික්ඛින්ද්‍රිය වූයේ අන්තරාපරිනිබ්බායී වෙයි, උද්ඝටිතඥ මුදින්ද්‍රිය පුද්ගල උද්ධංසොතඅකනිට්ඨගාමී වෙයි. උද්ඝටිතඥ ද විපඤ්චිතඥ ද දෙදෙන ඉන්ද්‍රියනානාත්වයෙන් තික්ඛින්ද්‍රිය උද්ඝටිතඥ පුද්ගල සසංඛාරපරිනිබ්බායී වෙයි. උද්ඝටිතඥ මුදින්ද්‍රියපුද්ගල උපහච්චපරිනිබ්බායී වෙයි. විපඤ්චිතඥ තික්ඛින්ද්‍රිය පුද්ගල අසංඛාරපරිනිබ්බායී වෙයි. විපඤ්චිතඥ මුදින්ද්‍රිය පුද්ගල සසංඛාර පරිනිබ්බායී වෙයි, නෙයපුද්ගල උපහච්චපරිනිබ්බායී වෙයි. විපඤ්චිතඥ තික්ඛින්ද්‍රියපුද්ගල අසංඛාරපරිනිබ්බායී වෙයි, විපඤ්චිතඥ මුදින්ද්‍රිය පුද්ගල සසංඛාරපරිනිබ්බායී වෙයි. නෙයපුද්ගල උද්ධංසොතඅකනිට්ඨගාමී වේ. මෙසේ පඤ්ච අනාගාමීහු යැ සවැනි සකදගාමී යැ තුන් ස්‍රොතාපන්නයෝ යැයි මේ නව ශෛක්ෂයෝ වෙත්.

එහි තික්ඛින්ද්‍රිය වූ උග්ඝටිතඤ්ඤූ පුද්ගල රහත්බවට පැමිණෙනුයේ පුද්ගලයෝ දෙදෙනෙක් වෙති : උභතොභාගවිමුත්ත ද පඤ්ඤාවිමුත්ත දැයි. එහි මුදින්ද්‍රිය උග්ඝටිතඤ්ඤූ පුද්ගල රහත් බවට පැමිණෙනුයේ පුද්ගලයෝ දෙදෙනෙක් වෙති : ඨිතකප්පී ද පටිවෙධනභාව දැයි කියායි. එහි තික්ඛින්ද්‍රිය විපඤ්චිතඤ්ඤූ පුද්ගල ද රහත් බවට පැමිණෙනුයේ පුද්ගලයෝ දෙදෙනෙක් වෙති : චෙතනාභව්‍ය ද රක්ෂණාභව්‍ය දැයි. එහි මුදින්ද්‍රය විපඤ්චිතඤ්ඤූ පුද්ගල රහත්බවට පැමිණෙනුයේ පුද්ගලයෝ දෙදෙනෙක් වෙති : ඉදින් සිතා නම් නො පිරිනිවෙයි. ඉදින් නො රකී නම් පිරිනිවේ යයි. එහි දී නෙයපුද්ගල භාවනානුයොගයෙහි යෙදුණේ පරිහාන ස්වභාව ඇතියේ වේ ද කර්මනියත වූයේ හෝ සමසීසී හෝ වෙයි. මේ නව වැදෑරුම් රහත්හු යි.

ඉදං චතුබ්බිධං සුත්තං: සංකිලෙසභාගියං -පෙ- අසෙඛභාගියං. ඉමේසු පුග්ගලෙසු තථාගතස්ස දසවිධං බලං පවත්තති.

කතමං දසවිධං: ඉධ බුද්ධානං භගවන්තානං අප්පවත්තිතෙ ධම්මචක්කෙ මහෙසක්ඛා දෙවපුත්තා යාචනාය අභියාතා භොන්ති: 'දෙසෙතු සුගතො ධම්ම'න්ති. සො අනුත්තරෙන බුද්ධචක්ඛුනා වොලොකෙන්තො අද්දසාසි සත්තානං තයො රසී[1]: සම්මත්තනියතො මිච්ඡත්තනියතො අනියතො.

තත්ථ සම්මත්තනියතො රාසි මිච්ඡාසතිං ආපජ්ජෙය්‍යාති නෙතං ඨානං විජ්ජති, අසත්ථුකො පරිනිබ්බායෙය්‍යාති නෙතං ඨානං විජ්ජති, සම්මාපත්තිං ආපජ්ජෙය්‍යාති ඨානමෙතං විජ්ජති.

තත්ථ මිච්ඡත්තනියතො රාසි අරියසමාපත්තිං පටිපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති, අනරියමිච්ඡාපටිපත්තිං පටිපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජති

තත්ථ අනියතො රාසි සම්මාපටිපජ්ජමානො[2]. සම්මත්තනියතරාසිං ගමිස්සතීති ඨානමෙතං විජ්ජති, මිච්ඡාපටිපජ්ජමානො සම්මත්තනියතරාසිං ගමිස්සතීති නෙතං ඨානං විජ්ජති. සම්මාපටිපජ්ජමානො මිච්ඡත්තනියතරාසිං ගමිස්සතීති නෙතං ඨානං විජ්ජති, මිච්ඡාපටිපජ්ජමානො මිච්ඡත්තනියතරාසිං ගමිස්සතීති ඨානමෙතං විජ්ජති.

ඉමෙ තයො අනුත්තරෙන බුද්ධචක්ඛුනා වොලොකෙන්තස්ස සම්මාසම්බුද්ධස්ස මෙ සතො 'ඉමෙ ධම්මා අනභිසම්බුද්ධා'ති එත්තාවතා[3] මං කොචි සහධම්මෙන පටිචොදෙස්සතීති[4] නෙතං ඨානං විජ්ජති, විතරගස්ස මෙ[5] පටිජානතො අඛීණාසවතාය සහධම්මෙන කොචි පටිචොදෙස්සතීති[4] නෙතං ඨානං විජ්ජති. යතො පන ඉමස්ස අනියතස්ස රාසිස්ස ධම්මදෙසනා, සා න දියසති තක්කරස්ස සම්මාදුක්ඛක්ඛයායා'ති නෙතං ඨානං විජ්ජති, තථා ඔවදිතො යං පන මෙ අනියතරාසි සාවකො පුබ්බෙනාපරං විසෙසං න සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති.

යං ඛො මුනි නානප්පකාරෙන[6] නානානිරුත්තියො දෙවනාගයක්ඛානං දෙසෙති දමෙති, ධම්මෙ වචත්ථානෙන චත්වා කාරණතො අසදිසං කාරණං[7] ගමිස්සතීති නෙතං ඨානං විජ්ජති, ධම්මපටිසම්භිදා.

යතො පනිමා නිරුත්තිතො සත්ත සුත්ත(?) නිරුත්තියො[8] නාභිසම්භුනෙය්‍යාති නෙතං ඨානං විජ්ජති, නිරුත්තිපටිසම්භිදා.

1. තයො රසීනං – මජසං, PTS.
2. සම්මාපටිපජ්ජමානං-මජසං, PTS.
3. එත්තවතා – ම.
4. පටිචොදිස්සතීති – ම.
5. තෙ – මජසං.
6. නානප්පකාරස්ස – මජසං, PTS.
7. පාරං – මජසං, PTS.
8. සත්ත සඤ්ඤ නිරුත්තියො – මජසං

මේ සංක්ලෙසභාගිය ......... අසෙඛභාගිය යන චතුර්විධ සූත්‍ර යි. මේ පුද්ගලයන් කෙරෙහි තථාගතයන් වහන්සේගේ දසවිධ බලය පවතී.

කවර දසවිධ බලයෙක යත් : මෙහි භාග්‍යවත් බුදුවරුන් දම්සක් නො පැවැත්වූ කල්හි මහායශස්ක දිව්‍යපුත්‍රයෝ අයැදීම පිණිස පැමිණියාහු වෙති : 'සුගතයන් වහන්සේ දහම් දෙසන සේක්වා'යි. ඒ බුදුහු අනුත්තර වූ බුදුඇසින් බලන සේක් සත්ත්වයන්ගේ සම්මත්ත නියත යැ මිච්ඡත්තනියත යැ අනියත යැ යන තුන් රාශීන් දුටුසේක.

එහි සම්මත්ත නියතරාශිය මිච්ඡාසතියට පැමිණෙන්නේ යැ යන තෙල කරුණ නො වෙයි. අශාශ්වත්‍ය වැ පිරිනිවෙන්නෝ යැ යන තෙල කරුණ නො වෙයි. සම්වතට පැමිණේ යැ යන තෙල කරුණ වෙයි.

එහි මිච්ඡත්තනියත රාශිය ආයර්‍යසමාපත්තියට පිළිපදනේ යැ යන තෙල කරුණ නො වෙයි, අනායර්‍ය වූ මිථ්‍යාප්‍රතිපත්තියට පිළිපදනේ යැ යන තෙල කරුණ වෙයි.

එහි අනියත රාශිය චොනොවට පිළිපදනේ සම්මත්තනියත රාශියට යන්නේ යැ යන තෙල කරුණ වෙයි. වරදවා පිළිපදනේ සම්මත්තනියතරාශියට යන්නේ යැ යන තෙල කරුණ නො වෙයි. සම්‍යක් ප්‍රතිපන්න වූයේ මිච්ඡත්තනියත රාශියට යන්නේ යැ යන තෙල කරුණ නො වෙයි. මිථ්‍යාප්‍රතිපන්න වූයේ මිච්ඡත්තනියත රාශියට යන්නේ යැ යන මෙකරුණ වන්නේ යි.

මේ තුන් පුද්ගලයන් අනුත්තර වූ බුදුඇසින් බලන්නා වූ සම්‍යක් සම්බුද්ධ වූ මට 'මේ ධර්මයෝ අනභිසම්බුද්ධයහ'යි මෙනෙකින් කිසිවෙක් මට සකාරණ ව ප්‍රතිචොදනා කරන්නේ යැ යන තෙල කරුණ නො වේ. වීතරාග යයි පිළින කරන මට අභිඥාසව තායෙන් සකාරණ ව කියිවෙක් චොදනා කරන්නේ යැ යන තෙල කරුණ නො වේ. තවද යම් හෙයෙකින් මේ අනියතරාශියට ධර්මදෙශනා වේ ද ඒ දෙශනාව එය පිළිපදනාහුට මනාකොට දුක් ක්ෂය වීම පිණිස නො පැනේ යැ යන තෙල කරුණ නො වෙයි. තවද යම්හෙයෙකින් මා විසින් එසේ අවවාද කරන ලද අනියත රාශියෙහි වූ ශ්‍රාවකයෙක් පූර්ව විශෙෂයෙන් අපර විශෙෂය ප්‍රත්‍යක්ෂ නො කරන්නේ යැ යන තෙල කරුණ නො වේ.

තථාගත මුනිහු දේව - නාග - යක්ෂයනට නානාප්‍රකාරයෙන් නානානිරුක්තීන් දේශනා කෙරෙති. (ඔවුන්) දමනය කෙරෙත්. විනිශ්වය විසින් දහම් දෙසා කාරණයෙන් අන්‍යකාරණයකට යන්නාහ යන තෙල කරුණ නො වේ. ධම්මපටිසම්භිද යැ.

යම් හෙයකින් නිරුත්තිසුදණ හේතුයෙන් සජක සූත්‍රනිරුක්තීන් අවබොධ නො කරන්නේ යැ යන (?) තෙල කරුණ නො වෙ යි. නිරුත්ති පටිසම්භිද යැ.

නිරුත්ති ඛො පන අභිසමයරතානං සාවකානං තමත්ථමවිඤ්ඤාපයෙති නෙතං ඨානං විජ්ජති අත්ථපටිසම්භිදා.

මනෙසත්තකා දෙවපුත්තා උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡිංසු, තං සිංහෙන වා, මානසිකෙන වා, පරිපීළිතස්ස; හත්ථකුණ්ඨී වා පාදෙ වා බාඤ්ජස්ස දණ්ඩස්ස වා, සො අත්ථො න පරිභාජීයන්ති නෙතං ඨානං විජ්ජති. පටිභානපටිසම්භිදා.

යං හි තං තෙසං හොති තං හි අසන්තං භවතීති නෙතං ඨානං විජ්ජති. යං හි නාසං තෙසං න භවති, තං හි නාසං තෙසං භවිස්සතීති නෙතං ඨානං විජ්ජති. එවං සමුදයස්ස නිරොධාය දස අකුසලකම්මපථා.

මාරෙ වා ඉන්දො වා බ්‍රහ්මා වා තථාගතො වා චක්කවත්තී වා සො වත නාම මාතුගාමො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති, පුරිසො[1] රජා චක්කවත්තී සක්කො දෙවානමින්දො භවිස්සතීති ඨානමෙතං විජ්ජති. ඉතිස්ස එවරූපං බලං එවරූපං ඤාණං, ඉදං වුච්චති ඨානාඨානඤාණං[2] පඨමං තථාගතබලං. තං නිද්දිසිතබ්බං: තීහි රාසීහි චතූහි වෙසාරජ්ජෙහි චතූහි පටිසම්භිදාහි, පටිච්චසමුප්පාදස්ස පවත්තියං නිවත්තියං භාගියං ච, කුසලං කුසලවිපාකෙසු ච උපපජ්ජති යං ච ඉත්ථිපුරිසානං.

ඉදං පඨමං තථාගතබලං.

තථාගතො එවං ජානාති: යෙසං පන සම්මත්තනියතො රාසි. නායං සබ්බත්ථගාමිනී පටිපදා, නිබ්බානගාමිනියෙවායං පටිපදා, තත්ථ සියා මිච්ඡත්තනියතො රාසි, එසා'පි න සබ්බත්ථගාමිනී පටිපදා, සක්කායසමුදයගාමිනීයෙවායං පටිපදා, හොතු, අයං තත්ථ තත්ථ පටිපත්තියා ඉතො ගච්ඡති නිබ්බානං, ගච්ඡති අපායං, ගච්ඡති දෙවමනුස්සස්ස. යං යං වා පටිපදං පටිපජ්ජෙය්‍ය සබ්බත්ථ ගච්ඡෙය්‍ය, අයං සබ්බත්ථගාමිනී පටිපදා, යං එත්ථ ඤාණං යථාභූතං, ඉදං වුච්චති සබ්බත්ථගාමිනිපටිපදා ඤාණං.

ඉදං දුතියං තථාගතබලං.

සා ඛො පනායං සබ්බත්ථගාමිනී පටිපදා නානාධිමුත්තා කෙචි කාමෙසු කෙචි දුක්කරකාරියං කෙචි අත්තකිලමථානුයොගමනුයුත්තා කෙචි සංසාරෙන සුද්ධිං පච්චෙන්ති කෙචි අනවජ්ජභාවනායාති[3]. තෙන තෙන චරිතෙන විනිබන්ධානං[4] සත්තානං යං ඤාණං යථාභූතං නානාගතං ලොකස්ස අනෙකාධිමුත්තිගතං යථාභූතං පජානාති.

ඉදං තතියං තථාගතබලං.

---

1, පුරිසො අයං – මජසං.
2. ඨානාවට්ඨානඤාණං – ම.
3. අගජ්ජාභාවනා – මජසං.
අනාජ්ඣාභාවනා – PTS.
4. විනිබන්ධානං – මජසං PTS.

නිරුක්තිය වැලිත් අභිසමයෙහි ඇලුණු ශ්‍රාවකයනට ඒ අර්ථය නො හඟවන්නේ යැ යන තෙල කරුණ නො වේ. අත්ථපටිසම්භිදා යි.

මහායශස්ක වූ දිව්‍ය පුත්‍රයෝ (බුදුන් කරා) එළඹ පැන පුළුවුත්හ. කායික හෝ මානසික හෝ දුකින් පීඩිත වූවහුට අත් පා කොරවූවහුට හෝ දන්ධයකුට හෝ ඒ අර්ථය විභාග නො කරනු ලැබෙයි යන තෙල කරුණ නො වේ. පටිභාන පටිසම්භිදා යි.

(මෙහි පාළිය සර්වප්‍රකාරයෙන් ව්‍යාකූලව ඇත.)

යම් සත් ස්වභාවයක් ඔවුනට වේ ද එය අසත් (අවිද්‍යමාන) වූවක් වේ යැ යන තෙල කරුණ නො වෙයි. යම් අසත් වූවක් ඔවුනට නො වේ ද ඒ අසත් ස්වභාව ඔවුනට වන්නේයැ යන තෙල කරුණ නොවේ. සමුදයයාගේ නිරොධය පිණිස දශඅකුශලකර්ම පථයෝ ද මෙසේ වෙත්.

මාර වේවයි ඉන්ද්‍ර වේවයි බ්‍රහ්ම වේවයි තථාගත වේවයි චක්‍රවර්ති වේවයි ඒකාන්තයෙන් හේ නම් මාගමක් වන්නේ යැ යන තෙල කරුණ නො වේ. පුරුෂයෙක් සක්විති රජ වන්නේ යැ ශක්‍රදේවේන්ද්‍ර වන්නේ යැ යන තෙල කරුණ වන්නේ යි. මෙසේ මෙබඳු බලයක් මෙබඳු ඥනයක් වන්නේයැ, මේ 'ඨානාඨානඤාණ නම් පළමුවන තථාගතබලය යි කියනු ලැබේ. එය තුන් රාශියෙන් සතර වෛශාරද්‍යයෙන් සිවු පිළිසිඹියායෙන් ද . . . පටිච්චසමුප්පාදයාගේ ප්‍රවෘත්තියෙහි ද නිවෘත්තියෙහි ද යම් ස්ත්‍රීපුරුෂයන්ගේ කුශලයක් ඒ කුශලවිපාකයන්හි උපදනේ නම් (එයින් ද)දැක්විය යුතු.

(1) මේ පළමුවන තථාගතබල යැ.

තථාගතයන් වහන්සේ මෙසේ දන්නා සේක : යම් කෙනකුන්ට සම්මත්තනියතරාසිය වේ ද මේ සබ්බත්ථගාමිනීපටිපදා නො වේ, මේ නිබ්බාන ගාමිනී පටිපදා මැ වේ. එහි යම් මිච්ඡත්තනියතරාසියෙක් වන්නේ ද, මෙ ද සබ්බත්ථගාමිනී පටිපදා නො වෙයි, මේ සක්කායසමුදයගාමිනී පටිපදා මැ වේ. චේවා. මේ තෙම ඒ ඒ ප්‍රතිපත්තියෙහි සිටියේ නිවනට යෙයි, අපායට යෙයි, දිව්‍යමනුෂ්‍යගතියට යෙයි. යම් යම් ප්‍රතිපදාවකට පිළිපන්නේ සියලු ගතියට මැ යන්නේ නම් මේ සබ්බත්ථගාමිනීපටිපදා යි. එහි යථාභූත වූ යම් ඤාණයක් වේ ද මේ සබ්බත්ථගාමිනීපටිපදාඤාණ යයි කියනු ලැබේ.

(2) මේ දෙවැනි තථාගතබල යැ.

යළි මේ සබ්බත්ථගාමිනීපටිපදාව නානාධ්‍යාශය ඇති වෙයි. කිසි කෙනෙක් කාමයන්හි අධිමුත්ත (ඇලුනාහු) වෙති, කිසි කෙනෙක් දුෂ්කරක්‍රියායෙහි අධිමුත්ත වෙති, කිසි කෙනෙක් අත්තකිලමථානුයොගයෙහි යෙදුනාහු වෙති. කිසි කෙනෙක් සංසාරයෙන් ශුද්ධිය කැමැති වෙති, කිසි කෙනෙක් අනවද්‍යභාවනායෙන් ශුද්ධිය කැමැති වෙත් යයි. ඒ ඒ චරිතයෙන් බැඳුණු සත්ත්වයන් පිළිබඳ යථාභූත වූ යම් ඥනයක් ඇද්ද, ලොකය පිළිබඳ නානා ස්වභාව අනෙකාධිමුත්තබව යථාභූතව (තතු පරිදි) දැනගන්නා සේක.

(3) මේ තුන්වැනි තථාගතබල යැ.

තත්ථ සත්තානං අධිමුත්තා භවන්ති ආසෙවන්ති භාවෙන්ති බහුලීකරොන්ති. තෙසං කම්මූපසයානං[1] තදධිමුත්තානං[2] සා චෙව ධාතු සංවහති. කතරා පනෙසා ධාතු: නෙක්ඛම්මධාතු බලධාතු කාචි සම්මත්තං[3] කාචි මිච්ඡත්තං ච ධාතු අධිමුත්තා භවන්ති අඤ්ඤතරෙ උත්තරිං[4] න සමනුපස්සන්ති. තෙ තදෙව ඨානං ජාති[5] ජරාමරණස්ස අභිනිවිස්ස වොහරන්ති: 'ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති, යථා භගවතා[6] සක්කස්ස දෙවානමින්දස්ස භාසිතං. යං තත්ථ ඨානාභූතං ඤාණං.

ඉදං වුච්චති චතුත්ථං තථාගතබලං.

තත්ථ යං යදෙව ධාතුං[7] සෙට්ඨන්ති, තං තං කායෙන ච වාචාය ච ආරභන්ති[8] චෙතයිතො ආරම්භො චෙතනා කම්මං, කායිකො වාචසිකො ආරම්භො චෙතයිතත්තා කම්මන්තරං. තථාගතො එවං පජානාති: 'ඉමිනා සත්තෙන එවං ධාතුකෙන එවරූපං කම්මං කතං, තං අතීතමද්ධානං. ඉමිනා හෙතුනා තස්ස එවරූපො විපාකො විපච්චති එතරහි, විපච්චිස්සති වා අනාගතමද්ධාන'න්ති. එවං පච්චුප්පන්නමද්ධානං පජානාති: අයං පුග්ගලො එවංධාතුකො ඉදං කම්මං කරොති, තණ්හාය ච දිට්ඨියා ච. ඉමිනා හෙතුනා න තස්ස විපාකො දිට්ඨෙව ධම්මෙ, නිබ්බත්තිස්සති උපපජ්ජෙ වා අපරම්හි වා පරියායෙති. එවං පජානාති: 'අයං පුග්ගලො එවරූපං කම්මං කරිස්සති අනාගතමද්ධානං ඉමිනා හෙතුනා තස්ස එවරූපො විපාකො නිබ්බත්තිස්සති ඉමිනා හෙතුනා'ති යානි චත්තාරි කම්මට්ඨානානි, ඉදං කම්මට්ඨානං පච්චුප්පන්නදුක්ඛං ආයතිං ච සුඛවිපාකං -පෙ- ඉති අයං අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං හෙතුසො ඨානසො විපාකවෙමත්තතං පජානාති උච්චාවචතං[10] හීනප්පණීතතං.

ඉදං වුච්චති කම්මවිපාකඤාණං පඤ්චමං තථාගතබලං.

තථා සත්තා යං වා කම්මසමාදානං සමාදියන්ති.[11] තත්ථ එවං පජානාති: ඉමස්ස පුග්ගලස්ස කාමාධිමුත්තස්ස රාගචරිතස්ස නෙක්ඛම්මධාතු[12] පාරිපූරිං ගච්ඡති[13] තස්ස රාගානුගතෙ ඣුජ්ඣමානස්ස පඨමං ඣානං සංකිලිස්සති, සචෙ පුන උත්තරිං වායමතෙ[14] ඣානවොදානගතෙ මානසෙ විසෙසභාගියං පටිපදං අනුයුඤ්ජියති, තස්ස හි ඣානභාගියංයෙව පඨමජ්ඣානෙ ඨිතස්ස දුතියං ඣානං වොදානං ගච්ඡති, තතියං ච ඣානං සමාපජ්ජිතුකාමස්ස සෙ මනසින්ද්‍රියං විතක්කං පරියාදාය තිට්ඨති තස්ස සා පීති අවිසෙසභාගියං තතියං ඣානං

1. කම්මපසයංතං - PTS.
2. තදධිමුත්තානං - ම.
3. සම්පත්ති - මජසං, පත්තිකා ච. PTS.
4. උත්තරි ම.
5. මයා - ම PTS.
6. භගවා - ම.
7. යංයෙව ධාතු - ම. PTS.
8. ආරබ්භන්ති - ම.
9. හෙතුනා = ම
10. උච්චාවචා - මජසං, PTS.
11. සමාධියන්ත, PTS.
12. ධාතූනං - මජසං, PTS.
13. ගච්ඡන්ති - මජසං, PTS.
14. උත්තරි වායමතො - ම.

එහි සත්ත්වයන්ගේ අධ්‍යාශයෝ වෙති, ආසේවන කෙරෙති, වඩති, බහුල කෙරෙත්. කර්මයෙහි ඇලුණු එහි අධිමුක්ත වූ ඔවුනට එ මැ ස්වභාවය ද තෙල ධාතු (ස්වභාව) කවර යත් : නෙක්ඛම්මධාතු යැ බලධාතු යැ සම්‍යක්ත්වධාතු යැ මිථ්‍යාත්වධාතු යැ (යන මෙහි) අධිමුක්ත වෙත්. ඇතැම්හු මත්තෙහි නො දක්නාහු යැ ඔහු එකරුණ මැ ජාති ජරාමරණයට පිවිසැ ව්‍යවහාර කෙරෙති :'මෙය මැ සැබව, අන්‍යය සිස් යැ'යි. යම්සේ භාග්‍යවතුන් විසින් සක් දෙව්දුට වදරන ලද ද එමෙනි.

(4) මේ සතරවැනි තථාගතබල යයි කියනු ලැබේ.

එහි යම් යම් මැ ධාතු-අධ්‍යාශයක් ශ්‍රේෂ්ඨ යයි සලකත් ද ඒ ඒ අධ්‍යාශය කයින් ද වචනයෙන් ද අරඹති, චෛතසික ආරම්භය චේතනා කර්ම යි. කායික වාචසික ආරම්භය චෛතසික බැවින් කර්මාන්තර යැ. තථාගතයන් වහන්සේ මෙසේ දැනගන්නා සේක : 'මෙබඳු ස්වභාව ඇති මේ සත්ත්ව විසින් මෙබඳු කර්මයක් කරනලද. එය අතීත කාලයෙහි යැ. මේ හේතුයෙන් ඔහුට මෙබඳු විපාකයෙක් මෙකල විපාක දෙයි, අනාගත කාලයෙහි හෝ විපාක දෙන්නේ ය යි. ප්‍රත්‍යුත්පන්න කාලය මෙසේ දැනගනී : 'මේ පුද්ගල මෙබඳු ස්වභාව ඇතියේ තෘෂ්ණායෙන් ද දෘෂ්ටියෙන් ද මේ කර්මය කෙරෙයි. මේ හෙතුයෙන් ඒ කර්මයාගේ විපාකය ඉහාත්මයෙහි මැ නූපදනේ යැ, උපපද්‍යභවයෙහි හෝ අපරපර්‍ය්‍යායයෙහි හෝ උපදනේ යැ යි. මෙසේ දැනගනී : මේ පුද්ගල අනාගත කාලයෙහි මේ හෙතුයෙන් මෙබඳු කර්මයක් කරන්නේ යැ, මේ හෙතුයෙන් ඔහුට මෙබඳු විපාකයෙක් උපදනේ යැ යි'. යම් සතර කර්මකාරණයෝ වෙත් ද, එනම් : ''මේ කර්මය ප්‍රත්‍යුත්පන්න සුඛ යැ, මතුයෙහි ද සුඛවිපාක ඇත ......... මෙසේ මේ අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වූ කර්ම සමාදානයන්ගේ හේතු වශයෙන් කාරණ වශයෙන් විපාකයන්ගේ නානාත්වය උස්පහත් බව හීන ප්‍රණීත බව දන්නාසේක.

(5) මේ 'කම්මවිපාකඤාණ' නම් වූ පස්වැනි තථාගතබල යැ.

එහි සත්ත්වයෝ යම් (කෙබඳු) හෝ කර්මසමාදානයක් ගන්නාහු වෙති. එහි (බුදුහු) මෙසේ දැනගන්නා සේක : කර්මාධිමුක්ත වූ රාගචරිත ඇති මේ පුද්ගලහට නෙක්ඛම්මධාතුව පිරිමට යෙයි, රාගානුගත කල්හි ගුන්‍ය වන ඔහුගේ ප්‍රථමධ්‍යානය කිලිටි වෙයි. ඉදින් යළි මත්තෙහි වෑයම් කරන්නහුට සිත ධ්‍යානයෙන් විශුද්ධ වූ කල්හි විසෙසභාගිය ප්‍රතිපදවට පැමිණෙයි. ප්‍රථමධ්‍යානයෙහි සිටි ඔහුට ධ්‍යාන භාගිය වූ මැ ද්විතීයධ්‍යානය ව්‍යවදානයට යෙයි. යළි තෘතීයධ්‍යානයට සමවදිනු කැමැත්තහුගේ සිත සොමනස්සින්ද්‍රිය හාත්පයින් ගෙන සිටී. ඔහුගේ ඒ ප්‍රීතිය විශෙසභාගිය නොවූ තෘතීයධ්‍යානය ගෙන සිටී.

ආදිස්ස තිට්ඨති, සචෙ තස්ස නිස්සරණං යථාභූතං පජානාති, තථාභූතස්ස චතුත්ථං ඣානං වොදානං ගච්ඡතියෙව. චතුත්ථස්ස ඣානස්ස හානභාගියා ධම්මා, තෙ ච ධම්මා යත්ථ පජානාති යෙහි චතුත්ථං ඣානං වොදානං දිස්සති. එවං අජ්ඣායතනසමාපත්තියා යා එතාසො සමාපත්තියො තීණි විමොක්ඛමුඛානි අට්ඨ විමොක්ඛා. ඣානානීති චත්තාරි ඣානානි, විමොක්ඛාති අට්ඨ ච විමොක්ඛා තීණි ච විමොක්ඛමුඛානි. සමාධීති චත්තාරො සමාධි : ඡන්දසමාධි විරියසමාධි[1] චිත්තසමාධි වීමංසාසමාධි. සමාපත්තියොති එතාසො අජ්ඣායතනසමාපත්තියො ඉති ඉමෙසං ඣානානං විමොක්ඛසමාපත්තීති එවරූපො සංකිලෙසො රාගචරිතස්ස පුග්ගලස්ස එවං දොසචරිතස්ස, මොහචරිතස්ස, රාගචරිතස්ස පුග්ගලස්ස එවරූපං වොදානං. ඉති යං එත්ථ ඤාණං යථාභූතං අසාධාරණං සබ්බසත්තෙහි. ඉදං වුච්චති ඡට්ඨං තථාගතබලං.

තත්ථ තථාගතො එවං පජානාති : ලොකිකා ධම්මා ලොකුත්තරා ධම්මා භාවනාභාගියා ඉන්ද්‍රියනාමං[2] ලභන්ති ආධිපතෙය්‍යභූමිං උපාදය, බලනාමං[3] ලභන්ති ථාමගතං මනො ඉන්ද්‍රියං, තං උපාදය, විරිය නාමං[4] ලභන්ති ආරම්භධාතුං උපාදය. ඉතිස්ස[5] එවරූපං ඤාණං ඉමෙහි ච ධම්මෙහි ඉමෙ පුග්ගලා සමන්නාගතාතිපි. ධම්මදෙසනං අකාසි අකාරතො ච වෙකාරතො ච ආසයජ්ඣාසයස්ස අධිමුත්තිසමන්නාගතානං. ඉදං වුච්චති පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියබලවිරියවෙමත්තතං ඤාණං සත්තමං තථාගතබලං.

තත්ථ ච තථාගතො ලොකාදිසු ච භූමිසු සංයොජනානං ච සෙක්ඛානං ද්විහි බලෙහි ගතිං පජානාති. පුබ්බෙනිවාසානුස්සතියා අතීතෙ සංසාරෙ එතරහි ච පච්චුප්පන්නෙ, දිබ්බචක්ඛුනා චුතූපපාතං ඉති ඉමානි ද්වෙ බලානි දිබ්බචක්ඛුතො අභිනිහිතානි. සො අතීතමද්ධානං දිබ්බස්ස චක්ඛුනො ගොචරෙ, සො එතරහි සතිගොචරෙ, ඉති අත්තනො ච පරෙසං ච පුබ්බෙනිවාසඤාණං අනෙකවිධං නානප්පකාරකං පච්චුප්පන්නමද්ධානං දිබ්බෙන චක්ඛුනා. ඉමානි ද්වෙ තථාගතබලානි, අට්ඨමං පුබ්බෙනිවාසො, නවමං දිබ්බචක්ඛු.

පුනචපරං තථාගතො අරියපුග්ගලානං ඣානං වොදානං නිබ්බෙධභාගියං පජානාති : අයං පුග්ගලො ඉමිනා මග්ගෙන ඉමාය පටිපදාය ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති, ඉති අත්තනො ච ආසවානං ඛයෙ ඤාණං දිට්ඨෙකට්ඨානං චතුභූමිමුපාදය යාව නවන්නං අරහන්තානං අසවක්ඛයො ඔධිසො සෙඛානං අනොධිසො අරහන්තානං. තත්ථ චෙතොවිමුත්ති ද්වීහි ආසවෙහි අනාසවා : කාමාසවෙන ච භවාසවෙන ච. පඤ්ඤාවිමුත්ති ද්වීහි ආසවෙහි අනාසවා : දිට්ඨාසවෙන ච අවිජ්ජාසවෙන ච. ඉමාසං ද්වින්නං විමුත්තීනං යථාභූතං ඤාණං, ඉදං වුච්චති ආසවක්ඛයෙ ඤාණං.

දසමං තථාගතබලං.

---

1. චිරියසමාධි - ම.
2. ඉන්ද්‍රියං නාමං - මජසං,
3. බලං නාමං - මජසං,
4. විරියං නාමං - මජසං,
5. ඉතිස්ස (දෙව)

ඉදින් ඒ ධ්‍යානයාගේ නිස්සරණය යථාභූතව දනී ද, එසේ වූවහුට චතුර්ථධ්‍යානය ව්‍යව දනයට මයි මැ යැ. චතුර්ථධ්‍යානයාගේ හානභාගිය ධර්මයෝ වෙති, ඒ ධර්මයෝ යම් තැනෙක උපදිත් ද, යම් ධර්මයකින් චතුර්ථධ්‍යානය ව්‍යවදන වූයේ දක්නා ලැබේ ද, මෙසේ අධ්‍යාශයසමාපත්තියෙන් යම් සතර සමාපත්ති කෙනෙක් වෙත් ද තුන් විමොක්ෂමුඛයෝ වෙත් ද. අට්ඨ විමොක්ඛයෝ වෙත් ද ; (මෙහි) ඣාන යනු සතර ධ්‍යානයෝ යැ, විමොක්ඛා යනු අෂ්ටවිමොක්ෂයෝ යැ තුන් විමොක්ෂමුඛයෝ යි. සමාධි යනු සතර සමාධීහු යැ : ඡන්දසමාධි යැ විරියසමාධි යැ චිත්තසමාධි යැ විමංසාසමාධි යි. සමාපත්තියො යනු සතර අධ්‍යාශයසමාපත්ති යි. මෙසේ මේ ධ්‍යානයන්ගේ විමොක්ඛසමාපත්ති යැ යන මෙබඳු සංකිලෙසය රාගචරිත පුද්ගල යාහට යැ, දෙසචරිතයාහට මෙසේ යැ, මොහචරිතයාහට මෙසේ යැ, රාගචරිත පුද්ගලයාහට මෙබඳු ව්‍යවදනය වේ යයි, මෙසේ මෙහි යථාභූත වූ සියලු සත්ත්වයන් හා අසාධාරණ වූ යම් ඥනයක් ඇද්ද, මේ සවැනි තථාගතබලය' යි කියනු ලැබේ. (6)

එහි තථාගතයන් වහන්සේ මෙසේ දනගන්නා සේක : ලෞකිකධර්මයෝ ද ලොකොත්තරධර්මයෝ ද භාවනාභාගිය වූවාහු ආධිපතෙය්‍යභූමිය පටන් ඉන්ද්‍රියනාමය ලබති. ථාමගත වූ මනස මනින්ද්‍රිය යි, එය පටන් බලනාමය ලබති, ආරම්භධාතුව පටන් විරිය නාමය ලබත්. මෙසේ මේ ධර්මයන්ගෙන් මේ පුද්ගලයෝ සමන්වාගත වූහ'යි ද මෙබඳු ඥනය වන්නේ යැ, ආශය අධ්‍යාශයාගේ ආකාර වශයෙන් ද වොකාර වශයෙන් ද, අධිමුත්ති සමන්වාගත වූවනට ධර්මදෙශනා කළසේක. පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ ඉන්ද්‍රිය–බල–වීය්‍ය වෙමත්තතාඥාණ නම් වූ මේ සත්වැනි තථාගතබලය යි කියනු ලැබේ. (7)

එහි දු කාමලෝකාදි භූමීන්හි ද සංයෝජන ඇති ශෛක්ෂයන්ගේ ද පූර්වනිවාසානුස්මෘති යෙන් අතීත සංසාරයෙහි ද දිවැසින් දුන් ප්‍රත්‍යුත්පන්නයෙහි ද මේ බල දෙකින් ගතිය දනගන්නා සේක. මෙසේ මේ බලයෝ දෙදෙන දිව ඇසින් කරන ලද්දහු යැ හේ අතීත කාලය දිව ඇසට ගොචර යැ. හේ මෙකල්හි ස්මෘතිගොචර යි. මෙසේ තමන්ගේ ද අන්‍යයන්ගේ ද පූර්වනිවාසඥනය ද අනෙකවිධ වූ නානා ප්‍රකාර වූ ප්‍රත්‍යුත්පන්න කාලය දිව ඇසින් දක්නා නුවණ ද යන මේ අටවැනි පූර්වනිවාසඥනය ද නවවැනි දිව්‍යචක්ෂුඥනය ද දෙවැදෑරුම් තථාගතබලයෝ යි. (8–9)

නැවත තථාගතයන් වහන්සේ ආය්‍යපුද්ගලයන්ගේ ව්‍යවදන වූ නිබ්බෙධභාගිය වූ ධ්‍යානය දනගන්නා සේක : "මේ පුද්ගල මේ මාර්ගයෙන් මේ ප්‍රතිපදයෙන් ආස්‍රවයන්ගේ ක්ෂය වීමෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය ද ප්‍රඥවිමුක්තිය ද ඉහාත්මයෙහි මැ ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙරේ යයි මෙසේ තමන් වහන්සේගේ ද සතර භූමිය පටන් නව රහතුන් දක්වා ශෛක්ෂයන්ගේ අවධිවශයෙන් ද රහතුන්ගේ අනොධිවශයෙන් ද ආස්‍රවක්ෂය වෙයි. ඒ දෘෂ්ටිය හා සහජාතවශයෙන් ප්‍රහාණවශයෙන් එකාර්ථ වූ ආස්‍රව-යන්ගේ ක්ෂයඥනය වෙයි. එහි චෙතොවිමුක්තිය කාමාස්‍රවයෙන් ද භවාස්‍රවයෙන් ද ද්විවිධ ආස්‍රවයන්ගෙන් අනාස්‍රව වෙයි. පඤ්ඤාවිමුක්තිය දෘෂ්ට්‍යාස්‍රවයෙන් ද අවිද්‍යා ස්‍රවයෙන් ද යන ද්විවිධ ආස්‍රවයන්ගෙන් අනාස්‍රව වෙයි. මේ දෙවැදෑරුම් විමුත්තීන්-ගේ යම් යථාභූත ඥනයක් ඇද්ද මේ ආසවක්ඛය ඤාණ යයි කියනුලැබේ.

දසවැනි තථාගත බලයයි. (10)

ඉමෙසු දසසු බලෙසු ඨිතො තථාගතො පඤ්චවිධං සාසනං දෙසෙති: සංකිලෙසභාගියං වාසනාභාගියං දස්සනභාගියං භාවනාභාගියං අසෙඛභාගියං.

තත්ථ යො තණ්හාසංකිලෙසො ඉමස්ස අලොභො නිස්සරණං. යො දිට්ඨිසංකිලෙසො ඉමස්ස අමොහො නිස්සරණං. යො දුච්චරිතසංකිලෙසො ඉමස්ස තීණි කුසලානි නිස්සරණං.

කිං නිදානං: තීණි[1] ඉමානි මනොදුච්චරිතානි – අභිජ්ඣා ව්‍යාපාදො මිච්ඡාදිට්ඨි.

තත්ථ අභිජ්ඣා මනොදුච්චරිතං කායකම්මං උපට්ඨපෙති අදින්නාදානං සබ්බං ච තදුපනිබද්ධං[2] වාචාකම්මං උපට්ඨපෙති, මුසාවාදං ච සබ්බවිතථං සබ්බං වාචම්භාවං සබ්බමත්තං පලාසං අභිජ්ඣාඅකුසලමූලන්ති. මුසාවාදො[3] අදින්නාදානං[4] අභිජ්ඣාය චෙතනා.[5]

තත්ථ ව්‍යාපාදො මනොදුච්චරිතං කායකම්මං උපට්ඨපෙති පාණාතිපාතං සබ්බං චෙතං ආකඩ්ඪනං පරිකඩ්ඪනං නිබන්ධං රොචනං, වාචාකම්මං උපට්ඨපෙති පිසුනාවාචං, ඵරුසාවාචං[6]. මිච්ඡාදිට්ඨි මනොදුච්චරිතං ච අභිජ්ඣං ව්‍යාපාදං මිච්ඡාදිට්ඨිං පයොජෙති.

යස්ස[7] යො කොචි මිච්ඡාදිට්ඨි රාගො රාගජො වා දොසජො වා සබ්බසො මිච්ඡාදිට්ඨිසම්භූතො, ඉමිනා කාරණෙන මිච්ඡාදිට්ඨි කායකම්මං උපට්ඨපෙති කාමෙසුමිච්ඡාචාරං, වචීකම්මං උපට්ඨපෙති සම්ඵප්පලාපං. ඉමානි තීණි දුච්චරිතානි අකුසලමූලානි.

යා අභිජ්ඣා සො ලොභො, යො ව්‍යාපාදො සො දොසො, යා මිච්ඡාදිට්ඨි සො මොහො, යානි[8] අට්ඨ මිච්ඡත්තානි උපට්ඨපෙන්ති, තෙසු ගහිතෙසු තීසු අකුසලමූලෙසු දසවිධං අකුසලං[9] පාරිපූරිං ගච්ඡති. තස්ස තිවිධස්ස දුච්චරිතසංකිලෙසස්ස වාසනාභාගියං ච සුත්තං නිස්සරණං.

තත්ථ යො බහුසිතො[10] තිදොසො යථා ලොභො දොසො, මොහොපි තත්ථ අයිතො[11] එත්ථ ලොභො උස්සදො. තෙන කාරණෙන තෙසු ච ධම්මෙසු ලොභො පඤ්ඤපීයති.[12] තත්ථායං මොහො අකුසලං, අයං අවිජ්ජා, යා චතුබ්බිධා රූපෙ අභිනිවිට්ඨා, රූපං අත්තතො සමනුපස්සති අවිජ්ජාගතො, රූපවන්තං වා අත්තානං අත්තනි වා රූපං රූපස්මිං වා අත්තානං.

1. තීණි හි - PTS.
2. තදුපනිබන්ධං – ම.
3. සුචරිතෙ සුචරිතං, මුසාවාදෙ.
4. මුසාවාද අදින්නාදානා – මජ්සං,
5. අභිජ්ඣායතනායඤ්ච – PTS.
6. පිසුණවාචං – ම.
7 තස්ස – මජ්සං,
8 නානි – PTS.
9 අකුසලමූලං – මජ්සං, – PTS.
10 බහුසිතා PTS.
11. අසිතං – මජ්සං, PTS.
12. පඤ්ඤපියති – මජ්සං,

මේ දසබලයන්හි සිටි තථාගතයන් වහන්සේ පඤ්චවිධ ශාසනය දෙසනසේක : සංකිලෙසභාගිය යැ වාසනාභාගිය යැ දස්සනභාගිය යැ භාවනාභාගිය යැ අසෙඛභාගිය යැ යනු යි.

එහි යම් තණ්හාසංකිලෙසයෙක් ඇද්ද මොහුට අලොභය නිස්සරණ යැ. යම් දිට්ඨි සංකිලෙසයෙක් ඇද්ද මොහුට අමොහය නිස්සරණ යැ, යම් දුච්චරිතසංකිලෙසයෙක් ඇද්ද මොහුට තුන් කුසලයෝ නිස්සරණ යි.

නිදන කවර යත්: මේ මනොදුශ්චරිතයෝ තිදෙනෙක් වෙති : අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යා දෘෂ්ටි යැ.

එහි අභිධ්‍යාමනොදුශ්චරිතය අදින්නාදන කායකර්මය එළවයි, එය හා බැඳුණු සියලු වාක්කර්මය ද එළවයි, මෘෂාවාදය ද සියලු බොරුබස් ද සියලු අසද්වචන ද සියලු මකුබව ද පලාස (ගුණසාරා දැමීම) ද අභිධ්‍යාඅකුශලමූලය යන මේ එළවයි. මුසාවාදය ද අදින්නාදනය ද අභිධ්‍යාවගේ චෙතනා යි.

එහි ව්‍යාපාදමනොදුශ්චරිතය ප්‍රාණඝාතකායකර්මය එළවයි. සියලු ආකර්ෂණය පරිකර්ෂණය බන්ධනය ද පිසුනාවාච ඵරුසාවාච වාක්කර්මය ද එළවයි, මිථ්‍යාදෘෂ්ටි මනොදුශ්චරිතය ද අභිධ්‍යා ව්‍යාපාද හා මිථ්‍යාදෘෂ්ටිය ද යොදවයි.

යමක්හුගේ මිථ්‍යාදෘෂ්ටියෙන් යුත් රාගජ වූ හෝ දෙසජ වූ හෝ යම් කිසි ත්‍යාගයෙක් වේ ද, එය සර්වප්‍රකාරයෙන් මිථ්‍යා දෘෂ්ටියෙන් උපන්නේ වේද, මේ කරුණෙන් මිථ්‍යා දෘෂ්ටිය කාමමිථ්‍යාචාරකායකර්මය එළවයි. සම්පප්‍රලාප වාක්කර්මය එළවයි. මේ අකුශලමූල වූ තුන් දුශ්චරිතයෝ යි.

යම් අභිධ්‍යාවක් ඇද්ද ඒ ලොභ යැ, යම් ව්‍යාපාදයෙක් ඇද්ද ඒ දෙස යැ, යම් මිථ්‍යා දෘෂ්ටියක් ඇද්ද ඒ මොහ යි. යම් අටවැදෑරුම් මිථ්‍යාත්වයන් උපදවත් ද ඔහු යි. ඒ තුන් අකුශලමූලයන් ගත්කල්හි දසවිධ අකුසලය පිරිමට යෙයි. ඒ ත්‍රිවිධ දුශ්චරිත සංකිලෙසයාගේ නිස්සරණය වාසනාභාගියසූත්‍ර යි.

එහි ලෝභ. දෙස බඳු යම් බෙහෙවින් බැඳුණු නිද්දෙසයෙක් ඇද්ද, මෙහි මොහයත් නොබැඳුණෝ වේද, ලොභය උත්සන්න වෙයි. එකරුණෙන් ඒ ධර්මයන්හි හෝ ලොභය පනවනු ලැබෙයි. එහි මේ මොහය අකුශලයෙක් වේද, අවිජ්ජා යි. සිව් වැදෑරුම් වූ යම් අවිද්‍යාවක් රූපයෙහි අනුශයවශයෙන් සිටියා ද එය යි. අවිද්‍යාවෙන් මඩනා ලද්දේ රූපය ආත්ම වශයෙන් දකී, ආත්මය රූපවත් කොට දකී, ආත්මයෙහි රූපය ඇතැයි හෝ දකී. රූපයෙහි හෝ ආත්මය ඇතැයි දකී.

තත්ථ කතමං පදං සක්කායදිට්ඨියා උච්ඡෙදං වදති : 'තං ජීවං තං සරීර'න්ති නත්ථිකදිට්ඨි, අධිච්චසමුප්පන්නදිට්ඨි ච, අඤ්ඤො ච කරොති අඤ්ඤො පටිසංවෙදියති පච්ඡිමසවසිකපපානං [?] තීණි පදානි සක්කාය-දිට්ඨියා සස්සතං භජන්ති අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති අකිරියං ච තං දුක්ඛමිච්ඡතො : අහෙතුකං ච පතන්ති අනජ්ඣාභාවො ච කම්මානං සබ්බං ච මානති.[1]

තත්ථ 'ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති සංසාරෙන සුද්ධි ආජීවකා ජලාසීති පඤ්ඤපෙන්ති. යථා රූපෙ සක්කායදිට්ඨියා චතුවත්ථුකා, එවං පඤ්චසු ඛන්ධෙසු වීසතිවත්ථුකා[2] සක්කායදිට්ඨි සස්සතං භජති. අඤ්ඤජීවිකා ච සස්සතවාදිකා ච[4] සීලබ්බතං භජන්ති පරමසන්ති ඉමිනා භවිස්සාමි දෙවො වා දෙවඤ්ඤතරො වාති. අයං සීලබ්බත-පරාමාසො.

තත්ථ සක්කායදිට්ඨියා සො රූපං අත්තතො සමනුපස්සති : තං ජීවං තං සරීරම්'ති. තං කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති නාභිප්පසීදති, පුබ්බන්තෙ අපරන්තෙ පුබ්බන්තාපරන්තෙ -පෙ- ඉති වාසනාභාගියෙසු සුත්තස්ස අයං උපක්කිලෙසො.

තත්ථ සද්ධින්ද්‍රියෙන සබ්බං විචිකිච්ඡිතං පජහති, පඤ්ඤින්ද්‍රියෙන උදයබ්බයං පස්සති, සමාධින්ද්‍රියෙන චිත්තං එකොදිකරොති, විරියින්ද්‍රියෙන ආරභති* සො ඉමෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි සද්ධානුසාරී අවෙච්චප්පසාදෙ නිරතො ආනන්තරියං[3] සමාධිං උප්පාදෙති. ඉන්ද්‍රියෙහි සුද්ධෙහි ධම්මානුසාරී අප්පච්චයතාය ආනන්තරියං[3] සමාධිං උප්පාදෙති සො 'ඉදං දුක්ඛ'න්ති යථාභූතං පජානාති. (සච්චානි) ඉදං දස්සනභාගියං සුත්තං. තස්ස පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං තීණි සංයොජනානි දස්සනා පහාතබ්බානි[5] සබ්බෙන සබ්බං පහීනානි ද්වෙ පුග්ගලකතානි [?]

තත්ථ තීණි අකුසලමූලානි භාවනාපහාතබ්බානි උපරික්ඛිත්තානි ඡ භවෙ නිබ්බත්තෙන්ති. තත්ථ තෙසු අභිජ්ඣාබ්‍යාපාදෙසු තනුකතෙසු ඡ භවා පරික්ඛයං[6] පරියාදං ගච්ඡන්ති, ද්වෙ භවා අවසිට්ඨා. තස්ස අභිජ්ඣා ච බ්‍යාපාදො ච සබ්බෙන සබ්බං පරික්ඛීණා හොන්ති. එකො භවො අවසිට්ඨො හොති. සො ච මානවසෙන නිබ්බත්තති. කිඤ්චාපි එත්ථ අඤ්ඤෙපි චත්තාරො කිලෙසා රූපරාගො භවරාගො අවිජ්ජා උද්ධච්චං, තෙතුසම්ං[7]. මානභූතා තප්පටිබලා අසම්මානං විනිවත්තෙතුං, සබ්බෙපි යෙ අසම්මානස්ස පහානං ආරභන්තෙ.[8] ඛීණෙසු න ච තෙසු ඉදමුත්තරිං දස්සනභූමියං පඤ්චසු සෙඛපුග්ගලෙසු තීසු ච පටිපන්නකෙසු[9] ද්වීසු ච ඵලට්ඨෙසු භාවනාභාගියං සුත්තං. තදුත්තරිං[10]. අසෙඛභාගිය-

1. මානයි - මජ්ඣං,
2. වත්ථුකා – මජ්ඣං, PTS.
* සතින්ද්‍රියං ඌනං.
3. අනන්තලීනං – මජ්ඣං
4. වාදිකෙ මජ්ඣං, PSS.
5. දස්සනපහාතබ්බානි – ම.
6. පරිජ්ඣයං – මජ්ඣං, PTS.
7. තෙතුසම්ං, මජ්ඣං, PTS.
8. ආරභතෙ – මජ්ඣං, PTS.
9. පටිපන්නකෙසු – ම.
10. තදුත්තරි – ම.

එහි කවර පදයෙක් සක්කායදිට්ඨියෙන් උච්ඡේදය කියා ද යත් : එය මැ ජීව යැ එය මැ ශරීර යැ'යි ගන්නා නාස්තික දෘෂ්ටිය ද අධිත්‍යසමුත්පන්නදෘෂ්ටිය ද, අනෙකෙක් කෙරෙයි අනෙකෙක් විඳී යන සක්කායදිට්ඨිය පිළිබඳ තුන් පදයෝ ශාශ්වතදෘෂ්ටිය භජනය කෙරෙති. ජීවය අනෙකෙක ශරීරය අනෙකෙක යන අක්‍රියදෘෂ්ටියට ද ......... අහෙතුක දෘෂ්ටියට ද වැටෙත්. .........

එහි 'මෙය මැ සැබව අන්‍යය සිස් යැ'යි සංසාරයෙන් ශුද්ධිය කියන ආජීවකයෝ සයාසූ ලබ්ධියක් පනවති. යම්සේ රූපයෙහි සක්කායදිට්ඨිය පිළිබඳ චතුස්වස්තුකදෘෂ්ටිය වේ ද එ පරිදි පඤ්චස්කන්ධයෙහි විංශද්වස්තුක සත්කායදෘෂ්ටිය ශාශ්වතය භජනය කෙරෙයි අන්‍ය ආජීවකයෝ ද ශාශ්වතවාදීහු ද 'මෙයින් දෙවියෙක් හෝ දෙවාන්‍යතරයෙක් හෝ වන්නෙමි'යි ශීලව්‍රතය භජනය පරාමර්ශනය කෙරෙත්. මේ සීලබ්බතපරාමාස යි.

එහි සක්කායදිට්ඨියෙන් හෝ රූපය ආත්මවශයෙන් දකී, 'එ මැ ජීව යැ, එ මැ ශරීරයැ'යි. පූර්වාන්තයෙහි අපරාන්තයෙහි පූර්වාන්තාපරාන්තයෙහි සැක කෙරෙයි, විචිකිත්සා කෙරෙයි, නිශ්චයට නො යෙයි, නො පහදී.........මෙසේ වාසනාභාගියෙහි සිටියහුට මේ උපක්කිලෙස යි.

එහි සද්ධින්ද්‍රියයෙන් සියලු විචිකිච්ඡිත දුරු කෙරෙයි, පඤ්ඤින්ද්‍රියයෙන් උදයව්‍යය දකී, සමාධින්ද්‍රියයෙන් සිත එකඟ කෙරෙයි, විරියින්ද්‍රියයෙන් වීර්‍යාරම්භ කෙරෙයි. හේ මේ පඤ්චෙන්ද්‍රියයන්ගෙන් සද්ධානුසාරී වූයේ අවෙත්‍යප්‍රසාදයෙහි නිරත වූයේ ආනන්තරිය සමාධිය උපදවයි. ශුද්ධ ඉන්ද්‍රියයන්ගෙන් ධම්මානුසාරී වූයේ ප්‍රත්‍යය රහිත බැවින් ආනන්තරිය සමාධිය උපදවයි, හේ 'මේ දුක' යයි ඇති සැටියෙන් දැන ගනී. (සත්‍යයෝ දක්විය යුත්තාහු ය.) මේ දස්සනභාගිය සූත්‍ර යි. ඔහුට පඤ්ච ඔරම්භාගිය සංයොජනයන් අතුරෙන් දර්ශනයෙන් ප්‍රහාතව්‍ය වූ තුන් සංයොජනයෝ සියල්ලෙන් සියල්ල ප්‍රහීණ වූවාහු පුද්ගලයෝ දෙදෙනෙක් වූවාහු ය. [?]

එහි උඩ කියන ලද භාවනායෙන් ප්‍රහාතව්‍ය වූ තුන් අකුසලමූලයෝ භව සයක් උපදවති. එහි ඒ භවයන් කෙරෙහි අභිධ්‍යාව ද ව්‍යාපාදයන් ද තුනී කළ කල්හි ෂඩ්භවයෝ ක්ෂයවීමට මයත්‍නදවට යෙති, ඔහුට අභිධ්‍යාව ද ව්‍යාපාදය ද සියල්ලෙන් සියල්ල ක්ෂය වූවාහු වෙත්. එක් භවයෙක් අවශිෂ්ට වේ. එ ද මානවශයෙන් නිපදවයි. තවද මෙහි රූපරාගය භවරාගය අවිද්‍යාවය උද්ධච්චය යන අන්‍ය වූත් සතර ක්ලේශයෝ වෙති. ඔහු එහි මාන වූවාහු අස්මිමානය විනිවර්තන කරන්නට ප්‍රතිබල නො වෙති. ඔහු සියල්ලෝ මැ අස්මි මානයාගේ ප්‍රහාණය ආරම්භ කෙරෙත්. ඔවුන් ක්ෂය නොවූ කල්හි මතුයෙහි දර්ශන භූමියෙහි ද පඤ්චශෛක්ෂ පුද්ගලයන් කෙරෙහි ද තුන් ප්‍රතිපන්නකයන් කෙරෙහි ද ඵලස්ථයන් දෙදෙනකු කෙරෙහි ද මේ භාවනාභාගිය සූත්‍ර යැ. එයින් මත්තෙහි අසෙඛ

සුත්තං. කත්ථචි භූමි නවිභ්‍රාන්ති [?] ඉදං ච පඤ්චමං සුත්තං තිණ්ණං පුග්ගලානං දෙසිතං පුථුජ්ජනස්ස, සෙඛස්ස අසෙඛස්ස. සංකිලෙසභාගියං වාසනාභාගියං පුථුජ්ජනස්ස, දස්සනභාගියං භාවනාභාගියං පඤ්චන්නං සෙඛානං, යං පරිමනිද්දිට්ඨං අසෙඛභාගියං සබ්බෙසං අරහන්තානං. යං පන පඤ්චවිධං සත්තවීසආකාරෙ පරියෙසිතබ්බං. එතෙසු තස්ස ගතිනං ගතො උත්තරි [?] තං ච ඛො සඞ්ඛෙපෙන පඤ්ඤාසාය ආකාරෙහි සම්පතති, යෙ පඤ්ඤාස ආකාරා සාසනෙ නිද්දිට්ඨා තෙ සඞ්ඛිපියන්තා දසහි ආකාරෙහි පතන්ති, යෙ අරියසච්චං නික්ඛෙපෙන සීතෙ සඞ්ඛිපියන්තා අට්ඨසු ආකාරෙසු පතන්ති. චතූසු ච සාධාරණෙසු සුත්තෙසු, යා හාරසම්පාතස්ස භූමි තෙ සඞ්ඛිපියන්තා පඤ්චසු සුත්තෙසු පතන්ති : සංකිලෙසභාගියෙ වාසනාභාගියෙ භාවනාභාගියෙ නිබ්බෙධ-භාගියෙ අසෙඛභාගියෙ ච. තෙ සඞ්ඛිපියන්තා චතූසු සුත්තෙසු පතන්ති : සංකිලෙසභාගියෙ වාසනාභාගියෙ නිබ්බෙධභාගියෙ අසෙඛභාගියෙ ච. තෙ සඞ්ඛිපියමානා තීසු සුත්තෙසු පතන්ති පුථුජ්ජනභාගියෙ සෙඛභාගියෙ අසෙඛභාගියෙ ච. තෙ සඞ්ඛිපියන්තා ද්වීසු සුත්තෙසු පතන්ති : නිබ්බෙධ-භාගියෙ ච පුබ්බයොගභාගියෙ ච. යථා වුත්තං භගවතා : ''ද්වෙ අත්ථවසෙ සම්පස්සමානා තථාගතා අරහන්තො සම්මාසම්බුද්ධා ධම්මං දෙසෙන්ති : සුත්තං ගෙය්‍යං -පෙ- සත්ථා පුබ්බයොගසමන්නාගතො අප්පකසිරෙන මඤ්ඤමානො වසියති. පුබ්බයොගා ච භවිස්සන්ති සත්තානං මඤ්ඤ-මානාධරිය[1] [?]

තත්ථ පඤ්ඤවෙමත්තතං අත්තනො සමනුපස්සමානෙන අට්ඨවිධෙ සුත්තසඞ්ඛෙපෙ යත්ථ යත්ථ සක්කොති තත්ථ තත්ථ යොජෙතබ්බං, තත්ථ තත්ථ යොජෙත්වා සුත්තස්ස අත්ථො නිද්දිසිතබ්බො. න හි සතිවෙදනං මනොධාරෙත්වා විනා සක්කා යෙන කෙනචි සුත්තස්ස අත්ථං යථාභූතං නිද්දිසිතුං.

තත්ථ පුරිමකානං සුත්තානං ඉමා උද්දානගාථා :

(1) කාමන්ධා ජාලසඤ්ඡන්නා - පඤ්ච නීවරණානි ච
මනො පුබ්බඞ්ගමා ධම්මා - මහානාමො ච සාකියො,

(2) උද්ධං අධො විප්පමුත්තො - යං ච සීලකිමත්ථියා
යස්ස සෙලූපමං චිත්තං - උපතිස්සපුච්ඡාදිකා,

(3) යස්ස කායගතාසති - ජත්තං තමොපරායණො
න තං දළ්හං චෙතසිකං - අයං ලොකොති ආදිකං,

(4) චත්තාරො චෙව පුග්ගලා - දදතො පුඤ්ඤං පවඩ්ඪති
සොතානුධතධම්මෙසු - අයං තෙසං අනුක්කමො.

(9) තත්ථ කතමා ආණත්ති :

13 සචෙ භායථ[2] දුක්ඛස්ස - සචෙ වො දුක්ඛමප්පියං
මාකත්ථ පාපකං කම්මං - ආවි වා යදි වා රහො.

''අතීතෙ රාධ රූපෙ අනපෙක්ඛො හොහී''ති[3] විත්ථාරෙන කාතබ්බා.

---

1. ධාරිය - PTS.
2 භායසි - PTS.
3. අනපෙක්ඛා හොතීති - PTS.

භාගිය සූත්‍ර යැ, කිසි තැනෙක......... ? මේ පස්වැනි සූත්‍රය ද පෘථග්ජන, ශෛක්ෂ, අශෛක්ෂ යන තුන් පුද්ගලයන්ට දෙසන ලද. සංකිලෙසභාගිය වාසනාභාගිය සූත්‍රය පුහුදුන් පුහුල්හට යැ, දස්සනභාගිය භාවනාභාගිය දෙක පඤ්ච ශෛක්ෂයන්ට යැ, පළමු දක්වන ලද අසෙඛ භාගිය සූත්‍රය සියලු රහතුන්ට යැ. පඤ්චවිධ වූ යම් සූත්‍රයක් සත්විසි ආකාරයෙහි ලා සෙවිය යුතු ද මොවුන් කෙරෙහි ......... ? එ ද සැකෙවින් පනස් අයුරෙකින් සම්පතනය වේ ද, යම් පනස් ආකාර කෙනෙක් ශාසනයෙහි දක්වන ලද්දහු ද ඔහු සංක්ෂෙප කරනු ලබන්නාහු දස ආකාරයකින් සංග්‍රහ වෙති, සැකෙවින් සිටි ආයර්‍යසත්‍යයෝ සංක්ෂෙප කරනු ලබන්නාහු අට ආකාරයෙක්හි පතිත වෙති ( ? ) සතර සාධාරණ සූත්‍රයන්හි ද වැටෙති. හාරසම්පාතයට යම් භූමියක් ඇද්ද එයි යැ, ඔහු සංක්ෂෙප කරනු ලබන්නාහු 'සංකිලෙයභාගිය වාසනාභාගිය භාවනාභාගිය නිබ්බෙධභාගිය හා අසෙඛභාගිය ද් යන පඤ්චසූත්‍රයන්හි වැටෙති, ඔහු සංක්ෂෙප කරනු ලබන්නාහු 'යංකිලෙසභාගිය වාසනා භාගිය නිබ්බෙධභාගිය හා අසෙඛභාගිය ද යන සතර සූත්‍රයන්හි වැටෙති. ඔහු සංක්ෂෙප කරනු ලබන්නාහු 'පුථුජ්ජනභාගිය. සෙඛභාගිය හා අසෙඛභාගිය ද යන තුන් සූත්‍රයන්හි වැටෙති. ඔහු සංක්ෂෙප කරනු ලබන්නාහු නිබ්බෙධභාගිය ද පුබ්බයොගභාගිය ද යන සූත්‍රද්වයෙහි වැටෙත්. භාග්‍යවතුන් විසින් එහෙයින් වදරන ලද : ''අත්ථවස – කරුණු දෙකක් දක්නාවූ තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයෝ සුත්ත ගෙය්‍ය ......... යන ධර්මය දෙශනා කෙරෙති. ශාස්තෘන් වහන්සේ පූර්ව යොගසමන්වාගත වූවන් නිදුකින් දන්නාහු වසභ කෙරෙති. ......... ( ? )

එහි තමන්ගේ ප්‍රඥවිශෙෂත්වය දක්නහු විසින් අටවැදැරුම් සූත්‍රසංක්ෂෙපයෙහි යම් යම් තැනෙක හැකි වේ ද ඒ ඒ තැන යෙදියැ යුතු. ඒ ඒ තැන්හි යොද සූත්‍රාර්ථය දක්විය යුතු. පිරිසුදු සිහියෙන් වෙන් වැ යම් කිසිවක්හු විසින් සූත්‍රාර්ථය තත්වූ පරිදි දක්වන්නට නො මැ හැකි වේ, ?

එහි පූර්ව උදහෘත සූත්‍රයන්ගේ මේ උද්දන ගාථා යැ :

(1) ''කාමන්ධා ජාලසඤ්ජන්නා' යැ පඤ්ච නීවරණයෝ යැ මනොපුබ්බංගමා ධම්මා යැ මහානාම ශාක්‍යරජ යැ යන මොහු ද–

(2) 'උද්ධං අධො විප්පමුත්තො' යැ ''කිමත්ථියානි කුසලානි සීලානි'' යනාදිය යැ යස්ස සෙලූපමං චිත්තං' යැ 'ආයස්මා මං භන්තෙ යනාදි උපතිස්ස (සාරිපුත්ත) පුච්ඡා යැ–

(3) 'යස්ය කායගතාසති' යැ 'ඡන්නමතිවස්සති' යනාදිය යැ 'තමොතමපරායනො' යනාදිය යැ 'න තං දළ්හං' යනාදිය යැ 'යං චෙතසිකං' යනාදිය යැ 'අයං ලොකො යනාදියයැ

(4) 'අනුසොතගාමී' ආදි සතර පුද්ගලයෝ යැ – දදතො පුඤ්ඤං පවඩ්ඪති' යනාදිය යැ 'සොතානුධතෙසු ධම්මෙසු' යනාදිය යැ මේ ඒ උදහරණයන්ගේ අනුක්‍රමය යි.

(9) එහි ආණත්ති කවර යත් :

13. ඉදින් දුකට බියවවූ නම් ඉදින් තොපට දුක අප්‍රිය නම් හෙළියෙහි වේවයි නොහොත් රහයි වැ වේවයි පව්කම් නහමක් කරවූ.

''රාධය, අතීත රූපයෙහි අනපෙක්ෂ වෙව''යි විස්තරයෙන් කියැයුතු'

"සීලවන්තෙන ආනන්ද පුග්ගලෙන න චෙතනා[1] කරණීයා 'කින්ති මෙ අවිප්පටිසාරො භවිස්සතී''ති.[2] අයං වුච්චති ආණත්ති.

(10) තත්ථ කතමං ඵලං :

14. ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ඡත්තං මහන්තං යථ වස්සකාලෙ,
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී.

ඉදං ඵලං :

(11) තත්ථ කතමො උපායො :

15. සබ්බෙ ධම්මා අනත්තාති – යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ – එස මග්ගො විසුද්ධියා.

"සත්තහඞ්ගෙහි සමන්නාගතො ඛො භික්ඛු අපි හිමවන්තං පබ්බතරාජානං චාලෙය්‍ය, කො පන වාදො ඡවං අවිජ්ජං." (සත්තකෙසු වෙය්‍යාකරණං කාතබ්බං.) අයං උපායො.

(12) තත්ථ කතමං[3] ආණත්ති ච ඵලං ච :

16 සචෙ භායථ දුක්ඛස්ස – සචෙ වො දුක්ඛමප්පියං
මා'කත්ථ පාපකං කම්මං – ආවි වා යදි වා රහො.

17. සචෙ ච පාපකං කම්මං – කරිස්සථ කරොථ වා[4]
න වො දුක්ඛා පමුත්ත්‍යත්ථි[5] – උපච්චා'පි[6] පලායතං.

පුරිමිකාය ගාථාය ආණත්ති, පච්ඡිමිකාය ඵලං.

"සීලෙ පතිට්ඨාය ද්වෙ ධම්මා භාවෙතබ්බා : යා ච චිත්තභාවනා යා ච පඤ්ඤාභාවනා'' අයං[7] ආණත්ති, රාගවිරාගා ච ඵලං

(13) තත්ථ කතමං ඵලං ච උපායො ච :

18. සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො – චිත්තං පඤ්ඤං ච භාවයං
ආතාපී නිපකො භික්ඛු – සො ඉමං විජටයෙ ජටං.

පුරිමිකාය අඩ්ඪගාථාය උපායො, පච්ඡිමිකාය අඩ්ඪගාථාය ඵලං.

---

1. සද මජසං – PTS.
2. අස්සාති – PTS. මජසං,
3. කතමා – මජසං,
4. කරෙථ වා කරිස්සථ – ම.
5. පමොක්ඛාත්ථි – ම.
6. උපෙච්චාපි – මජසං උදාන, PTS.
7. යා ච – ම.

''ආනන්දය, සිල්වත් පුහුල්හු විසින් 'කිමැ මට අවිප්පටිසාරය වන්නේ දැ'යි චේතනා නො කටයුතු'' යයි මේ ආඥප්ති යයි කියනු ලැබේ.

(10) එහි ඵලය කවරෙ යත් :

14. දනාදි කුශලධර්ම තෙමේ ඒකාන්තයෙන් ඒ ධර්මයෙහි හැසිරෙන පුහුල්හු (දිට්ඨධම්මික සම්පරායික අනර්ථයෙන්) රක්නේ යැ, වැසිකල මහත්වූ ඡත්‍රය එය ධරන්නහු යම්සේ රකී ද එමෙනි. ධර්මය මොනොවට පරිචිත කල්හි තෙල අනුසස වෙයි, ධර්මචාරී පුද්ගල අපායාදි දුගතියට නො යේ යයි.

මේ ඵල යි.

(11) එහි උපාය කවරෙ යත් :

15. සියලු සංඛත සංඛ්‍යාත ප්‍රත්‍යයොත්පන්නධර්මයෝ අනාත්මයහ යි මෙසේ යම් කලෙක (විදසුන් නෙදගන්වා) අනාත්මානුදර්ශන ප්‍රඥයෙන් දකී ද, එකල්හි (පෙර මැ අනිත්‍ය දුඃඛයන් දුටු හෙයින්) විදර්ශනා ගොචර වූ පඤ්චස්කන්ධ දුඃඛයෙහි නිර්වෙදයට පැමිණෙයි. තෙල නිර්වෙදය විශුද්ධි සංඛ්‍යාත ආය්‍යීමාර්ගයට උපාය වේ යයි.

''සත් අහෙකින් සමන්වාගත මහණ හිමවත් පව්රජු පවා සලන්නේ යැ, ලාමක වූ අවිද්‍යාව (සලන්නේ යැ යනු) කියනු මැ කවරේ ද'' (සත්තක නිපාතයෙහි වෙය්‍යාකරණය විස්තර කළ යුතු.) මේ උපාය යැ.

(12) එහි ආඥප්ති ද ඵලය ද කවරෙ යත් :

16. ඉදින් දුකට බියවවූ නම් ඉදින් තොපට දුක අප්‍රිය නම්, හෙළියෙහි වේවයි නොහොත් රහසැ වේවයි පව්කම් නහමක් කරවූ.

17. ඉදින් පව්කම් මතු කරන්නවූ නම් ,දුන් කරවූ නම් හෝ දුන දුන පලායන්නා වූ ද තොපට දුකින් මිදීමෙක් නැති.

පූර්ව ගාථායෙහි ආඥප්ති යැ, පශ්චිමගාථායෙහි ඵල යි.

''සීලයෙහි පිහිටා චිත්තභාවනාව ද පඤ්ඤාභාවනාව ද යන ධර්මයෝ දෙදෙන වැඩියැ යුත්තාහු මැ යැ'' මේ ආඥප්ති යැ'. රාගවිරාගය ඵල යි.

(13) එහි ඵලය ද උපාය ද කවරෙ යත් :

18. පිළිසඳ නුවණින් නුවණ ඇති වීය්‍යී ඇති පාරිහාරික ප්‍රඥ ඇති සසරබිය දක්නා වූ යම් සත්ත්වයෙක් ඇද්ද හේ ශීලයෙහි පිහිටා චිත්තසමාධිය ද විදර්ශනා ප්‍රඥව ද වඩමින් මේ තෘෂ්ණා නමැති අවුල කපන්නේ යි.

මෙහි පූර්වාර්ධගාථායෙන් උපාය ද, පශ්චිමාර්ධගාථායෙන් ඵලය ද වේ.

'නන්දියො සක්කො – කාපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමකො'[1] සුත්තං. මූලතො උපාදාය යාව ඡසු ධම්මෙසු උත්තරිං[2] පඤ්චසු ධම්මෙසු. යාව 'කරණීයං අත්තනො න සමනුපස්සති'[3] අයං උපායො. අරියසාවකො පජහතෙව පාපකෙ අකුසලෙ ධම්මෙ, න උපාදියතී''[4]ති[7] සබ්බාසු ඡසු පඤ්චසු, අයං ඵලං ච උපායො ච.

(14) **තත්ථ කතමං ආණත්ති ච ඵලං ච උපායො ච :**

19. සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු – මොඝරාජ සදා සතො
අත්තානුදිට්ඨිං ඌහච්ච – එවං මච්චුතරො සියා.

"සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු මොඝරාජා"ති ආණත්ති. "සදා සතො"ති උපායො. "අත්තානුදිට්ඨිං ඌහච්ච එවං මච්චුතරො සියා"ති ඵලං.

"සමාධිං භික්ඛවෙ භාවෙථ, සමාහිතො භික්ඛවෙ භික්ඛු රූපං අනිච්චන්ති පජානාති, එවං පස්සං අරියසාවකො පරිමුච්චති ජාතියාපි -පෙ- උපායාසෙහිපි.[5] ඉධ තීණිපි.

(15) **තත්ථ කතමො අස්සාදො :**

20. කාමං කාමයමානස්ස – තස්ස චෙ තං සමිජ්ඣති
අද්ධා පීතිමනො හොති – ලද්ධා මච්චො යදිච්ඡති.

අයං අස්සාදො.

"ධම්මචරියා සමචරියා කුසලකිරියා[6] හෙතු හි බ්‍රාහ්මණ එවමිධෙ-කච්චෙ සත්තා කායස්ස භෙදා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති." අයං අස්සාදො.

(16) **තත්ථ කතමො ආදීනවො :**

21. කාමෙසු වෙ හඤ්ඤතෙ – සබ්බා මුච්චෙච්ච – (?)

අයං ආදීනවො.

පසෙනදිසංයුත්තකෙ සුත්තෙ පබ්බතූපමා අයං ආදීනවො.

(17) **තත්ථ කතමං නිස්සරණං ;**

22. යො කාමෙ පරිවජ්ජෙති – සප්පස්සෙව පදා සිරො
සො'මං විසත්තිකං ලොකෙ – සතො සමතිවත්තති,

සංයුත්තකෙ සුත්තං පාරිච්ඡත්තකො පණ්ඩුපලාසො සන්නපලාසො ; ඉදං නිස්සරණං.

---

1. ඉසිවුත්තපුරිරිකා ම එතරකෙඛ – ම PTS.
2. උත්තරි – ම PTS.
3. යාචියොගො කරණීයො – ම
4. අසඞ්ගතස්ස කාමාසවාපි චිත්තං විමුච්චතීති – ම.
5 උපායාසෙපි – PTS.
6. කුසලචරියා – මජ්සං, PTS.

කිඹුල්වත්නුවර නිග්‍රොධාරාමයෙහි නන්දිය ශාක්‍යහට වදාළ නන්දිය සූත්‍රය—මුල පටන් ධර්ම සයෙහි ද මත්තෙහි ධර්ම පසෙහි ද තමා විසින් කටයුතු දය දකිත්. මේ උපාය යැ, ආර්‍යශ්‍රාවක ලාමක අකුශල ධර්මයන් දුරු කෙරේ මැ යැ, සියලු එකොළොස් ධර්මයන්හි මේ ඵලය ද උපාය ද වේ.

(14) එහි ආණත්ති ද ඵලය ද උපාය ද කවරේ යත් :

19. මොඝරාජය, හැම කල්හි ස්මෘතිමත් වැ සත්කායදෘෂ්ටිය දුරුකොට ලොව ශූන්‍ය විසින් බලව, මෙසෙයින් මෘත්‍යුහු ඉක්මවන්නෙහි යැ''.

''සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු මොඝරාජ'' යනු ආණත්ති යැ. ''සද සතො'' යනු උපාය යැ, අත්තානුදිට්ඨිං ඌහච්ච එවං මච්චුතරො සියා'' යනු ඵල යි.

''මහණෙනි, සමාධිය වඩවූ, මහණෙනි, සමාහිත වූ මහණ 'රූපය අනිත්‍ය යයි දනගනී, මෙසේ දක්නා ආර්‍යශ්‍රාවක ජාතියෙන් ද ......... උපායාසයන්ගෙන් ද මිදෙයි.'' මෙහි ආණත්ති ආදි තුන මැ ඇත.

(15) එහි අස්සාද කවරෙ යත් :

20. වස්තුකාමය කැමැතිවන සත්ත්වහට ඉදින් ඒ කාමවස්තු සමෘද්ධ වේ නම්, එකල්හි සත්ත්ව තෙමේ කැමැති වස්තුව ලැබ ඒකාන්තයෙන් සතුටු සිත් ඇතියේ වේ.

මේ අස්සාද යැ.

''බමුණ, ධර්මචර්‍යා සමචර්‍යා කුශලක්‍රියා හේතු කොට ගෙන මැ මෙසේ මෙලොවැ ඇතැම් සත්ත්ව කෙනෙක් කය බිඳීමෙන් සුගති ස්වර්ගලොකයට පැමිණෙත්.'' මේ අස්සාද යි.

(16) එහි ආදීනව කවරෙ යත් :

21. (ආදීනව සඳහා නිදර්ශන කළ පාඨය අසම්පූර්ණ වූයෙකි.)

පසෙනදි (කොසල) සංයුක්තයෙහි සූත්‍රාගත ''පබ්බතූපමාව' වෙයි. මේ ආදීනව යි.

(17) එහි නිස්සරණ කවරෙ යත් :

22. යමෙක් වස්තුකාමක්ලේශකාමයන් (විෂ්කම්භණයෙන් හෝ සමුච්ඡෙදයෙන්) තමාගේ පාදය කෙරෙන් සර්පයකුගේ හිස මෙන් දුරුකෙරේ ද, ඒ මහණ ලොවැ විසත්තිකා සංඛ්‍යාත මේ තෘෂ්ණාව ස්මෘතිමත් වැ ඉක්මවයි.

සංයුත්සනියැ සූත්‍රය– පඬුවන් කොළ ඇති ගිලිහුණු කොළ ඇති පරසතුරුක (දක්වියයුතු) මේ නිස්සරණ යි.

(18) තත්ථ කතමො අස්සාදො ච ආදීනවො ච :

23. යානි කරොති පුරිසො - තානි අත්තනි පස්සති
කල්‍යාණකාරී කල්‍යාණං - පාපකාරී ච පාපකං

තත්ථ යං පාපකාරී පච්චනුභොති අයං ආදීනවො[1] කල්‍යාණකාරී යං පච්චනුභොති, අයං අස්සාදො.

ලාභාලාභ අට්ඨකෙසු බ්‍යාකරණං, තත්ථ "අලාභො අයසො නින්දා දුක්ඛං" අයං ආදීනවො. 'ලාභො යසො සුඛං පසංසා' අයං අස්සාදො.

(19) තත්ථ කතමං අස්සාදො ච නිස්සරණං ච :

24. සුඛො විපාකො පුඤ්ඤානං – අධිප්පායො ච ඉජ්ඣති
ඛිප්පං ච පරමං සන්තිං – නිබ්බානමධිගච්ඡති.

යො ච විපාකො පුඤ්ඤානං යා ච අධිප්පායස්ස ඉජ්ඣනා, අයං අස්සාදො. යං ඛිප්පං ච පරමං සන්තිං නිබ්බානමධිගච්ඡති, ඉදං නිස්සරණං.

"බත්තිංසාය[2] චෙව මහාපුරිසලක්ඛණෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස ද්වෙ යෙව ගතියො භවන්ති[3] : සචෙ අගාරං අජ්ඣාවසති, රාජා හොති චක්කවත්ති' (යාව අභිවිජිත්වා අජ්ඣාවසති) අයං අස්සාදො "සචෙ අගාරස්මා අනගාරියං පබ්බජති" (සබ්බං විත්ථාරෙන[4]) ඉදං නිස්සරණං. අයං අස්සාදො ච නිස්සරණං ච.

(20) තත්ථ කතමො ආදීනවො ච නිස්සරණං ච :

25. ආදානස්ස භයං දිස්වා – ජාතිමරණසම්භවං
අනාදාන නිබ්බාති[6] – ජාතිමරණසඞ්ඛයා.

පුරිමිකාය අඩ්ඪගාථාය ජාතිමරණසම්භවො ආදීනවො. 'අනාදාන නිබ්බාති ජාතිමරණසඞ්ඛයා'ති නිස්සරණං.

"කිච්ඡං වතායං ලොකො ආපන්නො, ජායති ච ජීයති ච මීයති ච"[5] යාව "කුදාස්සු නාම ඉමස්ස දුක්ඛස්ස නිස්සරණං පඤ්ඤායිස්සති ජරාමරණස්සා"ති[7]. එත්ථ යා උපපරික්ඛා, අයං ආදීනවො, යො ගෙධං හිත්වා[8]. අභිනික්ඛමති යාව පුරණ්ණකාය රාජධානියා. ඉදං නිස්සරණං. අයං ආදීනවො ච නිස්සරණං ච.

(21) තත්ථ කතමො අස්සාදො ච ආදීනවො ච නිස්සරණං ච :

26. කාමා හි චිත්‍රා මධුරා[9] මනොරමා
විරූපරූපෙන[10] මථෙන්ති චිත්තං, -පෙ-
තස්මා අහං පබ්බජිතොම්හි රාජ -පෙ-
අපණ්ණකං සාමඤ්ඤමෙව සෙය්‍යො.

---

1 අස්සාදො – ම.
2. බාත්තිංසාය – මජ්සං.
3. භොන්ති – ම, PTS.
4. සබ්බෙන ඔහෙන – ම, PTS.
5. යමිදං ජායතෙ ච මීයතෙ ච – ම, PTS.
6. නිබ්බන්ති – මජ්සං, PTS.
7. අනෙනා භවිස්සති පරතො වාති – ම, PTS.
8. ගෙධං දිස්වා – ම, PTS.
9. විවිධා – ම, PTS.
10. විරූපරූපෙහි – ම, PTS.

(18) එහි අස්සාද හා ආදීනව කවරේ යත් :

23. පුරුෂ තෙමේ යම් පාප කෙනකුන් කෙළේ ද, ඒ පාපවිපාකයන් තමා කෙරෙහි දකී, දනාදි කල්‍යාණක්‍රියා කරනුයේ කල්‍යාණයන් දකී, යළි පාපකාරී පුරුෂ ලාමක පාපවිපාකය දකී.

එහි පාපකාරී තෙම යම් විපාකයක් විඳී ද මේ ආදීනව යැ, කල්‍යාණකාරී පුරුෂ යම් විපාකයක් විඳී ද මේ අස්සාද යි.

'ලාභාලාභ' අෂ්ටකයෙහි වෙය්‍යාකරණය දක්විය යුතු : එහි 'අලාභ අයස නින්ද දුක්ඛ, යන මේ ආදීනව යැ, 'ලාභ යස සුඛ පසංසා' යන මේ අස්සාද යි.

(19) එහි අස්සාද හා නිස්සරණ කවරෙ යත් :

24. පුණ්‍යයන්ගේ සුඛ විපාකය වෙයි, අධ්‍යාශය ද සමෘද්ධ වෙයි. චිහා පරම ශාන්තිය, වූ නිර්වාණය ද අවබොධ කෙරෙයි.

පුණ්‍යයන්ගෙ යම් විපාකයෙක් ඇද්ද, යම් අධිප්‍රාය සමෘද්ධියකුත් වේ ද, මේ අස්සාද යැ යම් පරම ශාන්ති වූ නිර්වාණය අවබොධකිරීමක් ඇද්ද මේ නිස්සරණ යි.

''දෙතිස් මහාපුරුෂලක්ෂණයෙන් සමන්වාගත මහාපුරුෂහට ගති දෙකක් මැ වෙති : ඉදින් ගිහිගෙයි වෙසේ නම් සක්විති රජ වෙයි. (දිනා වාසය කෙරෙයි යනු දක්වා) මේ අස්සාද යැ. 'ඉදින් ගිහිගෙන් නික්මැ අනගාරිය පැවිද්දට පැමිණේ ද (සියල්ල විස්තරයෙන් කියැ යුතු.) මේ නිස්සරණ යැ. මේ අස්සාද හා නිස්සරණ සූත්‍ර යි.

(20) එහි ආදීනව හා නිස්සරණ හා කවරෙ යත් :

25. (තෘෂ්ණා විසින්) ආදනයාගේ ජාතිමරණ කාරණ වූ බිය දැනැගෙන ජාතිමරණ යන්ගේ ක්ෂය වීමෙන් තෘෂ්ණාග්‍රහණය නො කොට පිරිනිවෙයි.

පූර්වාර්ධගාථායෙහි ජාතිමරණසම්භවය ආදීනව යැ, 'අනාදතුන නිබ්බාති ජාතිමරණ සංඛයා, යනු නිස්සරණ යි.

'එකාන්තයෙන් මේ ලෝවැසි තෙමේ දුකට පැමිණියේ යැ, උපදනෝ ද දිරන්නෝ ද මියන්නෝ ද වෙයි' (යනු පටන්) කවද නම් මේ ජරාමරණ දුඃඛයාගේ නිස්සරණය පැනෙන්නෝ ද' යනු දක්වා මෙහි යම් උපපරීක්ෂාවක් වේ ද මේ ආදීනව යැ, පුරාණ රාජධානියෙහි ගෙධය හැරපියා අභිනිෂ්ක්‍රමණය වේ ද, මේ නිස්සරණ යැ. මේ ආදීනව හා නිස්සරණ යි.

(21) එහි අස්සාද ආදීනව හා නිස්සරණ කවරෙ යත් :

26. යම් හෙයකින් වස්තුකාමයෝ විසිතුරු වූවාහු මධුර වූවාහු (පුහුදුනට) මනරම් වූවාහු විවිධ ස්වරූපයෙන් සිත අලළත් ද ... මහරජ, මම එහෙයින් පැවිදි වීමි, ... අවිරුද්ධ වූ – නෛර්‍යාණික වූ ශ්‍රමණභාවය මැ උත්තරීතර වේ.

යං ‘කාමා හි චිත්‍රා මධුරා මනොරමා’ති අයං අස්සාදො. යං ‘විරූපරූපෙන මථෙන්ති චිත්ත’න්ති අයං ආදීනවො. යං ‘අහං පබ්බජිතොම්හි රාජ අපණ්ණකං සාමඤ්ඤමෙව සෙය්‍යො’ති ඉදං නිස්සරණං.

**බාලිසිකොපමසුත්තං.[1]**

යං ආසාය වා වෙදනීයං කම්මං ගාහති, තථා චෙපි යං යං පාපකම්මං අනුභොති, තත්ථ දුක්ඛවෙදනීයෙන කම්මෙන අභාවිත-කායෙන ච යාව පරිත්තචෙතසො ච ආදීනවං දස්සෙති, සුඛවෙදනීයෙන කම්මෙන අස්සාදං දස්සෙති[2] යං පුරුසදිසො හොති. භාවිතචිත්තො භාවිතකායො භාවිතපඤ්ඤො මහානාමො, ඉදං නිස්සරණං.

(22) තත්ථ කතමං ලොකියං සුත්තං :

27. න හි පාපං කතං කම්මං – සජ්ජු ඛීරංව මුච්චති
දහන්තං බාලමන්වෙති – භස්මච්ඡන්නොව පාවකො.

‘චත්තාරි අගතිගමනානි’, ඉදං ලොකියං සුත්තං.

(23) තත්ථ කතමං ලොකුත්තරං සුත්තං :

28. යස්සින්ද්‍රියානි සමථං ගතානි
අස්සා යථා සාරථිනා සුදන්තා,
පහීනමානස්ස අනාසවස්ස
දෙවා’පි තස්ස පිහයන්ති තාදිනොති,

“අරියං වො භික්ඛවෙ සම්මාසමාධිං දෙසෙස්සාමී” ති ඉදං ලොකුත්තරං සුත්තං.

(24) තත්ථ කතමං ලොකියං ලොකුත්තරං ච සුත්තං :

29. සත්තියා විය ඔමට්ඨො – ඩය්හමානොව මත්ථකෙ
කාමරාගප්පහානාය – සතො භික්ඛු පරිබ්බජෙ.

“සත්තියා විය ඔමට්ඨො ඩය්හමානොව මත්ථකෙ”ති ලොකියං. “කාමරාගප්පහානාය සතො භික්ඛු පරිබ්බජෙ”ති ලොකුත්තරං.

“කබළිඞ්කාරෙ ආහාරෙ අත්ථි ඡන්දො”ති ලොකියං. “නත්ථි ඡන්දො”ති ලොකුත්තරං. ඉදං ලොකියං ලොකුත්තරං ච සුත්තං.

(25) තත්ථ කතමං කම්මං :

30. යො පාණමතිපාතෙති – මුසාවාදං ච භාසති
ලොකෙ අදින්නං – ආදියති – පරදාරං ච ගච්ඡති,
සුරාමෙරයපානං ච යො නරො අනුයුඤ්ජති.

31. අප්පහාය පඤ්ච වෙරානි – දුස්සීලො ඉති වුච්චති,
(කායස්ස භෙදා දුප්පඤ්ඤො – නිරයං සොපපජ්ජති.)

“තීණිමානි භික්ඛවෙ දුච්චරිතානි” ඉදං කම්මං.

1. බලවං බාලොපම සුත්තං – ම, PTS.
2. අස්සාදෙති – ම.

''කාමා හි චිත්‍රා මධුරා මනොරමා'' යන යමක් ඇද්ද, මේ අස්සාද යැ. ''විරූප රූපෙන මථෙන්ති චිත්තං'' යන මේ ආදීනව යැ. ''අහං පබ්බජිතොම්හි රාජ අපණ්ණකං සාමඤ්ඤ මෙව සෙය්‍යො'' යන මේ නිස්සරණ යි.

''බාලිසිකොපමසූත්‍රය වෙදනාසංයුත්ත

ආශායෙන් හෝ යම් (විපාක) වින්දයුතු කර්මයක් කෙරේ ද, ඉදින් යම් යම් පාපකර්මයක් කෙරේ ද, එහි දුඃඛවෙදනීය කර්මයෙන් ද අභාවිත කායයෙන් ද යුක්ත වූ පරිත්තචෙතසො' යනු දක්වා ආදීනවය දක්වති. සුඛවෙදනීය කර්මයෙන් අස්සාදය දක්වති. වැඩූ සිත වැඩූ කය වැඩූ ප්‍රඥ ඇති අපරිත්ත-(නිකෙලෙස්) මහානාම වෙයි. මේ නිස්සරණයි. (මේ කොටස ද ව්‍යාකූල යි.)

(22) එහි ලෞකිය සූත්‍ර කවරෙ යත් :

27. කරන ලද පාපකර්මය එකෙණෙහි (දෙවනලද ධාරොෂ්ණ) ක්ෂීරය දිහිබවට නො යන්නාසේ නො මැ විපාක දෙයි. හළුයෙන් වැසුණු සහලගරක් සෙයින් පච්කම් කළ බාලයා දවමින් ඔහු ලුහුබැඳ යෙයි.

සතර අගතිගමනයෝ දක්විය යුත්තාහ. මේ ලෞකිය සූත්‍ර යි.

(23) එහි ලොකුත්තර සූත්‍ර කවරෑ යත් :

28. යම් මහණක්හුගේ චක්ෂුරාදි ඉන්ද්‍රියයෝ දක්ෂ රියැදුරක්හු විසින් මැනැවින් දමනය කළ අසුන් මෙන් ශමථයට (දමුණුබවට) ගියාහු ද, ප්‍රහීණමාන ඇති අනාස්‍රව වූ ලාභාලාභාදියෙහි තාදී වූ ඒ ක්ෂීණාස්‍රවහට දෙවියෝ ද කැමැති වෙත් යයි.

''මහණෙනි, මම තොපට ආර්‍ය්‍ය සම්‍යක් සමාධිය දෙසන්නෙමි'' යන මේ ලොකුත්තර සූත්‍ර යි.

(24) එහි ලෞකිය ද ලොකුත්තර ද සූත්‍රය කවරෙ යත් :

29. අඩයටියෙකින් උඩ සිට පහර දෙනු ලැබුවකු සෙයින් හිස දවෙන්නකු සෙයින් කාමරාගයාගේ ප්‍රහාණය පිණිස මහණ සිහි ඇති වැ වාසකරන්නේ යැ.

''සත්තියා විය ඔමට්ඨො ඩය්හමානොව මත්ථකෙ'' යනු ලෞකිය යැ, කාමරාගප්ප හානාය සතො භික්ඛු පරිබ්බජෙ'' යනු ලොකුත්තර යි.

''කබළිංකාරෙ ආහාරෙ අත්ථි ඡන්දෙ'' යනු ලෞකිය යැ. ''නත්ථි, ඡන්දෙ'' යනු ලොකුත්තර යැ. මේ ලෞකිය ද ලොකුත්තර ද සූත්‍ර යි.

(25) එහි කම්ම කවරෑ යත් :

30. යමෙක් පණිවා කෙරේ නම් මුසවාත් බෙණේ නම් ලොවැ නුදුන් දැ ගනී නම් පරඹුන් කරාත් යේ නම් යම් මිනිසෙක් රහමෙර පානයෙහිත් යෙදේ නම්—

31. හේ පඤ්ච අකුශලවෛරයන් නො පියා සිටියේ දුශ්ශීලයෙකැයි කියනු ලැබේ. (ඒ දුෂ්ප්‍රාඥ කාබුන් මරණින් මතු නිරයට පැමිණේ.)

''මහණෙනි, මේ දුශ්චරිතයෝ තිදෙනෙක් වෙති'' මේ කර්ම යි.

(26) තත්ථ කතමො විපාකො :

32. සට්ඨිවස්සසහස්සානි – පරිපුණ්ණානි සබ්බසො

"දිට්ඨා මයා භික්ඛවෙ ඡඵස්සායතනිකා නාම නිරයා. දිට්ඨා මයා භික්ඛවෙ ඡඵස්සායතනිකා නාම සග්ගා." අයං විපාකො.

(27) තත්ථ කතමං කම්මං ච විපාකො ච :

33. අයසාව මලං සමුට්ඨිතං – තදුට්ඨාය[2] තමෙව ඛාදති
එවං අතිධොනචාරිනං – සානි කම්මානි නයන්ති දුග්ගතිං.

"අයසාව මලං සමුට්ඨිතං" යාව "සානි කම්මානී"ති ඉදං කම්මං, "නයන්ති දුග්ගති"න්ති විපාකො.

"චතුසු සම්මා පටිපජ්ජමානො : මාතරි පිතරි තථාගතෙ තථාගතසාවකෙ" යා සම්මාපටිපත්ති, ඉදං කම්මං. යං දෙවෙසු උපපජ්ජති, අයං විපාකො. ඉදං කම්මං ච විපාකො ච.

(28) තත්ථ කතමං නිද්දිට්ඨං සුත්තං :

34. නෙලඞ්ගො සෙතපච්ඡාදෙ – එකාරෙ වත්තතෙ[3] රථො
අනීඝං පස්ස ආයන්තං – ඡින්නසොතං අබන්ධනං.

යං වා චිත්තං සමණෙසු චිතො ගහපති[4] දිස්සති, එවං ඉමාය ගාථාය නිද්දිට්ඨො අත්ථො.

ගොපාලකූපමෙ එකාදස පදානි. "එවං ඛො භික්ඛවෙ භික්ඛු රූපඤ්ඤූ හොති" යාව[5] "අතිරෙකපූජාය පූජෙතා හොතී"ති. ඉමානි එකාදස පදානි යථාභාසිතානි නිද්දිට්ඨො අත්ථො.

(29) තත්ථ කතමං අනිද්දිට්ඨං සුත්තං :

35. සුඛො විවෙකො තුට්ඨස්ස – සුතධම්මස්ස පස්සතො
අබ්‍යාපජ්ජං සුඛං ලොකෙ – පාණභූතෙසු සංයමො.

36. සුඛා විරාගතා ලොකෙ – කාමානං සමතික්කමො
අස්මිමානස්ස යො විනයො – එතං වෙ පරමං සුඛන්ති.

ඉදං අනිද්දිට්ඨං, අට්ඨ මහාපුරිසවිතක්කා. ඉදං අනිද්දිට්ඨං.

(30) තත්ථ කතමං නිද්දිට්ඨං ච අනිද්දිට්ඨං ච :

37. පන්නනෙත්තො සුමුඛො – බ්‍රහා උජු පතාපවා
මජ්ඣෙ සමණසඞ්ඝස්ස – ආදිච්චොව විරොචති.

---

1. විපච්චිගා – මජසං. PTS.
2. තතුට්ඨාය – මජසං, PTS.
3. වත්තති – මජසං, PTS.
4. චිතොගහපති – මජසං.
5. යා ච – මජසං, PTS.
6. අනිද්දිට්ඨො අත්ථො – මජසං, PTS.

(26) එහි විපාක කවරෙ යත් :

32. (නිරයෙහි පැසෙන අපට) සර්වප්‍රකාරයෙන් සැටවාදහසක් පිරුණාහුය.

''මහණෙනි, මා විසින් ෂට්ස්පර්ශායතනික නම් නරකයෝ දක්නාලද්දහු ය, මහණෙනි මා විසින් ෂට්ස්පර්ශායතනික නම් ස්වර්ගයෝ දක්නා ලද්දහු ය. මේ විපාක යි.

(27) එහි කර්මය ද විපාකය ද කවරෙ යත් :

33. යකඩින් මැ නැඟුණු මලය එයින් මැ නැඟී යම්සේ ඒ යකඩය මැ කා වනසා ද, එපරිද්දෙන් සිවුපසයෙහි ප්‍රත්‍යවෙක්ෂාඥනය ඉක්මැවූවහු (සිවුපසය නො පස්විකා වළඳන මහණහු) ඒ ස්වකීය කර්මයෝ දුගතියට පමුණුවත්.

''අයසාව මලං සමුට්ඨිතං' යනු පටන් ''සානි කම්මානි, යනු දක්වා මේ කම්ම යැ, 'නයන්ති දුග්ගතිං' යනු විපාක යි.

''මව කෙරෙහි පියා කෙරෙහි තථාගතයන් කෙරෙහි තථාගතශ්‍රාවකයන් කෙරෙහි යන සතර තැන්හි මැනැවින් පිළිපදනේ යැ' යන තන්හි (චතුක්කංගුත්තර) යම් සම්‍යක්ප්‍රති පත්තියෙක් ඇද්ද මේ 'කම්ම' යැ. දෙව්ලොවැ උපදී යන මේ විපාක යැ, මේ කම්ම ද විපාක ද වෙයි.

(28) එහි නිද්දිට්ඨ සූත්‍ර කවරෙ යත් :

34. නිර්දෙෂ වූ ශ්වෙතාවරණ ඇති (ස්මෘති සංඛ්‍යාත) එක් අර (දැව්) යක් ඇති රථයෙක් පවතී. රාගාදි ව්‍යසන නැති සිඳුනා ලද තෘෂ්ණා ස්‍රොතස් ඇති රාගාදි බන්ධන නැති වැ පැමිණෙන රහත්හු බලව.

චිත්ත ගෘහපති ශ්‍රමණයන් කෙරෙහි යම් චිත්‍රයක් දකී ද, මෙසේ මේ ගාථායෙන් නිර්දිෂ්ට අර්ථය වේ.

ගොපාලකූපම සූත්‍රයෙහි එකොළොස් පදකෙනෙක් වෙති, (එකාදසකංගුත්තර) ''එවං ඛො භික්ඛවෙ භික්ඛු රූපඤ්ඤූ හොති'' යනු පටන් ''අතිරෙක පූජාය පූජෙතා හොති'' යනු යි. මේ එකොළොස් පදයෝ වදළ පරිදි නිර්දිෂ්ට අර්ථ ඇත්තෝ යි.

(29) එහි අනිද්දිට්ඨ සූත්‍ර කවරෙ යත් :

35. (සතර මාර්ගඥන සන්තොෂයෙන්) සතුටු වූ ප්‍රකාශිත වූ නිර්වාණ ධර්ම ඇති විවෙකය හෝ දක්කයුතු දැ දක්නා රහතුන් වහන්සේට නිර්වාණ සංඛ්‍යාත උපධිවිවෙකය සුව වෙයි, නො කිපෙන බව සුව වෙයි, ලොවැ ප්‍රාණීන් කෙරෙහි සංයමය (අවිහිංසාව) සුව වේ.

36. ලොවැ කාමයන්ගේ යම් ඉක්මැවීමෙක් ඇද්ද ඒ විරාග බව සුව වෙයි. (රහත් මගින්) අස්මිමානයාගේ යම් දුරැලීමෙක් ඇද්ද තෙල රහත් බව ඒකාන්තයෙන් පරම සුවය වෙ යයි.

මේ අනිද්දිට්ඨ සූත්‍ර යැ. අෂ්ට මහාපුරුෂවිතර්කයෝ වෙති. මේ අනිද්දිට්ඨ සූත්‍ර යි.

(30) එහි නිද්දිට්ඨ ද අනිද්දිට්ඨ ද සූත්‍ර කවරෙ යත් :

37. පහන් වූ නෙත් සහළක් ඇති හොබනා මුවමඬල ඇති මහත් වූ ඍජු වූ කය ඇති ප්‍රතාපවත් බුදුහු මහණගණ මැද හිරු මෙන් බබළන සේක.

'පසන්නනෙත්තො' යාව 'ආදිච්චොව විරොචසී'ති නිද්දිට්ඨො. පසන්නනෙත්තො සො භගවා, කථං ච පන පසන්නනෙත්තතා, කථං සුමුඛතා, කථං බ්‍රහාකායතා, කථං උජුකතා, කථං පතාපවන්තතා.[1] කථං විරොචතී ති[2] අනිද්දිට්ඨො.

'ඵෙණපිණ්ඩූපමං වෙය්‍යාකරණං' යථා ඵෙණපිණ්ඩො එවං රූපං, යථා බුබ්බුළො[3] එවං වෙදනා, මායූපමං[4] විඤ්ඤාණං, පඤ්චක්ඛන්ධා පඤ්චහි උපමාහි නිද්දිට්ඨා, කෙන කාරණෙන ඵෙණපිණ්ඩූපමං රූපං, සබ්බං ච චක්ඛුවිඤ්ඤෙය්‍යං යං වා චතූහි ආයතනෙහි. කථං වෙදනා බුබ්බුළූපමා, කතරා ච සා වෙදනා සුඛා දුක්ඛා අදුක්ඛමසුඛා, එවිමෙයා අනිද්දිට්ඨා. එවං නිද්දිට්ඨං ච අනිද්දිට්ඨං ච.

(31) තත්ථ කතමං ඤාණං :

38. පඤ්ඤා හි සෙට්ඨා ලොකස්මිං – යායං නිබ්බෙධගාමිනී,
යාය සම්මා පජානාති – ජාතිමරණසඞ්ඛයං.

"තීණී'මානි ඉන්ද්‍රියානි : අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං. ඉදං ඤාණං.

(32) තත්ථ කතමං ඤෙය්‍යං :

39. කාමෙසු සත්තා කාමසඞ්ගසත්තා
සංයොජනෙ වජ්ජමපස්සමානා,
න හි ජාතු සංයොජනසඞ්ගසත්තා
ඔඝං තරෙය්‍යුං විපුලං මහන්තං.

'චතූහි ධම්මෙහි'[5] සමන්නාගතා කායස්ස භෙදා දෙවෙසු උපපජ්ජන්ති,

උදෙන කාවියං[6] සුත්තං, අපණ්ණකපසාදනීයං. ඉදං ඤෙය්‍යං.

(33) තත්ථ කතමං ඤාණං ච ඤෙය්‍යං ච :

40. සබ්බෙ ධම්මා අනත්තාති – යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දතී දුක්ඛෙ – එස මග්ගො විසුද්ධියා.

යදා පස්සතී'ති ඤාණං. යො සබ්බධම්මෙසු අනත්තාකාරෙන උපට්ඨපෙති, ඉදං ඤෙය්‍යං.

"චත්තාරි අරියසච්චානි, තත්ථ තීණි ඤෙය්‍යානි. මග්ගසච්චං සීලක්ඛන්ධො ච පඤ්ඤාක්ඛන්ධො ච ඉදං ඤාණං ච ඤෙය්‍යං ච.

(34) තත්ථ කතමං දස්සනං :

41. එසො'ව මග්ගො නත්ථඤ්ඤො – දස්සනස්ස විසුද්ධියා
එතං හි[7] තුම්හෙ පටිපජ්ජථ – මාරස්සෙතං පමොහනං.

---

1. පතාපවන්තා – මජසං, PTS.
2. විරොචතා'ති – මජසං, PTS.
3. පුබ්බුළො – මජසං
4. මායා – මජසං.
5. අඞ්ගෙහි – මජසං, PTS.
6. කපියං – PTS.
7. එතම්හි – මජසං

'පසන්නනෙත්තො' යනු පටන් 'ආදිච්චොව විරොචති' යනු දක්වා නිද්දිට්ඨ යැ, ප්‍රසන්න නෙත්‍ර ඇති භගවත්හු – පසන්නනෙත්තතා කෙබඳු යැ, සුමුඛතා කිසේ යැ බ්‍රහ්මකායතා කිසේ යැ උජුකතා කෙබඳු යැ ප්‍රතාපවත් බව කිසේ යැ කෙසේ බබළත් දැයි අනිද්දිට්ඨ යි.

'ඵෙණපිණ්ඩූපමා වෙය්‍යාකරණය' (ඛන්ධසංයුත්ත–ථෙරවර්ගය) පෙණ පිඩ යම්සේ ද රූපය එබඳු යැ, දියබුබුළ යම්සේ ද වෙදනා එබඳු යැ, විඥානය මායාවක් බඳු යැ, පඤ්ච ස්කන්ධයෝ පස් උපමායෙකින් දක්වන ලද්දහු යැ. කවර කරුණෙකින් රූපය පෙණ පිඩක් බඳු වී ද, චක්ඛුර්විඥෙය වූ සියලු රූපය ද ? නොහොත් සතර ආයතනයන්ගෙන් ද? වෙදනාව කෙසේ දියබුබුළක් බඳු වූ ද ? ඒ සුඛ දුක්ඛ අදුක්ඛමසුඛ වූ කවර වෙදනාවක් දැයි අනිද්දිට්ඨ යැ. නිද්දිට්ඨ ද අනිද්දිට්ඨ ද සූත්‍රය මෙසේ යි.

(31) එහි ඤාණ කවරෙ යත් :

38. නිවනට පමුණුවන යම් ප්‍රඥවක් ඇද්ද, යම් විදර්ශනා සහිත මාර්ගඥානයෙකින් ජාතිමරණක්ෂය සංඛ්‍යාත නිවන හා අර්හත්ත්වය මැනැවින් දැනගනී ද, ලොවැ ඒ ප්‍රඥව මැ ශ්‍රෙෂ්ඨ වන්නීය.

'මේ ඉන්ද්‍රියයෝ තිදෙනෙක් වෙති : අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය අඤ්ඤින්ද්‍රිය අඤ්ඤාතාවින්ද්‍රිය යන මේ යි. මේ ඤාණ යි.

(32) එහි 'ඤෙය්‍ය' කවරැ යත් :

39. වස්තුකාමයන්හි ක්ලේශකාමයෙන් ඇලුණු කාමවස්තූන්හි රාගාදි සංගයෙන් ලැගුණු සංයොජනයෙහි දෙස් නො දක්නා සංයොජන සංඛ්‍යාත සංගයෙන් (තෛභූමක ධර්මයන්හි) ඇලුණු සත්ත්වයෝ විපුල වූ මහත් වූ කාමාදි චතුරොඝය කිසිකලෙකත් නො මැ තරණය කරන්නාහු යි.

'සතර ධර්මයකින් සමන්විත වූවාහු කය බිදීමෙන් (මරණින් මතු) දෙව් ලොවැ උපදනාහු ය.)

උදානයෙහි කාවිය (පිප්ප ?) සූත්‍රය, අපණ්ණකපසාදනීය සූත්‍රය (?) මේ ඤෙය්‍ය සූත්‍ර යි.

(33) එහි ඤාණ ද ඤෙය්‍ය ද සූත්‍ර කවරැ යත් :

40. සියලු සංඛතාසංඛත ප්‍රත්‍යයොත්පන්න ධර්මයෝ අනාත්මයෝ යයි යම් කලෙක (විදසුන් නෙදගන්වා) අනාත්මානුදර්ශනඥානයෙන් දකී ද, එකල්හි විදර්ශනාගොචර වූ පඤ්චස්කන්ධදුඃඛයෙහි නිර්වෙදයට පැමිණෙයි, තෙල නිර්වෙදය විශුද්ධි සංඛ්‍යාත ආර්‍ය්‍ය මාර්ගයට උපාය වේ.

'යද පස්සති' යනු ඤාණ යැ, යමෙක් සර්වධර්මයන් අනාත්මාකාරයෙන් සිත්හි එළවා ද, මේ ඤෙය්‍ය යැ.

සතර ආර්‍ය්‍යසත්‍යයෝ වෙති, එහි තිදෙනෙක් ඤෙය්‍යයෝ යැ, මාර්ගසත්‍යය ශීල ස්කන්ධය ද ප්‍රඥස්කන්ධය ද වේ. මේ ඤාණ ද ඤෙය්‍ය ද සූත්‍ර යි.

(34) එහි 'දස්සන' කවරැ යත් :

41. මාර්ගඵලදර්ශනයාගේ විශුද්ධිය පිණිස තෙල ආර්‍ය්‍ය මාර්ගය මැ වෙයි. අන් මඟෙක් නැත, තෙපි මේ මඟ පිළිපදිවු, තෙල මාර්ගය පිළිපැදීම මරහුගේ ප්‍රමොහනය යි.

“චතූහි අඞ්ගෙහි සමන්නාගතො අරියසාවකො අත්තනාව අත්තානං බ්‍යාකරෙය්‍ය : ‘ඛීණනිරයොම්හි’ යාව ‘සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො’’ ති ඉදං දස්සනං.

(35) තත්‍ථ කතමා භාවනා :

42. යස්සින්ද්‍රියානි සුභාවිතානි[1]
අජ්ඣත්තං බහිද්ධා ච සබ්බලොකෙ,
*නිබ්බිජ්ඣ ඉමං පරං ච ලොකං
කාලං කඞ්ඛති භාවිතො ස දන්තො.

“චත්තාරි ධම්මපදානි : අනභිජ්ඣා අව්‍යාපාදො සම්මාසති සම්මාසමාධි.’’ අයං භාවනා.

(36) තත්‍ථ කතමං දස්සනං ච භාවනා ච :

43. වචසා මනසා ච කම්මුනා ච[2]
අවිරුද්ධො සම්මා විදිත්වා ධම්මං,
නිබ්බානපදාභිපත්‍ථයානො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

‘සොතාපත්තිඵලං සච්ඡිකාතුකාමෙන කතමෙ ධම්මා මනසිකාතබ්බා : භගවා ආහ, පඤ්චුපාදානක්ඛන්ධා. ඉදං දස්සනං ච භාවනා ච.

(37) තත්‍ථ කතමෙ විපාකධම්මධම්මා :

“යානි කරෙති පුරිසො’’ති විත්‍ථාරො.

“තීණි’මානි භික්ඛවෙ සුචරිතානි’’ ඉමෙ විපාකධම්මධම්මා.

(38) තත්‍ථ කතමෙ නවිපාකධම්මධම්මා :

44. රූපං වෙදයිතං සඤ්ඤා – විඤ්ඤාණං යා ච චෙතනා
නෙසො’හමස්මි න මෙ සො – අත්තා ඉති දිට්ඨො විරජ්ජති.

“පඤ්චිමෙ භික්ඛවෙ ඛන්ධා’’ ඉමෙ නවිපාකධම්මධම්මා.

(39) තත්‍ථ කතමෙ නෙවවිපාකො නවිපාකධම්මධම්මා :

45. යෙ එවං පටිපජ්ජන්ති – නයං බුද්ධෙන දෙසිතං,
තෙ දුක්ඛස්සන්තං කරිස්සන්ති – සත්‍ථු සාසනකාරකා’ති.

ඉති යා ච සම්මාපටිපත්ති යො ච නිරොධො, උභයමෙතං නෙව විපාකො න විපාකධම්මො.

බ්‍රහ්මචරියං වො, භික්ඛවෙ දෙසෙස්සාමි, බ්‍රහ්මචරියඵලානි ච : බ්‍රහ්මචරියං ච අරියො අට්ඨඞ්ගිකො මග්ගො, බ්‍රහ්මචරියඵලානි සොතාපත්තිඵලං යාව අරහත්තං.

---

1. භාවිතානි – S.
*‘සො පුග්ගලො මතිමා ච රූපසඤ්ඤී
සුමොහගතා න ජානාති,
ඉති මජ්ඣං – PTS පොත්‍ථකෙසු දිස්සති.
2. මනසාථ කම්මනා ච – ම.

'සතර අඟෙකින් සමන්වාගත ආය්‍යීශ්‍රාවක තෙමේමැ තමා ප්‍රකාශ කරන්නේ යැ : 'ක්ෂය කළ නිරය ඇතියෙම් වෙමි' යනු පටන් 'මම විනිපාතයට නො පැමිණෙන පියවි ඇති බොධියට නියත වූ සම්බොධිය පරායන කොට ඇති සොතාපන්නයෙකිම් වෙමි'යි කියා යි. මේ 'දස්සන' සූත්‍ර යි.

(35) එහි භාවනා කවර යත් :

42. යම් ආය්‍යීපුද්ගලයක්හු විසින් ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයෝ මැනැවින් වඩනලද්දහු ද, සියලු ලොවැ අධ්‍යාත්ම බාහිර වූ (සංයොජනයන්) ද, මෙලොව පරලොව ද ප්‍රතිවෙධ කොට (සිටියේ ද) භාවිත සිත් ඇති දමුණු ඉඳුරන් ඇති හෙතෙම මරණකාලය කැමැති වෙ.

''ධර්මපදයෝ සතර දෙනෙක් වෙති : අනභිජ්ඣා අව්‍යාපාද සම්මාසති සම්මාසමාධි' යනුයි. මේ භාවනා යි.

(36) එහි 'දස්සන ද භාවනා' ද කවරැ යත් :

43. වචසින් මනසින් ද කර්මයෙන් (කයින්) ද අවිරුද්ධ වූයේ සියුසස් දහම් මැනැවින් දන නිර්වාණපදය (ස්කන්ධ පරිනිර්වාණය) පතන්නාවූ හේ ලොවැ (සියල්ල) මැනැවින් හැරපියා යෙයි.

'සොවත්පල' පසක් කරනු රිසියහු විසින් කවර දහම්හු මෙනෙහි කළයුත්තාහු ද ? බුදුහු වදළහ : පඤ්චොපාදනස්කන්ධයෝ යි. මේ දස්සන ද භාවනා ද සූත්‍ර යි.

(37) එහි විපාක ස්වභාවධර්මයෝ කවරහ :

''යාති කරොති පුරිසො'' (38 පිට) යන විස්තර යැ''.

''මහණෙනි, මේ සුචරිතයෝ තිදෙනෙක් වෙති'' මේ විපාකස්වභාවධර්මයෝ යි.

(38) එහි නවිපාකස්වභාවධර්මයෝ කවරහ :

44. රූපයද වෙදනාව ද සංඥව ද විඥනය ද යම් සංඛතයෙක් වේ නම් එ ද තෙල පස්කඳ මම් නො වෙමි, තෙල මා ගැත්තේ නො වෙ යි, මෙසේ දක්නාලදුයේ එහි නො ඇලේ.

''මහණෙනි, මේ පඤ්චස්කන්ධ කෙනෙක් වෙති. මේ නවිපාකස්වභාව ධර්මයෝ යි.

(39) එහි නො මැ විපාක වූ නවිපාකස්වභාවධර්ම කවරෙ යත් :

45. යම් කෙනෙක් බුදුරදුන් වදළ දහම්නය මෙසේ පිළිපදනාහු ද ශාස්තෲන් වහන්සේගේ ශාසනය කරන්නාවූ ඔහු වච්චදුක්ඛයාගේ අන්තය කරන්නාහු යි.

මෙසේ යම් සම්‍යක් ප්‍රතිපත්තියක් ඇද්ද යම් නිරොධයෙකුත් ඇද්ද මේ දෙක නො මැ විපාක යැ, විපාකස්වභාව නො වෙයි.

''මහණෙනි, තොපට මහබඹසර ද බඹසරඵල ද දෙසන්නෙමි. බඹසර නම් අරිඅටඟි මඟ යැ, සොවත් පල පටන් රහත් බව දක්වා බඹසරඵලයෝ යි.

(40) තත්ථ කතමං සකවචනං :

46. සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා
සචිත්තපරියොදපනං - එතං බුද්ධාන සාසනං.

"තීණි'මානි භික්ඛවෙ විමොක්ඛමුඛානි" ඉදං සකවචනං.

(41) තත්ථ කතමං පරවචනං :

47. නත්ථි පුත්තසමං පෙමං - නත්ථි ගොසමිතං[1] ධනං
නත්ථි සූරියසමා[2] ආභා - සමුද්දපරමා සරා.

"භොතු දෙවානමින්ද සුභාසිතෙන ජයො'ති"* "නො හි නාම භික්ඛවෙ සක්කො දෙවානමින්දො සකං පුඤ්ඤඵලං උපජීවමානො"'ති විත්ථාරෙන කාතබ්බං. ඉදං පරවචනං.

(42) තත්ථ කතමං සකවචනං ච පරවචනං ච :

48. යං පත්තං යං ච පත්තබ්බං - උභයමෙතං රජානුකිණ්ණං
ගෙ එවං වාදිනො නත්ථි - තෙසං කාමෙසු දොසො'ති.

ඉදං පරවචනං

"යෙ ච ඛො තෙ උභො අන්තෙ අනුපගම්ම වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය. ඉදං සකවචනං.

49. නන්දති පුත්තෙහි පුත්තිමා
ගොමිකො[3] ගොහි[4] තථෙව නන්දති,
උපධීහි නරස්ස නන්දනා[5]
න හි සො නන්දති; යො නිරූපධී'ති. පරවචනං.

50. සොචති පුත්තෙහි පුත්තිමා
ගොමිකො ගොහි තථෙව සොචති,
උපධී හි නරස්ස සොචනා[6]
න හි සො සොචති යො නිරූපධී'ති, සකවචනං.

ඉදං සකවචනං පරවචනං ච.

(43) තත්ථ කතමං සකාධිට්ඨානං :

51, යෙ කෙචි භූතා භවිස්සන්ති
යෙ වා'පි සබ්බෙ ගමිස්සන්ති පහාය දෙහං,
තං සබ්බං ජානිං කුසලො විදිත්වා
ආතාපියො[7] බ්‍රහ්මචරියං චරෙය්‍ය,

---

1 ගොණසමිතං - ම. PTS.
2. සුරියසමා ම. PTS.
* හෙතුනා මාරිසා ඉච්චාදි පාඨො මජ්ඣං PTS. පොත්ථකෙසු දිස්සති.
3. ගොමා - මජ්ඣං,
4. භොගිකො, භොගෙහි - PTS.
5. ජනො, නන්දිනො - PTS.
6. ධම්ම සීතො - PTS.
7. ජනො න සොචති - PTS.

(40) එහි සකවචන කවරැ :

46. සියලු අකුශලය නො ඉපදවීම ද චාතුර්භූමක කුශලයාගේ ප්‍රතිලාභය ද (රහත්මගින්) ශිය සිත්සතන් පිවිතුරු කිරීම ද යන මෙල සියලු බුදුවරයන්ගේ අනුශාසනා යි.

"මහණෙනි, මේ විමොක්ෂමුඛයෝ තිදෙනෙක් වෙති. මේ සකවචන යි.

(41) එහි පරවචන කවරැ :

47. පුත්‍ර ප්‍රේමය සම වූ ප්‍රේමයෙක් නැත, ගවධනය හා සම වූ ධනයෙක් නැත, සූර්‍ය්‍යා-ලොකය සම වූ අවභාසයෙක් නැත, සියලු ජලාසයෝ සමුද්‍රය පරම කොට ඇත්තාහ.

"දේවේන්ද්‍රය, සුභාෂිතයෙන් ජය වේවා'යි. "මහණෙනි ඒ ශක්‍ර දේවේන්ද්‍ර ස්වකීය පුණ්‍යඵලය නිසා ජීවත්වන්නේ" යයි විස්තර කළයුතු. මෙ 'පරවචන' යි.

(42) සකවචන ද පරවචන ද කවරැ :

48. ලබන ලද යමක් ඇද්ද ලැබියයුතු යමකුත් ඇද්ද මේ දෙකම රජසින් ආකුල යැ-මෙයේ කියන යම කෙනෙක් වෙත් ද ඔවුනට කාමයන්හි දෙෂයෙක් නැතැ'යි ( ? )

මේ පරවචන යැ.

"යම් කෙනෙක් උභයාන්තයට නො පැමිණ වෙයෙත් ද ඔවුනට පැනැවීමට වට්ටයෙක් නැති. මේ සකවචන යි.

49. පුතුන් ඇතියේ පුතුන් සමග හෝ පුතුන් කරණ කොටගෙන සතුටු වෙයි. එසෙයින් ම ගවයන් ඇතියේ ගවයන් කරණකොටගෙන සතුටු වෙයි. කාමගුණූපධීන් කරණකොට මිනියාට සතුට වෙයි. යමෙත් උපධි රහිත ද හේ නොමැ සතුටු වේ යනු පරවචන යි.

50. පුතුන් ඇතියේ පුතුන් කරණකොට ශෝක වෙයි, එසේ මැ ගවහිමි ගවයන් කරණ කොට ශෝක වෙයි, උපධීන් කරණකොට මිනිසාට ශෝකය වෙයි, යමෙක් කාමගුණූපධි රහිත වේ ද හේ නො මැ ශෝක කෙරෙයි යනු සකවචන යි.

මේ සකවචන ද පරවචන ද වේ.

(43) එහි යත්තාධිට්ඨාන කවරැ :

51. යම් සත්ත්ව කෙනෙක් පෙර වූවාහු ද යම් කෙනෙකුත් මතු වෙද්ද, ඒ සියල්ලෝ කය හැරපියා පරලොව යන්නාහ, නුවණැතියේ ඒ සියලු පිරිහීම දැන කෙලෙස් තවන වැර ඇති වැ බඹසර හැසිරෙන්නේ යි.

"තයොමෙ භික්ඛවෙ සත්ථාරො: තථාගතො අරහං සෙක්ඛො පටිපදො". ඉදං සත්තාධිට්ඨානං

(44) තත්ථ කතමං ධම්මාධිට්ඨානං :

52. යං ච කාමසුඛං ලොකෙ - යං චිදං දිවියං සුඛං,
තණ්හක්ඛයසුඛස්සෙතෙ - කලං නාග්ඝන්ති සොළසිං.

"සත්තිමෙ භික්ඛවෙ බොජ්ඣඞ්ගා" ඉදං ධම්මාධිට්ඨානං.

(45) තත්ථ කතමං සත්තාධිට්ඨානං ච ධම්මාධිට්ඨානං ච :

"දුද්දසං තං[1] සච්චං දුද්දසො පටිවෙධො බාලෙහි, ජානතො පස්සතො නත්ථි නන්දී'ති වදාමි. 'දුද්දසං තං සච්චං දුද්දසො පටිවෙධො බාලෙහී'ති ධම්මාධිට්ඨානං. 'ජානතො පස්සතො නත්ථි නන්දී'ති සත්තාධිට්ඨානං.

දාරුක්ඛන්ධොපමං, ගඞ්ගාය තීරියං[2] ඔරිමඤ්ච තීරං පාරිමඤ්ච තීරං ථලෙ වා න ච උස්සීදනං මජ්ඣෙ ච න සංසීදනං මනුස්සගාහො[3] ච අමනුස්සගාහො ච අන්තො පූතිභාවො ච, ඉදං ධම්මාධිට්ඨානං. එවං පන භික්ඛු නිබ්බානනින්නො භවිස්සති නිබ්බානපොණො'ති[4] සත්තාධිට්ඨානං. ඉදං සත්තාධිට්ඨානං ච ධම්මාධිට්ඨානං ච.

(46) තත්ථ කතමො ථවො :

53 මග්ගාන'ට්ඨඞ්ගිකො සෙට්ඨො - සච්චානං චතුරො පදා,
විරාගො සෙට්ඨො ධම්මානං - ද්විපදානං ච චක්ඛුමා.

"තීණි'මානි භික්ඛවෙ අග්ගානි : බුද්ධො සත්තානං, විරාගො ධම්මානං, සඞ්ඝො ගණානං" අයං ථවො.

(47) තත්ථ කතමං අනුඤ්ඤාතං :

54. කායෙන සංවරො සාධු - සාධු වාචාය සංවරො
මනසා සංවරො සාධු - සාධු සබ්බත්ථ සංවරො,
සබ්බත්ථ සංවුතො භික්ඛු - සබ්බදුක්ඛා පමුච්චති.

ඉදං භගවතා අනුඤ්ඤාතං.

"තීණි'මානි භික්ඛවෙ කරණීයානි : කායසුචරිතං වචීසුචරිතං මනොසුචරිතං." ඉදං අනුඤ්ඤාතං.

(48) තත්ථ කතමං පටික්ඛිත්තං :

"නත්ථි පුත්තසමං පෙමං" විත්ථාරො. ඉදං පටික්ඛිත්තං.

"තීණි'මානි භික්ඛවෙ අකරණීයානි (සයං අභිඤ්ඤාය දෙසිතානි) කතමානි තීණි : කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං" ඉදං පටික්ඛිත්තං.

---

1. දුද්දසමනන්තං - මජසං - PTS.
2. තීරියා - මජසං PTS.
3. මනුස්සග්ගාහො - මජසං.
4. නිබ්බානපරායණො'ති - ම.
5. තීරියා - මජසං, PTS.

"මහණෙනි, මේ ශාස්තෘහු තිදෙනෙක් වෙති : තථාගත යැ ක්ෂීණාස්‍රව යැ ශෛක්ෂ ප්‍රතිපද ඇත්තේ"යි මේ සත්තාධිට්ඨාන සූත්‍ර යි.

(44) එහි ධම්මාධිට්ඨාන කවරැ :

52. ලොවැ යම් කාමසහගත සුඛයෙක් වේ ද දිව්‍යවිහාරවශයෙන් ලැබිය යුතු යම් රූපසමාපත්තිසුඛයෙක් වේ ද, මෙල සුඛයෝ තෘෂ්ණාක්ෂය සංඛ්‍යාත නිවන් සුවයාගේ සොළොස්වන කලාවට නො අගනාහු වෙත්.

"මහණෙනි, මේ බොධ්‍යංගයෝ සත්දෙනෙක් වෙති. මේ ධම්මාධිට්ඨාන යි,

(45) එහි සත්තාධිට්ඨාන ද ධම්මාධිට්ඨාන ද කවරැ :

"බාලයන් විසින් ඒ චතුස්සත්‍යය දක්ක නො හැකි ය, ප්‍රතිවේධය දුර්දශ යැ. පඤ්චස්කන්ධයන්ගේ උදයව්‍යය දන්නහුට දක්නහුට නන්දිසංඛ්‍යාත තෘෂ්ණා නැතැයි කියමි" (මෙහි) "දුද්දසං තං සච්චං, දුද්දසො පටිවෙධො බාලෙහි" යනු ධම්මාධිට්ඨාන යැ,

"ජානතො පස්සතො නත්ථි නන්දි" යනු සත්තාධිට්ඨාන යි.

"දරුක්ඛන්ධොපමසූත්‍රය (වෙදනාසංයුක්ත) ගංගායෙහි සරස වැටීම යැ ඔරිමතීරය පාරිමතීරය ස්ථලයෙහි නභා නො තැබීම ය මධ්‍යයෙහි නො ගැලීමය මනුෂ්‍ය ග්‍රහණය අමනුෂ්‍යග්‍රහණය ඇතුළත දිරුබව ද යන මේ ධම්මාධිට්ඨාන' යැ. යළි මෙසෙයින් මහණ නිර්වාණනින්න නිර්වාණප්‍රවණ වන්නේ යැ යන මේ සත්තාධිට්ඨාන' යැ. මේ සත්තාධිට්ඨාන ද ධම්මාධිට්ඨාන' ද සූත්‍ර යි.

(46) එහි ථව' සූත්‍ර කවරෙ යත් :

53. ජංගමාදි මාර්ගයන් අතුරෙන් අෂ්ටාංගික ආර්‍යමාර්ගය උතුම් වෙයි, සත්‍යයන් අතුරෙන් දුක්ඛාදි (ආර්‍යසත්‍යප්‍රකාශක) සතර පදය උතුම් වෙයි, ධර්මයන් අතුරෙන් නිර්වාණ සංඛ්‍යාත විරාගය උතුම් වෙයි. දිව්‍ය මනුෂ්‍යාදි දෙපා ඇත්තවුන් අතුරෙන් පසැස් ඇති තථාගතයෝ උතුම් වෙත්.

"මහණෙනි, මේ අග්‍රයෝ තිදෙනෙක් වෙති : සත්ත්වයන් කෙරෙන් බුදුහු අග්‍ර වෙති. ධර්මයන් කෙරෙන් විරාගය (නිවන) අග්‍ර යැ, ගණයන් කෙරෙන් සංඝයා අග්‍ර යි. මේ ථව සූත්‍ර යි.

(47) එහි අනුඤ්ඤාතය කවරැ :

54. කයින් සංවරය මැනැවි, වචනයෙන් සංවරය මැනැවි, සිතින් සංවරය මැනැවි, හැම තන්හි සංවරය මැනැවි, සියලු තැන්හි සංවෘත වූ මහණ සියලු දුකින් මිදේ.

මේ භාග්‍යවතුන් විසින් අනුඤ්ඤාත යැ.

"මහණෙනි, මේ කටයුතු තුනක් වෙති : කායසුචරිත යැ වචීසුචරිත යැ මනොසුචරිතයි. මේ අනුඤ්ඤාත සූත්‍ර යි.

(48) එහි 'පටික්ඛිත්තය' කවරැ :

"නත්ථි පුත්තසමං පෙමං" (දෙවතාසංයුක්ත) විස්තරය වෙයි. මේ පටික්ඛිත්ත යැ.

"මහණෙනි, මේ නො කටයුතු තුනක් වෙති : (තමන්වහන්සේ විසින් අවබොධ කොට දෙසන ලද්දහු යැ.) කවර තුනෙක යත් : කායදුශ්චරිතය වචීදුශ්චරිතය මනොදුශ්චරිත යි. මේ "පටික්ඛිත්ත' සූත්‍ර යි.

(49) තත්‍ථ කතමං අනුඤ්ඤාතං ච පටික්ඛිත්තං ච :

55\. කායෙන කුසලං කයිරා[1] – අථ කායෙන සංවුතො
කායදුච්චරිතං හිත්වා – කායසුචරිතං චරෙ.

ද්වීහි පඨමපදෙහි චතුත්ථෙන ච පදෙන අනුජානාති. කායදුච්චරිතං හිත්වා'ති තතියෙන පදෙන පටික්ඛිත්තනති. මහාවිභඞ්ගො, අචිරතා-පනාදෙ (?)

තත්‍ථිමා උද්දානගාථා :

(1) සචෙ භායථ දුක්ඛස්ස – රූපෙ රාඛ අජිතකො
සීලවන්තෙන ආනන්‍ද – ධම්මො ඡත්තංව රක්ඛති.

(2) සබ්බෙ ධම්මා අනත්තාති – හිමවන්තම්පි චාලයෙ
න වො දුක්ඛා පමුත්තත්‍යත්ථි – සමථො ච විපස්සනා,

(3) කාමච්ඡන්‍දං උපාදය – යො සො විතක්කෙහි බජ්ජති
සුභාවිතෙන බොජ්ඣඞ්ගෙ – සො ඉමං විජටයෙ ජටං.

(4) සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු – සමාධිං භික්ඛු භාවයෙ
කාමං කාමයමානස්ස – ධම්මචරියාය සුගතිං.

(5) හඤ්ඤතෙ සබ්බා මුච්චෙච – තිපෙථාලෙත්තා චතුද්දිසා
යො කාමෙ පරිවජ්ජෙති – පාරිවජ්ජෙන්තාපමෙන ච,

(6) යානි කරොති පුරිසො – ලොකධම්මා පකාසිතා
සුඛො විපාකො පුඤ්ඤානං – තථියං අඤ්ඤං න විජ්ජති,

(7) ආදීනස්ස භයං ඤත්වා – ජායති ජීයතීති ච
කාමා හි චිත්‍රා මධුරා – අථ බාලිසිකොපමං,[2]

(8) න හි පාපං කතං කම්මං – අගතිහි ච ගච්ඡති,
යස්සින්‍ද්‍රියානි සමථං ගතානි – තථෙව පඤ්චඤ්ඤණිකො.

(9) සත්තියා විය ඔමට්ඨො – විඤ්ඤාණං ච පතිට්ඨිතං;
යො පාණමතිපාතෙති – තීණි දුච්චරිතානි ච,

(10) සට්ඨිවස්සසහස්සානි – ඛණං ලද්ධාන දුල්ලභං
අයසාව මලං සමුට්ඨිතං – චතුසු පටිපජ්ජති,

(11) නෙලඞ්ගො සෙතපච්ඡාදෙ – අථ ගොපාලකූපමං
සුඛො විවෙකො තුට්ඨස්ස – විතක්කා ච සුදෙසිතා,

(12) ඵෙණපිණ්ඩූපමං රූපං – බ්‍රහා උජු පතාපවා
පඤ්ඤා හි සෙට්ඨා ලොකස්මිං – අනඤ්ඤා තීණි ඉන්‍ද්‍රියානි,

---

1 { කරමානො –
ඝරෙ – මජසං }

2\. ලොණසල්ලොපමං – මජසං, PTS

(49) එහි අනුඤ්ඤාත ද පටික්ඛිත්ත ද කවරැ :

55. කයින් කුශලය කරන්නේ යැ කයින් සංවෘත වන්නේ යැ කායදුශ්චරිතය හැරපියා කායසුචරිතයෙහි හැසිරෙන්නේ යි.

ප්‍රථම පාද දෙකින් ද සතරවැනි පාදයෙන්ද අනුඥා කෙරෙති, 'කාදුච්චරිතං හිත්වා, යන තුන් වැනි පාදයෙන් ප්‍රතික්ෂිප්ත යි.

ඔයාවිභංගො......... ( ? )

(13) කාමෙසු සත්තා කාමසඞ්ගසත්තා – අථ වණ්ණාරහස්ස ච
සබ්බෙ ධම්මා අනත්තාති – අරියසච්චං ච දෙසිතං,

(14) එසොව මග්ගො නත්ථඤ්ඤො – සොතාපන්නොති බ්‍යාකරෙ
යස්සින්ද්‍රියානි සුභාවිතානි – අථ ධම්මපදෙහි ච,

(15) වචසා මනසා චෙව – පඤ්චක්ඛන්ධා අනිච්චතො
යානි කරෙති පුරිසො – තීණි සුචරිතානි ච,

(16) රූපං වෙදයිතං සඤ්ඤා – පඤ්චක්ඛන්ධා පකාසිතා
යෙ එවං පටිපජ්ජන්ති – බ්‍රහ්මචරියං ඵලානි ච,

(17) සබ්බපාපස්ස අකරණං – විමොක්ඛා තං හි දෙසිතා
නත්ථි පුත්තසමං පෙමං – දෙවානං අසුරාන ච,

(18) යං පත්තං යෙ උභො අන්තෙ – නන්දති සොචතී’ති ච
යෙ කෙචි භූතා භවිස්සන්ති – සත්ථාරා ච පකාසිතා

(19) යං ච කාමසුඛං ලොකෙ – බොජ්ඣඞ්ගා ච පකාසිතා
මග්ගා’ට්ඨඞ්ගිකො සෙට්ඨො තයො ච අග්ගපත්තියො

(20) කායෙන සංවරෙ සාධු – කරණීයං ච දෙසිතං
නත්ථි පුත්තසමං පෙමං – අකරණීයානි ච දෙසිතා,

(21) කායෙන කුසලං කයිරා – විනයං ච කාමසුඛං ලොකෙ
බොජ්ඣඞ්ගා ච සුදෙසිතා – දුද්දසං අමතං පදං.

---

**පෙටකොපදෙසෙ සාසනපට්ඨානං නාම**
**දුතියභූමි සමත්තා**

මේ එහි උද්දාන ගාථා යැ :

‘‘සචෙ භායථ දුක්ඛස්ස – පෙ – දුද්දසං අමතං පදං’’ යී උදාහෘත දේශනා සඳහන් කරන උද්දානගාථා පාළිවශයෙන් ම දක්වෙහන්නේ යි.

**පෙටකොපදෙසයෙහි සාසනපට්ඨාන නම් වූ**
**ද්විතීය භූමි සමාප්ත යි.**

# තතිය භූමි

තත්ථ කතමං සුත්තාධිට්ඨානං: ලොභාධිට්ඨානං, දොසාධිට්ඨානං, මොහාධිට්ඨානං, අලොභාධිට්ඨානං, අදොසාධිට්ඨානං, අමොහාධිට්ඨානං, කායකම්මාධිට්ඨානං, වාචාකම්මාධිට්ඨානං, මනොකම්මාධිට්ඨානං, සද්ධින්ද්‍රියාධිට්ඨානං, විරියින්ද්‍රියාධිට්ඨානං, සතින්ද්‍රියාධිට්ඨානං, සමාධින්ද්‍රියාධිට්ඨානං, පඤ්ඤින්ද්‍රියාධිට්ඨානං.

(1) තත්ථ කතමං ලොභාධිට්ඨානං:

1 විතක්කපමථිතස්ස[1] ජන්තුනො
තිබ්බරාගස්ස සුභානුපස්සිනො,
භීය්‍යො තණ්හා පවඩ්ඪති
එස ඛො දළ්හං[2] කරොති බන්ධනං.

'විතක්කපමථිතස්සා'ති කාමරාගො. 'සුභානුපස්සිනො'ති කාමවත්ථු. 'භීය්‍යො තණ්හා පවඩ්ඪතී'ති කාමතණ්හා. 'එස දළ්හං කරොති බන්ධන'න්ති රාගං. ඉති යො යො ධම්මො මූලනික්ඛිත්තො, සො යෙව තත්ථ ධම්මො උග්ගාහයිතබ්බො. (?) න භගවා එකං ධම්මං ආරබ්භ අඤ්ඤං ධම්මං දෙසෙති. යස්ස විතක්කොති කාමවිතක්කො, තමෙව විතක්කං කාමවිතක්කෙන නිද්දිසති, 'තිබ්බරාගස්සා'ති තමෙව විතක්කස්ස වත්ථුං නිද්දිසති 'සුභානුපස්සිනො භීය්‍යො තණ්හා පවඩ්ඪතී'ති තමෙව රාගං කාමතණ්හාති නිද්දිසති, 'එස දළ්හං කරොති බන්ධන'න්ති තමෙව තණ්හාසංයොජනං නිද්දිසති. එවං ගාථාසු අනුමිනිතබ්බං. එවං සවෙය්‍යාකරණෙසු.

තත්ථ භගවා එකං ධම්මං තිවිධං නිද්දිසති: නිස්සන්දතො හෙතුතො ඵලතො.

2. දදං පියො හොති භජන්ති නං බහූ
කිත්තිං ච පප්පොති යසො ච වඩ්ඪති,
අමඞ්කුභූතො පරිසං විගාහති
විසාරදො හොති නරො අමච්ඡරී.

'දද'න්ති යං යං දානං, ඉදං දානමයිකං පුඤ්ඤකිරියං[3]. තත්ථ හෙතු: යං චෙතං, 'භජන්ති නං බහූ' 'කිත්ති'න්ති යො ච කල්‍යාණො කිත්තිසද්දො ලොකෙ අබ්භුග්ගච්ඡති, යං බහුකස්ස ජනස්ස පියො භවති මනාපො ච. යං ච අවිප්පටිසාරී කාලඞ්කරොති අයං නිස්සන්දො, යං කායස්ස භෙදා දෙවෙසු උපපජ්ජතීති[4] ඉදං ඵලං. ඉදං අලොභාධිට්ඨානං[5].

---

1. විතක්කාමථිතස්ස - PTS.
2. ගාළ්හං - ම.
3. පුඤ්ඤක්‍රියං - ම, TS.
4. උපපජ්ජතීති - මජසං.
5. ලොභාධිට්ඨානං - මජසං.

# තෘතීයභූමි

එහි සුත්තාධිට්ඨාන කවරෙ යත් : 1. ලොභාධිට්ඨාන යැ 2. දෙසාධිට්ඨාන යැ. 3. මොහාධිට්ඨාන යැ 4. අලොභාධිට්ඨාන යැ 5. අදෙසාධිට්ඨාන යැ 6. අමොහ ධිට්ඨාන යැ 7. කායකම්මාධිට්ඨාන යැ 8. වාචාකම්මාධිට්ඨාන යැ 9. මනොකම්මා ධිට්ඨාන යැ 10. සද්ධින්ද්‍රියාධිට්ඨාන යැ 11. විරියින්ද්‍රියාධිට්ඨාන යැ 12. සතින්ද්‍රියා-ධිට්ඨාන යැ 13. සමාධින්ද්‍රියාධිට්ඨාන යැ 14. පඤ්ඤින්ද්‍රියාධිට්ඨාන යි.

(1) එහි ලොභාධිට්ඨාන කවරැ :

1. කාමාදි අකුශලවිතර්කයෙන් මැඩුණු දැඩි වූ කාමරාග ඇති අරමුණු ශුභවශයෙන් බලන සත්ත්වහට බෙහෙවින් තෘෂ්ණාව වැඩෙයි, තෙල පුද්ගල තෘෂ්ණාබන්ධනය දැඩි කරන්නේ යි.

''විතක්කපමථිතස්ස' යනු කාමරාග යැ, 'සුභානුපස්සිනො' යනු කාමවස්තු යැ. ''භියො තණ්හා පවඩ්ඪති' යනු කාමතෘෂ්ණා යැ, එස දළ්හං කරොති බන්ධනං'' යනු රාගය යි. මෙසේ යම් යම් ධර්මයෙක් මූලවශයෙන් තබන ලද ද ( ? ) මෙහි ඒ ධර්මය මැ දක්විය යුතු ( ? ) බුදුහු එක් ධර්මයක් අරබයා අන් දහමක් නො දෙසනසේක. යමෙක් කාමවිතර්කය විතර්ක කෙරේ ද, ඒ විතර්කය මැ කාමවිතර්කවශයෙන් දක්වනු ලැබේ. 'තිබ්බරාගස්ස' යී ඒ විතර්කයාගේ මැ වස්තුව දක්වති. 'සුභානුපස්සිනො භියො තණ්හා පවඩ්ඪති'යී ඒ රාගය මැ 'කාමතණ්හා' යයි දක්වති. 'එස දළ්හං කරොති බන්ධනං' යී ඒ තණ්හා සංයොජනය මැ දක්වති. මෙසේ ගාථාවන්හි ද වෙයයාකරණයන්හි ද ප්‍රමාණ කටයුතු.

එහි බුදුහු එක් ධර්මය අනුසස් හෙයින් ද හේතු හෙයින් ද ඵල හෙයින් දැයි ත්‍රිවිධ කොට දක්වන සේක.

2. නොමසුරු වූ මිනිස්තෙම දන් දෙනුයේ ප්‍රිය වූයේ වෙයි, බොහෝදෙන ඔහු ඇසුරු කෙරෙති, කීර්තියට ද පැමිණෙයි, ඔහුගේ යශස් වැඩෙයි, නො මකු වැ (තෙද ඇතිවැ) පිරිස් කරා පැමිණෙයි, විශාරද වූයේ වේ.

'දදං' යනු යම් යම් දනයෙකි. මේ දනමය පුණ්‍යක්‍රියා යැ, එහි 'භජන්ති නං බහූ' යන යමක් ඇද්ද තෙල හෙතු යැ. 'කිත්තිං, යනු යම් කල්‍යාණ කීර්තිශබ්දයෙක් ලොවැ උස්ව නැඟේ ද, බොහෝ දෙනාට ප්‍රිය මනාප වූයේ වේ ද විපිළිසර නැතිවැ කලුරිය කෙරේ ද, මේ අනුසසි, කය බිඳීමෙන් (මරණින් මතු) දෙව් ලොවැ උපදී යන මේ ඵල යි· මේ අලොභාධිට්ඨාන යි.



8—ඒ 078576

(2) තත්ථ කතමං දෙසනාධිට්ඨානං :

3. යො පාණමතිපාතෙති - මුසාවාදං ච භාසති,
ලොකෙ අදින්නං ආදියති - පරදාරං ච ගච්ඡති,
සුරාමෙරයපානං ච - යො නරො අනුයුඤ්ජති.

4. අප්පහාය පඤ්ච වෙරානි - දුස්සීලො ඉති වුච්චති,
කායස්ස භෙදා දුප්පඤ්ඤො - නිරයං සොපපජ්ජති.

'යො පාණමතිපාතෙතී'ති දුට්ඨො පාණමතිපාතෙති. 'මුසාවාදං ච භාසතී'ති දෙසොපඝාතනාය මුසාවාදං ච භාසති. 'සුරාමෙරයපානං ච යො නරො අනුයුඤ්ජතී'ති දෙසො නිදානං. 'යො ච සුරාමෙරයපානං අනුයුඤ්ජති. යථා පරදාරවිහාරී අමිතෙන ජනයති[2].

'පඤ්ච වෙරානි අප්පහායා'ති පඤ්චන්නං සික්ඛාපදානං සමතික්කමනං, සබ්බෙසං දෙසජානං සා පඤ්ඤත්ති[1], තෙනෙව දෙසජනිතෙන 'කම්මෙන දුස්සීලො ඉති වුච්චති' සො'පි ධම්මො හෙතුනා නිද්දිසිතබ්බො, නිස්සන්දෙන ඵලෙන ච.

''තීණි බාලස්ස බාලලක්ඛණානි : දුබ්භාසිතභාසී ච හොති දුච්චින්තිතචින්තී ච දුක්කතකම්මකාරී ච'' තත්ථ යං කායෙන ච වාචාය ච පරක්කමති, ඉදමස්ස දුක්කතකම්මකාරී, තත්ථ යං යථා ච මුසාවාදං භාසති, යථා පුබ්බනිද්දිට්ඨං, ඉදමස්ස දුබ්භාසිතා යං ච සඞ්කප්පෙති, මනොදුච්චරිතං බ්‍යාපාදං ඉදමස්ස දුච්චින්තිතචින්තිතා. යං සො ඉමෙහි තීහි බාලලක්ඛණෙහි සමන්නාගතො තීණි තජ්ජානි දුක්ඛානි දෙමනස්සානි අනුභවති, සො ච හොති සභග්ගතො වා පරිසග්ගතො වා, තජ්ජං කථං කථෙන්ති[4]. යදා භවති සො ච පාණාතිපාතාදි දස-අකුසලකම්මපථො, සො තතොනිදානං දුක්ඛං දෙමනස්සං පටිසංවෙදෙතී'ති.

පුනචපරං යදා පස්සති චොරං රාජාපරාධිකං රඤ්ඤා ගහිතං ජීවිතා වොරොපෙන්තං, තස්සෙවං භවති 'සචෙ මමම්පි රාජා ජානෙය්‍ය මමම්පි රාජා ගාහාපෙත්වා ජීවිතා වොරොපෙය්‍යා'ති සො තතොනිදානං දුක්ඛං දෙමනස්සං පටිසංවෙදෙති.

පුනචපරං බාලො යදා භවති ආසනා සමාරූළ්හො යාව යා මෙ ගති භවිස්සති ඉතො පෙච්ච පරම්මරණා'ති සො තතොනිදානං දුක්ඛං දෙමනස්සං පටිසංවෙදෙති ඉති බාලලක්ඛණං හෙතු, තීණි තජ්ජානි දුක්ඛානි නිස්සන්දො කායස්ස භෙදා නිරයෙසු උප්පජ්ජති, ඉදං ඵලං ඉදං දෙසනාධිට්ඨානං.

---

1. අභිභිජ්ඣති - PTS.
2. අමිත්තා ජායන්ති - මජසං, PTS.
3. පණ්ණත්ති - මජසං
4. කථං කථෙන්ති - මජසං, කතං කතන්ති - PTS.

(2) එහි දෙසාධිට්ඨාන කවර :

3.4. (මේ ගාථා දෙක 4, 5, වැනි පිටේ ව්‍යාඛ්‍යාත යැ.)

'යො පාණමතිපාතෙති' යනු දුෂ්ට වූයේ ප්‍රාණවධ කෙරෙයි, 'මුසාවාදං ච භාසති' යනු ද්වේෂයෙන් උපහත බැවින් මුසවා බෙණෙයි, 'සුරාමෙරයපානං ච යො නරො අනුයුඤ්ජති, යනු දෙසනිදන යැ, යමෙක් රහමෙර පීමෙහි යෙදේ ද හේ පරදරවිහරණ ඇත්තකු සෙයින් සතුරන් උපදවයි.

'පඤ්ච වෙරානි අප්පහාය' යනු පඤ්ච ශික්ෂාපදයන් ඉක්මැවීම යැ, සියලු දෙසජ අකුශලයන්ට ඒ ප්‍රඥප්ති යැ, එහෙයින් මැ ද්වෙෂජනිත කර්මයෙන් දුශ්ශීලයෙකැ යි කියනු ලැබේ, ඒ ධර්මය ද හේතුයෙන් නිස්‍යන්දයෙන් හා ඵලයෙන් දක්වියැ යුතු.

'බාලයාගේ බාලලක්ෂණයෝ තිදෙනෙක් වෙති : දුර්භාෂිත කියන්නේත්, දුශ්චින්තිත සිතන්නේත් දුෂ්කෘතකර්ම කරන්නේත් වෙයි. එහි කයින් ද වචනයෙන් ද යම් උත්සාහ යෙක් ඇද්ද, මේ ඔහුගේ දුෂ්කෘතකර්මකාරී බව යැ. එහි යම්සේ යම් මුසාවාදයෙක් බෙණේ ද එය පළමු දක්වන ලද පරිදි යැ. මේ ඔහුගේ දුර්භාෂිතභාෂී බව යැ. යම් මනොදුශ්චරිත වූ ව්‍යාපාදයක් සිතා ද, මේ ඔහුගේ දුශ්චින්තිත චින්තී බව යි. හේ මේ තුන් බාලලක්ෂණයෙන් සමන්විත වූයේ එයින් උපන් තුන් දුක් දෙම්නස් විඳී. හේ සභාමැදට ගියේ හෝ පිරිස් මැදට ගියේ හෝ තදනුරූප වූ කථා බෙණෙයි, ඒ හේතුයෙන් ප්‍රාණ වධාදි·දශ අකුශලකර්මපථ ඇති හෙතෙම දුක් දෙම්නස් විඳී යයි.

යළිදු හෙතෙම යම්කලෙක රාජාපරාධ කළ, රජු විසින් ගන්නා ලද සොරකු දිවියෙන් තොර කරන්නහු දකී ද, එකල ඔහුට මේ සිත වෙයි : ඉදින් රජ මා ද දන්නේ නම් රජ මා ද ගන්වා දිවියෙන් තොරකරන්නේය'යි. හේ ඒ හේතුයෙන් දුක් දෙම්නස් විඳී.

නැවත ද බාල තෙමේ යම් කලෙක අසුනක හුන්නේ වේ ද, එ කල්හි මෙයින් මියැ මරණින් මතු මට යම්බඳු ගතියක් වන්නේ දැයි සිතා ද, හේ ඒ හේතුයෙන් දුක් දෙම්නස් විඳී. මෙසේ බාලලක්ෂණය හේතු යැ, එයින් උපන් තුන්වැදෑරුම් දුක නිස්‍යන්ද යැ, කය බිඳීමෙන් මරණින් මතු නිරයෙහි පළදී, මේ ඵල යි. මේ දෙසාධිට්ඨාන යි.

(3) තත්ථ කතමං මොහාධිට්ඨානං :

5. සතං චෙව සහස්සානං - කප්පානං සංසරිස්සති,
අථවා'පි තතො භිය්‍යො - ගබ්භා ගබ්භං ගමිස්සථ.

6. අනුප්පාදය බුද්ධවචනං - සඞ්ඛාරෙ අත්තතො උපාදය,
දුක්ඛස්සන්තං කරිස්සන්ති - ඨානමෙතං න විජ්ජති

සො'යං අනමතග්ගසංසාරං සමාපන්නො ජායති ච මීයති ච[1], අයං අවිජ්ජාහෙතුකා. යානි'පි ච සඞ්ඛාරානං පයොජකානි,[2] තානි'පි අවිජ්ජාපච්චයානි යං අදස්සානං බුද්ධවචනස්ස, අයං අවිජ්ජාසුත්තෙන යෙව නිද්දිට්ඨං. සො ච සඞ්ඛාරෙ අත්තතො හරති, පඤ්චක්ඛන්ධෙ පඤ්ච දිට්ඨියො උපගච්ඡති : 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති, ඉදං සුත්තං අවිජ්ජාය නික්ඛිත්තං අවිජ්ජාය නික්ඛිපිතං. එවං සත්ථා සුත්තෙන නයෙන ධම්මෙන නිද්දිසති'' අසාධාරණෙන තංයෙව තත්ථ නිද්දිසිතබ්බං. න අඤ්ඤං.

''යෙහි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ''ඉදං දුක්ඛ'න්ති නප්පජානන්ති'' (චත්තාරි සච්චානි විත්ථාරෙන.) යා තත්ථ අප්පජානනා, ඉදං දුක්ඛං. අයං හෙතු. අප්පජානන්තො විවිධෙ සඞ්ඛාරෙ අභිසඞ්ඛරොති, අයං නිස්සන්දො. යං ච දිට්ඨිගතානි පරාමසති, 'ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති අයං නිස්සන්දො. යං පුනබ්භවං නිබ්බත්තෙති, ඉදං ඵලං. අයම්පි ධම්මො නිද්දිට්ඨො,[3] හෙතුතො ච නිස්සන්දතො ච ඵලතො ච.

එත්ථ පන කෙචි ධම්මා සාධාරණා භවන්ති. හෙතු බලු ආදිතො යෙව සුත්තෙන නික්ඛිපිස්සන්ති. යථා කිං භවෙ : ''චත්තාරි'මානි භික්ඛවෙ අගතිගමනානි'' තත්ථ යං ච ඡන්දාගතිං ගච්ඡති. යං ච භයාගතිං ගච්ඡති, අයං ලොභො අකුසලමූලං, යං දොසා - අයං දොසො යෙව. යං මොහා - අයං මොහො යෙව. එවං ඉමානි තීණි අකුසලමූලානි ආදිතො යෙව උපපරික්ඛිතබ්බානි, යත්ථ එකං නිද්දිසිතබ්බං, තත්ථ එකං නිද්දිසියති. තථා ද්වෙ, තථා තීණි[4], න හි ආදිම්හි[5] අතික්කන්තෙන හෙතු වා නිස්සන්දො වා ඵලං වා නිද්දිසිතබ්බං. අයං චෙත්ථ ගාථා :

7. ඡන්දා දොසා භයා මොහා - යො ධම්මං අතිවත්තති
නිහීයති තස්ස යසො - කාළපක්ඛෙව චන්දිමා.

තත්ථ ඡන්දා ච, අයං ලොභො යථානිද්දිට්ඨං පුබ්බෙ ඉදං මොහාධිට්ඨානං.

---

1. ජායතෙ ච මීයතෙ ච - ම. PTS.
2. පයෝජනානි - මජ්සං, PTS,
3. සනිද්දිට්ඨො - මජ්සං, PTS.
4. යථා තීණි - මජ්සං, PTS.
5. ආදිහි - මජ්සං, PTS.

(3) එහි මොහාධිට්ඨාන කවරැ :

5. කල්ප සියදහසක් සසරැ සැරිසරන්නේ යැ, නොහොත් එයින් වැඩියක් කල් ගර්භයෙන් ගර්භයට (මවුකුසින් මවුකුසට) යන්නේ ය.

6. බුදුවදන් නොගෙන සංස්කාරයන් ආත්මවශයෙන් ගෙන දුක් කෙළවරකරන්නේය යන තෙල කරුණු නො වේ.

අනවරාග්‍ර සංසාරයට සමාපන්න වූ මේ පුද්ගල උපදනේ ද මියන්නේ ද වෙයි. මේ අවිද්‍යා හේතුක යැ, සංස්කාරයන්ගේ යම් යෙදීම් කෙනෙක් ඇද්ද ඔහුදු අවිද්‍යාව ප්‍රත්‍යය කොට ඇත්තාහුය, බුද්ධවචනයාගේ යම් නො දැනීමෙක් ඇද්ද මේ අවිජ්ජාසූත්‍රයෙහි මැ දක්වනලද. යමෙකුත් සංස්කාරයන් ආත්මවශයෙන් ගනී ද හේ පඤ්චස්කන්ධයෙහි 'තෙල මාගේ යැ තෙලෙ මම් වෙමි තෙලෙ මාගේ ආත්ම වේ'' යයි පඤ්ච දෘෂ්ටීන්ට පැමිණේ. මේ සූත්‍රය අවිද්‍යායෙහි ලා වදරනලද, මෙසේ බුදුහු සූත්‍රයෙහි අසාධාරණ වූ දහම් නයින් දක්වන සේක. එය මැ එහි දක්විය යුතු යැ, අනෙකක් නොදක්විය යුතු.

''මහණෙනි, යම් කිසි මහණකෙනෙක් හෝ බමුණුකෙනෙක් හෝ 'මේ දුකැ'යි නොදනිත් ද, (සිවුසස් විස්තරයෙන්) එහි යම් නො දැනීමක් ඇද්ද, මේ දුක යැ, මේ හේතු යි. නොදන්නේ විවිධ සංස්කාරයන් රැස්කෙරෙයි. මේ නිස්සන්ද' යැ. මෙය මැ සැබව අන්‍යය සිස් යැ'යි යම් දෘෂ්ටියක් පරාමර්ශ කෙරේ ද මේ නිස්සන්ද යැ, යම් පුනර්භවයක් උපදවා ද, මේ ඵල යි. මේ ධර්මය ද හේතුවශයෙනුදු නිස්සන්දවශයෙනුදු ඵලවශයෙනුදු දක්වන ලද.

මෙහි වැලිත් කිසි ධර්මකෙනෙක් සාධාරණ වෙති, හේතුව වනාහි ආදියෙහි ම සූත්‍රයෙහි නික්ෂෙප කෙරෙති, කුමක් මෙන් ද යත් : ''මහණෙනි, මේ අගති ගමනයෝ සතර දෙනෙක් වෙති''. එහි යම් ඡන්දයෙන් අගතියට යැමෙක් ඇද්ද භයින් අගතියට යැමෙක් ඇද්ද, මේ ලොභඅකුශලමූල යැ. යම් ද්වෙෂයෙන් අගතිගමනෙක් ඇද්ද මේ දෙස අකුසල මූල යැ, යම් මෝහයෙන් අගතිගමනෙක් ඇද්ද මේ මෝහඅකුසලමූලය මැය. මෙසේ මේ තුන් අකුශලමූලයෝ ආදියෙහි මැ විමසියැයුත්තාහ. යම් තැනෙක එකක් දක්විය යුතු ද, එහි එකෙක් දක්වනු ලැබේ. දෙකක් තුනක් දක්විය යුතු තැන ද එසේ යැ. ආදි යෙහි නො දක්වූ කල්හි හෙතුව හෝ නිස්සන්දය හෝ ඵලය හෝ නො මැ දක්වියයුතු. මේ මෙහි ගාථා යැ.

7. ඡන්දහේතුයෙනුදු ද්වේෂහේතුයෙනුදු භයහේතුයෙනුදු මෝහහේතුයෙනුදු යමෙක් දහම් ඉක්මැයේ නම් ඔහුගේ කීර්ති-පරිවාරයශස් අවපස සඳ මෙන් පිරිහේ.

එහි ඡන්දහෙතුයෙනුදු.........මේ ලොභ යැ. පෙර දක්වූ පරිදි යැ. මේ මොහාධිට්ඨාන යි.

(4) තත්ථ කතමං අලොභාධිට්ඨානං :

8. අසුභානුපස්සිං විහරන්තං - ඉන්ද්‍රියෙසු සුසංවුතං,
භොජනම්හි ච මත්තඤ්ඤුං - සද්ධං ආරද්ධවීරියං,
තං වෙ නප්පසහති මාරො - වාතො සෙලං'ව පබ්බතන්ති.

තත්ථ යා අසුභාය උපපරික්ඛා, අයං කාමෙසු ආදීනවදස්සනෙන පරිච්චාගො ඉන්ද්‍රියෙසු සුසංවුතො තස්සෙව අලොභස්ස පාරිපූරියං මම ආයතනා නොහනතී'ති[1] අනුපාදය, භොජනම්හි ච මත්තඤ්ඤූ'න්ති රසතණ්හාපහානං, ඉති අයං අලොභො අසුභානුපස්සිතාය වත්ථුතො ධාරයති, සො අලොභො හෙතු. ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය ගොචරතො ධාරයති, භොජනෙ මත්තඤ්ඤුතාය පරතො ධාරයති, අයං නිස්සන්දො. 'තං වෙ නප්පසහති මාරො වාතො සෙලංව පබ්බත'න්ති ඉදං ඵලං. ඉති යොයෙව ධම්මො ආදිම්හි නික්ඛිත්තො, සොයෙව මජ්ඣෙ චෙව අවසානෙ ච.

''නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස අනුප්පාදාය උප්පන්නස්ස වා පහානාය. යථයිදං අසුභනිමිත්තං.'' තත්ථ අසුභ නිමිත්තං අනුප්පන්නො චෙව කාමච්ඡන්දො න උප්පජ්ජති, උප්පන්නො ච කාමච්ඡන්දො පහීයති. ඉදං අලොභස්ස වත්ථු. යං පුන අනුප්පන්නො කාමරාගො පරියාදියති රූපරාගං අරූපරාගං, ඉති ඵලං. ඉති අයම්පි ච ධම්මො නිද්දිට්ඨො හෙතුතො ච නිස්සන්දතො ච ඵලතො ච. ඉදං අලොභාධිට්ඨානං.

(5) තත්ථ කතමං අදොසාධිට්ඨානං :

9. එකම්පි චෙ පාණමදුට්ඨචිත්තො
මෙත්තායති කුසලො තෙන හොති,
සබ්බෙ ච පාණෙ මනසා'නුකම්පං
පහූතමරියො පකරොති පුඤ්ඤං.

''එකම්පි චෙ පාණමදුට්ඨචිත්තො මෙත්තායතී''ති අයං අදොසො නිග්ඝතෙන අස්සාදෙ, 'කුසලො තෙන හොතී'ති තෙන කුසලෙන ධම්මෙන සංයුත්තො ධම්මපඤ්ඤත්තිං ගච්ඡති. 'කුසලො'ති යථා පඤ්ඤාය පඤ්ඤෙ පණ්ඩිච්චෙන පණ්ඩිතො. 'පහූතමරියො පකරොති පුඤ්ඤ'න්ති තස්සා යෙව විපාකො, අයං ලොකියස්ස, න හි ලොකුත්තරස්ස තත්ථ යා මෙත්තායනා, අයං හෙතු යං කුසලො භවති, අයං නිස්සන්දො, යාව අබ්‍යාපජ්ජභූමියං[2]. බහුං පුඤ්ඤං[3] පසවති, ඉදං ඵලං. ඉති අදොසො නිද්දිට්ඨො හෙතුතො ච නිස්සන්දතො ච ඵලතො ච.

''එකාදසානිසංසා මෙත්තාය චෙතොවිමුත්තියා'' තත්ථ යා මෙත්තාචෙතොවිමුත්ති, අයං අරියධම්මෙසු රාගවිරාගා චෙතොවිමුත්ති, ලොකිකාය භූමිකා හෙතු, යං සුඛං ආයතිං මනාපො හොති මනුස්සානං. ඉමෙ එකාදස ධම්මා නිස්සන්දො, යං ච අකතාවී බ්‍රහ්මකායෙ උප්පජ්ජති[4] ඉදං ඵලං, ඉදං අදොසාධිට්ඨානං.

1. ආයතනනොවිහං - මජසං, PTS.
2. අබ්‍යාපජ්ඣා භූමියං - මජසං, PTS.
3. බහුපුඤ්ඤං - ම, PTS.
4. උපපජ්ජති - ම.

(4) එහි අලොභාධිට්ඨාන කවරැ :

8. උද්ධුමාතකාදි අශුභයක් අනුව බලමින් වසන ඉඳුරන් කෙරෙහි මැනැවින් සංවර වූ භෝජනයෙහි පමණ දන්නා ශ්‍රද්ධා ඇති සතර ඉරියව්වෙහි වඩන ලද වීර්‍ය්‍ය ඇති ඒ පුද්ගලයා වාතය හුදු සෙල්පව්වක් සෙයින් ක්ලේශමාර තෙමේ එකාන්තයෙන් මැඩලියැ නොහේ යයි.

එහි අශුභය පිළිබඳ යම් උපපරික්ෂායෙක් වේ ද මේ කාමයන්හි ආදීනව දැකීමෙන් හැරපීම යැ, ඉන්ද්‍රියයන්හි සුසංවෘත වූයේ ඒ අලොභයාගේ මැ පිරිමෙහි ලා මාගේ ආයතනයෝ හොබනාහ' යි නොගෙන, භොජනම්හි ච මත්තඤ්ඤුං' යනු රසතෘෂ්ණාප්‍රහාණය යැ, මෙසේ මේ අලෝභය අශුභානුදර්ශීභාවයෙන් වස්තුවශයෙන් ධරයි, ඒ අලෝභය හේතු යැ ; ඉන්ද්‍රියයන්හි පියූ දෙර ඇති බැවින් ගොචරහෙයින් ධරයි, භෝජනයෙහි පමණ දන්නා බැවින් පරභාවයෙන් ධරයි, මේ නිස්සන්ද යැ, ''තං වෙ නප්පසහති මාරො වාතො සෙලංව පබ්බතං'' යන මේ ඵල යි. මෙසේ යම් මැ ධර්මයෙක් ආදියෙහි නික්ෂේප කරන ලද ද ඒ ධර්මය මැ මධ්‍යයෙහි ද අවසානයෙහි ද නික්ෂේප කරන ලදි.

''මහණෙනි, මම නූපන් කාමච්ඡන්දයාගේ නො ඉපදීම පිණිස හෝ උපන් කාමච්ඡන්ද යාගේ ප්‍රහාණය පිණිස හෝ මේ අශුභ නිමිත්ත යම් බඳු ද එබඳු වූ අන් එක දහමකුදු නො දක්මි.'' එහි අශුභනිමිත්ත (හෙතුයෙන්) නූපන් කාමච්ඡන්දයත් නූපදී, උපන් කාමච්ඡන්දයත් ප්‍රහීණ වෙයි. මේ අලොභයට වස්තු යැ. යළි යම් හෙයකින් නූපන් කාමරාග තෙමේ රූපරාගය අරූපරාගය මැඩගනී' යනු ඵල යි. මෙසේ මේ ධර්මය ද හෙතුවශයෙන් ද නිස්සන්දවශයෙන් ද ඵලවශයෙන් ද දක්වන ලදි. මේ අලොභාධිට්ඨාන යි.

(5) එහි අදෙසාධිට්ඨාන කවරැ :

9. ඉදින් ව්‍යාපාදයෙන් අදූෂිත සිත් ඇතියේ එක් ප්‍රාණියකුට පවා මෙත් වඩා ද, ඒ මෙත් වැඩීමෙන් මහත් කුසල් ඇතියේ වෙයි. සියලු ප්‍රාණීන් ට සිතින් අනුකම්පා කරන ආර්‍ය්‍ය (පිරිසුදු සිත් ඇති) පුද්ගල බොහෝ පින් උපදවයි.

'එකම්පි චෙ පාණමදුට්ඨචිත්තො මෙත්තායති' යනු මේ අදෙස යැ, ද්වේෂ ප්‍රහාණයෙන් ආස්වාදය වේ. 'කුසලො තෙන හොති' යනු ඒ කුශලධර්මයෙන් යුක්ත වූයේ ධර්ම ප්‍රඥප්තියට යෙයි, 'කුසලො' යනු යම්සේ ප්‍රඥයෙන් ප්‍රාඥ වූයේ පාණ්ඩිත්‍යයෙන් පණ්ඩිත වූයේ ද එමෙනි. 'පහුතමරියො පකරොති පුඤ්ඤං' යනු ඒ මෙත්තාවගේ මැ විපාක යැ, මේ ලෞකික කුශලයාගේ යැ. ලොකොත්තරකුශලයාගේ නොමැ වෙයි. එහි යම් මෙත් වැඩීමෙක් ඇද්ද මේ හේතු යැ. යම් කුසල්ඇතියේ වේ ද, මේ නිස්සන්ද යැ. යම්තාක් අව්‍යාපාද භූමියෙහි සිට බොහෝ පින් උපදවා ද, මේ ඵල යි. මෙසේ හේතු වශයෙන් ද නිස්සන්ද වශයෙන් ද ඵලවශයෙන් ද අදෙසය දක්වන ලදි.

'මෙත්තාචෙතොවිමුත්තියෙහි එකොළොස් අනුසස් කෙනෙක් වෙති''. එහි යම් මෙත්තාචෙතොවිමුක්තියක් ඇද්ද මේ ආර්‍ය්‍ය ධර්මයන් කෙරෙහි රාගවිරාගචෙතොවිමුත්ති යැ. ලෞකිකභූමියෙහි වූවා හේතු යැ, යම් සුවයෙක් වේ ද මතුයෙහි මිනිසුන්ට මනාප වේ ද, මේ එකොළොස් ධර්මයෝ නිස්සන්ද යැ. යම් මාර්ගයෙන් කළ කිස නැතියේ බඹලොවැ උපදී ද, මේ ඵල යි. මේ අදෙසාධිට්ඨාන යි.

(6) තත්ථ කතමං අමොහාධිට්ඨානං :

10. පඤ්ඤා හි සෙට්ඨා ලොකස්මිං - යා'යං නිබ්බෙධගාමිනී,
යාය සම්මා පජානාති - ජාතිමරණසඞ්ඛයං[1].

'පඤ්ඤා හි සෙට්ඨා'ති වත්ථුං, 'නිබ්බෙධගාමිනී'ති නිබ්බානගාමිනියං යථාභූතං පටිවිජ්ඣති. 'සම්මා පජානාති ජාතිමරණසඞ්ඛය'න්ති අමොහො 'පඤ්ඤා'ති හෙතු, යං පජානාති අයං නිස්සන්දො, යො ජාතිමරණසඞ්ඛයො, ඉදං ඵලං. ඉති අමොහො නිද්දිට්ඨො හෙතුනා ච නිස්සන්දෙන ච ඵලෙන ච.

තීණි'මානි භික්ඛවෙ ඉන්ද්‍රියානි : අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං, තත්ථ කතමං අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං : ඉධ භික්ඛවෙ භික්ඛු අනභිසමෙතස්ස දුක්ඛස්ස අරියසච්චස්ස අභිසමයාය ඡන්දං ජනෙති වායමති විරියං[2]. ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. (එවං චතුන්නං අරියසච්චානං කාතබ්බං.) තත්ථ කතමං අඤ්ඤින්ද්‍රියං : ඉධ භික්ඛවෙ භික්ඛු 'ඉදං දුක්ඛං අරියසච්ච'න්ති යථාභූතං පජානාති, (යාව ධම්මා,) ඉදං අඤ්ඤින්ද්‍රියං. ආසවක්ඛයා අනාසවො හොති, ඉදං වුච්චති අඤ්ඤාතාවින්ද්‍රියං. තත්ථා'යං පඤ්ඤා, අයං හෙතු. යං ඡන්දං ජනෙති වායමති, යා පජානාති, අයං නිස්සන්දො. යෙන සබ්බසො ආසවානං ඛයො අයං හෙතු,[3] යං ඛයෙ ඤාණමුප්පජ්ජති අනුප්පාදෙ ඤාණං ච අයං නිස්සන්දො, යං අරහත්තං, ඉදං ඵලං. තත්ථ 'ඛීණා මෙ ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීය'න්ති, ඉදං ඛයෙ ඤාණං. 'නාපරං ඉත්ථත්තායා'ති පජානාතී'ති ඉදං අනුප්පාදෙ ඤාණං. ඉති ඉමානි ඉන්ද්‍රියානි. අමොහො නිද්දිට්ඨො හෙතුනා ච නිස්සන්දෙන ච ඵලෙන ච. ඉමානි අසාධාරණානි නිද්දිට්ඨානි.

තත්ථ කතමානි කුසලමූලානි සාධාරණානි :

"කුසලං ච වො භික්ඛවෙ දෙසෙස්සාමි කුසලමූලං චෙව. තත්ථ කතමං කුසලමූලං : අලොභො අදොසො අමොහො. තත්ථ කතමං කුසලං : අට්ඨ සම්මත්තානි, සම්මාදිට්ඨි යාව සම්මාසමාධි. තත්ථ යානි කුසලමූලානි, අයං හෙතු යං ච අලොභො තීණි කම්මානි සමුට්ඨාපෙති : සඞ්කප්පං වායාමං සමාධිං ච. අයං අලොභස්ස නිස්සන්දො. තත්ථ යො අදොසො, අයං හෙතු. යං තයො ධම්මෙ පට්ඨපෙති : සම්මාවාචං සම්මාකම්මන්තං සම්මාආජීවං ච, අයං නිස්සන්දො. තත්ථ යො අමොහො හෙතු, යං ද්වෙ ධම්මෙ උපට්ඨපෙති : අවිපරීතදස්සනම්පි ච අනභිලාපනං, අයං නිස්සන්දො. ඉමස්ස බ්‍රහ්මචරියස්ස යං ඵලං තා ද්වෙ විමුත්තියො : රාගවිරාගා චෙතොවිමුත්ති අවිජ්ජාවිරාගා ච පඤ්ඤාවිමුත්ති, ඉදං ඵලං. ඉති ඉමානි තීණි කුසලමූලානි නිද්දිට්ඨානි හෙතුතො ච නිස්සන්දතො ච ඵලතො ච, එවං සාධාරණානි කුසලානි පටිවිජ්ඣිතබ්බානි.

1. ජතිභව පරික්ඛයං - ඉති වි.
2. විරියං - මජසං.
3. ඛයා හෙතු - මජසං, PTS.

(6) එහි අමොහාධිට්ඨාන කවරැ :

10. යම් ප්‍රඥවක් නිර්වෙදගාමිනී වේද, යම් ප්‍රඥවකින් ජාතිමරණයන්ගේ ක්ෂය වීම් සංඛ්‍යාත නිවන මැනැවින් ප්‍රත්‍යක්ෂ කෙරේ ද, ඒ විදර්ශනා සහිත මාර්ගප්‍රඥව මැ ලොවැ ශ්‍රෙෂ්ඨ වන්නී යැ.

''පඤ්ඤා හි සෙට්ඨා'' යනු වස්තු යැ. ''නිබ්බෙධගාමිනි'' යනු නිර්වාණගාමිණී මාර්ගය යථාභූත වැ ප්‍රතිවෙධ කෙරෙයි. ''සම්මා පජානාති ජාතිමරණ සංඛයං යනු අමොහ යැ. ''පඤ්ඤා' යනු හේතු යැ, යමක් දැන ගනී ද මේ නිස්සන්ද යැ. යම් ජාතිමරණයන්ගේ ක්ෂය වීමෙක් ඇද්ද මේ ඵල යි. මෙසේ හේතුයෙන් ද නිස්සන්දයෙන් ද ඵලයෙන් ද අමොහය දක්වන ලද්දේ යි.

'මහණෙනි මෙ ඉන්ද්‍රියයෝ තිදෙනෙක් වෙති : අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය අඤ්ඤින්ද්‍රිය අඤ්ඤාතාවින්ද්‍රිය යි. එහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය කවරැ : මහණෙනි, මෙ සස්නෙහි මහණ අවබෝධ නොකළ දුඃඛාර්‍ය්‍යසත්‍යයාගේ අභිසමය පිණිස කත්තුකම්‍යතාකුසලච්ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි, වීර්‍ය්‍යාරම්භ කෙරෙයි, සිත දැඩි ව ගනී, ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි. (මෙසේ සතර ආර්‍ය්‍යසත්‍යයන්ගේ විස්තරය කළ යුතු.) එහි අඤ්ඤින්ද්‍රිය කවරැ : මහණෙනි, මෙ සස්නෙහි මහණ මෙ දුඃඛාර්‍ය්‍යසත්‍යයයි යථාභූතව දැනගනී. (මෙහි පාළිය) මේ අඤ්ඤින්ද්‍රිය යැ, ආස්‍රවක්ෂය වීමෙන් අනාස්‍රව වෙයි. මේ අඤ්ඤාතාවින්ද්‍රිය යි කියනු ලැබේ. මේ ප්‍රඥව එබඳු යි. මේ හේතු යැ. යම් ඡන්දයක් උපදවා ද වෑයම් කෙරේ ද යමක් දැනගනී ද මේ නිස්සන්ද යැ. යමකින් සර්වප්‍රකාරයෙන් ආස්‍රවයන්ගේ ක්ෂය වේ ද, මේ හේතු යි. යම් ක්ෂයඥනයකුත් අනුත්පාදඥනයකුත් උපදී ද, මේ නිස්සන්ද යැ, යම් රහත් බවක් වේ ද මේ ඵල යි. එහි මාගේ ජාතිය ක්ෂය වූ යැ. මහබඹසර වැස නිමවන ලද, සිවුමඟින් කළයුතු කිස කරන ලදැ'යි යන මේ ක්ෂයඥන යැ. මේ බැව් සඳහා අන් කටයුත්තෙක් නැතැයි දැනගනී' යන මෙය අනුත්පාදඥන යි. මෙසේ මේ ඉන්ද්‍රියයෝ වෙති. හෙතුයෙන් ද නිස්සන්දයෙන් ද ඵලයෙන් ද අමොහය දක්වන ලදි. මේ අසාධාරණ ඥනයෝ දක්වන ලද්දහු යි.

එහි සාධාරණ කුශලමූලයෝ කවරහ :

''මහණෙනි, තොපට කුශලය ද කුශලමූලය ද දෙසන්නෙමි, එහි කුශලමූලය කවරැ : අලොභය අදෙසය අමොහ යි. එහි කුශලය කවරැ : අෂ්ට සම්‍යක්ත්වයෝ යැ. සම්මා දිට්ඨිය පටන් සම්මාසමාධිය දක්වා යි. එහි යම් කුශලමූලයෝ වෙත් ද මේ හේතු යැ. අලොභය සංකප්ප වායාම සමාධි යන තුන් කර්මයන් උපදවයි, මේ අලොභයාගේ නිස්සන්දයැ, එහි යම් අදෙසයෙක් වේ ද මේ හේතු යැ, යම් සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව ද යන තුන් ධර්මයන් පිහිටුවා ද මේ නිස්සන්ද යැ, එහි යම් අමොහ හේතුයෙක් ඇද්ද එය අවිපරීතදර්ශනය ද අනභිලාපය ද යන දෙ දහමුන් එළවයි. මේ නිස්සන්ද යැ. මේ බ්‍රහ්මචර්‍ය්‍යයාගේ යම් ඵලයෙක් වේ ද එය රාගවිරාග චෙතො විමුක්තිය අවිජ්ජාවිරාග පඤ්ඤාවිමුක්තිය ද යන විමුක්තිහු දෙදෙන යැ මේ ඵල යි. මෙසේ මේ තුන් කුශලමූලයෝ හෙතුහෙයින් ද නිස්සන්ද හෙයින් ද ඵලහෙයින් ද දක්වන ලද්දහු ය. මෙසේ සාධාරණ කුශලයෝ දතයුත්තාහු යි.

යත්ථ දුවෙ යත්ථ තීණි, අයං චෙත්ථ ගාථා :

11. තුලමතුලං ච සම්භවං – භවසඞ්ඛාරමවස්සජි මුනි,
අජ්ඣත්තරතො සමාහිතො – අභිදා[1] කවචමිවත්තසම්භවන්ති.

'තුලමතුලං ච සම්භව'න්ති තුලසඞ්ඛතං අතුලසඞ්ඛතං' තත්ථ යෙ සඞ්ඛතා තුලං, තෙ ද්වෙ ධම්මා : අස්සාදො ච ආදීනවො ච තුලිතා භවන්ති. එත්තකො කාමෙසු අස්සාදො. එත්තකො ආදීනවො ඉමස්ස, ඉදං නිස්සරණන්ති ඉති නිබ්බානං පජානාති.

ද්වීහි කාරණෙහි අතුලං න ච සක්කා තුලයිතුං, එත්තකං එතං නෙතං පරමත්ථීති තෙන අතුලං, අථ නිබ්බානං රතනන්ති[2] කරිත්වා අච්ඡරියභාවෙන අතුලං. තත්ථ කුසලස්ස ච අභිසම්භවා ජානනා පස්සනා, අයං අමොහො. යං තත්ථ ඡන්දතා ඔයිරණා (?) භවසඞ්ඛාරානං. අයං අලොභො, යං 'අජ්ඣත්තරතො සමාහිතො'ති වික්ඛෙපපටිසංහරණං.[3] අයං අදොසො. ඉති ඉමානි තීණි කුසලමූලානි, තුලමතුලං සම්භව'න්ති අයං අමොහො. යො භවසඞ්ඛාරානං සමොසරණං ලොභො, සම්මාසමාධීනං අස්සදො, අයං හෙතු. යං අජ්ඣත්තරතො අවිජ්ජණ්ඩකොසස්ස[4] සම්භෙදො, අයං නිස්සන්දො. සා පවත්ති. ඉමානි තීණි නිද්දිට්ඨානි කුසලමූලානි හෙතුතො ච නිස්සන්දතො ච ඵලතො ච.

එත්තාවතා එසා පවත්ති ච නිවත්ති ච, අකුසලමූලෙහි පවත්තන්ති, කුසලමූලෙහි නිවත්තන්තීති ඉමෙහි ච තීහි සබ්බං අකුසලං[5] සමොසරණං ගච්ඡති. සො ධම්මෙ වා වචනතො නිද්දිට්ඨො (?) තණ්හාති වා, කොධොති වා අසම්පජඤ්ඤන්ති වා අනුසයොති වා මක්ඛොති වා පලාසොති වා අසතීති වා[6] ඉස්සාති වා මච්ඡරියන්ති වා අඤ්ඤාණන්ති වා, තෙහි යෙ ච චතූහි නිද්දිසිතබ්බං. යස්සිමානි ද්වෙ වචනානි ධම්මපදානි නිද්දිට්ඨානි න සො අත්ථි කිලෙසො යො ඉමෙසු නවසු පදෙසු සමොධානං සමොසරණං ගච්ඡති, අයං කිලෙසො. න ච ලොභො න ච දොසො න ච මොහො. යථා අකුසලමූලානි, එවං කුසලානි පටික්ඛෙපෙන නිද්දිසිතබ්බානි. ඉදං අමොහාධිට්ඨානං.

(7) තත්ථ කතමං කායකම්මාධිට්ඨානං :

12. කායෙන කුසලං[7] කරෙ – අස්ස කායෙන සංවුතො,
කායදුච්චරිතං හිත්වා – කායසුචරිතං චරෙ.

"තීණි'මානි භික්ඛවෙ කායසුචරිතානි : පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී" ඉදං කායකම්මාධිට්ඨානං.

---

1. අභින්දි – මජසං.
2. පාපුණා රතනං – මජසං, PTS.
3. පටිසං හරණා – මජසං, PTS.
4. අවිජ්ජණ්ඩකොසං – මජසං, PTS.
5. අකුසලමූලං – මජසං, PTS.
6. අස්සතීතිවා – මජසං,
7. කුසලම්පි – PTS.

යත්ථ දුවෙ යත්ථ තීණි (?) මෙහි මේ ගාථාව ද වෙයි.

11. බුද්ධ මුනිහු කාමාවචර කර්මය ද (අතුලවූ) මහද්ගත කර්මය ද නොහොත් කාමාවචර රූපාවචර කර්මය හා අරූපාවචර කර්මය ද ඒ භවහේතුක කර්ම රැස්කරන පුනර්භව සංස්කාරය ද දුරුකළහ. (නොහොත් අතුල වූ නිවන ද භවය ද තුලනය කරමින් ස්කන්ධමූල වූ භවසංස්කාරය ආර්‍යමාර්ගඥනයෙන් දුරුකළහ,) විදර්ශනාවශයෙන් අධ්‍යාත්මයෙහි ඇලුණාහු උපචාර අර්පණා සමාධීන් සමාහිත ව (යුද්ධශීර්ෂයෙහි මහා යොධයෙක්) සන්නාහය මෙන් ආත්ම සම්භව වූ සියලු ක්ලේශජාතය බිඳ ලූහ 'යි.

තුලමතුලං ච සම්භවං යනු තුල සංඛ්‍යාත ද අතුල සංඛ්‍යාත ද ධර්ම ය, එහි යම් සංඛත ධර්මයෝ තුල වෙත් ද, ඔහු ධර්මයෝ දෙදෙනෙකි : අස්සාදය ද ආදීනවය ද තුලිත වූවාහු වෙති. කාමයන්හි ආස්වාදය මෙතෙකැ මොහුගේ ආදීනවය මෙතෙකැයි මේ නිස්සරණ යයි මෙසේ නිවන දැනගනී.

දෙ ආකාරයෙකින් අතුල යැ, තෙල මෙතෙකැ යි තුලනය කරන්නට නො ද හැකි යැ, මෙයට අධික වූවක් නැත් නුයි එකරුණෙන් අතුල යැ, නිවන රත්න යැයි කොට ආශ්චර්‍ය භාවයෙන් අතුල යි. එහි කුසලයාගේ ඉපැදීමෙන් දැනීමක් නුවණින් දැකීමක් ඇද්ද, මේ අමොහ යැ, එහි භවසංස්කාරයන්ගේ දැනීමෙන් දුරැලීමෙක් ඇද්ද, මේ අලොභ යැ,

''අජ්ඣත්තරතො සමාහිතො''යී වික්ෂේපය දුරුකිරීමෙක් ඇද්ද මේ අදෙස යි. මෙසේ මේ තුන් කුශලමූලයෝ වෙති. 'තුලමතුලං සම්භවං' යන මේ අමෝහ යැ. භවසංස්කාර යන්ගේ සමොසරණය ඇති යම් ලොභයෙක් ඇද්ද, සම්‍යක්සමාධීන්ගේ යම් ආස්වාදයෙක් ඇද්ද මේ හේතු යැ, ආධ්‍යාත්මයෙහි ඇලුණේ අවිද්‍යා අණ්ඩකොෂයාගේ යම් බිඳීමෙක් ඇද්ද මේ නිස්සන්ද යැ, ඒ ප්‍රතිපත්ති යැ. මේ තුන් කුශලමූලයෝ හේතුවශයෙන් ද නිස්සන්දවශයෙන් ද ඵලවශයෙන් ද දක්වන ලද්දහු යි.

මෙතෙකින් මේ ප්‍රවෘත්තිය ද නිවෘත්තිය ද වෙයි, අකුශලමූලයන්ගෙන් ප්‍රවෘත්තිය ද කුශලමූලයන්ගෙන් නිවෘත්තිය ද වේ නුයි මේ තුනෙන් සියලු අකුශලය එක්වීමට යෙයි. හෙ ද ධර්මයෙහි වචනයෙන් දක්වන ලද (?) තණ්හා යයි හෝ ක්‍රෝධ යැ අසම්පජඤ්ඤය‍ැ මක්ඛ යැ පළාස යැ අසති යැ ඉස්සා යැ මච්ඡරිය යැ අඤ්ඤාණ යැයි හෝ යමක් ඒ වස්තූන් ගෙන් දැක්විය යුතු ද ,ධම්මපද වූ යම් (පවත්ති–නිවුත්ති) යන වචන දෙකක් දක්වන ලද්දහු ද, යම් ක්ලේශයෙක් තණ්හා ආදි මේ නව පදයන්හි සමොධානයට, සමොසරණයට නොයේ ද එබඳු ක්ලේශයෙක් නැත. මේ ක්ලේශ යි. ලොභය ද දෙසය ද මොහය ද නො වේ. (? මේ වාක්‍යය, මුළුල්ල ව්‍යාකුල යි.) අකුශලමූලයෝ යම්සේ ද එසේ කුශලයෝ ද ප්‍රතික්ෂෙප වශයෙන් දැක්විය යුත්තාහු ය. මේ මොහාධිට්ඨාන යි.

(7) එහි කායකම්මාධිට්ඨානය කව ර :

12. කයින් කුසලය කරන්නේ යැ කයින් සංවර වන්නේ යැ කායදුශ්චරිතය හැරපියා කයින් සුචරිතයෙහි හැසිරෙන්නේ යැ.

''මහණෙනි, මේ කාය සුචරිතයෝ තිදෙනෙකි : ප්‍රාණඝාතයෙන් වෙන්වීම යැ අදත්තා දනයෙන් වෙන්වීම යැ කාමයෙහි මීස හසරින් වෙන්වීම'' යි. මේ කායකම්මාධිට්ඨාන යි.

(8) තත්ථ කතමං වාචාකම්මාධිට්ඨානං :

13 සුභාසිතං උත්තමමාහු සන්තො
ධම්මං භණෙ නාධම්මං තං දුතියං,
පියං භණෙ නාප්පියං තං තතියං
සච්චං භණෙ නාලිකං තං චතුත්ථං.

චත්තාරිමානි ච වචීසුචරිතානි. ඉදං වාචාකම්මාධිට්ඨානං.

(9) තත්ථ කතමං මනොකම්මාධිට්ඨානං :

14. මනෙන කුසලං කයිරා[1] – මනසා සංවුතො භවෙ,
මනොදුච්චරිතං හිත්වා – මනසා සුචරිතං චරෙ.

"තීණි'මානි මනොසුචරිතානි : අනභිජ්ඣා අබ්‍යාපාදො සම්මාදිට්ඨි, ඉදං මනොකම්මාධිට්ඨානං. ඉමානි අසාධාරණානි සුත්තානි.

තත්ථ කතමානි සාධාරණානි සුත්තානි :

15. වාචානුරක්ඛී මනසා සුසංවුතො
කායෙන ච අකුසලං න කයිරා[2],
එතෙ තයො කම්මපථෙ විසොධයෙ
ආරාධයෙ මග්ගං ඉසිප්පවෙදිතං[3].

"තිස්සො ඉමා භික්ඛවෙ පාරිසුද්ධියො : කායකම්මපාරිසුද්ධි වාචාකම්මපාරිසුද්ධි මනොකම්මපාරිසුද්ධි, තත්ථ කතමා කායකම්මපාරිසුද්ධි : පාණාතිපාතා වෙරමණී අදින්නාදානා වෙරමණී කාමෙසු මිච්ඡාචාරා මෙරමණී. තත්ථ කතමා වාචාකම්මපාරිසුද්ධි : මුසාවාදා වෙරමණී -පෙ- සම්ඵප්පලාපා වෙරමණී, තත්ථ කතමා මනොකම්මපාරිසුද්ධි : අනභිජ්ඣා අබ්‍යාපාදො සම්මාදිට්ඨි. ඉදං සාධාරණ සුත්තං.

ඉති සාධාරණානි ච සුත්තානි අසාධාරණානි ච සුත්තානි පටිවිජ්ඣිතබ්බානි, පටිවිජ්ඣිත්වා වාචාය කායෙන ච සුත්තස්ස අත්ථො නිද්දිසිතබ්බො

(10) තත්ථ කතමං සද්ධින්ද්‍රියාධිට්ඨානං :

16 යස්ස සද්ධා තථාගතෙ – අචලා සුප්පතිට්ඨිතා,
සීලං ච යස්ස කල්‍යාණං – අරියකන්තං පසංසිතං.

17. සඞ්ඝෙ පසාදො යස්සත්ථි – උජුභූතං ච දස්සනං,
අදලිද්දොති තං ආහු – අමොඝං තස්ස ජීවිතං.

18. සද්ධාවෙ නන්දිකා ආරා – ධිකො භො තස්ස සද්ධොති,
සබ්බං සියාති භගවන්තං – තථාරූපො ධම්මසම්පසාදො.

ඉදං සද්ධින්ද්‍රියාධිට්ඨානං.

---

1. නාකුසලං කයිරා – මජ්සං,
2. කුසලං කම්මං - මජ්සං, PTS.
3. මග්ගමිසිප්පවෙදිතං – ම.

(8) එහි වාචාකම්මාධිට්ඨාන කවරැ :

13. බුද්ධාදි සත්පුරුෂයෝ සුභාෂිතය උතුමැයි කීහු, ධර්මය මැ කියන්නේ යැ (මේ පළමුවන අංග යැ) අධර්මය නො කියන්නේ යැ එය දෙවන අංග යැ ප්‍රිය වචනය කියන්නේ යැ අප්‍රිය වූවක් නො කියන්නේ යැ ඒ තෙවන අංග යැ සැබවක් කියන්නේ යැ බොරු බසක් නො කියන්නේ යැ ඒ සතරවැනි අංග යි.

යළි මේ වාක් සුචරිතයෝ සතර දෙනෙක් වෙති. මේ වාචාකම්මාධිට්ඨාන යි.

(9) එහි මනොකම්මාධිට්ඨාන කවරැ :

14. සිතින් කුසලය කරන්නේ යැ සිතින් සංවෘත වන්නේ යැ මනොදුශ්චරිතය හැරපියා සිතින් සුචරිතයෙහි හැසිරෙන්නේ යි.

''මේ මනෝසුචරිතයෝ තිදෙනෙක් වෙති : අනභිධ්‍යා යැ අව්‍යාපාද යැ සම්මාදිට්ඨී යි. මේ මනොකම්මාධිට්ඨාන යි. මොහු අසාධාරණ සූත්‍රයෝ යි.

එහි සාධාරණ සූත්‍රයෝ කවරහ :

15. වාග්දුශ්චරිතය දුරැලීමෙන් වාග්ද්වාරය රක්නේ යැ සිතින් ද සංවෘත වන්නේ යැ කයිනුදු අකුසල් නො කරන්නේ යැ මේ තුන් කර්මපථය පිරිසිදු කරන්නේ යැ, බුද්ධාදි සෘෂින් විසින් ප්‍රවිදිත වූ ආර්‍ය්‍ය මාර්ගය සිද්ධ කරන්නේ යි.

''මහණෙනි මේ 'පාරිශුද්ධිහු තිදෙනෙක් වෙති : කායකර්ම පාරිශුද්ධි යැ වාක්කර්ම පාරිශුද්ධි යැ මනඃකර්මපාරිශුද්ධි යි. එහි කායකර්ම පාරිශුද්ධි කවර: ප්‍රාණවධයෙන් වැළැකීම යැ අදත්තාදනයෙන් වෙන් වීම යැ කාමමිථ්‍යාචාරයෙන් වෙන් වීම යි. එහි වාක්කර්මපාරිශුද්ධි කවර : මෘෂාවාදයෙන් වෙන්වීම යැ ......... සම්පප්‍රලාපයෙන් වෙන් වීම යි. එහි මනඃකර්මපාරිශුද්ධි කවර : අනභිධ්‍යා යැ අව්‍යාපාද යැ සම්‍යග්දෘෂ්ටි යි. මේ සාධාරණ සූත්‍ර යි.

මෙසේ සාධාරණ සූත්‍රයෝ ද අසාධාරණසූත්‍රයෝ ද දතයුත්තාහු ය, දූන වචනයෙන් ද සූත්‍රාර්ථය දක්විය යුත්තේ යි.

(10) එහි සද්ධින්ද්‍රියාධිට්ඨාන කවරැ :

16. යමක්හුගේ ශ්‍රද්ධාව තථාගතයන් කෙරෙහි අචල වැ මැනැවින් පිහිටියා ද යමක්හුගේ ශීලයත් කල්‍යාණ වූයේ ආර්‍ය්‍යයනට කාන්ත වූයේ පසස්නා ලද ද–

17. යමක්හට සංඝයා කෙරෙහි ප්‍රසාදය ඇද්ද (කායවංකාදි අභාවයෙන්) ඍජුවූ දර්ශනය වේ ද ඔහු නොදිළින්දෙකැයි කියති. ඔහුගේ ජීවිතය නො සිස් වෙයි.

18. එහෙයින් බුදුරදුන්ගේ අනුශාසනය සිහිකරන නුවණැති පුද්ගල ශ්‍රද්ධාව යැ ශීල යැ ප්‍රසාද යැ සිවුසස්දහම් දැකීම යැ යන මෙහි යෙදෙන්නේ යි.

මේ සද්ධින්ද්‍රියාධිට්ඨාන යි.

11. තත්ථ කතමං විරියින්ද්‍රියාධිට්ඨානං :

19. ආරභථ[1] නික්කමථ - යුඤ්ජථ බුද්ධසාසනෙ
ධුනාථ මච්චුනො සෙනං - නළාගාරංව කුඤ්ජරො.

"චත්තාරො'මෙ භික්ඛවෙ සම්මප්පධානා" ඉදං විරියින්ද්‍රියාධිට්ඨානං[2].

(12) තත්ථ කතමං සතින්ද්‍රියාධිට්ඨානං :

20. සතිමතො සදා[3] 'භද්දං - සතිමා සුඛමෙධති,
සතිමතො සුවෙ සෙය්‍යො[4] - වෙරා න පරිමුච්චති.

"චත්තාරො සතිපට්ඨානා" විත්ථාරෙන කාතබ්බා. ඉදං සතින්ද්‍රියාධිට්ඨානං.

(13) තත්ථ කතමං සමාධින්ද්‍රියාධිට්ඨානං :

21. ආකඞ්ඛතො තෙ නරදම්මසාරථි
දෙවා මනුස්සා මනසා විචින්තිතං,
සබ්බෙ න ජඤ්ඤා කසිණාපි පාණිනො
සන්තං සමාධිං අරණං නිසෙවතො.

'කිං තං භගවා ආකඞ්ඛතී'ති.

"තයො'මෙ භික්ඛවෙ සමාධි : සවිතක්කො සවිචාරො, අවිතක්කො විචාරමත්තො, අවිතක්කො අවිචාරො" ඉදං සමාධින්ද්‍රියාධිට්ඨානං.

(14) තත්ථ කතමං පඤ්ඤින්ද්‍රියාධිට්ඨානං ;

"පඤ්ඤා හි සෙට්ඨා ලොකස්මිං"න්ති විත්ථාරෙන.

"තිස්සො ඉමා භික්ඛවෙ පඤ්ඤා : සුතමයී චින්තාමයී භාවනාමයී" ඉදං පඤ්ඤින්ද්‍රියාධිට්ඨානං සුත්තං. ඉමානි ඉන්ද්‍රියාධිට්ඨානානි අසාධාරණානි සුත්තානි.

තත්ථ කතමානි සාධාරණානි ඉන්ද්‍රියාධිට්ඨානානි සුත්තානි :

22. අවීතරාගො කාමෙසු - යස්ස පඤ්චින්ද්‍රියා[5] මුදූ,
සද්ධා සති ච විරියං[6] - සමථො ච විපස්සනා,
තාදිසං භික්ඛුමාසජ්ජ - පුබ්බෙව උපහඤ්ඤති.

1. ආරම්භථ - ම.
2. විරියාධිට්ඨානං - ම.
3. සද්ධා සෙය්‍යො - PTS.
4. භද්දං අඤ්ඤ සතිමතො PTS.
5. පඤ්ඤින්ද්‍රියා - PTS.
6. විරියං - ම.

(11) එහි විරියින්ද්‍රියාධිට්ඨානය කවර :

19. ආරම්භධාතු සංඛ්‍යාත වීර්‍ය්‍යය කරවූ, කෞෂිද්‍යයෙන් නික්මැයන නිෂ්ක්‍රමධාතු සංඛ්‍යාත වීර්‍ය්‍යය කරවූ, ශමථ – විදර්ශනා සංඛ්‍යාත බුද්ධශාසනයෙහි යුක්ත ප්‍රයුක්ත වවූ, බලසම්පන්න ඇත්රජෙක් බටදඬින් කළ ගෙයක් ඇසිල්ලෙකින් මෙන් කෙලෙස් මරහුගේ කාමාදි සේනාව විද්ධවංසන කරවූ.

"මහණෙනි, මේ සම්‍යක්ප්‍රධානයෝ සතර දෙනෙකි." මේ විරියින්ද්‍රියාධිට්ඨාන යි.

(12) එහි සතින්ද්‍රියාධිට්ඨාන කවර :

20. සිහි ඇතියහුට හැම කල්හි භද්‍රය (යහපත) වෙයි,සිහි ඇතියේ සුවය ලබයි, සිහි ඇතියේ හැමකල්හි උතුම් වෙයි, (එතෙකින්), වෛරයෙන් නො මිදෙයි.

'සතර සතිපට්ඨානයෝ විස්තර කළයුත්තාහු යැ. මේ සතින්ද්‍රියාධිට්ඨාන යි.

(13) එහි සමාධින්ද්‍රියාධිට්ඨාන කවර :

21. නරදම්සැරිය, (සත්ත්වයන්ගේ හිතාර්ථය) කැමැතිවන නුඹ වහන්සේ විසින් (කරුණායෙන් සිහිල්වූ) සිතින් සිතන ලද අර්ථය දෙවියෝ ද මනුෂ්‍යයෝ ද සියලු අනවශේෂ ප්‍රාණීහු ද නො දන්නාහු යැ, ශාන්ත වූ අරණසමාධිය සෙවුනා බුදුරදුන්ගේ චින්තිතය– බුදුහු කුමක් කැමැති වෙත් ද'යි අන්‍යයනයට අවිසය වේ.

"මහණෙනි, මේ සමාධීහු තිදෙනෙක් වෙති : සවිතර්ක සවිචාර සමාධි යැ, අවිතර්ක විචාරමාත්‍ර සමාධි යැ අවිතර්ක අවිචාර සමාධි යි. මේ සමාධින්ද්‍රියාධිට්ඨාන යි.

(14) එහි පඤ්ඤින්ද්‍රියාධිට්ඨාන කවර :

"ලොවැ ප්‍රඥාව මැ ශ්‍රෙෂ්ඨවන්නී යැ" යන (ඉතිවුත්තක පාළි) මේ සූත්‍රය විස්තර කළයුතු.

"මහණෙනි මේ ප්‍රඥා තුනක් වෙති : සුතමයී චින්තාමයී භාවනාමයී යැ" : මේ පඤ්ඤින්ද්‍රියාධිට්ඨාන සූත්‍ර යි. මේ ඉන්ද්‍රියාධිට්ඨානයෝ අසාධාරණ සූත්‍රයෝ යි.

එහි සාධාරණ ඉන්ද්‍රියාධිට්ඨාන සූත්‍රයෝ කවරහ :

22. යමෙක් කාමයන්හි අවීතරාග වූයේ ද යමක්හුගේ සද්ධා සති විරිය සමථ විපස්සනා යන පඤ්චෙන්ද්‍රියයෝ මෘදු වෙත් ද එබඳු මහණහු කරා පැමිණ (හේ) පළමු මැ සටනු ලැබෙ.

"පඤ්චිමානි ඉන්ද්‍රියානි" සද්ධින්ද්‍රියාදි ඉන්ද්‍රියං දට්ඨබ්බං. තීසු අවෙච්චප්පසාදෙ විත්ථාරෙන සුත්තං කාතබ්බං, ඉමානි සාධාරණානි ඉන්ද්‍රියාධිට්ඨානානි සුත්තානි.

යං යස්ස සම්බන්ධං කුසලස්ස වා අකුසලස්ස වා තෙන තෙන අධිට්ඨානෙන තං සුත්තං නිද්දිසිතබ්බං. තත්ථඤ්ඤෙ ධම්මා නිද්දිසිතබ්බා.

තත්ථ සාධාරණං කුසලං, නාපි කුසලං අකුසලං, යථා සාධාරණානි ච කුසලමූලානි සාධාරණානි ච අකුසලමූලානි : උප්පන්නං කාමවිතක්කං පජහති -පෙ- චත්තාරො සම්මප්පධානා. කුසලං අකුසලං ච

තත්ථිමා උද්දානගාථා :

1. විතක්කෙන පමථිතො – දදං පියො කරෙ ඉති,
   යො පාණමතිපාතෙති – තීණි බාලස්ස ලක්ඛණා.

2. සතං චෙව සහස්සානං – යෙ ච සමණබ්‍රාහ්මණා,
   ඡන්දා දොසා භයා මොහා – චතූහි අගතීහි ච.

3. අසුභානුපස්සිං විහරන්තං – නිමිත්තං අසුභං තථා,
   එකම්පි චෙ පියං පාණං – මෙත්තා චෙව සුභාවිතා.

4. පඤ්ඤා හි සෙට්ඨා ලොකස්මිං – අනඤ්ඤා තීණි ඉන්ද්‍රියානි,
   කුසලාකුසලමූලානි – තුලමතුලං ච සම්භවං.

5. කායෙන කුසලං කරෙ – තීණි සුචරිතානි ච,
   සුභාසිතං උත්තමමාහු – වචීසුචරිතානි ච.

6 මනෙන කුසලං කයිරා – මනොසුචරිතානි ච,
   වාචානුරක්ඛී මනසා – තිස්සො ච පාරිසුද්ධියො.

7. යස්ස සද්ධා තථාගතෙ – සම්පසාදෙ ච දෙසිතෙ,
   ආරභථ නික්ඛමථ – යා ච සම්මප්පධානතා.

8. සතිමතො සදා භද්දං – සතිපට්ඨාන භාවනා,
   ආකඞ්ඛතො ච අනඤ්ඤඤ්ඤාණං – තයො චෙව සමාධයො

9. පඤ්ඤා හි සෙට්ඨා ලොකස්මිං – තිස්සො පඤ්ඤා පකාසිතා.
   විතරාගො කාමෙසු – සද්ධාදි පඤ්ච ඉන්ද්‍රියානි.

පෙටකොපදෙසෙ සුත්තාධිට්ඨානං නාම
තතිය භූමි සමත්තා

''මේ ඉන්ද්‍රියයෝ පස්දෙනෙක් වෙති', සද්ධින්ද්‍රියාදි ඉන්ද්‍රිය දතයුතු. බුද්ධාදි වස්තු ත්‍රයෙහි අවෙත්‍යප්‍රසාදයෙයි සූත්‍රය විස්තර කළයුතු. මේ සාධාරණ වූ ඉන්ද්‍රියාධිෂ්ඨාන සූත්‍රයෝ යි.

යමක් යම් කුසලයකට හෝ අකුසලයකට හෝ සම්බන්ධ වේ ද ඒ ඒ අධිෂ්ඨානයෙන් ඒ සූත්‍රය දැක්වියැ යුතු. අන් දහමෙක් නො දැක්වියැ යුතු.

එහි කුසලය සාධාරණ යැ, කුසලය හා අකුසලය නො ද සාධාරණ යැ, සාධාරණ කුසල මූලයෝ ද සාධාරණ අකුසල මූලයෝ ද යම්සේ ද එමෙනි. (?) උපන් කාමවිතර්කය දුරු කෙරෙයි......... සතර සම්‍යක් ප්‍රධානයෝ යි, මේ කුසල ද අකුසල ද වේ (!?)

එහි මේ උද්දානගාථා යැ :

(1) විතර්කයෙන් මඩනාලද්දේය, 'දදං පියො හොති'' යැ, යො පාණමතිපාතෙති යැ, බාලයාගේ බාලලක්ෂණයෝ යැ.

(මෙසේ උද්ධෘත පාඨයන්ගේ ආදි පද පාළි වශයෙන් ම දත හැකි ය. එහෙයින් සිංහල අනුවාදයෙක් අවශ්‍ය නොවේ.

පෙටකොපදෙසයෙහි සුත්තාධිෂ්ඨාන නම් වූ
තෘතීය භූමි සමාප්ත යි.

9—ඒ 078576

# චතුත්ථභූමි

තත්ථ කතමො සුත්තවිචයො :

තත්ථ කුසලෙහි ධම්මෙහි අකුසලෙහි ධම්මෙහි පුබ්බාපරසො සාධුකං උපපරික්ඛියති[1] කිං නු ඛො ඉදං සුත්තං ආරභි -පෙ- තෙහි සුත්තෙහි සහ අධිසන්ධාවෙහි යුජ්ජති, උදාහු න යුජ්ජතීති.

යථා භගවා කිලෙසෙ ආදිම්හි තත්ථ දෙසෙති, කිං දෙසිතං තෙසං කිලෙසානං පහානං උදාහු නො දෙසිතන්ති උපපරික්ඛිතබ්බං : යදි න දෙසිතං භගවතා[2] තෙසං කිලෙසානං පහානං, කුසලා ධම්මා පරියෙසිතබ්බා. යත්ථ තෙ අකුසලා පහානං ගච්ඡන්ති. සචෙ සමන්නෙසමානො[3] න ලභති. තත්ථ අකුසලා ධම්මා අපකඩ්ඪිතබ්බා විමංසිතබ්බා සංකිලෙසභාගියසුත්තං.

යදි කිලෙසා අපකඩ්ඪියන්තා. යෙ වා න දෙන්ති. තත්ථ උපපරික්ඛිතබ්බා අරියමග්ගධම්මා, තාසු භූමිසු කිලෙසා පහානං ගච්ඡන්ති, උදාහු න ගච්ඡන්තීති. යත්තකා පන කිලෙසා දෙසිතා, න තත්තකා අරියධම්මා දෙසිතා. යත්ථ කිලෙසා පහානං ගච්ඡන්ති, තත්ථ යෙ කිලෙසා අරියධම්මානං පටිපක්ඛෙන න යුජ්ජන්ති, තෙ අපකඩ්ඪිතබ්බා, සචෙ අපකඩ්ඪියන්තා යොජනං දෙන්ති, තත්ථ එවං වීමංසිතබ්බං : ද්වෙ තීණි වා තදුත්තරිං වා කිලෙසා එකෙන අරියමග්ගෙන පහානං ගච්ඡන්තීති. සචෙ එවං වීමංසියන්තා යොජනං දෙන්ති, තත්ථ උපපරික්ඛිතබ්බං : පරම්පරය වා පිටකසම්පදානෙන වා සුත්තස්ස අත්ථො ච නත්ථො ච යං වා න සක්කා සුත්තං නිද්දිසිතුං, නෙව සුත්තං විචිකිච්ඡිතබ්බං, එවං යථා ආදිම්හි කුසලා ධම්මා හොන්ති, යෙ කිලෙසා තෙ පහීනෙය්‍යාති, තෙ උපපරික්ඛිතබ්බා : පුරෙ වා කුසලෙ පටිපක්ඛෙන වා පුරෙ දෙසනා, අනූනා අනධිකා උග්ගහෙතබ්බා. යථා පඨමො උත්තිලො (?) යෙසම්දනි කිලෙසානං යෙ අරියධම්මා දෙසිතා ඉමෙ කිලෙසා ඉමෙහි අරියධම්මෙහි පහීයන්ති, උදාහු න පහීයන්තීති විචිනිතබ්බා. යදි උපපරික්ඛියමානා යුජ්ජන්ති ගහෙතබ්බා. අථ න යුජ්ජන්ති, යෙ කිලෙසා අපටිපක්ඛා හොන්ති, තෙ කිලෙසා අපරිපක්ඛිතබ්බා. යෙ ච අරියධම්මා පටිපක්ඛා හොන්ති, තෙ අරියධම්මා අපකඩ්ඪිතබ්බා. න හි අරියධම්මා අනාගාමි කිලෙසප්පහානං ගච්ඡන්ති, නාපි අරියධම්මා සබ්බකිලෙසානං පහානාය සංවත්තන්ති.

යථා කුසලා මෙත්තා, අකුසලො රාගො, න තු කුසලා මෙත්තාති සාරවා[4] අකුසලස්ස රාගස්ස පහානාය සම්භවති. බ්‍යාපාදෙ මෙත්තාය පහානං ගච්ඡති. තස්මා උභො කිලෙසා උපපරික්ඛිතබ්බා. යො යො ච

1. උපපරික්ඛියති – මජසං.
2. භගවති – මජසං, PTS.
3. සමන්නෙහමානො – PTS.
4. සාරෙඛා – PTS, මජසං,

# චතුත්ථභූමි

එහි 'සුත්තවිචය' කවරෙ යත් :

එහි කුශලධර්මයන්ගෙන් ද අකුශලධර්මයන්ගෙන් ද පූර්වාපර වශයෙන් මැනැවින් පරික්ෂා කරනු ලැබෙයි, කුමක් හෙයින් මේ සූත්‍රය ඇරැඹූහු ද ... ඉතා ආසන්න අර්ථ ඇති ඒ සූත්‍රයන් සමග යෙදේ ද, නොහොත් නො යෙදේ දෑ'යි.

ඒ මෙසේ යැ : බුදුහු එහි ආදියෙහි කෙලෙසුන් දෙසන සේක, කිමැ ඒ කෙලෙසුන්ගේ ප්‍රහාණය දෙසිත ද, නොහොත් නො දෙසිත දෑයි විමැසියැයුතු යැ, ඉදින් භාග්‍යවතුන් විසින් ඒ කෙලෙසුන්ගේ ප්‍රහාණය නොදෙසනලද නම්, කුශලධර්මයෝ සෙවියයුත්තාහු යැ. යම් තැනෙක ඒ අකුශලයෝ ප්‍රහාණයට යෙත් ද, ඉදින් විමසනුයේ නො ලැබේ නම් එහි අකුශලධර්මයෝ අපකර්ෂණය කළයුත්තාහු යැ විමැසියැයුක්තාහු යැ, සංකිලෙස භාගිය සූත්‍රයෙකි.

ඉදින් ක්ලේශයෝ අපකර්ෂණය කරනු ලබන්නාහු (යෙ වා න දෙන්ති ?) එහි ආර්‍ය්‍ය මාර්ග ධර්මයෝ පරික්ෂා කළයුත්තාහු ය : ඒ භූමීන්හි ක්ලේශයෝ ප්‍රහාණයට යෙත් ද, නොහොත් නො යෙත් දෑ'යි. යළි යම් පමණ ක්ලේශයෝ දෙසන ලද්දහු ද, එපමණ ආර්‍ය්‍ය ධර්මයෝ නො දෙසන ලද්දහු ද, යම් තැනෙක ක්ලේශයෝ ප්‍රහාණයට යෙත් ද, එහි යම් කෙලෙස් කෙනෙක් ආර්‍ය්‍ය ධර්මයන්ට ප්‍රතිපක්ෂයෙන් නො යෙදෙත් ද, ඒ කෙලෙස්හු බැහැර කළ යුත්තාහු යැ, ඉදින් බැහැර කරනු ලබන්නාහු යෙදීමට යෙත් ද එහි මෙසේ විමැසියයුතු : දෙකක් තුනක් හෝ එයින් වැඩියක් හෝ ක්ලේශයෝ එක් ආර්‍ය්‍යමාර්ගයෙකින් ප්‍රහාණයට යෙත් දෑ'යි. ඉදින් මෙසේ විමසනු ලබන්නාහු යෙදීමට යේ ද එහි මෙසේ විමැසියැ යුතු : පරම්පරායෙන් හෝ පිටකය හා සැසැඳෙනුයෙන් හෝ සූත්‍රයාගේ අර්ථය ද අර්ථ නො වූයේ ද විමැසියැයුතු. යම්හෙයකින් සූත්‍රය දක්වන්නට නො හැකි හෝ වේ ද, සූත්‍රය නොමැ සැක කළයුතු. මෙසේ ආදියෙහි යම්පරිදි කුශලධර්මයෝ වෙත් ද යම් කෙලෙස් කෙනෙක් වෙත් නම් ඔහු ප්‍රහීණ වන්නාහ යි ඔහු පරීක්ෂා කළයුත්තාහ. (පළමු කොට කුශලය හෝ ප්‍රතිපක්ෂ විසින් හෝ පළමුකොට දෙශනාව අනූන අනාධික කොට උගතයුත්තී යැ, (යථාපයමො උත්තිලො ?) දූන් යම් කෙලෙස් කෙනකුන්ට යම් ආර්‍ය්‍ය ධර්ම කෙනෙක් දෙසනලද්දහු ද, මේ කෙලෙස්හු මේ ආර්‍ය්‍යධර්මයන්ගෙන් ප්‍රහීණ වෙත් ද නොහොත් ප්‍රහීණ නො වෙත් දෑ යි විමැසියැයුත්තාහු යැ, ඉදින් පරික්ෂා කරනු ලබන්නාහු යෙදෙත් නම් ගතයුත්තාහු යැ, යළි නො යෙදෙන්නාහු නම් යම් කෙලෙස් කෙනෙක් ප්‍රතිපක්ෂ නො වෙත් ද ඒ කෙලෙස්හු බැහැර නො කළයුත්තාහු යැ යම් ආර්‍ය්‍යධර්ම කෙනෙක් (කෙලෙසුන්ට) ප්‍රතිපක්ෂ වෙත් ද, ඒ ආර්‍ය්‍යධර්මයෝ බැහැර කළයුත්තාහු යැ, ආර්‍ය්‍යධර්මයෝ නො පැමිණි කෙලෙසුන්ගේ ප්‍රහාණයට නො මැ යෙති. ආර්‍ය්‍යධර්මයෝ සියලු කෙලෙසුන්ගේ ප්‍රහාණය පිණිස නො ද පවතිත්.

ඒ මෙසේ යැ : මෛත්‍රිය කුසල්වූ යැ, රාගය අකුසලයෙකි, මෛත්‍රිය කුසල් යැයි කොට අකුසල් වූ රාගයාගේ ප්‍රහාණය පිණිස නො මැ පවතී, ව්‍යාපාදය මෛත්‍රියෙන් ප්‍රහාණයට යෙයි. එහෙයින් උභයක්ලේශයෝ විමැසියැයුත්තාහු යැ. කුසල් වූ හෝ අකුසල් වූ හෝ

ධම්මො උපදිසීයති කුසලො වා අකුසලො වා, සො අපකඩ්ඪිතබ්බො. සචෙ තෙ යුජ්ජන්ති අපකඩ්ඪියමානො නත්ථි උපපරික්ඛිතබ්බං. ඉධ වා කිලෙසා එකෙන අරියධම්මෙන පහීයෙය්‍යාති ද්වීහි වා අරියධම්මෙහි එකො වා කිලෙසො පහීයතීති.

අථ වා එවම්පි උපපරික්ඛියමානං යුජ්ජති, තත්ථ විමංසිතබ්බං වා යථා යුජ්ජති තත්ථ වීමංසිතබ්බං වා, යථා නනු සක්කා සුත්තං නිද්දිසිතුං, න හි සුත්තෙන විචිකිච්ඡිතබ්බං. කිලෙසෙ, මං අරියධම්මෙසු දෙසිතෙසු උභයතො උපපරික්ඛිතබ්බං: යෙ වා කිර.[2] ඉමෙ කිලෙසා දෙසිතා යෙ ච අරියධම්මා දෙසිතා ගාථාය වා බ්‍යාකරණෙන වා, කිං නු ඛො ඉමෙ කිලෙසා ඉමෙහි අරියධම්මෙහි පහීයන්ති, උදහු න පහීයන්ති[3], ඉමෙ වා පන අරියධම්මා ඉමෙසං කිලෙසානං පහානාය සංවත්තන්තීති.

කිඤ්චාපි කුසලෙහි ධම්මෙහි අකුසලා ධම්මා පහානං ගච්ඡන්ති න තු සබ්බෙහි සබ්බා'කුසලා පහානං ගච්ඡන්ති, යථා මෙත්තා කුසලා අකුසලො ච රාගො, න තු කුසලා මෙත්තා අකුසලො රාගොති කත්වා[1] මෙත්තාය රාගො පහානං. බ්‍යාපාදො මෙත්තාය පහානං ගච්ඡති[4]. එවං කිලෙසොති කත්වා සුත්තෙන පහානං ගච්ඡති, න සුත්තා ධම්මොති කත්වා[1], සබ්බස්ස කිලෙසස්ස පහානාය සංවත්තති, යං තු සුත්තස්ස අරියධම්මො සංකිලෙසපටිපක්ඛො සො තෙන පහානං ගච්ඡතීති.

තත්ථ කුසලෙ දෙසිතෙ සුත්තෙන බ්‍යාකරණෙ වා සංකිලෙසා න යුජ්ජන්ති අරියධම්මා වා, තෙ මහාපදෙසෙ නිද්දිසිතබ්බාවයවෙන අපකඩ්ඪිතබ්බා. තත්ථ කිලෙසෙහි ච දෙසිතෙහි අරියධම්මෙසු ච යදිපි තෙන අරියධම්මෙන තෙ කිලෙසා පහානං ගච්ඡන්ති, තත්ථපි උත්තරිං උපපරික්ඛිතබ්බං: කෙන කාරණෙන එතෙ කිලෙසා පජහිතබ්බා, කෙන කාරණෙන අරියධම්මා දෙසිතාති. යෙන යෙන වා ආකාරෙන අරියධම්මා දෙසිතා තෙන තෙන පකාරෙන අයං කිලෙසො හීනො. අත්ථි හි එකො කිලෙසො තෙන වා අරියධම්මො න අඤ්ඤථා, අඤ්ඤථා පහාතබ්බො, යථා දිට්ඨිරාගො අවිජ්ජා ච දස්සනෙන පහාතබ්බා. සා චෙ එවං ච අවිජ්ජා භාවනාය භූමි වා ධම්මා භාවනාය පහාතබ්බා. සායෙව උද්ධම්භාගියං අසඞ්ඛතදස්සනාය විමුත්තියා අතිමීතෙන චෙතොසමාධිනා අමනසිකාරෙන පහීයති. එවං සාත්ථං සබ්‍යඤ්ජනං උපපරික්ඛිතබ්බං, යෙ දස්සනෙන පහාතබ්බා කිලෙසා දස්සනාකාරෙන අරියධම්මො දෙසිතො. භාවනාය පහාතබ්බා භාවනාකාරෙන අරිය-ධම්මො දෙසිතො. පතිසෙවනා පහාතබ්බා පතිසෙවනාකාරෙන අරියධම්මො දෙසිතො, එවං විනොදනා පහාතබ්බා යාව සත්ත ආසවා කාතබ්බා, යාවඤ්ඤථා. අඤ්ඤථා සෙස ධම්මො පහාතබ්බො

1. කාරෙත්වා – ම.
2. කිර යෙ වා – ම.
3. නප්පහීයන්ති – ම.
4. ගච්ඡන්ති – ම.

යම් යම් ධර්මයෙක් දක්වනුලැබේ ද ඒ ධර්මය අපකර්ෂණය කළයුත්තේ යැ, ඉදින් ඔහු යෙදෙත් නම් අපකර්ෂණ කරනු ලබන්නේ පරීක්ෂා කළයුත්තෙක් නැති. එක් ආර්‍ය්‍ය ධර්මයෙකින් ක්ලෙශයෝ දෙදෙනෙක් හෝ ප්‍රහීණ වෙති, ආර්‍ය්‍යධර්ම දෙකෙකින් එක් ක්ලේශයෙක් හෝ ප්‍රහීණෙ වේ යයි.

නොහොත් මෙසේත් විමසනුලබන්නේ යෙදේ නම්, එහි යෙදෙන පරිදි විමැසියැයුතු හෝ එහි යම්පරිදි සූත්‍රය නිර්දේශ කරන්නට නො හැකි වේ නම් විමැසියැයුතු හෝ වෙයි. සූත්‍රයෙහි විචිකිත්සා නො මැ කළයුතු යැ. (කිලෙසො ච ?) ආර්‍ය්‍යධර්මයන් දෙසිත කල්හි දෙපරිද්දෙකින් විමැසියැයුතු : ගාථායෙන් හෝ වෙය්‍යාකරණයෙන් හෝ යම් මේ ක්ලෙශයෝ දෙසනලද්දහු ද යම් මේ ආර්‍ය්‍යධර්මයෝ දෙසනලද්දහු දැ'යි කිමැ හෝ මේ කෙලෙස්හු මේ ආර්‍ය්‍යධර්මයන්ගෙන් ප්‍රහීණ වෙත් ද, නොහොත් ප්‍රහීණ නො වෙත් ද, යළි මේ ආර්‍ය්‍යධර්මයෝ මේ කෙලෙසුන්ගේ ප්‍රහාණය පිණිස පවතිත් දැ' යි.

තවද කුශලධර්මයන්ගෙන් අකුශලධර්මයෝ ප්‍රහාණයට යෙති, එතෙකුදුවත් සියලු කුශලයන්ගෙන් සියලු අකුශලයෝ ප්‍රහාණයට නො යෙති. මෙසේ යැ : මෛත්‍රිය කුසල් යැ, රාගය අකුසල් වෙයි, එහෙත් මෛත්‍රිය කුසල් යැ රාගය අකුසලැ යි කොට මෛත්‍රියෙන් රාගය ප්‍රහාණයට නො යෙයි, ව්‍යාපාදය මෛත්‍රියෙන් ප්‍රහාණයට යෙයි. මෙසේ ක්ලෙශ යෙකැයි කොට සූත්‍රයෙන් (දක්වූ පරිදි) ප්‍රහාණයට යෙයි. සූත්‍රය ධර්මයෙකැ යි කොට සියලු ක්ලේශයන්ගේ ප්‍රහාණය පිණිස නො පවතී. සූත්‍රයාගේ යම් ආර්‍ය්‍යධර්මයෙක් සංක්ලෙශයට ප්‍රතිපක්ෂ ද, ඒ ක්ලේශය ඒ ධර්මයෙන් ප්‍රහාණයට යේ යයි.

එහි සූත්‍රයෙහි හෝ වෙය්‍යාකරණයෙහි හෝ කුසලයක් දෙසූ කල්හි සංක්ලේශයෝ හෝ ආර්‍ය්‍යධර්මයෝ හෝ නො යෙදෙත් ද, ඒ ධර්මයෝ මහාපදෙසයෙහි දක්වියැයුතු අවයවයෙකින් බැහැර කළයුත්තාහු යැ. එහි ක්ලේශයන්ගෙන් ද ආර්‍ය්‍යධර්මයෙන් ද දෙසන ලද් ඉදින් ඒ ආර්‍ය්‍යධර්මයෙන් ඒ ක්ලේශයෝ ප්‍රහාණයට යෙත් ද, එහි දු මත්තෙහි විමැසියැයුතු : කවර කරුණෙකින් තෙල ක්ලෙශයෝ දුරුකළයුත්තාහු ද, කවර කරුණෙ-කින් ආර්‍ය්‍යධර්මයෝ දෙසනලදහු දැයි. යම් යම් අයුරෙකින් හෝ ආර්‍ය්‍යධර්මයෝ දෙසන ලද්දහු ද, ඒ ඒ ප්‍රකාරයෙන් මේ ක්ලේශය සිටියේ යැ, ඒ එසේ මැයැ, එක් ක්ලේශයෙක් ඇත, එයින් ආර්‍ය්‍යධර්මය අන්පරිදි නො වෙයි, අන් පරිද්දෙකින් ප්‍රහීණ කටයුතු වේ. ඒ මෙසේ යැ: දිට්ඨිරාගය ද අවිද්‍යාව ද දර්ශනයෙන් ප්‍රහීණ කටයුත්තාහු යැ, ඉදින් එසේ වුව ද අවිද්‍යාව භාවනාවට භූමි වූවා භාවනායෙන් ප්‍රහීණ කටයුත්තී යැ, ඒ අවිද්‍යාව මැ උද්ධංභාගිය වෙයි. නිවන දක්නා විමුක්තියෙන් අනිමිත්තචෙතොසමාධියෙන් අමනසි කාරයෙන් ප්‍රහීණ වෙයි. මෙසේ සාර්ථ වැ සව්‍යඤ්ජන වැ පරීක්ෂා කළයුතු යැ, දර්ශන යෙන් ප්‍රහීණ කළයුතු යම් ක්ලෙශ කෙනෙක් වෙත් ද දර්ශනාකාරයෙන් ආර්‍ය්‍යධර්මය දෙශිත යැ, භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ භාවනාකාරයෙන් ආර්‍ය්‍යධර්මය දේශිත යැ, පටිසෙවනයෙන් (ප්‍රත්‍යවෙක්ෂාවෙන්) ප්‍රහාතව්‍ය ක්ලේශයෝ වෙත් ද එහි ප්‍රත්‍යවෙක්ෂා කාරයෙන් ආර්‍ය්‍යධර්මය දේශිත යැ, මෙසේ විනෝදනයෙන් ප්‍රහාතව්‍යයෝ යැ යි සප්ත

අඤ්ඤෙනාකාරෙන අරියධම්මො දෙසිතො, යො අරියධම්මො අඤ්ඤථා පරියෙසිතබ්බො. යදි අයං ධම්මො පරියෙසන්තො යො ච දෙසෙති යෙන යෙනාකාරෙන, සො අරියධම්මො පරියෙසිතබ්බො, යෙනාකාරෙන කිලෙසො පහීයති සො තත්ථ උපපරික්ඛිතබ්බො. අථ න යුජ්ජති යදි හි තෙන සුත්තෙන විහිතං, සුත්තං වීමංසිතබ්බං, යථා යුජ්ජති, තථා ගහෙතබ්බං, යථා න යුජ්ජති, තථා න ගහෙතබ්බං, අද්ධා එතං භගවතා න භාසිතං, ආයස්මතා වා දුග්ගහිතං, යථා මහාපදෙසෙ නිද්දිසිතබ්බං, භගවතා යථාභූතං දෙසිතං, යො ච ධම්මො දෙසිතො කුසලො ච අකුසලො ච තස්ස ධම්මස්ස පච්චයො පරියෙසිතබ්බො, න හි පච්චයා විනා ධම්මො අප්පච්චයො උප්පජ්ජති. තත්ථ කො ආකාරො පරියෙසනාය:

තත්ථ තථාරූපං සහෙතු සප්පච්චයං සොයං ධම්මො වුත්තොති ඉදං වීමංසිතබ්බං. සො ච පච්චයො තිවිධො: මුදු මජ්ඣො අධිමත්තො. තත්ථ මුදුම්හි පච්චයෙ මුදු ධම්මො ගහෙතබ්බො, එවං සත්‍යස පච්චයො[3] දුවිධො: පරම්පරපච්චයො[2] ච සමනන්තරපච්චයො ච. සො පච්චයො මුදු තෙන වෙමත්තතං[4] පරියෙසිතබ්බං. කිං කාරණං: අඤ්ඤතරෙපි පච්චයො[5] අඤ්ඤෙහි පච්චයෙහි පරියත්තිං වා පාරිපූරිං වා ගච්ඡති. තත්ථ යො ධම්මො දෙසිතො, තස්ස ධම්මස්ස එතෙන වා කාරණෙන වා හෙතු පරියෙසිතබ්බො. යථා පච්චයො හෙතුනා පච්චයෙන ච, සො තස්ස ධම්මස්ස නිස්සන්දො පරියෙසිතබ්බො. යථා නිද්දිට්ඨො අධිට්ඨානෙ පධානං පරියෙසති, සො පච්චයො පරියෙසිතබ්බො. න හි මුදුස්ස ධම්මස්ස අධිමත්තො නිස්සන්දො අධිමත්තස්ස වා නිස්සන්දස්ස මුදු ධම්මො, අථ මුදුස්ස මුදු, මජ්ඣාය මජ්ඣො, අධිමත්තස්ස අධිමත්තො යුජ්ජති, තං ගහෙතබ්බං. අථ න යුජ්ජති න ගහෙතබ්බං. යං ච භගවා ආරභති ධම්මං දෙසෙතුං, තං යෙව ධම්මං මජ්ඣං තං පරියොසානං[6] දෙසෙති, යථා සුත්තාධිට්ඨානෙ ධම්මො[7] ආදිම්හි නිද්දිසති, තංයෙව පහූතස්ස[8] සුත්තස්ස පරියොසානං. තස්ස හි ධම්මස්ස වසෙන තං සුත්තං හොති ගාථා වා බ්‍යාකරණං බුද්ධානං මහන්තං වා, යථා පන දුවිධා අනුරූපන්ති වා ඨපනා[9] ච දෙසනාඨපනා. රූපන්තිපි ධම්මස්ස පරියෙසිතබ්බො. යථා ච භගවතා පඤ්චන්නං ඉන්ද්‍රියානං සංවරණා දෙසිතං තණ්හාය නිග්ගණ්හත්ථා ඉච්ඡාව හොති. දෙසෙති යථා ගොපාලකූපමෙ සුත්තෙ අඤ්ඤෙහි පි සුත්තෙහි භගවා භාසති ඉච්ඡාව හොති, මජ්ඣිමනිකායෙ විතක්කො. අයං භගවතො දෙසනානුරූපන්ති, ඉති සො ධම්මො අඤ්ඤෙසුපි වෙය්‍යාකරණෙසු පරියෙසිතබ්බො. න හි එකං හි සුත්තෙ දට්ඨබ්බො යුඤ්ජනං තං ගහෙතබ්බං.

1 තෙන – PTS.
2. පරම්පරපච්චයො – මජ්සං.
3. සතො සපච්චයො – PTS.
4. බ්‍යාධිමත්තං – මජ්සං, PTS.
5. විපච්චයො – PTS.
6. ධම්මා – මජ්සං, PTS.
7. මජ්ඣන්තපරියොජානං – මජ්සං, PTS.
8. බහුතස්ස – ම
9. ඵපනා – මජ්සං.

ආසවයන් දක්වා විස්තර කළයුතු, මේ ක්ලේශධර්මය අන්පරිද්දෙකින් ප්‍රහීණ කළයුතු යැ, අන් අයුරෙකින් ආයර්‍යධර්මය දෙසනලද, යම් ආයර්‍යධර්මයෙක් අන්අයුරෙකින් සෙවිය යුතු ද එය යි. ඉදින් මේ ධර්මය පයෙර්‍යෂණ කරන්නහුට යමෙකුත් යම් යම් අයුරෙකින් දෙසා ද, ඒ ආයර්‍යධර්මය පයෙර්‍යෂණ කළයුතු. ඒ අයුරින් කෙලෙස් ප්‍රහීණ වෙයි. ධර්මය එහි විමසියැයුතු යැ, ඉක්බිති ඉදින් ඒ සූත්‍රයෙන් දක්වන ලද්ද නො යෙදේ නම්, ඒ සූත්‍රය විමැසියැයුතු යැ. යම් පරිදි යෙදේ නම් එසෙයින් ගතයුතු යැ, යම්සේ නො යෙදේ නම් එසේ නො ගතයුතු. ඒකාන්තයෙන් තෙල භාග්‍යවතුන් විසින් නො වදරනලද, ආයුෂ්මතුන් විසින් වරදවා හෝ ගන්නා ලද, මහාපදෙසයෙහි මෙන් දක්වියැයුතු. භාග්‍ය වතුන් විසින් යථාභූත ව දෙසනලද, කුසල් වූ ද අකුසල් වූ ද යම් දහමක් දෙසනලද ද, ඒ ධර්මයාගේ ප්‍රත්‍යය පයෙර්‍යෂණ කළයුතු යැ, ප්‍රත්‍යයෙන් වෙන් වැ ධර්මයෙක් අප්‍රත්‍යය වැ නො මැ උපදී. එහි පයෙර්‍යෂණයාගේ ආකාරය කෙබඳු ද :

එහි එබඳු වූ සහෙතු සප්‍රත්‍යය කොට මේ ධර්මය වදරනලදද්'යි මෙය විමැසියැයුතු, ඒ ප්‍රත්‍යය ද ත්‍රිවිධ යැ : මෘදු යැ මධ්‍ය යැ අධිමාත්‍ර යි. එහි මෘදු ප්‍රත්‍යය ඇති කල්හි මෘදු ධර්මයෙක් ගතයුතු. මෙසේ ඇති කල්හි තෙල ප්‍රත්‍යය ද්විවිධ යැ : පරම්පර ප්‍රත්‍යය ද සමනන්තර ප්‍රත්‍යය දැයි. ඒ ප්‍රත්‍යය මෘදු වී නම් එයින් වෙමත්තතාව (විශේෂයයි) සෙවියැ යුතු, කරුණු කිමයත් : අන්‍යතර ප්‍රත්‍යයෙකුදු අන්‍ය ප්‍රත්‍යයන්ගෙන් පයර්‍යාප්තියට හෝ පිරීමට හෝ යන හෙයිනි. එහි යම් දහමෙක් දේසිත ද ඒ ධර්මයාගේ හේතුව මෙකරුණෙන් හෝ සෙවියැයුතු. ප්‍රත්‍යය වූ පරිදි හේතුයෙන් ද ප්‍රත්‍යයෙන් ද ඒ ධර්මයාගේ නිස්සන්දය සෙවියැයුතු. අධිට්ඨාන (හාර) යෙහි දක්වූ පරිදි ප්‍රධාන ධර්මය සොයා ද ඒ ප්‍රත්‍යය සෙවියැ යුතු. ඒ එසේ මැයැ : මෘදු ධර්මයාගේ අධිමාත්‍ර නිස්සන්දයෙක් නැත. අධිමාත්‍ර නිස්සන්දයාගේ හෝ මෘදු ධර්මයෙක් නැති. වැලි මෘදු ධර්මයාගේ මෘදු නිස්සන්දය ද මධ්‍යධර්මයාගේ මධ්‍ය නිස්සන්දය ද අධිමාත්‍ර ධර්මයාගේ අධිමාත්‍ර නිස්සන්දය ද යෙදෙයි. එය ගතයුතු යැ. වැලි නො යෙදේ නම් නො ගතයුතු. තවද බුදුහු යම් දහමක් දෙසන්නට ආරම්භ කෙරෙත් ද ඒ ධර්මය මැ මධ්‍යය කොට එය පයර්‍යවසානය කොට දෙසනයේක. යම්සේ සුත්තාධිට්ඨානයෙහි ධර්මයන් ආදියෙහි නිර්දේශ කෙරෙත් ද, එය මැ මහත් වූ සූත්‍රයාගේ ද පයර්‍යවසානය වෙයි. ඒ එසේ මැ යැ, ඒ ධර්මයාගේ වශයෙන් ඒ සූත්‍රය වෙයි. ගාථා වේ වයි බ්‍යාකරණයක් වේව'යි කුඩා වූ හෝ මහත් වූ හෝ (සූත්‍රය) (යථා පන දුවිධා ......... පරියෙසිතබ්බා ?) යම්සේ භාග්‍යවතුන් විසින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සංවරය තෘෂ්ණානිග්‍රහය පිණිස දෙසන ලද ද, (ඉච්ඡාව හොති, දෙසෙති ?) ගොපාලකූපම සූත්‍රයෙහි යම්සේද අන්‍ය සූත්‍රයන්ගෙනුදු බුදුහු වදරති, (එය) ඉච්ඡා පරිදි වේ. මැදුම්සඟියැ (ද්වෙධා විතක්කසූත්‍රය) විතර්කය මෙනි. මේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනානුරූප යි. මෙසේ ඒ ධර්මය අන්‍ය වෙය්‍යාකරණයන්හි ද පයෙර්‍යෂණ කළයුතු. එක් මැ සූත්‍රයෙහි, නො මැ දතයුතු යැ. යෙදෙන පරිදි එය ගතයුතු.

තත්ථ කතමං අනුඤ්ඤාතං: යං කිඤ්චි සුත්තං භගවතා න භාසිතං, තඤ්ච සුත්තෙසු චෙව දිස්සති, එවමෙතං ධාරෙතබ්බං. යථා අසුකෙන භාසිතන්ති, තං සුත්තං වීමංසිතබ්බං: කිං නු ඛො ඉමං සුත්තං අනුඤ්ඤාතං ඛමං භගවතො උදාහු නානුඤ්ඤාතං ඛමං, කිඤ්චි රූපං ච සුත්තං භගවතො අනුඤ්ඤාතං ඛමං, කිඤ්චි රූපං ච නානුඤ්ඤාතං ඛමං යං සබ්බසො අනොතාරෙත්වා දසබලො ගොචරං දෙසෙති, තං සබ්බං සුත්තං භගවතො නානුඤ්ඤාතං ඛමං. අත්ථි පි සො සාවකො දසබලානං ගොචරං ජානාති ඔධිසො අනොධිසො, තං පන බලං සබ්බසො න ජානාති අඤ්ඤථා නාම සච්චෙන? යථා ආයස්මතා සාරිපුත්තෙන යෙන බ්‍රාහ්මණො ඔවදිතො, තස්ස ආයස්මතො නත්ථි ඉන්ද්‍රියබලවෙමත්තඤාණං, තෙන පුග්ගලපරොපරියං ච[1], තං අජානන්තො සති උත්තරිං කරණීයෙ[2] උප්පාදිතො, සො භගවතා අපසාදිතො. යථාච ආයස්මා කස්සපගොත්තො[3] චෙතං[4] ඔවදති ආනන්තරියසමන්නා-ගතො ඉද්ධිපාටිහීරෙන අඞ්ගුලියො ආදීපෙත්වා, යං සබ්බෙසං ධම්මානං කම්මසමාදානානං හෙතුසො ඨානසො යථාභූතං ඤාණං. තස්ස ආයස්මතො න සංවිජ්ජති, තෙන නං ඔවදති, තං භගවා කරෙති.

1. සචෙ'පි දස පජ්ජොතෙ - ධාරයිස්සසි කස්සප,
නෙව දක්ඛිති[5] රූපානි - චක්ඛු හි'ස්ස[6] න විජ්ජති.

අපි'ච ඛො යථා දූතො රාජවචනෙන සත්තමනුස්සාති, එවං සොතානුගො අඤ්ඤාතකං සොතං පරෙසං දෙසෙති අනුඤ්ඤාත-ඛම්සුත්තං ගහෙතබ්බං. අනනුඤ්ඤාතඛමං න ගහෙතබ්බං.

තත්ථ කතමො සුත්තාධිකාරෙ; පඤ්චවිධං සුත්තං: සංකිලෙසභාගියං වාසනාභාගියං දස්සනභාගියං භාවනාභාගියං අසෙඛභාගියං. අඤ්ඤං ආරබ්භෙය්‍ය අඤ්ඤං දෙසෙති අඤ්ඤස්ස ච සුත්තස්ස අත්ථං අඤ්ඤම්හි සුත්තෙ නිද්දිසති, ඔරම්භාගියානං සංයොජනානං අත්ථං උද්ධම්භාගියෙසු නිද්දිසති. මුදුමජ්ඣානං ඉන්ද්‍රියානං අධිමත්තෙසු සුත්තෙසු නිද්දිසති. ඉති ඉදං සුත්තං සමෙහදං හෙතූනං ච නිස්සන්දෙන ච ඵලෙන ච නිද්දෙසෙන ච, මුදුමජ්ඣාධිමත්තතායපි ච අත්ථෙන ච බ්‍යඤ්ජනෙන ච යො සමෙහදෙ, අයං වුච්චති සුත්තාධිකාරෙ යො අසමෙහදෙ, අයං වුච්චති සුත්තවිචයො.

තත්ථා'යං උද්දානගාථා:

පුරිමානං අපකඩ්ඪං[7] - යථාභූතස්ස පච්චයො,
නිස්සන්දො දෙසනා සුත්තං - අනුඤ්ඤා සුත්තාධිකාරෙ.

පෙටකොපදෙසෙ සුත්තවිචයො නාම
චතුත්ථභූමි සමත්තා.

---

1. පුග්ගලපරොපරඤ්ඤා - ම.
2. උත්තරකරිණීයෙ - ම
3. මහාකස්සපො - ම, PTS.
4. භාගිනෙය්‍යං - ම, PTS.
5. දක්ඛති - ම PTSr
6. චක්ඛු තස්ස - ම, TS.
7. සද්ධිං - PTS.

එහි අනුඤ්ඤාතය කවර : යම්කිසි සූත්‍රයෙක් භාග්‍යවතුන් විසින් නො විදරනලද ද එ ද සූත්‍රයන් අතුරෙහි මැ දක්නාලැබෙයි. තෙල මෙසේ ධැරියැයුතු යැ : ඒ මෙසේ යැ, අසුවල්හු විසින් භාෂිත යැයි ඒ සූත්‍රය විමසියැයුතු. කිමැ හෝ මේ සූත්‍රය (අනුඤ්ඤතං ඛමං...... අඤ්ඤථා නාම සවනෙන?) ඒ මෙසේ යැ, ආයුෂ්මත් සැරියුත් තෙරුන් විසින් බමුණු අවවාද කරන ලද්දේ ය. ඒ ආයුෂ්මත්හට ඉන්ද්‍රිය බලවෙමත්තඤාණය නැත, පුග්ගල පරොපරියඤාණය නැත. එය නොදන්නේ මාර්ගය දෙසන ලද්දේය. හේ භාග්‍යවතුන් විසින් අප සාදිත විය. එසේම ආයුෂ්මත් කාශ්‍යගොත්‍ර සෘද්ධියෙන් ඇඟිලි දල්වා මුව වැද්දට අවවාද කෙරෙයි. සියලු ධර්මයන්ගේ කර්ම සමාදනයන්ගේ හෙතුවශයෙන් කාරණ වශයෙන් යථාභූතඤාණය ඒ ආයුෂ්මත්හට නැත. එහෙයින් ඔහුට අවවාද කෙරෙයි.

1. කසුබ, ඉදින් (තෙපි පහන් දසයක් දරන්නවු නමුදු (හේ) රූපයන් නො මැ දක්නේ යැ, ඔහුට (රූ දක්නා) නුවණැස අවිද්‍යමාන හෙයිනි.

තවද යම්සේ රාජදූතයෙක් රජුගේ වචනයෙන් රටවැසි ජනතාවට අනුශාසනා කෙරේ ද, එසෙයින් දේශකයෙක් තමා නොදත් මෙරමා වෙතින් අසන ලද්දක් අනූනව දේශනා කෙරේ නම් බුදුරදුන් අනුදන්නා ලද දහම හා සැසැඳෙන සූත්‍රය ගතයුතු යැ. අනුඤ්ඤතය හා නොයෙදෙන සූත්‍රය ඉනාගත යුත්තේ යි.

එහි සූත්‍රසංකරය කවර : සූත්‍රය පඤ්චවිධ වෙයි, සංකිලෙස භාගිය යැ වසනා භාගිය යැ දස්සන භාගිය යැ භාවනාභාගිය යැ අසෙඛභාගිය යි. අනෙකක් ආරාධනය කරන්නේ නම් අනෙකක් දෙසයි, අන් සූත්‍රයක්හුගේ අර්ථය අන් සූත්‍රයෙකැ දක්වයි. ඔරම්භාගියසංයෝජනයන්ගේ අර්ථය උද්ධම්භාගිය සංයෝජනයන්හි ලා දක්වයි. මෘදු මධ්‍ය වූ ඉන්ද්‍රියයන් අධිමාත්‍ර ඉන්ද්‍රිය ඇති සූත්‍රයන් හි ලා දක්වයි. මෙසේ මේ සූත්‍රය හෙතු විසින් ද නිස්සන්ද විසින් ද ඵල විසින් ද නිද්දෙස විසින් ද සම්භෙද වේ. මෘදු මධ්‍ය අධිමාත්‍රභාවයෙනුදු අර්ථ විසින් ද ව්‍යඤ්ජන විසින් ද යම් සම්භෙදයෙක් වේ ද මේ සූත්‍ර සංකර ය යි කියනු ලැබේ. යම් අසම්භෙදයෙක් වේ ද මේ සූත්‍රවිචය යී කියනු ලැබේ.

එහි මේ උද්දනගාථා යැ :

පූර්ව වූ අගුලධර්මයන්ගේ අපකර්ෂණ යැ යථා භූතයාගේ සහෙතු සප්‍රත්‍ය යැ නිස්සන්ද යැ දෙසනායුත්ති යැ අනුඤ්ඤත යැ සූත්‍රසංකර යැ යන මේ මෙහි සංගෘහිත යි.

**පෙටකොපදෙසයෙහි සුත්ත විචය නම්**

**චතුර්ථභූමි සමාප්ත යි.**

# පඤ්චම භූමි

තත්ථ කතමො හාරවිභඞ්ගො: යත්ථ සොළසහාරා අක්ඛරසො භෙදං ගච්ඡන්ති,

1. තත්ථ ආදිම්හි දෙසනාහාරෙ: තත්ථ අයං ගාථා:

කුසලා වා අකුසලා වා - සච්චානි වා සච්චෙකදෙසො වා

කිං දෙසිතන්ති සුත්තෙන - වීමංසා දෙසනාහාරො.

යථා අරියසච්චානං[1] නික්ඛෙපො, චත්තාරි සච්චානි සාධාරණානි අසාධාරණානි ච, තානි ච අට්ඨාරස පදානි දුක්ඛතො, සත්ත පදානි සඞ්ඛෙපෙන කායිකෙන චෙතසිකෙන දුක්ඛෙන අප්පියසම්පයොගෙන පියවිප්පයොගෙන ච තීහි ච සඞ්ඛතාහි[2] තත්ථ තීණි සඞ්ඛතලක්ඛණානි තීසො දුක්ඛතා: උප්පාදෙ සඞ්ඛතලක්ඛණං, සඞ්ඛාරදුක්ඛතාය දුක්ඛතා ච වයො සඞ්ඛත[4] ලක්ඛණං, විපරිණාමදුක්ඛතාය දුක්ඛතා ච[5] අඤ්ඤථත්තං[6] සඞ්ඛබතලක්ඛණං, දුක්ඛදුක්ඛතාය[7] දුක්ඛතා ච[8], ඉමෙසං තිණ්ණං සඞ්ඛතලක්ඛණානං තීසු වෙදනාභූමීසු අදුක්ඛමසුඛා වෙදනා, උප්පාදෙ සඞ්ඛතලක්ඛණං, සඞ්ඛාරදුක්ඛතාය ච දුක්ඛතා, වයො[8] සඞ්ඛතලක්ඛණං, සුඛා වෙදනා[9] විපරිණාමදුක්ඛතාය ච දුක්ඛතා[10] අඤ්ඤථත්තං සඞ්ඛතලක්ඛණං, දුක්ඛා වෙදනා දුක්ඛදුක්ඛතාය ච දුක්ඛතා, ඉති ඉමෙසු[11] නවපදෙසු පඨමෙසු සත්තසු පදෙසු සොළස පදෙසු දුක්ඛා පරියෙසිතබ්බා, එකාදස දුක්ඛතාය ච ලක්ඛණං නිද්දෙසෙ නිද්දිට්ඨං. පාතුභාවලක්ඛණා ජාති, යා ච පාතුභාවවුත්තිලක්ඛණො වුත්තොති විත්ථාරෙන පන්නරසපදානි කත්තබ්බානි.

එවං සාධාරණානි අසාධාරණානි ච සත්තසු දසසු පදෙසු පඤ්ඤසත්තිවිධෙ ච[12] සාසනපට්ඨානෙ[13] අට්ඨාරසවිධෙසු ච සුත්තාධිට්ඨා-නෙසු දසවිධෙසු ච සුත්තවිධෙයෙසු සොළසවිධෙසු ච හාරෙසු එකවීසතිවිධාය ච පවිචයවීමංසායාති ඉදං දෙසිතං. යථාභූතං ච දෙසිතන්ති. අයං වුච්චති දෙසනාහාරො.

---

1. අරියසච්චානි - මජසං, PTS.
2. සංඛතාහි - මජසං, PTS.
3. සංඛත - මජසං, PTS.
4. දුක්ඛතාති - මජසං, PTS.
5. අඤ්ඤථත්තං ච - මජසං, PTS.
6. දුක්ඛදුක්ඛතාය ච - ම, PTS.
7. දුක්ඛතා - ම, PTS.
8. තයො - ම, PTS.
9. වෙදනායච - මජසං, PTS.
10. දුක්ඛතාති - ම, PTS.
11. ඉමම්හි තීමෙසු - PTS.
    ඉමම්හි ඉමෙසු - මජසං.
12. සඤ්ඤසත්තිවිධෙ - ම, PTS.
13. ස ච, - PTS.

# පඤවමභූමි

එහි හාරවිභංග කවරෙ යත් : යම් තැනෙක සොළොස් හාරයෝ අක්ෂර වශයෙන් ප්‍රභේදයට යෙත් ද එය යි.

1. එහි, ආදියෙහි දෙසනාහාරය (කියනු ලැබේ.) එහි, මේ ගාථාව යැ

1. කුසල් හෝ අකුසල් හෝ සිව්සස් හෝ සත්‍යෙකදේශයෙක් හෝ දේශිත වෙයි. 'කුමක් දෙසන ලද දැ'යි සූත්‍රයෙහි ලා විමසීම දේසනාහාර යි.

ආය්‍ය්‍යසත්‍යයන්ගේ නික්ෂෙපය මෙනි. සාධාරණ වූ ද අසාධාරණ වූ ද සත්‍යයෝ සතර දෙනෙකි. යම් අටළොස් පදකෙනෙක් වෙත් ද, දුක් හෙයින් සැකෙවින් කායික චෙතසික දුකින් ද, අප්‍රිය සම්ප්‍රයොගයෙන් හා ප්‍රියවිප්‍රයොගයෙන් ද ත්‍රිවිධ සංඛතතායෙන් දූයි සත් පදකෙනෙක් වෙති. එහි සංඛත ලක්ෂණයෝ තිදෙනෙක් වෙති, දුක්ඛතා තුනක් වෙත් : උත්පාදය සංඛතලක්ෂණ යැ, සංස්කාර දුඃඛතායෙන් දුක්ඛතා ද වෙයි, ව්‍යය (බිඳීම) සංඛත ලක්ෂණ යැ, විපරිණාම දුක්ඛතායෙන් දුක්ඛතා ද වෙයි, අන්‍යථාත්වය සංඛත ලක්ෂණ යැ, දුක්ඛ දුක්ඛතායෙන් දුක්ඛතා ද වේ. මේ තුන් සංඛත ලක්ෂණයන් අතුරෙන් තුන් වෙදනාභූමියෙහි අදුක්ඛමසුඛවෙදනාව උත්පාද සංඛ්‍යාත සංඛතලක්ෂණ යැ සංඛාර දුක්ඛතායෙන් දුක්ඛතා ද වෙයි, සුඛවෙදනාව ව්‍යය සංඛ්‍යාත සංඛත ලක්ෂණ යැ, විපරිණාමදුක්ඛතායෙන් දුක්ඛතා ද වෙයි. දුක්ඛවේදනාව අන්‍යථාත්ව සංඛ්‍යාත සංඛත ලක්ෂණ යැ දුක්ඛදුක්ඛතායෙන් දුක්ඛතා ද වේ. මෙසේ මේ නව පදයන්හි ද පළමු දුක් වූ සත්පදයන්හි ද යන සොළොස් පදයන්හි දුක්ඛයෝ සෙවියයුත්තාහු යැ, එකොළොස් දුක්ඛතාවගේ ද ලක්ෂණ නිද්දෙසයෙහි දක්වන ලදි. පහළවීම ලක්ෂණ කොට ඇත්තී ජාති නමු, ච්‍යුත වීම ලක්ෂණකොට ඇත්තේ චුත නම් වේ යයි පසළොස් පදයෝ විස්තර කළ යුත්තාහු ය.

මෙසේ සාධාරණ වූ ද අසාධාරණ වූ ද (චතුස්සත්‍යයෝ) සතළොස් පදයන්හි ද පනස් වැදෑරුම් සාසනපට්ඨානයෙහි ද අටළොස් වැදෑරුම් සුත්තාධිට්ඨානයෙහි ද දසවැදෑරුම් සූත්‍ර විධෙයයෙහි ද සොළොස් වැදෑරුම් හාරයන්හි ද එක් විසි වැදෑරුම් පවිචය වීමංසායෙහි ද යන මෙහි මේ දේශිතය වෙයි. යථාභූත ව දෙසන ලද්දේ ද වේ යයි. මේ දෙසනා හාර යයි කියනු ලැබේ.

2. තත්ථ කතමො විචයො හාරො :

2. පදං පඤ්හා ච පුච්ඡා ච – කිං පුබ්බං කිඤ්ච පච්ඡිමං,
අනුගීති යා ච[1] විචයො – හාරෙ විචයොති නිද්දිට්ඨො.

පදන්ති පඨමං පදං, තස්ස කො අත්ථො : යං භගවා පුට්ඨො ආයස්මතා අජිතෙන, තා ගහෙතබ්බං. කති පදානි පුට්ඨානි යථා කිං : ''කෙනස්සු නිවුතො ලොකො''ති ගාථා, ඉමානි කති පදානි චත්තාරි ඉති විසජ්ජනාය[2] පුච්ඡා. යත්තකෙහි පදෙහි භගවතා විසජ්ජිතානි පදානි ඉති පුච්ඡාය ච යා පදානං සඞ්ඛායනා, ඉදං වුච්චති පදන්ති.

පඤ්හා 'ති : ඉමානි චත්තාරි පදානි කති පඤ්හා එකො වා ද්වෙ වා තදුත්තරිං[3] වා, ඉමානි චත්තාරි පදානි එකො පඤ්හො, අත්ථානුපරිවත්ති බ්‍යඤ්ජනං හොති, සම්බහුලානිපි පදානි එකමෙවත්ථං පුච්ඡති. ඉමානි චත්තාරි පදානි අනුපරිවත්තීති තං බ්‍යඤ්ජනෙන එකො පඤ්හොව හොති.

කෙනස්සු නිවුතො ලොකො'ති : ලොකං අධිකාය පුච්ඡති. කෙනස්සු නප්පකාසති කිස්සාභිලෙපනං බ්‍රූසී' ති තංයෙව පුච්ඡති. කිංසු තස්ස මහබ්භයන්ති තංයෙව පුච්ඡති, එවං අත්ථානුපරිවත්ති බ්‍යඤ්ජනං එකො පඤ්හො හොති, සො පඤ්හො චතුබ්බිධො : එකංසබ්‍යාකරණීයො, විභජ්ජබ්‍යාකරණීයො, පටිපුච්ඡාබ්‍යාකරණීයො ඨපනීයොති'[4] තත්ථ චක්ඛුං[5] අනිච්ච'න්ති එකංසබ්‍යාකරණීයො, 'යං අනිච්චං තං දුක්ඛ'න්ති විභජ්ජබ්‍යාකරණීයො, 'සියා අනිච්චං න චක්ඛු, යානිපි ආයතනානි ච න චක්ඛු, තානිපි අනිච්චනාති න චක්ඛුයෙව අයං විභජ්ජබ්‍යාකරණීයො, 'යං චක්ඛු තං චක්ඛුන්ද්‍රියං නො'ති පටිපුච්ඡාබ්‍යාකරණීයො, ''තං චක්ඛුං තථාගතො'ති ඨපනීයො, ''අඤ්ඤත්‍ර චක්ඛුනාති ඨපනීයො'' පඤ්හා.

ඉදං පඤ්හං භගවා කිං පුච්ඡිතො : ලොකස්ස සංකිලෙසො පුච්ඡිතො, කිං කාරණං : තිවිධො හි සංකිලෙසො : තණ්හාසංකිලෙසො ච දිට්ඨිසංකිලෙසො ච දුච්චරිතසංකිලෙසො ච. තත්ථ ''අවිජ්ජාය නිවුතො''ති අවිජ්ජං දස්සෙති. ''ජප්පා''ති තණ්හං දස්සෙති, 'මහබ්භය''න්ති අකුසලස්ස කම්මස්ස විපාකං දස්සෙති. 'සොතං' නාම, සුඛවෙදනීයස්ස කම්මස්ස දුක්ඛවෙදනීයො විපාකො භවිස්සතීති නෙතං ඨානං විජ්ජතීති භගවා විසජ්ජෙති.[6] චතූහි ච පදෙහි ''අවිජ්ජාය නිවුතො ලොකොති -පෙ- එවං වුච්චති.

තදුත්තරිං[3] පටිපුච්ඡති, ''සවන්ති සබ්බධි සොතා''ති ගාථා. චත්තාරි පදානි පුච්ඡති, තං භගවා ද්වීහි විසජ්ජෙති[6]

---

1 න ච – PTS.
2. විසජ්ජනාය – මජ්ඣං PTS.
3. තදුත්තරි – ම PTS.
4. ඨපනීයොති – ම.
5 චක්ඛු – මජ්ඣං, PTS.
6. විසජ්ජෙති – ම.PTS.

**2. එහි, විචය හාරය කවරෙ යත් :**

2. පදය ද ප්‍රශ්නයෝ ද පෘච්ඡා ද පූර්වපදය කිමෙක පශ්චිම පදය කිමෙක යනු ද අනුගීතිය ද යන මේ විමසීම ලක්ෂණ කොට ඇත්තේ විචයහාර නමැයි දක්වන ලද්දේ ය.

'පදං යනු ප්‍රථම පදය යැ, ඒ පදයාගේ අර්ථ කවරෙ යැ : ආයුෂ්මත් අජිත විසින් බුදුහු යමක් පුළුවුස්නා ලද්දහු ද, එය කෙතෙක් පදයෝ පුළුවුස්නාලද්දහු දැයි ගත යුතු යැ. ඒ කෙසේ යැ : ''කෙනස්සු නිවුතො ලොකො'' යන ගාථාව යැ, මේ කෙතෙක් පදයෝ වෙත් ද : පද සතරක් වෙයි. යම් පමණ පදයන්ගෙන් භාග්‍යවතුන් විසින් විසඳන ලද පදයෝ වෙත් ද, ප්‍රශ්නයෙහි ද (එපමණ පදයෝ වෙති) පුච්ඡායෙහි ද පදයන්ගේ යම් සැකෙවින් ප්‍රකාශ කිරීමෙක් වේ ද, මේ පද' යයි කියනු ලැබේ.

**පඤ්හා** යනු මේ සතර පදයෝ කෙතෙක් ප්‍රශ්නයෝ වෙත් ද : එකක් හෝ දෙකක් හෝ එයින් වැඩියක් හෝ වෙත් ද, මේ සතර පදයෝ එක් ප්‍රශ්නයෙකි. අර්ථය ව්‍යඤ්ජනය වෙයි. බොහෝ වූ ද පදයෝ එක් මැ අර්ථයක් පුළුවුස්ති. මේ සතර පදයෝ අනුව යන්නාහු වෙති. එය ව්‍යඤ්ජන විසින් එක් ප්‍රශ්නයෙක් වේ.

**කෙනස්සු නිවුතො ලොකො** යී ලෝකය සඳහා විචාරයි. **කෙනස්සු නප්පකාසති කිස්සාභිලෙපනං** බ්‍රූසි යී එය මැ විචාරයි. **කිංසු තස්ස මහබ්භයං''** යී එය මැ විචාරයි: මෙසේ අර්ථානුපරිවර්ති වූ ව්‍යඤ්ජනය එක් ප්‍රශ්නයෙක් වේ. ඒ ප්‍රශ්නය චතුර්විධ වෙයි. ඒකාන්තයෙන් විසඳියැ යුත්තේ යැ විභාගකොට විසඳිය යුත්තේ යැ පිළිවිසැ විසඳියැ යුත්තේ යැ තබාලියැ යුතු (ඨපනීය) යයි. එහි 'ඇස අනිත්‍ය ද ?' යනු ඒකාන්තයෙන් විසඳියැ යුත්තේ යැ, 'යමක් අනිත්‍ය නම් එය දුක් වේ ද ?'' යනු විභාග කොට විසඳියැ යුත්තේ යැ, අනිත්‍ය වන්නේ යැ (එය) ඇස නො වේ ද ? යම් ආයතන කෙනකුත් ඇද්ද ඇස නො වෙයි. ඔහුදු අනිත්‍ය යැ' ඇස මතුයෙක් මැ නො වේ'' මේ විභාග කොට විසඳියැයුත්තේ යැ' 'යමක් ඇස වේ නම් එය චක්ඛුන්ද්‍රිය නො වේ ද' යනු පිළිවියැ විසඳියැ යුතු ප්‍රශ්න යැ' 'ඒ චක්ෂුස සත්ත්ව වේ ද ?'' යනු තැබියැ යුතු යැ, 'චක්ෂුසිත්, අන් තැනෙක (තථාගත) වේ ද ? යනු ඨපනීය (තැබියැයුතු) ප්‍රශ්න යි.

මේ ප්‍රශ්නයෙන් බුදුහු කුමක් පුළුවුස්නාලද්දහු ද යත් : 'ලෝකයාගේ කෙලෙසීම විමසනලද, කරුණු කිම යත් : සංක්ලේශය ත්‍රිවිධ යැ : තණ්හාසංකිලේසය ද දිට්ඨිසංකි ලෙසය ද දුච්චරිතසංකිලේසය දැයි. එහි ''අවිජ්ජාය නිවුතො''යී අවිද්‍යාව වදරති, ''ජප්පා'යී තෘෂ්ණාව වදරති, ''මහබ්භයං'' යී අකුශලකර්මයාගේ විපාකය වදරති. ''සොත'' නම් ''සුඛවෙදනීය කර්මයාගේ දුක්ඛවෙදනීය විපාකයෙක් වන්නේ යැ' යන තෙල කරුණ නො වෙ යයි බුදුහු සතරපදයෙන් විසඳන සේක. ''අවිජ්ජාය නිවුතො ලොකො'' ... යී මෙසේ කියනු ලැබේ.

**එයින් මතුයෙහි ද පුළුවුස්සි, ''සවන්ති සබ්බධි සොතා'' යන ගාථාව යැ. (එහි) සතර පදයක් පුළුවුස්සි. බුදුහු එය දෙපදයෙකින් විසඳන සේක.**

2. යානි සොතානි ලොකස්මිං – සති තෙසං නිවාරණං,
සොතානං සංවරං බ්‍රූමි – පඤ්ඤායෙතෙ පිථීයරෙ.

ඉමානි චත්තාරි පදානි ද්වීහි පදෙහි විස්සජ්ජෙති. ඉදං කථන්ති[1] පුච්ඡිතො, තස්ස සංකිලිට්ඨස්ස ලොකස්ස වොදානං පුච්ඡිතො. සොතානි ච තණ්හානුසයා බහුලාධිවචනෙන නිද්දිට්ඨා භවන්ති සබ්බෙහි ආයතනෙහි, තානි සොතානි යෙන නිවාරීයන්තීති පරියුට්ඨානපහානං පුච්ඡති – "තෙන සොතා පිථීයරෙ"ති අනුසය-සමුග්ඝාතං පුච්ඡති, තත්ථ භගවා ඡසු ද්වාරෙසු සතියා සංවරං දෙසෙති, යො හි සම්පජානො විහරති සතිදොවාරිකෙන ච තස්ස ඉන්ද්‍රියානි ගුත්තානි සම්භවන්ති, තත්ථ ගුත්තෙසු ඉන්ද්‍රියෙසු යා යා විපස්සනා සා සා තෙසං සොතානං තස්සා ච අවිජ්ජාය යාය ලොකො[2] නිවුතො අච්චන්තපහානාය සංවත්තති.

එවං සොතානි පිහිතානිපි භවන්ති, තතො උත්තරිං පුච්ඡති :

3. පඤ්ඤා චෙව සති ච (ඉච්චායස්මා අජිතො)
නාමරූපං ච මාරිස,
එතං මෙ පුට්ඨො පබ්‍රූහි
කත්ථෙතං උපරුජ්ඣති.*

ඉමානි චත්තාරි පදානි භගවා එකෙන පදෙන විස්සජ්ජෙති.[3]

4. යමෙතං පඤ්හං අපුච්ඡි – අජිත තං වදාමි තෙ,
යත්ථ නාමං ච රූපං ච – අසෙසං උපරුජ්ඣති,
විඤ්ඤාණස්ස නිරොධෙන – එත්ථෙතං උපරුජ්ඣති.[4]

ඉමිනා පඤ්හෙන කිං පුච්ඡති : අනුපාදිසෙසනිබ්බානධාතුං පුච්ඡති, තං භගවා අනුපාදිසෙසාය නිබ්බානධාතුයා විස්සජ්ජෙති,[3] තත්ථ පඨමෙන පඤ්හෙන සංකිලෙසං පුච්ඡති, දුතියෙන පඤ්හෙන වොදානං පුච්ඡති, තතියෙන පඤ්හෙන සොපාදිසෙසනිබ්බානධාතුං පුච්ඡති, චතුත්ථෙන පඤ්හෙන අනුපාදිසෙසනිබ්බානධාතුං පුච්ඡති. තතො උත්තරිං පරිපුච්ඡති :

5. යෙ ච සඞ්ඛාතධම්මා[5] සෙ – යෙ ච සෙඛා පුථූ ඉධ.
තෙසං මෙ නිපකො ඉරියං – පුට්ඨො පබ්‍රූහි මාරිස.

---

* එත්ථ මජසං පොත්ථකෙ "පඤ්ඤා ච සති නාමරූපස්සෙ, තස්ස භගවන්තං පුට්ඨුමාගම්ම කත්ථෙතං උපසම්මතී" ඉති දිස්සති

1. පදන්ති – මජසං, PTS.
2. යො ලොකො – මජසං, PTS.
3. විසජ්ජෙති – මජසං.
4. උපසම්මති – ම, PTS.
5. සංඛතධම්මා – PTS.

2. ලොවැ තෘෂ්ණාදි යම් ස්‍රොතස් කෙනෙක් වෙත් ද විදර්ශනා සම්ප්‍රයුක්ත ස්මෘතිය ඒ ස්‍රොතසුන්ගේ ආවරණ ය ආරක්ෂාව නුයි (ඒ සමෘතිය මැ) ස්‍රොතසුන්ගේ සංවරය යි කියමි. මාර්ගප්‍රඥයෙන් තෙල ස්‍රොතස්හු (සර්වාකාරයෙන්) වසනු ලැබෙත්.

මේ සතරපදයන් දෙපදයෙකින් විසඳනසේක. මේ කෙසේ ද යත්: සංක්ලිෂ්ට වූ ඒ ලෝකයාගේ ව්‍යවදනය (ශුද්ධිය) පුළුවුස්නා ලදහ. ස්‍රොතස් නම් සවැදෑරුම් තෘෂ්ණා සමූහය යි. බහුවචනයෙන් දක්වන ලද්දහු වෙති, සියලු ආයතනයන්ගෙනි. ඒ ස්‍රොතස්හු කුමකින් නිවාරණය කරනු ලැබෙත් ද'යි පර්යුට්ඨාන (තෘෂ්ණාවිචරිත) යන්ගේ ප්‍රහාණය විචාරයි. ''කෙන සොතා පිථීයරෙ'' යි අනුශයයන්ගේ සමුද්ඝාතය විචාරයි. එහි බුදුහු සදෙරහි සතිසංවරය වදරනසේක. ඒ එසේ මැය, යමෙක් සම්‍යක්ප්‍රඥ ඇති වැ වාස කෙරේද, ස්මෘති නමැති ද්වාරපාලයා විසින් ඔහුගේ ඉන්ද්‍රියයෝ රක්නා ලද්දහු වෙති. එහි ඉන්ද්‍රියයන් ගුප්ත කල්හි යම් යම් විදර්ශනාවක් වී ද, ඒ ඒ විදර්ශනාව ඒ ඒ ස්‍රොතසුන්ගේ ද යම් අවිද්‍යාවක් විසින් ලෝකය වසනලද ද, ඒ අවිද්‍යාවගේ ද අත්‍යන්ත ප්‍රහාණය පිණිස පවතී.

මෙසේ චක්ෂුරාදි ස්‍රොතස්හු වසන ලද්දහු ද වෙත්. එයින් මතුයෙහි පුළුවුස්සි :

3. (ආයුෂ්මත් අජිත මෙසේ විචාරයි) නිදුකාණන් වහන්ස, මාර්ග ප්‍රඥව ද සමෘතිය ද තදවශේෂ නාමරූප ද යන තෙල සියල්ල කොතැන්හි ලා නිරුද්ධ වේ ද තෙල මා විසින් පුළුවුස්නාලද සේක් වදළ මැනැව.

මේ සතර පදයන් බුදුහු එක් පදයෙකින් විසඳන සේක.

4. අජිතය, තෙල (කත්ථෙතං උපරුජ්ඣතියී) යම් ප්‍රශ්නයක් විචාළෙහි ද එය තොපට කියමි, යම් තැනෙක ලා නාමයත් රූපයත් නිරවශෙෂ කොට නිරුද්ධ වේ ද, ඒ පශ්චිම විඥනයාගේ නිරොධය සමග මැ විඥනනිරොධයෙහි ලා තෙල නාමරූප නිරුද්ධ වේ.

මේ ප්‍රශ්නයෙන් කුමක් පුළුවුස්සි ද යත් : අනුපාදිසෙස නිර්වාණධාතුව පුළුවුස්සි. එය බුදුහු අනුපාදිසෙස නිබ්බානධාතුයෙන් විසඳනසේක. එහි පළමුවන ප්‍රශ්නයෙන් සංකිලෙසය පුළුවුස්සි, දෙවැනි ප්‍රශ්නයෙන් ව්‍යවදනය පුළුවුස්සි, තෙවැනි ප්‍රශ්නයෙන් සොපාදිශේෂ නිර්වාණධාතුව පුළුවුස්සි, සතරවැනි ප්‍රශ්නයෙන් අනුපාදිශේෂ නිර්වාණධාතුව පුළුවුස්සි. එයින් මතුයෙහි පුළුවුසී :

5. (ආයුෂ්මත් අජිත මෙසේ විචාරයි) නිදුකාණන් වහන්ස, මෙලොවැ අනිත්‍යාදි විසින් විමසන ලද සංස්කාර ඇති යම් රහත් කෙනෙකුත් වෙත් ද, බොහෝ වූ යම් ශෛක්ෂ කෙනෙකුත් වෙත් ද, මා විසින් පුළුවුස්නා ලද (ශෛක්ෂා' ශෛක්ෂධර්මයෙහි) නිපුණ වූ මුබවහන්සේ ඒ ශෛක්ෂාශෛක්ෂයන්ගේ ප්‍රතිපත් (මට) වදළ මැනැව.

ඉමානි චත්තාරි පදානි පුච්ඡති, තානි ච පන තෙ පඤ්හා. සඞ්ඛාතධම්මා[1] ච අරහන්තා සෙක්ඛා ච, කිං පුබ්බං කිස්ස ච පච්ඡිමන්ති 'අයමත්ථො. තත්ථ කතරං පඨමං පුච්ඡති කතරං පච්ඡා[2] අරහන්තං පඨමං පුච්ඡති සෙක්ඛධම්මෙ (පච්ඡා) තත්ථ පඨමෙන පදෙන[3] 'සඞ්ඛාත-ධම්මා'ති අරහන්තො ගහිතා, 'පුථූ'ති සෙක්ඛා ගහිතා, 'තෙසං මෙ නිපකො'ති සාධාරණං පදං භගවන්තං පුච්ඡති. තත්ථ[4] සාධාරණානි ච අසාධාරණානි ච පඤ්හෙසු පුච්ඡිතබ්බානි. තං භගවා විස්සජ්ජෙති. න තථා පුට්ඨං, පඨමං පුට්ඨං. යං තං පච්ඡා[5] විස්සජ්ජෙති, යං පච්ඡා පුච්ඡිතං, පඨමං විස්සජ්ජෙති, කිස්ස ච ඉදං පුච්ඡිතං 'විසුද්ධානං විසුජ්ඣන්තානං ච කා ඉරියා'ති ඉදං පුච්ඡිතං 'කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය මනසා'නාවිලො සියා'ති පරියුට්ඨානානි විතක්කෙ ච[6] භගවා නිවාරෙති, ද්වෙ පන විතක්කා ආවිලතාය[7] පරියුට්ඨානං, යථා නීවරණෙසු නිද්දිට්ඨං. 'කුසලො සබ්බධම්මාන'න්ති අරහන්තං විස්සජ්ජෙති.

"කථං සු* තරති ඔඝ',න්ති ගාථා, ඉමානි චත්තාරි පදානි, චත්තාරොයෙව පඤ්හා. කිං කාරණං: න හි එත්ථ අත්ථානුපරිවත්ති බ්‍යඤ්ජනං යථා පඨමං අජිතපඤ්හෙසු, තස්ස න එකංසෙන බහූනි විස්සජ්ජනානි, න බහුකා පඤ්හා, එකොයෙව, න චා'පි, සබ්බෙ පුච්ඡති. පුබ්බෙ විස්සජ්ජිතො, යථා චතුත්ථො. අජිතපඤ්හෙ[8] යං එත්ථ යථාභූතං පරියෙසනං පදබ්‍යඤ්ජන විස්සජ්ජනායො එවං යථාභූතං පරියෙසති. යො පුන එත්ථ යං එවං පුච්ඡති තත්ථ අයමාකාරො පුච්ඡනායං:

"අන්තො ජටා බහි ජටා'ති ගාථා, පුච්ඡිතවිස්සජ්ජනාය[9] මග්ගිතබ්බා, කථං විස්සජ්ජිතා'ති. භගවා හි විස්සජ්ජෙති.[10] "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො"ති ගාථා, තත්ථ චිත්තභාවනාය සමථො, පඤ්ඤාභාවනාය විපස්සනා. තත්ථ එවං අනුමීයති: යෙ ධම්මා සමථෙන ච විපස්සනාය ච පහීයන්ති, තෙ ඉමෙ අන්තො ජටා බහි ජටා, තත්ථ විස්සජ්ජනං: සමථෙන රාගො පහීයති, විපස්සනාය අවිජ්ජා. අජ්ඣත්තවත්ථුකො රාගො අන්තොජටා, බාහිරවත්ථුකො රාගො බහි ජටා, අජ්ඣත්තවත්ථුකා සක්කාය දිට්ඨි, අයං අන්තොජටා, එකසට්ඨි දිට්ඨිගතානි ච බාහිර-වත්ථුකානි බහිජටා, යා හි අජ්ඣත්තවත්ථුකාදි භාවෙන[11] භවිස්සති අයං ජටා තථා සඞ්ඛිත්තෙන යා කාචි අජ්ඣත්තවත්ථුකා තණ්හා ච දිට්ඨි ච අයං අන්තොජටා, යා කාචි බාහිරවත්ථුකා තණ්හා ච දිට්ඨි ච අයං බහිජටා.

---

1. සඞ්ඛතධම්මා – PTS,
2. කතරං පුච්ඡා – ම.
3. තෙන පදෙන – PTS.
4. තස්ස – ම, PTS.
5. පුච්ඡා – ම.
6. විතක්කෙන ච – මජ්සං, PTS.
7. විතක්ක අනාවිලතාය – මජ්සං,
8. අජිතොපඤ්හ – ම.
9. විසජ්ජනාය – ම.
10. භගවාති විසජ්ජෙති – ම.
11. සාදිභාගියෙන – PTS.

*කෙනස්සු

මේ සතර පදයන් පුළුවුස්සි, ''යළි ඔහු කෙනෙක් ප්‍රශ්න වෙත් ද සංඛාතධම්ම වූ රහත්හු ද ඉශෙක්ෂයෝ ද වෙත්. එහි කවරකු පළමු විචාරා ද කවරකු පසුව විචාරා ද යත් : රහත්හු පළමු පුළුවුස්සි, ශෛක්ෂධර්ම ඇතියන් පසුව පුළුවුස්සි'' එහි පළමුවන පදයෙන් 'සඞ්ඛාතධම්මා' යී රහත්හු ගන්නාලදහ. 'පුථු' යී ශෛක්ෂයෝ ගන්නාලදහ. 'තෙසං මෙ නිපකො' යී සාධාරණපදය භාග්‍යවතුන් පුළුවුස්සි, එහි ප්‍රශ්නයන්හි ලා සාධාරණ වූ ද අසාධාරණ වූ ද පදයෝ පිළිවිසියයුත්තාහ. එය බුදුහු විසඳනසේක. එසේ විචාරනලද නො වෙයි (?) පළමු විචාළ යම් කරුණක් ඇද්ද එය පසුව විසඳන සේක'' පසුව විචාළ කරුණ පළමු කොට විසඳන සේක. මේ පුච්ඡිතය කිමෙක් ද ? විශුද්ධ වූවන්ගේ ද විශුද්ධ වන්නවුන්ගේ ද ප්‍රතිපත් කවරේ දැයි මෙය විචාළේය. එය ''කාමෙසු නාභි ගිජ්ඣෙය්‍යා මනසා නාවිලො සියා''යී කිලෙසපරියුට්ඨානයන් ද විතර්කයන් ද බුදුහු වළහන සේක. යළි විතර්කයෝ දෙදෙනෙකි, චිත්තයාගේ ආවිලතායෙන් (කැළැඹුණු බැවින්) ඔවුන්ගේ පරියුට්ඨානය (නැඟීසිටීම) වෙයි. නීවරණයන් කෙරෙහි ලා දක්වූ පරිද්දෙනි. ''කුසලො සබ්බධම්මානං'' යී රහත්හු දක්වන සේක.

''කථංසු තරති ඔඝං'' යන ගාථාව වෙයි : මේ සතර පදයෝ ප්‍රශ්න සතරක් මැ' වෙති. කරුණු කිම යත් : පළමු අජිතප්‍රශ්නයෙහි මෙන් මෙහි අර්ථානුපරිවර්ති ව්‍යඤ්ජනය නො මැ වෙයි. ඒ පැනයෙහි ඒකාන්තයෙන් බොහෝ විසඳුන් නො වේ. බොහෝ ප්‍රශ්නයෝ නො වෙත්. එකෙක් මැ වෙයි. සියල්ල නො ද විචාරයි. පළමු විසඳනලද සතර වැනි අජිතප්‍රශ්නය මෙනි. මෙහි යම් යථාභූත වූ පයෝෂණයෙක් වේ ද පද බන්ධයෙන් විසඳුම් වෙත් ද, එපරිදි යථාභූත ව පයෝෂණ කෙරෙයි. යළි යමෙක් මෙහි යම් පැනයක් මෙසේ විචාරයි ද එහි පුච්ඡනා යෙහි මේ ආකාර යි. (?)

''අන්තො ජටා බහි ජටා'' යන ගාථාව, පුච්ඡිත විස්සජ්ජනායෙහි ලා කෙසේ විසඳන ලද්දී දැ යි ගවේෂණය කළයුත්තී යැ. භාග්‍යවතුන් වහන්සේ වනාහි (මෙසේ) විස්ඳන සේක : ''සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො'' යන ගාථාව – එහි චිත්තභාවනායෙන් සමථයෝ වෙති, පඤ්ඤාභාවනායෙන් විදර්ශනා වෙත්. එහි මෙසේ සලකනු ලැබේ : යම් ධර්ම කෙනෙක් ශමථයෙන් ද විදර්ශනායෙන් ද ප්‍රහීණ වෙත් නම් ඔහු මේ 'අන්තො ජටා බහිජටා' නම් වෙත්, එහි විසඳීම මෙසේ යැ : සමථයෙන් රාගය 'ප්‍රහීණ වෙයි, විපස්සනායෙන් අවිද්‍යාව ප්‍රහීණ වේ. අධ්‍යාත්මවස්තුක වූ රාගය අන්තො ජටා යැ, බාහිරවස්තුක රාගය බහිජටා යි. අධ්‍යාත්මවස්තුක සත්කායදෘෂ්ටියක් ඇද්ද, මේ අන්තො ජටා යැ, එක්සැට දෘෂ්ටිගතයෝ ද බාහිරවස්තුක දෘෂ්ටි ද බහි ජටා යි. යමක් වනාහි අධ්‍යාත්ම වස්තුකාදිභාවයෙන් වන්නේ ද මේ ''ජටා නමු' එහෙයින් සැකෙවින් යම් කිසි අධ්‍යාත්ම වස්තුක වූ තෘෂ්ණාවක් හා දෘෂ්ටියක් වී ද මෝ ''අන්තො ජටා' නමු, යම් කිසි බාහිරවස්තුවක වූ තෘෂ්ණාවක් හා දෘෂ්ටියක් වී ද මෝ තොමෝ 'බහිජටා' නම් වූ.

යථා දෙවතා භගවන්තං පුච්ඡති 'චතුචක්කං නවද්වාරන්ති ගාථා. තත්ථ භගවා විස්සජ්ජෙති: "ඡෙත්වා නද්ධිං වරත්තං චා"ති ගාථා. ඉමං[1] භගවා දුක්ඛනිරොධගාමිනිං පටිපදං විස්සජ්ජෙති, ඉමාය විස්සජ්ජනාය භගවා අනුමීයති කිලෙසෙ එත්ථ පුරිමාය ගාථාය නිද්දිසිතබ්බෙ[2]. තං හි "චතුචක්ක"න්ති චත්තාරො චා ඉරියාපථා.[3] "නවද්වාර"න්ති නව වණ්ණමුඛානි. යථා 'චතුචක්ක"න්ති චත්තාරො උපාදානා, උපාදානපච්චයා භවො උපාදානනිරොධා භවනිරොධො. 'නවද්වාර"න්ති නව මානවිධා, මානජාතිකාය හි දුක්ඛං සෙය්‍යොහමහි[4]

පරසො තිණ්ණි තිකානි පුණ්ණං[5], තිකෙන සංයුත්තං' හි පඤ්චකාමගුණිකො රාගො. තත්ථ "නද්ධි"ති තණ්හා විස්සජ්ජියති, "වරත්ත"න්ති මානං විස්සජ්ජෙති, "ඉච්ඡා ලොභං ච පාපකන්ති[6] පඤ්චකාමගුණිකො රාගො. තත්ථ විසමලොභො පාපකො'ති නිද්දිසියති 'සමූලං තණ්හ'න්ති. අඤ්ඤාණමූලකා තණ්හා අබ්බූය්හාති තණ්හාය ච දිට්ඨියා ච පහානං යෙ ච පුන අඤ්ඤෙපි කෙචි චතුචක්කයොගෙන තෙනෙව කාරණෙන ච යුජ්ජන්ති, සංසාරගාමිනො ධම්මා සබ්බෙ නිද්දිසිතබ්බා තත්ථායං ගාථා විස්සජ්ජනාය සමෙති. යං යදි සඤ්ඤෙන (?) අථ සහබ්‍යාකරෙණන අනුගීතියං ච සො විචයොති භගවා යත්තකානි පදානි නික්ඛිපති තත්තකෙහි අනුගායති.

"අට්ඨහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු දූතෙය්‍යං ගන්තුමරහති." ඉමානි අට්ඨපදානි නික්ඛිත්තානි. ඡහි පදෙහි භගවා අනුගායති.

6. යො වෙ න ව්‍යථති[7] පත්වා – පරිසං උග්ගවාදිනිං,
න ච හාපෙති වචනං – න ච ඡාදෙති සාසනං.

7. අසන්දිද්ධං ච භණති – පුච්ඡිතො න ච කුප්පති,
ස වෙ තාදිසකො භික්ඛු – දූතෙය්‍යං ගන්තුමරහතී'ති.

තත්ථ පන භගවා යත්තකානි පදානි නික්ඛිපති, තත්තකෙහි අනුගායති. "සත්තහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො කල්‍යාණමිත්තො පියො ගරු භාවනීයො"ති විත්ථාරෙන. ඉදං භගවා සත්තහි පදෙහි අනුගායති. ඉති බහුස්සුතවා අනුගායති, අප්පතරකථං පදං වා නික්ඛෙපො. බහුස්සුතවා නව පදානි නික්ඛෙපො අප්පතරිකා අනුගීතියා බහුතරිකා අනුගායති.

අයං වුච්චති අනුගීති ච විචයො. අයං විචයො නාම හාරො.

---

1. ඉදං – මජ්ඣං, PTS.
2. නිද්දිසිතබ්බෙන – ම, PTS.
3. හත්ථපාද – මජ්ඣං, PTS.
4. දුක්ඛංසෙ යෙනමහි – PTS.
5. පුඤ්ඤං – PTS.
6. ඉච්ඡා ලොභො ච පාපකොති – ම, PTS.
7. න වෙධති – අංගුත්තර.

මෙසේ දෙවි භාග්‍යවතුන් වහන්සේ පුළුවුස්සි : ''චතුචක්කං නවද්වාරං'' යන ගය– එහි බුදුහු විසඳන සේක : ''ඡෙත්වා නද්ධිං වරත්තං ච'' යන ගය– බුදුහු මේ දුක්ඛනිරොධ ගාමිනිපටිපදව විසඳන සේක. මේ විසඳීමෙන් බුදුහු පළමු ගාථාවෙන් දක්වියැ යුතු ක්ලේශයන් දක්වන සේක. ඒ වනාහි 'චතුචක්කං' යනු සතර ඊර්‍ය්‍යාපථයෝ හෝ යැ, 'නවද්වාරං' යනු නව වණමුඛයෝ යැ, එසේ මැ –චතුචක්කං' යනු සතර උපාදනයෝ යැ, උපාදනප්‍රත්‍යයෙන් කර්ම භවය වෙයි, උපාදනනිරොධයෙන් භවනිරොධය වේ'' 'නවද්වාරං යනු නවවැදෑරුම් මානයෝ යැ, (මාන ජාතිකාය හි දුක්ඛං සෙය්‍යොනම්හි පරසො තීණි තිකානි පුණ්ණං ?)

පඤ්චකාමගුණික රාගය මානත්‍රිකයෙන් සංයුක්ත මැ යි. එහි 'නද්ධි' යී තෘෂ්ණාව කියනු ලැබෙ. 'වරත්තං' යී මානය කියනු ලැබෙ. 'ඉච්ඡා ලොභං ච පාපකං' යනු පඤ්ච කාමගුණික රාගය යි. එහි විසමලොභය ලාමක යයි දක්වනු ලැබෙ. ''සමූලං තණ්හං' යනු අවිද්‍යා මූලක තෘෂ්ණාව යැ, අබ්බුය්හ යනු තෘෂ්ණාවගේ ද දෘෂ්ටියගේ ද ප්‍රහාණ යයි. යළි අන්‍ය වූ ද යම් කිසි ධර්ම කෙනෙක් චතුෂ්කයොගයෙන් (?) එකරුණෙන් ම යෙදෙත් ද ඒ සියලු සංසාරගාමී ධර්මයෝ දක්වියැ යුත්තාහු යැ. එහි මේ ගාථා විස්සජ්ජනය පුච්ඡාව හා ද විස්සජ්ජනාව හා ද සම වෙයි. (යං යදි සන්දෙන ?) යළි වෙය්‍යාකරණය සමග අනුගීතියෙහි දු ඒ විචය වේ. බුදුහු යම් පමණ පදයන් නික්ෂෙප කෙරෙත් ද එතෙක් පදයන්ගෙන් අනුගායනය කරන සේක.

''මහණෙනි, අට අඟෙකින් යමන්වාගත මහණ දූත මෙහෙවරට යන්නට සුදුසු වෙයි,'' මේ අට පදයෝ නික්ෂෙප කරන ලදහ, බුදුහු සපදයෙකින් අනුගායන කෙරෙති :

6. උග්‍රවාදිනී වූ පිරිස කරා පැමිණ යමෙක් කම්පා නො වේ ද වදන් නො පිරිහෙළා ද, හස්න නො ද සඟවා ද,

7. සන්දේහ රහිත වැ බෙණේ ද, පුළුවුස්නා ලදුයේ නො ද කිපේ ද ඒකාන්තයෙන් එබඳු මහණ දූතමෙහෙවරට යන්නට සුදුසු වේ යයි.

එහි වැලිත් බුදුහු යම් පමණ පදයන් නික්ෂෙප කෙරෙත් ද එතෙක් පදයෙන් අනුගායන කෙරෙත්. ''මහණෙනි සත් අඟෙකින් සමන්වාගත කල්‍යාණ මිත්‍ර ප්‍රිය වූයේ ගුරු වූයේ භාවනීය වූයේ''යී විස්තර කළයුතු. බුදුහු මෙය සත් පදයෙකින් අනුගායන කරනසේක. මෙසේ බහු ශ්‍රැතවත් වූයේ අල්පතර කථාව හෝ පදය හෝ අනුගායන කෙරෙයි. .........?

මේ අනුගීති විචය යයි කියනු ලැබෙ. **මේ විචය නම් හාර යි.**

3. තත්ථ කතමො යුත්තිහාරො :

8. සබ්බෙසං හාරානං – යා භූමි යො ච ගොචරො තෙසං,
යුත්තායුත්ත පරික්ඛා – හාරො යුත්තීති නිද්දිට්ඨො.

හාරානං සොළසන්නං යථා දෙසනා යථා විචයො යො ච නිද්දිසියති[1]. අයං නිද්දෙසො, අයං පුච්ඡා සුත්තෙසු න යුජ්ජතීති යා තත්ථ වීමංසා අයං යුත්ති.

යථා හි සහෙතු සප්පච්චයා සත්තා සංකිලිස්සන්ති, අත්ථි හෙතු අත්ථි පච්චයො සත්තානං සංකිලෙසාය, සහෙතු සප්පච්චයා සත්තා විසුජ්ඣන්ති, අත්ථි හෙතු අත්ථි පච්චයො සත්තානං විසුද්ධියා.

"සීලවතා ආනන්ද පුග්ගලෙන න චෙතනා කරණීයා[2] 'කින්ති මෙ අවිප්පටිසාරො[3] උප්පජ්ජෙය්‍යා'ති"[4] -පෙ- වෙය්‍යාකරණං[5]. සත්තබ්බං. අයං විසුද්ධියා මග්ගො. තස්ස කො හෙතු[6] කො පච්චයො සීලක්ඛන්ධස්ස, චත්තාරො හෙතු ච පච්චයා ච : යො ච සප්පුරිසසංසෙවො යො ච පතිරූපදෙසවාසො[7] අයං උපාදපච්චයතාය පච්චයො. යං පොරාණ-කම්මං අස්ස විපාකො පච්චයො, තාය පච්චයතාය[8] අත්තසම්මාපණිධි, අයං හෙතු, ඉති සීලක්ඛන්ධො සහෙතු සප්පච්චයොති. ඉදං ලොකිකං සීලං.

යං පන ලොකුත්තරං සීලං තස්ස තීණි ඉන්ද්‍රියානි පච්චයො සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං[9] සමාධින්ද්‍රියං අයං පච්චයො. සතින්ද්‍රියං ච පඤ්ඤින්ද්‍රියං ච හෙතු. පඤ්ඤාය නිබ්බෙධගාමිනියා යං සීලං ජායති. සොතාපන්නස්ස ච සීලං කෙනායං හෙතු අයං පච්චයො (?)

යං පුන සමාධිනො පස්සද්ධි ච පීති ච පාමොජ්ජං ච පච්චයො. යං සුඛං හෙතු, තෙන සමාධික්ඛන්ධො සහෙතු සප්පච්චයො, යං සමාහිතො යථාභූතං පජානාති, අයං පඤ්ඤා. තස්සා[10] පරතොඝොසො ආජ්ඣත්තං ච යොනිසොමනසිකාරො හෙතු ච පච්චයො ච. ඉති ඉමෙ තයො ඛන්ධා සහෙතු සප්පච්චයා. එවං සත්ත පඤ්ඤා. සත්ත-බ්‍යාකරණීසු ච සුත්තෙසු න යුජ්ජති. අයං යුත්තිහාරො, සො චතුසු මහාපදෙසෙසු දට්ඨබ්බො.

4. තත්ථ කතමො පදට්ඨානො හාරො :

9. ධම්මං දෙසෙති ජිනො – තස්ස ච ධම්මස්ස යං පදට්ඨානං,
ඉති යාව සබ්බධම්මා[11] – එසො හාරො පදට්ඨානො.

---

1. නිද්දිසියති – ම, PTS.
2. වෙය්‍යාකරණීයා, – ම, PTS.
3. විප්පටිසාරො – ම, PTS.
4. උප්පාදෙය්‍ය – ම, PTS.
5. අබ්‍යාකරණං – ම, PTS.
6. තස්ස හෙතු – ම.
7. පතිරූපදෙසවාසො ච – ම.
8. පච්චයාය – ම, PTS.
9. විරියින්ද්‍රියං – ම.
10. තස්ස – ම, PTS.
11 එත්තාවතා සබ්බධම්මානං – PTS.

3. එහි යුක්තිහාරය කවරෙ යත් :

8. සියලු හාරයන්ගේ ව්‍යඤ්ජන, සංඛ්‍යාත යම් භූමියක් ඇද්ද, සූත්‍රාර්ථ සංඛ්‍යාත, යම් ගෝචරයෙකුත් ඇද්ද, ඒ අර්ථව්‍යඤ්ජනයන් මහා-අපදේසයන් හා යුක්ත අයුක්ත (යෙදෙන නොයෙදෙන) බව, දක්වීම ලක්ෂණ කොට ඇත්තේ යුක්තිහාර නමැයි දක්වන ලද්දේ ය.

සොළොස් හාරයන්ගේ දේසනාහාරය මෙන් විචයහාරය මෙන් යම් විමංසායෙක් දක්වනු ලැබෙ ද, සූත්‍රයන්හි මේ නිර්දේශය මේ පුච්ඡාව නො යෙදේ යයි එහි යම් විමංසායෙක් ඇද්ද මේ යුත්ති නම් වේ.

ඒ මෙසේ යැ, හේතු සහිත වූවාහු ප්‍රත්‍යය සහිත වූවාහු සත්ත්වයෝ සංක්ලේශයට පැමිණෙන්නාහු ය, සත්ත්වයන්ගේ කෙලෙසීමට හේතුයෙක් ඇත, ප්‍රත්‍යයෙක් ඇත. හේතු සහිත වූවාහු ප්‍රත්‍යය සහිත වූවාහු සත්ත්වයෝ විශුද්ධියට පැමිණෙත්. සත්ත්වයන්ගේ විශුද්ධියට හේතුයෙක් ඇත, ප්‍රත්‍යයෙක් ඇති.

''ආනන්දය, සිල්වත් පුහුල්හු විසින් 'කිසෙයින් මට අවිප්‍රතිසාරය උපදනෝ ද'යි චෙතනා නො කටයුත්තී යැ ...... වෙය්‍යාකරණය විස්කර කළ යුතු. මේ විශුද්ධියට මාර්ග යැ, ඒ ශීලස්කන්ධයට හේතු කවරෙ යැ, ප්‍රත්‍යය කවරෙ යැ : හෙතුහු ද ප්‍රත්‍යයෝ ද සතර දෙනෙක් වෙති : යම් සත්පුරුෂසංසෙවායෙක් ඇද්ද යම් ප්‍රතිරූප දේශවාසයෙකුත් ඇද්ද, උපාද ප්‍රත්‍යයතායෙන් මේ ප්‍රත්‍යය වෙයි. යම් පුරාණ කර්මයක් ඇද්ද ඒ කර්මයාගේ විපාකය ප්‍රත්‍යය වෙයි, ඒ ප්‍රත්‍යයභාවයෙන් ආත්මසම්‍යක්ප්‍රණිධිය වෙයි. මේ හේතු යි. මෙසේ ශීලස්කන්ධය සහෙතු සප්‍රත්‍යය වේ යයි. මේ ලෞකික ශීල යි.

යළි යම් ලොකොත්තරශීලයෙක් ඇද්ද ඒ ශීලයට සද්ධින්ද්‍රිය විරියන්ද්‍රිය සමාධින්ද්‍රිය යන තුන් ඉන්ද්‍රියයෝ ප්‍රත්‍යය වෙති. මේ ප්‍රත්ත්‍යය යි. සතින්ද්‍රිය ද පඤ්ඤින්ද්‍රිය ද හේතු යි. නිබ්බෙධගාමිනී ප්‍රඥයෙන් යම් ශීලයක් උපදී ද, සෝවන්හුගේ ද සීලය ලොකුත්තර යි.

යළි සමාධියට යම් පස්සද්ධියක් ප්‍රීතියක් ප්‍රාමොද්‍යයෙක් ඇද්ද මේ ප්‍රත්‍ය යැ, යම් සුඛයක් ඇද්ද මේ හේතු යි. එයින් සමාධික්ඛන්ධය සහේතු සප්‍රත්‍යය වේ. යම්හෙයෙකින් සමාහිත වූයේ යථා භූත වැ දනගනී ද මේ ප්‍රඥ යැ. ඒ ප්‍රඥවට පරතොඝොසය ද අධ්‍යාත්ම යෙහි යොනිසො මනසිකාරය ද හේතු ද ප්‍රත්‍යය ද වේ. මෙසේ මේ තුන් ස්කන්ධයෝ සහෙතු සප්‍රත්‍යය වෙත්. (එවං සත්ත පඤ්ඤා සත්තබ්‍යාකරණීසු ච සුත්තෙසු න යුජ්ජති?) මේ යුක්තිහාර යි'' හේ සතර මහාපදෙසයෙහි දතයුත්තේ යි.

4. එහි පදට්ඨානයාරය කවරෙ යැ :

9. ජිතපඤ්චමාර වූ බුදුහු දහම් දෙසති. ඒ කුශලාදි භෙද වූ ධර්මයට කාරණ වූ යොනිසොමනසිකාරාදි යම් පදට්ඨානයෙක් ඇද්ද, මෙසේ සූත්‍රාගත වූ සියලු ධර්මයනට පදට්ඨාන (ආසන්න කාරණ) දක්වීම ලක්ෂණ වූ තෙල හාරය පදට්ඨාන නම් වේ.

තත්ථ පඤ්ච කාමගුණා කාමරාගස්ස පදට්ඨානං, යෙසං කෙසඤ්චි කාමරාගො උප්පජ්ජති උප්පන්නො වා උප්පජ්ජිස්සති වා එතෙසු යෙව[1] පඤ්චසු රූපාදිසු[2] ආයතනෙසු, නාඤ්ඤත්‍ර එතෙහි කාමරාගස්ස පදට්ඨානන්ති. වුච්චතෙ, තෙන පඤ්ච කාමගුණා කාමරාගස්ස පදට්ඨානං, පඤ්චින්ද්‍රියානි රූපරාගස්ස පදට්ඨානං, මනින්ද්‍රියං භවරාගස්ස පදට්ඨානං, පඤ්චක්ඛන්ධා සක්කායදිට්ඨියා පදට්ඨානං, එකසට්ඨි දිට්ඨිගතානි දිට්ඨිරාගස්ස පදට්ඨානං, කාමධාතු කාමරාගස්ස පදට්ඨානං, රූපධාතු රූපරාගස්ස පදට්ඨානං අරූපධාතු අරූපරාගස්ස පදට්ඨානං, සුභසඤ්ඤා කාමරාගස්ස පදට්ඨානං, බ්‍යාපාදසඤ්ඤා බ්‍යාපාදස්ස පදට්ඨානං, අසම්පජානතා[3] සම්මොහස්ස පදට්ඨානං, නව[4] ආඝාතවත්ථූනි බ්‍යාපාදස්ස පදට්ඨානං, නවවිධං මානං° විධමානස්ස[4] පදට්ඨානං, සුඛා වෙදනා රාගානුසයස්ස පදට්ඨානං, දුක්ඛා වෙදනා පටිඝානුසයස්ස පදට්ඨානං, අදුක්ඛමසුඛා වෙදනා අවිජ්ජානුසයස්ස පදට්ඨානං, අත්තවාදුපාදානං ච මුසාවාදො ච ලොභස්ස පදට්ඨානං, පාණාතිපාතො ච පිසුණවාචා ච ඵරුසවාචා ච බ්‍යාපාදස්ස පදට්ඨානං, මිච්ඡත්තං ච සම්ඵප්පලාපො ච මොහස්ස පදට්ඨානං, භවං භොගං ච වොකාරෙ ච අහංකාරස්ස පදට්ඨානං, බාහිරානං පරිග්ගහො මමංකාරස්ස පදට්ඨානං, කායස්ස සඞ්ගං දිට්ඨියා පදට්ඨානං, කායිකදොසො දොසස්ස පදට්ඨානං, කායිකකාමාචො ලොභස්ස පදට්ඨානං, යො යො වා පන ධම්මො යෙන යෙන ආකාරෙන[5]. උප්පජ්ජති සභාගට්ඨානෙන[6] වා ධම්මාධිට්ඨානෙන වා අනුසයනෙන වා සො ධම්මො තස්ස පදට්ඨානං. තෙන ආකාරෙන[5] සො ධම්මො උප්පජ්ජති.

යථා මනුස්සො පුරිමස්ස පදස්ස පදට්ඨානං අලභන්තො දුතියං පදං උද්ධරති. සො පච්ඡානුපදං සංහරති[7]. යදි පන යො න දුතියපදස්ස පදට්ඨානං ලභති, අපරං පදං උද්ධරති, තස්ස සො වෙසො පච්චයො භවති. එවං ධම්මො කුසලො වා අකුසලො වා අබ්‍යාකතො වා පදට්ඨානං අලභන්තො න පවත්තති, යථා පසුතස්ස ධම්මස්ස යොනිසො[8]. අයං වුච්චති පදට්ඨානො හාරො.

### 5. තත්ථ කතමො ලක්ඛණො හාරො :

10. වුත්තම්හි එකධම්මෙ - යෙ ධම්මා එකලක්ඛණා තෙන,
සබ්බෙ භවන්ති වුත්තා - සො හාරො ලක්ඛණො නාම.

---

1. යෙපි - මජසං,
2. රූපෙසු - මජසං, PTS,
3. අසම්පජඤ්ඤතා - ම, PTS.
4. මානස්ස - ම,
5. ආරම්මණෙන - ම, PTS.
6. සච්චාධිට්ඨානෙන - ම, PTS.
7. පටිසංහරති - PTS.
8. යොනිලාභො - මජසං,

එහි පඤ්චකාමගුණයෝ කාමරාගයට පදට්ඨාන යැ, යම් කිසි කෙනකුන්ට කාමරාගය උපදී ද, උපන්නේ හෝ උපදනේ හෝ වේ ද, තෙල රූපාදි පඤ්ච ආයතනයන්හි මැ උපදී, මොවුන් කෙරෙන් අන් තැනෙක කාමරාගයට පදට්ඨාන නැති, එයින් කියනු ලැබේ,. ''පඤ්චකාම ගුණයෝ කාමරාගයට පදට්ඨාන යැ, පඤ්චෙන්ද්‍රියයෝ රූපරාගයට පදට්ඨාන යැ, මනඉන්ද්‍රිය භවරාගයට පදට්ඨාන යැ, පඤ්චස්කන්ධයෝ සක්කාය දිට්ඨියට පදට්ඨාන යැ, එක්සැටක් දෘෂ්ටිගතයෝ දිට්ඨිරාගයට පදට්ඨාන යැ, කාමධාතුව කාමරාගයට පදට්ඨාන යැ, රූපධාතුව රූපරාගයට පදට්ඨාන යැ, අරූපධාතුව අරූපරාගයට පදට්ඨාන යැ, සුබසංඥව කාමරාගයට පදට්ඨාන යැ, ව්‍යාපාද සංඥව ව්‍යාපාදයට පදට්ඨාන යැ. සම්‍යග්ඥන රහිතබව සම්මොහයට පදට්ඨාන යැ, නව ආඝාතවස්තු ව්‍යාපාදයට පදට්ඨාන යැ නව විධ මානය විධා සංඛ්‍යාත මානයට පදට්ඨාන යැ, සුඛවෙදනාව රාගානුශයට පදට්ඨාන යැ, දුක්ඛ වෙදනාව පටිඝානුසයට පදට්ඨාන යැ, අදුක්ඛමසුඛ වෙදනාව අවිද්‍යානුශයට පදට්ඨාන යැ, අත්තවාදූපාදනය ද මුසාවාදය ද ලොභයට පදට්ඨාන යැ, ප්‍රාණඝාතය ද පිසුනවචනය ද පරුෂ වචනය ද ව්‍යාපාදයට පදට්ඨාන යැ, මිත්‍ථ්‍යාදෘෂ්ටිය ද සම්ඵප්‍රලාපය ද මොහයට පදට්ඨාන යැ, භවය ද භොග ද ව්‍යවකාරය (සිතෙහි ව්‍යාකූලබව) ද අහංකාරයට පදට්ඨාන යැ, බාහිර වස්තූන් ගේ පරිග්‍රහය මමංකාරයට පදට්ඨාන යැ, කායසංගය (ඇලීම) දෘෂ්ටියට පදට්ඨාන යැ කායික දෙෂය ද්වෙෂයට පදට්ඨාන යැ, කායකසටය ලොභයට පදට්ඨාන යැ, තවද යම් යම් ධර්මයෙක් සත්ත්වප්‍රඥප්ති වශයෙන් හෝ ධර්මවශයෙන් හෝ අනුශය වශයෙන් හෝ යම් යම් අකාරයකින් උපදී ද, ඒ ධර්මය එයට පදට්ඨාන යි. ඒ ආකාරයෙන් ඒ ධර්මය උපදී.

යම්සේ මිනිසෙක් පළමු පාදයට පිය තබන තැනක් නො ලබනුයේ දෙවැනි පිය නහයි, හේ පසුපිය හකුළුවයි, යළි ඉදින් යමෙක් දෙවැනි පියට පිය තබන තැනක් නො ලබා නම් අනික් පිය නගයි, ඔහුට තෙල ප්‍රත්‍යය වේ. එපරිදි කුශල හෝ අකුශල හෝ අව්‍යාකෘත හෝ ධර්මය පදට්ඨානය නො ලබනුයේ නො පවතී. (යථා පයුත්තස්ස ධම්මස්ස යොනිසො?) මේ පදට්ඨානහාර යයි කියනු ලැබේ.

**5.** එහි, ලක්ඛණහාර කවරෙ යත් :

10. (කුශලාදි හෝ ස්කන්ධාදි හෝ) එක් ධර්මයක් සූත්‍රයෙහි වදළ කල්හි (කුශලාදි ස්කන්ධාදි භාවයෙන්) එය හා සමාන ලක්ෂණ වූ යම් ධර්මකෙනෙක් වෙත් ද, ඒ හැම ධර්මයෝ ලක්ෂණ වශයෙන් කියන ලද්දහු වෙති, (නො දක් වූ ධර්මයෝ එළවා දක්වීම ලක්ෂණ කොට ඇති) ඒ හාරය ලක්ඛණහාර නම් වේ.

"යෙසං ච සුසමාරද්ධා - නිච්චං කායගතාසතී"ති ගාථාය වුත්තාය කායගතාගතියා වුත්තා වෙදනාගතා චිත්තගතා ධම්මගතා ච සති, චතුන්නං සතිපට්ඨානානං එකෙන සතිපට්ඨානෙන. තහි චිත්තං එකස්මිං විඤ්ඤාණට්ඨිතියා පවත්තති, නානාසු ගතීසු පවත්තති, කායගතාසතියා වුත්තාය වුත්තා වෙදනාගතා චිත්ත - ධම්මගතා ච. න හි කායගතාසතියා භාවිතාය සතිපට්ඨානා චත්තාරො භාවනාපාරිපූරිං ගච්ඡන්ති. එවං තස්සදිසෙසු ධම්මෙසු වුත්තෙසු සබ්බධම්මා වුත්තා ච භවන්ති.

"සචිත්තපරියොදපනං[1] එතං බුද්ධාන සාසන"න්ති ගාථා චෙතසිකා ධම්මා වුත්තා, චිත්තෙන රූපං වුත්තං. ඉදං නාමරූපං දුක්ඛං අරියසච්චං තතො, සචිත්තපරියොදපනා[2] යං පටිවෙධෙන ඔදපෙති, තං දුක්ඛං යතො ඔදපෙති සො සමුදයො යෙන ඔදපෙති, සො මග්ගො. යං ඔදපිතං සො නිරොධො.

"චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං." තත්ථ සහජාතා වෙදනා සඤ්ඤා චෙතනා ඵස්සො මනසිකාරො එතෙ තෙ ධම්මා එකලක්ඛණා උප්පාදලක්ඛණෙන. යො ච රූපෙ නිබ්බින්දති, වෙදනාය සො නිබ්බින්දති, සඤ්ඤාසඞ්ඛාරවිඤ්ඤාණෙසුපි සො නිබ්බින්දති. ඉති යෙ එකලක්ඛණා ධම්මා තෙසං එකම්හි ධම්මෙ නිද්දිට්ඨෙ සබ්බෙ ධම්මා නිද්දිට්ඨා හොන්ති. අයං වුච්චති ලක්ඛණො හාරො.

6. තත්ථ කතමො චතුබ්‍යූහො හාරො :

11. නිරුත්ති අධිප්පායො ච - බ්‍යඤ්ජනා දෙසනාය ච,
සුත්තත්ථො පුබ්බාපරසන්ධි - එසො හාරො චතුබ්‍යූහො.

තත්ථ කතමා නිරුත්ති : සා කථං පරියෙසිතබ්බා, යථා වුත්තං භගවතා "එකාදසහි අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු ඛිප්පං ධම්මෙසු මහන්තං පාපුණාති, අත්ථකුසලො ච හොති ධම්මකුසලො ච හොති බ්‍යඤ්ජනකුසලො ච හොති නිරුත්තිකුසලො ච හොති ඉත්ථාධිවචනකුසලො ච හොති පුරිසාධිවචනකුසලො ච විපුරිසාධිවචනකුසලො ච අතීතාධිවචනකුසලො ච අනාගතාධිවචනකුසලො ච පච්චුප්පන්නාධිවචනකුසලො ච. එකාධිප්පායෙන කුසලො අනෙකාධිප්පායෙන[3] කුසලො කිම්හි දෙසිතං අතීතානාගතපච්චුප්පන්නං. ඉත්ථාධිවචනෙන පුරිසාධිවචනෙන සබ්බා යථාසුත්තං නිද්දිට්ඨං. තං බ්‍යඤ්ජනතො නිරුත්තිකොසල්ලතො යො යං සුත්තස්ස සුනිරුත්ති දුන්නිරුත්ති තං අවෙක්ඛති, ඉදං එවං නිරොපයිතබ්බං, ඉදමපි න නිරොපයිතබ්බං. ඉදං වුච්චති නිරුත්තිකොසල්ලං.

---

1. පරියොදපනං - ම.
2. පරියොදපනා - ම.
3 නානාධිප්පයෙන - ම, PTS.

"යම් කෙනකුන් විසින් නිරතුරු කාගියාසී මොනවට වඩන ලද ද" යන ගාථායෙහි කායගතාසතිය වදළ කල්හි වෙදනාගතා–චිත්තගතා–ධම්මගතාසති ද වදරනලද්දහු වෙති. සතර සතිපට්ඨානයෙන් එක සතිපට්ඨානයකින් වදළ හෙයිනි. චිත්තය එක විඤ්ඤාණවීථියෙක්හි නො මැ පවතී, නානාගතීන්හි පවතී, කායගතාසතිය වදළ කල්හි වෙදනා – චිත්ත – ධම්මගතාසති ද වදරන ලද වෙයි. කායගතාසති වැඩූකල්හි සතර සතිපට්ඨානයෝ භාවනායෙන් පිරීමට නො මැ යෙත්. මෙසේ ඊට සමාන වූ ධර්මයන් වදළ කල්හි සියලු ධර්මයෝ වදරන ලද්දහු ද වෙත්.

"සචිත්තපරියොදපනං එතං බුද්ධාන සාසනං" යන ගාථාව : මෙහි චෛතසික ධර්මයෝ වදරනලද්දහුය. චිත්තයෙහි රූපය කියනලදි, මේ නාමරූපය දුඃඛාර්‍යසත්‍ය යැ, එයින් ස්වචිත්තයාගේ පවිත්‍ර කිරීම වේ. යමක් ප්‍රතිවෙධ සංඛ්‍යාත පරිඥාභිසමයෙන් පවිත්‍ර කෙරේ ද, එය දුඃඛ යැ, යමක් කෙරෙන් පවිත්‍ර කෙරේ ද ඒ සමුදය යැ, යමක් කරණකොට පවිත්‍ර කෙරේ ද, ඒ මාර්ගය යැ, යමක් පවිත්‍ර කරන ලද ද ඒ නිරොධ යි.

"චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං" එහි සහජාත වූ වෙදනා යැ සඤ්ඤා යැ චෙතනා යැ ඵස්ස යැ මනසිකාර යැ යන තෙල ධර්මයෝ උත්පාද ලක්ෂණ යෙන් සමාන ලක්ෂණ ඇත්තාහු යැ. යමෙක් රූපයෙහි නිර්වෙදයට (කලකිරීමට) පැමිණේ ද හේ වෙදනායෙහි නිර්වෙදයට පැමිණෙයි. සඤ්ඤා–සඞ්ඛාර–විඤ්ඤාණයන්හිදු හේ නිර්වෙදයට පැමිණෙයි, මෙසේ සමාන ලක්ෂණ වූ යම් ධර්මකෙනෙක් වෙත් ද, ඔවුනතුරෙන් එක් ධර්මයක් දක් වූ කල්හි සියලු ධර්මයෝ දක්වන ලද්දහු වෙත්. මේ ලක්ඛණහාර යයි කියනු ලැබේ.

**6.** එහි **චතුබ්‍යුහහාරය** කවරෙ යත් :

11. සූත්‍රාගත, පදනිර්වචන සංඛ්‍යාත නිරුත්තිය ද දේශකයන්ගේ අධිප්‍රාය ද දේශනාවගේ නිදානය ද සූත්‍රාර්ථ වූ පූර්වාපරසන්ධිය ද යන චතුර්විධ ලක්ෂණයන් වර්ණනා කිරීම ලක්ෂණ කොට ඇති තෙල හාරය චතුබ්‍යුහ නම් වේ.

එහි නිරුත්ති කවරෙ : ඒ නිරුත්ති කිසෙයින් සෙවියැයුත්තී ද යත් : භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වදරන ලද : "එකොළොස් අඟෙකින් සමන්වාගත මහණ වහා ධර්මයෙහි මහත්ත්වයට පැමිණෙයි, පාළි අර්ථයෙහි දක්ෂවූයේත් වෙයි, පාළියෙහි දක්ෂ වූයේත් වෙයි, අක්ෂර වාක්‍ය සංඛ්‍යාත ව්‍යඤ්ජනයෙහි කුසල වූයේත් වෙයි නිර්වචනයෙහි කුසල වූයේත් වෙයි, ස්ත්‍රීප්‍රඥප්තියෙහි නිපුණ වූයේත් වෙයි, පුරුෂ ප්‍රඥප්තියෙහි නිපුණ වූයේත් වෙයි, නපුංසක ප්‍රඥප්තියෙහි නිපුණ වූයේත් වෙයි, අතීත ප්‍රඥප්තියෙහි නිපුණ වූයේත් වෙයි, අනාගතප්‍රඥප්ති යෙහි නිපුණ වූයේත් වෙයි, වර්තමානප්‍රඥප්තියෙහි නිපුණ වූයේත් වෙයි, එකවචනයෙහි නිපුණ වූයේත් වෙයි, අනෙක වචනයෙහි නිපුණ වූයේත් වෙයි, ප්‍රත්‍යුත් පන්නාධිවචනයෙහි කුශල වූයේත් වෙයි, ඒකාධිප්‍රායයෙන් දෙසනලද්දෙහිත් අනේකාධි ප්‍රායයෙන් දෙසන ලද්දෙහිත් කුශල වෙයි. ඒ එසේ මැය කිම දෙශිතය අතීතානාගත ප්‍රත්‍යුත්පන්න ද, ස්ත්‍රීලිංගයෙන් පුරුෂලිංගයෙන් නපුංසක ලිංගයෙන් දෙසන ලද දැයි සියල්ල සූත්‍රානුරූප ව දක්වන ලද, එය ව්‍යඤ්ජනවශයෙන් නිරුත්තිකුසලබව හෙයින් සූත්‍රයාගේ යම් සුනිරුත්ති දුන්නිරුත්තියක් වේ ද එය "මේ පදය මෙසේ නිරූපණය කළයුතු ය, මෙය නිරූපණය නොකළයුතු යයි නුවණින් බලයි. මේ නිරුක්තිකෞශල්‍ය යයි කියනු ලැබේ. (මෙහි පෙළ ඉතා ව්‍යාකූලයි.)

තත්ථ කතමං අධිප්පායකොසල්ලං: යථාදෙසිතස්ස සුත්තස්ස (සබ්බස්ස වාරං ගච්ඡති, ඉමෙන භගවතා දෙසිතන්ති) යථා කිං:

“අප්පමාදො අමතපදං[1] පමාදො මච්චුනො පද”න්ති ගාථා.

තත්ථ භගවතො කො අධිප්පායො: යෙ අමතමෙව[2] ආකඞ්ඛන්ති තෙ අප්පමත්තා විහරිස්සන්ති. අයං අධිප්පායො.

12. (යොගස්ස කාලං න නිවත්තන්ති යා ච
සො න තත්ථ පාපිනාවෙ භවන්ති,
වෙදනාමජ්ඣුසිනා පවෙදිතං.
ධුතරජාසවා දුක්ඛා පමොක්ඛාතා.)?

එත්ථ භගවතො කො අධිප්පායො: යෙ දුක්ඛනානස්සාදකා[4] (?) තෙ විරියමාරභිස්සන්ති දුක්ඛක්ඛයායා’ති අයං තත්ථ භගවතො අධිප්පායො. ඉති ගාථාය වා බ්‍යාකරණෙ[5] වා දෙසිතෙ ඉමිනා සුත්තෙන සාධකා (?) යෙ, එවං ධම්මානුධම්මං පටිපජ්ජන්තීති නො අධිප්පායො. අයං වුච්චති දෙසනාධිප්පායො,

තත්ථ කතමො පුබ්බාපරසන්ධි: (යං ගාථායං වා සුත්තෙ[6] වා පදානි අසීතිතානි (?) භවන්ති එවං වා එවමෙවහි තස්සා ගාථාය සුත්තස්ස වා යානි පුරිමානි පදානි යානි ච පච්ඡිමකානි, තානි සමොසාරෙතබ්බානි. එවං සො පුබ්බාපරෙන සන්ධිං ඤායති. යා එකා සමාරද්ධා ගාථා ද්වෙ තීණි වා තස්සමෙකදෙසෙ භාසිතානං අභාසිතාහි ගාථාහි අනිද්දිට්ඨො අත්ථො භවති තදුපධාරිතබ්බං යං වත්තබ්බං. ඉතිස්ස පරියෙසමානස්ස පරියෙසනාකඞ්ඛා, තස්ස වා පුග්ගලස්ස පඤ්ඤත්තීනං අපරෙ පරියෙසිතබ්බං. ඉදං වුච්චතෙ පුබ්බාපරෙන සන්ධි.)?

‘කොසල්ල’න්ති වත්ථුතො නිදානකොසල්ලං. බ්‍යඤ්ජනතො නිරුත්ති-කොසල්ලං, දෙසනාධිප්පායකොසල්ලං, පුබ්බාපරෙන සන්ධිකොසල්ලං. තත්ථ තස්ස ගාථා පරියෙසිතා නිදානං වා උපලභිතුං[7]. න අත්ථො නිද්දිසිතබ්බො වත්ථුතො නිදානකොසල්ලං අත්ථකොසල්ලං ඉමෙහි චතූහි පදෙහි අත්ථො පරියෙසියන්තො යථාභූතං පරියිට්ඨො හොති. අථ ච සබ්බො වත්ථුතො වා නිදානෙන වා යො අධිප්පායො බ්‍යඤ්ජනො නිරුත්ති සන්ධි ච අනුත්තරෙ එසො පුබ්බාපරෙන එවං සුත්තත්ථෙන දෙසිතබ්බං. අයං චතුබ්‍යූහො හාරො.

**7. තත්ථ කතමො ආවට්ටො හාරො:**

13. එකම්හි පදට්ඨානෙ – පරියෙසති සෙසකං පදට්ඨානං,
ආවත්තති පටිපක්ඛෙ – ආවට්ටො නාම සො හාරො.

---

1. අමතං පදං – ම, PTS.
2. යංච, සබ්බා – ම.
3. අසීතිමෙව – ම, PTS.
4. දුක්ඛසා සාධකා – PTS.
5. බ්‍යාකරණෙන – ම, PTS
6. සුත්තෙසු – ම,
7. උපලබ්භිතුං – ම, PTS

එහි අධිප්පායකොසල්ලය කවරෙ යත් : දේශනා කරන ලද සූත්‍රය පිළිබඳව භාග්‍යවතුන් විසින් මේ අදහසින් දෙසන ලදැයි දේශනායෙහි අදහස දක්වියයුතු යැ (?) කෙබඳු ද යත් :

''ස්මෘති අවිප්‍රවාස සංඛ්‍යාත අප්‍රමාදය නිවනට කාරණ යැ, ප්‍රමාදය මරණයට කාරණ වෙයි'' යන ගාථාව යැ.

මෙහි ලා භාග්‍යවතුන් වහන්සේගේ අදහස කවරෙ යැ : යම් කෙනෙක් අමෘතය (නිවන) මැ කැමැති වෙත් ද, ඔහු අප්‍රමත්ත වැ වාසකරන්නාහ'' යන මේ අදහස යි.

12. (මේගාථාව අතිශයින් ව්‍යාකූල යැ මේ තාක් ශුද්ධ කිරීමට හසරක් නො ලැබිණ.)

මෙහි භාග්‍යවතුන් වහන්සේගේ අදහස කවරෙ යත් : යම් කෙනෙක් දුකින් මිදෙනු කැමැත්තාහු ද, ඔහු දුක් ක්ෂය කිරීම පිණිස වීර්‍ය්‍යාරම්භ කරන්නාහු යැ. මේ එහි භාග්‍ය වත්හුගේ අදහස යි. මෙසේ ගාථාවක් හෝ වෙය්‍යාකරණයක් හෝ දෙසිත කල්හි මේ සූත්‍රයෙන් දක්වූ ධර්මානුධර්මයෙහි පිළිපදනේ යැ යනු අභිප්‍රාය යි. (?) මේ දෙසනාධිප්පාය නමැයි කියනු ලැබේ.

එහි පුබ්බාපරසන්ධි කවරෙ යත් :

(පුබ්බාපරසන්ධි දක්වන වාක්‍යය ද ව්‍යාකූලව ඇත.)

කොසල්ල යනු : වස්තු වශයෙන් නිදන දක්වීමෙහි කුශල බව ද ව්‍යඤ්ජන වශයෙන් නිරුක්ති දක්වීමෙහි කුශලබව ද, දෙශනායෙහි අදහස දක්වීම පිළිබඳ කුශලබව ද පූර්වාපර වශයෙන් දෙශනා සන්ධි දක්වීමෙහි කුශලබව ද වේ ......... ? (මෙ ද ව්‍යාකූල තැනෙකි)..

මේ චතු බ්‍යූහහාර යි.

7. එහි ආවත්තහාර කවරෙ යත් :

13. ආරම්භධාතු ආදි (පරක්කමධාතු ආදියට) පදට්ඨාන වූ එක් ධර්මයක් දෙශනාරූඪ කල්හි ඒ ධර්මයට විෂභාගභාවයෙන් (ප්‍රමාදදියට පදට්ඨාන වූ කොසජ්ජාදි) අවශෙෂ පදට්ඨානධර්මය ගවෙෂණය කෙරෙයි, එය සොයා ප්‍රතිපක්ෂධර්මයන් ආවර්තන කෙරෙයි. (මෙසේ සභාග විෂභාගවශයෙන් ආවර්තන ලක්ෂණ වූ) ඒ හාරය ආවට්ටහාර නම් වේ'.

යථා කිං: "උන්නළානං[1] පමත්තානං"ති ගාථායො. ඉදං කිස්ස පදට්ඨානං: කුසලානං ධම්මානං[2] ඔස්සග්ගස්ස[3]. කුසලධම්මොස්සග්ගො පන කිස්ස පදට්ඨානං: අකුසලධම්ම[4] පටිසෙවනාය. (අප්පමාදෙ) කිස්ස පදට්ඨානං: කුසලධම්මපටිසෙවනාය. (පමාදෙ) කිස්ස පදට්ඨානං: කිලෙසවත්ථුපටිසෙවනාය. ඉති පමාදෙන මොහපක්ඛියා දිට්ඨි අවිජ්ජා ඡන්දරාගපක්ඛියා, තත්ථ තණ්හා ච දිට්ඨි ච චත්තාරො ආසවා, තණ්හා කාමාසවො ච භවාසවො ච, දිට්ඨි දිට්ඨාසවො ච අවිජ්ජාසවො ච. තත්ථ චිත්තෙන අජ්ඣීති දිට්ඨි චෙතසිකෙසු නිච්චන්ති පඤ්චසු කාමගුණෙසු අජ්ඣාවහනෙන කාමාසවො, උපපත්තීසු ආසත්ති භවාසවො. තත්ථ රූපකායො කාමාසවස්ස භවාසවස්ස ච පදට්ඨානං, නාමකායො දිට්ඨාසවස්ස අවිජ්ජාසවස්ස ච පදට්ඨානං.

තත්ථ අලලීයනාය[5] අජ්ඣත්තවාහනං කාමාසවස්ස ලක්ඛණං, පත්ථනා ගෙත්ථන[6] අභිසඞ්ඛාරකාය සඞ්ඛරණං[7], භවාසවස්ස ලක්ඛණං, අභිනිවෙසො ච පරාමාසො ච දිට්ඨාසවස්ස ලක්ඛණං, අප්පටිවෙධො ච ධම්මෙසු අසම්පජඤ්ඤං ච අවිජ්ජාසවස්ස ලක්ඛණං.

ඉමෙ චත්තාරො ආසවා චත්තාරි උපාදානානි: කාමාසවො කාමුපාදානං, භවාසවො භවුපාදානං, දිට්ඨාසවො දිට්ඨුපාදානං, අවිජ්ජාසවො අත්තවාදුපාදානං, ඉමෙහි චතූහි උපාදානෙහි පඤ්චක්ඛන්ධා.

තත්ථ අවිජ්ජාසවො චිත්තෙ පහාතබ්බො. සො චිත්තෙ චිත්තානුපස්සිස්ස පහීයති, දිට්ඨාසවො ධම්මෙසු පහාතබ්බො, සො ධම්මෙසු ධම්මානුපස්සිස්ස පහීයති. භවාසවො ආසත්තියා පහාතබ්බො, සො වෙදනාසු වෙදනානුපස්සිස්ස පහීයති. කාමාසවො පඤ්චසු කාමගුණෙසු පහාතබ්බො, සො කායෙ කායානුපස්සිස්ස පහීයති.

තත්ථ කායානුපස්සනා දුක්ඛං අරියසච්චං භජති, වෙදනානුපස්සනා පඤ්චන්නං ඉන්ද්‍රියානං පච්චයො, සුඛින්ද්‍රියස්ස දුක්ඛින්ද්‍රියස්ස සොමනස්සින්ද්‍රියස්ස දොමනස්සින්ද්‍රියස්ස උපෙක්ඛින්ද්‍රියස්ස සත්තකිලෙසොපචාරො තෙන සමුදයං භජති, චිත්තෙ චිත්තානුපස්සනා නිරොධං භජති, ධම්මෙසු ධම්මානුපස්සනා මග්ගං භජති.

තෙනස්ස චතූසු ච දස්සනෙන තසොව සබ්බෙ පහීයන්ති යෙන නිද්දිට්ඨා පඨමං "උන්නළානං පමත්තානං තෙසං වඩ්ඪන්ති ආසවා" ජානතො හි පස්සතො ආසවානං ඛයො, දුක්ඛං සමුදයො නිරොධො මග්ගො හි අකුසලා ධම්මා එවං පරියෙසිතබ්බා යාව තස්ස අකුසලස්ස ගති. තතො පටිපක්ඛෙන අකුසලෙ ධම්මෙ පරියෙසති තෙසං කිලෙසානං කාරෙන ආවත්තති. අයං වුච්චති ආවට්ටො හාරො.

1. උණ්ණළානං – PTS. උන්නට්ඨානං – මජසං.
2. කුසලා ධම්මා – PTS.
3. ඔසග්ගස්ස – ම, PTS.
4. අකුසලා ධම්මා – PTS.
5. අලලියනාය – ම.
6. පත්ථනගෙත්ථන – මජසං.
7. සඞ්ඛාරණං – ම.

කෙබඳු ද යත් : "උන්නළානං, පමත්තානං" යන ගාථා යි, මේ කුමකට පදට්ඨාන ද යත් : කුශලධර්මයන්ගේ හැරපීමට යැ, කුශලධර්මයන් හැරපීම වැලිත් කුමකට පදට්ඨාන ද යත් : අකුශලධර්මයන්ගේ සේවනය කිරීමට යැ, (අප්‍රමාදය) කුමකට පදට්ඨාන ද යත් : කුශලධර්මසේවනයට යැ, (ප්‍රමාදය) කුමකට පදට්ඨාන ද යත් : ක්ලෙශවස්තු සෙවනයට යැ මෙසේ ප්‍රමාදය හෙතුකොටගෙන මොහපක්ෂයෙහි වූ දෘෂ්ටිය ද ඡන්දරාග පක්ෂයෙහි වූ අවිද්‍යාව ද වෙයි. එහි තෘෂ්ණාවත් දෘෂ්ටියත් සතර ආශ්‍රවයෝ වෙත්. තෘෂ්ණාව කාමාශ්‍රවය ද භවාශ්‍රවය ද වෙයි. දෘෂ්ටිය දෘෂ්ටි ආශ්‍රවය ද අවිද්‍යාශ්‍රවය ද වේ. එහි චිත්තයෙහි (?) ඇත යන දෘෂ්ටිය චෛතසිකයන්හි නිත්‍ය යයි පඤ්චකාමගුණයන්හි බැසගෙන සිටීමෙන් කාමාශ්‍රවය වෙයි, උපප්‍රාප්තියෙහි ඇලීම භවාශ්‍රවය වේ. එහි රූපකාය කාමාශ්‍රවයට ද භවාශ්‍රවයට ද පදට්ඨාන යැ, නාමකාය දෘෂ්ටිආශ්‍රවයට ද අවිද්‍යාශ්‍රවයට ද පදට්ඨාන යි.

එහි ඇලීමෙන් අධ්‍යාත්මයෙහි බැසගෙන සිටීම කාමාශ්‍රවයන්ගේ ලක්ෂණ යැ, ප්‍රාර්ථනයෙන් ග්‍රන්ථනයෙන් අභිසංස්කාරකායයාගේ සංස්කරණය භවාශ්‍රවයාගේ ලක්ෂණ යැ, අභිනිවෙශය ද පරාමාසය ද දෘෂ්ටිආශ්‍රවයාගේ ලක්ෂණ යැ, ධර්මයන්හි අප්‍රතිවෙධය ද අසම්ප්‍රජන්‍යය ද අවිද්‍යාශ්‍රවයාගේ ලක්ෂණ යි.

මේ සතර ආශ්‍රවයෝ සතර උපාදනයෝ වෙති : කාමාශ්‍රවය කාමොපාදන යැ, භවාශ්‍රවය භවොපාදන යැ, දෘෂ්ටිආශ්‍රවය දෘෂ්ට්‍යුපාදන යැ, අවිද්‍යාශ්‍රවය ආත්මවාදෙපාදන යි. මේ සතර උපාදනයන්ගෙන් පඤ්චස්කන්ධයෝ වෙත්.

එහි අවිද්‍යාශ්‍රවය චිත්තයෙහි ලා ප්‍රහාතව්‍ය යැ, එය චිත්තයෙහි චිත්තානුදර්ශී වූවහුට ප්‍රහීණ වෙයි. දෘෂ්ටිආශ්‍රවය ධර්මවිෂයෙහි ප්‍රහාතව්‍ය යැ, එය ධර්මයන්හි ධර්මානුදර්ශී වූවහුට ප්‍රහීණ වෙයි. භවාශ්‍රවය ආසත්තියෙහි ලා ප්‍රහාතව්‍ය යැ, එය වෙදනාවන්හි වෙදනානුදර්ශී වූවහුට ප්‍රහීණ වෙයි, කාමාශ්‍රවය පස්කම්ගුණයෙහි ලා ප්‍රහාතව්‍ය යැ, එය කයෙහි කායානුදර්ශී වූවහුට ප්‍රහීණ වේ.

එහි කායානුපස්සනාව දුඃඛාර්‍ය්‍යසත්‍යය භජනය කෙරෙයි, වෙදනානුපස්සනාව සුඛින්ද්‍රිය දුක්ඛින්ද්‍රිය සොමනස්සින්ද්‍රිය දෙමනස්සින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය යන පඤ්චෙන්ද්‍රියයන්ට ප්‍රත්‍යය වෙයි, එයින් සප්ත ක්ලේශයන්ගේ උපචාරය සමුදයසත්‍යය භජනය කෙරෙයි. චිත්තයෙහි චිත්තානුපස්සනාව නිරොධසත්‍යය භජනය කෙරෙයි. ධර්මයන්හි ධම්මානුපස්සනාව මාර්ගසත්‍යය භජනය කෙරෙයි.

එහෙයින් සතර සතිපට්ඨානයන්හි ලා චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ දර්ශනයෙන් ඔහුගේ සියලු ආශ්‍රවයෝ ප්‍රහීණ වෙත්. යම්හෙයකින් පළමු කොට "උන්නළානං පමත්තානං තෙසං වඩ්ඪන්ති ආසවා" යනු දක්වන ලද්දී ද එහෙයිනි. (යොනිසොමනසිකාරය) දන්නහුට දක්නහුට මැ ආශ්‍රවක්ෂය වෙයි ... අකුශලධර්මයෝ මෙසේ සෙවියැ යුත්තාහ. අකුශලයාගේ ගති (පැවැත්ම) යම්තාක් වේ ද එපරිද්දෙනි. ඊට ප්‍රතිපක්ෂ විසින් අකුශල ධර්මයන් පර්‍ය්‍යෙෂණ කෙරෙයි. ඒ ක්ලේශයන් මේ හාරයෙන් ආවර්තන කෙරෙයි. මේ ආවට්ට හාර යී කියනු ලැබෙ.

එවං සුතතාපි ධමමා පරියෙසිතබබා. අකුසලධමෙම ආවටෙටතවා[1]. තතථ ආවටටසස හාරසස අයං භූමි : සතිඋපටඨානා ච විපලලාසා ච චතතාරි ඤාණානි සකකායසමුපපාද[2]ගාමිනී ච පටිපදා සකකාය-නිරොධගාමිනී පටිපදා.

8. තතථ කතමො විභතති හාරො :

යං කිඤචි විභජජබයාකරණීයං වුචචති විභතති හාරො, යථා කිං ආගනතවා ච පුන පුගගලො හොති, නො වාගතං න පරිභාසති[3] පරිපුචඡතාය පටඨාය අතියනං[4] එකසස කිඤචි[5]. අයං වුචචතෙ විභතතිහාරො.

9. තතථ කතමො පරිවතතනො හාරො :

යං කිඤචි පටිපකඛනිදෙදසො, අයං වුචචති පරිවතතනො, හාරො, යථාවුතතං භගවතා : "සමමාදිටඨිකසස පුරිසපුගගලසස මිචඡාදිටඨි නිජජිණණා හොති"ති විතථාරෙන සබබානි මගගඞගානි. අයං වුචචතෙ පරිවතතනො හාරො.

10. තතථ කතමො වෙවචනො හාරො :

14. වෙවචනෙහි අනෙකෙහි - එකං ධමමං පකාසිතං,
සුතෙත යො ජානාති[7] සුතතවිදූ - වෙවචනො නාම සො හාරො

යථා ආයසමා සාරිපුතෙතා එකමහි වතථුමහි වෙවචනෙන නානා-සුතෙතන[8], භගවතා පසංසිතො "මහාපඤඤො සාරිපුතෙතා හාසපඤඤො ජවනපඤඤො"ති, ඉදං පඤඤාය වෙවචනං:

යථා ච මගගවිභඞෙග නියයානටෙඨා එකමෙකං මගගඞගං වෙවචනෙහි නිදදිටඨං. එවං අවිජජාය වෙවචනා[9]. එකං අකුසලමූලං තදෙව සනතං තෙසු තෙසු ජනපදෙසු තෙන තෙන පජානනති. න හි අනෙන තදෙවපි ආලපියනති[10] අඤඤං භජති[11] 'සබබකාමජහසස භිකඛුනො'ති කාමා ආලපිතා. "යසස නිතතිණණො පඞකො"ති[12] තෙ යෙව කාමෙ පඞකාති[13] ආලපති "සුණමානසස පුරෙතරං රජ"නති[14] තෙයෙව කාමෙ 'රජ'නති ආලපති, එවං සුතතමහි යො ධමමො දෙසියති තසස පරියෙටඨි "කතමසස ධමමසස ඉදං නාමං, කතමසස ඉදං වෙවචන"නති. සබබඤඤු හි යෙසං යෙසං යා නිරුතති හොති, යථා ගාමී තෙන තෙන දෙසෙතීති තසස වෙවචනං පරියෙසිතබබං. අයං වෙවචනො හාරො.

---

1. ආගමිසස - PTS.
2. සමුපපාදය - ම, PTS.
3. නො වා න පරිභාසති - PTS.
4. පඤහායති යං - PTS.
5. න එසා කිඤචි - PTS,
6. පරිවතතනා - PTS.
7. යොජනාති - PTS.
8. නානාවුතෙතන - PTS.
9. වෙවචනං - PTS.
10. ආලයනති - PTS.
11. භජති - මජසං.
12. සඞකාති - ම, PTS.
13. සඞකාති - ම. PTS.
14. රජජනති - ම. PTS.

මෙසේ අකුශලධර්මයන් ආවර්තන කොට කුශලධර්මයෝ ද සෙවියැ යුත්තාහ. එහි ආවට්ටහාරයට මේ භූමි යැ : සතර සතිපට්ඨානයෝ ද සතර විපල්ලාසයෝ ද සතර මාර්ගඥනයෝ ද සක්කායසමුප්පාදගාමිනී පටිපදව ද සක්කායනිරොධගාමිනී පටිපදව ද යන මේ ධර්මයෝ යි.

8. එහි විභක්තිහාරය කවරෙ යැ :

විභාග කොට ප්‍රකාශ කළයුතු (කුශලාදි භෙද වූ ධර්ම යැ විශෙෂාධිගමයට කාරණ වූ පදට්ඨාන යැ පෘථග්ජනාදි භූමි යැ යන) යම් කිසි ධර්මයක් ඇද්ද මේ විභක්ති හාර යයි කියනු ලැබෙ. කුමක් මෙන් ද යත් : (ආගන්ත්වා ද–?) මේ විභක්තිහාර යයි කියනු ලැබෙ.

9. එහි පරිවර්තනහාර කවර :

යම් කිසි ප්‍රතිපක්ෂ වශයෙන් නිර්දේශයෙක් ඇද්ද, මේ පරිවර්තනහාර යයි කියනු ලැබෙ. ''සම්‍යග්දෘෂ්ටි ඇති පුහුල් හට මිත්‍ථ්‍යාදෘෂ්ටිය (විදර්ශනා සම්‍යග්දෘෂ්ටියෙන් විෂ්කම්භිතව මාර්ගසම්‍යග් දෘෂ්ටියෙන් සමුච්ඡින්නව) ප්‍රහීණ වේ'' යයි විස්තරයෙන් සියලු මාර්ගාංගයෝ දක්විය යුත්තාහ. මේ පරිවර්තනහාර යී කියනු ලැබෙ.

10. එහි වෙවචනහාරය කවර :

14. සූත්‍ර දන්නාවූ යමෙක් සූත්‍රයෙහි නොයෙක් වෙවචනයන්ගෙන් ප්‍රකාශ කරනලද එක් ධර්මයක් දනගනී ද, ඒ හාරය තෙමේ වෙවචන නම් වේ.

ඒ මෙසේ යැ, ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ එක් වස්තුයෙක්හි ලා භාග්‍යවතුන් විසින් වෙවචන වූ නානාසූත්‍රයෙන් පසස්නා ලදහ. ''ශාරිපුත්‍ර මහාපඤ්ඤ යැ හාසපඤ්ඤ යැ ජවන පඤ්ඤ යැ'' යි මේ ප්‍රඥවට වෙවචන යි.

තවද මාර්ග විභංගයෙහි නිර්යාණාර්ථ වූ එකෙකි මාර්ගංගය වෙවචනයන්ගෙන් දක්වන ලදි. අවිද්‍යාවෙවචනයෝ ද එසේ යැ. එක් අකුශලමූලයක් එය මැ වූයේ ඒ ඒ ජනපදයන්හි ඒ ඒ නාමයෙන් දනැගනිත්. මේ නාමයෙන් මෙය මැ නො කියත්, අනෙකක් වෙයි. ''සබ්බකාමජහස්ස භික්ඛුනො'' යී කාමයෝ කියන ලද්දහ. ''යස්ස නිත්තිණ්ණො පඞ්කො ''යී ඒ කාමයන් මැ ''පඞ්ක'' යී පවසයි. ''සුණමානස්ස පුරෙතරං රජං ''යී ඒ කාමයන් මැ ''රජං'' යි පවසයි. මෙසේ සූත්‍රයෙහි ලා යම් දහමෙක් දෙසනු ලැබෙ ද, ''කවර දහමකට මේ නාමය වේ ද කවරකට මේ වෙවචනය වේ ද'යී ඒ නාමයාගේ පර්යෙෂණය වේ. සර්වඥයන් වහන්සේ වනාහි යම් යම් දහමකට යම් නිරුක්තියක් වේ ද ඒ ඒ වචනයෙන් දෙශනා කරනසේක් නුයි ඒ ධර්මයාගේ මේ වචනය සෙවියැ යුත්තේ යි. මේ වෙවචනහාර යි.

### 11. තත්ථ කතමො පඤ්ඤත්ති හාරො:

"චත්තාරි අරියසච්චානී"ති සුත්තං නිද්දිසති, නික්ඛෙපපඤ්ඤත්තියා[1]; සමුදයපඤ්ඤත්ති. 'කබලිඞ්කාරෙ[2] චෙ භික්ඛවෙ ආහාරෙ අත්ථි රාගො අත්ථි නන්දි, අත්ථි තණ්හා, පතිට්ඨිතං. තත්ථ විඤ්ඤාණං, -පෙ- පභව.[3] පඤ්ඤත්තිං පඤ්ඤපෙති. "කබලිඞ්කාරෙ ආහාරෙ නත්ථි රාගො -පෙ- සමුග්ඝාතං පඤ්ඤපෙති.[4]

"තස්ස කාමාසවාපි චිත්තං විමුච්චති, භවාසවාපි චිත්තං විමුච්චති, අවිජ්ජාසවාපි චිත්තං විමුච්චතී"ති පහානපඤ්ඤත්තිං පඤ්ඤපෙති. "තණ්හා යස්ස පුරක්ඛතා පඤ්ඤු පරිවත්තතී" ගාථා මනාපපඤ්ඤත්තිං පඤ්ඤපෙති. එවං පන මනාපපඤ්ඤත්තීති එතං ධම්මං භගවා පඤ්ඤපෙති. න හි තණ්හා දුක්ඛසමුදයොති කත්වා[5] සබ්බත්ථ තණ්හාසමුදයො නිද්දිසිතබ්බො. යථා: "උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙතී"ති පටික්ඛෙපපඤ්ඤත්ති.

එවං සබ්බෙසං ධම්මානං කුසලානඤ්ච අකුසලානඤ්ච යං චස්ස ධම්මක්ඛෙත්තං භවති, සො චෙව ධම්මො තත්ථ පවත්තති, තදවසිට්ඨා ධම්මා තස්සානුවත්තකා හොන්ති, සා දුවිධා පඤ්ඤත්ති: පරාධීනපඤ්ඤත්ති ච සාධීනපඤ්ඤත්ති ච. කතමා සාධීනපඤ්ඤත්ති: "සමාධිං භික්ඛවෙ භාවෙථ සමාහිතො භික්ඛවෙ භික්ඛු යථාභූතං පජානාති. "රූපං අනිච්ච"න්ති යථාභූතං පජානාති, අයං සාධීනපඤ්ඤත්ති පරාධීනපඤ්ඤත්ති ච, සා පඤ්ඤත්ති පඤ්ඤාය ච සීලස්ස ච.

යථා චත්තාරි ඣානානි භාවෙථ, තස්ස අත්ථි සමාධින්ද්‍රියං, මුද්ධති චත්තාරි ඉන්ද්‍රියානි තානි චතුපරාධීනානි, තීණි අවෙච්චප්පසාදෙහි පරාධීනං සමාධින්ද්‍රියං චත්තාරි ඉන්ද්‍රියානි පරාධීනානි චතූසු අරියසච්චෙසු අපරාධීනං පඤ්ඤින්ද්‍රියං සතිපට්ඨානෙසු සම්මප්පධානෙසු විරියින්ද්‍රියං. ඉති සකෙ පදට්ඨානෙ සකෙ ඛෙත්තසාධීනො සො ධම්මො, සො ච තත්ථ පඤ්ඤපෙතබ්බො. තස්ස පටිපක්ඛා නිඝාතො නිද්දිසිතබ්බො. එත්ථායං අනෙකාකාරපඤ්ඤත්ති කෙන කාරණෙන අයං ධම්මො පඤ්ඤත්තොනාති. අයං වුච්චතෙ පඤ්ඤත්ති හාරො.

### 12. තත්ථ කතමො ඔතරණො හාරො:

ඡසු ධම්මෙසු ඔතාරෙතබ්බං, කතමෙසු ඡසු: ඛන්ධෙසු ධාතූසු ආයතනෙසු ඉන්ද්‍රියෙසු සච්චෙසු පටිච්චසමුප්පාදෙසු. නත්ථි තං සුත්තං වා ගාථා වා බ්‍යාකරණං වා ඉමෙසං[7] ඡන්නං ධම්මානං අඤ්ඤතරස්මිං න සන්දිස්සති. එත්තාවතා එසා සබ්බා දෙසනා යා[8] තා ඛන්ධා වා ධාතුයො වා ආයතනානි වා ඉන්ද්‍රියානි වා සච්චානි වා පටිච්ච. සමුප්පාදො වා.

---

1. පඤ්ඤත්තියා – මජ්සං.
2. කබළිඞ්කාරෙ – ම, PTS.
3. පරභාව – PTS.
4. සමුග්ඝාති පඤ්ඤත්ති – ම, PTS.
5. කාරෙත්වා – ම,
6. ඔතරණො – PTS.
7. ඉමෙසු – ම, PTS.
8. දෙසනාස – PTS.

11. එහි පඤ්ඤත්තිහාරය කවරැ :

''චත්තාරි අරිය සච්චානි'' යන සූත්‍රය නිර්දෙශ කෙරෙයි. මේ නික්ෂෙප ප්‍රඥප්තියෙන් සමුදය (ප්‍රභව) ප්‍රඥප්ති යැ. ''මහණෙනි ඉදින් කවලීකාරාහාරයෙහි රාගය ඇද්ද (ගෙහ සිත සොම්නස වූ) නන්දිය ඇද්ද තෘෂ්ණා ඇද්ද එහි ප්‍රතිසන්ධිවිඥානය පිහිටියේ වෙයි ... (මෙහි) ප්‍රභව ප්‍රඥප්තිය පනවනසේක. කවලීකාරාහාරයෙහි රාගය නැද්ද ... මෙහි සමුද්ඝාතය පනවනසේක.

''ඔහුගේ සිත කාමාස්‍රවයෙන් ද මිදෙයි, භවාස්‍රවයෙනුදු සිත මිදෙයි, අවිද්‍යාස්‍රවයෙනුදු සිත මිදේ''යි ප්‍රහාණ ප්‍රඥප්තිය පනවනසේක. ''යමක්හු විසින් තෘෂ්ණාව පුරස්කෘත ද (ඔහුගේ) ප්‍රඥාව පිරිහෙයි'' යන ගාථායෙන් මනාපප්‍රඥප්තිය පනවනසේක. මෙසේ වැළිත් ''මනාපපඤ්ඤත්ති'යි බුදුහු එක් ධර්මයක් පනවන සේක. තණ්හාව දුක්ඛ සමුදයයි කොට සියලු තන්හි තෘෂ්ණාව සමුදය යි නො මැ දක්වියැ යුත්තේ යැ. ඒ මෙසේ යැ : ''උපන් කාමවිතර්කය නො ඉවසයි. දුරු කෙරෙයි, බැහැර කෙරෙයි'' යනු පටික්ඛෙපපඤ්ඤත්ති යි.

මෙසේ කුශලවූත් අකුශලවූත් සියලු ධර්මයන්ගේ ද ඒ ධර්මයාගේ යම් ධර්මක්ෂෙත්‍ර යෙකුත් වේ ද ඒ ධර්මයත් එහි පවතී, එයින් අවශිෂ්ට වූ ධර්මයෝ ඊට අනුවර්තක වූවාහු වෙත්. ඒ ප්‍රඥප්තිය පරාධීනප්‍රඥප්ති ද ස්වාධීනප්‍රඥප්ති දැයි ද්විවිධ වන්නීය : ''මහණෙනි සමාධිය වඩවු, මහණෙනි, සමාහිත වූ මහණ යථාභූත වැ දැනගනී, රූපය අනිත්‍ය යැයි යථාභූත වැ (ඇති සැටියෙන්) දැනගනී'' මේ ස්වාධීන ප්‍රඥප්ති ද පරාධීන ප්‍රඥප්ති ද වෙයි. ඕ ප්‍රඥාවගේ ද ශීලයාගේ ද ප්‍රඥප්ති වේ.

ඒ මෙසේ යැ, සතර ධ්‍යානයන් වඩවු. (මෙහි සිට පඤ්ඤත්තිහාරය අවසානය දක්වා වාක්‍යය ව්‍යාකූලය ?) මේ පඤ්ඤත්තිහාර යයි කියනු ලැබේ.

12. එහි ඔතරණහාරය කවරැ :

ධර්ම සයෙක අවතරණය කටයුතු යැ, කවර ධර්ම සයෙකැ යත් : ස්කන්ධ ධාතු ආයතන ඉන්ද්‍රිය සත්‍ය පටිච්චසමුප්පාද යන ධර්ම සයෙහි යැ. මේ ධර්මයන් සදෙනා අතුරෙන් එක්තරා ධර්ම යෙක්හි (යම් සූත්‍රාදියක්) නො දක්නා ලැබේ නම් එබඳු සූත්‍රයක් හෝ ගාථාවක් හෝ වෙය්‍යාකරණයක් හෝ නැත. ස්කන්ධ යැ ධාතු යැ ආයතන යැ ඉන්ද්‍රිය යැ සත්‍ය යැ පටිච්චසමුප්පාදය හෝ යම් දේශනාවක් ඇද්ද ඒ සියලු දෙශනා මෙතෙක් මැ යි. (?)

තත්ථ පඤ්චන්නං ඛන්ධානං වෙදනාක්ඛන්ධො රාගදොසමොහානං පදට්ඨානං. තත්ථ තිස්සො වෙදනායො, තත්ථ[1] සුඛාය වෙදනාය සොමනස්සො සවිචාරො, දුක්ඛාය වෙදනාය දොමනස්සො සවිචාරො, අදුක්ඛමසුඛාය වෙදනාය උපෙක්ඛා සවිචාරා.

යා පුන තත්ථ වෙදයිතං ඉදං දුක්ඛසච්චං, ඛන්ධෙසු සඞ්ඛාරක්ඛන්ධො. තත්ථ කායො පමත්තානං සඋපවත්තනති, තඤ්ච සඞ්ඛාරගතං[2]. ද්විධා ච භවඞ්ගානුසරණං කම්මං, තීණි ච සඞ්ඛාරානි පුඤ්ඤාභිසඞ්ඛාරා වා අපුඤ්ඤා වා ආනෙඤ්ජා වා හෙතු, සබ්බං සරාගස්ස නො වීතරාගස්ස දෙසස්ස, අභිසඞ්ඛාරානි ච අවීතරාගො චෙතෙති ච පකප්පෙති ච, වීතරාගො පන චෙතෙති ච නො අභිසඞ්ඛරොති, යං උණ්හං වජිරං කාවෙඨ වා, රුක්ඛෙ වා, අඤ්ඤත්ථ වා, පතන්තං භින්දති ච දහති[3] ච, එවං සරාගො චෙතනා[4] චෙතෙති ච අභිසඞ්ඛරොති ච යථා සීතං[5] වජිරං න භින්දති න ච දහති[6], එවං වීතරාගො චෙතනා[7] චෙතෙති න ච අභිසඞ්ඛරොති[8] තත්ථ පඤ්චන්නං ඛන්ධානං එකො ඛන්ධො අනින්ද්‍රියසරීරං සඤ්ඤාක්ඛන්ධො.

තත්ථ ධාතූනං, අට්ඨාරස ධාතුයො, තත්ථ යා රූපී දස ධාතුයො තාසු දෙසියමානාසු රූපක්ඛන්ධො නිද්දිසිතබ්බො, දුක්ඛං අරියසච්චං. යෙපි ච ඡ විඤ්ඤාණකායා මනොධාතුසත්තමා, තත්ථ විඤ්ඤාණක්ඛන්ධො ච නිද්දිසිතබ්බො, දුක්ඛං අරියසච්චං. ධම්මධාතු පන ධම්මසමොසරණායො ධම්මො හෙතුනා ච නිස්සන්දෙන ච ඵලෙන ච කිච්චෙන ච වෙවචනෙන ච යෙන යෙන උපලබ්භති, තෙන තෙන නිද්දිසිතබ්බො. යදි වා කුසලා යදි වා අකුසලා යදි වා අබ්‍යාකතා යදි වා අසඞ්ඛතා. ආදසන්නං ආයතනානං දස ආයතනානි රූපානි තං දුක්ඛං අරියසච්චං නිද්දිසිතබ්බං. රූපක්ඛන්ධො ච මනායතනඤ්ච විඤ්ඤාණක්ඛන්ධෙන නිද්දිසිතබ්බං, දුක්ඛං අරියසච්චං. ධම්මායතනං නානාධම්මසමොසරණං.

තත්ථ යෙ ධම්මා ඉන්ද්‍රියානං ඉන්ද්‍රියෙසු නිද්දිසිතබ්බා. යෙ අනින්ද්‍රියානං අනින්ද්‍රියෙසු නිද්දිසිතබ්බා, පරියායතො ච ඔතාරෙතබ්බා. යථා යා ධම්මධාතු තථා ධම්මායතනං පරියෙසිතබ්බං. යා යෙව හි ධම්මධාතු තදෙව ධම්මායතනං අනූනං අනධිකං.

තත්ථ පටිච්චසමුප්පාදෙ අත්ථි තිවිධො, අත්ථි චතුබ්බිධො, අත්ථි දුවිධො. තත්ථ තිවිධො පටිච්චසමුප්පාදො: හෙතු ඵලං නිස්සන්දො. අවිජ්ජා සඞ්ඛාරා තණ්හා උපාදානං ච අයං හෙතු, විඤ්ඤාණං නාමරූපං සළායතනං[9] ඵස්සො වෙදනා ච අයං පච්චයො, යො භවො, අයං විපාකො. යා ජාති මරණං අයං නිස්සන්දො.

---

1 තස්ස - ම, PTS.
2. ගතො - ම, PTS.
3. තෙසු - මජසං.
4. සරාගචෙතනා - ම.
5. සතං - ම, PTS.
6. ඔහති - ම, PTS.
7. වීතරාගචෙතනා - ම, PTS.
8. අභිසංඛාරෙති - ම.
9. සට්ඨායතනං - මජසං.

එහි පඤ්චස්කන්ධයන් අතුරෙන් වෙදනාස්කන්ධය රාග දෙස මොහයන්ට පදට්ඨාන යැ, එහි තුන් වෙදනායෙකි, එහි සුඛවෙදනාවට විචාර සහිත වූ සොම්නස වෙයි, දුක්ඛවෙදනාවට සවිචාර වූ දෙම්නස වෙයි, අදුක්ඛමසුඛවෙදනාවට සවිචාර වූ උපෙක්ෂා වෙයි.

යළි එහි යම් වෙදයිතයෙක් ඇද්ද මේ දුඃඛසත්‍ය යැ, ස්කන්ධයන් කෙරෙහි සංස්කාර ස්කන්ධය වෙයි, එහි ශය ප්‍රමත්ත වූවහු සමග පවතී (?) ඒ සංඛාරගතය ද දෙපරිද්දෙකින් භවඞ්ගොතරණ කර්මය වෙයි. සංස්කාරයෝ ද තිදෙනෙකි : පුඤ්ඤාභිසංඛාරයෝ ද අපුඤ්ඤාභිසංඛාරයෝ ද අනෙඤ්ජාභිසංඛාරයෝ දැයි. සියල්ල සරාගයාහටයැ, වීතරාගයා හට හෙතු නොවේ. (දෙසස්ස ...?) අවීතරාග වූයේ සිතන්නේ ද කරන්නේ ද වෙයි. වීතරාග වැලිත් සිතන්නේ ද වෙයි. අභිසංඛරණය නො කෙරෙයි. යම්සේ උෂ්ණ වූ වජ්‍රය කාෂ්ටයෙකැ හෝ වෘක්ෂයෙකැ හෝ අන් තැනෙක හෝ වැටෙනුයේ බිඳිනේත් දවන්නේත් වේ ද, එසෙයින් සරාග වූයේ චෙතනා සිතන්නේත්, කර්ම රැස් කරන්නේත් වෙයි. යම්සේ සීත වූ වජ්‍රය (කාෂ්ටාදිය) නො බිඳි ද නො ද දවාද, එසෙයින් වීතරාග වූයේ සිතිවිලි සිතයි, නො ද අභිසංස්කාර වේ යයි. එහි පඤ්චස්කන්ධයන් අතුරෙන් එක් ස්කන්ධයෙක් අනින්ද්‍රියශරීර යැ, සංඥස්කන්ධ යි.

එහි ධාතුහු (?) අටළොස් ධාතුහු වෙති, එහි යම් රූපී වූ දස ධාතු කෙනෙක් වෙත් ද ඔවුන් දෙසනු ලබන කල්හි රූපස්කන්ධය දක්වියයුතු යැ, එය දුඃඛායතිසත්‍යය වෙයි, මනොධාතුව සත්වැනි කොට ඇති යම් ෂඩ්විඥනකාය කෙනෙක් ඇද්ද එහි විඥනස්කන්ධය ද දුඃඛායතිසත්‍යය ද දක්වියයුතු යැ, ධර්මධාතුව වැලිත් ධර්මයන්ගේ සමොසරණයෙකි. යම් ධර්මයෙක් හෙතුයෙන් ද නිෂ්‍යන්දයෙන් ද ඵලයෙන් ද කෘත්‍යයෙන් ද වෙවචනයෙන් ද යම් යම් ධර්මයෙකින් ලැබේ ද ඒ ඒ ධර්මයෙන් දක්වියැයුත්තේ යැ, ඉදින් කුශල හෝ අකුශල හෝ අව්‍යාකෘත හෝ අසංඛතධාතු හෝ යි. දෙළොස් ආයතනයන් අතුරෙන් රූපී දසආයතනයෝ දුඃඛායතිසත්‍ය යයි දක්වියැයුතු යැ. රූපස්කන්ධය ද මනායතනය ද විඥනස්කන්ධයෙන් දක්වියැයුතු යැ, එය දුඃඛායතිසත්‍යය වෙයි, ධම්මායතනය නානා ධර්මයන්ගේ සමොසරණ යි.

එහි ඉන්ද්‍රියයන් අතුරෙන් යම් ධර්ම කෙනෙක් ඉන්ද්‍රියයන්හි ලා දක්වියයුත්තාහු ද අනින්ද්‍රියයන් අතුරෙන් යම් ධර්ම කෙනෙක් අනින්ද්‍රියයන්හි ලා දක්වියැයුත්තාහු ද (ඔහු) පරියාය වශයෙන් ද අවතරණය කටයුත්තාහු ය. යම් ධර්මධාතුවක් යම්සේ ද ඒපරිද්දෙන් ධර්මායතනය ද සෙවියැයුතු යැ. එසේ මැ ය, යම් මැ ධර්මධාතුවක් ඇද්ද එය මැ අනූන වූ අනධික වූ ධර්මායතනය වේ.

එහි පටිච්චසමුප්පාදය ත්‍රිවිධ වූයේ ඇත. චතුර්විධ වූයේ ඇත, ද්විවිධ වූයේ ඇති. එහි පටිච්චසමුප්පාදය හෙතු යැ ඵල යැ නිෂ්‍යන්ද යයි ත්‍රිවිධ වෙයි. අවිජ්ජා සංඛාර තණ්හා උපාදාන ද යන මේ හෙතු යැ විඤ්ඤාණ යැ නාමරූප යැ ඡට්ඨායතන යැ ඵස්ස යැ වෙදනා ද යන මේ ප්‍රත්‍ය යැ, යම් භවයෙක් ඇද්ද මේ විපාක යැ, යම් ජාතියක් මරණයක් වේ ද මේ නිස්සන්ද යි,

තත්ථ චතුබ්බිධො: හෙතු පච්චයො විපාකො නිස්සන්දො ච අවිජ්ජා ච තණ්හා ච සඞ්ඛාරා ච උපාදානං ච අයං හෙතු, විඤ්ඤාණං නාමරූපස්ස පච්චයො, නාමරූපං උප්පජ්ජති. තථා උප්පන්නස්ස සළායතනං[1]. ඵස්සො වෙදනා ච අයං පච්චයො. යො භවො අයං විපාකො. යා ජාති යා ච ජරාමරණං අයං නිස්සන්දො.

තත්ථ දුවිධො පටිච්චසමුප්පාදො: අවිජ්ජා සඞ්ඛාරා තණ්හා උපාදානං අයං සමුදයො, විඤ්ඤාණං නාමරූපං සළායතනං[1] ඵස්සො වෙදනා භවො ජාති මරණං ච, ඉදං දුක්ඛං. යං පන අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො, ඉමානි තප්පටිපක්ඛෙන ද්වෙ සච්චානි. තස්මා පටිච්චසමුප්පාදො යෙන ආකාරෙන නිද්දිට්ඨො, තෙන තෙන නිද්දිසිතබ්බො.

තථා බාවීසති ඉන්ද්‍රියානි: අට්ඨාදස ඉන්ද්‍රියානි චක්ඛුන්ද්‍රියාති චක්ඛුන්ද්‍රියං යෙන දොමනස්සින්ද්‍රියං, ඉදං දුක්ඛං. පුරිසින්ද්‍රියං ච දිට්ඨියා ච තණ්හා පදට්ඨානං. යතො පුරිසො පුරිසකාමං තං එවං කාතබ්බතා. අථ අජ්ඣත්තං සාරජ්ජති. අයං අහඞ්කාරො තං යථා[2] සාරත්තො බහිද්ධා පරියෙසති, අයං මමඞ්කාරො[3] එවං ඉති, තත්ථ සුඛින්ද්‍රියං ච සොමනස්සින්ද්‍රියං ච පුරිසින්ද්‍රියස්සානුවත්තකා හොන්ති. තස්ස අධිප්පායපරිපූරණා ලොභධම්මා කුසලමූලෙ පවඩ්ඪෙන්ති තස්ස චෙ අයමධිප්පායො න පාරිපූරිං ගච්ඡති. තස්ස දුක්ඛින්ද්‍රියං ච දොමනස්සින්ද්‍රියං ච වත්තන්ති, දොසො ච අකුසලමූලං පවඩ්ඪති සචෙ පන උපෙක්ඛං[4] භාවෙති උපෙක්ඛින්ද්‍රියස්ස අනුවත්තකො[5] භවති. අමොහො ච කුසලමූලං පවඩ්ඪති. ඉති සත්ත ඉන්ද්‍රියානි කිලෙසවත්ථුමුපාදාය අනපෙක්ඛමානි අවමානි සබ්බස්ස වෙදනා ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං.

තත්ථ අට්ඨ ඉන්ද්‍රියානි සද්ධින්ද්‍රියං යාව අඤ්ඤාතාවිනො ඉන්ද්‍රියං, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා, දසන්නං පඤ්චින්ද්‍රියානං කාමරාගස්ස පදට්ඨානං. මනින්ද්‍රියං භවරාගස්ස පදට්ඨානං, පඤ්චින්ද්‍රියානි රූපරාගස්ස පදට්ඨානං. ඉත්ථින්ද්‍රියං ච පුරිසින්ද්‍රියං ච සත්තපඤ්ඤත්තියා පදට්ඨානං. තත්ථ යෙන යෙන ඉන්ද්‍රියෙන යුත්තං වා ගාථාය ඔතාරෙතුං සක්කොති තෙන තෙන නිද්දිසිතබ්බො. එවං ඛන්ධෙසු ධාතූසු ආයතනෙසු සච්චෙසු පටිච්චසමුප්පාදෙසු. අයං ඔතරණො හාරො.

13. තත්ථ කතමො සොධනො හාරො:

තයො ගාථා[6] එතෙන ආරම්භෙන භාසියන්ති[7]; තත්ථ එකිස්සා භාසිතාය අවසිට්ඨාසු ආභාසිතාසු[8] සො අත්ථො න නිද්දිසිතබ්බො. කිං කාරණං: න හි තාව සො අත්ථො භාසිතො, සො ආභාසිතො න සක්කා නිද්දිසිතුං. යථා කිං: "අප්පමාදො අමතපදන්ති[9] ගාථා අයමෙතා ගාථා න නිද්දිසිතබ්බා,[10] කිං කාරණං: අපි තාව[11] ඉමස්ස ආරම්භස්ස අභාසිතං:

1 සට්ඨායතනං - මජසං.
2. යසා - ම.
3. මමංකාරො - ම.
4. උපෙක්ඛා - ම, PTS.
5. අනුවත්තකාමා - ම, PTS.
6. යො ගාථා - ම, PTS.
7. ආරම්භා භාසිස්සන්ති - ම, PTS.
8. භාසිතාසු - ම, PTS.
9. අමතං පදන්ති - ම, PTS.
10. නිද්දිසිතබ්බා - ම, PTS.
11. අපික්ඛාතාව - ම, PTS.

කිසෙයින් චතුර්විධ වෙයි යත් : හෙතු යැ ප්‍රත්‍ය යැ විපාක යැ නිෂ්‍යන්ද යැයි චතුර්විධ යි. අවිජ්ජා තණ්හා සංඛාර උපාදන ද යන මේ හේතු යැ, විඤ්ඤාණය නාම රූපයට ප්‍රත්‍යය වෙයි, (විඤ්ඤාණයෙන්) නාමරූපය උපදී, එසේ උපන්නහුට ෂඩායතනය ද ඵස්සය ද වෙදනා ද යන මේ ප්‍රත්‍යය වෙයි. යම් භවයෙක් ඇද්ද මේ විපාක යැ, යම් ජාතියක් යම් ජරාමරණයකුත් ඇද්ද මේ නිෂ්‍යන්ද යි.

කිසෙයින් පටිච්චසමුප්පාදය ද්විවිධ වෙයි යත් : අවිජ්ජා සංඛාර තණ්හා උපාදන යන මේ සමුදය යැ, විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වෙදනා භව ජාති මරණ ද යන මේ දුඃඛ යැ. යළි අවිද්‍යා නිරොධයෙන් සංඛාරනිරොධය වෙයි. ( මෙසේ ) තත්ප්‍රතිපක්ෂ ත්‍වයෙන් මේ සත්‍යයෝ දෙදෙන වෙති. එහෙයින් පටිච්චසමුප්පාදය යම් අයුරෙකින් වදරන ලදද ඒ ඒ අයුරින් දක්වියැයුත්තේ යි.

එසෙයින් දෙවියි ඉන්ද්‍රියයෝ, වෙති : (ද්වාදස ... එවං ඉත්ථි ? මෙ ද ව්‍යාකූල තැනෙකි.) එහි සුඛින්ද්‍රිය ද සොමනස්සින්ද්‍රිය ද පුරිසින්ද්‍රියට අනුවර්තක වෙති. ඔහුට අධ්‍යාශය පරිපූර්ණ වූ ලොභධර්මයෝ කුශලමූලයන් වර්ධනය කෙරෙති. ඉදින් ඔහුගේ මේ අධ්‍යාශය පිරිමට නොයේ නම්, ඔහුට දුක්ඛින්ද්‍රිය ද දෙමනස්සින්ද්‍රිය ද පවතී, දෙස අකුසලමූලය ද වැඩෙයි. ඉදින් වැලිත් උපෙක්ෂාව වඩා නම්, උපෙක්ඛින්ද්‍රියට අනුවර්තක වේ නම් අමොහකුසලමූලය ද වඩයි. (ඉති සත්තඉන්ද්‍රියානි ... මෙ ද ශුද්ධවියයුතු තැනෙකි.

එහි ඉන්ද්‍රියයෝ අටදෙනෙක් වෙති : සද්ධින්ද්‍රිය පටන් අඤ්ඤාතාවින්ද්‍රිය දක්වා යි. මේ දුක්ඛනිරොධගාමිනිපටිපද යැ, දසවැදෑරුම් පඤ්ඤින්ද්‍රියයන් අතුරෙන් (?) කාම රාගයට පදට්ඨාන යැ, මනින්ද්‍රිය භවරාගයට පදට්ඨාන යැ, පඤ්ඤින්ද්‍රියයෝ (?) රූප රාගයට පදට්ඨාන යැ, ඉත්ථින්ද්‍රිය ද පුරිසින්ද්‍රිය ද සත්වප්‍රඥප්තියට පදට්ඨාන යැ, එහි යම් යම් ඉන්ද්‍රියයෙකින් යුක්ත වූයේ හෝ ගාථායෙන් අවතරණය කරන්නට හැකි වූයේ නම් ඒ ඒ ඉන්ද්‍රියයෙන් දක්වියැයුත්තේ යි. මෙසේ ස්කන්ධ ධාතු ආයතන සත්‍යය පටිච්චසමුප්පාදයන්හි අවතරණය කටයුත්තේ යි. මේ ඔතරණහාර යි.

13. **එහි සොධනහාර කවර :**

ගාථා තුනක් එක් ආරම්භයෙකින් වදරනු ලැබෙත්. එහි එක් ගාථාවක් වදළ කල්හි සෙසු ගාථා නො වදළ කල්හි (ගාථායෙහි) ඒ අර්ථය නොදක්වියැයුතු යැ, කරුණු කිම යත් : එතෙක් ඒ අර්ථය නො වදළ හෙයිනි. ඒ නො වදළ අර්ථය දක්වන්නට නො හැක්ක. ඒ කිසේ යැ : ''අප්පමාදෙ අමතපදං'' යන ගාථාව යැ, මේ එක ගාථාව නො දක්වියයුත්ති යැ, කරුණු කිම ප්‍රත් : මේ ආරම්භයාගේ නො වදරන ලද අර්ථයෙක් ඇත :

15. 'එතං විසෙසතො ඤත්වා – අප්පමාදම්හි පණ්ඩිතා,
අප්පමාදෙ පමොදන්ති – අරියානං ගොචරෙ රතා'ති.

ඉදං අභාසිතං ඉමිස්සාපි ගාථාය භාසිතාය අත්ථො න නිද්දිසිතබ්බො.[1] කිං කාරණං: අත්ථි තත්ථ අවසිට්ඨං: "තෙ ඣායිනො සාතතිකා නිච්චං දළ්හපරක්කමා"ති ගාථා, එවං ඉමා ගාථායො යදා උපධාරිතා[2] භවන්ති, තදා අත්ථො නිද්දිසිතබ්බො.

එවං අස්සුතපුබ්බෙසු සුත්තෙසු බ්‍යාකරණෙසු වා එකුද්දෙසො භාසිතො. යා වීමංසා තුලනා ඉදං අත්ථි කිච්චං, ඉදං සුත්තං භාසිතං තස්ස වෙවචනං නිද්දිට්ඨං වා න වා'ති. තත්ථ යා වීමංසා, අයං වුච්චතෙ සොධනො හාරො.

14. තත්ථ කතමො අධිට්ඨානො හාරො:

එකත්තතා ච වෙමත්තතා ච. තත්ථ කතපඤ්ඤත්ති ච කිච්චපඤ්ඤත්ති ච සා එකත්තතා ච වෙමත්තතා ච යථා පඤ්ඤත්ති, එතෙ වෙවචනෙන[4] වෙමත්තතා, (?) පජානාතීති පඤ්ඤා, සා ච ආධිපතෙය්‍යට්ඨෙන පඤ්ඤත්ති. යං අනොමත්තියට්ඨෙන පඤ්ඤත්තං,[5] තං අකම්පියට්ඨෙන[6] පඤ්ඤාබලං. තදුභූතා ගොචරත්තවසා සෙව සති තීසු රතනෙසු අනුස්සති බුද්ධානුස්සති ධම්මානුස්සති සඞ්ඝානුස්සති අවිපරීතානුස්සරණතාය සම්මාදිට්ඨිධම්මානං පච්චයෙන ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො අභිනීහාරතො අභිඤ්ඤාති. සබ්බෙපෙත මග්ගා තා වත්ථු අවිකොපනතාය එකත්තා, යථා උණ්හෙන සංසට්ඨං උණ්හොදකං, සීතෙන සංසට්ඨං සීතොදකං, ඛාරොදකං ගුළොදකන්ති, ඉදං එකත්තතා වෙමත්තතා ච.

අත්ථි පුන ධම්මො නානාධම්මසඞ්ගතො[7] එකත්තතා,[8] යථා රූපං චතාරො දස්සෙතබ්බා[9] තං ච රූපන්ති එකත්තතා, පඨවීධාතු[10] ආපො – තෙජො – වායොධාතූති වෙමත්තතා. එවං සබ්බා චතස්සො ධාතුයො. රූපන්ති එකත්තතා, පඨවීධාතු ආපො – තෙජො – වායොධාතූති වෙමත්තතා. පඨවීධාතූති ලක්ඛණතො එකත්තතා, සංකිණ්ණවත්ථුතො වෙමත්තතා. යං කිඤ්චි කක්ඛළ ලක්ඛණං සබ්බං තං පඨවීධාතූති. එකත්තතා, කෙසා ලොමා නඛා දන්තා ඡවි චම්මන්ති වෙමත්තතා, එවං සබ්බා[11] චතස්සො ධාතුයො, රූපන්ති එකත්තං, සද්ද ගන්ධා රසා ඵොට්ඨබ්බාති වෙමත්තතා.

අත්ථි පුන ධම්මො වෙමත්තතා අඤ්ඤං[12] නාමං ලභති, යථා කායානුපස්සනාය නව සඤ්ඤා විනීලකසඤ්ඤා උද්ධුමාතකසඤ්ඤා, අයං අසුභසඤ්ඤා, යා එකත්තතා අරම්මණතො වෙමත්තතා, (සා

1. නිද්දිසිතබ්බො – ම. PTS.
2. උපධාරිතා යදා – ම. PTS.
3 { කිතපඤ්ඤත්ති – ම. / පඤ්ඤත්ති – PTS.
4 එකවෙවචනෙන – ම.
5. පඤ්ඤත්තන්ති – ම, PTS.
6. අනොමිත්තියට්ඨෙන – ම, PTS.
7. සංඝතො – ම, PTS.
8. එකතො – ම, PTS.
9. වාරෙතබ්බා – ම, PTS
10. පඨවීධාතු – ම, PTS.
11. සබ්බං – ම, PTS.
12. අඤ්ඤ ම, PTS.

15. "ප්‍රාඥ වූ පණ්ඩිතයෝ අප්‍රමාදයෙහි තෙල (ප්‍රමත්තයාහට සසර වටින් නිස්සරණයෙක් නැත, අප්‍රමත්තයාහට ඇත යන) විශෙෂය වෙසෙසින් දන අප්‍රමාදයෙන් සතුටු වෙති, ඔහු බුද්ධාදි ආර්‍ය්‍යයන්ට ගොචර වූ සතර සිවටන් ආදි ධර්මයෙහි ඇලුණහු වෙති" යන—

මෙය අභායිත යැ, මේ ගාථාව වදළ කල්හි දූ අර්ථය නො දක්වියැ යුතු යැ. කරුණු කිම යත් : එහි අවශිෂ්ටයෙක් ඇත :

"තෙ ඣායිනො සාතතිකා නිච්චං දළ්හපරක්කමා" යන ගාථාව යැ. මෙසේ මේ ගාථාවෝ යම් විටෙක විමසන ලද්දහු වෙත් ද එකල්හි අර්ථය දක්වියැයුත්තේ යි.

මෙසේ නො ඇසූවිරූ සූත්‍රයන්හි හෝ වෙය්‍යාකරණයන්හි හෝ එක් උද්දෙසයක් කියනලද්දේ ය, (එහි) යම් විමංසාවක් තුලනාවක් ඇද්ද, මේ කිස ඇත. (?) මේ සූත්‍රය භාසිත යැ. ඒ සූත්‍රයාගේ වෙවචනය දක්වන ලද හෝ නො දක්වන ලද හෝ දූයි එහි යම් විමංසාවක් ඇද්ද, මේ සොධනහාර යයි කියනු ලැබේ.

14. එහි **අධිට්ඨානහාර** කවරැ :

එකත්තතා සංඛ්‍යාත සාමාන්‍යය ද වෙමත්තතා සංඛ්‍යාත විශෙෂය ද වෙයි. එහි කෘතප්‍රඥප්ති ද කෘත්‍යප්‍රඥප්ති ද වෙයි. (සා එකත්තතා ව ... ? මෙද ව්‍යාකුල තැනෙකි.) ප්‍රකර්ෂයෙන් දනගනී නුයි පඤ්ඤා නමු. එ ද අධිපතිභාවාර්ථයෙන් "පඤ්ඤත්ති" නමු. (යං අනොමත්තියට්ඨෙන ?) පඤ්ඤත්ත නම් වේ ද, එය අවිද්‍යාවෙන් කම්පා නොවන අර්ථයෙන් පඤ්ඤාබල නම් වෙයි. (තනුභූතා ගොචරත්තවසා ?) ඒ සතිය මැ රත්නත්‍රයෙහි පුනපුනා පැවැතීම් වශයෙන් අනුස්සති" නම් වේ. අවිපරීත ව සිහිකිරීම් වශයෙන් බුද්ධානුස්සති ධම්මානුස්සති සංඝානුස්සති නම් වේ. සම්‍යග්දෘෂ්ටිධර්මයන් ප්‍රකාරයෙන් විමසීමෙන් ධම්මවිචය සබ්බොජ්ඣඞ්ග වෙයි, අභිනිහාර වශයෙන් අභිඤ්ඤා වේ යයි. (සඞ්ඛෙපෙන මග්ගා කා ?) වස්තූන්ගේ අවිකොපනතායෙන් එකත්වය වේ. ඒ මෙසේ යැ : උෂ්ණය හා සංසෘෂ්ට වූයේ උණෙහාදක යැ, සීතය හා සංසෘෂ්ට වූයේ සීතොදක යැ, ක්ෂාරොදක යැ ගුඩොදක යැ යන මේ එකත්තතා ද වෙමත්තතා ද වෙයි.

යළි ධර්මයෙක් නානාධර්මයන් හා සංගත වූයේ එකත්තතායෙක් ඇත. ඒ මෙසේ යැ: රූපය චතුර්විධ කොට දක්වියයුතු යැ, එද 'රූප යනු එකත්තතා යැ, පඨවීධාතු ආපො–තෙජො–වායොධාතු යනු වෙමත්තතා යි. සියලු සතර ධාතුහු මෙසේ යි. "රූපං' යනු එකත්තතා යැ, පඨවී ධාතු ආපො– තොජො– වායොධාතු වෙමත්තතා යැ, 'පඨවීධාතු' යනු ලක්ෂණ විසින් එකත්තතා යැ, සංකීර්ණවස්තු විසින් වෙමත්තතා යි. "යං කිඤ්චි කක්ඛළලක්ඛණං සබ්බං තං පඨවීධාතු" යනු එකත්තතා යැ, "කෙසා ලොමා නඛා දන්තා ජචි චම්මං" යනු වෙමත්තතා යි. සියලු සතර ධාතුහු මෙසේ යි. 'රූපං' යනු එකත්තතා යැ, 'සද්ද ගන්ධා රසා ඵොට්ඨබ්බා" යනු වෙමත්තතා යි.

යළි වෙමත්තතා ධර්මයෙක් ඇත : එය අන් නාමයක් ලබයි, ඒ මෙසේ යැ කායානුපස්සනායෙහි නව සංඥයෙකි : විනීලකසඤ්ඤා උද්ධුමාතකසඤ්ඤා ... මේ අශුභ සංඥ යැ, යම් එකත්තතාවක් ආලම්බන හෙයින් වෙමත්තා වේ ද, එය මෙසේ සඤ්ඤා

එවං සඤ්ඤා වෙදනාසු ආදීනවං සමනුපස්සතො කථංධිට්ඨානං සමාධින්ද්‍රියං ච සායෙව ධම්මෙසු තත්‍ථ සඤ්ඤාභාවිතා වීරියින්ද්‍රියං ච ධම්මෙසු ධම්මානුපස්සනා චිත්තෙ චිත්තසඤ්ඤං පජහතො පඤ්ඤින්ද්‍රියං ච චිත්තෙ චිත්තානුපස්සනා? ඉති යො කොචි ඤාණුප්පචාරො[1] සබ්බසො පඤ්ඤාය ගොචරො. පඤ්ඤා, අයං වෙමත්තතා, යථා කාමරාගො භවරාගො දිට්ඨිරාගොති වෙමත්තතා තණ්හාය. ඉති යං එකත්තතාය ච වෙමත්තතාය ච ඤාණං වීමංසනා තුලනා, අයං අධිට්ඨානො[2] හාරො.

### 15. තත්‍ථ කතමො පරික්ඛාරො හාරො:

සහෙතු සප්පච්චයං වොදානං ච සංකිලෙසො ච, යං තදුභයං පරියෙට්ඨි ස පරික්ඛාරො හාරො. ඉති ධම්මානං සහෙතුකානං හෙතු පරියෙසිතබ්බා, සප්පච්චයානං පච්චයො පරියෙසිතබ්බා.

තත්‍ථ කිං නානාකරණං හෙතුස්ස ච පච්චයස්ස ච: සභාවො හෙතු, පරභාවො පච්චයො පරභාවස්ස පච්චයො හෙතුපි, සභාවස්ස හෙතු (යා?) පරභාවස්ස තස්සවි පච්චයො. අවුත්තො හෙතු, වුත්තො පච්චයො. අජ්ඣත්තිකො හෙතු බාහිරො පච්චයො. සභාවො හෙතු පරභාවො පච්චයො. නිබ්බත්තකො හෙතු පරිග්ගාහකො[3] පච්චයො. නෙවාසිකො හෙතු, ආගන්තුකො පච්චයො. අසාධාරණො හෙතු, සාධාරණො පච්චයො. එකො යෙව හෙතු, අපරාපරො පච්චයො.

හෙතුස්ස උපකරණං සමුද්දෙනතබ්බං[4]: සමුද්දනං හෙතු, තත්‍ථ දුවිධො හෙතු දුවිධො පච්චයො: සමනන්තරපච්චයො ච පරම්පරපච්චයො ච. හෙතුපි දුවිධො: සමනන්තරහෙතු ච පරම්පරහෙතු ච. තත්‍ථ කතමො පරම්පරපච්චයො: අවිජ්ජා නාමරූපස්ස පරම්පරපච්චයො. විඤ්ඤාණං සමනන්තරපච්චයතාය පච්චයො. යදි ආදිම්හි අවිජ්ජානිරොධො භවති නාමරූපස්ස නිරොධොපි, තත්‍ථ සමනන්තරං කිං කාරණං පරම්පරපච්චයො සමනන්තරපච්චයො සමුද්දිතො[5] අයං පච්චයතො. තත්‍ථ කතමො පරම්පරහෙතු: විජානන්තස්ස පරම්පරහෙතුතාය හෙතු, අඤ්ඤාකාරෙ සමනන්තරහෙතුතාය හෙතු යස්ස හි යං සමනන්තරං නිබ්බත්තති, සො තස්ස හෙතුපි ජාතිනිරොධා බහි ආකාරනිරොධො, ආහාරනිරොධා දණ්ඩනිරොධො, දණ්ඩනිරොධා ඛණ්ඩනිරොධො. එවා හෙතුපි ද්විධා සො නානි පස්සිතබ්බා (?)

පටිච්චසමුප්පාදෙ යථා අවිජ්ජාපච්චයො තස්ස පුන කිං පච්චයො: අයොනිසොමනසිකාරො, සො තස්ස පච්චයො සඞ්ඛාරානං, ඉති පච්චයො ච සමුප්පන්නං ච. තත්‍ථ කො හෙතු: අවිජ්ජායෙව. තථා හි පුරිමා කොටි න පඤ්ඤායති, තත්‍ථ අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානස්ස හෙතු, පුරිමා හෙතු පච්ඡා පච්චයො, සාපි අවිජ්ජා සඞ්ඛාරානං පච්චයො චතූහි කාරණෙහි: සහජාතපච්චයතාය සමනන්තරපච්චයතාය අභිසන්දනපච්චයතාය පතිට්ඨානපච්චයතාය.

---

1. ඤාණපචාරො – ම, PTS.
2. තුලනායම්ධිට්ඨානො – PTS.
3. පටිග්ගාහකො – ම, PTS.
4. සමුද්දෙනතබ්බා – ම.
5. සමුද්දිතො – ම

වෙදනාවන්හි ආදීනව දක්නහුට (සා එවං ... චිත්තානුපස්සනා ?) මෙසේ යම් කිසි ඤාණූපචාරයෙක් ඇද්ද එය සර්වප්‍රකාරයෙන් ප්‍රඥාවට ගොචර වෙයි. මේ වෙමත්තතා යි. ඒ මෙසේ යැ: කාමරාග යැ භවරාග යැ දිට්ඨිරාග යැ යන මේ තණ්හාවට වෙමත්තතා යි. මෙසේ එකත්තතා පිළිබඳ වූ ද වෙමත්තතා පිළිබඳ වූ ද යම් ඥානයක් වීමංසනාවක් තුලනාවක් වේ දූ මේ අධිට්ඨානහාර නම් වේ.

15. එහි පරික්ඛාරහාරය කවරැ :

සහෙතු සප්‍රත්‍යය වූ ව්‍යවදනය ද සංක්ලෙශය ද වෙයි, ඒ වොදන සංකිලෙස දෙක පිළිබඳ යම් පයෙෘිෂණයෙක් වේ ද, එය පරික්ඛාරහාර නම් වේ. මෙසේ සහෙතුක වූ සියලු ධර්මයන්ගේ හේතුව සෙවියැයුතු යැ, සප්‍රත්‍යයධර්මයන්ගේ ප්‍රත්‍යය සෙවියැයුත්තේ යි.

එහි හේතුහුගේ ද ප්‍රත්‍යයාගේ විශෙෂය කවරැ : සමානභාවය හේතු යැ, එයින් අන්‍යභාවය ප්‍රත්‍යය යැ, පර (අන්‍ය) භාවයට හේතුව ද ප්‍රත්‍යය වෙයි, සභාව හේතුව කිසියම් පරභාවයකට ප්‍රත්‍යය වෙයි, නො කියන ලද්දේ හේතු යැ. කියන ලද්දේ ප්‍රත්‍ය යැ. ආධ්‍යාත්මික වූයේ හේතු යැ, බාහිර වූයේ ප්‍රත්‍ය යැ. සමානභාවය හේතු යැ, අන්‍යභාවය ප්‍රත්‍ය යැ. නිපද වනුයේ හේතු යැ, පරිග්‍රාහක වූයේ ප්‍රත්‍ය යැ. නෙවාසික වූයේ හේතු යැ, ආගන්තක වූයේ ප්‍රත්‍ය යැ. අසාධාරණ වූයේ හේතු යැ, සාධාරණ වූයේ ප්‍රත්‍ය යැ. එකලා වූයේ හේතු යැ, අපරාපර වූයේ ප්‍රත්‍යය යි.

හේතුහුගේ උපකරණය එළැවියැයුතු යැ, සමුදනය හේතු යි. එහි හේතුව ද්විවිධ යැ, ප්‍රත්‍යය ද්විවිධ යැ, සමනන්තරහෙතුව ද පරම්පරහෙතුව ද ද්විවිධ හේතු යි. එහි පරම්පර ප්‍රත්‍යය කවරෙ යත් : අවිද්‍යාව නාමරූපයට පරම්පරප්‍රත්‍යය වෙයි. විඤ්ඤාණය සමනන් තර ප්‍රත්‍යයභාවයෙන් ප්‍රත්‍යය වෙයි. ඉදින් ආදියෙහි අවිද්‍යානිරොධය වේ නම් නාම රූපයාගේ නිරොධයත් වෙයි. එහි සමන්තරප්‍රත්‍යය කවර කරුණෙකින් පරම්පරප්‍රත්‍යයත් සමනන්තරප්‍රත්‍යයත් එළවනලද ද (අයං පච්චයො ... සො තාහි පස්සිතබ්බො ?)

පටිච්චසමුප්පාදය මෙසේ යැ : අවිද්‍යාව ප්‍රත්‍යයධර්මයෙකි. ඒ අවිද්‍යාප්‍රත්‍යයට වැලිත් කුමක් ප්‍රත්‍යය වේ ද : අයෝනිසොමනසිකාරය යි. හේ කවරක්හට ප්‍රත්‍යය වේ ද, සංස්කාරයන්ට ප්‍රත්‍යය වෙයි. මෙසේ ප්‍රත්‍යය ද ප්‍රත්‍යයසමුත්පන්නය ද වෙයි, ඒ අවිද්‍යා ප්‍රත්‍යයට හේතු කවරෙ යැ : අවිද්‍යාව මැ යි. ඒ එසේ මැ ය : (අවිද්‍යාවගේ) පූර්වකෙළවර නො පැනෙයි. එහි අවිද්‍යානුශය අවිජ්ජාපරියුට්ඨානයට හේතු යි, හේතුව පූර්ව වෙයි. ප්‍රත්‍යය පසුව වේ. ඒ අවිද්‍යාව ද සංස්කාරයන්ට සතර කාරණයෙකින් ප්‍රත්‍යය වෙයි : සහජාත ප්‍රත්‍යභාවයෙන් සමනන්තරප්‍රත්‍යතායෙන් අභිසන්දනප්‍රත්‍යතායෙන් පතිට්ඨාන ප්‍රත්‍යතායෙන් යන සතර කරුණෙනි.

කථං සහජාතපච්චයතාය අවිජ්ජා සඞ්ඛාරානං පච්චයො: යං චිත්තං රාගපරියුට්ඨිතං[1] – තත්‍ථ අවිජ්ජාපරියුට්ඨානෙන සබ්බං පඤ්ඤාය ගොචරං හනති. තත්‍ථ සඞ්ඛාරාති පච්චයට්ඨිතා අධිභූමිකාර-මහත්තස්ස (?) අයං අවිජ්ජා සහසමුප්පන්නානං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලතං ආපජ්ජන්ති චතූහි කාරණෙහි පඤ්ඤා පහීයති. කතමෙහි චතූහි: අනුසයො පරියුට්ඨානං සංයොජනං උපාදානං. තත්‍ථ අනුසයො පරියුට්ඨානං ජනෙති[2] පරියුට්ඨිතා සංයුජ්ජති සංයුත්තා උපාදියති, උපාදානපච්චයා භවො. (එවං තෙ සඞ්ඛාරා තිවිධා උප්පන්නා භූමිගතා නාසඤ්ඤත්‍ථ අයං මග්ගෙන විනීතත්තායාති තෙ ථාමගතා අප්පටිවිනීතාතිපි තෙ සඞ්ඛාරාති වුච්චති. එවං සහෙතු සමුප්පන්නට්ඨෙන අපිමෙව[3] පච්චයා සඞ්ඛාරානං පච්චයො නිද්දිට්ඨං අපනෙත්වා කුසලං අකුසලං කුසලෙ ච අකුසලෙ ච පකප්පිතබ්බො. විපාකධම්මා අපනෙත්වා වචනීයං අවචනීයං වචනීයං ච අවචනීයං ච පකප්පිතබ්බං භව . . . ?) සබ්බසුත්තං පරිකප්පිතබ්බං.

දස තථාගතබලානි චත්තාරි වෙසාරජ්ජානි පුඤ්ඤානි අනඤ්ඤාතං, අවිජ්ජා සමනන්තරපච්චයතාය සඞ්ඛාරානං පච්චයො. යෙන චිත්තෙන සහ සමුප්පන්නා අවිජ්ජා තස්ස චිත්තස්ස සමනන්තරචිත්තං සමුප්පන්නානන්ති තස්ස යං සමනන්තරචිත්තං සමුප්පන්නානන්ති, තස්ස පච්ඡිමස්ස චිත්තස්ස පුරිමචිත්තං හෙතුපච්චයතාය පච්චයො. තෙන අවිජ්ජා හෙතු, තෙන චිත්තෙන උපාදානං අනොකාසකතං ඤාණං න උප්පජ්ජති, යා තස්ස අප්පමාද ධාතු අභිජ්ඣාභිසඤ්ඤිතා තහිං විපල්ලාසා උප්පජ්ජන්ති: 'අසුභෙ සුභන්ති, දුක්ඛෙ සුඛ'න්ති. තත්‍ථ සඞ්ඛාරා උප්පජ්ජන්ති රත්තා දුට්ඨා මූළ්හස්ස[4] චෙතනා රාගපරියුට්ඨානෙන බ්‍යාපාදපරියුට්ඨානෙන අවිජ්ජාපරියුට්ඨානෙන දිට්ඨිවිපල්ලාසො චතුන්නිද්දෙසෙ නිද්දිසිතබ්බො. යං විපරීතචිත්තො විජානාති අයං චිත්තවිපල්ලාසො. යා විපරීතසඤ්ඤා උපගණ්හාති[5] අයං සඤ්ඤාවිපල්ලාසො. යං විපරීතදිට්ඨි අභිනිවිසති අයං දිට්ඨිවිපල්ලාසො.

අට්ඨ මිච්ඡත්තානි වඩ්ඪන්ති තීණි අකුසලානි, අයොනිසො-මනසිකාරෙ උප්පන්නං විඤ්ඤාණං ච විජ්ජං ච කරොන්ති. ඉති පුබ්බාපරෙන අකුසලානන්තරීකරෙ [?] සඞ්ඛාරා වුද්ධිං වෙපුල්ලං ගච්ඡන්ති. තෙ ච මහන්තා ච අප්පටිවිදිතා පොනොභවිකා සඞ්ඛාරා භවන්ති. ඉති එවං අවිජ්ජා සහජාතපච්චයතාය සඞ්ඛාරානං පච්චයො සමනන්තරපච්චයතාය ච.

කථං අභිසන්දනාකාරෙන අවිජ්ජා සඞ්ඛාරානං පච්චයො: සා අවිජ්ජා තෙ සඞ්ඛාරෙ අභිසන්දෙති පරිප්ඵරති. සෙය්‍යථාපි නාම උප්පලං වා පදුමං වා තං උදකෙ වඩ්ඪං අස්ස, සීතෙන වාරිනා අභිසන්නං පරිසන්දනං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජති එවං අභිසන්දනට්ඨෙන අවිජ්ජා සඞ්ඛාරානං පච්චයො.

1. පරියුට්ඨං – ම, PTS.
2. ජාති – ම, PTS.
3. අපිමෙව – ම
4. මූලස්ස – ම, PTS.
5. උපගණ්හාති – ම.

කියෙයින් සහජාතප්‍රත්‍යතාෙයන් අවිද්‍යාව සංස්කාරයන්ට ප්‍රත්‍යය වෙයි යත් : යම් සිතක් රාගයෙන් මඩනා ලද ද, එහි අවිජ්ජා පරියුට්ඨානය හේතු කොට ගෙන සියලු ප්‍රඥාගොචරය නසයි. (තත්ථ සංඛාරා ......?) මේ අවිද්‍යාව එක්ව උපන් ධර්මය සමග වෘද්ධියට වැඩීමට විපුල බවට පැමිණෙන්නී සතර කරුණෙකින් ප්‍රඥාව ප්‍රහීණ කෙරෙයි කවර සතරෙකින යත් ; අනුශය යැ පරියුට්ඨාන යැ සංයොජන යැ උපාදන යැ යන සතරෙනි. එහි අනුසය පරියුටඨානය උපදවයි පරියුටඨාන වූවා සංයුක්ත වෙයි, සංයුක්ත වූවා උපාදනය කෙරෙහි, උපාදන ප්‍රත්‍යයෙන් භවය වේ. (එවං තේ......... සබ්බයුත්තං නික්ඛිපිතබ්බං ? මේ වාක්‍ය ප්‍රදේශය ද, ව්‍යාකූලය)

තථාගත බලයෝ දසදෙනෙකි, වෛසාරද්‍යයෝ සතර දෙනෙකි. (පුඤ්ඤානි අභාඤ්ඤ-කතං ?) අවිද්‍යාව සමනන්තර ප්‍රත්‍යභාවයෙන් සංස්කාරයන්ට ප්‍රත්‍යය වෙයි, යම් සිතක් සමඟ උපන් අවිද්‍යාව ඒ සිතට සමනන්තරව සිතක් උපන් නුයි ඒ සිතට සමනන්තරව යම් සිතක් උපන් නුයි ඒ පශ්චිම චිත්තයට පූර්ව චිත්තය හේතු ප්‍රත්‍යතාෙයන් ප්‍රත්‍යය වෙයි. එහෙයිනුත් අවිද්‍යාව, හේතු යි. ඒ සිතින් උපාදනව අවකාස නො කරන ලද ඥානය නූපදී. ඔහුගේ යම් අප්‍රමාද ධාතුවක් අභිධ්‍යායෙන් යුක්ත වූ ද, එහි අශුභයෙහි ශුභ යැ දුඃඛයෙහි සුඛ යැ යන විපයඝාසයෝ උපදිත්. එහි රාගයෙන් රත්වූ, ද්වෙශයෙන් දුෂ්ට වූ සංස්කාරයෝ උපදිත්. මෝහයෙන් මූඪ වූවහුගේ චෙතනාව රාගපරියුටඨානයෙන්, ව්‍යාපාදපරියුට්-ඨානයෙන්, අවිද්‍යා පරියුට්ඨානයෙන් දිට්ඨි විපල්ලාසය වස්තු නිර්දේශයෙහි ලා දක්වියැ යුතු යැ. විපරීත සිත් ඇතියේ යමක් දනගනී ද මේ චිත්ත විපල්ලාස යැ, යම් විපරීත සංඥාවක් ගනී ද මේ සඤ්ඤාවිපල්ලාස යැ, යම් විපරීත දෘෂ්ටියකට බැසගනී ද මේ දිට්ඨිවිපල්ලාස යි.

අවවැදූරුම් මිච්ඡත්තයෝ තුන් අකුශලයන් වඩත්. අයොනිසො මනසිකාරයෙහි උපන් විඤ්ඤාණය ද විද්‍යාව ද, කෙරෙත් (ද) ඉතිපුබ්බා පරන්තෙ...... සංඛාරා භවන්ති ?)

මෙසේ අවිද්‍යාව සහජාත ප්‍රත්‍යභාවයෙන් ද සමනන්තර ප්‍රත්‍යභාවයෙන් ද සංස්කාර යන්ට ප්‍රත්‍යය වේ.

කි සෙයින්, අභිසන්දනාකාරයෙන් අවිද්‍යාව සංස්කාරයන්ව ප්‍රත්‍යය වෙයි යත් : ඒ අවිද්‍යාව, ඒ සංස්කාරයන් අභිසන්දනය කෙරෙයි, පැතිරගෙන සිටී, යම් සේ උපුලක් හෝ පියුමක් හෝ උදකයෙහි වැඩෙනුයේ සිහිල් දියෙන් තෙත්වූයේ හාත් පසින් තෙත්වූයේ වෘද්ධියට වැඩීමට විපුල බවට පැමිණේ ද, එපරිද්දෙන් අභිසන්දනාර්ථයෙන් අවිද්‍යාව සංස්කාරයන්ට ප්‍රත්‍යය වේ.

කථං පතිට්ඨානට්ඨෙන අවිජ්ජා සඞ්ඛාරානං පච්චයො: තෙ සඞ්ඛාරා අවිජ්ජං[1] නිස්සාය වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං[2] ආපජ්ජන්ති. සෙය්‍යථාපි නාම උප්පලං වා පදුමං වා පඨවිං නිස්සාය පයිට්ඨිතං[3]. පතිට්ඨාය වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජති, එතෙ සඞ්ඛාරා අවිජ්ජං නිස්සාය අවිජ්ජාය[4] පතිට්ඨිතා වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ගච්ඡන්ති. එවං පතිට්ඨානට්ඨෙන අවිජ්ජා සඞ්ඛාරානං පච්චයො.

පුන රාගසහගතස්ස කම්මස්ස විපාකෙන පටිසන්ධිම්හි භවො නිබ්බත්තන්ති, තං කම්මස්ස[5] සබ්බං අභිනිව්වට්ටං අඤ්ඤාණවසෙන පොනොභවිකා[6] සඞ්ඛාරාති වුච්චන්ති, එවම්පි අවිජ්ජාපච්චයා සඞ්ඛාරා අත්ථි. පුන පඤ්චසු යෙ ච සෙඛා[7] පුග්ගලා, යෙ ච අසඤ්ඤසමාපත්තිං සමාපන්නා, යෙ ච භවග්ගතා, යෙ ච අනෙනාගතායෙව සංසෙදජා, යෙ ච වා පන අඤ්ඤෙ හි කොචි අනාගාමිභූතා න චෙතෙන්ති න ච පත්ථෙන්ති, තෙසං කිං පච්චයා සඞ්ඛාරා පුන රාගා අත්ථි තෙසං සඞ්ඛාරානි උප්පාදනානි චිත්තමනුස්සරන්තියෙව අවිපක්කවිපාකසමූහතා අසමුච්ඡින්නපච්චයා තෙසං පුන ච ගතො භවති.

එවම්පි හි අවිජ්ජාපච්චයා සඞ්ඛාරා. පුන සා තෙ න උප්පාදනා නපි සඞ්ඛාරා, අත්ථි පුන තෙසං සන්තා අනුසයා අසමූහතා අසමුච්ඡින්නා, තදාරම්මණං භවති, විඤ්ඤාණස්ස පතිට්ඨාය විඤ්ඤාණපච්චයා නාම-රූපං. එවම්පි අවිජ්ජාපච්චයා සඞ්ඛාරා.

පුන සා[8] යං කිඤ්චි කම්මං ආචයගාමි, සබ්බං තං අවිජ්ජාවසෙන අභිසඞ්ඛරීයති තණ්හාවසෙන ච අල්ලීයති. අඤ්ඤාණවසෙන ච තත්ථ ආදීනවම්පි න ජානාති තදෙව විඤ්ඤාණබීජං භවති. සායෙව තණ්හාසිනෙහො භවති. සායෙව අවිජ්ජා සම්මොහෙති. එවම්පි අවිජ්ජාපච්චයා සඞ්ඛාරා වත්තබ්බා. ඉති ඉමෙහි ආකාරෙහි අවිජ්ජා-සඞ්ඛාරානං පච්චයො.

තත්ථ අවිජ්ජාය හෙතු අයොනිසො මනසිකාරො පච්චයො හොති, තත්ථ අවිච්ඡෙදො[9], අයං තත්ථ තතියං බලං නිවත්ති, අයං පටිසන්ධි තත්ථ පුනබ්භවො, යො අවිච්ඡෙදො[10] අසමුග්ඝාතනට්ඨෙන අයං අනුසයො, යථා පතාකං[11] වා සාටකං වා (ද්වෙ ජනා පීඨෙසු ච එකා වා බලං වා අස්ස නිවාචයෙසු, න පන පීඨෙසු සොසෙය්‍ය, තත්ථ යං සිනෙහා ආපොධාතු අනුපුබ්බෙන සොසෙතබ්බා. උණ්හ-ධාතුමාගම්ම සචෙ පුන තං ආකාසෙ නික්ඛිපෙය්‍ය තං උස්සාවෙන යෙභුය්‍යතරං සිනෙහමාගවෙසෙය්‍ය, න හි අනාගම්ම තෙජොධාතුං පරිසොසං[12] ගවෙසෙය්‍ය. එවමෙව භවග්ගපරමාපි සමාපත්ති න අනුරූපස්ස සමුග්ඝාතාය සංවත්තන්ති. තෙ හි ආලසන්ති සම්මසන්ති, න ච තණ්හාය තණ්හාපහානං ගච්ඡන්ති?)

---

1. අවිජ්ජායං – ම.
2. වෙපුල්ලතං – ම, PTS.
3. පඨවිං – ම, PTS.
4. අවිජ්ජායං – ම, PTS.
5. කාමස්ස – PTS.
6. පොනබ්භවිකා – PTS-
7. සෙක්ඛා – ම, PTS.
8. පන සා – PTS.
9. අභිච්ඡෙදො – ම, PTS.
10. අවෙච්ඡෙදො – ම, PTS.
11. පටකං – PTS.; පටාකං – ම.
12. පරිසෙසං – ම.

කී සෙයින් පතිට්ඨානාර්ථයෙන් අවිද්‍යාව සංස්කාරයන්ට ප්‍රත්‍යය වේ ද යත්: ඒ සංස්කාරයෝ අවිද්‍යාව නිසා වෘද්ධියට වැඩීමට විපුල බවට පැමිණෙති. යම් පරිදි උපුලක් හෝ පියුමක් හෝ පඨවිය නිසා පඨවියෙහි පිහිටා වෘද්ධියට වැඩීමට විපුලබවට පැමිණේ ද, එපරිදි තෙල සංස්කාරයෝ අවිද්‍යාව නිසා අවිද්‍යාවෙහි පිහිටියාහු වෘද්ධියට වැඩීමට විපුලබවට පැමිණෙත්. මෙසේ පතිට්ඨානාර්ථයෙන් අවිද්‍යාව සංස්කාරයන්ට ප්‍රත්‍යය වේ.

යළි රාගසහගත කර්මයාගේ විපාකයෙන් ප්‍රති සන්ධියෙහි ලා භවය උපදී, ඒ සියල්ල නොදනීම් වශයෙන් කර්මයට පිවිසියේ වෙයි, (ඔහු) පුනර්භවය ඇති කරන සංස්කාරයෝ යයි කියනු ලැබෙත්. මෙසේ ත් අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ ඇත. යළි (පඤ්චසු?) යම් ශෛක්ෂ පුද්ගල කෙනෙක් වෙත් ද යම් අසංඥී සමාපත්තියට සමවන්නා හු වෙත් ද, භවගත වූ යම් කෙනෙකුත් වෙත් ද, අන්තොගත වූ මැ සංසෙදජ වූ යම් කෙනෙකුත් වෙත් ද, (යෙ ච වා පන අඤ්ඤාභි, කොචි ?) අනාගාමී වූවා හු චෙතනා නො කෙරෙති ප්‍රාර්ථනා නො කෙරෙත්. ඔවුනට සංස්කාරයෝ කුමක් ප්‍රත්‍යය කොට ඇත්තා හු ද, ( යළි රාගය හේතු කොට ගන-අත්ථා නෙසං ගතො භවති ?)

මෙසේ මැ අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති. (පුන සා ?) ඔහු උපාදනයෝ නො වෙති, සංස්කාරයෝ නො ද වෙත්. යළි ඔවුනට සත් අනුශයයෝ නො නසන ලද්දාහු අසමුච්ඡින්න වූවාහු ඇත, විඥනයාගේ පිහිටීමට එය අරමුණු වෙයි. විඥාන ප්‍රත්‍යයෙන් නාමරූපය වෙයි, මෙසේත් අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙත්.

නැවත ඒ අවිද්‍යාව ආචයගාමී වූ යම් කිසි කර්මයක් ඇද්ද ඒ සියල්ල අවිද්‍යා වශයෙන් රැස් කරනු ලැබෙයි. තෘෂ්ණා වශයෙන් ඇලෙයි, නො දනීම් වශයෙන් එහි ආදීනව ද නො දනී, එය මැ ප්‍රතිසන්ධි විඥනයට බීජ වෙයි. ඒ අවිද්‍යාව මැ තෘෂ්ණාවට සෙනහ වෙයි. ඒ අවිද්‍යාව මැ සම්මොහ වේ යයි. මෙසේත් අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ කියයුත්තාහු යැ. මෙසේ මේ ආකාරයෙන් අවිද්‍යාව සංස්කාරයන්ට ප්‍රත්‍යය වේ.

එහි අවිද්‍යාව හේතු යැ, අයොනිසොමනසිකාරය ප්‍රත්‍ය වේ. එහි අව්ච්ඡෙදය වෙයි, මේ එහි තුන් වැනි බලය (නිවත්ති ?) මේ පටිසන්ධි යැ, එහි පුනර්භවය වෙයි, අසමුද්ඝාතාර්ථයෙන් නො සිඳී පැවැත්මෙක් වේ ද, මේ අනුශය යි, යම්සේ පතාකයක් හෝ සළුවක් හෝ (දේවජනා...... තණ්හාපහානං ගමජන්ති ?–මුළු වාක්‍යයම විපරීත ව ව්‍යාකුලව ඇත.)

තත්ථ සො අසමූහතානො අවිජ්ජාය අනුසයො ච චිත්තස්ස සම්පලිබොධො, ඉදං පරියුට්ඨානං. යථාභූතං විඤ්ඤාණස්ස අප්පටිවෙධො අයං අවිජ්ජාසවො, අවිජ්ජා විඤ්ඤාණබීජං භවති. යං බීජං සො හෙතු න සමුච්ඡිජ්ජති, අසමුච්ඡිජ්ජන්තො පටිසන්දහති, පටිසන්දහන්තො න සමුග්ඝාතං ගච්ඡති. අසමුග්ඝාතං චිත්තං පරියොනහති, පරියොනද්ධචිත්තො යථාභූතං නප්පජානාති.

ඉති විඤ්ඤාණස්ස[1] සාසවත්ථෙන අවිජ්ජත්ථෙන, හෙතුඅත්ථෙන අවිච්ඡෙදත්ථෙන අනිවත්තිඅත්ථෙන ඵලත්ථෙන, පටිසන්ධිඅත්ථෙන පුනබ්භවත්ථෙන, අසමූගඝාතත්ථෙන අනුසයත්ථෙන, සම්පලිබොධත්ථෙන[2] පරියුට්ඨානත්ථෙන, අසම්පටිවෙධත්ථෙන අවිජ්ජත්ථෙන[3]. එත්තාවතා අවිජ්ජාය ඛෙත්තං නිද්දිට්ඨං භවති. අයං වුච්චති පරික්ඛාරො හාරො.

16. තත්ථ කතමො සමාරොපනො හාරො:

උග්ගහිතම්හි තම්හි – සනානකෙවච තං විත්ථාරං පන වත්තබ්බං
විත්ථාරවිධිං විජඤ්ඤා – අයං සමාරොපනො හාරො.

තත්ථ නාමනිද්දෙසො උපසටතො, වත්ථුනිද්දෙසො වෙවචනං වත්ථුභූතො විත්ථාරො. යථා කිං: යො භික්ඛු නිවත්තන්තො පහාතබ්බො. අයං උපසටනා.

තත්ථ කතමො සමාරොපනො: කිඤ්චි න වත්තබ්බං රූපරාගං වා නාමවත්තපහාතබ්බං. යාව විඤ්ඤාණන්ති විත්ථාරෙන කාතබ්බානි, අවිජ්ජා තා ඔපම්මෙන පඤ්ඤපෙතබ්බා, අයං සමාරොපනො නිස්සිතචිත්තස්ස ච මඤ්ඤිතො ච නිස්සයො තණ්හා ච දිට්ඨි ච තත්ථ දිට්ඨි අවිජ්ජා, තණ්හා සඞ්ඛාරා තත්ථ දිට්ඨිපච්චයා තණ්හා ඉමෙ අවිජ්ජාපච්චයා සඞ්ඛාරා. තත්ථ නිස්සිතං විඤ්ඤාණං, ඉදං සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, යාව ජරාමරණං ඉදං සඞ්ඛිත්තෙන භාසිතෙ අවසිට්ඨං පරොපයති (?)

“අනිස්සිතස්ස චලිතං නත්ථී”ති තස්ස එවං දිට්ඨියා තණ්හාය ච පහානං, තත්ථ දිට්ඨි අවිජ්ජානිරොධාය යථාභූතං[4] විඤ්ඤාණං රාගට්ඨානියෙසු[5] ධම්මෙසු තං තං ධම්මං උපෙච්ච[6] අඤ්ඤං ධම්මං ධාවති මක්කටොපමතාය: අථ ඛවස්ස පරිත්තෙසු ධම්මෙසු රාගට්ඨානියෙසු[7] ඡන්දරාගො නත්ථි, කුතො තතො චලනා, අධිමත්තෙසු සන්තෙසු (?) චිත්තං නිවෙසයති[8] තං අපතිට්ඨිතං විඤ්ඤාණං අනාහාරං නිරුජ්ඣති, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, යාව ජරාමරණනිරොධො අයං සමාරොපනො.

---

1. සඤ්ඤාණස්ස – ම, PTS.
2. සම්පලිබොධත්ථෙන – මජසං, PTS. නත්ථි.
3. අපටිවෙනත්ථෙන – ම.
4. භූතං – මජසං.
5. සරාගට්ඨානියෙසු – මජසං, PTS.
6. උපයුජ්ජ – PTS.
7. සරාගට්ඨානියෙසු – මජසං, PTS.
8. නිවෙස්සයති – ම, PTS.

එහි අවිද්‍යාවගේ අසමුද්ඝාතය ද අනුශය ද චිත්තයට පරිබොධ වෙයි. මේ පරියුට්ඨාන යි. යථාභූතව-ඇති සැටි) විඤ්ඤානයාගේ අප්‍රතිවෙධයෙක් වේ ද මේ අවිද්‍යාස්‍රව යි. අවිද්‍යාව විඤ්ඤානයට බීජ වෙයි. යමක් බීජ වේ ද ඒ හේතුව නොසිඳී පවතී, නො සිඳී පවත්නේ ප්‍රතිසන්ධානය කෙරෙයි. ප්‍රතිසන්ධානය කරනුයේ සමුද්ඝාතයට නො යෙයි. සමුද්ඝාතයට නො පැමිණියේ සිත හාත්පසින් බැඳ ගනී. හාත්පසින් බැඳුණු සිත් ඇතියේ යථාභූත ව නො දනී.

මෙසේ විඤ්ඤානයාගේ සාස්‍රවාර්ථය අවිද්‍යාර්ථ යැ, හේතු අර්ථය අවිච්ඡෙදර්ථ යැ. අනිවත්ති (නොනවත්නා) අර්ථය එලාර්ථ යැ, ප්‍රතිසන්ධි අර්ථය පුනර්භාවාර්ථ යැ, අසමුද්ඝාතාර්ථය අනුශයාර්ථ යැ, සම්පරිබොධාර්ථය පරියුට්ඨානාර්ථ යැ, අසම්ප්‍රතිවෙධාර්ථය අවිද්‍යාර්ථ යි. මෙතෙකින් අවිද්‍යාවගේ ක්ෂේත්‍ර ය දක්වන ලද්දේ වේ.

මේ පරික්ඛාරහාරය යි කියනු ලැබේ.

16, එහි සමාරොපන හාර කවරෙ යැ :

ඒ ධර්මය උද්ඝාටනය කළ කල්හි විද්‍යමාන වූ මැ විස්තරය කියැයුතු ය, ඒ විස්තාර විධිය දත යුත්තේ යැ. මේ සමාරොපන් හාර නම් වේ.

එහි නාමනිර්දේශය උපසටක වෙයි, වස්තු නිර්දේශය වේවචන යැ. වස්තු වූයේ විස්තරය යි. ඒ කෙසේ යැ යත් : යම් මහණෙක් නිවෘත්තියෙන් ප්‍රභාතව්‍ය වේ ද, මේ උපසටනා යැ.

එහි සමාරෝපන කවරෙ යැ : රූපරාගය හෝ (කිඤ්චි න වත්තබ්බං......... අවසිට්ඨං පරොපති : මේ කොටස ද අර්ථයක්, නගාගත නො හැකි පරිදි ව්‍යාකූලව ඇත ?)

''අනිස්සිතස්ස චලිතං නත්ථි'' යනු ඔහුට මෙසේ දෘෂ්ටියගේ ද. තෘෂ්ණාවගේ ප්‍රහාණය වෙයි, එහි දෘෂ්ටි අවිද්‍යාවන්ගේ නිරොධය පිණිස (?) යථාභූතවිඤ්ඤනය රාගයට කාරණ වූ ධර්මයන් කෙරෙහි වඳුරකුට බඳු උපමා ඇතියෙන් ඒ ඒ ධර්මයට පැමිණ අන් දහමකට (අරමුණකට) දිවෙයි. වැලි ඔහුට රාගය ඉපදීමට කාරණ වූ පරිත්ත ධර්මයන්හි ද ඡන්දරාග යෙක් නැත, එහෙයින් චලනය කොහි යැ, අධිමාත්‍ර වූ සත්වයන් කෙරෙහි (?) සිත පිහිටුවයි, ඒ අප්‍රතිෂ්ඨාන වූ විඤ්ඤනය අනාහාර වැ නිරුද්ධ වෙයි. විඤ්ඤනයාගේ නිරොධ යෙන් නාමරූප නිරෝධය වෙයි, ජරාමරණ නිරොධය දක්වා (විස්තරයි) මේ සමාරොපණ යි.

තත්‍ථ රාගවසෙන විඤ්ඤාණස්ස චලිතං සපරිග්ගහො, තස්මිං චලිතෙ අසති යො පරික්කිලෙසොපචාරො තිච්ඡෙධො අග්ගි පටිප්පස්සද්ධො භවති. තෙනාහ : ‘චලිතෙ අසති[1] පස්සද්ධි හොති. තත්‍ථා’යං සමාරොපනා, පස්සද්ධකායො සුඛං වෙදති, සුඛිනො චිත්තං සමාධියති, යාව විමුත්තමිති[2] ඤාණදස්සනං භවති.

සො ආසවානං ඛයා ච විමුත්තිනො උපපජ්ජති. තස්ස උපපත්තිස්ස ආගතිගතියා අසන්තියා[3] නෙවිධ න[4] හුරං න උභයමන්තරෙන, එසෙවන්තො දුක්ඛස්සාති අනුපාදිසෙසා නිබ්බානධාතු. ඉදමස්ස සුත්තස්ස[5] මජ්ඣෙ සමාරොපිතං පටිච්චසමුප්පාදෙ ච විමුත්තියං ච යොගො, න ච එතං තස්ස සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්‍ථාරෙන අත්‍ථං විභත්තනාති[6] අයං වුච්චතෙ සමාරොපනො[7] හාරො.

න ච සඞ්කිලෙසභාගියෙන සුත්තෙන සුඞ්කිලෙසභාගියො යෙ ච ධම්මා සමාරොපයිතබ්බා නාඤ්ඤෙ. එවං වාසනාභාගියෙ නිබ්බෙධ-භාගියෙ.

**අයං සමාරොපනො හාරො.**

**ඉමෙ සොළස හාරා.**

**සුවීරස්ස මහාකච්චායනස්ස ජම්බුවනවාසිනො**
**පෙටකොපදෙසෙ හාරවිභඞ්ගො නාම**
**පඤ්චමභූමි[8] සමත්තා[9]**

1. අසන්තෙ – ම, PTS.
2. විමුත්තිතමිති – ම.
3. ආගතිගතියං අසන්තියං, PTS
4. න චෙතනා හුරං PTS.
5. ඉදමස්ස – ම.
6. විභජ්ජනාති – ම, PTS.
7. සමාරොපනා – PTS.
8. පඤ්චමා භූමි – ම.
9. සිද්ධි – PTS.

එහි රාගවශයෙන් විඥානයාගේ චලිතය (සැලීම) වෙයි, හේ පරිග්‍රහයයි (දැඩි කොට ගැනීම යැ) ඒ තෘෂ්ණා වශයෙන් සැලීම නැති කල්හි පරික්ලෙශොපචාර වූ යම් ත්‍රිවිධාග්නි යෙක් ඇද්ද හේ සන්හිඳුණේ වේ. එයින් වදළ හ : ''චලිතෙ අසති පස්සද්ධි හොති '', යි. එහි මේ සමාරෝපණා යැ. සන්හුන් කය ඇතියේ කායික සුවය විඳියි. සුඛිත වූවහුගේ සිත සමාධියට පැමිණෙයි (සිත) කෙලෙසුන් කෙරෙන් මිදිණැයි ඥාන දර්ශනය (ප්‍රත්‍යවෙක්ෂාඥානය) වෙයි යනු දක්වා විස්තර යි.

හේ ආස්‍රවයන්ගේ ක්ෂය වීමෙන් අර්හත්ඵල විමුක්තියට පැමිණෙයි, විමුක්ත සිත් ඇති ඔහුට පටිසන්ධි විසින් ආගමනය ද චුති විසින් ගමන ය ද (ආගති ගති) නැති කල්හි මෙලොවැ නො මැ වෙයි, පරලොවැ නො වෙයි, උභය ලෝකයෙහි මැ නො වෙයි, මෙය මැ වට්ට දුක්ඛයාගේ අන්තය වේ යයි අනුපදිසෙස නිබ්බාන ධාතු වේ. මේ ඒ සූත්‍රයාගේ මාධ්‍යයෙහි සමාරොපිතය පටිච්ච සමුප්පාදයෙහි ද විමුක්තියෙහි ද, යොගය වෙයි. තෙල සැකෙවින් වදරන ලද ඒ සූත්‍රයාගේ අර්ථය විස්තරයෙන් නො ද විභාග කරන ලදැයි. මේ සමාරොපන හාරයයි කියනු ලැබෙ.

සංකි ලෙස භාගිය සූත්‍රයෙන් සංකිලෙසභාගිය සූත්‍රයෙක් නො ද සමාරොපන කටයුතු යැ. යම් ධර්ම කෙනෙක් සමාරෝපනය කළ යුත්තා හු ද (ඔවුන් හැර) අන්‍යධර්මයෝ සමාරොපන නො කටයුත්තාහ. වාසනාභාගිය නිබ්බෙධභාගිය සූත්‍රයෙහි ද මෙසේයි,

**මේ සමාරොපන හාර යි**

**මොහු සොළස හාරයෝ යි.**

**ජම්බුවනවාසී සුවීර වූ මහාකච්චායන තෙරණුවන්ගේ**
**පෙටකොපදෙසයෙහි හාරවිභඞ්ග නම් වූ**
**පඤ්චම භූමිය සමාප්තයි.**

# 6. ඡට්ඨමභූමි

6-1. බුද්ධානං භගවන්තානං සාසනං තිවිධෙන සඞ්ගහං ගච්ඡති: ඛන්ධෙසු ධාතූසු ආයතනෙසු.

තත්ථ පඤ්චක්ඛන්ධා: රූපක්ඛන්ධො, යාව විඤ්ඤාණක්ඛන්ධො. දස රූපආයතනානි: චක්ඛු රූපා ච, යාව කායො ඵොට්ඨබ්බා ච. අයං රූපක්ඛන්ධො,

තත්ථ ඡ වෙදනාකායා වෙදනාක්ඛන්ධො: චක්ඛුසම්ඵස්සජා වෙදනා, යාව මනොසම්ඵස්සජා වෙදනා, අයං වෙදනාක්ඛන්ධො.

තත්ථ ඡ සඤ්ඤාකායා සඤ්ඤාක්ඛන්ධො: රූපසඤ්ඤා, යාව ධම්ම-සඤ්ඤා, ඉමෙ ඡ සඤ්ඤාකායා. අයං සඤ්ඤාක්ඛන්ධො.

තත්ථ ඡ චෙතනාකායා සඞ්ඛාරක්ඛන්ධො: රූපසඤ්චෙතනා, යාව ධම්මසඤ්චෙතනා, ඉමෙ ඡ චෙතනාකායා, අයං සඞ්ඛාරක්ඛන්ධො.

තත්ථ ඡ විඤ්ඤාණකායා විඤ්ඤාණක්ඛන්ධො: චක්ඛුවිඤ්ඤාණං, යාව මනොවිඤ්ඤාණං, ඉමෙ ඡ විඤ්ඤාණකායා, අයං විඤ්ඤාණක්ඛන්ධො. ඉමෙ පඤ්චක්ඛන්ධා.

තෙසං කා පරිඤ්ඤා: අනිච්චං දුක්ඛං සඤ්ඤා අනත්තාති, එසා එතෙසං පරිඤ්ඤා

තත්ථ කතමො ඛන්ධත්ථො: සමූහත්ථො ඛන්ධත්ථො, පුඤ්ජත්ථො ඛන්ධත්ථො, රාසත්ථො ඛන්ධත්ථො, තං යථා දබ්බක්ඛන්ධො චනක්ඛන්ධො දාරුක්ඛන්ධො අග්ගික්ඛන්ධො උදකක්ඛන්ධො වායුක්ඛන්ධො ඉති එවං ඛන්ධෙසු සබ්බසඞ්ගහොව එවං ඛන්ධත්ථො.

6-2 තත්ථ අට්ඨාරස ධාතුයො: චක්ඛුධාතු රූපධාතු චක්ඛු-විඤ්ඤාණධාතු -පෙ- මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු. එතායො අට්ඨාරස ධාතුයො. තාසං පරිඤ්ඤා: අනිච්චං දුක්ඛං සඤ්ඤා අනත්තාති, එසා එතාසං පරිඤ්ඤා.

තත්ථ කො ධාතුඅත්ථො, වුච්චතෙ: අවයවත්ථො ධාතුඅත්ථො, අවයවොති: චක්ඛුනො පසාදෙ[1] චක්ඛුධාතු. එවං පඤ්චසු ධාතූසු, පුන රූපවවච්ඡෙදත්ථො ධාතුඅත්ථො. වවච්ඡින්නා හි චක්ඛුධාතු, එවං පඤ්චසු, පුනරූප එකත්ති පකත්‍යත්ථෙන ධාතුඅත්ථොති වුච්චතෙ. තං යථා: පකතියා අයං පුරිසො පිත්තිකො සෙම්හිකො වාතිකො සන්නිපාතිකොති. එවංපකති චක්ඛුධාතු. දසන්නම්පි යා ච සබ්බෙසු ඉන්ද්‍රියෙසු -පෙ- විනිභාගත්ථො ධාතුඅත්ථො.

---

1. චක්ඛු, නො පසාදෙ - මජ්ඣං.

# 6. ෂෂ්ඨ භූමි

6–1. භාග්‍යවත් බුදුවරුන්ගේ ශාසනය තුන්පරිද්දෙකින් සංග්‍රහයට යෙයි : ස්කන්ධ–ධාතු–ආයතනයන්හි යැ.

එහි පඤ්චස්කන්ධයෝ නම් : රූපස්කන්ධ යැ, විඥනස්කන්ධය දක්වා ඇති පස ද රූපායතනයෝ දසයෙකි : ඇස ද රූපයෝ ද – කය ද ස්ප්‍රෂ්ටව්‍යයෝ ද යන මේ රූපස්කන්ධ යි.

එහි සවැදෑරුම් වෙදනාකාය වෙදනාස්කන්ධ යැ : චක්ඛු සම්ඵස්සජ වෙදනා යැ– මනොසම්ඵස්සජවෙදනාව දක්වා ඇති මේ සවැදෑරුම් වෙදනා වෙදනාස්කන්ධ යි.

එහි, සවැදෑරුම් සංඥකාය සංඥස්කන්ධ යැ. රූපසංඥව (ආදිකොට) ධර්මසංඥ දක්වා ඇති මේ ෂට්සංඥකාය සංඥස්කන්ධ යි.

එහි සවැදෑරුම් චෙතනාකාය සංස්කාරස්කන්ධ යැ : රූප සඤ්චෙතනා (ආදි කොට) ධර්මසඤ්චෙතනා දක්වා මොහු සඳෙන චෙතනාකාය යැ, මේ සංස්කාරස්කන්ධ යි.

එහි සවැදෑරුම් විඥනකාය විඥනස්කන්ධ යැ, චක්ඛුවිඤ්ඤාණය (ආදි කොට) මනො විඤ්ඤාණය දක්වා මොහු සංඥා විඥනකාය යැ, මේ විඥනස්කන්ධ යි.

ඒ පඤ්චස්කන්ධයන්ගේ, පරිඤ්ඤා කවර යැ : අනිත්‍ය යැ දුඃඛ යැ සංඥ යැ අනාත්ම යැ යන මොහු යි. මේ ස්කන්ධයන්ගේ තෙල අනිත්‍යාදි වශයෙන් දැනීම 'පරිඤ්ඤා' නම් වී.

එහි ස්කන්ධාර්ථය කවරෙ යත් : සමූහභාවය ස්කන්ධාර්ථ යැ පුඤ්ජභාවය ස්කන්ධාර්ථ යැ රාශිභාවය ස්කන්ධාර්ථ යැ. ඒ මෙසේ යැ : ද්‍රව්‍යස්කන්ධ යැ වනස්කන්ධ යැ දරුස්කන්ධ යැ අග්නිස්කන්ධ යැ උදකස්කන්ධ යැ වායුස්කන්ධ යැ යනු මෙනි. මෙසේ ස්කන්ධයන්හි සියල්ල සංග්‍රහ වූ ස්කන්ධාර්ථය මෙසේ දතයුතු.

6–2. එහි අටළොස් ධාතුකෙනෙක් වෙති : චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු යැ ... මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු යැ යන මොහු අටළොස් ධාතුහු යි. ඔවුන්ගේ අනිත්‍යාදිවශයෙන් දැනීම අනිත්‍ය යැ දුඃඛ යැ සංඥ යැ අනාත්ම යැ යන මොහු යි. මේ තෙල ධාතුන්ගේ පරිඤ්ඤා නම් වී.

එහි ධාතුඅර්ථය කවරෙ යත් : කියනු ලැබේ. අවයවාර්ථය ධාතුඅර්ථ යි. අවයව නම් : චක්ෂුහුගේ ප්‍රසාදය වූ චක්ෂුර්ධාතු යැ. චක්ෂුරාදි පඤ්චධාතූන්හි (අවයව) මෙසෙයින් දතයුතු. යළි රාගයාගේ ව්‍යවච්ඡෙදර්ථය ධාතුඅර්ථ යි. එසේ මැයැ පිරිසිඳුනා ලද්දී චක්ඛුධාතු යැ, පඤ්චධාතූන්හි මැ එපරිදි වෙයි. යළි ... ප්‍රකෘති අර්ථයෙන් ධාතු අර්ථය කියනු ලැබේ. ඒ මෙසේ යැ : පියවින් මේ පුරුෂ පිත ප්‍රකෘති කොට ඇත්තේ යැ, සෙම්භික යැ වාතික යැ සන්නිපාතික යැ යනු යි. මෙබඳු පියවි ඇතියේ චක්ඛුධාතු යැ, (චක්ඛු–රූපාදි) දසධාතූන්ගේ ද සියලු ඉන්ද්‍රියයන්හි ද ... විසභාගාර්ථය ධාතු අර්ථ යි''.

6-3. තත්ථ ද්වාදසායතනානි, කතමානි : ඡ අජ්ඣත්තිකානි ඡ බාහිරානි, චක්ඛායතනං[1], යාව මනායතනන්ති අජ්ඣත්තිකං, රූපායතනං. යාව ධම්මායතනන්ති බාහිරං. එතානි ද්වාදස ආයතනානි.

එතෙසං කා පරිඤ්ඤා : අනිච්චං දුක්ඛං සඤ්ඤා අනත්තාති, එසා එතෙසං පරිඤ්ඤා. අපි ච ද්විධා පරිඤ්ඤා : ඤාතපරිඤ්ඤා[2] ච පහානපරිඤ්ඤා ච. තත්ථ ඤාතපරිඤ්ඤා[2] නාම : අනිච්චං දුක්ඛං සඤ්ඤා අනත්තාති, එසා ඤාතපරිඤ්ඤා[2] පහානපරිඤ්ඤා පන ඡන්දරාගප්පහානා, එසා පහානපරිඤ්ඤා.

තත්ථ කතමො ආයතනත්ථො : වුච්චතෙ, ආකරත්ථො[3] ආයතනත්ථො, යථා සුවණ්ණාකරෙ රතනාකරෙ[4] යථා ද්වීහි තෙහි ආකරෙහි[5] තෙ තෙ ගාවා උත්තිට්ඨන්ති, එවං එතෙහි චිත්තචෙතසිකා ගාවා උත්තිට්ඨන්ති කම්මකිලෙසා දුක්ඛධම්මා ච.

පුනරාහ ආයදනත්ථො ආයතනත්ථො, යථා රඤ්ඤො ආයදනෙහි ආයො භවති. එවං ආයදනත්ථො ආයතනත්ථො.

6-4. චත්තාරි අරියසච්චානි : දුක්ඛං සමුදයො නිරොධො මග්ගො ච. යථා දුක්ඛං[6] සමාසෙන බන්ධසරීරං,[7] මානසං ච, සමුදයො සමාසෙන අවිජ්ජා ච තණ්හා ච, නිරොධො සමාසෙන විජ්ජා ච විමුත්ති ච මග්ගො සමාසෙන සමථො ච විපස්සනා ච.

6-5. තත්ථ සත්තතිංස බොධිපක්ඛිකා ධම්මා කතමෙ : චත්තාරො සතිපට්ඨානා, යාව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. එවමෙතෙ සත්තතිංස බොධිපක්ඛිකා ධම්මා. යෙ ධම්මා අතීතානාගතපච්චුප්පන්නානං බුද්ධානං සාවකානං ච නිබ්බානං සංවත්තන්තීති. යො මග්ගො චත්තාරො සතිපට්ඨානා. කතමෙ චත්තාරො : "ඉධ භික්ඛු කායෙ කායානුපස්සී විහරති -පෙ- සම්මපධානං, ඉද්ධිපාදං, ඉන්ද්‍රියානි, බලානි, තත්ථ කො ඉන්ද්‍රියත්ථො, ඉන්දත්ථො ඉන්ද්‍රියත්ථො, ආධිපතෙය්‍යත්ථො ඉන්ද්‍රියත්ථො, පසාදත්ථො ඉන්ද්‍රියත්ථො, අසාධාරණං කස්ස කිරියත්ථො ඉන්ද්‍රියත්ථො. අනවපරියත්ථො බලත්ථො, ථාමත්ථො බලත්ථො, උපාදයත්ථො බලත්ථො, උපත්ථම්භනත්ථො බලත්ථො.

තත්ථ කතමෙ සත්ත බොජ්ඣඞ්ගා : සතිසම්බොජ්ඣඞ්ගො, යාව උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. තත්ථ කතමො අට්ඨඞ්ගිකො මග්ගො : සම්මාදිට්ඨි, යාව සම්මාසමාධි.

---

1. චක්ඛුආයතනං – PTS.
2. ඤාණපරිඤ්ඤා – PTS.
3. ආකාරත්ථො – මජ්සං, PTS.
4. දුබ්බණ්ණාකරෙ – මජ්සං.
5. ආකාරෙහි – PTS.
6. දුක්ඛං, යථා – මජ්සං, PTS.
7. { ධම්මාචරියං – මජ්සං.
   ධම්මචරියං – PTS.

6–3. එහි ද්වාදශ–ආයතනයෝ කවරහ : ආධ්‍යාත්මික ආයතන සයෙක, බාහිරායතන සයෙකි. චක්ෂුරායතනය (ආදිකොට) මනායතනය දක්වා ආධ්‍යාත්මික යැ. රූපායතනය (ආදි කොට) ධර්මායතනය දක්වා බාහිර යි. තුලුහු ද්වාදශ ආයතනයෝ යි.

මොවුන්ගේ පරිඥ කවර යැ : අනිත්‍ය යැ දුඃඛ යැ සංඥ යැ අනාත්ම යි. මෝ තුලුන්ගේ පරිඥ යි. තවද ඥාතපරිඥ්ඥා ද පහානපරිඥ්ඥා දයි පරිඥ ද්විවිධ යැ : එහි ඥාත පරිඥ්ඥා නම් : අනිත්‍ය යැ දුඃඛ යැ සංඥ යැ අනාත්ම යැ යන මෝ ඥත පරිඥ යි. පහාන පරිඥ්ඥා වැලිත් ඡන්දරාගප්‍රහාණ යැ. මෝ ප්‍රහාණපරිඥ යි.

එහි ආයතනාර්ථය කවරෙ යත් : කියනු ලැබෙයි. ආකරාර්ථය (උත්පත්තිස්ථාන භාවය) ආයතනාර්ථ යැ, සුවර්ණාකර රත්නාකර යම්සේද එමෙනි'' යම්සේ ඒ දෙවැදැරුම් ආකරයන්ගෙන් ඒ ඒ වස්තු (?) උපදිත් ද එපරිද්දෙන් මේ ආයතනයන්ගෙන් චිත්ත–චෛතසික දහම්හු ද කර්මක්ලෙශයෝ ද දුඃඛධර්මයෝ ද උපදිත්.

යළි කියයි, ආයදනාර්ථය ආයතනාර්ථ යැ. යම්සේ රජුට අය දීමෙන් (රාජ්‍යයෙහි) අය උපදී ද එපරිද්දෙන් ආයදනාර්ථය ආයතනාර්ථ යි.

6–4. ආර්‍යසත්‍ය සතරෙකි : දුඃඛ යැ සමුදය යැ නිරොධ යැ මාර්ගය දයි කියා යි. ඒ මෙසේ යැ : සැකෙවින් ස්කන්ධශරීරය ද දුඃඛසත්‍ය යැ, සැකෙවින් අවිද්‍යාව ද තෘෂ්ණාව ද සමුදයසත්‍ය යැ, සැකෙවින් විද්‍යා ද විමුක්ති ද නිරොධසත්‍ය යැ, සැකෙවින් ශමථය ද විදර්ශනා ද මාර්ගසත්‍යය යි.

6–5. එහි සත්තිස් බොධිපාක්ෂික ධර්මයෝ කවරහ යත් : සතර සතිපට්ඨාන (ආදි කොට) ආර්‍යඅෂ්ටාංගිකමාර්ගය දක්වා ඇති තෙල දහම්හු සත්තිස් බෝපැකිදහම්හු යි. යම් දහම් කෙනෙක් අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වූ භාග්‍යවත් බුදුවරයන්ගේ ද පසේබුදුවර යන්ගේ ද ශ්‍රාවකයන්ගේ ද නිර්වාණය පිණිස පවත්නාහු ද ඔහු යි. ඒ මාර්ගය සතර සතිපට්ඨානයෝ යැ, කවර සතරදෙනෙක යත්: ''මෙසස්නෙහි මහණ (ආශ්වාස–ප්‍රශ්වාසාදි) කයෙහි කය අනුව බලමින් වාස කෙරෙයි ... සතර සම්‍යක් ප්‍රධාන යැ, සතර ඍද්ධිපාද යැ, පඤ්චෙන්ද්‍රියයෝ යැ, පඤ්චබලයෝ යැ'' (යනාදිය). එහි ඉන්ද්‍රියාර්ථ කවරෙ යැ : ඉන්ද්‍රාර්ථය ඉන්ද්‍රියාර්ථ යැ, අධිපතිභාවාර්ථය ඉන්ද්‍රියාර්ථ යැ, ප්‍රසාදර්ථය ඉන්ද්‍රියාර්ථ යැ (අසාධාරණං ... ) ස්ථාම – ශක්ති අර්ථය බලාර්ථ යැ, උපාදයාර්ථය බලාර්ථ යැ, උපස්තම්භාර්ථය බලාර්ථ යි.

එහි සප්තබොධ්‍යංගයෝ කවරහ : සති සම්බොධ්‍යඞ්ගය (පටන්) උපෙක්ඛාසම් බොධ්‍යඞ්ගය දක්වා ඇත්තාහු යි. එහි අෂ්ටාඞ්ගික මාර්ගය කවරෙ යැ : සම්මාදිට්ඨිය, (පටන්) සම්මාසමාධිය දක්වා ඇත්නාහු යි.

තත්ථ අට්ඨඞ්ගිකො මග්ගොති: ඛන්ධා: සීලක්ඛන්ධො ච සමාධික්ඛන්ධො ච පඤ්ඤාක්ඛන්ධො ච, තත්ථ යා ච සම්මාවාචා, යො ච සම්මාකම්මන්තො යො ච සම්මාආජීවො, අයං සීලක්ඛන්ධො. යා ච සම්මාසති යො ච සම්මාවායාමො, යො ච සම්මාසමාධි, අයං සමාධික්ඛන්ධො. යො ච සම්මාසඞ්කප්පො යා ච සම්මාදිට්ඨි, අයං පඤ්ඤාක්ඛන්ධො. එවං ඛන්ධා[1] තිස්සො සික්ඛා. එවං තීහාකාරෙහි දස පදානි -පෙ-.

6-6. තත්ථ යොගාවචරෙ සීලක්ඛන්ධෙ ඨිතො දොසං අකුසලං න උප්පාදියති, දොසානුසයං සමූහනති, දොසසල්ලං උද්ධරති, දුක්ඛවෙදනං පරිජානාති, කාමධාතුං සමතික්කමති.

සමාධික්ඛන්ධෙ ඨිතො ලොභං අකුසලං න උප්පාදියති, රාගානුසයං සමූහනති, ලොභසල්ලං උද්ධරති, සුඛවෙදනං පරිජානාති, රූපධාතුං සමතික්කමති.

පඤ්ඤාක්ඛන්ධෙ ඨිතො මොහං අකුසලං න උප්පාදියති, අවිජ්ජානුසයං සමූහනති, මොහසල්ලං දිට්ඨිසල්ලඤ්ච උද්ධරති, අදුක්ඛමසුඛවෙදනං පරිජානාති, අරූපධාතුං සමතික්කමති.

ඉති තීහි ඛන්ධෙහි තීණි අකුසලමූලානි න උප්පාදියති, චත්තාරි සල්ලානි උද්ධරති, තිස්සො වෙදනා පරිජානාති තෙධාතුකං සමතික්කමති.

6-7. තත්ථ කතමා අවිජ්ජා: යං චතූසු අරියසච්චෙසු අඤ්ඤාණන්ති විත්ථාරෙන, යථා සො පාණසජ්ජෙසු කථංකථා කාතබ්බං.

තත්ථ කතමං විඤ්ඤාණං: ඡ විඤ්ඤාණකායා. වෙදනා සඤ්ඤා චෙතනා ඵස්සො මනසිකාරො ඉදං නාමං. තත්ථ කතමං රූපං: චාතුම්මහාභූතිකං[2] චතුන්නං මහාභූතානං උපාදායරූපස්ස පඤ්ඤත්තිං. ඉති පුරිමකං ච නාමං ඉදං ච රූපං තදුභයං නාමරූපන්ති වුච්චති

තත්ථ ඡළායතනන්ති: ඡ අජ්ඣත්තිකානි ආයතනානි, චක්ඛු අජ්ඣත්තිකං ආයතනං, යාව මනො අජ්ඣත්තිකං ආයතනං.

ඵස්සොති ඡ ඵස්සකායා, චක්ඛුසම්ඵස්සො යාව මනොසම්ඵස්සොති ඵස්සො.

වෙදනාති: ඡ වෙදනාකායා වෙදනා.

තණ්හාති: ඡ තණ්හාකායා තණ්හා.

උපාදානන්ති චත්තාරි උපාදානානි: කාමූපාදානං දිට්ඨූපාදානං සීලබ්බතුපාදානං අත්තවාදූපාදානන්ති උපාදානං.

භවොති තයො භවා, කාමභවො රූපභවො අරූපභවො.

1. කායො - මජසං.
2. චාතුමහාභූතිකං - ම.

එහි අට්ඨඞ්ගිකමග්ග යනු : ශීලස්කන්ධය ද සමාධිස්කන්ධය ද ප්‍රඥාස්කන්ධය ද යන ස්කන්ධ යි. එහි යම් සම්‍යග්වචනයෙක් යම් සම්‍යක්කර්මාන්තයෙක් යම් සම්‍යගාජීවයෙක් ඇද්ද මේ ශීලස්කන්ධ යැ. යම් සම්‍යක්ස්මෘතියක් සම්‍යග්ව්‍යායාමයෙක් යම් සම්‍යක්සමාධියෙක් ඇද්ද මේ සමාධිස්කන්ධ යැ, යම් සම්‍යක්සංකල්පයෙක් යම් සම්‍යග්දෘෂ්ටියක් ඇද්ද මේ ප්‍රඥාස්කන්ධ යි. මෙසේ ස්කන්ධය ත්‍රිවිධ ශික්ෂා වෙති. මෙසේ තුන් අයුරෙන් දසපද කෙනෙක් වෙති ...

6–6. එහි, යොගාවචර ශීලස්කන්ධයෙහි සිටියේ ද්වේෂ අකුශලය නූපදවයි. ද්වේෂානුශය සමුද්ඝාතනය කෙරෙයි. ද්වේෂශල්‍යය උදුරයි, දුඃඛවේදනාව පරිඥානය කෙරෙයි, කාමධාතුව ඉක්මවයි.

සමාධිස්කන්ධයෙහි සිටියේ ලොභ අකුශලය නූපදවයි, රාගානුශය සමූහනය කෙරෙයි, ලොභශල්‍යය උදුරයි, සුඛවේදනාව දැනගනී, රූපධාතුව ඉක්මවයි.

ප්‍රඥාස්කන්ධයෙහි සිටියේ මොහ අකුශලය නූපදවයි, අවිද්‍යානුශය සමූහනය කෙරෙයි, මොහශල්‍යය ද දෘෂ්ටිශල්‍යය ද උදුරයි, අදුක්ඛමසුඛවේදනාව පරිජානනය කෙරෙයි, අරූපධාතුව ඉක්මවයි.

මෙසේ ත්‍රිවිධ ස්කන්ධයෙන් තුන් අකුශලමූලයන් උපාදනය නො කෙරෙයි, චතුර්විධ ශල්‍යයන් උදුරයි, තුන් වේදනා පරිජානනය කෙරෙයි, ත්‍රෛධාතුක භවය ඉක්මවයි.

6–7. එහි අවිද්‍යා කවර යත් : චතුරාර්‍ය්‍යසත්‍යය විෂයෙහි යම් නොදැනීමක් ඇද්ද යනාදිය විස්තරයෙන් දක්වියයුතු. (යථාසො ?)...

එහි විඤ්ඤාණ කවරෙ යැ : සවැදෑරුම් කායයෝ යැ, වේදනා සඤ්ඤා චෙතනා ඵස්ස මනසිකාර යන මේ නාම යැ, එහි රූප කවරෙ යැ : සතර මහාභූතරූප යැ, සතර මහාභූතයන් නිසා පවත්නා රූපයාගේ ප්‍රඥප්ති යැ යන පළමු කී නාමය ද මේ රූපය ද යි එදෙක 'නාමරූප' යයි කියනු ලැබේ.

එහි ෂඩායතන යනු : ෂඩ් ආධ්‍යාත්මික ආයතනයෝ යැ, ඇස ආධ්‍යාත්මික ආයතනයෙකැ, (ආදි කොට) මනආධ්‍යාත්මික ආයතනය දක්වා යි.

ඵස්ස යනු : චක්ඛුසම්ඵස්සය පටන් මනොසම්ඵස්සය දක්වා සවැදෑරුම් ඵස්සකාය 'ඵස්ස' නම් වේ.

වේදනා යනු : ෂඩ්වේදනාකායයෝ යැ, මේ වේදනා යි.

තණ්හා යනු : ෂට්තෘෂ්ණාකායයෝ යැ, මේ තෘෂ්ණා යි.

උපාදන යනු : කාමූපාදන යැ දිට්ඨි–උපාදන යැ සීලබ්බතූපාදන යැ අත්තවාද-උපාදන යැ යන සතර උපාදනයෝ යැ. මේ උපාදන යි.

භව යනු : කාමභව යැ රූපභව යැ අරූපභව යැ යන තුන් භවයෝ යි.

තත්ථ කතමා ජාති, යා පඨමං ඛන්ධානං පඨමං ධාතූනං පඨමං ආයතනානං උප්පත්ති ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො, අයං ජාති.

තත්ථ කතමා ජරා: ජරා නාම යං තං ඛණ්ඩිච්චං පාලිච්චං වලිතතචතා[1] චතුන්නං මහාභූතානං විවණ්ණතා[2] භඞ්ගො යා ජරා[3] හීයනා පරිහීයනා[4] ආයුනො හානි සංහානි ඉන්ද්‍රියානං පරිපාකා උපඝාතො පරිපාකො, අයං ජරා.

තත්ථ කතමං මරණං: මරණං නාම, යා තස්මිං තස්මිං සත්ත-නිකායෙ තෙසං තෙසං සත්තානං චුති චවනතා මරණං කාලකිරියා[6] ඛන්ධානං[7] භෙදො කායස්ස නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො, ඉදං මරණං, ඉති පුරිමිකා ච ජරා ඉදං ච මරණං තදුභයං ජරා-මරණං.

6-8. තත්ථ අන්ධකාරතිමිසා යථාභූතං අප්පජානනා[8] ලක්ඛණා අවිජ්ජා, සඞ්ඛාරානං පදට්ඨානං: අභිසඞ්ඛරණලක්ඛණා සඞ්ඛාරා, උපචියපුනබ්භවාභිරොපනපච්චුපට්ඨානා, තෙ විඤ්ඤාණස්ස පදට්ඨානං. වත්ථු සවිඤ්ඤත්තිලක්ඛණං විඤ්ඤාණං, තං නාමරූපස්ස පදට්ඨානං. අනෙකසන්නිස්සයලක්ඛණං නාමරූපං, තං සළායතනස්ස පදට්ඨානං. ඉන්ද්‍රියවවත්ථාපනලක්ඛණං සළායතනං, තං ඵස්සස්ස පදට්ඨානං. සන්නිපාතලක්ඛණො ඵස්සො, සො වෙදනාය පදට්ඨානං. අනුභවන-ලක්ඛණා වෙදනා, සා තණ්හාය පදට්ඨානං. අජ්ඣොසානලක්ඛණා තණ්හා, සා උපාදානස්ස පදට්ඨානං. ආදානපරිග්ගහලක්ඛණං උපාදානං. තං භවස්ස පදට්ඨානං. නානාගතිවික්ඛෙපනලක්ඛණො භවො, සො ජාතියා පදට්ඨානං. ඛන්ධානං පාතුභාවලක්ඛණා ජාති, සා ජරාය පදට්ඨානං. උපඝායපරිපාකලක්ඛණා ජරා, සා මරණස්ස පදට්ඨානං. ආයුක්ඛයජීවිතඋපරොධලක්ඛණං මරණං, තං දුක්ඛස්ස පදට්ඨානං. කායසම්පීළනලක්ඛණං දුක්ඛං, තං දොමනස්සස්ස පදට්ඨානං. චිත්ත-සම්පීළනලක්ඛණං දොමනස්සං, තං සොකස්ස පදට්ඨානං. සොචන-ලක්ඛණො සොකො, සො පරිදෙවස්ස පදට්ඨානං. වාචා[9] නිච්ඡාරණ-ලක්ඛණො පරිදෙවො, සො උපායාසස්ස පදට්ඨානං. යෙ ආයාසා තෙ උපායාසා.

6-9. නව පදානි යත්ථ සබ්බො අකුසලපක්ඛො සඞ්ගහං සමො-සරණං ගච්ඡති, කතමානි නව පදානි: ද්වෙ මූලකිලෙසා තීණි අකුසලමූලානි, චත්තාරො විපල්ලාසා.

---

1. පලිතත්තං – මජසං, අධිකං.
2. විවණ්ණතං – මජසං.
3. තං ජරා – මජසං.
4. පහීයානා – මජසං.
5. පරිභෙදො – මජසං.
6. කාලංකිරියා – මජසං.
7. උද්ධුමාතකානං – මජසං.
8. අවිජානනා – PTS.
9. වචී . . . – මජසං, PTS.

එහි ජාති කවරැ : ස්කන්ධයන්ගේ ධාතූන්ගේ ආයතනයන්ගේ යම් පළමු උපතක් ඉපදීමක් මොනොවට ඉපදීමක් අවක්‍රාන්තියක් වෙසෙසින් ඉපදීමෙක් ස්කන්ධයන්ගේ පහළවීමෙක් ඇද්ද මේ ජාති නමු.

එහි ජරා කවරැ : ජරානම්, යම් ඒ (දත් ආදිය) කැඩුණු බවෙක් පැසුණු බවෙක් සම රැලිවැටුණු බවක් සතර මහාභූතයන්ගේ විවර්ණබවෙක් බිඳීමෙක් යම් දිරීමෙක් හීමෙක් පිරිහීමෙක් ආයුෂයාගේ හීමෙක් පිරිහීමෙක් ඉන්ද්‍රියයන්ගේ මිහිකිරීමෙක් උපනාහයෙක් පරිපාකයෙක් වේ ද මේ ජරා නමු.

එහි මරණ කවරෙ යත් : මරණය නම්, ඒ ඒ සත්ව නිකායෙහි ඒ ඒ සත්වයන්ගේ ච්‍යුත වීමක් ච්‍යුත වන බවක් මරණයක් කාලක්‍රියාවක් ස්කන්ධයන්ගේ බිඳීමෙක් රූපකය බහාතැබීමෙක් ජීවිතෙන්ද්‍රියයාගේ සිඳීමෙක් වේ ද මේ මරණ යැ. මෙයේ පළමු කී ජරාව ද මේ මරණය ද යන දෙක ජරාමරණ නම් වේ.

6-8. එහි ගනඅඳුරක් බඳු අවිද්‍යාව යථාභූත ව නො දැනීම ලක්ෂණ කොට ඇත්තී ය, සංස්කාරයන්ට ආසන්නකාරණ වෙයි. සංස්කාරයෝ කර්මායූහන සංඛ්‍යාත අභිසංස් කරණය ලක්ෂණ කොට ඇත්තාහු ය. උපචය (ඉපදීම්) සංඛ්‍යාත පුනර්භවය හටගැනීම වැටහීම කොට ඇත්තාහුය, ඔහු කර්මවිඥානයට පදට්ඨාන යි. විඥානය රූපාදි වස්තූහුගේ විඥප්ති සහිතබව ලක්ෂණ කොට ඇත්තේ ය, එය නාමරූපයට පදට්ඨාන යි. නාමරූපය වෙදනාදි නොයෙක් ධර්මයන්ගේ සන්නිශ්‍රය ලක්ෂණ කොට ඇත්තේ ය, එය ෂඩායතනයට පදට්ඨාන යි. ෂඩායතනය චක්ෂුරාදි ඉන්ද්‍රියයන් නිශ්චය කිරීම ලක්ෂණ කොට ඇත්තේ ය එය ස්පර්ශයට පදට්ඨාන යි. ඵස්සය චක්ඛු–රූපාදීන්ගේ එක්වීම ලක්ෂණ කොට ඇත්තේ යැ, ඒ ඵස්සය වෙදනාවට පදට්ඨාන යි. වෙදනාව චක්ඛුසම්ඵස්සාදිය විඳීම ලක්ෂණ කොට ඇත්තී යැ, ඒ වෙදනාව තණ්හාවට පදට්ඨාන යි. තෘෂ්ණාව රූපාදි අරමුණෙහි බැසැගෙන සිටීම ලක්ෂණ කොට ඇත්තී යැ, ඒ තණ්හාව උපාදානයට පදට්ඨාන යි. උපාදානය දැඩි ව ගැනීම ලක්ෂණ කොට ඇත්තේ යැ, එය භවයට පදට්ඨාන යි. භවය නානාගතියෙහි පමුණුවාලීම ලක්ෂණකොට ඇත්තේ යැ, හේ ජාතියට පදට්ඨාන යි. ජාතිය ස්කන්ධයන්ගේ පහළවීම ලක්ෂණ කොට ඇත්තී යැ, මේ ජරාවට පදට්ඨාන යි. ජරාව (ඉන්ද්‍රියපරිපාකයට) පැමිණීම ලක්ෂණ කොට ඇත්තී යැ, ඕ මරණයට පදට්ඨාන යි. මරණය ආයු ගෙවීමෙන් ජීවිතෙන්ද්‍රිය සිඳීම ලක්ෂණ කොට ඇත්තේ යැ, එය දුකට පදට්ඨාන යි. දුක කය පෙළීම ලක්ෂණ කොට ඇත්තේ යැ, එය දොම්නසට පදට්ඨාන යි. දොම්නස සිත පෙළීම ලක්ෂණ කොට ඇත්තේ යැ, එය ශොකයට පදට්ඨාන යි. ශොකය ශොක කිරීම ලක්ෂණ කොට ඇත්තේ යැ. හේ පරිදෙව (වැලැපීමට) පදට්ඨාන යි. පරිදෙවය වචන නිකුත්කිරීම ලක්ෂණ කොට ඇත්තේ යැ, ඒ පරිදේවය උපායාසයට පදට්ඨාන යි. යම් ආයාස කෙනෙක් වෙත් ද ඔහු උපායාසයෝ යි.

6-9. නව පද කෙනෙක් වෙති, යම් තැනෙක සියලු අකුශලපක්ෂය සංග්‍රහයට එක්වීමට යේ ද ඒ කවර නව පදකෙනෙක යත් : මූලක්ලේශයෝ දෙදෙනෙක, අකුශලමූලයෝ තිදෙනෙක, විපල්ලාසයෝ සතර දෙනෙකි.

තත්ථ ද්වෙ මූලකිලෙසා, අවිජ්ජා ච භවතණ්හා ච, තීණි අකුසලමූලානි: ලොභො දොසො මොහො ච, චත්තාරො විපල්ලාසා: 'අනිච්චෙ නිච්ච'න්ති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො, දුක්ඛෙ සුඛන්ති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො, අනත්තනි අත්තාති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො, අසුභෙ සුභන්ති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො

6-10. තත්ථ අවිජ්ජා නාම: චතූසු අරියසච්චෙසු යථාභූතං අඤ්ඤාණං, අයං අවිජ්ජා, භවතණ්හා නාම: යො භවෙසු රාගො සාරාගො ඉච්ඡා මුච්ඡා පත්ථනා නන්දී අජ්ඣොසානං අපරිච්චාගො, අයං භවතණ්හා.

තත්ථ කතමො ලොභො අකුසලමූලං: යො[1] තෙසු තෙසු පරවත්ථූසු පරදබ්බෙසු පරවට්ඨානෙසු පරසාපතෙය්‍යෙසු පරපරිග්ගහෙසු ලොභො ලුබ්භනා ඉච්ඡා මුච්ඡා පත්ථනා නන්දී අජ්ඣොසානං අපරිච්චාගො; අයං ලොභොඅකුසලමූලං. කස්සෙතං මූලං: * ලොභජස්ස අකුසලස්ස කායකම්මස්ස වචීකම්මස්ස මනොකම්මස්ස තංසම්පයුත්තානං ච චිත්තචෙතසිකානං ධම්මානං මූලං.

තත්ථ කතමො දොසො අකුසලමූලං: යො[2] සත්තෙසු අඝතො අක්ඛන්ති අප්පච්චයො ව්‍යාපාදො පදොසො අනත්ථකාමතා චෙතසො පටිඝාතො, අයං දොසො අකුසලමූලං. කස්සෙතං මූලං දොසජස්ස අකුසලස්ස කායකම්මස්ස වචීකම්මස්ස මනොකම්මස්ස තංසම්පයුත්තානං ච චිත්තචෙතසිකානං ධම්මානං මූලං.

තත්ථ කතමො මොහො අකුසලමූලං: යං අඤ්ඤාණං අදස්සනං[3] අනභිසමයො අසම්පජ්ජගාහො[4] අප්පටිවෙධො, මොහො මුය්හනා සම්මොහො සම්මුය්හනා අවිජ්ජා තමො අන්ධකාරො ආවරණං නීවරණං ඡදනං අවච්ඡදනං[5] අපසට්ඨාගමනං[6] කුසලානං ධම්මානං අයං මොහො අකුසලමූලං. කස්සෙතං මූලං: මොහජස්ස අකුසලස්ස කායකම්මස්ස වචීකම්මස්ස මනොකම්මස්ස, තංසම්පයුත්තානං ච චිත්තචෙතසිකානං ධම්මානං මූලං.

6-11 තත්ථ විපල්ලාසා ජානිතබ්බා, විපල්ලාසානං වත්ථු ජානිතබ්බං, යං විපල්ලාසං සියා තං ජානිතබ්බං.

තත්ථ එකො විපල්ලාසො, චත්තාරි විපල්ලාසවත්ථූනි, තීණි විපල්ලාසානි,

---

1. ලොභො නාම සො – ම, PTS.
2. සො – මජ්ඣං, PTS.

* ලොභොති පදං – ම, PTS., පොත්ථකෙසු අධිකං.

3. යං – ම, PTS.
4. අසම්පජ්ජඤ්ඤාහො – ම, PTS.
5. අපසච්චාගමනං – ම, PTS.
6. අවච්ඡදනං – ම.

එහි අවිද්‍යාව ද භවතෘෂ්ණාව ද යන දෙදෙනා මූලක්ලේශයෝ යැ. ලොභය ද්වෙෂය මොහය ද යන තිදෙනා අකුශල මූලයෝ යැ. අනිත්‍යයෙහි නිත්‍යයැ යන සංඥාවිපර්‍යාස චිත්තවිපර්‍යාස දෘෂ්ටිවිපර්‍යාසය ද දුඃඛයෙහි සුඛ යැ යන සංඥා-චිත්ත-දෘෂ්ටිවිපර්‍යාසය ද අනාත්මයෙහි ආත්ම යැ යන සංඥා-චිත්ත-දෘෂ්ටිවිපර්‍යාසය ද අශුභයෙහි ශුභ යැ යන සඤ්ඤා විපල්ලාස චිත්තවිපල්ලාස දිට්ඨිවිපල්ලාසය ද යන මොහු සතර විපල්ලාසයෝ යි.

6-10. එහි අවිද්‍යා නම් : චතුරාර්‍යසත්‍යයෙහි යථාභූත වැ නො දැනීම යැ. මේ අවිද්‍යා යි. භවතෘෂ්ණා නම් : භවයන්හි යම් රාගයෙක් දැඩි වූ රාගයෙක් ඊර්ෂ්‍යාවක් මුසපත්වීමෙක් ප්‍රාර්ථනාවක් ඇලීමෙක් බැසැගෙන සිටීමෙක් නො හැරීමෙක් වේ ද මේ භවතෘෂ්ණා යි.

එහි ලොභඅකුශලමූලය කවර : ලොභ නම් : ඒ ඒ පර (මෙරමා අයත්) වස්තූන්හි පරද්‍රව්‍යයන්හි පරස්ථානයන්හි පරසම්පත්හි මෙරමා අයත්වූයෙහි යම් ලොභයෙක් ලොභාකාරයෙක් ඉච්ඡායෙක් මූර්ඡායෙක් ප්‍රාර්ථනායෙක් නන්දියෙක් බැසැගෙන සිටීමෙක් නො හැරීමෙක් වේ ද, මේ ලොභඅකුශලමූල යැ, තෙල කවරක්හුගේ මූලයැ යත් : කාය කර්ම වාක්කර්ම මනඃකර්ම වූ ලොභයෙන් උපන් අකුශලයාගේ ද සම්ප්‍රයුක්තවූ චිත්ත චෛතසිකධර්මයන්ගේ ද මූල යි.

එහි ද්වෙෂ අකුශලමූලය කවර : සත්ත්වයන් කෙරෙහි යම් ආඝාතයෙක් නොඉවසීමෙක් නොසතුටෙක් ව්‍යාපාදයෙක් ප්‍රද්වෙෂයෙක් අනර්ථ කැමැතිබවෙක් චිත්තයාගේ ප්‍රතිඝාත යෙක් වේ ද මේ ද්වෙෂඅකුශල මූල යැ. තෙල කවරක්හුගේ මූල යැ යත් : කායකර්ම වාක්කර්ම මනඃකර්ම වූ දේවෂයෙන් උපන් අකුශලයාගේ ද සම්ප්‍රයුක්ත වූ චිත්තචෛත ධර්මයන්ගේ ද මූල යි.

එහි මොහඅකුශලමූලය කවර : චතුරාර්‍යසත්‍යයෙහි යම් නොදැනීමෙක් නොදන්මෙක් අනවබොධයෙක් නො විමසා ගැනීමෙක් අප්‍රතිවෙධයෙක් මොහයෙක් මුළාවනා අයුරෙක් සම්මොහයෙක් සම්මොහාකාරයෙක් අවිද්‍යාවක් තමසෙක් අන්ධකාරයෙක් ආවරණයෙක් නීවරණයෙක් වැයීමෙක් හාත්පසින් වැසීමෙක් කුශලධර්මයන් බැහැර කොට යැමෙක් වේ ද මේ මොහඅකුශලමූල යැ. තෙල කවරක්හුගේ මූල යැ යත් : කායකර්ම වාක්කර්ම මනඃකර්ම වූ මොහයෙන් උපන් අකුශලයාගේ ද තත්සම්ප්‍රයුක්ත වූ චිත්තචෛතසික ධර්මයන්ගේ ද මූල යි.

6-11. එහි විපර්‍යාසයෝ දතයුත්තාහ, විපර්‍යාසයන්ගේ වස්තු දතයුතු යැ, යමක් විපර්‍යාස වන්නේ ද එය දතයුතු යි.

එහි එක් විපර්‍යාසයෙක් වෙයි, තුන් විපර්‍යාස කෙනෙක් ද වෙති, විපර්‍යාස වස්තු සතරක් වෙත්.

කතමො එකො විපල්ලාසො ච, යෙන පටිපක්ඛෙන විපල්ලාසිතං ගණ්හාති අනිච්චෙ නිච්චන්ති දුක්ඛෙ සුඛන්ති අනත්තනි අත්තාති අසුභෙ සුභ'න්ති, අයං එකො විපල්ලාසො.

කතමානි චත්තාරි විපල්ලසවත්ථූනි, කායො වෙදනා චිත්තං ධම්මා ච, ඉමානි චත්තාරි විපල්ලාසවත්ථූනි.

කතමානි තීණි විපල්ලාසානි, සඤ්ඤා චිත්තං දිට්ඨි ච. ඉමානි තීණි විපල්ලාසානි.

තත්ථ[1] මනාපිකෙ චක්ඛුම්හි ඉන්ද්‍රියත්ථෙ[2] වණ්ණායතනෙ වා යො නිමිත්තස්ස උග්ගාහො, අයං සඤ්ඤාවිපල්ලාසො. තත්ථ විපරීතචිත්තස්ස චක්ඛුම්හි සති විඤ්ඤත්ති, අයං චිත්තවිපල්ලාසො. තත්ථ විපරීතචිත්තස්ස තම්හි රූපෙ අසුභෙ සුභ'න්ති යා ඛන්ති රුචි උපෙක්ඛනා නිජ්ඣායො දිට්ඨි නිදස්සනං සන්තීරණා, අයං දිට්ඨිවිපල්ලාසො.

තත්ථ චතුබ්භෙදෙන කායෙසු[3] ද්වාදස විපල්ලාසා භවන්ති : තයො කායෙ තයො වෙදනාය තයො චිත්තෙ තයො ධම්මෙ[4] චත්තාරො සඤ්ඤාවිපල්ලාසා චත්තාරො චිත්තවිපල්ලාසා චත්තාරො දිට්ඨිවිපල්ලාසා, ආයතනුපච්චයතො චක්ඛුවිඤ්ඤාණසඤ්ඤාසම්බන්ධිස්ස රූපෙසු ද්වාදස විපල්ලාසා, යාව මනොවිඤ්ඤාණසඤ්ඤා[5]සම්බන්ධිස්ස ධම්මෙසු ද්වාදස විපල්ලාසා, ඡ ද්වාදසකා චත්තාරි විපල්ලාසා භවන්ති. ආරම්මණ-නානත්තතො හි අපරිමිතසඞ්ඛ්‍යානං සත්තානං අපරිමිතසඞ්ඛ්‍යා විපල්ලාසා භවන්ති හීනුක්කට්ඨමජ්ඣිමතාය.

6-12. තත්ථ පඤ්චක්ඛන්ධා චත්තාරි අත්තභාවවත්ථූනි භවන්ති : යො රූපක්ඛන්ධො සො කායො අත්තභාවවත්ථු, යො වෙදනාක්ඛන්ධො සො වෙදනා අත්තභාවවත්ථු, යො සඤ්ඤාක්ඛන්ධො ච සඞ්ඛාරක්ඛන්ධො ච තෙ ධම්මා අත්තභාවවත්ථු. යො විඤ්ඤාණක්ඛන්ධො සො චිත්තං අත්තභාවවත්ථු, ඉති පඤ්චක්ඛන්ධා චත්තාරි අත්තභාවවත්ථූනි. තත්ථ කායෙ අසුභෙ සුභ'න්ති විපල්ලාසො භවති, එවං වෙදනාසු චිත්තෙ ධම්මෙසු ච අත්තවිපල්ලාසො භවති.

තත්ථ චතුන්නං විපල්ලාසානං සමුග්ඝාතනත්ථං භගවා චත්තාරො සතිපට්ඨානෙ දෙසෙති පඤ්ඤපෙති, කායෙ කායානුපස්සී විහරන්තො[6] අසුභෙ සුභ'න්ති විපල්ලාසං සමුග්ඝාතෙති. එවං වෙදනාසු - චිත්තෙ - ධම්මෙසු ච කාතබ්බං.

6-13. තත්ථ අන්ධකාරතිමිසා අප්පටිවෙධලක්ඛණා අවිජ්ජා, තස්සා විපල්ලාසා පදට්ඨානං. අජ්ඣොසානලක්ඛණා තණ්හා, තස්සා පියරූප-සාතරූපං පදට්ඨානං. අත්තාසාවඤ්චනලක්ඛණො ලොභො, තස්ස අදින්නාදානං පදට්ඨානං. ඉධ විවාදලක්ඛණො දොසො, තස්ස

1. කතමා - PTS, අයිකා.
2. ඉන්ද්‍රියවත්ථෙ - ම.
3. කායො සා - PTS.
4. විපල්ලාසපදට්ඨානං - ම.
5. මහාසඤ්ඤා - ම, PTS.
6. විහරතො - ම.

එක විපර්‍යාසය කවරේ යත් : ප්‍රතිපක්ෂ වූ යමක් හේතු කොටගෙන අනිත්‍යයෙහි නිත්‍ය යැ දුකෙහි සුව යැ අනාත්මයෙහි ආත්ම යැ අශුභයෙහි ශුභ යැ යි විපර්‍යාස්ත ව ගනී ද මේ එක විපල්ලාසය යැ.

සතර විපර්‍යාසවස්තු කවරහ : කාය වෙදනා චිත්ත ධම්ම යන මේ සතර විපල්ලාස වස්තූහු වෙත්.

තුන් විපර්‍යාසයෝ කවරහ : සඤ්ඤා චිත්ත දිට්ඨි ද යන මොහු තුන් විපර්‍යාසයෝ යි.

එහි මනවඩන වස්තුයෙහි ඉන්ද්‍රියාර්ථයෙහි පැහැසටහනෙහි හෝ නිමිත්ත පිළිබඳව යම් දැඩිව ගැනීමෙක් වේ ද මේ සංඥාවිපර්‍යාස යැ. එහි විපර්‍යාස්ත සිත් ඇත්තහුගේ වස්තු ඇති කල්හි යම් විඥප්තියක් වේ ද මේ චිත්තවිපර්‍යාස යැ, එහි විපරීත සිත් ඇත්තහුගේ ඒ රූපයෙහි ලා අශුභයෙහි ශුභ යැයි යම් ඉවසීමෙක් රුචියක් උපෙක්ෂණයක් නිශ්චයෙක් දෘෂ්ටියක් නිදර්ශනයෙක් සන්තීරණයෙක් වේ ද මේ දෘෂ්ටිවිපර්‍යාස යි.

එහි වස්තුභෙදයෙන් කයෙහි දොළොස් විපර්‍යාස කෙනෙක් වෙති : කයෙහි තුනෙක, වෙදනායෙහි තුනෙක, චිත්තයෙහි තුනෙක ධර්මයෙහි තුනෙකි. සංඥාවිපර්‍යාසයෝ සතරදෙනෙක, චිත්තවිපර්‍යාසයෝ සතරදෙනෙක, දෘෂ්ටිවිපර්‍යාසයෝ සතරදෙනෙකි. ආයතනයන්ගේ උපචය වශයෙන් චක්ෂුර්විඥානසංඥායෙන් යුක්ත වූවහුට රූපවිෂයෙහි දොළොස් විපර්‍යාස කෙනෙක් වෙති. (යාව) මනොවිඥානසංඥාසමඞ්ගීහට ධර්මවිෂයෙහි දොළොස් විපර්‍යාස කෙනෙක් වෙති. ෂඩ් ද්වාදශකයෝ සතර විපර්‍යාසයෝ වෙත්. ආලම්බන නානාත්වයෙන් වැලිත් අපරිමිත සංඛ්‍යා ඇති සත්ත්වයන්ගේ හීනොත්කෘෂ්ට මධ්‍යමතායෙන් අපරිමිත සංඛ්‍යා ඇති විපර්‍යාසයෝ වෙත්.

6-12. එහි පඤ්චස්කන්ධයෝ සතර ආත්මභාවවස්තු වෙති : යම් රූපස්කන්ධයෙක් වේ ද හේ කාය සංඛ්‍යාත ආත්මභාව වස්තු යැ, වෙදනාස්කන්ධය වෙදනා සංඛ්‍යාත ආත්ම භාවවස්තු යැ, සංඥාස්කන්ධය ද සංස්කාරස්කන්ධ ය ද යන මොහු ධම්ම සංඛ්‍යාත ආත්ම භාවවස්තු යැ, විඥානස්කන්ධය චිත්ත සංඛ්‍යාත ආත්මභාව වස්තු යි. මෙසේ පඤ්ච ස්කන්ධයෝ සතර ආත්මභාව වස්තු වෙත්. ඔවුන් කෙරෙහි කායවස්තුයෙහි අශුභයෙහි ශුභ යැ' යන විපර්‍යාසය වෙයි. මෙ පරිදි වෙදනා-චිත්ත- ධර්මවස්තූන්හි ද ආත්ම විපර්‍යාසය වේ.

එහි සතර විපර්‍යාස වස්තූන්ගේ සමුද්ඝාතනය පිණිස බුදුහු සතර සත්පට්ඨානයන් දෙසනසේක, පනවන සේක. කයෙහි කය අනුව බලමින් වාසයකරනුයේ අශුභයෙහි ශුභ යැ යන විපර්‍යාසය නසයි. මෙසේ වෙදනා චිත්ත-ධර්මයන්හි දු විස්තර කළයුතු යි.

6-13. එහි අන්ධකාරතමිස්‍ර වූ අවිද්‍යාව අප්‍රතිවෙධය ලක්ෂණ කොට ඇත්තී යැ. ඒ අවිද්‍යාවට විපර්‍යාසයෝ ආසන්නකාරණ යැ. තෘෂ්ණාව බැසගෙන (ගිලගෙන) සිටීම ලක්ෂණ යැ ප්‍රියස්වභාව මධුරස්වභාව ඊට පදට්ඨාන යි. ලෝභය ආත්මාසය වඤ්චා කිරීම ලක්ෂණ යැ ඊට අදත්තාදනය පදට්ඨාන යි. ද්වෙෂය මෙහි විවාද කිරීම ලක්ෂණ යැ

පාණාතිපාතො පදට්ඨානං. චක්ඛුවිප්පටිපත්තිලක්ඛණො මොහො, තස්ස මිච්ඡාපටිපත්තිපදට්ඨානං. සඞ්ඛතානං ධම්මානං අවිනාසග්ගහනලක්ඛණා නිච්චසඤ්ඤා, තස්සා සබ්බසඞ්ඛාරා පදට්ඨානං. සාසවඵස්සොපගමන-ලක්ඛණා සුඛසඤ්ඤා, තස්සා මමිඞ්කාරො[1] පදට්ඨානං. ධම්මෙසු උපගමනලක්ඛණා අත්තසඤ්ඤා, තස්සා අහිඞ්කාරො[2] පදට්ඨානං. වණ්ණසඞ්ගහනලක්ඛණා සුභසඤ්ඤා, තස්සා ඉන්ද්‍රියඅසංවරො පදට්ඨානං. එතෙහි නවහි පදෙහි උද්දිට්ඨෙහි සබ්බො අකුසලපක්ඛො නිද්දිට්ඨො භවති, සො ච ඛො බහුස්සුතෙන සක්කා ජානිතුං. නො අප්පස්සුතෙන, පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙන, යුත්තෙන නො අයුත්තෙන.

6-14. නව පදානි කුසලානි යත්ථ සබ්බො කුසලපක්ඛො සඞ්ගහං[3] සමොසරණං ගච්ඡති[4] කතමානි නව පදානි: සමථො විපස්සනා අලොභො අදොසො අමොහො අනිච්චසඤ්ඤා දුක්ඛසඤ්ඤා අනත්තසඤ්ඤා අසුභසඤ්ඤා ච.

තත්ථ කතමො සමථො: යා චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති ඨානං පට්ඨානං උපට්ඨානං සමාධි සමාධානං අවික්ඛෙපො අවිප්පටිසාරො වූපසමො මනසො[5] එකග්ගං චිත්තස්ස, අයං සමථො.

තත්ථ කතමා විපස්සනා: ඛන්ධෙසු වා ධාතූසු වා ආයතනෙසු වා නාමරූපෙසු වා පටිච්චසමුප්පාදෙසු වා පටිච්චසමුප්පන්නෙසු වා ධම්මෙසු දුක්ඛෙ වා[6] සමුදයෙ වා[7] නිරොධෙ වා මග්ගෙ වා කුසලාකුසලෙසු වා ධම්මෙසු සාවජ්ජානවජ්ජෙසු වා කණ්හසුක්කෙසු වා සෙවිතබ්බාසෙවි-තබ්බෙසු වා යො යථාභූතං විචයො පවිචයො වීමංසා පරිවීමංසා ගාහනා අග්ගාහනා පරිග්ගාහනා චින්තනා පරිචින්තනා[8] තුලනා උපපරික්ඛා ඤාණං විජ්ජා[9] චක්ඛු බුද්ධි මෙධා පඤ්ඤා ඔභාසො ආලොකො ආභා පභා ඛග්ගො නාරාචො[10] ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො සම්මාදිට්ඨි මග්ගඞ්ගං, අයං විපස්සනා.

කෙනෙසා[11] විපස්සනා ඉති වුච්චති: විවිධා වා එසා පස්සනාති[12] තස්මා එසා විපස්සනාති වුච්චති. ද්විධා චෙසා හි විපස්සනා ධම්ම-විපස්සනාති.

ද්විධා ඉමාය පස්සති: සුභඤ්ච අසුභඤ්ච කණ්හඤ්ච සුක්කඤ්ච සෙවිතබ්බඤ්ච අසෙවිතබ්බඤ්ච කම්මඤ්ච විපාකඤ්ච බන්ධඤ්ච විමොක්ඛඤ්ච ආචයඤ්ච අපචයඤ්ච පවත්තිඤ්ච නිවත්තිඤ්ච සංකිලෙසඤ්ච වොදානඤ්ච එවං විපස්සනාති වුච්චති. අථ වා 'වි'ඉති උපසග්ගො, පස්සනාති අත්ථො, තස්මා විපස්සනාති වුච්චතෙ, අයං විපස්සනා.

---

1. මමඞ්කාරො – ම, PTS.
2. අහඞ්කාරො – ම, PTS.
3. සඞ්ගහො – ම.
4. ගච්ඡන්ති – ම.
5. මානසො – ම, PTS.
6. දුක්ඛෙසු වා – ම, PTS.
7. සමුදයෙසු වා – ම, PTS.
8. පරිචින්තනා – ම, PTS.
9. විජ්ජා වා – ම, PTS.
10. නාරජෙජා – PTS.
11. තෙනෙසා – ම, – PTS.
12. විපස්සනාති – ම, PTS.

ඊට ප්‍රාණවධය පදට්ඨාන යි. වස්තූන්ගේ වරදවාගැනීම ලක්ෂණ කොට ඇත්තේ යැ මෝහය, ඊට මිථ්‍යාප්‍රතිපත්තිය පදට්ඨාන යි. නිත්‍යසංඥව සංඛතධර්මයන්ගේ අවිනාශග්‍රහණය ලක්ෂණ යැ, ඊට සියලු සංස්කාරයෝ පදට්ඨාන යි. සුඛසංඥව සාශ්‍රව ස්පර්ශයන් දැඩිව ගැනීම ලක්ෂණ යැ, ඊට මමංකාරය පදට්ඨාන යි. ආත්මසංඥව ධර්ම විෂයෙහි දැඩිව ගැනීම ලක්ෂණ යැ, ඊට අහංකාරය පදට්ඨාන යි. ශුභසංඥව පැහැසටහන මොනවට ගැනීම ලක්ෂණ යැ, ඊට ඉන්ද්‍රියාසංවරය පදට්ඨාන යි. උද්දෙස කළ කෙල නවපදයන්ගෙන් සියලු අකුශල පක්ෂය නිර්දෙශ කරන ලද්දේ වෙයි. හෙද වනාහි බහුශ්‍රුත පුඟුලක්හු විසින් දැනගන්නට හැකි වෙයි. අල්පශ්‍රැතකයක්හු විසින් නො දත හැකි වෙයි. ප්‍රාඥයකු විසින් දත හැක්ක, දුෂ්ප්‍රාඥයකු විසින් නො දතහැක්ක. (යොගයෙහි) යෙදුණක්හු විසින් දතහැක්ක, නො යෙදුණහු විසින් නො දතහැකි වේ.

6–14. සියලු කුශලපක්ෂය සංග්‍රහයට එක්වීමට යන කුශල නවපද කෙනෙක් වෙති. කවර නවපද කෙනෙක යත් : සමථ විපස්සනා අලොභ අදෙස අමොහ අනිච්චසඤ්ඤා දුක්ඛසඤ්ඤා අනත්තසඤ්ඤා, අසුභසඤ්ඤා ද යන මොහු යි.

එහි සමථ කවරෙ යත් : චිත්තයාගේ යම් (අරමුණෙහි) සිටීමෙක් මොනොවට සිටීමෙක් බැසගෙන සිටීමෙක් නැවැත්මෙක් පිහිටා සිටීමෙක් එළැඹ සිටීමෙක් සමාධියෙක් සමොධානයෙක් අවික්ෂෙපයෙක් අවිප්‍රතිසාරයෙක් සිතෙහි සන්හිඳීමෙක් සිතෙහි එකඟ බවෙක් වේ ද මේ සමථ යි.

එහි විපස්සනා කවර යත් : ස්කන්ධයන්හි හෝ ධාතූන්හි ආයතනයන්හි–නාමරූපයෙහි– පටිච්චසමුප්පාදයෙහි – පටිච්චසමුප්පන්නධර්මයන්හි – දුක්ඛසත්‍යයෙහි – සමුදයසත්‍යයෙහි– නිරොධසත්‍යයෙහි–මාර්ගසත්‍යයෙහි–කුශලාකුශලධර්මයන්හි – සාවද්‍යානවද්‍යධර්මයන්හි– කෘෂ්ණශුක්ලධර්මයන්හි–සෙවිතව්‍යාසෙවිතව්‍යයෙහි හෝ යථාභූත ව යම් විමසීමෙක් වෙසෙසින් විමසීමෙක් විමංසායෙක් පරිවීමංසායෙක් ගැනීමක් වෙසෙසින් ගැනීමක් හාත්පසින් ගැනීමක් සිතින් හාත්පසින් සිතීමක් තුලනයක් පරීක්ෂාවක්, ඥානයක් විද්‍යාවක් නුවණැසක් බුද්ධියක් මෙධායෙක් ප්‍රඥවක් අවභාසයෙක් ආලොකයෙක් ආභායෙක්, ප්‍රභායෙක් ප්‍රඥබඩගයෙක් ප්‍රඥ නමැති හීයෙක් ධම්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් සම්මා– දිට්ඨියක් මාර්ගාඞ්ගයෙක් වේ ද මේ විපස්සනා යි.

කවර කරුණෙකින් 'මේ විපස්සනා' යී කියනු ලැබේ ද යත් : (අනිත්‍යාදි විසින්) විවිධා කාරයෙන් දකී නුයි එකරුණෙන් මේ 'විපස්සනා' යි කියනු ලැබේ. තවද මේ විදර්ශනාව දෙවැදැරුම් වන්නීය : (ධම්මවිපස්සනාති ...?)

මේ විදර්ශනාඥනායෙන් දෙපරිද්දෙකින් දකී : ශුභ–අශුභ, කෘෂ්ණ-ශුකල, සේවිතව්‍ය– අසෙවිතව්‍ය, කර්ම–විපාක, බන්ධන– විමොක්ෂ, ආචය– අපචය, ප්‍රවෘත්ති– නිවෘත්ති සංක්ලෙෂ– ව්‍යවදාන දැයි මෙසේ දෙපරිද්දෙකින් දකී නුයි 'විපස්සනා' යි කියනු ලැබේ. නොහොත් 'වි' යනු උපසර්ග යැ, (විවිධාකාරයෙන්) දැකීම යැ යන අර්ථ යි. එහෙයින් විපය්සනා' යි කියනු ලැබේ. මේ 'විපස්සනා' යි.

6-15 තත්ථ ද්වෙ රොගා සත්තානං : අවිජ්ජා ච භවතණ්හා ච, එතෙසං ද්වින්නං රොගානං නිඝාතාය භගවතා ද්වෙ භෙසජ්ජානි වුත්තානි : සමථො ච විපස්සනා ච, ඉමානි ද්වෙ භෙසජ්ජානි පටිසෙවෙන්තො[1] ද්වෙ අරොගෙ සච්ඡිකරොති : රාගවිරාගං චෙතොවිමුත්තිං අවිජ්ජාවිරාගං ච පඤ්ඤාවිමුත්තිං. තත්ථ තණ්හාරොගස්ස සමථො භෙසජ්ජං, රාගවිරාගා චෙතොවිමුත්ති අරොගං. අවිජ්ජාරොගස්ස විපස්සනා භෙසජ්ජං, අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්ති අරොගං.

එවං හි භගවා චාහ : "ද්වෙ ධම්මා පරිඤ්ඤෙය්‍යා : නාමං ච රූපං ච ද්වෙ ධම්මා පහාතබ්බා : අවිජ්ජා ච භවතණ්හා ච, ද්වෙ ධම්මා භාවෙතබ්බා : සමථො ච විපස්සනා ච, ද්වෙ ධම්මා සච්ඡිකාතබ්බා : විජ්ජා ච විමුත්ති චා"ති.

තත්ථ සමථං භාවෙන්තො රූපං පරිජානාති, රූපං පරිජානන්තො තණ්හං පජහති, තණ්හං පජහන්තො රාගවිරාගා චෙතොවිමුත්තිං සච්ඡිකරොති. විපස්සනං භාවෙන්තො නාමං පරිජානාති, නාමං පරිජානන්තො අවිජ්ජං පජහති, අවිජ්ජං පජහන්තො අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්තිං සච්ඡිකරොති.

යදා භික්ඛුනො ද්වෙ ධම්මා පරිඤ්ඤාතා භවන්ති නාමඤ්ච රූපඤ්ච, තදස්ස[2] ද්වෙ ධම්මා පහීනා භවන්ති අවිජ්ජා ච භවතණ්හා ච, ද්වෙ ධම්මා භාවිතා භවන්ති සමථො ච විපස්සනා ච, ද්වෙ ධම්මා සච්ඡිකතා භවන්ති විජ්ජා ච විමුත්ති ච. එත්තාවතා භික්ඛු කතකිච්චො භවති. එසා සොපාදිසෙසා නිබ්බානධාතු. තස්ස ආයුපරියාදානා ජීවිතින්ද්‍රියස්ස උපරොධා ඉදං ච දුක්ඛං නිරුජ්ඣති, අඤ්ඤං ච දුක්ඛං න උප්පජ්ජති. තත්ථ යො ඉමෙසං ඛන්ධානං ධාතුආයතනානං අප්පටිසන්ධි අපාතුභාවො, අයං අනුපාදිසෙසා නිබ්බානධාතු.

6-16. තත්ථ කතමං අලොභො කුසලමූලං : යංධාතුතො අලොභො අලුබ්භනා අලුබ්භිතත්තං අනිච්ඡා අපත්ථනා අකන්තතා අනජ්ඣොසානං, අයං අලොභො කුසලමූලං, කස්සෙතං මූලං : අලොභජස්ස කුසලස්ස කායකම්මස්ස වචීකම්මස්ස මනොකම්මස්ස තංසම්පයුත්තානං ච චිත්ත-චෙතසිකානං ධම්මානං මූලං. අථ වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො කුසලන්ති වුච්චති, සො තිණ්ණං මග්ගඞ්ගානං මූලං, කතමෙසං තිණ්ණං : සම්මාසඞ්කප්පස්ස සම්මාවායාමස්ස සම්මාසමාධිස්ස ච, ඉමෙසං මූලන්ති තස්මා කුසලමූලන්ති වුච්චති.

තත්ථ කතමං අදොසො කුසලමූලං : යො[4] සත්තෙසු ච සඞ්ඛාරෙසු ච අනාඝාතො[5] අප්පටිඝාතො අබ්‍යාපත්ති අබ්‍යාපාදො අදොසො මෙත්තා මෙත්තායනා අත්ථකාමිතා[6] හිතකාමිතා චෙතසො පසාදො, අයං අදොසො කුසලමූලං. කස්සෙතං මූලං : අදොසජස්ස කුසලස්ස කායකම්මස්ස වචීකම්මස්ස මනොකම්මස්ස තංසම්පයුත්තානං ච චිත්තචෙතසිකානං ධම්මානං මූලං. අථ වා තිණ්ණං මග්ගඞ්ගානං මූලං, කතමෙසං තිණ්ණං : සම්මාවාචාය සම්මාකම්මන්තස්ස සම්මාආජීවස්ස ච ඉමෙසං තිණ්ණං මග්ගඞ්ගානං මූලං, තස්මා කුසලමූලන්ති වුච්චති.

---

1. පටිසෙවෙන්තො – මජ්සං, PTS.
2. තථාස්ස – ම, PTS.
3. සච්ඡිකාතබ්බා – මජ්සං.
4. යා – මජ්සං, PTS.
5. අනඝාතො – ම, අනග්ඝාතො – PTS.
6. අත්තකාමතා – PTS.

6–15. එහි සත්ත්වයන්ට රෝගයෝ දෙදෙනෙකි : අවිද්‍යාව ද භව-තෘෂ්ණාව ද යන මේ යි. මේ රෝගයන් දෙදෙනාගේ නැසීම පිණිස භාග්‍යවතුන් විසින් සමථ යැ විපස්සනා යැ යි බෙහෙත් දෙකක් වදරන ලද යැ, මේ බෙහෙත් දෙක සෙවනය කරනුයේ රාගවිරාග චෙතොවිමුත්තිය ද අවිජ්ජාවිරාගපඤ්ඤාවිමුක්තිය ද යන ආරොග්‍යතා දෙක ප්‍රත්‍යක්ෂ කෙරෙයි. එහි තෘෂ්ණාරොගයට සමථය බෙහෙතැ, රාගවිරාග චෙතොවිමුත්තිය ආරොග්‍ය යැ. අවිද්‍යාරොගයට විදර්ශනාව බෙහෙතැ, අවිද්‍යාවිරාග ප්‍රඥවිමුක්තිය ආරොග්‍යය වේ.

එහෙයින් මැ බුදුහු ද වදළහ : ''නාමය ද රූපය ද යන ධර්මයෝ දෙදෙන දතයුත්තාහු යැ, අවිජ්ජා ද භවතණ්හා ද යන ධර්මයෝ දෙදෙන ප්‍රහීණ කළයුත්තාහ, සමථය ද විපස්සනා ද යන ධර්මයෝ දෙදෙන වැඩියැයුත්තාහ. විජ්ජා ද විමුත්ති ද යන ධර්මයෝ දෙදෙන පසක් කළයුත්තාහ''යි

එහි සමථය වඩනුයේ රූපය පිරිසිඳ දනගනී, රූපය දනගනුයේ තෘෂ්ණාව දුරු කෙරෙයි, තෘෂ්ණාව දුරුලනුයේ රාගවිරාගචෙතොවිමුත්තිය පසක් කෙරෙයි. විදර්ශනාව වඩනුයේ නාමය පිරිසිඳ දනගනී, නාමය දනගනුයේ අවිද්‍යාව දුරු කෙරෙයි, අවිද්‍යාව දුරු කරනුයේ අවිජ්ජාවිරාග පඤ්ඤාවිමුක්තිය පසක් කෙරෙයි.

යම් කලෙක භික්ෂුහු විසින් නාමය ද රූපය ද යන ධර්මයෝ දෙදෙන පරිඥත වූවාහු වෙත් ද එකල්හි ඔහු විසින් අවිද්‍යාව ද භවතෘෂ්ණාව ද යන ධර්මයෝ දෙදෙන ප්‍රහීණ වූවාහු වෙති, සමථය ද විපස්සනාව ද යන ධර්මයෝ දෙදෙන වඩන ලද්දහු වෙති. විද්‍යාව ද විමුක්තිය ද යන ධර්මයෝ දෙදෙන පසක් කරනලද්දහු වෙත්. මෙතෙකින් මහණ (සිවුමගින්) කළ කිස ඇතියේ වෙයි, මෝ සොපධිසෙසනිබ්බානධාතු යැ, ඔහුගේ ආයු ගෙවීමෙන් ජීවිතෙන්ද්‍රියයාගේ නිරොධයෙන් මේ පඤ්චස්කන්ධදුඃඛය ද නිරුද්ධ වෙයි. අන්‍යත් ස්කන්ධදුඃඛයකුදු නූපදී. එහි මේ ස්කන්ධයන්ගේ ද ධාතු ආයතනයන්ගේ ද යම් නිරොධයෙක් ව්‍යුපශමයෙක් වේ ද අන්‍ය ස්කන්ධ ධාතුආයතනයන්ගේ ද අප්‍රතිසන්ධිය නො පහළවීම වේ, මේ අනුපධිසෙසනිබ්බානධාතු යි.

1–16. එහි අලොභකුශලමූලය කවරැ : යම් ස්වභාව වූ අලොභයෙක් අලොභාකාරයෙක් අලුබ්ධ බවෙක් ආශා රහිත බවෙක් නො පැතීමෙක් නො කැමැත්තෙක් බැසැගෙනැ නො සිටිමෙක් වේ ද, මේ අලොභ සංඛ්‍යාත කුශලමූල යි. තෙල කවරක්හුගේ මූලය යැ යත් : කායකර්ම වාක්කර්ම මනඃකර්ම වූ අලොභයෙන් උපන් කුශලයාගේ ද තත්සම්ප්‍රයුක්ත වූ චිත්තචෛතසිකයන්ගේ ද මූල යැ. නොහොත් ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගය කුශල යයි කියනු ලැබේ. ඒ අෂ්ටාඞ්ගික ආර්‍ය්‍යමාර්ගය මාර්ගාඞ්ග තිදෙනකුන්ගේ මූල යැ. කවර තිදෙනකුන්ගේ ද යත් : සම්මාසංකප්පය සම්මාවායාමය හා සම්මාසමාධිහුගේ ද යන මේ තිදෙනාගේ මූල යි. එහෙයින් කුශලමූල යයි කියනු ලැබේ.

එහි අදෙසකුසලමූලය කවරැ : සත්වයන් කෙරෙහි හෝ සංස්කාරයන් කෙරෙහි හෝ යම් නො ගැටීමෙක් අප්‍රතිඝාතයෙක් අව්‍යාපන්නබවක් අව්‍යාපාදයෙක් අද්වෙෂයෙක් මෛත්‍රියක් මෛත්‍රි කරන අයුරෙක් වැඩ කැමැති බවෙක් හිත කැමැති බවෙක් චිත්තයාගේ ප්‍රසාදයෙක් වේ ද මේ අදෙෂකුශලමූල යැ, තෙල කවරක්හුගේ මූල යැ යත් : කායකර්ම වාක්කර්ම මනඃකර්ම වූ අදෙෂයෙන් උපන් කුශලයාගේ ද තත්සම්ප්‍රයුක්ත වූ චිත්ත චෛතසිකධර්මයන්ගේ ද මූල යැ. නොහොත් තුන් මාර්ගාඞ්ග කෙනකුන්ගේ මූල යැ, කවර තිදෙනකුන්ගේ ද යත් : සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව යන මේ තුන් මාර්ගාඞ්ගයන්ගේ මූල යි. එහෙයින් කුශලමූල යයි කියනු ලැබේ.

තත්ථ කතමං අමොහො කුසලමූලං: යං චතූසු අරියසච්චෙසු යථාභූතං ඤාණදස්සනං අභිසමයො සම්මා ච පච්චාගමො පටිවෙධො අමොහො අසම්මුය්හනා අසම්මොහො විජ්ජා පකාසො ආලොකො අනාවරණං සෙක්ඛානං කුසලානං ධම්මානං, අයං අමොහො කුසලමූලං. කස්සෙතං මූලං: අමොහජස්ස කුසලස්ස කායකම්මස්ස වචීකම්මස්ස මනොකම්මස්ස තංසම්පයුත්තානං ච චිත්තචෙතසිකානං ධම්මානං මූලං. අථ වා ද්වින්නං මග්ගඞ්ගානං මූලං, කතමෙසං ද්වින්නං: සම්මාදිට්ඨියා ච සම්මාසතියා ච ඉමෙසං ද්වින්නං මග්ගඞ්ගානං මූලං, තස්මා කුසලමූලන්ති වුච්චති. එවං ඉමෙහි, තීහි කුසලමූලෙහි අට්ඨඞ්ගිකො මග්ගො යොජෙතබ්බො.

6-17 තත්ථ කතමා අනිච්චසඤ්ඤා: "සබ්බෙ සඞ්ඛාරා උප්පාද-වයධම්මිනො"ති[1] 'යා සඤ්ඤා සඤ්ජානනා වවත්ථපනා උග්ගාහො, අයං අනිච්චසඤ්ඤා. තස්සා කො නිස්සන්දො: අනිච්චසඤ්ඤාය භාවිතාය බහුලීකතාය අට්ඨසු ලොකධම්මෙසු චිත්තං නානුසන්ධති න සන්ධති න සණ්ඨහති, උපෙක්ඛා වා පටික්කූලතා වා සණ්ඨහති. අයමස්සා නිස්සන්දො

තත්ථ කතමා දුක්ඛසඤ්ඤා: "සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා"ති යා සඤ්ඤා සඤ්ජානනා වවත්ථපනා උග්ගාහො, අයං දුක්ඛසඤ්ඤා තස්සා කො නිස්සන්දො: දුක්ඛසඤ්ඤාය භාවිතාය බහුලීකතාය ආලස්සෙ සම්පමාදෙ විමහයෙ ච චිත්තං නානුසන්ධති න සන්ධති න සණ්ඨහති, උපෙක්ඛා වා පටික්කූලතා වා සණ්ඨහති. අයමස්සා නිස්සන්දො.

තත්ථ කතමා අනත්තසඤ්ඤා: "සබ්බෙ ධම්මා[2] අනත්තා"ති යා සඤ්ඤා සඤ්ජානනා වවත්ථපනා උග්ගාහො, අයං අනත්තසඤ්ඤා. තස්සා කො නිස්සන්දො: අනත්තසඤ්ඤාය භාවිතාය බහුලීකතාය අහඞ්කාරෙ චිත්තං නානුසන්ධති න සන්ධති, මමඞ්කාරෙ[3] න සණ්ඨහති, උපෙක්ඛා වා පටික්කූලතා වා සණ්ඨහති, අයමස්සා නිස්සන්දො.

තත්ථ කතමා අසුභසඤ්ඤා: "සත්තසඞ්ඛාරා අසුභා"ති යා සඤ්ඤා සඤ්ජානනා වවත්ථපනා උග්ගාහො, අයං අසුභසඤ්ඤා. තස්සා කො නිස්සන්දො: අසුභසඤ්ඤාය භාවිතාය බහුලීකතාය සුභනිමිත්තෙන චිත්තං නානුසන්ධති න සන්ධති න සණ්ඨහති, උපෙක්ඛා වා පටික්කූලතා වා සණ්ඨහති, අයමස්සා නිස්සන්දො.

6-18. තත්ථ පඤ්චන්නං ඛන්ධානං පරිඤ්ඤා භගවතා දෙසිතා, යා තත්ථ[4] අසුභසඤ්ඤා රූපක්ඛන්ධස්ස පරිඤ්ඤත්තං දුක්ඛසඤ්ඤා වෙදනාක්ඛ-න්ධස්ස පරිඤ්ඤත්තං, අනත්තසඤ්ඤා සඤ්ඤක්ඛන්ධස්ස සඞ්ඛාරක්ඛන්ධස්ස පරිඤ්ඤත්තං, අනිච්චසඤ්ඤා විඤ්ඤාණක්ඛන්ධස්ස පරිඤ්ඤත්තං.

තත්ථ සමථෙන තණ්හං සමුග්ඝාතෙති, විපස්සනාය අවිජ්ජං සමුග්ඝාතෙති, අදොසෙන දොසං සමුග්ඝාතෙති, අමොහෙන මොහං සමුග්ඝාතෙති. අනිච්චසඤ්ඤාය නිච්චසඤ්ඤං සමුග්ඝාතෙති; දුක්ඛසඤ්ඤාය සුඛසඤ්ඤං සමුග්ඝාතෙති, අනත්තසඤ්ඤාය අත්තසඤ්ඤං සමුග්ඝාතෙති, අසුභසඤ්ඤාය සුභසඤ්ඤං සමුග්ඝාතෙති.

---

1. ... ධම්මිනො ති ච - මජසං.
2. සබ්බෙසු ධම්මෙසු - මජසං.
3. මමඞ්කාරො - ම, PTS.
4. යො තත්ථ - ම, PTS.

එහි අමෝහ කුශලමූලය කවරැ : චතුරාර්‍යසත්‍යයන්හි යථාභූත වූ යම් ඥානදර්ශනයෙක් අභිසමයෙක් මනා අවබෝධයෙක් ප්‍රතිවේධයෙක් අමෝහයෙක් නොමුළාවන අයුරෙක් අසම්මෝහයෙක් විද්‍යාවක් ප්‍රකාශයෙක් ආලෝකයෙක් ශෛක්ෂයන්ගේ කුශලධර්මයන් පිළිබඳ අනාවරණයෙක් වේ ද, මේ අමෝහ කුශලමූල යි. තෙල කවරක්හුගේ මූල යැ යත් : කායකර්ම වාක්කර්ම මනඃකර්ම වූ අමෝහයෙන් උපන් කුශලයාගේ ද තත්සම්ප්‍රයුක්ත වූ චිත්තචෛතසික ධර්මයන්ගේ ද මූල යි. නොහොත් මාර්ගාංගයන් දෙදෙනකුන්ගේ මූල යැ ; කවර දෙදෙනකුන්ගේ ද යත් : සම්මාදිට්ඨිය සම්මාසතිය යන මේ මාර්ගාඞගයන් දෙදෙනාගේ මූල යි. එහෙයින් කුශලමූල යයි කියනු ලැබේ. මෙසේ තුන් කුශලමූලයන්ගෙන් අෂ්ටාඞගිකමාර්ගය යෙදියැයුත්තේ යි.

6–17. එහි අනිත්‍යසංඥා කවර යත් : ''සියලු සංස්කාරයෝ උත්පාදනය හා විනාශය ස්වභාව කොට ඇත්තාහ'යි යම් සංඥාවක් සංජානනාකාරයෙක් නිශ්චය කිරීමෙක් ගැනීමෙක් වේ ද මේ අනිත්‍යසංඥා යි. එහි නිෂ්‍යන්ද (ඵලය) කවරැ : අනිත්‍යසංඥාව වැඩූ කල්හි බහුලීකෘත කල්හි අටලෝදහම්හි සිත නො බැඳෙයි, නො සිටී නො පිහිටයි. උපෙක්ෂාව හෝ ප්‍රතිකූලභාවය හෝ පිහිටයි, මේ ඒ අනිත්‍ය සංඥාවගේ නිෂ්‍යන්ද යි.

එහි දුඃඛසංඥා කවර යත් : 'සියලු සංස්කාරයෝ දුක් වූහ'යි යම් සංඥාවක් දන්නා අයුරක් නිශ්චය කිරීමෙක් දැඩිව ගැනීමෙක් වේ ද, මේ දුඃඛසංඥා'යි. එහි නිෂ්‍යන්ද කවරැ : දුඃඛසංඥාව භාවිත කල්හි බහුලීකෘත කල්හි අලසබැව්හි ප්‍රමාදයෙහි විස්මයෙහි ද සිත නො පිහිටයි, නො සිටී නො පිහිටයි. උපෙක්ෂාව හෝ ප්‍රතිකූලභාවය හෝ පිහිටයි. මේ ඒ දුඃඛසංඥාවගේ නිෂ්‍යන්ද යි.

එහි අනාත්මසංඥා කවරැ : 'සියලු ධර්මයෝ අනාත්මයෝ යයි යම් සංඥාවක් සඤ්ජනනාකාරයක් නිශ්චය කිරීමෙක් උද්ග්‍රාහකයෙක් වේ ද, මේ අනාත්මසංඥා යැ එහි නිෂ්‍යන්ද කවරෙ යැ : අනාත්මසංඥාව භාවිත කල්හි බහුලීකෘත කල්හි අහඞකාරය (මම යැ යන දෘෂ්ටිය) සිත අනුසන්ධාන නො කෙරෙයි. මාගේ යැ යන තෘෂ්ණාව නො පිහිටයි, උපෙක්ෂාව හෝ ප්‍රතිකූලතාව හෝ පිහිටයි. මේ ඒ අනාත්ම සංඥාවගේ නිෂ්‍යන්ද යි.

එහි අශුභසංඥා කවරැ : යත්වසංස්කාරයෝ අශුභ වූහයි යම් සංඥාවක් සඤ්ජානනාකාරයක් නිශ්චය කිරීමක් උද්ග්‍රාහයෙක් වේ ද, මේ අශුභසංඥා යැ. එහි නිෂ්‍යන් ද කවරෙ යැ : අශුභසංඥා ව භාවිත බහුලීකෘත කල්හි ශුභාලම්බනයෙහි සිත නො බැඳෙයි. නො සිටී නො පිහිටයි, උපෙක්ෂාව හෝ ප්‍රතිකූලතාව හෝ බැසගෙන සිටී. මේ ඒ අශුභසංඥාවගේ නිෂ්‍යන්ද යි.

6–18. එහි පඤ්චස්කන්ධයන්ගේ (ත්‍රිවිධ පරිඥායෙන්) පරිඥානය භාග්‍යවතුන් විසින් දෙසන ලද්දේය. එහි යම් අශුභසංඥාවක් ඇද්ද එය රූපස්කන්ධයාගේ පරිඥානය පිණිස යැ, දුඃඛසංඥාව වේදනා ස්කන්ධයාගේ පරිඥානය පිණිස යැ, අනාත්මසංඥාව සංඥාස්කන්ධයාගේ සංස්කාරස්කන්ධයාගේ ද පරිඥානය පිණිස යැ, අනිත්‍යසංඥාව විඥාන ස්කන්ධයාගේ පරිඥානය පිණිස යි.

එහි ශමථයෙන් තෘෂ්ණාව සමුද්ඝාතනය කෙරෙයි. විදර්ශනායෙන් අවිද්‍යාව නසයි. අද්වේෂයෙන් ද්වේෂය නසයි, අමෝහයෙන් මෝහය නසයි. අනිත්‍යසංඥායෙන් නිත්‍යසංඥාව සමුද්ඝාතනය කෙරෙයි. දුඃඛසංඥායෙන් සුඛසංඥාව නසයි, අනාත්මසංඥාවෙන් ආත්මසංඥාව නසයි, අශුභසංඥායෙන් ශුභසංඥාව සමුද්ඝාතනය කෙරෙයි.

චිත්තවික්ඛෙපපටිසංහරණලක්ඛණො සමථො, තස්ස ඣානානි පදට්ඨානං. සබ්බධම්මං යථාභූතං පටිවෙධලක්ඛණා විපස්සනා, තස්සා සබ්බඤෙය්‍යං පදට්ඨානං. ඉච්ඡාපටිසංහරණලක්ඛණො අලොභො, තස්ස අදින්නාදානා වෙරමණී පදට්ඨානං. අව්‍යාපාදලක්ඛණො අදොසො, තස්ස පාණාතිපාතා වෙරමණී පදට්ඨානං. වත්ථුඅප්පටිහතලක්ඛණො අමොහො, තස්ස සම්මාපටිපත්ති පදට්ඨානං. සඞ්ඛතානං ධම්මානං විනාසගහණලක්ඛණා අනිච්චසඤ්ඤා, තස්සා උදයබ්බයො පදට්ඨානං. සාසවඵස්සසඤ්ජානනලක්ඛණා දුක්ඛසඤ්ඤා, තස්සා වෙදනා පදට්ඨානං. සබ්බධම්මඅනුපගමනලක්ඛණා අනත්තසඤ්ඤා, තස්සා ධම්මසඤ්ඤා පදට්ඨානං, විනීලකවිපුබ්බකඋද්ධුමාතකසමුග්ගහණලක්ඛණා අසුභසඤ්ඤා, තස්සා නිබ්බිදා පදට්ඨානං. ඉමෙසු නවසු පදෙසු උපදිට්ඨෙසු සබ්බො කුසලපක්ඛො උපදිට්ඨො භවති, සො ච බහුස්සුතෙන සක්කා ජානිතුං නො අප්පස්සුතෙන, පඤ්ඤවතා, නො දුප්පඤ්ඤෙන, යුත්තෙන නො අයුත්තෙනා'ති.

තත්ථ නිච්චසඤ්ඤාධිමුත්තස්ස අපරාපරං චිත්තං පණාමෙන්තස්ස[1] සතිං අප්පච්චවෙක්ඛක්ඛතො අනිච්චසඤ්ඤා න උපට්ඨාති, පඤ්චසු කාමගුණෙසු සුඛස්සාදාධිමුත්තස්ස ඉරියාපථස්ස අගතිං අප්පච්චවෙක්ඛතො දුක්ඛසඤ්ඤා න උපට්ඨාති, ඛන්ධධාතුආයතනෙසු අත්තාධිමුත්තස්ස නානාධාතුඅනෙකධාතුවිනිබ්භොගං අප්පච්චවෙක්ඛතො අනත්තසඤ්ඤා න උපට්ඨාති, වණ්ණසණ්ඨානාභිරතස්ස කායෙ සුභාධිමුත්තස්ස ච විපටිවජ්ජනා[2] අසුභසඤ්ඤා න උපට්ඨාති.

6 19 අවිප්පටිසාරලක්ඛණා සද්ධා, සද්දහනා පච්චුපට්ඨානං, තස්සා[3] චත්තාරි සොතාපත්තියඞ්ගානි පදට්ඨානං. එවඤ්හි වුත්තං භගවතා: "සද්ධින්ද්‍රියං භික්ඛවෙ කුහිං දට්ඨබ්බං: චතූසු සොතාපත්තියඞ්ගෙසු කුසලෙසු ධම්මෙසු".

සූරා අපටික්ඛෙපනලක්ඛණං විරියින්ද්‍රියං,[4] විරියාරම්භො[5] පච්චුපට්ඨානං, තස්ස අභීතා චත්තාරො සම්මප්පධානා පදට්ඨානං. යථා වුත්තං භගවතා: "විරියින්ද්‍රියං භික්ඛවෙ කුහිං දට්ඨබ්බං: චතූසු සම්මප්පධානෙසු".

සති සරණලක්ඛණා, අසම්මොහපච්චුපට්ඨානා, තස්සා අභීතා චත්තාරො සතිපට්ඨානා පදට්ඨානං. යථා වුත්තං භගවතා: "සතින්ද්‍රියං භික්ඛවෙ කුහිං දට්ඨබ්බං, චතූසු සතිපට්ඨානෙසු"

එකග්ගලක්ඛණො සමාධි, අවික්ඛෙපපච්චුපට්ඨානො, තස්ස චත්තාරි ඣානානි[6] පදට්ඨානං. යථා වුත්තං භගවතා: "සමාධින්ද්‍රියං භික්ඛවෙ කුහිං දට්ඨබ්බං චතූසු ඣානෙසු"

පජානන[7]ලක්ඛණා පඤ්ඤා, භූතත්ථසන්තීරණ[8]පච්චුපට්ඨානා, තස්සා චත්තාරි අරියසච්චානි පදට්ඨානං. යථාවුත්තං භගවතා: "පඤ්ඤින්ද්‍රියං භික්ඛවෙ කුහිං දට්ඨබ්බං චතූසු අරියසච්චෙසු'

1. පණාමෙන්තා – ම, PTS.
2. විපටිවජ්ජනා – ම.
3. තස්ස – ම, PTS.
4. විරියින්ද්‍රියං – ම.
5. විරියින්ද්‍රියාරම්භො – ම.
6. ඤාණානි – ම, PTS.
7. සඤ්ජානන – PTS
8. සන්තීරණා – ම, PTS.

ශමථය අරමුණෙහි චිත්තයාගේ විසිරීම ප්‍රතිසංස්කරණය ලක්ෂණ කොට ඇත්තේ යැ, ඒ ශමථයට ධ්‍යානයෝ ආසන්න කාරණ වෙයි. විදර්ශනාව ස්කන්ධාදි සියලු ධර්ම (අනිත්‍යාදි විසින්) යථාභූතව ප්‍රතිවෙධ කිරීම ලක්ෂණ කොට ඇත්තී යැ, ඊට සියලු දතයුතු දය පදට්ඨාන යි. අලොභය ප්‍රතිසංහරණ ලක්ෂණ යැ, ඒ අලොභයට අදින්නාදාන යෙන් විරමණය ආසන්නකාරණ වෙයි. අදෙසය අව්‍යාපාද ලක්ෂණ යැ, ඊට ප්‍රාණවධ යෙන් වෙන්වීම පදට්ඨාන යි. අමොහය වස්තු විෂයෙහි නො ගැටීම ලක්ෂණ යැ, ඊට සම්‍යක් ප්‍රතිපත්තිය පදට්ඨාන යි. අනිත්‍යසංඥාව සංඛතධර්මයන්ගේ විනාශග්‍රහණය ලක්ෂණ යැ, ඊට උදයව්‍යය පදට්ඨාන යි. දුඃඛසංඥාව සාස්‍රවස්පර්ශය හැඳිනීම ලක්ෂණ කොට ඇත්තේ යැ, ඊට වෙදනාව පදට්ඨාන යි, අනාත්මසංඥාව සියලු ධර්මයන් නො ගැනීම ලක්ෂණ කොට ඇත්තී යැ, ඊට ධර්මසංඥාව පදට්ඨාන යි. අශුභසංඥාව විනීලක විපුබ්බක උද්ධුමාතක අශුභයන් ගැනීම ලක්ෂණ කොට ඇත්තී යැ, ඊට නිබ්බිදාව පදට්ඨාන යි. දක්වන ලද මේ නව පදයන් කෙරෙහි සියලු කුශලපක්ෂය දක්වන ලදුයේ වේ. මෙ ද බහුශ්‍රැතයන්හු විසින් දැනගන්නට හැකි වෙයි, අල්පශ්‍රැතයා විසින් නො දතහැකි වේ. ප්‍රාඥයකු විසින් දතහැකි වෙයි, දුෂ්ප්‍රාඥයා විසින් නො දත හෙයි. යොගයෙහි යෙදුණක්හු විසින් දතහෙයි. යොගයුක්ත නොවූවහු විසින් නො දතහැකි වේ.

එහි නිත්‍යසංඥායෙහි අධිමුක්ති ඇති ඔබ්නොබ සිත මෙහෙයන සිහි නො එළවන්නහුට අනිත්‍යසංඥාව නො වටහයි, පස්කම්ගුණයෙහි සුඛාස්වාදයෙහි ඇලුණු පැවැතුම් ඇති (ලොභාදි) අගය නො සිතන්නහුට දුඃඛසංඥාව නො වටහයි. ස්කන්ධ ධාතු ආයතනයන්හි ආත්ම යයි. අධිමුක්ති ඇති නානාධාතු අනෙකධාතුවිනිර්භොගය නො සිතන්නහුට අනාත්මසංඥාව නො වටහයි. පැහැසටහන්හි ඇලුණහුට ද (කෙලෙස් විසින්) ශුභයෙහි ගිජු වූවහුට ද වෙසෙසින් පිළසන් වූ අශුභසංඥාව නො වටහයි.

6-19. ශ්‍රද්ධාව නො මකුබව ලක්ෂණ කොට ඇත්තිය, හැදැහීම වැටහීම කොට ඇත්තියැ, සතර සොතාපත්තියඞ්ගයෝ ඒ ශ්‍රද්ධාවට ආසන්නකාරණ යි. භාග්‍යවතුන් විසින් මෙසේ වදරන ලද : ''මහණෙනි, සද්ධින්ද්‍රිය කොහි දතයුතු යැ : කුශලධර්ම වූ සතර සොතපත්තියඞ්ගයන්හි දතයුතු'' යැයි.

විරියින්ද්‍රිය යුරබව පිළිකෙව් නො කිරීම ලක්ෂණ කොට ඇත්තේ යැ, වීයර්‍ාරම්භය වැටැහීම වෙයි, ඊට අතීත වූ සතර සම්‍යක් ප්‍රධානයෝ පදට්ඨාන යි. භාග්‍යවතුන් විසින් මෙසේ වදරන ලද : ''මහණෙනි, විරියින්ද්‍රිය කොහි දතයුතු යැ : සතර සම්‍යක් ප්‍රධානයන්හි දතයුතු'' යි.

සතිය සිහිකිරීම ලක්ෂණ කොට ඇත්තී යැ, මුළා නො වීම වැටැහෙනු වෙයි. ඒ ස්මෘති යට අතීත වූ සතර සතිපට්ඨානයෝ ආසන්නකාරණ වෙයි. භාග්‍යවතුන් විසින් මෙසේ වදරන ලද : 'මහණෙනි සතින්ද්‍රිය කොහි දතයුතු යැ : සතර සතිපට්ඨානයන්හි දතයුතු'යි.

සමාධිය සිතෙහි එකඟබව ලක්ෂණ කොට ඇත්තේ යැ, අවික්ෂෙපය වැටැහෙනු වෙයි. ඊට සතර ධ්‍යානයෝ පදට්ඨාන යි. භාග්‍යවතුන් විසින් මෙසේ වදරන ලද : 'මහණෙනි, සමාධින්ද්‍රිය කොහි දතයුතු යැ : සතර ධ්‍යානයන්හි ලා දතයුතු' යි.

ප්‍රඥාව විශිෂ්ට වූ දැනීම ලක්ෂණ කොට ඇත්තී යැ, භූතාර්ථසන්තීරණය වැටැහෙනු වෙයි, ඒ ප්‍රඥාවට සතර ආර්‍යසත්‍යයෝ පදට්ඨාන යි. භාග්‍යවතුන් විසින් මෙසේ වදරන ලද : 'මහණෙනි, පඤ්ඤින්ද්‍රිය කොහි ලා දතයුතු යැ : සතර ආර්‍යසත්‍යයන්හි ලා දතයුතු'යි.

6-20. චත්තාරි චක්කානි: පතිරූපදෙසවාසො චක්කං, සප්පුරිසාපස්සයො චක්කං, අත්තසම්මාපණිධානං චක්කං, පුබ්බෙකතපුඤ්ඤතා චක්කං, තත්ථ අරියසන්තිස්සයලක්ඛණො පතිරූපදෙසවාසො, සො සප්පුරිසාපස්සයස්ස පදට්ඨානං, අරියසන්තිස්සයලක්ඛණො සප්පුරිසාපස්සයො, සො අත්තසම්මාපණිධානස්ස පදට්ඨානං. සම්මාපටිපත්තිලක්ඛණං අත්තසම්මාපණිධානං, තං පුඤ්ඤානං පදට්ඨානං. කුසලධම්මොපචයලක්ඛණං පුඤ්ඤං, තං සබ්බසම්පත්තීනං පදට්ඨානං.

6-21 එකාදස සීලමූලකා ධම්මා: "සීලවතො අවිප්පටිසාරො භවති -පෙ- සො විමුත්තිඤාණදස්සනං 'නාපරං[1] ඉත්ථත්තායා'ති පජානනා.

තත්ථ වෙරමණී ලක්ඛණං සීලං, තං අවිප්පටිසාරස්ස පදට්ඨානං.

න අත්තානුවාදලක්ඛණො අවිප්පටිසාරො, සො පාමොජ්ජස්ස පදට්ඨානං.

අභිප්පමොදලක්ඛණං පාමොජ්ජං, තං පීතියා පදට්ඨානං.

අත්තමනලක්ඛණා පීති, සා පස්සද්ධියා පදට්ඨානං.

කම්මනියලක්ඛණා පස්සද්ධි, සා සුඛස්ස පදට්ඨානං.

අබ්‍යාපාදලක්ඛණං සුඛං, තං සමාධිනො පදට්ඨානං.

අවික්ඛෙප[2]ලක්ඛණො සමාධි, සො යථාභූතඤාණදස්සනස්ස පදට්ඨානං.

අවිපරීතසන්තීරණලක්ඛණා පඤ්ඤා, සා නිබ්බිදය පදට්ඨානං

අනාලයනලක්ඛණා නිබ්බිදා, සා විරාගස්ස පදට්ඨානං

අසංකිලෙසලක්ඛණො විරාගො, සො විමුත්තියා පදට්ඨානං.

අකුසලධම්මවිවෙකලක්ඛණා විමුත්ති, සා විමුත්තිතො වොදනස්ස පදට්ඨානං.

6-22. චතස්සො අරියභූමියො, චත්තාරි සාමඤ්ඤඵලානි, තත්ථ යො යථාභූතං පජානාති, එසා දස්සනභූමි සොතාපත්තිඵලං ච. සො යථාභූතං පජානිත්වා නිබ්බින්දති, ඉදං තනුකාමරාගස්ස බ්‍යාපාදස්ස ච පදට්ඨානං සකදාගාමිඵලං ච. සණ්හං විරජ්ජති, අයං රාගවිරාගා චෙතොවිමුත්ති අනාගාමිඵලං ච. යා[3] අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්ති,[4] අයං භාවනාභූමි අරහත්තඤ්ච.

---

1. නාමරූපං - PTS.
2. අවික්ඛෙපන - ම.
3. යං - ම, PTS.
4. විරාගා, විමුච්චති - ම, PTS.

6–20. සතර චක්‍ර කෙනෙක් වෙති : ප්‍රතිරූපදෙශයෙහි වාසය චක්‍රයෙක, සත්පුරුෂ යන්ගේ උපනිශ්‍රය චක්‍රයෙක, ආත්මසම්‍යක්ප්‍රණිධානය චක්‍රයෙක, පූර්වකෘතපුණ්‍යතාව චක්‍රයෙකි. එහි ප්‍රතිරූපදෙශවාසය ආර්‍යයන්ගේ ආශ්‍රය ලක්ෂණ කොට ඇත්තේ යැ හේ සත්පුරුෂයන්ගේ උපනිශ්‍රයට පදට්ඨාන යි. සත්පුරුෂොපනිශ්‍රය ආර්‍යයන් හා එක්වැ විසීම ලක්ෂණ කොට ඇත්තේ යැ හේ ආත්මසම්‍යක්ප්‍රණිධානයට පදට්ඨාන යි. ආත්මසම්‍යක්ප්‍රණිධානය සම්‍යක්ප්‍රතිපත්ති ලක්ෂණ කොට ඇත්තේ යැ එය පුණ්‍යයන්ට පදට්ඨාන යි. පුණ්‍යය කුසල් දහම් රැස්කිරීම ලක්ෂණ කොට ඇත්තේ යැ එය සියලු සම්පත්තීන්ට පදට්ඨාන යි.

6–21. ශීලය මුල් කොට ඇති ධර්මයෝ එකොළොසෙකැ : සිල්වත්හට අවිප්‍රතිසාරය (නො මකුබව) වෙයි. ... ඉත්ථම්භාවය පිණිස කළයුතු අනෙකෙක් නැතැයි දැනීම විමුත්තිඤාණදස්සන යි.

එහි සීලය (ප්‍රාණවධාදියෙන්) විරමණය ලක්ෂණ කොට ඇත්තේ යැ, එය අවිප්පටි-සාරයට පදට්ඨාන යි.

අවිප්‍රතිසාරය අනාත්මානුවාදය ලක්ෂණ කොට ඇත්තේ යැ, එය ප්‍රාමොද්‍යයට පදට්ඨාන යි.

ප්‍රාමොද්‍යය (පංචවර්ණප්‍රීතිය) අධික වූ ප්‍රමොදය ලක්ෂණ කොට ඇත්තේ යැ, එය ප්‍රීතියට පදට්ඨාන යි.

ප්‍රීතිය අත්තමන (සතුටු සිත් ඇති බව) ලක්ෂණ කොට ඇත්තී යැ, ඒ ප්‍රීතිය පස්සද්ධියට (කාය–චිත්තයන්ගේ සැහැල්ලුබවට) පදට්ඨාන යි.

පස්සද්ධිය කර්මක්ෂම බව ලක්ෂණ කොට ඇත්තී යැ, එය අර්පණ පූර්වභාග වූ සුඛයට පදට්ඨාන යි.

සුඛය අව්‍යාපාදය ලක්ෂණ කොට ඇත්තේ යැ, එය සමාධියට පදට්ඨාන යි .

සමාධිය අවික්ෂෙපය (සිත නො විසුරුණුබව) ලක්ෂණ කොට ඇත්තේ යැ, එය යථාභූත ඥානදර්ශනයට (තරුණ විදර්ශනාවට) පදට්ඨාන යි.

විදර්ශනාප්‍රඥාව අවිපරීතසන්තීරණය ලක්ෂණ කොට ඇත්තී යැ, එය නිර්වෙදයට (බලව විපස්සනාවට) පදට්ඨාන යි.

නිර්වෙදය ආලය නො කිරීම ලක්ෂණ කොට ඇත්තී යැ, එය විරාගයට පදට්ඨාන යි.

විරාගය අසංක්ලෙශ ලක්ෂණ යැ, එය විමුක්තියට පදට්ඨාන යි.

විමුක්තිය අකුශලධර්මයෙන් වෙන් වීම ලක්ෂණ කොට ඇත්තී යැ, එය විමුක්ත වූවහුගේ ව්‍යවදානයට පදට්ඨාන යි.

6–22. ආර්‍යභූමි සතරෙකි, ශ්‍රාමණ්‍යඵලයෝ සතරදෙනෙකි. එහි යමෙක් යථාභූත වැ දැනැගනී ද මෝ දර්ශනභූමි යැ, සොතාපත්ති ඵලය ද වෙයි. හේ යථාභූත වැ අවබොධ කොට නිර්වෙදයට පැමිණෙයි, මෙය තනු වූ කාමරාගයට ද ව්‍යාපාදයට ද පදට්ඨාන යි. සකදාගාමිඵලය ද වෙයි. සිලුටු වැ විරාගයට පැමිණෙයි, මේ රාගවිරාග චෙතොවිමුත්ති යැ. අනාගාමී ඵලය ද වෙයි. යම් අවිජ්ජාවිරාග පඤ්ඤාවිමුත්තියක් වේ ද මේ කෘතභූමි යැ රහත් බව ද වේ.

සාමඤ්ඤඵලානීති කො වචනත්ථො, අරියො අට්ඨඞ්ගිකො මග්ගො සාමඤ්ඤං, තස්සෙතානි ඵලානීති සාමඤ්ඤඵලානි වුච්චන්ති. කිස්ස බ්‍රහ්මඤ්ඤඵලානීති වුච්චන්ති: බ්‍රහ්මඤ්ඤං[1] අරියො අට්ඨඞ්ගිකො මග්ගො, තස්සෙතානි[2] ඵලානීති බ්‍රහ්මඤ්ඤඵලානීති වුච්චන්ති.

තත්ථ සොතාපන්නො කථං හොති: සහ සච්චාභිසමයා අරියසාවකස්ස තීණි සංයොජනානි පහීයන්ති: සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො ච. ඉමෙසං තිණ්ණං සංයොජනානං පහානා පරික්ඛයා අරියසාවකො හොති අවිනිපාතධම්මො යාව දුක්ඛස්සන්තං කරොති.

තත්ථ කතමා සක්කායදිට්ඨි: අස්සුතවා[3] බාලො පුථුජ්ජනො ... (යාව) අරියධම්මෙ අකොවිදො, සො රූපං අත්තතො සමනුපස්සති, -පෙ-(යාව) විඤ්ඤාණස්මිං අත්තානං. සො ඉමෙසු පඤ්චසු ඛන්ධෙසු අත්තගාහො වා අත්තනියගාහො වා එකො හම්සම් එතස්මිං වසවත්තිකො පක්ඛිතො අනුග්ගාහො[4] අනුසයනො[5] අඞ්ගම්ඞගන්ති පරති, යා තථාභූතස්ස ඛන්ති රුචි පෙක්ඛනා ආකාරපරිවිතක්කො දිට්ඨිනිජ්ඣායනා අභිප්පසන්නා, අයං වුච්චතෙ සක්කායදිට්ඨී'ති.

තත්ථ පඤ්ච දිට්ඨියො උච්ඡෙදං භජන්ති, කතමා පඤ්ච: රූපං අත්තතො සමනුපස්සති, යාව විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, ඉමායො පඤ්ච උච්ඡෙදං භජන්ති, අවසෙසායො පන්නරස සස්සතං භජන්ති, ඉති සක්කායදිට්ඨිපහානා ද්වාසට්ඨිදිට්ඨිගතානි පහීයන්ති. පහානා උච්ඡෙදං සස්සතං ච න භජති. ඉති උච්ඡෙදසස්සතප්පහානා අරියසාවකස්ස න කිඤ්චි දිට්ඨිගතං භවති, ඉධ අරියසාවකො සුතවා හොති. සබ්බා සුතකපනෙකා කාතබ්බා, යාව අරියධම්මෙසු කොවිදො රූපං අනත්තතො සමනුපස්සති, යාව විඤ්ඤාණං -පෙ- එවමස්ස සමනුපස්සතස්ස සක්කායදිට්ඨි න භවති

කථං විචිකිච්ඡා න භවති: ඉධ අරියසාවකො බුද්ධෙ න කඞ්ඛති න විචිකිච්ඡති අභිප්පසීදති, ඉතිපි සො භගවා'ති සබ්බං. ධම්මෙ න කඞ්ඛති න විචිකිච්ඡති සබ්බං, යාව තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාන'න්ති, ඉමිනා දුතියෙන ආකඞ්ඛියෙන ධම්මෙන සමන්නාගතො හොති. සඞ්ඝෙ න කඞ්ඛති -පෙ- යාව පූජා සදෙවානං ච මනුස්සානං චා'ති, ඉමිනා තතියෙන ආකඞ්ඛියෙන ධම්මෙන සමන්නාගතො හොති.

'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති න කඞ්ඛති න විචිකිච්ඡති අධිමුච්චති අභිප්පසීදති. 'තණ්හා[6] දුක්ඛසමුදයො'ති න කඞ්ඛති න විචිකිච්ඡති- තණ්හානිරොධො[7] දුක්ඛනිරොධො'ති න කඞ්ඛති න විචිකිච්ඡති- 'අරියො, අට්ඨඞ්ගිකො මග්ගො දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති න කඞ්ඛති න විචිකිච්ඡති අධිමුච්චති අභිප්පසීදති.

---

1. බ්‍රහ්මචඤ්ඤ - PTS
2. තස්සතානි - ම, PTS.
3. අස්සුතවා - PTS.
4. අනුග්ගහො - ම, PTS.
5. අනුසයනො - PTS.
6. තණ්හා දුක්ඛා - PTS.
7. තණ්හා නිරොධා - ම, PTS.

සාමඤ්ඤඵලානි යනු වචනාර්ථ කවරේ යැ : ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය ශ්‍රාමණ්‍ය යැ, ඒ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයාගේ තෙල ඵලයෝ නුයි ශ්‍රාමණ්‍යඵලයෝ යයි කියනු ලැබෙත්. කුමක් හෙයින්, බ්‍රහ්මඤ්ඤඵලයෝයයි කියනු ලැබෙත් ද යත් : ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය බ්‍රහ්මඤ්ඤ යැ, ඒ බ්‍රහ්මඤ්ඤයාගේ තෙල ඵලයෝ නුයි බ්‍රහ්මඤ්ඤඵලයෝ යයි කියනු ලැබෙත්.

එහි කිසෙයින් සොතාපන්න වෙයි යත් : සත්‍යාවබොධය සමග ආර්‍ය්‍යශ්‍රාවකයාගේ සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස යන තුන් සංයොජනයෝ ප්‍රහීණ වෙති. මේ තුන් සංයොජනයන්ගේ ප්‍රහාණයෙන් ක්ෂය වීමෙන් දුක් කෙළවර කිරීම දක්වා අවිනිපාත ස්වභාව වූ ආර්‍ය්‍යශ්‍රාවක වේ.

එහි සක්කායදිට්ඨි කවර යත් : අශ්‍රුතවත් බාල පුහුදුන් තෙමේ (යම්තාක්) ... ආර්‍ය්‍ය ධර්මයෙහි අදක්ෂ වේ ද, හේ රූපය ආත්ම වියින් දකී ... විඥානයෙහි ආත්මය ඇතැයි දකී. හේ මේ පඤ්ච ස්කන්ධයෙහි ආත්මග්‍රාහය ඇත්තේ හෝ ආත්මනියග්‍රාහය (ඇත්තේ) හෝ වෙයි. 'තෙලෙ මම වෙමි' එක් (දෘෂ්ටියෙක) වශයෙහි පවත්නේ ප්‍රක්ෂිප්ත වූයේ ග්‍රාහ ඇත්තේ අනුශය වශයෙන් පවත්නේ අංගමංග ? යයි ගනී. එබඳු වූවහුගේ යම් කැමැත්තක් රුචියක් ප්‍රෙක්ෂණයෙක් ආකාර පරිවිතර්කයෙක් දෘෂ්ටිය ගෙන සිතීමෙක් ප්‍රසන්න බවක් වේ ද, මේ සක්කාය දිට්ඨි යයි කියනු ලැබේ.

එහි දෘෂ්ටිහු පස්දෙනෙක් උච්ඡෙදය භාජනය කෙරෙති, කවර පස්දෙනෙක යත් : රූපය ආත්ම වියින් දකී, (යනු පටන්) විඥනය ආත්ම යයි (දෘෂ්ටිවශයෙන්) දකී යන මේ පස උච්ඡෙදය භජනය කෙරෙත්. සෙසු පසළොස් (ආත්ම) දෘෂ්ටිහු ශාශ්වතය භජනය කෙරෙත්. මෙසේ සත්කායදෘෂ්ටිය ප්‍රහාණයෙන් දෙසැට දෘෂ්ටිගතයෝ ප්‍රහීණ වෙති. ප්‍රහීණ වීමෙන් (ආර්‍ය්‍යශ්‍රාවක) උච්ඡෙදයත් ශාශ්වතයත් භජනය නො කෙරෙයි. මෙසේ උච්ඡෙද ශාශ්වතප්‍රහාණයෙන් ආර්‍ය්‍යශ්‍රාවකහට කිසි දෘෂ්ටිගතයෙක් නො වෙයි. මෙ සස්නෙහි ආර්‍ය්‍යශ්‍රාවක ශ්‍රුතවත් වෙයි. සියලු ශුක්ලපක්ෂය විස්තර කළයුතු.. 'ආර්‍ය්‍යධර්මයෙහි නිපුණ වූයේ රූපය අනාත්ම වශයෙන් දකී, (යනු පටන්) විඥනය ... (අනාත්ම වශයෙන් දකී යනු දක්වා) මෙසේ දක්නා වූ ඔහුට සත්කායදෘෂ්ටි නො වේ.

කිසෙයින් විචිකිච්ඡා නො වෙයි යත් : මෙ සස්නෙහි ආර්‍ය්‍යශ්‍රාවක බුදුන් කෙරෙහි සැක නො කෙරෙයි, විචිකිත්සා නො කෙරෙයි, අතිශයින් පහදී, "ඉතිපි සො භගවා ... "සියල්ල ද, දහම්හි සැක නො කෙරෙයි, විචිකිත්සා නො කෙරෙයි, ... "තණ්හක්ඛයෙවිරාගො නිරොධො නිබ්බානං" යනු දක්වා සියල්ල ද (විස්තර කළයුතු යි.) මේ දෙවැනි ආකඩ්ඛිය ධර්මයෙන් (?) සමන්විත වෙයි. සඟුන් කෙරෙහි සැක නො කෙරෙයි ... දෙවියන්ගේ ද මිනිසුන්ගේ ද පූජාවට සුදුසු වෙයි (?) යනු දක්වා විස්තර යි. මේ තෙවැනි ආකඩ්ඛිය ධර්මයෙන් සමන්වාගත වේ.

"සියලු සංස්කාරයෝ දුක් වූහ"යි සැක නො කෙරෙයි, විචිකිත්සා නො කෙරෙයි, නිශ්චයට පැමිණෙයි, ප්‍රසාදයට පැමිණේ. 'තණ්හාව දුක්ඛසමුදය" යි සැක නො කෙරෙයි, විචිකිත්සා නො කෙරෙයි. ... 'තෘෂ්ණානිරොධය දුක්ඛනිරොධය"යි සැක නො කෙරෙයි, විචිකිත්සා නො කෙරෙයි, ... ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගය දුක්ඛනිරොධගාමිනි පටිපද"යි සැක නො කෙරෙයි, විචිකිත්සා නො කෙරෙයි, නිශ්චයට පැමිණෙයි, පහදී.

බුද්ධෙ වා[1] ධම්මෙ වා සඞ්ඝෙ වා දුක්ඛෙ වා සමුදයෙ වා නිරොධෙ වා මග්ගෙ වා කඞ්ඛායනා විමති විචිකිච්ඡා ද්වෙධාපථො[2] ආසප්පනා පරිසප්පනා අනවට්ඨානං අනාධිට්ඨානං[3] අනෙකංසො අනෙකංසිකතා, තෙ තස්ස පහීනා භවන්ති පඤ්ඤත්තා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවං ගතා[4] ආයතිං අනුප්පාදධම්මා.

තත්ථ සීලබ්බතපරාමාසො දුවිධා: සීලස්ස වා සුද්ධස්ස වා.

තත්ථ කතමො, සීලස්ස සීලබ්බතපරාමාසො: ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වා, තත්ථ කපොතපාදාහි අච්ඡරාහි සද්ධිං කීළිස්සාමි රමිස්සාමි පරිචරිස්සාමී'ති. යා තථාභූතස්ස ඛන්ති[5] රුචි විමුත්ති රාගො රාගපරිවත්තකා දිට්ඨි රූපනා පස්සනා, අයං සීලස්ස[6] සීලබ්බතපරාමාසො

තත්ථ කතමො සුද්ධස්ස සීලබ්බතපරාමාසො: ඉධෙකච්චො සීලං පරාමසති: සීලෙන සුජ්ඣති සීලෙන නීයති සීලෙන මුච්චති, සුඛං විතික්කමති, දුක්ඛං වීතික්කමති, සුඛදුක්ඛං වීතික්කමති, අනුපාපුණාති උපරිමෙන, තදුභයං සීලවතං පරාමසති, තදුභයෙන සීලවතෙන සුජ්ඣන්ති මුච්චන්ති නීයන්ති, සුඛං වීතික්කමන්ති, දුක්ඛං වීතික්කමන්ති, සුඛදුක්ඛං වීතික්කමන්ති, අනුපාපුණන්තීති අවිසුවිකරං ධම්මං අවිමුත්තිකරං ධම්මං විසුවිතො විමුත්තිතො පච්චාගච්ඡන්තස්ස යා තථාභූතස්ස ඛන්ති රුචි මුත්ති පෙක්ඛනා ආකාරපරිවිතක්කො දිට්ඨිනිජ්ඣායනා පස්සනා, අයං සුද්ධස්ස සීලබ්බතපරාමාසො.

එතෙ උභො පරාමාසා අරියසාවකස්ස පහීනා භවන්ති, යාව ආයතිං අනුප්පාදධම්මා. සො සීලවා භවති අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො අඛණ්ඩෙහි[7]- යාව උපසමසංවත්තනිකෙහි. ඉමෙසං තිණ්ණං සංයොජනානං පහානා සුතවා අරියසාවකො භවති සොතා-පන්නො අවිනිපාතධම්මො- සබ්බං.

'සහ සච්චාභිසමයා' ඉති යො වචනත්ථො: චත්තාරො අභිසමයා: පරිඤ්ඤාභිසමයො පහානාභිසමයො සච්ඡිකිරියාභිසමයො භාවනාභි-සමයො.

තත්ථ අරියසාවකො දුක්ඛං පරිඤ්ඤාභිසමයෙන අභිසමෙති, සමුදයං පහානාභිසමයෙන අභිසමෙති, නිරොධං සච්ඡිකිරියාභිසමයෙන අභිසමෙති, මග්ගං භාවනාභිසමයෙන අභිසමෙති

කිං කාරණා[8] දුක්ඛස්ස පරිඤ්ඤාභිසමයො, සමුදයස්ස පහානාභි-සමයො, නිරොධස්ස සච්ඡිකිරියාභිසමයො, මග්ගස්ස භාවනාභිසමයො: සමථවිපස්සනාය, කථං අභිසමෙති: ආරම්මණෙ චිත්තං උපනිබන්ධිත්වා පඤ්චක්ඛන්ධෙ දුක්ඛතො පස්සති. තත්ථ යො උපනිබන්ධො අයං සමථො, යා පරියොගාහනා, අයං විපස්සනා.

1. යාව බුද්ධෙ වා – ම, PTS.
2. ද්වෙධාපථා - ම, PTS.
3. අධිට්ඨාගමනං – ම, PTS
4. අනභාවංකතා – ම, PTS.
5. යථාභූතදස්සනන්ති – ම, PTS.
6. අසන්තුස්සිතස්ස – ම, PTS.
7. අක්ඛණ්ඩෙහි – මජසං.
8. කිං කාරණං – ම, PTS.

බුදුන් කෙරෙහි හෝ දහමෙහි හෝ සඟුන් කෙරෙහි හෝ දුකෙහි හෝ සමුදයෙහි හෝ නිරොධයෙහි හෝ මාර්ගයෙහි හෝ සැක කිරීමක් විමතියක් විචිකිත්සාවක් ද්විධාපථයෙක් පසුබැසීමෙක් හාත්පසින් පසුබැසීමෙක් නොසිටීමෙක් නො පිහිටාසිටීමෙක් අනෙකාන්ත බවෙක් අනෙකාංසිකාකාරයෙක් වේ ද, ඒ සැකයෝ ඔහු විසින් ප්‍රහීණ කරනලද්දහු වෙති, බැහැර කරන ලදද්දහු උඩුන් මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දහු අනභාවයට ගියාහු මතුයෙහි නූපදනා සැහැවි ඇත්තාහු වෙත්.

එහි සීලබ්බතපරාමාසය දෙපරිදි වෙයි : සිල් ඇත්තහුගේ හෝ ශුද්ධි ඇත්තහුගේ හෝ යැ.

එහි සිල්ඇත්තහුගේ සීලබ්බතපරාමාසය කවරැ : මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බඹසරින් හෝ දෙවියෙකිම් හෝ දෙවාන්‍යතරයෙකිම් වෙමි, එහි පරෙව්පාඇති අප්සරාවන් සමග ක්‍රීඩා කෙරෙමි, රමණය කෙරෙමි, සිත් අලවා වෙසෙමි එබඳු වූවහුගේ යම් කැමැත්තක් රුචියක් ඇලීමක් රාගයෙක් රාගපරිවර්තක දෘෂ්ටියක් දැක්වීමක් වේ ද මේ සිල්ඇත්තහුගේ ශීලව්‍රතපරාමර්ශ යි.

එහි ශුද්ධිඇත්තහුගේ සීලබ්බතපරාමාස කවරැ : මෙලොවැ කිසිවෙක් ශීලය පරාමර්ශ කෙරෙයි : ශීලයෙන් ශුද්ධවෙයි, ශීලයෙන් (සුවයට) පමුණුවයි, ශීලයෙන් මිදෙයි, සුව ඉක්මවයි, දුක් ඉක්මවයි, සුවදුක් ඉක්මවයි, උපරිමභාවයට පැමිණෙයි. ඒ ශීලව්‍රත දෙක පරාමාර්ශ කෙරෙයි : ඒ ශීලව්‍රත දෙකින් ශුද්ධ වෙති, මිදෙති, පමුණුවති, සුව ඉක්මවති, දුක් ඉක්මවති සුවදුක් ඉක්මවති, (නිවනට) පැමිණෙත් යයි. (අවිසුචිකරං ... මෙහි සිට වාක්‍ය ය ව්‍යාකල යි.) එබඳු වූවහුගේ යම් කැමැත්තක් රුචියක් මුක්තියක් ප්‍රෙක්ෂණයෙක් ආකාරපරිවිතර්කයෙක් දෘෂ්ටිය සිතීමෙක් දැකීමෙක් වේ ද, මේ විශුද්ධි ඇත්තහුගේ සීලබ්බතපරාමාස යි.

තෙල පරාමාසයෝ දෙදෙන ආර්‍ය්‍යශ්‍රාවකහට ප්‍රහීණ වූවාහු වෙති. ''ආයතිං අනුප්පාද ධම්මා' (යනු දක්වා විස්තර කළයුතු යැ) ඒ ආර්‍ය්‍යශ්‍රාවක අඛණ්ඩ වූ ආර්‍ය්‍යකාන්තශීලයෙන් සමන්වාගත වූයේ සිල්වත් වෙයි. ''උපසමසංවත්තනිකෙහි' (යනු දක්වා විස්තර යි.) මේ තුන් සංයොජනයන්ගේ ප්‍රහාණයෙන් ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක සෝතාපන්න වූයේ අවිනිපාත-ස්වභාව ඇතියේ වේ, සියල්ල (විස්තර කළයුතු යැ.)

'සහ සච්චාභි සමයා' යනු වචනාර්ථ කවරෙ යැ : 'පරිඤ්ඤාභිසමය පහානාභිසමය සච්ඡිකිරියාභිසමය භාවනාභිසමය යි අභිසමයයෝ සතරදෙනෙකි.

එහි ආර්‍ය්‍යශ්‍රාවක දුඃඛසත්‍යය පරිඥප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, සමුදයසත්‍යය ප්‍රහාණ ප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, නිරොධසත්‍යය සාක්ෂාත්ක්‍රියාභිසමයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, මාර්ගසත්‍යය භාවනාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි.

කවර කරුණෙකින් දුක්ඛයාගේ පරිඤ්ඤාභිසමය (ප්‍රතිවෙධය) සමුදයාගේ පහානාභිසමය, නිරොධයාගේ සච්ඡිකිරියාභිසමය, මාර්ගයාගේ භාවනාභිසමය වෙයි යත් : සමථ විපස්සනා හේතුයෙනි, කිසෙයින් ප්‍රතිවෙධ කෙරෙයි යත් : අරමුණෙහි සිත උපනිබන්ධනය කොට පඤ්චස්කන්ධයන් දුක් වශයෙන් දකී, එහි යම් උපනිබන්ධයෙක් ඇද්ද මේ සමථ යැ, යම් පරියොගාහනයෙක් (විමසීමෙක්) ඇද්ද මේ විපස්සනා යි.

පඤ්චක්ඛන්ධා[1] දුක්ඛාති පස්සතො යො පඤ්චක්ඛන්ධෙසු ආලයො නිකන්ති උපගමනං අජ්ඣොසානං ඉච්ඡා මුච්ඡා පණිධි පත්ථනා, සො පහීයති. තත්ථ පඤ්චක්ඛන්ධා දුක්ඛං. යො තත්ථ ආලයො නිකන්ති උපගමනං අජ්ඣොසානං ඉච්ඡා මුච්ඡා පණිධි පත්ථනා, අයං සමුදයො. යං තස්ස පහානං අයං[2] නිරොධො, සමථො විපස්සනා ච මග්ගො, එවං තෙසං චතුන්නං අරියසච්චානං එකකාලෙ එකක්ඛණෙ එකචිත්තෙ අපුබ්බං අචරිමං අභිසමයො භවති. තෙනාහ භගවා: "සහ සච්චාභිසමයා අරියසාවකස්ස තීණි සංයොජනානි පහීයන්තී"ති.

තත්ථ සමථවිපස්සනා යුගනද්ධා වත්තමානා එකකාලෙ එකක්ඛණෙ එකචිත්තෙ චත්තාරි කිච්චානි කරොන්ති[3] දුක්ඛං පරිඤ්ඤාභිසමයෙන අභිසමෙති- යාව මග්ගං භාවනාභිසමයෙන අභිසමෙති.

කිං කාරණා: දුක්ඛං පරිඤ්ඤාභිසමයො යාව මග්ගං භාවනාභිසමයො: එවං දිට්ඨන්තො: යථා නාවා ජලං ගච්ඡන්ති චත්තාරි කිච්චානි කරොති: පාරිමං තීරං පාපෙති, ඔරිමං තීරං ජහති, භාරං වහති, සොතං ඡින්දති. එවමෙව සමථවිපස්සනා යුගනද්ධා වත්තමානා එකකාලෙ එකක්ඛණෙ එකචිත්තෙ චත්තාරි කිච්චානි කරොන්ති: දුක්ඛං පරිඤ්ඤාභිසමයෙන අභිසමෙති- යාව මග්ගං භාවනාභිසමයෙන අභිසමෙති.

යථා වා සුරියො[4] උදයන්තො එකකාලෙ අපුබ්බං අචරිමං චත්තාරි කිච්චානි කරොති: අන්ධකාරං විධමති, ආලොකං පාතුකරොති, රූපං නිදස්සීයති, සීතං පරියාදියති, එවමෙව සමථවිපස්සනා යුගනද්ධා වත්තමානා එකකාලෙ -පෙ- යථා පදීපො ජලන්තො එකකාලෙ අපුබ්බං අචරිමං චත්තාරි කිච්චානි කරොති: අන්ධකාරං විධමති, ආලොකං පාතුකරොති, රූපං නිදස්සීයති, උපාදානං පරියාදියති. එවමෙව සමථවිපස්සනා යුගනද්ධා වත්තමානා එකකාලෙ -පෙ-.

යදා අරියසාවකො සොතාපන්නො භවති අවිනිපාතධම්මො නියතො- යාව දුක්ඛස්සන්තං කරොති අයං දස්සනභූමි සොතාපත්තිඵලං ච.

සොතාපත්තිඵලෙ ඨිතො උත්තරිං[5] විපස්සනං[6] භාවෙන්තො යුගනද්ධා වත්තමානා කාමරාගබ්‍යාපාදානං යෙභුය්‍යෙන පහානා අරියසාවකො හොති සකදාගාමී පරිනිට්ඨිතත්තා සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති, අයං තනුභූමි. සකදාගාමිඵලං ච.

සකදාගාමි[7] ඵලෙ ඨිතො විපස්සනං භාවෙන්තො කාමරාගබ්‍යාපාදෙ අනුසයෙ අනවසෙසං පජහති, කාමරාගබ්‍යාපාදෙසු අනවසෙසං පහීනෙසු පඤ්චොරම්භාගියානි සංයොජනානි පහීනානි භවන්ති: සක්කායදිට්ඨි සීලබ්බතපරාමාසො විචිකිච්ඡා කාමච්ඡන්දො බ්‍යාපාදො ච, ඉමෙසං පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පහානා අරියසාවකො හොති අනාගාමී, තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා, අයං වීතරාගභූමි, අනාගාමිඵලං ච.

1. පඤ්චක්ඛන්ධෙ - ම, PTS.
2. සො - මජ්ඣං, PTS.
3. කරොති - ම, PTS.
4. සූරියො - ම, PTS.
5. උත්තරි - ම, PTS.
6. සමථවිපස්සනං - ම, PTS.
7. යො සකදාගාමි - ම, PTS.

පඤ්චස්කන්ධයෝ දුක් වූහ'යි දක්නාහට පඤ්චස්කන්ධයෙහි යම් ආලයෙක් නිකාන්තියක් උපගමනයෙක් බැසැගෙන සිටීමෙක් ඊර්ෂ්‍යාවක් මූර්ඡාවක් ප්‍රණිධියක් ප්‍රාර්ථනාවක් ඇද්ද ඒ ප්‍රහීණ වෙයි, එහි පඤ්චස්කන්ධයෝ දුක්ඛ සත්‍ය යැ. එහි යම් ආලයෙක් නිකාන්තියක් උපගමනයෙක් අධ්‍යවසානයෙක් ඉච්ඡාවක් මූර්ඡාවක් ප්‍රණිධියක් ප්‍රාර්ථනාවක් ඇද්ද මේ සමුදය සත්‍ය යැ, ඒ සමුදයයාගේ ප්‍රහාණයෙක් ඇද්ද මේ නිරොධසත්‍ය යැ, සමථයත් විපස්සනාවත් මාර්ගසත්‍ය යි. මෙසේ ඒ චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ සමකාලයෙහි ඒකක්ෂණයෙහි ඒකචිත්තයෙහි නො පෙරපසු වැ අවබොධය වෙයි. එයින් වදළහ බුදුහු, ''සත්‍යාවබොධය සමග ආර්‍ය්‍යශ්‍රාවකහට තුන් සංයොජනයෝ ප්‍රහීණ වෙත්'' යයි.

එහි සමථවිපස්සනා යුගනද්ධ වැ පවත්නාහු එක්කලැ එක් කෙණෙහි එක් සිතෙහි සතර කෘත්‍යයක් කෙරෙති : දුක පරිඥාභිසමයෙන් අවබොධ කෙරෙයි, ... මාර්ගය භාවනාභිසමයෙන් අවබොධ කෙරෙයි, (යනු දක්වා විස්තර කළයුතු.)

කවර කරුණෙකින් දුක පරිඥාභිසමය වේ ද ... මාර්ගය භාවනාභිසමය වේ ද යත් : මෙසේ දෘෂ්ටාන්ත වෙයි : යම්සේ නැව ජලයෙහි ගමන් කරන්නී සතර කෘත්‍යයක් කෙරේ ද : පරතෙරට පමුණුවයි, මෙතෙර හැරපියයි, බර ගෙනයයි, ස්‍රොතස් සිඳී. එපරිදි මැ සමථවිපස්සනා දෙක යුගනද්ධ වැ පවත්නාහු එක්විට එක් ඇසිල්ලෙහි එක්සිතෙහි කෘත්‍යය සතරක් සිදු කෙරෙති. දුක්ඛසත්‍යය පරිඥාභිසමයෙන් ප්‍රතිවෙධ කෙරෙයි ... මාර්ගසත්‍යය භාවනාභිසමයෙන් ප්‍රතිවෙධ කෙරෙයි.

යළි යම්සේ හිරු උදයට පැමිණෙනුයේ එක්විට පෙරපසු නො වැ කෘත්‍යය සතරක් කෙරෙයි : අඳුර නසයි, ආලොකය පහළ කෙරෙයි, රූප දක්වයි, සීතය නසයි. එපරිදි මැ සමථවිපස්සනා යුගනද්ධ වැ පවත්නාහු එක්විට ... යම්සේ පහන දැල්වෙනුයේ එක්විට නො පෙරපසු වැ කෘත්‍යය සතරක් කෙරේ ද : අඳුර දුරු කෙරෙයි, එළිය පහළ කෙරෙයි, රූප දක්වයි, තෙල් ගෙවාලයි. එපරිදි මැ සමථවිපස්සනා යුගනද්ධ වැ පවත්නාහු එක්විටැ ...

යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවක ස්‍රෝතාපන්න වේ ද, විරූපයෙහි නොවැටෙන සැහැවි ඇතියේ මාර්ගනියාමයෙන් නියත වූයේ ... දුක් කෙළෙවර කෙරෙයි. මේ දර්ශනභූමි යැ, ස්‍රෝතාපත්තිඵලය ද වේ.

සොවත් පෙලෙහි සිටියේ මතුයෙහි විදර්ශනා වඩනුයේ (ඒ සමථවිපස්සනා) යුගනද්ධ වැ පවත්නාහු කාමරාගව්‍යාපාදයන්ගේ බෙහෙවින් ප්‍රහාණය හෙතු කොටගෙන සකෘදගාමී ආර්‍ය්‍යශ්‍රාවක වෙයි. පරිනිෂ්පන්න බැවින් (?) එක් මැ වරක් මෙලොවට අවුත් දුක් කෙළවර කෙරෙයි. මේ තනු භූමි යැ, සකදගාමී ඵලය ද වේ.

සෙදගැමිපෙලෙහි සිටියේ විදසුන් වඩනුයේ අනුශය සහිත වූ කාමරාගව්‍යාපාදයන් අනවශෙෂ කොට දුරු කෙරෙයි. කාමරාගව්‍යාදයන් අනවශෙෂ වැ ප්‍රහීණ කල්හි පඤ්ච ඔරම්භාගිය සංයොජනයෝ ප්‍රහීණ වූවාහු වෙති : සක්කායදිට්ඨි සීලබ්බතපරාමාස විචිකිච්ඡා කාමච්ඡන්ද හා ව්‍යාපාද යන මොහු යි. මේ පඤ්චඔරම්භාගිය සංයොජනයන්ගේ ප්‍රහාණයෙන් අනාගාමී ආර්‍ය්‍යශ්‍රාවක වෙයි. එහි පිරිනිවෙනුයේ එ බඹලොවින් (පිළිසඳ විසින්) නො එනසැහැවි ඇතියේ වෙයි, මේ වීතරාගභූමි යැ, අනාගාමීඵලය ද වේ.

අනාගාමිඵලෙ ඨිතො උත්තරිං[1] විපස්සනං[2] භාවෙන්තො පඤ්ච උද්ධම්භාගියානි සංයොජනානි පජහති: රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා ච.[3] ඉමෙසං පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං පහානා අරියසාවකො අරහා භවති ඛීණාසවො[4] වුසිතවා කතකරණීයො[5] ඔහිතභාරො අනුප්පත්තසදත්ථො[6] පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤාවිමුත්තො,[7] අයං කතාභූමි. අරහත්තඵලං ච.

අයං සොපාදිසෙසා නිබ්බානධාතු. තස්ස ආයුසඞ්ඛයා ජීවිතින්ද්‍රියොපරොධා[8] ඉදං ච දුක්ඛං නිරුජ්ඣති, අඤ්ඤං ච දුක්ඛං න උප්පජ්ජති, යො ඉමස්ස දුක්ඛස්ස නිරොධො වූපසමො අඤ්ඤස්ස ච අපාතුභාවො, අයං අනුපාදිසෙසා නිබ්බානධාතු. ඉමා ද්වෙ නිබ්බානධාතුයො. ඉති සච්චානි වුත්තානි, සච්චාභිසමයො වුත්තො, කිලෙසවවත්ථානං වුත්තං, පහානං වුත්තං, භූමියො වුත්තා, ඵලානි වුත්තානි, නිබ්බානධාතුයො වුත්තා, එවම්මෙසු වුත්තෙසු සබ්බබොධි වුත්තා භවති. එත්ථ 'යොගො කරණීයො.

6-23. තත්ථ කතමායො නව අනුපුබ්බසමාපත්තියො: චත්තාරි ඣානානි චතස්සො ච අරූපසමාපත්තියො නිරොධසමාපත්ති ච.

තත්ථ චත්තාරි ඣානානි කතමානි: "ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි"ති විත්ථාරෙන කාතබ්බානි. තත්ථ කතමා චතස්සො[9] ආරූපසමාපත්තියො: විරාගිනො වත වත්තබ්බා,[10] යාව නිරොධසමාපත්ති විත්ථාරෙන කාතබ්බං. ඉමායො නව අනුපුබ්බසමාපත්තියො.

තත්ථ කතමං පඨමං ඣානං පඤ්චඞ්ගවිප්පයුත්තං පඤ්චඞ්ගසමන්නාගතං, කතමෙහි පඤ්චහි අඞ්ගෙහි විප්පයුත්තං පඤ්චහි නීවරණෙහි, තත්ථ කතමානි පඤ්ච නීවරණානි: 'කාමච්ඡන්දො'ති විත්ථාරො කාතබ්බො.

තත්ථ කතමො කාමච්ඡන්දො: යො පඤ්චසු කාමගුණෙසු ඡන්දරාගො පෙමං නිකන්ති අජ්ඣොසානං ඉච්ඡා මුච්ඡා පත්ථනා අපරිච්චාගො අනුසයො පරියුට්ඨානං, අයං කාමච්ඡන්දො නීවරණං.[11]

තත්ථ කතමො ව්‍යාපාදො: යො සත්තෙසු සඞ්ඛාරෙසු ච ආඝාතො -පෙ- යථා දොසෙ තථා විත්ථාරො[12] අයං ව්‍යාපාදො නීවරණං[13].

1. උත්තිරි - මජ්සං.
2. සමථවිපස්සනං - ම, PTS.
3. රූපරාග අරූපරාගමාන උද්ධච්ච අවිජ්ජඤ්ච - ම, PTS.
4. ඛීණාසවොති - PTS.
5 මරම්මපොත්ථකෙ නත්ථි.
6. සම්පජඤ්ඤ විමුත්තො - PTS.
7 අරහත්තා ච - ම, PTS
8. ජීවිතින්ද්‍රියාපරොධා - ම.
9. චත්තාරො - ම, PTS
10. වත්තබ්බො - PTS, මජ්සං.
11. කාමච්ඡන්දනීවරණං - ම, PTS.
12. නිද්දිට්ඨා - ම, PTS.
13. ව්‍යාදනීවරණං - ම, PTS.

අනාගාමිපෙලෙහි සිටියේ මත්තෙහි විදසුන් වඩනුයේ පඤ්ච උද්ධම්භාගිය සංයොජනයන් දුරු කෙරෙයි : රූපරාග අරූපරාග මාන උද්ධච්ච හා අවිජ්ජා ද යන මොහු යි. මේ පඤ්ච උද්ධම්භාගිය සංයොජනයන්ගේ ප්‍රහාණයෙන් අර්හත් ආර්‍ය්‍යශ්‍රාවක වෙයි, වුසූ මහබඹසර ඇතියේ සිවුමඟින් කළ කිස ඇතියේ බහාතැබූ ස්කන්ධාදි භාරය ඇතියේ පැමිණි ස්වාර්ථ ඇතියේ ක්ෂය වූ භවසංයොජන ඇතියේ මොනොවට දැන විමුක්ත වූයේ වේ. මේ කෘත භූමි යැ, අර්හත්වඵලය ද වේ.

මේ සොපාදිසෙස නිබ්බානධාතු යැ. ඒ රහත්හුගේ ආයු ගෙවීමෙන් ජීවිතෙන්ද්‍රිය සිඳීමෙන් මේ පඤ්චස්කන්ධදුඃඛය ද නිරුද්ධ වෙයි. අනිත් ස්කන්ධදුඃඛයකුදු නුපදී. මේ පඤ්චස්කන්ධදුඃඛයාගේ යම් නිරොධයෙක් සන්හිඳීමෙක් වේ ද අනිත් දුකක්හුගේ ද පහළ නො වීමෙක් වේ ද මේ අනුපාදිසෙස නිබ්බානධාතු යි. මේ දෙවැදෑරුම් නිර්වාණ ධාතු යි. මෙසේ සත්‍යයෝ කියන ලද්දහු යැ සත්‍යප්‍රතිවෙධය කියන ලද්දේ යැ, ක්ලෙශ ව්‍යවස්ථානය කියනලද, ප්‍රහාණය කියනලද, භූමීහු කියන ලද්දහ, ඵලයෝ කියන ලද්දහ, නිර්වාණධාතු කියන ලද්දහ. මෙසේ මේ ධර්මයන් කි කල්හි සියලු බොධිය කියන ලද වේ. මෙහි යොග කටයුත්තේ යි.

6–23. එහි අනුපූර්වවිහාරසමාපත්තීහු කවරහ : සතර ධ්‍යානයෝ ද සතර අරූප සමාපත්තීහු ද නිරොධසමාපත්තිය ද යන මොහු යි.

එහි සතර ධ්‍යානයෝ කවරහ : "මහණෙනි, මෙසස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන්වැ මැ" යනු විස්තර කළයුත්තාහු යැ, එහි සතර අරූපසමාපත්තීහු කවරහ : විරාගීහු ගේ (අරූපසමාපත්ති) කියැයුත්තාහු යැ, නිරොධසමාපත්තිය දක්වා විස්තර කළයුත්තාහ. මොහු නව අනුපූර්වවිහාර සමාපත්තීහු යි.

එහි ප්‍රථමධ්‍යාන කවරෙ යැ : පස්අඟෙකින් වෙන් වූයේ පස්අඟෙකින් සමන්විත වූයේ යැ, කවර පස්අඟෙකින් විප්‍රයුක්ත ද යත් : පඤ්ච නීවරණයන්ගෙනි, එහි පඤ්ච නීවරණයෝ කවරහ : කාමච්ඡන්දය යනාදිය විස්තර කටයුතු.

එහි කාමච්ඡන්ද කවරෙ යත් : පස්කම්ගුණයෙහි යම් ඡන්දරාගයෙක් ප්‍රෙමයෙක් නිකාන්තියක් බැසැගෙන සිටීමෙක් ආසාවක් මුසපත්වීමෙක් පැතුමෙක් නො හැරීමෙක් අනුශයයෙක් පර්‍ය්‍යුත්ථානයෙක් ඇද්ද මේ කාමච්ඡන්ද තෙමෙ නීවරණ යැ.

එහි ව්‍යාපාද කවරෙ යැ : සත්වයන් කෙරෙහි ද සංස්කාරයන් කෙරෙහි ද යම් ආඝාතයෙක් වේ ද ... දෙසයෙහි මෙන් විස්තර යි. මේ ව්‍යාපාද තෙමේ නීවරණ යැ.

තත්ථ කතමං මිද්ධං : යා කායස්ස[1] ජඩතා[2] කායස්ස[1] ගරුතතා කායස්ස අකම්මනියතා[3] කායස්ස[1] නිද්දා නිදායනා පචලායිකතා[4] පචලායනා පචලායිතත්තං, ඉදං මිද්ධං. තත්ථ කතමං ථීනං[5] : යා චිත්තස්ස ථීනතා[6] ජඩතා චිත්තස්ස ගරුතතා චිත්තස්ස අපස්සද්ධි,[8] ඉදං ථීනං. ඉති ඉදං ච ථීනං පුරිමකං ච මිද්ධං තදුභයං ථිනමිද්ධනීවරණන්ති වුච්චති.

තත්ථ කතමං උද්ධච්චං : යො අවූපසමො[9] චිත්තස්ස, ඉදං උද්ධච්චං. තත්ථ කතමං කුක්කුච්චං : යො චෙතසො විලෙඛො අලඤ්චනා විලඤ්චනා හදයලෙඛො විප්පටිසාරො, ඉදං කුක්කුච්චං. ඉති ඉදං ච කුක්කුච්චං පුරිමකං ච උද්ධච්චං, තදුභයං උද්ධච්චකුක්කුච්චනීවරණන්ති වුච්චති.

තත්ථ කතමං විචිකිච්ඡානීවරණං : යො බුද්ධෙ වා ධම්මෙ වා සඞ්ඝෙ වා -පෙ- අයං විචිකිච්ඡා, අපි ච ඛො පන පඤ්ච විචිකිච්ඡායො : සමණන්තරාසිකා දෙසනන්තරාසිකා සම්පත්තන්තරාසිකා මග්ගන්තරාසිකා සඞ්ඝන්තරාසිකා, ඉමායො පඤ්ච විචිකිච්ඡායො. ඉධ පන සම්පත්තන්තරාසිකා විචිකිච්ඡා අධිප්පෙතා, ඉමෙ පඤ්ච නීවරණා.

තත්ථ 'නීවරණානී'ති කො වචනත්ථො, කුතො නිවාරයන්තී'ති : සබ්බතො කුසලපක්ඛිකා නිවාරයන්ති, කථං නිවාරයන්ති කාමච්ඡන්දො අසුභතො නිවාරයති, බ්‍යාපාදො මෙත්තාය නිවාරයති, ථීනං පස්සද්ධිතො නිවාරයති, මිද්ධං විරියාරම්භතො[10] නිවාරයති, උද්ධච්චං සමථතො නිවාරයති, කුක්කුච්චං අවිප්පටිසාරතො නිවාරයති, විචිකිච්ඡා පඤ්ඤාතො පටිච්චසමුප්පාදතො නිවාරයති.

අපරො පරියායො : කාමච්ඡන්දො අලොභතො කුසලමූලතො නිවාරයති, බ්‍යාපාදො අදොසතො කුසලමූලතො නිවාරයති, ථිනමිද්ධං[11] සමාධිතො නිවාරයති, උද්ධච්චකුක්කුච්චං සතිපට්ඨානෙහි නිවාරයති, විචිකිච්ඡා අමොහතො කුසලමූලතො නිවාරයති.

අපරො පරියායො : තයො විහාරා, දිබ්බවිහාරො, බ්‍රහ්මවිහාරො අරියවිහාරො. දිබ්බවිහාරො චත්තාරි ඣානානි, බ්‍රහ්මවිහාරො චත්තාරි අප්පමාණානි අරියවිහාරො සත්තතිංස බොධිපක්ඛියා ධම්මා, තත්ථ කාමච්ඡන්දො උද්ධච්චං කුක්කුච්චං ච දිබ්බවිහාරං නිවාරයති, බ්‍යාපාදො බ්‍රහ්මවිහාරං නිවාරයති, ථිනමිද්ධං විචිකිච්ඡා ච අරියවිහාරං නිවාරයති.

අපරො පරියායො : කාමච්ඡන්දො බ්‍යාපාදො උද්ධච්චකුක්කුච්චං ච සමථං නිවාරයන්ති, ථිනමිද්ධං විචිකිච්ඡා ච විපස්සනං නිවාරයන්ති. අතො නීවරණානි වුච්චන්ති. ඉමෙහි පඤ්චහි අඞ්ගෙහි විප්පයුත්තං පඨමං ඣානං.

---

1. චිත්තස්ස - ම, PTS.
2. ජළතා - PTS.
3. අකම්මනීයතා - ම, PTS
4. පචලිකතා - ම.
5. ථිනං - ම.
6. ථිනතා - ම.
7. කායස්ස - ම, PTS.
8. අප්පස්සද්ධි - ම, PTS.
9. අවූපසමො - ම. - PTS.
10. විරියාරම්භතො - ම.
11. ථිනමිද්ධං - ම.

එහි මිද්ධ කවරෙ යැ : කයෙහි යම් තෙමරිබවක් ගුරුබවක් කර්මක්ෂම නොවන බවක් නික්ෂෙපයෙක් නිදීමක් සලබවක් සැලීමක් සැලෙන අයුරක් වේ ද මේ මිද්ධ යැ. එහි ථීන කවරෙ යත් : චිත්තයාගේ යම් තදබවක් තෙමරියක් ගුරුබවක් බරබවක් වේ ද මේ ථීන යැ. මේ ථීනය ද පළමු කී මිද්ධය ද ඒ දෙක ථීනමිද්ධනීවරණ යයි කියනු ලැබෙ.

එහි උද්ධච්ච කවරෙ යැ : චිත්තයාගේ යම් නො සන්හිඳීමෙක් වේ ද මේ උද්ධච්ච යැ. එහි කුක්කුච්ච කවරෙ යැ : චිත්තයාගේ යම් හිරිනැසීමෙක් පැකිලීමෙක් වෙසෙසින් පැකිලීමෙක් සිත බිඳීමෙක් විපිළිසරෙක් වේ ද මේ කුක්කුච්ච යැ. මෙසේ මේ කුකුස ද පළමු කී උද්ධච්චය ද යන එ දෙක උද්ධච්චකුක්කුච්ච නීවරණ යයි කියනු ලැබෙ.

එහි විචිකිච්ඡානීවරණ කවරෙ යැ : යමෙක් බුදුන් කෙරෙහි හෝ දහම්හි හෝ සඟුන් කෙරෙහි හෝ (සැක කෙරෙයි) ... මේ විචිකිච්ඡා නමු. තවද විචිකිච්ඡා පසෙකි : සමනන්තරායිකා දෙසන්තරායිකා සමාපත්‍යන්තරායිකා මග්ගන්තරායිකා සග්ගන්-තරායිකා යයි, මේ පස් විචිකිච්ඡා යි. මෙහි වූ කලි සමථනට අන්තරායකර වූ (සමාපත්තන්තරායිකා) විචිකිච්ඡාව අදහස් කරන ලදු' මේ පඤ්චනීවරණයෝ යි.

එහි 'නීවරණානි' යනු වචනාර්ථ කවරෙ යැ : කොයින් වළකත් ද යත් : සර්වප්‍රකාරයෙන් කුශලපක්ෂයෙන් වළහත්. කෙසේ වළහත් ද යත් : කාමච්ඡන්ද තෙමේ අශුභයෙන් වළහයි, ව්‍යාපාදය මෛත්‍රියෙන් වළහයි, ථීනය පස්සද්ධියෙන් වළහයි, මිද්ධය වීර්‍ය්‍යාරම්භයෙන් වළහයි, උද්ධච්චය සමථයෙන් වළහයි, කුක්කුච්චය අවිප්‍රතිසාරයෙන් වළහයි, විචිකිච්ඡාව ප්‍රඥයෙන් ප්‍රතීත්‍යසමුත්පාදයෙන් වළහයි.

අනික් පරියායෙකි : කාමච්ඡන්දය අලොභකුශලමූලයෙන් වළහයි, ව්‍යාපාදය අදෙස කුසලමූලයෙන් වළහයි, ථීනමිද්ධය සමාධියෙන් වළහයි, උද්ධච්චකුක්කුච්චය සතිපට්ඨානයන්ගෙන් වළහයි, විචිකිච්ඡාව අමොහකුසලමූලයෙන් වළහයි.

අනෙකුදු පරියායෙකි : දිව්‍යවිහාර යැ බ්‍රහ්මවිහාර යැ ආර්‍ය්‍යවිහාර යැයි විහරණයෝ තිදෙනෙකි. සතර ධ්‍යානයෝ දිව්‍යවිහාර යැ සතර අප්‍රාමාණ්‍යයෝ බ්‍රහ්මවිහාර යැ සත්තිස් බොධිපාක්ෂිකධර්මයෝ ආර්‍ය්‍යවිහාර යි. එහි කාමච්ඡන්දය ද උද්ධච්චය ද කුක්කුච්චය ද යන මොහු දිව්‍යවිහාරය වළහති, ව්‍යාපාදය බ්‍රහ්මවිහාරය වළහයි, ථීනමිද්ධය ද විචිකිච්ඡාව ද යන මොහු ආර්‍ය්‍යවිහාරය වළහත්.

අනෙකුදු පරියායෙකි : කාමච්ඡන්දය ද ව්‍යාපාදය ද උද්ධච්චකුක්කුච්චය ද යන මොහු සමථය වළහති, ථීනමිද්ධය ද විචිකිච්ඡාව ද යන මොහු විදර්ශනාව වළහත්. එහෙයින් නීවරණ යයි කියනු ලැබෙත්. ප්‍රථමධ්‍යානය මේ පඤ්ච අංගයන්ගෙන් විප්‍රයුක්ත වූයේ යි.

කතමෙහි පඤ්චහි අඞ්ගෙහි සම්පයුත්තං පඨමං ඣානං: විතක්කවිචාරෙහි පීතියා සුඛෙන ච චිත්තෙකග්ගතාය ච. ඉමෙසං පඤ්චන්නං අඞ්ගානං උප්පාදපටිලාභසමන්නාගතාය[1] සච්ඡිකිරියාය[2] පඨමං ඣානං පටිලද්ධන්ති වුච්චති. ඉමානි පඤ්ච අඞ්ගානි උප්පාදෙත්වා විහරතීති තෙන වුච්චතෙ පඨමං ඣානං උපසම්පජ්ජ දිබ්බෙන විහාරෙන විහරතීති.[3]

තත්ථ දුතියං ඣානං චතුරඞ්ගසමන්නාගතං: පීතියා[4] සුඛෙන චිත්තෙකග්ගතාය අජ්ඣත්තං සම්පසාදනෙන, ඉමානි චත්තාරි අඞ්ගානි උප්පාදෙත්වා සම්පාදෙත්වා විහරති, තෙන වුච්චති දුතියං ඣානං උපසම්පජ්ජ විහරතීති.

තත්ථ පඤ්චඞ්ගසමන්නාගතං තතියං ඣානං: සතියා සම්පජඤ්ඤෙන සුඛෙන චිත්තෙකග්ගතාය උපෙක්ඛාය, ඉමානි පඤ්චඞ්ගානි උප්පාදෙත්වා සම්පාදෙත්වා විහරති, තෙන වුච්චති තතියං ඣානං උපසම්පජ්ජ විහරතීති.

තත්ථ චතුත්ථං ඣානං චතුරඞ්ගසමන්නාගතං: උපෙක්ඛාය සතිපාරිසුද්ධියා අදුක්ඛමසුඛාය වෙදනාය චිත්තෙකග්ගතාය ච, ඉමෙහි චතුහඞ්ගෙහි සමන්නාගතං චතුත්ථං ඣානං. ඉති ඉමෙසං චතුන්නං අඞ්ගානං උප්පාදපටිලාභසමන්නාගතාය සච්ඡිකිරියාය චතුත්ථං ඣානං පටිලද්ධන්ති වුච්චති. ඉමානි චත්තාරි ඣානානි උප්පාදෙත්වා සම්පාදෙත්වා උපසම්පජ්ජ විහරති තෙන වුච්චති 'දිබ්බෙන විහාරෙන විහරතී'ති.

6-24 තත්ථ කතමො අනිච්චට්ඨො: පීළනට්ඨො අනිච්චට්ඨො, පභඞ්ගට්ඨො සම්පාපනට්ඨො විවෙකට්ඨො අනිච්චට්ඨො, අයං අනිච්චට්ඨො.

තත්ථ කතමො දුක්ඛට්ඨො: පීළනට්ඨො[5] දුක්ඛට්ඨො සම්පීළනට්ඨො සංවෙගට්ඨො බ්‍යාබාධනට්ඨො[6] දුක්ඛට්ඨො, අයං දුක්ඛට්ඨො.

තත්ථ කතමො සුඤ්ඤට්ඨො: අනුපලිත්තට්ඨො[7] සුඤ්ඤට්ඨො අසමහජනට්ඨො විගතට්ඨො[8] විවත්තනට්ඨො[9] සුඤ්ඤට්ඨො. අයං සුඤ්ඤට්ඨො.

තත්ථ කතමො අනත්තට්ඨො: අනිස්සරියට්ඨො අනත්තට්ඨො අවසවත්තනට්ඨො අකාමකාරිට්ඨො පරිවිදට්ඨො අනත්තට්ඨො. අයං අනත්තට්ඨො'ති.

පෙටකොපදෙසෙ සුත්තත්ථසමුච්චයො නාම
ඡට්ඨමභූමි සමත්තා.

---

1. සමන්නාගමො – මජසං. / සමන්නාගමො – PTS.
2. කිරියං.
3. විහරතීති දිබ්බෙන විහාරෙන – මජසං, PTS.
4. පීතිසුඛෙන – ම, PTS.
5. උප්පීළනට්ඨො – PTS.
6. බ්‍යාධිනට්ඨො – ම, PTS.
7. අනුපලිත්තා – ම, අප්පට්ඨො – PTS
8 ගතපට්ඨො – ම.
9. විවට්ටට්ඨො – ම, PTS.

ප්‍රථමධ්‍යානය කවර පස්අඟෙකින් සම්ප්‍රයුක්ත වූයේ ද යත් : විතර්කවිචාරයන්ගෙන් ද ප්‍රීතියෙන් ද සුඛයෙන් ද චිත්තෛකාග්‍රතායෙන් ද යන පඤ්චාංගයෙනි. මේ පඤ්ච අංගයන්ගේ උත්පාද ප්‍රතිලාභයෙන් සමන්විත වූ සාක්ෂාත්ක්‍රියායෙන් ප්‍රථමධ්‍යානය ලබන ලදැයි කියනු ලැබේ. මේ පඤ්ච අංගයන් උපදවා වාසය කෙරේ නුයි එයින් කියනු ලැබේ. 'ප්‍රථම ධ්‍යානය උපදවා දිව්‍යවිහාරයෙන් යුක්ත වැ වාසය කෙරේ යයි.

එහි ද්විතීයධ්‍යානය සතර අඟෙකින් සමන්විත වෙයි : ප්‍රීතියෙන් සුඛයෙන් චිත්තෛකාග්‍රතායෙන් අධ්‍යාත්මයෙහි සම්ප්‍රසාදයෙනි. මේ සතර අංගයන් උපදවා සපයා වාස කෙරෙයි. එයින් කියනු ලැබෙයි. දෙවැනි ධ්‍යානය උපදවා වාස කෙරේ යයි.

එහි තෘතීයධ්‍යානය පස් අඟෙකින් සමන්විත වෙයි : ස්මෘතියෙන් සම්‍යග්ඥනයෙන් සුඛයෙන් චිත්තෛකාග්‍රතායෙන් උපෙක්ෂායෙන් යන මෙයිනි මේ පඤ්ච අංගයන් උපදවා වාස කෙරෙයි. එයින් කියනු ලැබෙයි. තෙවැනි දැහැන උපදවා වාස කෙරේ යයි.

එහි චතුර්ථධ්‍යානය සතර අඟෙකින් සමන්විත යැ : උපෙක්ෂායෙන් සමෘතිපාරිශුද්ධියෙන් අදුක්ඛමසුඛවේදනායෙන් චිත්තෛකාග්‍රතායෙන් ද යන සතරෙනි. චතුර්ථධ්‍යානය මේ සතර අංගයෙන් යුක්ත වූයේ යි. මෙසේ මේ සතර අංගයන්ගේ උත්පාද ප්‍රතිලාභයෙන් සමන්විත වූ සාක්ෂාත්ක්‍රියායෙන් චතුර්ථධ්‍යානය ප්‍රතිලබ්ධ යයි කියනු ලැබේ. මේ සතර දැහැන් උපයා සපයා ඊට පැමිණ වාස කෙරෙයි. එයින් කියනු ලැබෙයි, 'දිව්‍යවිහාරයෙන් යුක්ත වැ වෙසේ යයි.

6–24. එහි අනිත්‍යාර්ථ කවරෙ යත් : පීඩනස්වභාවය අනිත්‍යාර්ථ යැ, ප්‍රභඞ්ගාර්ථය සම්ප්‍රාපනාර්ථය විවෙකාර්ථය අනිත්‍යාර්ථ යැ. මේ අනිත්‍යාර්ථ යි.

එහි දුඃඛාර්ථ කවරෙ යත් : පීඩනාර්ථය දුඃඛාර්ථ යැ සම්පීඩනාර්ථය සංවෙගාර්ථය ව්‍යාබාධනාර්ථය දුඃඛාර්ථ යැ. මේ දුඃඛාර්ථ යි.

එහි ශූන්‍යතාර්ථ කවරෙ යත් : අනුපලිප්තාර්ථය ශූන්‍යතාර්ථ යැ අසම්භජනාර්ථය විගතාර්ථය විවර්තාර්ථය ශූන්‍යතාර්ථ යැ, මේ ශූන්‍යතාර්ථ යි.

එහි අනාත්මාර්ථ කවරෙ යත් : ඓශ්වර්‍ය්‍ය රහිතාර්ථය අනාත්මාර්ථ යැ වශයෙහි නො පවත්නා ස්වභාව, කැමැතිසේ නො කළහැකි බව, (පරිච්ඡේදාර්ථය ?) අනාත්මාර්ථ යැ. මේ අනාත්මාර්ථ වේ යයි.

**පෙටකොපදෙසයෙහි සූත්‍රාර්ථසමුච්චය නම්**
**ෂෂ්ඨභූමි සමාප්ත යි.**

# 7. සත්තමභූමි

## හාරසම්පාතභූමි

### 7 - 1. පකිණ්ණක නිද්දෙසො

ඣානං විරාගො, 'චත්තාරි ඣානානි' විත්ථාරෙන කාතබ්බානි තානි දුවිධානි : බොජ්ඣඞ්ගවිප්පයුත්තානි ච බොජ්ඣඞ්ගසම්පයුත්තානි ච. තත්ථ බොජ්ඣඞ්ගවිප්පයුත්තානි බාහිරකානි, බොජ්ඣඞ්ගසම්පයුත්තානි අරියපුග්ගලානි.

තත්ථ යෙන ජ පුග්ගලමූලානි තෙසං නික්ඛිපිත්වා[1] රාගචරිතො දොසචරිතො මොහචරිතො රාගදොසචරිතො රාගමොහචරිතො දොස-මොහචරිතො සමභාගචරිතො, ඉති ඉමෙසං පුග්ගලානං ඣානං සමාපජ්ජිතානං පඤ්ච නීවරණානි පටිපක්ඛො, තෙසං පටිඝාතාය යථා අසම්මොහො[2] තීණි අකුසලමූලානි නිග්ගණ්හාති. ලොභෙන අකුසලමූලෙන අභිජ්ඣා ච උද්ධච්චං ච උප්පිලවිතං අලොභෙන කුසලමූලෙන නිග්ගණ්හාති, කුක්කුච්චං ච විචිකිච්ඡා ච මොහපක්ඛො, තං අමොහෙන නිග්ගණ්හාති, දොසො ච ථීනමිද්ධං[3] ච දොසපක්ඛො තං අදොසෙන නිග්ගණ්හාති.

තත්ථ අලොභස්ස පාරිපූරියා නෙක්ඛම්මවිතක්කං විතක්කෙති, තත්ථ අදොසස්ස පාරිපූරියා අබ්‍යාපාදවිතක්කං විතක්කෙති, තත්ථ අමොහස්ස පාරිපූරියා අවිහිංසාවිතක්කං විතක්කෙති.

තත්ථ අලොභස්ස පාරිපූරියා විවිත්තො හොති කාමෙහි, තත්ථ අදොසස්ස පාරිපූරියා අමොහස්ස පාරිපූරියා ච විවිත්තො හොති පාපකෙහි අකුසලෙහි ධම්මෙහි.

සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති.

විතක්කොති තයො විතක්කා : නෙක්ඛම්මවිතක්කො අබ්‍යාපාද-විතක්කො අවිහිංසාවිතක්කො, තත්ථ පඨමාභිනිපාතො විතක්කො, පටිලද්ධස්ස[5] විචරණං විචාරො, යථා පුරිසො දූරතො පුරිසං පස්සති ආගච්ඡන්තං, න ච තාව ජානාති එසො ඉත්ථීති වා පුරිසොති වා, යදා තු පටිලභති ඉත්ථීති වා පුරිසොති වා එවං වණ්ණොති වා එවංසණ්ඨානොති වා, ඉමෙ විතක්කයන්තො උත්තරිං[4] උපපරික්ඛති[6] කින්නු ඛො අයං සීලවා උදාහු දුස්සීලො අඩ්ඪො වා දුග්ගතො'ති වා. එවං විචාරො විතක්කෙ අප්පෙති, විචාරො චරියති ච අනුවත්තති ච.

---

1. නික්ඛිපෙත්වා - ම.
2. තෙසං අභියාතාය ච පමත්තා PTS.
3. ථිනමිද්ධං - ම.
4. උත්තරි - ම.
5. විතක්කාති - ම, PTS.
6. උපපරික්ඛන්ති - ම.

# 7. සප්තම භූමිය

## හාරසම්පාත

### 7.1 ප්‍රකීර්ණක නිර්දේශය

1. ධ්‍යානය විරාග යැ. සතර ධ්‍යානයෝ විස්තර කළයුත්තාහු යැ. ඒ ධ්‍යානයෝ බොධ්‍යඞ්ග විප්‍රයුක්ත වූවාහු ද බොධ්‍යඞ්ග සම්ප්‍රයුක්ත වූවාහු දැයි දෙවැදෑරුම් වෙති. එහි බොධ්‍යඞ්ග විප්‍රයුක්ත වූවෝ ශාසනයෙන් බැහැර වූවාහු යැ, බොධ්‍යඞ්ග සම්ප්‍රයුක්ත වූවෝ ආර්‍යපුද්ගලයන් පිළිබඳ වූවාහු යි.

2. එහි පුද්ගලමූලයෝ සදෙනෙක් වෙති : රාගචරිත යැ දෙසචරිත යැ මොහචරිත යැ රාගදෙසචරිත යැ, රාගමොහචරිත යැ දෙසමොහචරිත යැ, සමභාගචරිත යි. මෙසේ ධ්‍යානයට සමවන් මේ පුද්ගලයන්ට පඤ්චනීවරණයෝ ප්‍රතිපක්ෂ වෙති. ඔවුන්ගේ නැසීම පිණිස අසමර්ථ වූයේ තුන් අකුශලමූලයන් නිගන්නේ වෙයි : ලොභඅකුශල මූලයෙන් අභිධ්‍යාවත් උද්ධච්චයත් උත්ප්ලවනය වනුයේ අලොභ කුශලමූලයෙන් එය නිගනී. කුක්කුච්චයත් විචිකිච්ඡාවත් මොහපක්ෂ යැ, එය අමොහ කුශලමූලයෙන් නිගනී. ද්වෙෂයත් ථීනමිද්ධයත් ද්වෙෂපක්ෂයෙහි වූයේ යැ, එය අදෙසකුසලමූලයෙන් නිගනී.

එහි අලොභයාගේ පාරිපූරිය පිණිස නෛෂ්ක්‍රම්‍යවිතර්කය විතර්ක කෙරෙයි. අදෙසයාගේ පාරිපූරිය පිණිස අව්‍යාපාදවිතර්කය විතර්ක කෙරෙයි. අමොහයාගේ පාරිපූරිය පිණිස අවිහිංසා විතර්කය විතර්ක කෙරෙයි.

එහි අලොභයාගේ පිරීම පිණිය කාමයන්ගෙන් වෙන්වූයේ වෙයි. එහි අදෙසයාගේ පිරීමට ද අමොහයාගේ පිරීමට ද ලාමක අකුශලධර්මයන්ගෙන් වෙන්වූයේ වෙයි.

3. විතර්ක සහිත වූ විචාර සහිත වූ නීවරණයන්ගේ වෙන්වීමෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති පළමුවන දැහැනට පැමිණ වාස කෙරෙයි.

විතක්ක යනු : නෙක්ඛම්මවිතක්ක අව්‍යාපාදවිතක්ක අවිහිංසාවිතක්ක යන තුන් විතර්කයෝ යි. එහි අරමුණෙහි සිත පළමුව නහාලීම ' විතක්ක ' නම් වෙයි, ලැබූ අරමුණෙහි සිත හැසිරැවීම ' විචාර ' යැ, ඒ මෙසේ යැ : පුරුෂයෙක් දුරින් එන පුරුෂයකු දකී, තෙලෙ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ යැයි තව නො දනී. යම් කලෙක වනාහි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ යැ මෙබඳු වර්ණ ඇත්තේ හෝ මෙබඳු සටහන් ඇත්තේ හෝ යැයි දැනගනී ද, මෙසේ විතර්ක කරනුයේ මත්තෙහි විමසයි : කිමැ මේ තෙමේ සිල්වත් ද නොහොත් දුශ්ශීල ද ධනවත් හෝ දුප්පත් හෝ දැයි මෙසේ විචාරය විතර්කයෙහි පිහිටුවයි. විචාරය අරමුණෙහි හසුරුවනුලබන්නේ ද අනුව පවත්නේ ද වේ.

යථා පක්ඛී පුබ්බං ආයූහති, පච්ඡා නායූහති, යථා ආයූහනා එවං විතක්කො, යථා පක්ඛානං පසාරණං එවං විචාරො අනුපාලෙති[1] විතක්කෙති විචරති විචාරෙති. විතක්කයති විතක්කෙති, අනුවිචරති විචාරෙති.

කාමසඤ්ඤාය පටිපක්ඛො විතක්කො, ව්‍යාපාදසඤ්ඤාය විහිංසාසඤ්ඤාය ච පටිපක්ඛො විචාරො, විතක්කානං කම්මං අකුසලස්ස අමනසිකාරො, විචාරානං කම්මං ජෙට්ඨානං සංවාරණා.

යථා පලිතො තුණ්හිකො සජ්ඣායං කරොති එවං විතක්කො, යථා තංයෙව අනුපස්සති එවං විචාරො. යථා අපරිඤ්ඤා එවං විතක්කො, යථා පරිඤ්ඤා එවං විචාරො. නිරුත්තිපටිසම්භිදායං ච පටිභානපටිසම්භිදායං ච විතක්කො ධම්මපටිසම්භිදායං ච අත්ථපටිසම්භිදායං ච විචාරො, කල්ලතා[2]කොසල්ලතා චිත්තස්ස විතක්කො, අභිනීහාරකොසල්ලං චිත්තස්ස විචාරො, ඉදං කුසලං ඉදං අකුසලං ඉදං පහාතබ්බං ඉදං සච්ඡිකාතබ්බන්ති විතක්කො, යථා පහානං ච සච්ඡිකිරියා ච එවං විචාරො.

ඉමෙසු විතක්කවිචාරෙසු ඨිතස්ස දුවිධං දුක්ඛං න උප්පජ්ජති කායිකං ච චෙතසිකං ච, දුවිධං සුඛං උප්පජ්ජති: කායිකං ච චෙතසිකං ච ඉති විතක්කජනිතං චෙතසිකං සුඛං පීති. කායිකං සුඛං කායිකොයෙව. යා තත්ථ චිත්තස්ස එකග්ගතා, අයං සමාධි. ඉති පඨමං ඣානං පඤ්චඞ්ගවිප්පහීනං පඤ්චඞ්ගසමන්නාගතං.

තෙසං යෙව විතක්කවිචාරානං අභික්ඛණං ආසෙවනාය තස්ස තප්පොණමානසං හොති, තස්ස විතක්කවිචාරා ඔළාරිකා ඛායන්ති. යං ච පීතිසුඛං ච නෙක්ඛම්මං ච ඔළාරිකං භවති. අපි ච සමාධිජා පීති රති ච ජායති තස්ස විචාරාරම්මණං. තෙසං වූපසමා අජ්ඣත්තං චෙතො සම්පසීදති. යෙ විතක්කවිචාරා ද්වෙ ධම්මානුස්සරිතබ්බා, පච්චුප්පන්නාදරණිතබ්බං. තෙසං වූපසමා එකොදිභාවං චිත්තෙකග්ගතං හොති. තස්ස එකොදිභාවෙන පීති පාරිපූරිං ගච්ඡති, යා පීති තං සොමනස්සින්ද්‍රියං, යං සුඛං තං සුඛින්ද්‍රියං, යා චිත්තෙකග්ගතා අයං සමාධි. තං දුතියං ඣානං චතුරඞ්ගසමන්නාගතං. සො පීතියා විරාගා ඤාති ඔජති ජල්ලසංගහං.[3]

තත්ථ සොමනස්සචිත්තමුප්පාදුනන්ති ච සො තං විචිනතො උපෙක්ඛමෙව මනසිකරොති. සො පීතියා විරාගා උපෙක්ඛකො විහරති. යථා ච පීතියා සුඛමානීතං[4] තං කායෙන පටිසංවෙදෙති සම්පජානො විහරති. යෙන සතිසම්පජඤ්ඤෙන උපෙක්ඛාපාරිපූරිං ගච්ඡති, ඉදං තතියං ඣානං චතුරඞ්ගසමන්නාගතං.

1. අනුපාලති – ම, PTS.
2. කල්ලිතා – ම, PTS
3. ඔජති ජල්ලසංගතං – මජ්ඣං.
4. සුඛමානිතං – ම.

යම්සේ පක්ෂි තෙම පළමුව වැයම් කෙරේ ද, පසුව වැයම් නො කෙරේ ද, ආයූහනය (වැයම් කිරීම) යම්සේ ද විතර්කය එබඳු යැ, පක්ෂප්‍රසාරණය යම්සේ ද, විචාරය එබඳු යැ, අනුපාලන විතර්කන විචරණ විචාරණ විතර්කණ අනුවිචරණ විචාරණ කෙරේයයි.

විතර්කය කාමසංඥාවට ප්‍රතිපක්ෂ යැ, විචාරය ව්‍යාපාදසංඥාවට ද විහිංසාසංඥාවට ද ප්‍රතිපක්ෂ යැ, විතර්කයන්ගේ කර්මය අකුශලය නො මෙනෙහි කිරීම යැ, විචාරයන්ගේ කර්මය (ජෙට්ඨානං) ද සංවාරණ යැ.

යම්සේ පලික ? නො බෙණමින් සජ්ඣායනා කෙරේ ද, විතර්කය එබඳු යැ, යම්සේ ඒ සජ්ඣායනය මැ නුවණින් දකී ද, විචාරය එබඳු යි. අපරිඥාව යම්සේ ද විතර්කය එබඳු යැ, පරිඥාව යම්සේ ද විචාරය එබඳු යි. නිරුක්තිපටිසම්භිදායෙහි ද පටිභානපටිසම්භිදායෙහි ද විතර්කය වෙයි. ධම්මපටිසම්භිදායෙහි ද අත්ථපටිසම්භිදායෙහි ද විචාරය වෙයි. චිත්තයාගේ කල්‍යතාකෞශල්‍යය (වශීභාවයෙන්, ප්‍රගුණ කළබව) විතර්ක යැ, චිත්තයාගේ අභිනීහාරයෙහි කුශලබව විචාර යැ, මේ කුශල යැ මේ අකුශල යැ මේ භාවිතව්‍ය යැ මෙය ප්‍රහාතව්‍ය යැ මේ ප්‍රත්‍යක්ෂ කටයුතු යැ යනු විතර්ක යැ, එපරිදි ප්‍රහාණය ද භාවනාව ද ප්‍රත්‍යක්ෂ කිරීම ද විචාරය යි.

මේ විතර්ක විචාරයන්හි සිටියහුට කායික වූ ද චෛතසික වූ ද දෙවැදෑරුම් දුක නූපදී, කායික වූ ද චෛතසික වූ ද දෙවැදෑරුම් සුවය උපදී, මෙසේ විතර්කයෙන් උපන් චෛතසික සුඛය ප්‍රීතිය යි, කායික සුඛය කායික වූ මැ සුඛය යි. එහි චිත්තයාගේ යම් ඒකාග්‍රතායෙක් වේ ද මේ සමාධි යි. මෙසේ ප්‍රථමධ්‍යානය පඤ්චාඞ්ගයෙකින් ප්‍රහීණ වූයේ පඤ්චාඞ්ගයෙකින් සමන්විත වූයේ වේ.

ඒ විතර්කවිචාරයන් ම නිරතුරු ආසෙවනය හේතුකොටගෙන ඔහුගේ තත්ප්‍රවණ වූ මනය වෙයි. ඔහුට විතර්කවිචාරයෝ ඖදරික ව වැටැහෙත්, යම් ප්‍රීතිය හා සුඛයකුත් නෛෂ්ක්‍රම්‍යයකුත් ඖදරික වේ ද, එතෙකුදුවත් ඔහුට විචාරය අරමුණුකොට සමාධියෙන් උපන් ප්‍රීතියත් රතියත් උපදී. ඒ ප්‍රීතිරති යන මොවුන්ගේ සන්හිඳිමෙන් අධ්‍යාත්මයෙහි සිත පහදී විතක්ක විචාර යන යම් ධර්මයෝ දෙදෙනෙක් සිහිකළ යුත්තාහු ද, (පච්චුප්පන්නදරණිතබ්බං ?) ඔවුන්ගේ සන්හිඳිමෙන් ඒකොදිභාවයෙන් වූ සිතෙහි එකඟබව වෙයි. ඔහුට ඒකොදිභාවය, හේතුකොට ප්‍රීතිය පිරීමට යෙයි. යම් ප්‍රීතියක් වේ ද එය සොමනස්සින්ද්‍රිය යැ යම් සුඛයෙක් වේ ද එය සුඛින්ද්‍රිය යැ යම් සිතෙහි එකඟබවක් ඇද්ද මේ සමාධිය යි. ඒ දෙවැනි දැහැන සිව් අඟෙකින් සමන්වාගත වේ. හේ ප්‍රීතියගේ විරාගයෙන් (යාති ඔජහි ජල්ලසංගතං ?)

ඒ දෙවැනි දැහැනෙහි සොම්නස් සහගත සිත උපාදනයෙකැයි ද හේ එය විමසනුයේ උපේක්ෂාව මැ මෙනෙහි කෙරෙයි. හේ ප්‍රීතියගේ විරාගයෙන් උපේක්ෂා ඇති වැ වාස කෙරෙයි, යම් පරිදි ප්‍රීතිය හේතුකොටගෙන සුවය එළවනලද්ද ඒ සුවය කයින් විඳි සම්‍යක් ඥාන ඇති වැ වාස කෙරෙයි. යම් සතිසම්පජඤ්ඤයෙකින් උපේක්ෂාව පිරීමට යේ ද එයයි. මේ තුන්වැනි දැහැන සතර අඟෙකින් සමන්වාගත වේ.

තථා කායිකස්ස සුඛස්ස පහානාය පඨමේ ඣානෙ සොමනස්සින්ද්‍රියං නිරුජ්ඣති. දුතියෙ ඣානෙ දුක්ඛින්ද්‍රියං නිරුජ්ඣති, සො සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති.

තත්ථ චතූහි ඉන්ද්‍රියෙහි උපෙක්ඛාපසාදො හොති, දුක්ඛින්ද්‍රියෙන දොමනස්සින්ද්‍රියෙන සුඛින්ද්‍රියෙන සොමනස්සින්ද්‍රියෙන ච. තෙසං නිරොධා උපෙක්ඛාසම්පජඤ්ඤං හොති, තත්ථ සුඛින්ද්‍රියෙන සොමනස්සින්ද්‍රියෙන ච අසති හොති, තෙසං නිරොධා සතිමා හොති, දුක්ඛින්ද්‍රියෙන දොමනස්සින්ද්‍රියෙන ච අසම්පජඤ්ඤං, තෙසං නිරොධා සම්පජඤ්ඤං හොති, ඉති උපෙක්ඛාය ච සඤ්ඤා,[1] සතො සම්පජානො චිත්තෙකග්ගතා ච, ඉදං වුච්චතෙ චතුත්ථං ඣානං

තත්ථ යො රාගචරිතො පුග්ගලො තස්ස සුඛින්ද්‍රියං ච සොමනස්සින්ද්‍රියං ච, යො දොසචරිතො පුග්ගලො තස්ස දුක්ඛින්ද්‍රියං ච දොමනස්සින්ද්‍රියං ච, යො මොහචරිතො පුග්ගලො තස්ස අසති ච අසම්පජඤ්ඤං ච.

තත්ථ රාගචරිතස්ස පුග්ගලස්ස තතියෙ ඣානෙ චතුත්ථෙ ච අනුනයො නිරුජ්ඣති, දොසචරිතස්ස පඨමෙ ඣානෙ දුතියෙ ච පටිඝං නිරුජ්ඣති. මොහචරිතස්ස පුග්ගලස්ස පඨමෙ ඣානෙ දුතියෙ ච අසම්පජඤ්ඤං නිරුජ්ඣති, තතියෙ ඣානෙ චතුත්ථෙ ච අසති නිරුජ්ඣති, එවමෙව තෙසං තිණ්ණං පුග්ගලානං චත්තාරි ඣානානි වොදානං ගමිස්සන්ති

තත්ථ රාගදොසචරිතස්ස පුග්ගලස්ස අසම්පජඤ්ඤං ච අනුනයො ච පටිඝං ච, තෙන හානභාගියං ඣානං හොති. තත්ථ රාගමොහචරිතස්ස පුග්ගලස්ස අනුනයතන්තං ච ආදීනවං දස්සිතා, තං තස්ස හානභාගියං ඣානං හොති, තත්ථ දොසමොහචරිතස්ස පුග්ගලස්ස පටිඝො ච අසති ච අසම්පජඤ්ඤං ච ආදීනවං දස්සිතා, තෙන තස්ස හානභාගියං ඣානං හොති. තත්ථ රාගදොසමොහසමභාගචරිතස්ස පුග්ගලස්ස විසෙසභාගියං ඣානං හොති

ඉමානි චත්තාරි ඣානානි සත්තසු පුග්ගලෙසු නිද්දිසිතබ්බානි චතූසු ච සමාධීසු : ඡන්දසමාධිනා පඨමං ඣානං, විරියසමාධිනා දුතියං ඣානං, චිත්තසමාධිනා තතියං ඣානං, වීමංසාසමාධිනා චතුත්ථං ඣානං. අප්පණිහිතෙන පඨමං ඣානං, සුඤ්ඤතාය දුතියං ඣානං, අනිමිත්තෙන තතියං ඣානං, ආනාපානසතියා චතුත්ථං ඣානං, කාමවිතක්කව්‍යාපාදානං ච තං තං වූපසමෙන පඨමං ඣානං හොති, විතක්කවිචාරානං වූපසමෙන දුතියං ඣානං, සුඛින්ද්‍රියසොමනස්සින්ද්‍රියානං වූපසමෙන තතියං ඣානං, කායසඞ්ඛාරානං වූපසමෙන චතුත්ථං ඣානං ච. වාගාධිට්ඨානෙන පඨමං ඣානං, සච්චාධිට්ඨානෙන දුතියං ඣානං, පඤ්ඤාධිට්ඨානෙන තතියං ඣානං, උපසමාධිට්ඨානෙන චතුත්ථං ඣානං, ඉමානි චත්තාරි ඣානානි සඞ්ඛෙපනිද්දෙසෙන නිද්දිට්ඨානි.

---

1. සඤ්ඤතා - PTS.

එසේමැ කායික සුඛයාගේ ප්‍රහාණය පිණිස ප්‍රථමධ්‍යානයෙහි සොමනස්සින්ද්‍රිය නිරුද්ධ වෙයි. ද්විතීයධ්‍යානයෙහි දුක්ඛින්ද්‍රිය නිරුද්ධ වෙයි. හේ සුඛයාගේ ද, ප්‍රහාණයෙන් දුක්ඛයාගේ ද ප්‍රහාණයෙන් පූර්වයෙහි තුන්වැනි දැහැනෙහි මැ සොම්නස් දෙම්නසුන්ගේ අස්තඞ්ගමයෙන් නොදුක් නොසුව වූ උපේක්ෂායෙන් උපන් ස්මෘති පාරිශුද්ධිය ඇති සිව්වැනි දැහැන උපයා වාස කෙරෙයි.

එහි දුක්ඛින්ද්‍රය දෙමනස්සින්ද්‍රිය සුඛින්ද්‍රිය සොමනස්සින්ද්‍රිය ද යන සතර ඉන්ද්‍රියයන් ගෙන් උපෙක්ෂාප්‍රසාදය වෙයි. ඔවුන්ගේ නිරොධයෙන් උපෙක්ෂා සම්ප්‍රජන්‍යය වෙයි. එහි සුඛින්ද්‍රියයෙන් ද සොමනස්සින්ද්‍රියයෙන් ද අසතිය වෙයි. ඔවුන්ගේ නිරෝධයෙන් සමෘතිමත් වේ. දුක්ඛින්ද්‍රියයෙන් ද දෙමනස්සින්ද්‍රියයෙන් අසම්පජඤ්ඤ වෙයි. ඔවුන්ගේ නිරොධයෙන් සම්‍යග්ඥානය වේ. මෙසේ (උපෙක්ඛාය ච සඤ්ඤා?) සිහි ඇතියේ සම්‍යග්ඥාන ඇතියේ චිත්තයාගේ ඒකාග්‍රතාව ද වේ. මේ සතරවැනි දැහැන යයි කියනු ලැබේ.

එහි යම් රාගචරිත ඇති පුද්ගලයෙක් වේ ද ඔහුට සුඛින්ද්‍රිය ද සොමනස්සින්ද්‍රිය ද වෙයි, යම් දෙසචරිත පුද්ගලයෙක් වේ ද ඔහුට දුක්ඛින්ද්‍රිය ද දෙමනස්සින්ද්‍රිය ද වෙයි යම්. මෝහචරිත පුද්ගලයෙක් වේ ද ඔහුට අසතිය ද අසම්පජඤ්ඤය ද වේ.

එහි රාගචරිත පුද්ගලයාට තෙවැනි දැහැනෙහි ද සිව්වැනි දැහැනෙහි ද අනුනය නිරුද්ධ වෙයි. දෙසචරිතයාට පළමුවැනි දැහැනෙහි ද දෙවැනි දැහැනෙහි ද ප්‍රතිඝය නිරුද්ධ වෙයි. මොහචරිත පුද්ගලයාට පළමුවන දැහැනෙහි ද දෙවැනි දැහැනෙහි ද අසම්පජඤ්ඤය නිරුද් වෙයි. තෙවැනි දැහැනෙහි ද සිව්වැනි දැහැනෙහි ද අසතිය නිරුද්ධ වේ. මෙසෙයින් ඒ තුන් පුද්ගලයන්ට සතර ධ්‍යානයෝ ව්‍යවදනයට යන්නාහුය.

එහි රාගදෙසචරිත ඇති පුද්ගලයාට අසම්පජඤ්ඤය ද අනුනය ද පටිඝය ද වෙයි, එහෙයින් හානභාගිය ධ්‍යානය වේ. එහි රාග මොහචරිත පුද්ගලයාට අනුනය බව ද ආදීනව කොට දක්වන ලද, එය ඔහුට හානභාගිය ධ්‍යාන වෙයි. එහි දෙසමොහචරිත පුහුල්හට ප්‍රතිඝය ද අසතිය ද අසම්පජඤ්ඤය ද ආදීනව කොට දක්වන ලදහ. එයින් ඔහුට හාන භාගිය ධ්‍යානය වෙයි. එහි රාගදෙසමොහ සමභාග චරිත ඇති පුහුල්හට විශෙෂභාගිය ධ්‍යානය වේ.

මේ සතර ධ්‍යානයෝ පුහුලන් සත්දෙනකුන් කෙරෙහි ලා සතර සමාධීන්හි ද දක්විය යුත්තාහ: ඡන්දසමාධියෙන් ප්‍රථමධ්‍යානය ද විරියසමාධියෙන් ද්විතීයධ්‍යානය ද චිත්ත සමාධියෙන් තෘතියධ්‍යානය ද වීමංසා සමාධියෙන් චතුර්ථධ්‍යානය ද, යළි අප්පනිහිත සමාධියෙන් ප්‍රථම ධ්‍යානය ද ශුන්‍යතායෙන් ද්විතීය ධ්‍යානය ද අනිමිත්ත සමාධියෙන් තෘතියධ්‍යානය ද ආනාපාන සතියෙන් චතුර්ථධ්‍යානය ද වෙයි. කාමවිතර්ක ව්‍යාපාද යන්ගේ ද සන්හිඳීමෙන් ප්‍රථමධ්‍යානය වෙයි, විතර්ක විචාරයන්ගේ සන්හිඳීමෙන් ද්විතීයධ්‍යානය ද සුඛින්ද්‍රිය සොමනස්සින්ද්‍රියයන්ගේ සන්හිඳීමෙන් තෘතීයධ්‍යානය ද කායසංකාරයන්ගේ සන්හිඳීමෙන් චතුර්ථ ධ්‍යානය ද වෙයි. යළි ත්‍යාගාධිෂ්ඨානයෙන් ප්‍රථමධ්‍යානය ද සත්‍යාධිෂ්ඨානයෙන් ද්විතීය ධ්‍යානය ද ප්‍රඥාධිෂ්ඨානයෙන් තෘතිය ධ්‍යානය ද උපෙක්ෂාධිෂ්ඨානයෙන් චතුර්ථධ්‍යානය ද වේ. මේ සතර ධ්‍යානයෝ සංක්ෂෙපනිර්දේශයෙන් නිර්දේශ කරන ලද්දහු යි.

තත්ථ සමාධින්ද්‍රියං පාරිපූරිං ගච්ඡති, අනුවත්තනකානි චත්තාරි, තත්ථ යො පඨමං ඣානං නිස්සාය ආසවක්ඛයං පාපුණාති, සො සුඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය දොමනස්සින්ද්‍රියපටිපක්ඛෙන. යො දුතියං ඣානං නිස්සාය ආසවක්ඛයං පාපුණාති, සො සුඛාය පටිපදාය ඛිප්පාභිඤ්ඤාය දුක්ඛින්ද්‍රියපටිපක්ඛෙන, යො තතියං ඣානං නිස්සාය ආසවක්ඛයං පාපුණාති, සො සුඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය සොමනස්සින්ද්‍රියපටිපක්ඛෙන, සො සුඛාය පටිපදාය ඛිප්පාභිඤ්ඤාය සුඛින්ද්‍රියපටිපක්ඛෙන ගතො.

**පකිණ්ණක නිද්දෙසො.**

## හාරසම්පාතභූමි

**7 - 2.**

යානි චත්තාරි ඣානානි, තෙසං ඣානානං ඉමානි අඞ්ගානි, තෙසං අඞ්ගානං සමූහො[1] අස්ස අඞ්ගා, අයං ඣානභූමි කො විසෙසොති අස්ස විසෙසො: ඉමෙ සමහාරා, තෙහි[2] අයං සමූදාගමො, තස්ස සමූදාගමස්ස අයං උපනිසා[3] තාය උපනිසාය අයං භාවනා, තස්සා භාවනාය අයං ආදීනවො, තෙන අයං පරිහානි. කස්ස පරිහානීති: තදුපගජ්ඣායිනො තං යථාභණිතං පච්චවෙක්ඛතො අයං විසෙසො, තෙන විසෙසෙන අයං අස්සාදො, සො කස්ස අස්සාදො: ආජානීයජ්ඣායිනො, තස්ස[4] ආජානීයජ්ඣායිනො,[5] ඉදං කල්ලතා[6] කොසල්ලෙ ඨිතජ්ඣානං අනොමද්දියතං ගච්ඡති ඣානබලං, ඣානබලෙ ඨිතස්ස අයං පාරම්පත්තස්ස ඉමානි ඣානඞ්ගානි අනාවිලසඞ්කප්පො, පඨමෙ ඣානෙ ඣානඞ්ගානි භාවි. සා පීති[7] තදනුසාරිතතාව පඨමෙ ඣානෙ ඣානඞ්ගං තස්සඞ්ගුණො ච ධම්මා තදභිසන්නිතාය ච. (?)

පීති දුතියෙ ඣානෙ ඣානඞ්ගධම්මතා බො පන තථා පවත්තස්ස සහගතං ඣානඞ්ගධම්මං සසුඛතාය අජ්ඣත්තං සම්පසාදෙ දුතියෙ ඣානෙ ඣානඞ්ගං මනොසම්පසාදනතාය තදභිසන්නතාය ච. පීති දුතියෙ ඣානෙ ඣානඞ්ගං අජ්ඣත්තං සම්පසාදනං සමාධිජං[8] පීතිසුඛං දුතියෙ ඣානෙ ඣානඞ්ගං, චෙතසො එකොදිභාවො තතියෙ ඣානෙ ඣානඞ්ගං, උපෙක්ඛා එසනා තතියෙ ඣානෙ ඣානඞ්ගං, සුඛං තස්ස අඞ්ගානි ච. චෙතසො එකොදිභාවො චතුත්ථෙ ඣානෙ ඣානඞ්ගං. උපෙක්ඛා අදුක්ඛමසුඛා චතුත්ථෙ ඣානෙ ඣානඞ්ගං, අභිනිසාභූමි උපෙක්ඛාසතිපාරිසුද්ධි චතුත්ථෙ ඣානෙ ඣානඞ්ගං, සතිපාරිසුද්ධි ච අනෙකජ්ඣා (න) භූමිසු ඣානඞ්ගසමායුත්තා පීති වෙපුසො එකොදිභාවො චතුත්ථෙ ඣානෙ ඣානඞ්ගං.

තත්ථ කතමා ඣානභූමි: සවිතක්කෙ සවිචාරෙ විවෙකානුගතා පඨමෙ ඣානෙ ඣානභූමි, අවිතක්කෙ අවිචාරෙ අජ්ඣත්තං සම්පසාදනං ජනිතං පීතිමනුගතා දුතියෙ[9] ඣානෙ ඣානභූමි. සුඛසාතසමොහිතා සප්පීතිකා තතියෙ ඣානෙ ඣානභූමි, තස්ස සුඛදුක්ඛසහගතා අභිනීහාරසහගතා චතුත්ථෙ ඣානෙ ඣානභූමි, අප්පමාණසහගතා සත්තාරම්මණා පඨමෙ ඣානෙ ඣානභූමි, විමොක්ඛසහගතා[10] විමොක්ඛසු තතියෙ ඣානෙ ඣානභූමි. අනුපස්සනාසහගතා කායසඞ්ඛාරා ධම්මා චතුත්ථස්ස ඣානස්ස භූමි.

---

1. සම්මොහො - PTS.
2. තෙහි සමහාරෙහි - PTS.
3. උපනිස්සා - PTS.
4. තස්සා - ම.
5. ඣායිනො - ම.
6. කල්ලිතා - ම.
7. සො පීති - ම.
8. සමාධිතා - මජසං. / සමාහිතා - PTS.
9. පීති, දුතියෙ - මජසං, PTS.
10. සහගතානං - මජසං, PTS.

ඒ ධ්‍යානයෙහි සමාධින්ද්‍රිය පිරීමට යෙයි, සතරධ්‍යානයෝ අනුවර්තකයෝ යි. එහි යමෙක් ප්‍රථම ධ්‍යානය නිසා ආස්‍රවක්ෂයට පැමිණේ ද හේ සුඛපටිදයෙන් දන්ධාභිඥයෙන් දෙමනස්සින්ද්‍රියට ප්‍රතිපක්ෂභාවයෙන් ආස්‍රවක්ෂයට පැමිණෙයි, යමෙක් ද්විතීයධ්‍යානය නිසා ආස්‍රවක්ෂයට පැමිනේ ද හේ සුඛපටිපදයෙන් ක්ෂිප්‍රාභිඥයෙන් දුක්ඛින්ද්‍රියට ප්‍රති-පක්ෂ භාවයෙන් ආස්‍රවක්ෂයට පැමිණෙයි. යමෙක් තෘතියධ්‍යානය නිසා ආස්‍රවක්ෂයට පැමිණේ ද හෙතෙම සුඛපටිපදයෙන් දන්ධාභිඥයෙන් සොමනස්සින්ද්‍රියට ප්‍රතිපක්ෂ භාවයෙන් ආස්‍රවක්ෂයට පැමිණෙයි. යමෙක් චතුර්ථ ධ්‍යානය නිසා ආස්‍රවක්ෂයට පාමිණේ ද හේ සුඛපටිපදයෙන් ක්ෂිප්‍රාභිඥයෙන් සුඛින්ද්‍රියට ප්‍රතිපක්ෂභාවයෙන් ආස්‍ර වක්ෂයට ගියේ වේ.

ප්‍රකීර්ණක නිර්දෙශ යි.

## හාරසම්පාතභූමි

7 – 2.

යම් සතර ධ්‍යාන කෙනෙක් වෙත් ද ඒ ධ්‍යානයන්ගේ මේ අංගයෝ වෙති, ඒ අංග යන්ගේ සමූහය ධ්‍යානභූමි යැ, ඒ ධ්‍යානයාගේ විශේෂය කවරෙ යත් : මේ ධ්‍යානසම් භාරයෝ යැ, ඒ සම්භාරයන්ගෙන් ධ්‍යානයාගේ ඉපදීම වෙයි, ධ්‍යානයාගේ ඉපදීමට මෙ කාරණයැ, එකරුණෙන් ධ්‍යානයාගේ වැඩීම වෙයි. වැඩීමෙන් මේ ආදීනව යැ එයින් මේ පරිහානිය වෙයි. කවරක්හුගේ පරිහානිය ද යත් : ඊට පැමිණි ධ්‍යායීහුගේ යැ, එය යථෝක්ත පරිදි ප්‍රත්‍යවේක්ෂා කරනුයේ මේ විශේෂය වෙයි, ඒ විශේෂයෙන් මේ ආස්වාදය වෙයි.

ඒ කවරක්හුගේ අස්වාදය ද යත් : ආජානීය ධ්‍යායී (රහත්) හුගේ යැ, ඒ රහත්හුගේ හෝ ආර්යධ්‍යායීහුගේ මේ සමර්ථභාව කෞශල්‍යයෙහි සිටි ධ්‍යානය නො මැඩිය හැකි බවට යෙයි. මේ ධ්‍යානබලය යි. ධ්‍යානබලයෙහි සිටියහුගේ මේ ධ්‍යානාඞගයෝ (කාම සංකල්පාදීන්) නොකැලඹුණු සංකල්ප ඇතියේ (පඨමෙ ඣානෙ......තදභියන්නීතාය ච?)

ප්‍රීතිය ද්විතීය ධ්‍යානයෙහි ධ්‍යානාඞග ධර්මතා වෙයි. එසේ පැවැතියහුට ප්‍රීති සහගත ධ්‍යානාඞග ධර්මතා සුඛ සහිත බැවින් සිත පහදවන බැවින් ද ඒ ප්‍රසාදයෙන් පැතිරුණු බැවින් ද අධ්‍යාත්මයෙහි පැහැදීම ද්විතීය ධ්‍යානයෙහි ධ්‍යානාඞග වෙයි, අධ්‍යාත්මයෙහි සම්ප්‍රසාදනය ඇති සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුඛය ද්විතීය ධ්‍යානයෙහි ධ්‍යානාඞග වෙයි. චිත්තයාගේ එකඟබව තෘතියධ්‍යානයෙහි ධ්‍යානාඞග වෙයි. උපේක්ෂා යෙන් පහස්නාබව තෘතියධ්‍යානයෙහි ධ්‍යානාඞග වෙයි. සුඛය ඒ තෘතියධ්‍යානයාගේ අංග වෙයි. චිත්තයාගේ එකෝදිභාවය සතරවැනි ධ්‍යානයෙහි ධ්‍යානාංග වෙයි. නොදුක් නොසුව වූ උපෙක්ෂාව චතුර්ථධ්‍යානයෙහි ධ්‍යානාංග වෙයි. (අභිනිසා භූමි) උපෙක්ෂා යෙන් උපන් ස්මෘති පාරිශුද්ධිය චතුර්ථධ්‍යානයෙහි ධ්‍යානාඞග යැ, ස්මෘතිපාරිශුද්ධිය ද නොයෙක් ධ්‍යානභූමීන්හි ධ්‍යානාඞගයන් ගා යෙදුණු ප්‍රීතිය ද චිත්තයාගේ එකොදිභාවය දි චතුර්ථ ධ්‍යානයෙහි ධ්‍යානාඞග වෙ.

තත්ථ කතමෙ ඣානවිසෙසා: විවිච්චෙව කාමෙහි විවිච්ච පාපකෙහි(?) අකුසලෙහි ධම්මෙහි විතක්කචෙතසිකසහගතා. කාමධාතු-සමතික්ක මනතාපි, අයං ඣානවිසෙසො. අවිතක්කා චෙව අවිචාරා ච සප්පීතිකාය සතිසහගතාය පීතිසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, අයං ඣානවිසෙසො. අවිතක්කාය භූමියා අවිචාරෙයෙව සති අනුගතා උපෙක්ඛාසහගතා මනසිකාරා සමුදාචරන්ති, තදනුධම්මතා[1] ච සති සණ්ඨහති, තං ච භූමිං උපසම්පජ්ජ විහරති, අයං ඣානවිසෙසො. සතිපාරිසුද්ධිසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, තං ච භූමිං උපසම්පජ්ජ විහරති, අයං ඣානවිසෙසො. විඤ්ඤාණඤ්චායතනසහගතාය භූමියං ආකිඤ්චඤ්ඤායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, තං ච භූමිං උපසම්පජ්ජ විහරති, අයං ඣානවිසෙසො.

තත්ථ කතමෙ ඣානසමාහාරා: නෙක්ඛම්මවිතක්කො සමාහාරො කාම-විතක්කවිනොදනාධිප්පායතා, අබ්‍යාපාදවිතක්කො සමාහාරො බ්‍යාපාද-විතක්කපටිවිනොදනාධිප්පායතා, අවිහිංසාවිතක්කො සමාහාරො විහිංසා-විතක්කපටිවිනොදනාධිප්පායතා, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා අප්පිච්ඡතා සමාහාරො පරිසුද්ධාජීවො. චතුන්නං සමාපත්තීනං සමාහාරො අකම්මස්ස විහාරිතා, මග්ගසමාහාරො සමාපත්තිපජ්ජනතා, ඵලසමාහාරො ඣාන-නිබ්බත්තිතාය ඣානසමුදාගමො, කුසලහෙතු යං ඣානං සමුදයං ගච්ඡති.[2] සො ච න කුතොචි නෙක්ඛම්මපත්තා සමුදාගච්ඡන්ති, ආලම්බ-නිරොධසමාධි සතො සමුදාගච්ඡන්ති, අවිතක්කත්තා සමුදාගච්ඡන්ති සුඛින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං පහානාය තෙ ච අබ්‍යාපජ්ජතාය සමුදා-ගච්ඡන්ති. තං පන සඞ්ඛාය සමුදාගච්ඡන්ති. අපරිදහනාය සමුදාගච්ඡන්ති. ඣානසමුදාගමො.

තත්ථ කතමා උපනිසා: කල්‍යාණමිත්තතා ඣානස්ස උපනිසා, කල්‍යාණසම්පවඞ්කතා ඣානස්ස උපනිසා, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා ඣානස්ස උපනිසා, අසන්තුට්ඨිතා[3] කුසලෙසු ධම්මෙසු සද්ධම්මසවනං[4] ඣානස්ස උපනිසා, සංවෙජනීයෙ[5] ඨානෙ සංවිග්ගස්ස යොනිසොපධානං ඣානස්ස උපනිසා, අයං ඣානොපනිසා.

තත්ථ කතමා භාවනා: මෙත්තාසෙවනා අබ්‍යාපාදවිතක්කභාවනා, කරුණාසෙවනා[6] අවිහිංසාවිතක්කභාවනා, මුදිතාභාවනා පීතිසුඛ-සම්පජඤ්ඤකාරිතා, උපෙක්ඛාභාවනා පස්සවනා උපෙක්ඛාභාවනා අපස්සවනා උපෙක්ඛා ච අජ්ඣුපෙක්ඛා ච අසුභසඤ්ඤාභාවනා දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා භවසඞ්ඛාභිඤ්ඤා භවසඞ්ඛානං, යා ඡබ්බිධා භාවනා භාවිතා බහුලීකතා අනුට්ඨිතා වත්ථුකතා යානීකතා පරිචිතා සුසමාරද්ධා, අයං භාවනා.

---

1 තදනුධම්මතාය – මජසං, PTS.
2. ගච්ඡන්ති – ම.
3. අසන්තුට්ඨිස්ස – PTS.
4. සද්ධම්මස්සවනං – ම.
5. සංවෙජනියෙ – ම.
6. කල්‍යාණසෙවනා – PTS.

එහි ධ්‍යානභූමි කවර යත් : සවිතර්ක වූ සවිචාර වූ ප්‍රථමධ්‍යානයෙහි නීවරණ විවේකය අනුව ගිය ධ්‍යානභූමි වෙයි. අවිතර්ක අවිචාර වූ ද්විතීය ධ්‍යානයෙහි අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති ප්‍රීතිය අනුව ගිය ධ්‍යාන භූමි වෙයි. තෘතීය ධ්‍යානයෙහි සුඛසහගත වූ සප්‍රීතික වූ ධ්‍යාන භූමි වෙයි. චතුර්ථධ්‍යානයෙහි (සුඛදුක්ඛසහගතා ?) අභිනීහාර සහගත වූ ධ්‍යාන භූමි වෙයි. (යළි) ප්‍රථම ධ්‍යානයෙහි අප්‍රමාණ සහගත සත්වයන් අරමුණු කොට ඇති ධ්‍යාන භූමි වෙයි. ද්විතීය ධ්‍යානයෙහි රූප සංඥීන් කෙරෙහි අභිභූමි ආයතන සහ ගත වූ ධ්‍යාන භූමි වෙයි. තෘතීය ධ්‍යානයෙහි විමොක්ෂයන්හි විමොක්ෂ සහගත වූ ධ්‍යාන භූමි වෙයි. අනුපස්සනා සහගත වූ කායසංඛාර ධර්මයෝ චතුර්ථධ්‍යානයාගේ භූමි වේ.

එහි ධ්‍යාන විශේෂයෝ කවරහ : කාමච්ඡන්දනීවරණයෙන් වෙන්ව (පාපකෙහි ?) ශේෂ නීවරණ සංඛ්‍යාත අකුශලධර්මයන් ගෙන් වෙන්ව චිත්ත චෛතසික සහගත බව ද කාම ධාතුව ඉක්මවන බව ද මේ ධ්‍යාන විශේෂ යැ, සප්‍රීතික ස්මෘති සහගත ධ්‍යාන භූමියෙහි අවිතර්ක වූ ද අවිචාර වූ ද ප්‍රීති සහගත සංඥ මනසිකාරයෝ පවත්නාහ. මේ ධ්‍යාන විශෙෂ යැ, අවිතර්ක භූමියෙහි ස්මෘතිය අනුවැ ගිය උපෙක්ෂා සහගත මනසිකාරයෝ පවත්නාහ. ඒ (තෘතීය ධ්‍යාන) භූමියට ද පැමිණ වෙසෙයි. මේ ධ්‍යාන විශේෂ යැ, ස්මෘති පාරිශුද්ධිය සහ ගිය සංඥමනසිකාරයෝ පවත්නාහ. ඒ ධ්‍යාන භූමියට ද පැමිණ වෙසෙයි. මේ ධ්‍යාන විශේෂ යැ, විඤ්ඤාණඤ්චායතන සහගත භූමියෙහි ආකිඤ්චඤ්ඤායතන සහගත වූ සඤ්ඤමනසිකාරයෝ පවත්නාහ. ඒ භූමියට ද එළඹැ වාසකෙරෙයි මේ ධ්‍යාන විශෙෂ යි.

එහි ධ්‍යානසම්භාරයෝ කවරහ : කාමවිතර්කයන්ගේ දුරැලීමෙහි අධ්‍යාශය ඇති බැවින් නෛෂ්ක්‍රම්‍ය විතර්කය ධ්‍යානසම්භාරයෙක, ව්‍යාපාදවිතර්කය දුරැලීමෙහි අධ්‍යාශය ඇති බැවින් අව්‍යාපාද විතර්කය සම්භාරයෙක, විහිංසා විතර්කය දුරැලීමෙහි අධ්‍යාශය ඇති බැවින් අවිහිංසා විතර්කය සම්භාරයෙක, පරිශුද්ධවූ ආජීවය ඉන්ද්‍රියයන්හි පියූ දෙර ඇති බවට අල්පෙච්ඡතාවට සම්භාර යැ, අකර්මවිහාරී බව සතර සමාපත්තීන්ට සම්භාර යැ, සමවත් සමවදනා බව මාර්ගසම්භාර යැ, ධ්‍යාන නිපදවන ලද බැවින් ධ්‍යානයාගේ සමුද්ගමය ඵල සම්භාර යැ මේ ධ්‍යාන සමුද්ගම යි.

එහි උපනිසා (හේතු) කවර යත් : කලණමිතුරන් ඇති බව ධ්‍යානයට කාරණ වෙයි. කලණමිතුරන් කෙරෙහි නැමුණුබව ධ්‍යානයට කාරණ යැ, ඉන්ද්‍රියයන්හි පියූ දෙර ඇතිබව ධ්‍යානයට කාරණ යැ, කුසල්දහම්හි අසන්තුට්ඨිතාව ධ්‍යානයට කාරණයැ, සද්ධර්ම ශ්‍රවණය ධ්‍යානයට කාරණ යැ, සංවේග දැනැවියැයුතු තැනැ සංවේග ඇතියහුගේ නුවණින් ප්‍රධන්වීර්‍ය්‍ය කිරීම ධ්‍යානයට කාරණ වේ. මේ ධ්‍යාන හේතු යි.

එහි භාවනා කවර යත් : මෛත්‍රීසේවනය අව්‍යාපාදවිතර්ක භාවනා යැ කරුණාසේවනය අවිහිංසා විතර්ක භාවනා යැ, මුදිතා භාවනාව ප්‍රීති සුඛ සම්ප්‍රජන්‍යකාරී බව යැ, උපෙක්ෂා භාවනාව (පස්සවතා...... අජ්ඣුපෙක්ඛා ච ?) අශුභසංඥා භාවනාව (දුක්ඛා පටිපදා...... සුසමාරද්ධා ?) මේ භාවනායි.

එවං භාවයන්තස්ස අයං ආදීනවො: පඨමෙ ඣානෙ සඞ්ඛාරසමන්නාගතො එසො ධම්මො අස්සුතො සාසවො. සවෙ එස ධම්මො අයං සීලො ආයත්තපටික්ඛො ච එස ධම්මො කාමොපතිචාරො සමාපත්තීනං ච සබ්බොළාරිකො එස ධම්මො විතක්කවිචාරො ච, තත්ථ චිත්තං බොහෙති,[1] කායො චෙත්ථ කිලමති, කායම්හි චෙත්ථ කිලන්තෙ චිත්තං විහඤ්ඤති,[2] අනභිනීහාරක්ඛමො ච අභිඤ්ඤානං, ඉමෙ ආදීනවා පඨමෙ ඣානෙ.

දුතියෙ ඣානෙ ඉමෙ ආදීනවා: පීතිඵරණ[3]සහගතො ච එසො ධම්මො, න සමුදාචාරසෙසති චිත්තං. අසොධයං උපගමො චෙස ධම්මො. උපගම්පරිස්සයො[4] දොමනස්සපච්චත්ථිකො චෙස ධම්මො. තත්ථ තත්ථ ඵුත්තීතං පීති, පරජ්ජතො චෙස ධම්මො දුක්කරං හොති, අවත්තනසන්තාසභූමිපරිවජ්ජයන්තො, චතූසු දුක්ඛතාසු එස ධම්මො අනුවිද්ධාපනසද්ධාය දුක්ඛතාය ච න පලිබොධදුක්ඛතාය ච අභිඤ්ඤදුක්ඛතාය ච රොගදුක්ඛතාය ච, ඉමෙ ආදීනවා දුතියෙ ඣානෙ.

තත්ථ කතමො ආදීනවා තතියෙ ඣානෙ: උපෙක්ඛාසුඛසහගතාය තත්ථ සාතාවිනං පඤ්චන්නං උපෙක්ඛාසුඛං පරිවත්තිතො එස ධම්මො තෙන නිච්චසඤ්ඤිතානං ච, යං හොති දුක්ඛූපනිසං[5] සුඛං චිත්තස්ස සබ්බොභතං උපාදාය සුඛදුක්ඛාය ගතො භවති. සුඛදුක්ඛානුගතං[6] ච උපාදාය අනභිනීහාරක්ඛමං චිත්තං හොති. අභිඤ්ඤාය සච්ඡිකිරියාසු සබ්බෙපි චෙතෙ ධම්මා තීසු ඣානසමාපත්තීසු චතූහි ච දුක්ඛතාහි අනුවිද්ධානං සා භයා දුක්ඛතාය පලිබොධදුක්ඛතාය ච අභිඤ්ඤදුක්ඛතාය ච රොගදුක්ඛතාය ච, ඉමෙ ආදීනවා තතියෙ ඣානෙ.

තත්ථ කතමෙ ආදීනවා චතුත්ථෙ ඣානෙ: ආකිඤ්චඤ්ඤසමාපත්තිතාවතෙ ධම්මානුසමාපත්තිකා එතිස්සා ච භූමියං සාතානං බාලපුථුජ්ජනානං අනෙකවිධානි දිට්ඨිගතානි උප්පජ්ජන්ති. ඔළාරිකසුඛුමානි[8] ච රූපසඤ්ඤාහි අනුවිද්ධානි එතානි ඣානානි, සදා අනුදයමෙත්තාඣානකලාදනුකලාය සාධාරණා දුක්කරා ච සබ්බෙ චත්තාරො මහාසම්භාරා, සමුදාගතානි ච එතානි ඣානානි අඤ්ඤමඤ්ඤං නිස්සාය සමුදාගච්ඡන්ති. එත්ථ සමුදාගතා ච එතෙ ධම්මා න සමත්තා හොන්ති. අසමුග්ගහිතනිමිත්තා ච එතෙ ධම්මා පරිහායන්ති නිරුජ්ඣන්ති ච එතෙ ධම්මා න උපාදියන්ති නිරුජ්ඣිතානි ච, එතෙසං ධම්මානං ඣානානි නිමිත්තානි න ඣානනිමිත්තසඤ්ඤා වොකිරති. අප්පටිලද්ධපුබ්බා ච ඣායීවසෙන ච භවති, ඉමෙහි ආදීනවෙහි. අයං ඣානපරිහානි.

නිරොධසමාපත්තියා[9]. අපටිනඛාය අවසෙසසඤ්ඤිනො ආකිඤ්චඤ්ඤායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, සො නිරොධසමාපත්තිතො පරිහායති. ආනෙඤ්ජසඤ්ඤිනො අසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසහගතා මනසිකාරා සමුදාචරන්ති, තං ච භූමිං න පජානාති, සො තතො පරිහායති. ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, තං ච භූමිං න පජානාති, සො තතො පරිහායති. විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤාසහගතා -පෙ- (විත්ථාරෙන යාව පඨමෙ ඣානෙ කාමසඤ්ඤාසහගතා කාතබ්බා.)

---

1. බොහෙන්ති – මජ්ඣං. / බොභන්ති - PTS.
2. මුහඤ්ඤති – PTS
3. පීතිසරණ – PTS.
4. පරිසයො – PTS.
5. දුක්ඛොපනිසං – ම. PTS.
6. සුඛදුක්ඛානුකතං – ම.
7. සමාපන්නා – මජ්ඣං.
8. සුඛුමෙහි – ම.
9. සමාපත්ති - PTS.

මෙසේ භාවනා කරනුවහුට මේ ආදීනවයැ : ප්‍රථමධ්‍යානයෙහි සංස්කාර සමන්වාගත වූ තෙල දහම අස්සුත යැ සාස්‍රව යැ ශීලය ආසන්න ප්‍රතිපක්ෂ වූයේ ද තෙල දහම (කාමො පතිවාරො පතිවිචාරො ?) සමාපත්තීන් අතුරෙනුදු සියල්ලට ඖදරික යැ, තෙල දහම විතර්ක විචාර ඇත්තේ ද වෙයි. එහි සිත ආලොලන කෙරෙයි. මෙහි කය ද වෙහෙසට පැමිණෙයි. මෙහි කය වෙහෙසට පත්කල්හි සිත ගැටෙයි, එහෙයින් අභිඥවන්ගේ අභිනීහාරයට අසමර්ථ වෙයි. ප්‍රථමධ්‍යානයෙහි මේ ආදීනවයෝ යි.

ද්විතීය ධ්‍යානයෙහි මේ ආදීනවයෝ වෙති : තෙල ද්විතිය ධ්‍යාන ධර්මය ප්‍රීතිඑරණයෙන් යුක්ත වූයේ ද (නසමුදවාරස්සෙති ...... රොග දුක්ඛ තාය ච? මෙහිදු අරුත් නගා ගැනීම දුෂ්කර විය.) මේ ද්විතීය ධ්‍යානයෙහි ආදීනවයෝ යි.

එහි තෘතියධ්‍යානයෙහි ආදීනවයෝ කවරහ : තත්‍රමජ්ඣත්තුපෙක්ඛා සුවයෙන් යුත් ඒ ධ්‍යානයෙහි සුවවිඳුනා පුද්ගලයන්ට ද එය නිත්‍ය යැ යන සංඥ ඇතියනට ද උපේක්ෂා සුඛය පරිවර්තන වන හෙයින් තෙල තෘතියධ්‍යානධර්මය දුකට කාරණ වූ සුවය චිත්තයාගේ කැලඹුණු බව නිසා සුව දුක් පිණිස වෙයි, සුවදුක් අනුගත නිසා සිත අභිනීහාරක්ෂම නොවෙයි, මේ සියලු මැ ධර්මයෝ අභිඥයෙන් ප්‍රත්‍යක්ෂ කටයුතු වූ තුන් ධ්‍යාන සමාපත්තීන්හි චතුර්විධ දුක්ඛතායෙන් අනුවිද්ධයනට (සාභයා ?) දුක්ඛතා පිණිස ද පළිබොධ දුක්ඛතා පිණිස ද අභිඥදුඃඛතා පිණිස ද පවත්නාහුය. තුන්වැනි ධ්‍යානයෙහි මේ ආදීනවයෝ යි.

එහි චතුර්ථධ්‍යානයෙහි ආදීනව කවරහ : (ආකිඤ්චඤ්ඤ ...... සමාපත්තිකා ?) තෙල චතුර්ථධ්‍යාන භූමියෙහි ශක්ත වූ බාලපෘථග්ජනයනට නන්වැදෑරුම් දෘෂ්ටිගතයෝ උපදිත්, තෙල ධ්‍යානයෝ ඖදරික වූ ද සූක්ෂම වූ ද රූපසංඥවන්ගෙන් අනුවිද්ධයහ, හැම කල්හි (අනුදය ...... සාධාරණ ?) සියලු සතර මහාසම්භාරයෝ දුෂ්කර වූවාහු ද වෙති, උපන්නාවූ ද තෙල ධ්‍යානයෝ ඔහුනොවූන් නිසා උපදිත්. මෙහි උපන්නාවූ ද තෙල ධර්මයෝ රැස් නොවෙති, මොනොවට නොගත් නිමිත්ත ඇති තෙල දහම්හු පිරිහෙති, නිරුද්ධ වෙත්. තෙල දහම්හු නිරුද්ධ වූ අංගයනුදු (යළි) නොගනිත්. (එතෙසං ...... ඉමෙහි ආදීනවෙහි ?) මේ ධ්‍යානපරිහානිය යි.

නිරොධසමාපත්තිය ප්‍රත්‍යවෙක්ෂා නොකොට අවශේෂ සංඥ ඇත්තහුට ආකිඤ්චඤ්ඤායතන සහගත වූ සංඥ මනස්කාරයෝ පවත්නාහු නම් හේ නිරොධ සමාපත්තියෙන් පිරිහෙයි. අසංඥයතනයට සමවන් ආනෙඤ්ජසංඥ ඇත්තහුට ආකිඤ්චඤ්ඤායතන සහගතවූ මනසිකාරයෝ පවත්නාහු නම් (හේ) ඒ ආකිඤ්චඤ්ඤායතන භූමියත් නොදනී නම් හේ ඒ සමවතින් පිරිහෙයි. ආකිඤ්චඤ්ඤායතනයට සමවන්නාහුට විඤ්ඤාණඤ්චායතන සහගත වූ යඤ්ඤමනසිකාරයෝ පවත්නාහු නම් ඒ භූමියත් නොදනී නම් හේ ඒ සමවතින් පිරිහෙයි. විඤ්ඤාණඤ්චායතනයට සමවන්නාහුට රූප සංඥ සහගත වූ ... (ප්‍රථමධ්‍යානයෙහි කාම සංඥ සහගතා යනු දක්වා විස්තරයෙන් ප්‍රකාශ කළයුතු.)

සො කිස්ස පරිහායති, සලම්බකජ්ඣායනො[1] සලම්බකං ඣායති පරිසමන්තතො ඣායති, භින්දන්තො ඣායති, න සඤ්ඣායති,[2] ආයූහන්තො ඣායති, කිඤ්චි ච න පරිච්චීතො[3] ඣායති, අතිවිධාවන්තො ඣායති, අතිමඤ්ඤන්තො ඣායති, කායසඞ්ඛාරෙ අප්පටිප්පස්සම්භිතෙ[4] ඣායති, පරියුට්ඨානස්ස නිස්සරණං අජානන්තො ඣායති, නීවරණාභිභූතො ඣායති, අස්සාදපත්තිං[5] මනසිකරොන්තො. ඣානස්ස අස්සාදෙ කාමරාගහෙතූනං ධම්මානං උදයොති[6], නිරුද්ධඛගාති[7] එතෙසං ධම්මානං ඣානානි උපරිමා සුඛුපෙක්ඛා[8] කාමකම්මකිලෙසානං පහානං අස්සාදෙ, එවං ඛො පුන ඣානස්ස අස්සාදෙ, මහාසම්බාධසම්පීළිතෙ[9]. ලොකසන්නිවාසෙ අසම්බාධොකාසොති[10] විගමෙස්සමිදං ඣානප්පහානා. අයං පලිරොධම්පපලිරොධලොකසන්නිවාසෙ එසතිසමිදං[11] ඣානං අනමතග්ගසංසාරසමාපන්නානං සත්තානං සංසාරප්පහානතාතිසංසො[12] යමිදං ඣානස්ස අස්සාදෙ. කායස්ස අඣානියඣායිනො භවති අඣානියඣානියඣායීති. අපරාමසන්තො අඣානියඣායිතං ඣායති. යානි කලම්බකඣායිනො පදුති තානි අනුම්තානි පටිපක්ඛෙ ඣානානි උපරිමා සුඛුපෙක්ඛා කාමකම්මකිලෙසානං අස්සාදෙ, එවං ඛො පුන ඣානස්ස අස්සාදෙ මහාසම්බාධසම්පීළිතෙ[10], ලොකසන්නිවාසෙ අසම්බාධොකාසො විගමෙස්සමිදං ඣානප්පහානා. අයං පලිරොධම්පපලිරොධලොකසන්නිවාසෙ එසතියමිදං ඣානං අනමතග්ගසංසාරසමාපන්නානං සත්තානං සංසාරප්පහානතාතිසංසො[13], යමිදං ඣානස්ස අස්සාදෙ. කායස්ස අඣානියඣායිනො භවති අඣානියඣානියඣානිසීති. අපරාමසන්තො අඣානියඣායී තං[14] ඣායති, යානි සලම්බකජ්ඣායිනො පදුති තානි අනුම්තානි පටිපක්ඛෙ.

තත්ථ කතමං ඣානකොසල්ලං: සමාපත්තිකොසල්ලං ඣානකොසල්ලං ඣානවිසෙසකොසල්ලං ඣානකොසල්ලං, ඣානන්තරිකකොසල්ලං ඣානකොසල්ලං, සමාපත්තිවුට්ඨානකොසල්ලං ඣානකොසල්ලං, ඣානෙ සභාවකොසල්ලං ඣානකොසල්ලං, ඣානෙ ආදීනවකොසල්ලං ඣානකොසල්ලං ඣානෙ නිස්සරණකොසල්ලං ඣානකොසල්ලං ඣානඵලෙන උප්පාදයකොසල්ලං ඣානඵලෙන පටිසඞ්ඛානඵලෙ අපරිහානධම්මතා නිබ්බත්තිඣානෙ ච කීළිතාවී[13] විසෙසභාගියං ඣානං පටිලභති[14] ඉදං පනස්සාති භාවකාරිතා ච ආරම්මණනිමිත්තගාහො නඅභිනීහාරබලං,[15] චිත්තෙකග්ගතානිමිත්තා සුගතිසහිතා සමථබලෙන අසංසීදනං ච ඣානෙ මග්ගඵලං සමථං පවත්තෙන සමාධිනො උපෙක්ඛා පටිපුබ්බාපරනිමිත්තාසයො පග්ගාහිනො සතිබලං තං පවත්තිතානං ච විපස්සනානං සමඤ්ඤබලෙ.

---

1. සලම්බකඤ්ඤාණෙ – මජසං, PTS.
2. සජ්ඣායති – මජසං, PTS.
3. නිපරිච්චිතො – මජසං, PTS.
4. අප්පටිසම්භාරෙ – මජසං, PTS.
5. අස්සාපත්ති – මජසං, PTS.
6. උදයන්ති – මජසං, PTS.
7. නිරුජ්ඣඛගාති – මජසං, PTS.
8. සුඛුපෙක්ඛා – ම.
9. මහාසංවාසම්පපීළිතෙ – ම.
10. අසමොබාධොකාසා – මජසං, PTS.
11. එසතිධම්මිදං – මජසං, PTS.
12. සංසාරප්පහානාසා – මජසං, PTS.
13. කීළතාවිථ – PTS.
14 පටිලබ්භති – ම.
15. අනභිනීහාරබලං – මජසං.

ඡේ කවර හෙයින් පිරිහෙයි යත්: කලඞ්කධ්‍යාන ඇතියෙ කලඞ්ක ආලම්බනයක් ධ්‍යාන කෙරෙයි. (අරමුණ) අවටින් ධ්‍යාන කෙරෙයි. (අරමුණ) බඳුමින් ධ්‍යාන කෙරෙයි. මොනොවට ධ්‍යාන නොකෙරෙයි. ආයූහන කෙරෙමින් ධ්‍යාන කෙරෙයි. අපරිචිත වැ අල්පමාත්‍රයක් ද ධ්‍යාන කෙරෙයි. ඉතා වෙලෙවි වැ ධ්‍යාන කෙරෙයි. අති මාන කෙරෙමින් ධ්‍යාන කෙරෙයි. නොයන්හිඳුවන ලද කායසංස්කාර (ආශ්වාස ප්‍රශ්වාස) ඇති කල්හි ධ්‍යාන කෙරෙයි. පර්යුත්ථානයාගේ නිස්සාරණය නො දත්මින් ධ්‍යාන කෙරෙයි. කාමරාගයට හේතු වූ ධර්මයන්ගේ උදය ධ්‍යානයාගේ ආස්වාද යැ යි ආස්වාද ප්‍රාප්තිය මෙනෙහි කෙරෙමින් නීවරණයන් විසින් මඩනාලද්දේ ධ්‍යාන කෙරෙයි. නිරුද්ධ ධ්‍යානාඞ්ගයෝ තෙල දහමුන්ගේ ධ්‍යාන වූවාහු සුඛ උපෙක්ෂා උපරිම වූවාහු වෙති. කාම කර්මකෙල්ශයන්ගේ ප්‍රහාණය ආස්වාද වෙයි. මෙසේ පුනර්ධ්‍යානාස්වාද තෙම මහා සම්බාධයෙන් සම්පීඩිත වූ ලෝකසනනිවාසයෙහි සම්බාධ රහිත අවකාශ ඇතියෙ යැ යි වෙන් වන්නෙම් නම් මේ ධ්‍යානප්‍රහාණ යි, යම් ධ්‍යානයෙක් ඇද්ද පරිරොධ අපරිරොධ ලොකසනානිවාසයෙහි මෝ එසතියම්දං? ධ්‍යානයාගේ යම් ආස්වාදයෙක් ඇද්ද මේ වූ කලි අනවරාග්‍ර සංස්සාරයට පැමිණි සත්වයන්ගේ සංසාරප්‍රහාණය ආනිසංස කොට ඇතියෙ යැ, ආලම්බනකාය අඣානියඣානීහට (ධ්‍යානාර්හ නොවූ අරමුණ ධ්‍යාන කරන්නාට) '' අඣානියඣායී '' යැ යන සිත් වෙයි, අඣානියඣායී තෙම එ අරමුණ පරාමර්ශ නො කෙරෙමින් ධ්‍යාන කෙරෙයි. කලංකධ්‍යායීහු සම්බන්ධ යම් පද කෙනෙක් ඇත් නම් ඔහු ප්‍රතිපක්ෂයෙහි ලා අනුමිත වෙති.

එහි ධ්‍යාන කෞශල්‍යය කවරෙ යත්: සමාපත්තියෙහි කුශල බව ධ්‍යාන කෞශල්‍ය යැ, ධ්‍යාන විශෙෂයෙහි කුශලබව ධ්‍යාන කෞශල්‍ය යැ, ධ්‍යානානන්තරික කෞශල්‍යය ධ්‍යාන කෞශල්‍ය යැ සමවතින් නැඟී සිටීමේ කුශලබව ධ්‍යාන කෞශල්‍ය යැ, ධ්‍යාන ස්වභාව යෙහි කුශලබව ධ්‍යාන කෞශල්‍ය යැ ධ්‍යානයෙහි ආදීනව දැනීමේ කුශලබව ධ්‍යාන කෞශල්‍ය යැ, ධ්‍යානයෙහි නිය්සරණ කෞශල්‍යය ධ්‍යාන කෞශල්‍ය යැ ධ්‍යාන ඵලයෙන් (ග්‍රහණ) කෞශල්‍යය වෙයි. ධ්‍යාන ඵලයෙන් පටිසංඛාන ඵලයෙහි නොපිරිහෙන ස්වභාව ද උපන් ධ්‍යානයෙහි වශී වූලය ද විශෙෂභාගී ධ්‍යානය ලබයි. (ඉදං පනස්සා ...... සමඤ්ඤ බලො ?)

තත්ථ කතමා ඣානපාරමිතා: සුපාරමිතා මෙත්තා "කාමෙසු සත්තා කාමසඞ්ගසත්තා"ති යම්හි සුත්තෙ දෙසනාය වොහාරෙන ද්වෙ සච්චානි නිද්දිට්ඨානි දුක්ඛං ච සමුදයො[1] ච. විචයෙන හාරෙන. යෙ සංයොජනීයෙසු ධම්මෙසු වජ්ජං න පස්සන්ති, තෙ ඔඝං තරිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. න තරිස්සන්තීති අත්ථි, එසා යුත්ති ච විචයො ච.

ඉදං නු කිස්ස පදට්ඨානං: කාමෙසු සත්තාති: පඤ්ච කාමගුණා තං කාමතණ්හාය පදට්ඨානං, සංයොජනෙ වජ්ජමපස්සමානාති. අවිජ්ජාය පදට්ඨානං, නහියාතු සංයොජනසඞ්ගසත්තා ඔඝං සාගරයඥං විපුලං මහනන්තන්ති: උපදානස්ස පදට්ඨානං.

කාමෙසු සත්තාති: කාමා දුවිධා වත්ථුකාමා ච කිලෙසකාමා ච, තත්ථ කිලෙසකාමා කාමතණ්හා, කාමතණ්හාය යුත්තා භවන්ති රූපතණ්හා භවතණ්හා, ලක්ඛණෙන හාරෙන, සංයොජනෙ වජ්ජමපස්සමානාති: සංයොජනස්ස, යො තත්ථ ඡන්දරාගො තස්ස කිං පදට්ඨානං: සුඛා වෙදනා ද්වෙ ච ඉන්ද්‍රියානි, සුඛින්ද්‍රියං ච සොමනස්සින්ද්‍රියං ච, ඉති සුඛාය වෙදනාය ගහිතාය තයොපි වෙදනා ගහිතා හොන්ති. වෙදනාක්ඛන්ධෙ ගහිතෙ සබ්බෙ පඤ්චක්ඛන්ධා ගහිතා හොන්ති. රූපසද්දගන්ධරසඵොට්ඨබ්බා ගහිතා, වත්ථුකාමෙසු ගහිතෙසු සබ්බානි ඡ බාහිරානි ආයතනානි ගහිතානි හොන්ති. අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු යො සත්තො[2] අයං වුච්චතෙ ලක්ඛණො හාරො.

තත්ථ යො ඔළාරිකම්හි කිලෙසෙ අජ්ඣාවසිතො සබ්බකිලෙසෙසු සො[3] න තතො සුඛුමතරෙසු න වීතරාගො භවති. තත්ථ බාහිරසංයොජනං මමන්ති, අජ්ඣත්තසංයොජනං අහන්ති.

තත්ථ භගවතො කො අධිප්පායො: යෙ ඔඝං තරිතුකාමා තෙ සංයොජනීයෙසු ධම්මෙසු ආදීනවානුපස්සිනො විහරිස්සන්තීති, අයමෙත්ථ භගවතො අධිප්පායො, කාමෙසු සත්තාති යෙසු ච සත්තා, යෙන ච සත්තා, යෙසං ච සත්තා, අයං චතුබ්බිධො ආකාරො සබ්බසංහාරභාගියො.

තත්ථ කතමානි තීණි විපල්ලාසානි පදට්ඨානානි ච: චිත්තවිපල්ලාසස්ස දිට්ඨිවිපල්ලාසස්ස සඤ්ඤාවිපල්ලාසස්ස තයො විපල්ලාසා තීණි අකුසලමූලානි පදට්ඨානං, තීණි අකුසලමූලානි හීනප්පණීතකාරියකම්මස්ස පදට්ඨානං, චතුන්නං ච උපාදානානං දොසො අකුසලමූලං දිස්සති, හීනප්පණීතකාරියකම්මස්ස පදට්ඨානං, යථා මාතුයා වා පිතුනො වා අඤ්ඤතරස්ස වා පුන උළාරස්ස භික්ඛුනො අභයං දෙති. තත්ථ අඤ්ඤො මිච්ඡාපටිපජ්ජෙය්‍ය කායෙන වා වාචාය වා. තත්ථ යො බ්‍යාපාදමුප්පාදය තෙසං උළාරානං රක්ඛාවරණගුත්තියා අනුපාලයන්තො, යො උළාරානං අභයං දෙති, තෙසං අභයෙ දින්නෙ යො තත්ථ මිච්ඡා පටිපජ්ජෙය්‍ය. තත්ථ සො ව්‍යාපාදං උපාදියන්තො[4] දොසජං කම්මං

1. සමුදයං – PTS.
2. සතො – ම. PTS.
3. සො – මජ්ඣං, PTS.
4. උපාදයන්තො – ම. PTS.

2–3. එහි ධ්‍යාන පාරිමිතා (උත්කර්ෂයට පැමිණි චතුර්ථ ධ්‍යාන භාවනාව) කවර යත් : (සුපාර මිතා මෙත්තා ?) 'කාමෙසු සත්තා කාමසංගසත්තා'' යි යම් සූත්‍රයෙක දේශනා ව්‍යවහාරයෙන් දුක්ඛය ද සමුදය ද යන විචය හාරයෙන් දක්වන ලද්දහු ය. යම කෙනෙක් සංයෝජනීය ධර්මයන්හි දෝෂය නොදක්නාහු ද ඔහු කාමාදි ඔඝය තරණය කරන්නාහුය යන කෙල කරුණ නොවේ. තරණය නොකරන්නාහ යන කරුණ ඇත. මේ යුක්ති ද විචය ද වෙයි.

4. මේ කුමකට පදට්ඨාන ද ? කාමෙසු සත්තා යනු පඤ්චකාමගුණයෝ යැ, එය කාම තණ්හාවට පදට්ඨාන යැ. ''සංයොජනෙ වජ්ජමපස්සමානා'' යනු අවිජ්ජාවට පදට්ඨාන යැ. න හි ජාතු සංයොජනසංගසත්තා ඔඝං තරෙයුං විපුලං මහන්තං'' යනු උපාදනයට පදට්ඨාන යි.

5. 'කාමෙසු සත්තා' යනු කාමයෝ වස්තුකාමයෝ ද කෙල්ශකාමයෝ දැයි දෙවැදෑරුම් වෙති : එහි කෙල්ශකාමයෝ කාමතණ්හා යැ, ලක්ඛණහාරයෙන් රූපතණ්හා භව තණ්හා (දෙක) කාමතණ්හාව හා යෙදුණාහු වෙති. ''සංයොජනෙ වජ්ජමපස්සමානා'' යනු (සංයොජනස්ස ?) එහි යම් ඡන්දරාගයෙක් ඇද්ද ඒ ඡන්දරාගයට කුමක් පදට්ඨාන වෙයි යත් : සුඛවේදනාව ද සුඛින්ද්‍රිය සොමනස්සින්ද්‍රිය යන ඉන්ද්‍රිය දෙක ද පදට්ඨාන වෙති. මෙසේ සුඛවේදනාව ගත් කල්හි තුන් වේදනාවෝම ගන්නා ලද්දහු වෙති. වේදනා ස්කන්ධය ගත් කල්හි සියලු පඤ්චස්කන්ධයෝ ගන්නා ලද්දහු වෙත්. රූප-සද්ද-ගන්ධ-රස-ඵොට්ඨබ්බා ගන්නා ලද්දාහු වස්තුකාමයන් ගත් කල්හි සියලු සවැදෑරුම් බාහිර ආයතනයෝ ගන්නා ලද්දහු වෙති. අජ්ඣත්තික බාහිර ආයතනයන්හි යමෙක් ඇලුණේ ද (?) මේ ලක්ෂණ හාර යයි කියනු ලැබේ.

6. එහි යමෙක් ඖදරික ක්ලේසයෙහි බැසගෙන සිටියේ ද හේ සියලු ක්ලේශයන්හි (බැසගෙන සිටියේයි.) එයින් ඉතා සියුම් වූ ක්ලේශයන්හි, වීතරාග නො වූයේ වේ. එහි මාගේ යැ යනු බාහිර සංයොජන යැ. 'මම' යැ යනු අධ්‍යාත්ම සංයොජන යි.

එහි භාග්‍යවතුන් වහන්සේගේ අධිප්‍රාය කවරෙ යත් ; යම් කෙනෙක් ඔඝය තරණය කරනු කැමති වෙත් ද ඔහු සංයොජනීය ධර්මයන්හි ආදීනව නුවණින් දකිමින් වාස කරන්නාහු යැ යනු මේ මෙහි භාග්‍යවතුන් වහන්සේගේ අධිප්‍රාය යි. 'කාමෙසු සත්තා' යනු යම් වස්තුකාමයන්හි ඇලුණාහු ද යම් ක්ලේශකාමයකින් ඇලුණාහු ද යම් කෙනකුන්ගේ හෙතුයෙන් ඇලුණාහු ද මේ චතුර්විධ ආකාරය (සබ්බෙසං හාරභාගියො ?

එහි තුන් විපල්ලසයෝ ද පදට්ඨානයෝද කවරහ යත් : චිත්තවිපල්ලාස දිට්ඨිවිපල්ලාස සඤ්ඤාවිපල්ලාස යයි තුන් විපල්ලාසයෝ වෙති. (ඔවුන්ට) තුන් අකුශල මූලයෝ පදට්ඨාන යැ, තුන් අකුශල මූලයෝ හීන ප්‍රණීතකාර්ය වූ කර්මයට පදට්ඨාන යැ, සතර උපාදනයන්ට ද දෙස අකුසල මූලය හීන ප්‍රණීත කාර්ය වූ කර්මයට පදට්ඨාන වූයේ දක්නා ලැබෙයි. ඒ මෙසේ යැ, මවට හෝ පියාට හෝ යළි අන්‍යතර ගුණවත් මහණක්හට හෝ අභය දෙයි, එහි අනෙකෙක් කයින් හෝ වචනයෙන් හෝ අයථායෙන් පිළිපදනේයැ එහි යමෙක් ප්‍රද්වේෂය නිසා ඒ උදර වූවනට රක්ෂා වරණ ගොපනයෙන් පාලනය කරනුයේ වේ ද යමෙක් උදරයනට අභය දේ ද ඔවුනට අභය දුන් කල්හි යමෙක් ඔවුන් කෙරෙහි අයථායෙන් පිළිපදනේ ද හේ ඔවුන් කෙරෙහි ව්‍යාපද කරනුයේ දෙසජ වූ අකුශලකර්මය කෙරෙයි. (යො තත්ථ අසාධු ..... නිවරණ එනාහි ?) ඔහු සතර උපාදනයෝ වෙති.

කරොති, යො තත්ථ අසාධු ඉජ්ජියා නීවරණං යං තෙසං අහයං දක්ඛිණතො සඤ්ඤං ඉදං පණීතං කාරණං යො පුන මිච්ඡාපටිපත්ති අයං බ්‍යාපාදෙ හීනගම්භිකම්මං ලොභො මොහො ච ඉමානි නීවරණ-වචනානි තානි චත්තාරි උපාදානානි, තෙහි චතූහි උපාදානෙහි යො සො උපාදානො ඉත්ථී වා පුරිසො වා තෙසං පඤ්චක්ඛන්ධානං, තෙයෙව උපාදානා[1] සමුදයො, ඉදං දුක්ඛං ච සමුදයො ච. සොයෙව දෙසනාහාරො.

7. තත්ථ කාමෙසු යෙ න රජ්ජන්ති,[2] තෙ ආදීනවානුපස්සනාය පජ්ජන්ති, ඉතිස්ස කාමධාතුයා නික්ඛමිතුකාමතා, අයං වුච්චති. නෙක්ඛම්මච්ඡන්දො, යො තත්ථ අනභිසඞ්ඛාරානං කිඤ්චි විසොධෙති තස්ස ධාවරා වා? අයං අබ්‍යාපාදච්ඡන්දො, කිඤ්චි න විහිංසති, අයං විහිංසා[3] ඡන්දො ඉති නෙක්ඛම්මාභිනීහතා තයො ඡන්දා, නෙක්ඛම්මච්ඡන්දො අබ්‍යාපාදච්ඡන්දො අවිහිංසාඡන්දො, තත්ථ නෙක්ඛම්මච්ඡන්දො අලොභො, අබ්‍යාපාදච්ඡන්දො අදොසො, අවිහිංසාඡන්දො අමොහො, ඉමානි තීණි කුසලමූලානි අට්ඨසු සම්මත්තෙසු[4] පරභිතානි, තෙසං යෙව චතුන්නං උපාදානානං නිරොධාය සංවත්තන්ති, සචෙ වා පුන කම්මං කරෙය්‍ය කණ්හං වා සුක්කං වා, තස්ස විපාකහානාය සංවත්තන්ති. ඉදං කම්මං අකණ්හං අසුක්කං කම්මක්ඛයාය සංවත්තති. තත්ථ යො තිණ්ණං අකුසලමූලානං නිරොධො, අයං නිරොධො, සොයෙව ධම්මො තත්ථ පටිපදාති, ඉමානි ද්වෙ සච්චානි, ඉමානි චත්තාරි සච්චානි. ආවට්ටො හාරො.

8. "කාමෙසු සත්තා"ති යෙ සෙක්ඛා, තෙ එකෙනෙවාකාරෙන සත්තා, යෙ පුථුජ්ජනා, තෙ ද්විහාකාරෙහි සත්තා. තත්ථායං පඤ්හො විභජ්ජබ්‍යාකරණීයො වත්තබ්බො. කිඤ්චාපි සොතාපන්නො පටිසෙවති,[7] නො ච ඛො අභිනිවෙසෙන සත්තො සො හි[8] අපචයාය පහදති, න උපචයාය සෙක්ඛො හි කිලෙසවසෙන කාමෙ පටිසෙවති. පුථුජ්ජනො පන කිලෙසසමුට්ඨානාය කාමෙ පටිසෙවති. තත්ථ කාමෙසු සත්තානං චතුබ්භං තරිස්සන්ති විභජ්ජබ්‍යාකරණීයො. අයං විභත්ති.

9. 'පරිවත්තනො'ති කාමෙ යෙ නෙව සජ්ජන්ති න ච සංයොජනෙහි සංයුත්තා, තෙ ඔඝං තරිස්සන්ති විපුලං මහන්තන්ත'න්ති. අයං සුත්තස්ස පටිපක්ඛො.

10. 'වෙවචන'න්ති යො කාමෙසු සත්තො යො ච තත්ථ කාමා-නං ගුණො තත්ථ විසො සත්තො යෙපි කාමානං ආහාරා ධම්මා තත්ථ විසො සත්තො තත්ථිමං කාමානං වෙවචනං, පඞ්කො රාජො සල්ලං ගණ්ඩො ඊති උපද්දවොති. යානි වා පන අඤ්ඤානි වෙවචනානි. තත්ථ විසො සත්තොති වෙවචනං සත්තො බද්ධො මුච්ඡිතො ගථිතො[9] අජ්ඣොසිතො කාමෙ අජ්ඣාපන්නො පරිමුත්තො තබ්බහුලවිහාරීති. යානි වා පන අඤ්ඤානි වෙවචනානි, අයං වෙවචනො නාම.

---

1. උපාදානො – මජ්ඣං, PTS.
2. පජ්ජන්ති – මජ්ඣං, PTS.
3. කිඤ්චි විහිංසති – මජ්ඣං, PTS.
4. සම්පත්තෙසු – ම. PTS.
5. විහිංසා – මජ්ඣං, PTS.
6. තස්සා යං – මජ්ඣං, PTS.
7. පටිසෙවනාය – මජ්ඣං, PTS.
8. සො හි – ම. PTS.
9. ගණිතො – PTS.

ඒ සතර උපාදනයන්ගෙන් යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ උපාදන සහිත වේ ද ඒ පඤ්ච ස්කන්ධයනට (දුක්ඛ ?) ඒ උපාදන යෝ මැ සමුදය යි. මේ දුක්ඛය ද සමුදය ද වේ. එය මැ දෙසනාහාර යි.

07. එහි යම් කෙනෙක් කාමයන්හි නො ඇලෙත් ද ඔහු ආදීනවානුපස්සනායෙහි යෙදෙති, මෙසේ ඔහුගේ කාමධාතුයෙන් නික්ම යනු කැමැති බව වේ. මේ නෛෂ්-ක්‍රම්‍යච්ඡද යයි කියනු ලැබේ. (යො තත්ර...........ධාවරා වා ?) මේ අව්‍යාපදච්ඡන්ද යෑ, කිසිවකුට හිංසා නො කෙරේ ද, මේ අවිහිංසාඡන්දය යි. මෙසේ නෛෂ්ක්‍රම්‍යයෙන් එළවන ලද නෙක්ඛම්මච්ඡන්ද අව්‍යාපාදච්ඡන්ද අවිහිංසාච්ඡන්ද යෑ, මෙසේ නෛෂ්ක්‍රම්‍යයෙන් එලවනලද නෙක්ඛම්මච්ඡන්ද අව්‍යාපාදච්ඡන්ද අවිහිංසාච්ඡන්ද යන තුන් ඡන්දයෝ වෙති. එහි නෙක්ඛම්මච්ඡන්දය අලොභ යෑ, අව්‍යාපාදච්ඡන්දය අදෙස යෑ, අවිහිංසාඡන්දය අමොහ යි, මේ තුන් කුශලමූලයෝ අෂ්ටසම්මත්තධර්මයන්හි සංග්‍රහ වෙති. එ මැ සතර උපාදනයන්ගේ නිරොධය පිණිස පවත්නාහුය, ඉදින් යළි කෘෂ්ණ වූ හෝ ශුක්ල වූ හෝ කර්මයක් කරන්නේ නම්, ඒ කර්මයාගේ විපාක හානිය පිණිස පවත්නාහ. අකණ්හ අසුක්ක වූ මේ කර්මය කර්මක්ෂය පිණිස පවතී. එහි තුන් අකුසල මූලයන්ගේ යම් නිරෝධයෙක් ඇද්ද මේ නිරෝධ යෑ, ඒ ධර්මය මැ එහි ප්‍රතිපද වේ යැයි මේ (නිරොධ මග්ග යන) සත්‍යයෝ දෙදෙනා වෙති. මේ චතුස්සත්‍ය යෝ යි), ආවත්ත හාර යි.

08. "කාමෙසු සත්තා" යනු යම් ශෛක්ෂ කෙනෙක් වෙත් ද, ඔහු එක් මැ අයු රෙකින් ඇලුණාහු යෑ, යම් පුහුදුන් කෙනෙක් වෙත් ද, ඔහු දෙ අයුරෙකින් ඇලුණාහු යෑ, එහි මේ ප්‍රශ්නය බෙද විසදියැ යුතු යයි කියැයුතු යෑ, එකෙක් ඇත :. ස්‍රොතාපන්න පුද්ගල (කාමයන්) සේවනය කෙරෙයි, නො ද අභිනිවෙසයෙන් ඇලුණේ වෙයි, හේ චනාහි අපචය පිණිස වෑයම් කෙරෙයි, උපචය පිණිස නො වේ. ශෛක්ෂ වූ කලි කෙලෙස් විසින් කාමයන් යෙවුනේ යෑ, පුහුදුන් පුද්ගල වැලිත් ක්ලෙශයන් ඉපැදීම පිණිස කාමයන් සේවන කෙරෙයි, එහි කාමයන්හි ඇලුණවුන්ගේ චතුරොස තරණය කරන්නේ යෑ යන කරුණ විභාග කොට විසඳියැ යුත්තේ යි. විභත්තිහාර යි.

09. "පරිවත්තන" යනු ; යම් කෙනෙක් කාමයන්හි නො මැ ඇලෙත් ද, සංයොජ නයන් හා නො යෙදෙත් ද, ඔහු විපුල වූ මහත් වූ ඔඝය කරණය කරන්නාහු යෑ, යන මේ සූත්‍රයාගේ ප්‍රතිපක්ෂ යි.

10. "වෙවචන" යනු; යමෙක් කාමයන්හි ඇලුණේ ද, එහි යම් කාමගුණයෙකුත් වේ ද, එහි පිවිසියේ ඇලුණේ වෙයි. කාමයන්ට ආහාර වූ යම් ධර්ම කෙනෙක් වෙත් ද, එහි පිවිසියේ ඇලුණේ වෙයි, එහි මේ කාමයන්ට වෙවචන යෑ : 'පාක යෑ රජස් යෑ ශල්‍ය යෑ ගණ්ඩ යෑ ඊති යෑ උපද්‍රව' යැයි යළි යම් අන්‍යත් වෙවන කෙනෙක් ඇද්ද ඔහු'යි. එහි පිවිසියේ යනු වෙවචන යි. 'සත්ත යෑ බන්ධ යෑ මුච්ඡිත යෑ ගථිත යෑ අජ්ඣොසිත යෑ කාමයෙහි අජ්ඣාපන්න යෑ පරිමුත්ත යෑ තබ්බහුල විහාරි යැයි, යළි යම් අන්‍යක් වෙවචිත වෙත් ද ඔහු යි, මේ වෙවචන" නමි.

11. කාමපපචාරපඤ්ඤත්තියා කිලෙසගොචරපඤ්ඤත්තියා පඤ්ඤත්තං[1] චිත්තනන්ති වෙවචනං, සත්තො තබ්බහුලවිහාරීති යානි වා පන අඤ්ඤානි. ඉමෙ කාමපපචාරපඤ්ඤත්තියා කිලෙසගොචරපඤ්ඤත්තියා පඤ්ඤත්තා බීජපඤ්ඤත්තියා පඤ්ඤත්තා, සඞ්ඛාරා සංයොජනපඤ්ඤත්තියා පඤ්ඤත්තා, උපාදානං හෙතුපඤ්ඤත්තියා පඤ්ඤත්තං, පුග්ගලො පුග්ගලපඤ්ඤත්තියා පඤ්ඤත්තො.

12. ඔතරණො’ති ඉමාය පටිච්චසමුප්පාදෙ දුක්ඛං ච සමුදයො ච. යෙ කිලෙසා යෙ සඞ්ඛාරා සංයොජනානි ච පඤ්චසු ඛන්ධෙසු සඞ්ඛාරක්ඛන්ධො ධම්මායතනෙසු අකුසලා ධම්මායතනානි, ඉන්ද්‍රියෙසු සුඛින්ද්‍රියං ච, සොමනස්සින්ද්‍රියං ච, අයං ඉන්ද්‍රියොතරණො :

13. සොධනොති එත්තකො, එසෙව ආරම්භො නිද්දිසිතබ්බො සුත්තත්ථො.

14. ‘අධිට්ඨානො’ති ඉමෙ ධම්මා අපි එකත්තතාය පඤ්ඤත්තා, අපි වෙමත්තතාය. යෙ සඤ්ඤා බාහිරෙ කාමෙ? තෙ වෙමත්තතාය පඤ්ඤත්තා. පඤ්චසු කාමගුණෙසු සත්තානි පරියුට්ඨානවිපල්ලාසා වෙමත්තතාය පඤ්ඤත්තා, ‘ඔහං කරෙය්‍යං විපුලං මහන්ත’න්ති අවිජ්ජා එකත්තතාය පඤ්ඤත්තා

15. ‘පරික්ඛාරො’ති තස්ස කො හෙතු කො පච්චයො : ආරම්මණපච්චයතාය පච්චයො. අයොනිසො ච මනසිකාරො සන්තාගිස්ස-යස්ස පච්චයතාය පච්චයො. අවිජ්ජා සමනන්තරපච්චයතාය පච්චයො. රාගානුසයො හෙතුපච්චයතාය පච්චයො. අයං හෙතු, අයං පච්චයො.

16. සමාරොපනො පච්චයො’ති යෙ කාමෙසු සත්තා සුගතා සුරූපා’’ති අයං කාමධාතුයා ඡන්දෙ රාගො, තෙ අපුඤ්ඤමයා සඞ්ඛාරා. තෙ කිංපච්චයා, අවිජ්ජාපච්චයා. තෙ කිස්ස පච්චයා, විඤ්ඤාණස්ස පච්චයා. ඉති අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං. -පෙ- (යාව ජරාමරණං) එවමෙතස්ස කෙවලස්ස මහතො දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. (එකං සුත්තං ගතං. පඤ්චනීවරණිකං සුත්තං කාතබ්බං.)

7—8

1. තත්ථ කතමො දෙසනාහාරො නාම : යා ච අභිජ්ඣා යො ච බ්‍යාපාදො යං ච උද්ධච්චං, අයං තණ්හා, යං ච ථිනමිද්ධං යං ච කුක්කුච්චං යා ච විචිකිච්ඡා, අයං දිට්ඨි. යා පන කායස්ස අකම්මනියතා කිඤ්චාපි තං මිද්ධං, නො තු සභාවකිලෙසතාය කිලෙසො, ඉති යා ච චිත්තසල්ලීයනා[2] යා ච කායකම්මනියතා[3] අයං පක්ඛපකිලෙසො[4] න තු සභාවකිලෙසො, තත්ථ අත්තසඤ්ඤානුපචිතං[5] කිලමථො.

---

1. පඤ්ඤත්තා – ම. PTS.
2. චිත්තං සල්ලීයනතාය ච – PTS.
3. කායකම්මනියතා – PTS.
4. පක්ඛාපකිලෙසා – මජසං, PTS.

11. කාමොපචාරපඤ්ඤත්තියෙන් ක්ලේශගොචර ප්‍රඥප්තියෙන් පනවන ලද 'චිත්ත' යනු වෙවචන යැ, 'සත්ත' යැ 'තම්බහුලවිහාරි, යනු ද යළි යම් අන්‍යත් වෙවචන වෙත් ද මොහු කාමොපචාර පණ්ණත්තියෙන් ක්ලේසගොචර පඤ්ඤත්ති යෙන් විජපඤ්ඤත්ති යෙන් පනවන ලද්දහු යැ, සංස්කාරයෝ සංයොජන පඤ්ඤත්තියෙන් පනවන ලදහ, උපාදානය. හෙතුපඤ්ඤත්තියෙන් පනවන ලද, පුද්ගල පුග්ගල පඤ්ඤත්තියෙන් පනවන ලදි.

12. "ඔතරණ" යනු මේ දේශනායෙන් පටිච්චසමුප්පාදයෙ, දුක්ඛ සත්‍යය හා සමුදය සත්‍යය ද, යම් කෙලෙස් කෙනෙක් යම් සංස්කාර කෙනෙක් වෙත් නම් ඔහු ද, සංයොජන යෝ ද, පඤ්චස්කන්ධයන් කෙරෙහි සංස්කාර ස්කන්ධය ද, ධර්මායතනයන් කෙරෙහි අකුශලධර්මායතනයෝ ද, ඉන්ද්‍රියයන් කෙරෙහි සුඛින්ද්‍රිය හා සොමනස්සින්ද්‍රිය ද, දක්විය යුත්තාහ. මේ ඉන්ද්‍රියෙයා තරණ ය.

13. "සොධන" යනු මෙතෙක් මෙ මැ දනගත්තු කැමැති අර්ථ සංඛ්‍යාත ආරම්භය ශුද්ධ යැ, සූත්‍රාර්ථය දක්වියැ යුතු.

14. "අධිට්ඨාන" යනු මේ ධර්මයෝ (සාමාන්‍යයෙන් දේසිත හෙයින්) එකත්තතා යෙන් පනවන ලද්දහු ඇත, විසේසදෙසිත වූ වෙමත්තතායෙන් පනවන ලද්දහු ඇති. බාහිර කාමයෙහි යම් සංඥ කෙනෙක් ඇද්ද (?) ඔහු වෙමත්තතායෙන් (වෙසෙසින්) පනවන ලදහ. පඤ්චකාම ගුණයෙන් ශක්ත වූහ' යි පරියුට්ඨාන විපල්ලාසයෝ වෙමත්තතායෙන් පනවන ලදහ. ඔඝං තරෙයග්ගං විපුලං මහන්තං යි අවිද්‍යාව එකත්තතායෙන් පනවන ලදු.

15. " පරික්ඛාර " යනු ඒ ධර්මයට හේතු කවරෙ යැ ප්‍රත්‍යය කවරෙ යැ ; ආරම්මණ ප්‍රත්‍යතායෙන් ප්‍රත්‍යය වෙයි, අයොනිසොමනසිකාරය සන්නිශ්‍රය ප්‍රත්‍යතායෙන් ප්‍රත්‍යය වෙයි, අවිද්‍යාව සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි. රාගානුසය හෙතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි. මේ හෙතු යැ මේ ප්‍රත්‍යය යි.

16. " සමාරොපණපච්චය " යනු යම් සංඛාර කෙනෙක් " කාමෙසු සත්තා සුගතා සුරූපා " යි මේ කාමධාතුයෙහි ඡන්ද යැ රාග යැ, ඔහු අපුණ්‍යමය සංඛාරයෝ යැ, ඔහු කුමක් ප්‍රත්‍යය කොට ඇත්තාහු ද : අවිද්‍යාව ප්‍රත්‍යය කොට ඇත්තාහ. ඔහු කුමකට ප්‍රත්‍යය වෙත් ද : විඥානයට ප්‍රත්‍යය වෙති. මෙසේ අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති, සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වෙයි. . . . . . (ජරාමරණ දක්වා විස්තර කළයුතු යැ. මෙසේ මෙල කේවල වූ මහත්වූ දුඃඛස්කන්ධයාගේ සමුදය වේ. (මෙල සූත්‍රය කාමච්ඡන්ද වශයෙන් කියන ලද, පඤ්චනීවරණික කොට සූත්‍රය විස්තර කළ යුතු)

7 — 3.

1. එහි දේසනාහාර නම් කවරෙ යැ : යම් අභිධ්‍යාවක් යම් ව්‍යාපාදයෙක් යම් උද්ධච්ච යෙක් වේ ද, මේ තණ්හා යැ, යම් ථිනමිද්ධයෙක් යම් කුක්කුච්චයෙක් යම් විචිකිච්ඡාවක් වේද මේ දිට්ඨි යැ. යළි නාමකායයාගේ යම් අකර්මණ්‍යබවක් වේ ද, එය මිද්ධය වූයේ නමුදු ස්වභාවක්ලේශතායෙන් කෙලශයෙක් නො වේ. මෙසේ යම් චිත්තයාගේ හැකුළුණු බවකුත් යම් කාය-අකර්මණ්‍යබවකුත් වේ ද, මේ ප්‍රක්ෂෙපක්ලේශයෙක, ස්වභාවක්ලේශ යෙක් නො වේ. එහි ආත්මසංඥයෙන් අනුපචිත වූයේ ක්ලමථු යැ, කුක්කුච්චයෙන්

කුක්කුච්චානුපතිතං[1] ථිනං, යා චිත්තස්ස ලීයනා, ඉති ඉමෙ පඤ්ච, නීවරණා චත්තාරි නීවරණානි සභාවකිලෙසා, ථිනමිද්ධං නීවරණපක්ඛපකිලෙසො. යථා චත්තාරො ආසවා සභාවආසවත්තාය ආසවා, නො කු චිත්තසාසවත්තාය ආසවා සභාවත්තාය ආසවා. පක්ඛප[2] ආසවත්තාය ආසවා. අථ පනාහ. සුක්කන්නං යෙන තෙ සම්පයුත්තා වා විප්පයුත්තා වා ආසවා, තෙයෙව එතෙ වත්තබ්බා සාසවා වා අනාසවා වා.

2. තත්ථ කතමො විචයො: අභිජ්ඣා කාමතණ්හා රූපතණ්හා භවතණ්හා. යං වා පන කිඤ්චි අජ්ඣොසානගතං සාසවං අභිජ්ඣිතස්ස මෙත්තානුපස්සිය යො[3] අනත්ථං චරති, තත්ථ සො බ්‍යාපාදං උප්පාදෙති, අචරි චරිස්සතීති. එවං පන ආඝාතවත්ථූනි කාතබ්බානි.

3. තස්සෙවං බ්‍යාපාදනුපස්සිස්ස[3] කිලෙසො යො පරිදාහො කායකිලමථො අකම්මනියතා මිද්ධං චිත්තානුපස්සිස්ස පටිඝාතෙන ඛීයනා[4] ඉදං ථිනමිද්ධං.[5] තත්ථ අධිකරණඅවූපසමො, ඉදං උද්ධච්චං. යං කිං කථමිති[6] ඉදං කුක්කුච්චං. යං යථා ඉදං සන්තීරණං, අයං විචිකිච්ඡා.

4. තත්ථ අවිජ්ජා ච තණ්හා ච අත්ථි, ඉදං පරියුට්ඨානං. ආවරණං නීවරණං ඡදනං උපක්කිලෙසො ච අත්ථි, ඉදං කාමච්ඡන්දෙ කාමරාගපරියුට්ඨානස්ස පදට්ඨානං. බ්‍යාපාදෙ බ්‍යාපාදපරියුට්ඨානස්ස පදට්ඨානං ථිනමිද්ධං ථිනමිද්ධපරියුට්ඨානස්ස පදට්ඨානං. උද්ධච්චකුක්කුච්චං අවිජ්ජාපරියුට්ඨානස්ස පදට්ඨානං, විචිකිච්ඡා විචිකිච්ඡාපරියුට්ඨානස්ස පදට්ඨානං, කාමරාගපරියුට්ඨානං අනුනයසංයොජනස්ස පදට්ඨානං, බ්‍යාපාදපරියුට්ඨානං පටිඝසංයොජනස්ස පදට්ඨානං, ථිනමිද්ධපරියුට්ඨානං මානසංයොජනස්ස පදට්ඨානං. අවිජ්ජාපරියුට්ඨානං ච විචිකිච්ඡාපරියුට්ඨානං ච දිට්ඨිසංයොජනස්ස පදට්ඨානං.

5. තත්ථ කතමො ලක්ඛණො හාරො: කාමරාගපරියුට්ඨානෙ වුත්තෙ සබ්බානි පරියුට්ඨානානි වුත්තානි භවන්ති[7], සංයොජනෙසු වුත්තෙසු සබ්බසංයොජනානි වුත්තානි භවන්ති. අයං ලක්ඛණො හාරො.

6. තත්ථ කතමො චතුබ්‍යූහො හාරො: යෙ ඉමෙ පඤ්ච නීවරණා ඣානපටිපක්ඛා, සො දුක්ඛසමුදයො. යං ඵලං, ඉදං දුක්ඛං. තත්ථ කාමච්ඡන්දස්ස නෙක්ඛම්මවිතක්කො පටිපක්ඛො. බ්‍යාපාදස්ස අබ්‍යාපාදවිතක්කො පටිපක්ඛො. තිණ්ණං නීවරණානං අවිහිංසාවිතක්කො පටිපක්ඛො. ඉති ඉමෙ තයො විතක්කා, නෙක්ඛම්මවිතක්කො සමාධික්ඛන්ධං භජති, අබ්‍යාපාදවිතක්කො සීලක්ඛන්ධං භජති, අවිහිංසාවිතක්කො පඤ්ඤාක්ඛන්ධං භජති. ඉමෙ තයො ඛන්ධා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො, නීවරණප්පහානාය සංවත්තති, යං නීවරණප්පහානං, අයං නිරොධො. ඉමානි චත්තාරි ධම්මානි. අයං චතුබ්‍යූහො හාරො.

---

1. නුපතිතං – මජසං, PTS.
2. පක්ඛ – මජසං, PTS.
3. මෙත්තානුපස්සස්සො – PTS
4. ඛියනා – ම.
5. ථිනමිද්ධං – ම.
6. කසථමිති – ම. PTS.
7. – භොන්තීති – මජසං, PTS.

අනුපචිත වූයේ චිත්තයාගේ හැකිළීම වූ ථීන යැ. මෙසේ මේ පඤ්චනිවරණයෝ සතර නිවරණ වූවාහු ස්වභාව ක්ලේශයෝ යැ. ථීනමිද්ධය නිවරණයෙහි ලා ප්‍රක්ෂෙපක්ලේශ යෙකි. යම්සේ සතර ආස්‍රවයෝ ස්වභාවආස්‍රවතායෙන් ආස්‍රව වෙත් ද, එතෙකුදු වත් චිත්තයාගේ සාස්‍රවතායෙන් ආස්‍රව නොවූවාහු ස්වභාවතායෙන් ආස්‍රව වෙත් ද, (පකෙඩ ?) ආස්‍රවභාවයෙන් ආස්‍රව වෙත්, එයින් කීහ : (සුත්තං තං . . . . . සාසවා වා අනාසවා වා ?)

2. එහි විචය කවරෙ යත් : අභිධ්‍යාව කාමතණ්හා යැ රූපතණ්හා යැ භවතණ්හා යි. යළි යම් කිසි අධ්‍යවසානයට ගිය සාස්‍රව වූ හටගත් අභිධ්‍යා ඇත්තකුගේ මෛත්‍රිය දක යමෙක් අනර්ථ කෙරේ ද, එහි යමෙක් ව්‍යාපාදය උපදවා ද, අනර්ථ කළේය, කරන්නේ යයි. මෙසේ ආඝාතවස්තු විස්තර කළයුත්තාහු ය.

3. මෙසේ ව්‍යාපාදය දක්නාවූ ඔහුගේ ක්ලේශය යම් පරිදහයෙක් කායක්ලමථුවක් අකර්මණ්‍යතායෙක් මිද්ධයක් වේ ද, චිත්තානුදර්ශී වූවහුගේ කෝපයෙන් දෙස් පහළ කිරීමෙක් වේ ද, මේ ථීනමිද්ධ යැ, එහි අධිකරණයාගේ නොසන්හිඳීමෙක් වේ ද, මේ උද්ධච්ච යැ, යමක් කිමෙක කෙසේ ද ? යන මේ කුක්කුච්ච යැ, යමක් මේ යම්සේ ද, එබඳු යයි යම් සන්තීරණයක් වේ ද මේ විචිකිච්ඡා යි.

4. එහි අවිද්‍යාව ද තෘෂ්ණාව ද ඇත, මේ පරියුට්ඨාන යැ, ආවරණ නීවරණ ඡදන උපක්ලේශ ද ඇත, මේ කාමච්ඡන්දය කාමරාග පරියුට්ඨානයට පදට්ඨාන යැ, ව්‍යාපාදය ව්‍යාපාදපරියුට්ඨානයට පදට්ඨාන යැ, ථීනමිද්ධය ථීනමිද්ධපරියුට්ඨානයට පදට්ඨාන යැ, උද්ධච්චකුක්කුච්චය අවිද්‍යා පරියුට්ඨානයට පදට්ඨාන යැ, විචිකිච්ඡාව විචිකිච්ඡාපරියුට්ඨා නයට පදට්ඨාන යැ, කාමරාගපරියුට්ඨානය අනුසය සංයොජන දෙකට පදට්ඨාන යැ, ව්‍යාපාදපරියුට්ඨානය ප්‍රතිඝසංයොජනයට පදට්ඨාන යැ, ථීනමිද්ධ පරියුට්ඨානය මානසංයොජනයට පදට්ඨාන යැ අවිජ්ජාපරියුට්ඨානය හා විචිකිච්ඡාපරියුට්ඨානය ද දිට්ඨිසංයොජනයට පදට්ඨාන යි.

5. එහි ලක්ඛණහාර කවරේ යැ : කාමරාගපරියුට්ඨානය කී කල්හි සියලු පරියුට්ඨානයෝ කියනලද්දාහු වෙති. සංයෝජනයක් කී කල්හි සියලු සංයෝජනයෝ කියන ලද්දාහු වෙත්. මේ ' ලක්ඛණහාර ' යි.

6. එහි චතුබ්‍යූහහාර කවරෙ යත් : යම් මේ පඤ්ච නීවරණ කෙනෙක් ධ්‍යානයට ප්‍රතිපක්ෂ ද හේ දුක්ඛසමුදය යැ, (එහි) යම් ඵලයක් ඇද්ද මේ දුක්ඛ යැ, එහි කාමච්ඡන්දයට නෛෂ්ක්‍රම්‍යවිතර්කය ප්‍රතිපක්ෂ යැ, ව්‍යාපාදයට අව්‍යාපාදවිතර්කය ප්‍රතිපක්ෂ යැ, (ඉතිරි) තුන් නිවරණයන්ට අවිහිංසාවිතර්කය ප්‍රතිපක්ෂ යි. මෙසේ මේ තුන් විතර්කයෝ යි. නෙක්ඛම්ම විතර්කය සමාධිස්කන්ධය බෙජෙයි, අව්‍යාපාදවිතර්කය ශීලස්කන්ධය බෙජෙයි, අවිහිංසාවිතර්කය ප්‍රඥස්කන්ධය බෙජෙයි. මේ තුන් ස්කන්ධයෝ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය යි. එය නිවරණප්‍රහාණය පිණිස පවතී. යම් නිවරණප්‍රහාණයෙක් ඇද්ද මේ නිරොධ යි. මේ සතර ධර්මයෝ වෙත්, මේ චතුබ්‍යූහ හාර යි.

7. තත්ථ කතමො ආවට්ටො හාරො: පඤ්චනීවරණානි. දස භවන්ති යදපි අජ්ඣත්තං සාරජ්ජති, තදපි නීවරණං. යදපි බහිද්ධා සාරජ්ජති, තදපි නීවරණං. එවං යාව විචිකිච්ඡා, ඉමෙ දස නීවරණා. අජ්ඣත්තබහිද්ධා කිලෙසා, ඉමානි ද්වෙ සංයොජනානි අජ්ඣත්තසංයොජනං ච බහිද්ධාසංයොජනං ච. තත්ථ අහන්ති අජ්ඣත්තං, මමන්ති බහිද්ධා. සක්කායදිට්ඨි අජ්ඣත්තං, එකසට්ඨි දිට්ඨිගතානි බහිද්ධා. යො අජ්ඣත්තං ඡන්දරාගො රූපෙසු අවීතරාගො භවති අවීතච්ඡන්දො. එවං යාව විඤ්ඤාණෙ, අයං අජ්ඣත්තා තණ්හා. යං ඡසු බාහිරෙසු ආයතනෙසු තීසු ච භවෙසු අජ්ඣොසානං, අයං බහිද්ධා තණ්හා ඉමානි ද්වෙ සච්චානි සංයොජනානි සංයොජනීයා ච ධම්මා, තත්ථ සංයොජනීයෙසු[1] ධම්මෙසු යා නිබ්බිදානුපස්සනා ච, අයං මග්ගො. යං සංයොජනප්පහානං අයං නිරොධො, අයං ආවට්ටො හාරො.

8. තත්ථ කතමො විභත්තිහාරො: සංයොජනන්ති න එකංසෙන, මානසංයොජනං දිට්ඨිභාගියන්ති න තං එකංසෙන අදිට්ඨිමානං නිස්සාය මානං න පජහති. යො පඤ්ච උද්ධම්භාගියො මානො කිඤ්චාපි සො දිට්ඨිපක්ඛො සියා, න තු ඔරම්භාගියං සංයොජනං තස්ස පහානාය සංවත්තතීති. යො ච අහංකාරො න පවිද්ධො, යං පනස්ස එවං හොති, කදාසු නාමාහං තං සන්තං ආයතනං සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාමි. යං අරියා සන්තං ආයතනං උපසම්පජ්ජ විහරිස්සන්තීති. අයං අභිජ්ඣා න ච තං නීවරණං. අපි පන අරහතො කායකිලෙසමිද්ධං ච ඔක්කමති, න ච තං නීවරණං තස්ස ථීනමිද්ධං නීවරණන්ති න එකංසෙන, අයං විභත්තිහාරො.

9. පරිවත්තනොති: පඤ්ච නීවරණා පඤ්චඞ්ගිකෙන ඣානෙන පහානං ගච්ඡන්ති, අයං තෙසං පටිපක්ඛො නීවරණො අසුභස්ස අයං තෙසං පටිපක්ඛා නීවරණා අසුභස්ස පහීනානි න අඤ්ඤනුමිනිතබ්බං, පරමත්ථමජ්ඣත්තං, අයං පරිවත්තනා.

10. තත්ථ කතමො වෙවචනො: කාමච්ඡන්දො ඡන්දරාගො පෙමං නිකන්තීති වෙවචනං. නීවරණං ඡදනං උපක්කිලෙසො පරියුට්ඨානන්ති වෙවචනං.

11. පඤ්ඤත්තීති: අවිජ්ජාපච්චයා කිච්චපඤ්ඤත්තියා පඤ්ඤත්ති' බ්‍යාපාදෙ වික්ඛෙපඤ්ඤත්තියා පඤ්ඤත්ති, ථීනමිද්ධං අසමුග්ඝාතපඤ්ඤත්තියා පඤ්ඤත්ති. එවං සබ්බෙපි එතෙ පඤ්ච නීවරණා ඉමම්හි සුත්තෙ වික්ඛෙපපඤ්ඤත්තියා පඤ්ඤත්ති.

12. තත්ථ කතමො ඔතරණො: ඉමෙ පඤ්ච නීවරණා අවිජ්ජා ච, තණ්හා ච, තත්ථ අවිජ්ජාමූලා නීවරණා යා තණ්හා ඉමෙ සඞ්ඛාරා, තෙ අවිජ්ජාපච්චයා, ඉමෙ ද්වෙ ධම්මා පඤ්චසු ඛන්ධෙසු සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා, ආයතනෙසු ධම්මායතනං, ධාතූසු ධම්මධාතු, ඉන්ද්‍රියෙසු ඉමෙසං ධම්මානං පදට්ඨානං සුඛින්ද්‍රියස්ස ච සොමනස්සින්ද්‍රියස්ස ච ඉත්ථින්ද්‍රියස්ස ච පුරිසින්ද්‍රියස්ස ච.

1. සංයොජනෙසු - මජසං.

7. එහි 'ආවත්තහාර' කවරෙ යැ : පඤ්චනීවරණයෝ දස නීවරණ කෙනෙක් වෙති, අධ්‍යාත්ම වස්තුයෙහි යම් දැඩි ඇලීමෙක් වේ ද, එ ද නීවරණ යැ, බාහිර වස්තුයෙහි යම් දැඩි ඇලීමෙකුත් වේ ද එ ද නීවරණ යි. විචිකිච්ඡාව දක්වා මෙසේ යැ, මේ දස නීවරණයෝ යි. යම් අධ්‍යාත්ම බාහිර ක්ලේශයෝ වෙත් ද මොහු අධ්‍යාත්ම සංයොජන ද බහිද්ධාසංයොජන දැයි සංයොජනයෝ දෙදෙනෙක් වෙති. එහි 'මම' යැ, යනු අධ්‍යාත්ම යැ, 'මාගේ' යැ යනු බාහිර සංයොජන යි. සත්කායදෘෂ්ටිය අධ්‍යාත්ම යැ, එක්සැටක් දෘෂ්ටිහු බාහිරයෝ යි. අධ්‍යාත්ම රූපයන්හි යම් ඡන්දරාගයෙක් අවිගත රාගයෙක් අවිගත ඡන්දයෙක් වේ ද එයයි. 'විඤ්ඤාණය' දක්වා මෙසේ යි. මේ අධ්‍යාත්ම තෘෂ්ණා යි. සවැදෑරුම් බාහිර ආයතනයන්හි ද තුන් භවයන්හි ද යම් බැසගෙන සිටීමෙක් වේ ද, මේ බාහිර තෘෂ්ණා යි. සංයොජනයෝ ද සංයොජනිය ධර්මයෝ ද යන මොහු (සමුදය දුක්ඛ යන) සත්‍යයෝ දෙදෙන වෙති. එහි සංයොජනිය ධර්මයන්හි යම් බලවත් විදර්ශනාවක් වේ ද, මේ මාර්ග යැ. යම් සංයොජනයන්ගේ ප්‍රහාණයෙක් ඇද්ද මේ නිරොධ යි. මේ ආවත්තහාර යි.

8. එහි ''විභත්තිහාර'' කවරෙ යැ : (සංයොජනන්ති . . . . . අයං විභත්තිහාරො ?)

9. ''පරිවත්තන'' යනු : පඤ්ච නීවරණයෝ පඤ්චාඞ්ගිකධ්‍යානයෙන් ප්‍රහාණයට යෙති. එම ඒ අංගයන්ට ප්‍රතිපක්ෂ නීවරණය අසුවල්හට ප්‍රහීණ යයි (න අඤ්ඤානුමිනිතබ්බං පරමත්ථමජ්ඣත්තං ?) මේ පරිවත්තනහාර යි.

10. එහි 'වෙවචනහාර' කවරෙ යැ : කාමච්ඡන්ද යැ ඡන්දරාග යැ පෙම යැ නිකන්ති යැ යනු වෙවචන යි. නීවරණ යැ ඡදන යැ උපක්කිලෙය යැ පරියුට්ඨාන යැ යනු වෙවචන යි.

11. ''පඤ්ඤත්ති'' යනු : අවිද්‍යාප්‍රත්‍යයෙන් (සංස්කාර) කෘත්‍යප්‍රඥප්තියෙන් පැනවීම යැ, ව්‍යාපාදය වික්ෂෙපප්‍රඥප්තියෙන් පැනවීම යැ, ථිනමිද්ධය අසමුද්ඝාත ප්‍රඥප්තියෙන් පැනවීම යැ, මෙසේ සියලු මැ තෙල පඤ්ච නීවරණයෝ මේ සූත්‍රයෙහි වික්ෂෙපප්‍රඥප්තියෙන් පැනවීම වේ.

12. එහි ''ඔතරණහාර'' කවරෙ යැ : මේ පඤ්ච නීවරණයෝ අවිද්‍යාව ද තෘෂ්ණාව ද (මුල් කොට ඇත්තාහ.) එහි අවිද්‍යාව මුල් කොට ඇත්තාහු නීවරණයෝ යැ, යම් තෘෂ්ණා වක් ඇද්ද මොහු සංස්කාරයෝ යැ, ඒ සංස්කාරයෝ අවිද්‍යාව ප්‍රත්‍යය කොට ඇත්තාහ, මේ ධර්මයෝ දෙදෙන පඤ්ච ස්කන්ධයන් කෙරෙහි සංස්කාරස්කන්ධයෙහි බැසගෙන සිටියාහුය, ආයතනයන් කෙරෙහි ධර්මායතන යැ, ධාතූන් කෙරෙහි ධර්මධාතු යැ, ඉන්ද්‍රියයන් කෙරෙහි සුඛින්ද්‍රිය ද සොමනස්සින්ද්‍රිය ද ඉත්ථින්ද්‍රිය ද පුරිසින්ද්‍රිය ද යන මේ ධර්මයන්ට පදට්ඨාන යි.

13. තත්ථ කතමො සොධනො හාරො: ඉදං සුත්තං යථා ආරබ්භ නික්ඛිත්තං සො අත්ථො භාසිතො ඉමෙහි පඤ්චහි පදෙහි.

14. තත්ථ කාමච්ඡන්දො ච බ්‍යාපාදො ච විචිකිච්ඡා ච න එකත්තතාය පඤ්ඤත්තා. කාමාති න එකත්තතාය පඤ්ඤත්තා, අථ ඛලු වෙමත්තතාය පඤ්ඤත්තා. අයං අධිට්ඨානො හාරො.

15. තත්ථ කතමො පරික්ඛාරො: කාමච්ඡන්දස්ස අයොනිසො මනසිකාරො සුභාරම්මණපච්චයො, සුභනිමිත්තං ච හෙතු. බ්‍යාපාදස්ස අයොනිසො මනසිකාරො ආඝාතවත්ථූනි ච පච්චයො, පටිඝානුසයො හෙතු. ථිනමිද්ධස්ස පටිසංහාරො පච්චයො, පවත්තියා කිලමථො චලනා තං ච හෙතු. උද්ධච්චකුක්කුච්චස්ස රජනීයං[1] ආරම්මණං[2] අස්සාදියාකිඤ්ජියං තාව අපරිපුණ්ණං ඤාණං පච්චයො, කාමසඤ්ඤා ච දිට්ඨිඅනුසයො ච හෙතු. විචිකිච්ඡාය නව මානවිධා ආරම්මණං මානානුසයො, සොච පච්චයො, විචිකිච්ඡානුසයො හෙතු. එතෙ පඤ්ච ධම්මා සහෙතු සප්පච්චයා උප්පජ්ජන්ති.

16. තත්ථ කතමො සමාරොපනො හාරො: ඉමෙ පඤ්ච නීවරණා චත්තාරොපි එතෙ ආසවා ගණ්ඨාපි එතෙ සල්ලාපි එතෙ උපාදානාපි එතෙ තෙසු එව බාහිරෙසු ධම්මෙසු සංකිලෙසභාගියං සුත්තන්ති පඤ්ඤත්තිං ගච්ඡති. අයං සමාරොපනො හාරො.

නිද්දිට්ඨං සංකිලෙසභාගියං සුත්තං

## 7 - 4

"මනොපුබ්බඞ්ගමා ධම්මා"ති ගාථා.

1. තත්ථ කතමො දෙසනාහාරො: ඉමම්හි සුත්තෙ කො අත්ථො, ඛන්ධවවත්ථානෙන විඤ්ඤාණක්ඛන්ධං දෙසෙති, ධාතුවවත්ථානෙන මනොවිඤ්ඤාණධාතුං. ආයතනවවත්ථානෙන මනායතනං, ඉන්ද්‍රියවවත්ථානෙන මනින්ද්‍රියං. තස්සං කිං පුබ්බඞ්ගමා ධම්මා, සංඛිත්තෙන ජ ධම්මා පුබ්බඞ්ගමා ධම්මා, කුසලමූලානි ච අකුසලමූලානි ච අනිමිත්තං ඉමම්හි සුත්තෙ කුසලමූලං දෙසිතං. තත්ථ කතමා මනොපුබ්බඞ්ගමා ධම්මා මනො තෙසං පුබ්බඞ්ගමං, යථාපි බලස්ස රාජා පුබ්බඞ්ගමො, එවමෙව ධම්මානං මනො පුබ්බඞ්ගමො.

තත්ථ තිවිධානං පුබ්බඞ්ගමානං නෙක්ඛම්මච්ඡන්දෙන අබ්‍යාපාදච්ඡන්දෙන අවිහිංසාච්ඡන්දෙන, අලොභස්ස නෙක්ඛම්මච්ඡන්දෙන පුබ්බඞ්ගමො[3] අදොසස්ස අබ්‍යාපාදච්ඡන්දෙන පුබ්බඞ්ගමො, අමොහස්ස අවිහිංසාච්ඡන්දෙන පුබ්බඞ්ගමො.

---

1. රජ්ජනීයං - PTS.
2, ආරම්මනීයං - මජසං PTS.
3. { පුබ්බඞ්ගමා - මජසං.
   { පුබ්බඞ්ගමං - PTS.

13. එහි ' සොධනහාර ' කවරෙ යැ: මේ සූත්‍රය යමක් අරබයා විදරන ලද ද, ඒ අර්ථය මේ පස්පදයෙන් විදරන ලදී.

14. එහි කාමච්ඡන්දය ද ව්‍යාපාදය ද විචිකිච්ඡාව ද සාමාන්‍යයෙන් (සමානභාවයෙන්) නො පනවනලද ' කාමා ' යනු එකත්තතායෙන් නො පනවන ලද, වැලි වෙමත්තතා (විශෙෂභාව) යෙන් පනවන ලදි, මේ '' අධිට්ඨානහාර '' යි.

15. එහි '' පරික්ඛාරහාර '' කවරෙ යැ : කාමච්ඡන්දයට ශුභාලම්බනය ප්‍රත්‍යය කොට ඇති අයොනිසොමනසිකාරය ද ශුභනිමිත්ත ද හෙතු යැ, ව්‍යාපාදයට අයොනිසොමනසිකාරය ද ආඝාතවස්තු ද ප්‍රත්‍ය යැ, පටිඝානුසය හෙතු වෙයි. ථිනමිද්ධයට (කාය-චිත්ත යන්ගේ) හැකිළීම ප්‍රත්‍ය යැ, ප්‍රවෘත්තියෙහි, ක්ලමථුව ද චලනය ද හෙතුයි. උද්ධච්චකුක්කුච්චයට ඇලුම් කටයුතු ආලම්බනය ද (අස්සාදියාකිත්ද්‍රියං ?) නො පිරිපුන් නුවණ ද ප්‍රත්‍ය යැ, කාමසංඥව ද දෘෂ්ටිඅනුශය ද හෙතු යි. විචිකිච්ඡාවට නාව මානයට ආලම්බන වූ මානානුස්සය ද (සොව ?) ප්‍රත්‍ය යැ, විචිකිච්ඡානුසය හෙතු යි. මේ පඤ්ච ධර්මයෝ සහෙතු සප්‍රත්‍යය වැ උපදනාහුයි.

16. එහි ' සමාරොපණහාර ' කවරෙ යැ : මේ පඤ්ච නිවරණයෝ සතරදෙනෙක් ද මොහු ආස්‍රව ද ගණ්ඩ ද ශල්‍ය ද උපාදන ද වෙත්. ඒ බාහිර ධර්මයන්හි මැ ' සංකිලෙසභාගිය සූත්‍ර යැ ' යන ප්‍රඥප්තියට යෙයි. මේ සමාරොපණහාර යි.

සංකිලෙසභාගිය සූත්‍රය දක්වනලදී.

7 – 4.

'' මනොපුබ්බඞ්ගමා ධම්මා '' යන ගාථාව මෙසේ යැ :

1. එහි '' දෙසනාහාරය '' කවරෙ යැ : මේ සූත්‍රයෙහි අර්ථ කවරැ : බන්ධවවත්ථාන යෙන් විඥනස්කන්ධය දේශනා කෙරෙති. ධාතුවවත්ථානයෙන් මනොවිඤ්ඤණධාතු ද, ආයතනවවත්ථානයෙන් මනායතනය ද, ඉන්ද්‍රියවවත්ථානයෙන් මනින්ද්‍රිය ද දෙසන සේක. ඒ ගාථායෙහි පූර්වඞ්ගම ධර්මයෝ කවරහු ද : සැකෙවින් ධර්මයෝ සදෙනෙක් පූර්වඞ්ගම ධර්මයෝ යි. නිමිත්තරහිත වැ කුශලමූලයෝ ද අකුශලමූලයෝ ද වෙති. මේ සූත්‍රයෙහි කුශලමූලය දේශිත යි. එහි මනොපුබ්බඞ්ගම ධර්මයෝ කවරහ : ඒ ධර්මයනට මනස පූර්වඞ්ගම යැ, යම්සේ බලසෙනඟට රජ පූර්වඞ්ගම ද, එසෙයින් මැ ධර්මයනට මනස පූර්වඞ්ගම යි.

එහි නෙක්ඛම්මච්ඡන්ද අව්‍යාපාදච්ඡන්ද අවිහිංසාච්ඡන්ද යන තෙවැදෑරුම් පූර්වඞ්ගමයන් අතුරෙන් අලොභයට නෛෂ්ක්‍රම්‍යච්ඡන්දයෙන් පෙරදූරි වෙයි, අදෙසයට අව්‍යාපාදච්ඡන්ද යෙන් පෙරදූරි වෙයි, අමොහයට අවිහිංසාච්ඡන්දයෙන් පෙරදූරි වේ.

තත්ථ 'මනොසෙට්ඨා'ති මනසා ඉමෙ ධම්මා උස්සටා, මනෙන වා නිම්මිතා, මනොව ඉමෙසං ධම්මානං සෙට්ඨොති මනොව ඉමෙසං ධම්මානං ජෙට්ඨොති[1] මනොව ඉමෙසං ධම්මානං ආධිපච්චං කරොතීති මනොසෙට්ඨා.

මනොජවා'ති යත්ථ මනො ගච්ඡති, තත්ථ ඉමෙ ධම්මා ගච්ඡන්තීති මනොජවා. යථා වාතො සීඝං ගච්ඡති අඤ්ඤො වා කොචි සීඝං ගාමිකො වුච්චතෙ වාතජවො'ති පක්ඛිගාමිකොති, එවමෙව ඉමෙ ධම්මා මනෙන සම්පජායමානා ගච්ඡන්ති, තත්ථ ඉමෙ ධම්මා ගච්ඡන්තීති මනොජවාති.

තෙ තිවිධා ඡන්දසමුට්ඨිතා අනාවිලතා ච සඞ්කප්පා. සත්තවිධා ච කායිකං සුචරිතං වාචසිකං සුචරිතං, තෙ දස කුසලකම්මපථා.

තත්ථ "මනසා චෙ පසන්නෙන"ති මනොකම්මං. "භාසති වා"ති වචීකම්මං. "කරොති වා"ති කායකම්මං. ඉමෙහි ඉමස්මිං සුත්තෙන දස කුසලකම්මපථා පරමාපි සත්තා සීලවා සො භවති නිවත්තියං න ලොකනිය්‍යානාය, වාසනාභාගියං සුත්තං භවති. අයං දෙසනා.

2. තත්ථ කතමො විචයො හාරො: "මනොපුබ්බඞ්ගමා ධම්මා"ති කුසලමූලානි ච අට්ඨඞ්ගසම්මත්තානි. ඉදං සුත්තං.

3. යුත්තීති: දසන්නං කුසලකම්මපථානං යො විපාකො සො සුඛවෙදනීයො අබ්‍යාපාදස්සඞ්ගමානො. "ඡායාව අනපායිනී"ති අනුගච්ඡති, අත්ථි එසා යුත්ති.

4. පදට්ඨානන්ති: අට්ඨාරසන්නං මනොපවිචාරානං පදට්ඨානං. "මනොපුබ්බඞ්ගමා ධම්මා"ති සබ්බකුසලපක්ඛස්ස ඉමෙ ධම්මා පදට්ඨානං. "මනසා චෙ පසන්නෙනා"ති යො චෙතසො පසාදො, ඉදං සද්ධින්ද්‍රියස්ස පදට්ඨානං. "භාසති වා"ති සම්මාවාචාය, "කරොති වා"ති සම්මා-කම්මන්තස්ස ච සම්මාවායාමස්ස පදට්ඨානං.

5. ලක්ඛණොති: ඉති පුබ්බඞ්ගමා ධම්මාති වෙදනාපුබ්බඞ්ගමාපි එතෙ, සඤ්ඤාපුබ්බඞ්ගමාපි එතෙ, සඞ්ඛාරපුබ්බඞ්ගමාපි එතෙ. යෙ කෙචි ධම්මා සහජාතා සබ්බෙ පුබ්බඞ්ගමා එතෙසං ධම්මානං. "තතො නං සුඛමන්වෙති"ති සොමනස්සම්පි නං අන්වෙති යං සුසුඛවජ්ජාය, තදපි නං සුඛං තදපි අන්වෙති.

6. තත්ථ කතමො 'චතුබ්‍යූහො හාරො: මනොපුබ්බඞ්ගමා'ති න ඉදං එකාධිවචනං[2] කිං කාරණා, සබ්බෙ යෙව ඉමෙ ඡ විඤ්ඤාණකායා, ඉමම්හි භගවතො කො අධිප්පායො: යෙ සුඛෙන අත්ථිකා, තෙ මනං පසාදෙන්තීති අයං ඉමම්හි සුත්තෙ භගවතො අධිප්පායො. අත්ථො පුබ්බෙයෙව නිද්දිට්ඨො.

---

1. සෙට්ඨජෙට්ඨොති - මජ්ඣං, PTS.
2. එකාවිවචනං - මජ්ඣං, PTS.

එහි '' මනොසෙට්ඨා '' යනු : මේ දහම්හු මනසින් උත්සෘෂ්ටයහ, නොහොත් සිතින් නිර්මිතයහ, සිත මැ මේ දහමුන්ට ශ්‍රේෂ්ඨ නු යි සිත මැ මේ දහමුන්ට ජ්‍යෙෂ්ඨ නු යි සිත මැ මේ දහමුන්ට අධිපතිබව කෙරේ නු යි ' මනොසෙට්ඨ ' නම් වෙති.

'' මනොජවා '' යනු : යම් තැනෙක සිත යේ ද, මේ දහම්හු එහි යෙත් නු යි '' මනොජව '' නම් වෙති. යම්සේ වාතය වහා යේ ද, වහා යන අන් කිසිවෙක් වේ ද, වාතජව යයි පක්ෂිගාමික යයි කියනු ලැබේ ද, එසෙයින් මැ මේ දහම්හු සිතින් උපදවනු ලබන්නාහු යෙති. එහි මෙ දහම්හු යෙත් නු යි ' මනොජව ' නම් වෙත්.

ඔහු ත්‍රිවිධ වෙති : ඡන්දයෙන් උපදවනලද්දහු ද අනාවිල සංකල්ප ඇත්තාහු ද වෙති. කායික සුචරිතය වාචසික සුචරිත යැයි යන්වැද්දරුම් ද වෙති. ඔහු දස කුශලකර්මපථයෝ වෙත්.

එහි '' මනසා චෙ පසන්නෙන '' යනු : මනඃකර්ම යැ, ' භාසති වා ' යනු වාක්කර්ම යැ' '' කරොති වා '' යනු කායකර්ම යි. මේ පදයන්ගෙන් මේ සූත්‍රයෙහි දස කුශලකර්ම පථයෝ පරම වූවාහු නමුදු සිල්වත් වූ හේ වට්ටයෙහි වෙයි, ලොකනිර්යාණය පිණිස නොවේ. වාසනාභාගියසූත්‍ර වෙයි. මේ දෙසනාහාර යි.

2. එහි ' විචයහාර ' කවරෙ යැ : '' මනොපුබ්බඩ්ගමා ධම්මා '' යනු මේ සූත්‍රය අෂ්ටාඩ්ගසමාක්ත්ව ඇති කුශලමූලයෝ ද වෙත්.

3. ' යුත්ති ' යනු : දශ කුශලකර්මපථයන්ගේ යම් විපාකයෙක් ඇද්ද හේ සුඛවෙදනීය වූයේ (අව්‍යාපාදස්සඩ්ගමානො ?) ' ඡායාව අනපායිනී ' යනු අනුව යෙයි. තෙල යුක්තිය ඇති.

4. '' පදට්ඨාන '' යනු : අටළොස්වැද්දරුම් මනොපවිචාරයන්ට ආසන්න කාරණ වෙයි. ' මනොපුබ්බඩ්ගමා ධම්මා ' යනු : සියලු කුශලපක්ෂයට මේ ධර්මයෝ පදට්ඨාන යැ, ' මනසා චෙ පසන්නෙන ' යනු : චිත්තයාගේ යම් ප්‍රසාදයෙක් ඇද්ද මේ පැහැදීම සද්ධින්ද්‍රියට පදට්ඨාන යැ. ' භාසති වා ' යනු : සම්‍යග්වචනයට පදට්ඨාන යැ. ' කරොති වා ' යනු : සම්‍යක්කර්මාන්තයට ද සම්‍යග්ව්‍යායාමයට ද පදට්ඨාන යි.

5. '' ලක්ඛණ '' යනු : මෙසේ ' පුබ්බඩ්ගමා ධම්මා ' යනු මොහු වෙදනාපූර්වඩ්ගම වූවාහු ද වෙති, මොහු සංඥාපූර්වඩ්ගම වූවාහු ද වෙති, මොහු සංස්කාරපූර්වඩ්ගම වූවාහු ද වෙත්, තෙල දහමුන්ට යම් කිසි ධර්ම කෙනෙක් සහජාත වූවාහු ද ඒ සියල්ලෝ පූර්වඩ්ගම වෙත්. ' තතො නං සුඛමන්වෙති ' යනු : සොම්නස ද ඔහු අනුව යෙයි, යම් සුව එළවන සෙවණැල්ලක් ඇද්ද (එමෙන්) සුවය ඔහු අනුව යෙයි.

6. එහි ' චතුබ්‍යූහහාරය ' කවරෙ යැ : ' මනොපුබ්බඩ්ගමා ' යන මෙය එකාධිවචන නො වෙයි, කරුණු කිම යත් : මොහු සියලු මැ ෂඩ්විඥානකායයෝ වෙති. මෙහි භාග්‍යවතුන් වහන්සේගේ අභිප්‍රාය කවරෙ යැ : යම් කෙනෙක් සුව කැමැත්තාහු වෙත් ද, ඔහු සිත පහදවා ගනිති, යන මේ මෙමැ සූත්‍රයෙහි භාග්‍යවතුන් වහන්සේගේ අභිප්‍රාය යි. අර්ථ පළමු මැ දක්වන ලද්දේ යි.

7. යානි හි කුසලමූලානි, තානි අට්ඨානිසංසමත්තා හෙතු, අයං අට්ඨඞ්ගිකො මග්ගො. දස ඨානානි දෙසනාහෙතූනි දෙසනාපච්චයා නිද්දෙසනා ච. තත්ථ යං මඤ්ඤෙ දුක්ඛෙන සහ නාමරූපං විඤ්ඤාණසම්මත්ති අබෙගන කුසලමූලං පහීයති. අයං අප්පහීනභූමියං සමුදයො. යං තෙසං පහානං, අයං නිරොධො. ඉමානි චත්තාරි සච්චානි. අයං ආවට්ටො හාරො.

8. විභත්ති ති :

"මනොපුබ්බඞ්ගමා ධම්මා - මනොසෙට්ඨා මනොජවා,
මනසා චෙ පසන්නෙන - භාසති වා කරොති වා,
තතො නං සුඛමන්වෙති - ඡායාව අනපායිනී"ති

තං න එකංසෙන සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා පසන්න හොති. තස්ස වා මිච්ඡාදිට්ඨිකස්ස සනසනෙථ චිත්තං පසාදෙති තෙන ච පසන්නෙන චිත්තෙන භාසති බ්‍යාකරොති න තං සුඛමන්වෙති න ඡායාව අනුගාමිනී, දුක්ඛමෙව තං අන්වෙති. යථා මහන්තං චක්කං පදමන්වෙති, ඉදං තං විභජ්ජබ්‍යාකරණීයං, මනසා චෙ පසන්නෙන කායකම්මං වචීකම්මං සුඛවෙදනීයන්ති සම්මග්ගතෙ[1] සුඛවෙදනීයං මිච්ඡාගතෙ[2]. දුක්ඛවෙදනීයං අයං විභත්ති.

9. තත්ථ කතමො පරිවත්තනො හාරො : "මනොපුබ්බඞ්ගමා ධම්මා"ති යං මනසා පදුට්ඨෙන භාසති වා කරොති වා, දුක්ඛමස්සානුගාමිනී, එතානියෙව ද්වෙ සුත්තානි භාසිතානි, එස එව ච පටිපක්ඛො, යදිදං . . . .

10. වෙවචනන්ති : මනො චිත්තං විඤ්ඤාණං මනින්ද්‍රියං මනොවිඤ්ඤාණධාතු.

11. පඤ්ඤත්තීති : "මනොපුබ්බඞ්ගමා ධම්මා"ති අයං මනො තිඤ්චි පඤ්ඤත්තියා පඤ්ඤත්තං. "ධම්මා"ති කුසලකම්මපථපඤ්ඤත්තියා පඤ්ඤත්තං. "මනොසෙට්ඨා"ති විසිට්ඨපඤ්ඤත්තියා පඤ්ඤත්තං. "මනොජවා"ති. සහ පඤ්ඤත්තියා පඤ්ඤත්තං. 'චිත්ත'න්ති නෙක්ඛම්මපඤ්ඤත්තියා පඤ්ඤත්තං. - "මනසා චෙ පසන්නෙනා"ති සද්ධින්ද්‍රියපඤ්ඤත්තියා පඤ්ඤත්තං, "මනසා චෙ පසන්නෙනා"ති අනාවිලසඞ්කප්පදුතියජ්ඣානපඤ්ඤත්තියා පඤ්ඤත්තං. "මනසා චෙ පසන්නෙනා"ති අස්සද්ධානං පටිපක්ඛපඤ්ඤත්තියා පඤ්ඤත්තං, 'භාසති වා'ති සම්මාවාචාපඤ්ඤත්තියා පඤ්ඤත්තං. "කරොති වා"ති සම්මාකම්මන්තපඤ්ඤත්තියා පඤ්ඤත්තං, "තතො නං සුඛමන්වෙතී"ති ඣානසමාධානං. ඉන්ද්‍රියෙසු මනින්ද්‍රියං. පටිච්චසමුප්පාදෙ විඤ්ඤාණං.

12. ඔතරණො ති : "මනොපුබ්බඞ්ගමා ධම්මා"ති මෙත්තා[3] ච මුදිතා ච ඣානෙසු දුතියං ඣානං තතියං ච. ඛන්ධෙසු සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නො, ධාතූසු ධම්මධාතු, ආයතනෙසු ධම්මායතනං, යං කුසලං ඉන්ද්‍රියෙසු

---

1. සමග්ගතෙ - ම.
2. මිච්ඡගතෙ ම.
3. මුදුතා - ම.

7. යම් කුශලමූල කෙනෙක් වෙත් ද, ඔහු අෂ්ට ආනිශංසමාත්‍ර වූවාහු හෙතු යැ, මේ අෂ්ටාඞ්ගික මාර්ග යි. (දස ධ්‍යානානි . . . . . කුසලමූල පහියති ?) මේ අප්‍රහීණභූමියෙහි සමුදය යැ, ඔවුන්ගේ යම් ප්‍රහාණයෙක් ඇද්ද මේ නිරොධ යැ, මේ සතර සත්‍යයෝ යි. මෙම ආවත්තහාර යි.

8. විභත්ති යනු: වෙදනාදි චෛතසිකධර්මයෝ සිත පෙරටුකොට ඇත්තාහ, සිත ශ්‍රෙෂ්ඨ කොට ඇත්තාහ, සිත පසුපස යන්නාහ. ඉදින් පහන් සිතින් යුක්ත වැ කියා නම් හෝ කෙරේ නම් හෝ ඒ හේතුයෙන් තමා නොහැර යන සෙවණැල්ලක් සෙයින් කායික චෛතසික විපාක සුඛය ඒ පුද්ගලයා කැටිව යේ යයි.

එය ඒකාන්තයෙන් මහණකුට හෝ බමුණකුට හෝ නො වෙයි, ඒ මියදිටු ඇත්තහුට හෝ ස්වකීය ශාස්ත්‍රයෙහි සිත පහදවා නම්, යළි ඒ පහන් සිතින් යුතුව කියා නම් පවයා නම් ඔහු කරා සුවය නො එයි, සෙවණැල්ලක් මෙන් අනුව යන්නී නො වෙයි, දුක ම ඔහු අනුව යෙයි, යම්සේ මහත් වූ චක්‍රය විය අනුව යේ ද එමෙනි. මේ විභාග කොට ප්‍රකාශ කළයුතු යැ. ඉදින් පහන් සිතින් යුතුවැ කළ කායකර්මය වාක්කර්මය සම්‍යග්ගත කල්හි සුඛවෙදනීය යී ද මිත්‍ථ්‍යාගත කල්හි දුඃඛවෙදනීය යී ද පැවැසියැ යුතු වේ. 'විභත්තිහාර' යි.

9. එහි පරිවත්තනහාර ' කවරෙ යැ': '' මනොපුබ්බඞ්ගමා ධම්මා '' යී ප්‍රදුෂ්ට වූ සිතින් යුක්තව යමක් කියා හෝ කෙරෙයි හෝ විපාක දුක ඔහු අනුව යනු වෙයි. තෙල දෙ සුත මැ වදරනලදහු යැ, යළි මෙය මැ ප්‍රතිපක්ෂ වෙයි, . . . . .

10. '' වෙවචන '' යනු : ' මන චිත්ත විඤ්ඤාණ මනින්ද්‍රිය මනොවිඤ්ඤාණධාතු ' යන මේ යි.

11. පඤ්ඤත්ති '' යනු : '' මනොපුබ්බඞ්ගමා ධම්මා '' යී මේ මනස කිසි ප්‍රඥප්ති යෙකින් පනවන ලද, ' ධම්මා ' යනු කුශලකර්මපථප්‍රඥප්තියෙන් පනවන ලද, ' මනො සෙට්ඨා ' යනු විශිෂ්ටප්‍රඥප්තියෙන් පනවනලද, ' මනොජවා ' යනු සමග යන ප්‍රඥප්ති යෙන් පනවන ලද, ' චිත්තං ' යනු නෛෂ්ක්‍රම්‍යප්‍රඥප්තියෙන් පනවන ලද, ' මනසා වෙ පසන්නෙන යනු සද්ධින්ද්‍රියප්‍රඥප්තියෙන් පනවනලද, ' මනසා වෙ පසන්නෙන ' යනු අනාවිල සංකල්ප ඇති ද්විතීයධ්‍යානප්‍රඥප්තියෙන් පනවන ලද, ' මනසා වෙ පසන්නෙන ' යනු ශ්‍රද්ධා නැතියනට ප්‍රතිපක්ෂභාව ප්‍රඥප්තියෙක් පනවන ලද, '' භාසති වා '' යනු සම්‍යග්වචනප්‍රඥප්තියෙන් පනවනලද, ' කරොතිවා ' යනු සම්‍යක්කර්මාන්තප්‍රඥප්තියෙන් පනවනලද, ' තතො නං සුඛමන්වෙති ' යනු ධ්‍යානයෙහි (සිත) පිහිටුවීම යැ, ඉන්ද්‍රියයන් කෙරෙහි මනින්ද්‍රිය යැ, පටිච්චසමුප්පාදයෙහි විඥන යි.

12. '' ඔතරණ '' යනු ; '' මනොපුබ්බඞ්ගමා ධම්මා '' යනු මෛත්‍රිය ද මෘදුත්වය ද වෙයි, ධ්‍යානයන් කෙරෙහි ද්විතීයධ්‍යානය හා තෘතීයධ්‍යානය ද වෙයි, ස්කන්ධයන් කෙරෙහි සංස්කාරස්කන්ධපර්‍යාපන්න වෙයි. ධාතූන් කෙරෙහි ධර්මධාතු යැ. ආයතන

සුඛින්ද්‍රියං ච සොමනස්සින්ද්‍රියං ච පදට්ඨානං, ඉමෙසං ධම්මානං පච්චය-සමුප්පන්නානං ඵස්සපච්චයා සුඛවෙදනීයො ඵස්සො සුඛවෙදනා, මනො පවිචාරෙසු සොමනස්සවිචාරො, ඡත්තිංසෙසු පඨමපදෙසු ඡ සොමනස්ස නෙක්ඛම්මස්සිතා. ඉති අයං ඔතරණො හාරො.

13. තත්ථ කතමො සොධනො හාරො: යං අත්ථං ආරබ්භ ඉදං සුත්තං භාසිතං, සො අත්ථො නියුත්තො, එතමත්ථං ආරබ්භ සුත්තං, අයං සොධනො හාරො.

14. තත්ථ කතමො අධිට්ඨානො හාරො: "මනොපුබ්බඞ්ගමා ධම්මා"ති වෙමත්තතා[1]පඤ්ඤත්ති න එකත්තපඤ්ඤත්ති, "ධම්මා"ති එකත්තතා[2] න වෙමත්තපඤ්ඤත්ති. "මනසා චෙ පසන්නෙනා"ති සො පසාදො දුවිධො[3] අජ්ඣත්තං ච අබ්‍යාපාදවික්ඛම්භනතො[4] බහිද්ධා ච ඔකප්පනතො. සො අජ්ඣත්තපසාදො දුවිධො සමුග්ඝාතපසාදො ච වික්ඛම්භනපසාදො ච බ්‍යාපාදපරියුට්ඨානං. විඝාතො න මූලපසාදෙ ජාතමූලම්පි වා. පසාදෙ සබ්‍යාපාදං විඝාතෙන "තතො නං සුඛමන්වෙතී"ති සුඛං කායිකං ච චෙතසිකං ච, අප්පියවිප්පයොගො'පි පිය-සම්පයොගො'පි නෙක්ඛම්මසුඛම්පි පුථුජ්ජනසුඛම්පි පීතිසම්බොජ්ඣඞ්ගම්පි චෙතසිකං සුඛං. යම්පි පස්සද්ධකායො සුඛං වෙදෙති, තම්පි කායිකං සුඛං, බොජ්ඣඞ්ගා ච චෙතසිකං සුඛං යම්පි පස්සද්ධකායො සුඛං වෙදෙති, තම්පි තඤ්ච සුඛපදට්ඨානං පඤ්ඤත්තියා යථාවුත්තං තං අපරාමට්ඨං කුසලානං ධම්මානං. "අන්වෙතී"ති අප්පනා සන්දිස්සති න වායං වා පත්තභූතො අන්වෙති. තයිදං සුත්තං ද්වීහි ආකාරෙහි අධිට්ඨාතබ්බං හෙතුනා ච යො පසන්නමානසො විපාකෙන ච යො දුක්ඛවෙදනීයො.

15. පරික්ඛාරෙං'ති භගවා පඤ්චසතෙන භික්ඛුසඞ්ඝෙන නගරං පවිසති රාජගහං. තත්ථ මනුස්සො පුග්ගලො භගවන්තං පරිවිසති, තස්ස පසාදො උප්පන්නො, කුසලමූලපුබ්බයොගාවචරොපි සො අසද්ධො ච අක්ඛාති ඉදං වාචං භාසති: 'ලාභා තෙසං යෙසං නිවෙසනං භගවා පවිසති අම්හාකම්පි යදි භවෙය්‍ය මයම්පි භගවතො සම්පසාදං ලභෙම්හා'ති. යෙන භගවා තෙනඤ්ජලිං පනාමෙත්වා 'නමො භගවතො, නමො භගවතො'ති අබ්‍යාපාදමනො[5] එකමන්තං අට්ඨාසි. තදනන්තරෙ භගවා ඉමං සුත්තං අභාසිත්ථ: "මනොපුබ්බඞ්ගමා ධම්මා"ති. සබ්බං සුත්තං තත්ථ[6] යං පරෙසං භාසති, ඉදං වාචා කම්මං. යං අඤ්ජලිං පණාමෙති, ඉදං කායකම්මං. යො මනො පසාදො ඉදං මනොකම්මං. තත්ථ යං පරෙසං පකාසෙති භාසති වණ්ණං යෙසං භගවා නිවෙසනං ගච්ඡතී'ති. සබ්බං තස්ස අලොභො කුසලමූලං, යං භගවති මෙත්තචිත්තං.[7] තස්ස අදොසො කුසලමූලං, යං අඤ්ජලිං පණාමෙති, මානං ච නිගණ්හාති, තත්ථස්ස අමොහො කුසලමූලං පාතුභවති. යං උළාරපඤ්ඤං පටිලභති,

1. වෙවචන - මජසං, PTS
2. එකතො - මජසං, PTS
3. ද්විධො - ම.
4. වික්ඛම්භන - ම.
5. අබ්‍යාපාදමානො - ම.
6. තථා - මජසං.
7. මෙත්තචිත්තො - මජසං.

යන් කෙරෙහි ධර්මායතන යැ, ඉන්ද්‍රියයන් කෙරෙහි සුඛින්ද්‍රිය ද සොමනස්සින්ද්‍රිය ද පදට්ඨාන යි. ප්‍රතීත්‍යසමුත්පන්න වූ මේ ධර්මයන්ට ස්පර්ශප්‍රත්‍යයෙන් සුඛවෙදනීය වූ ස්පර්ශය සුඛවෙදනාව දනවයි, මනොපවිචාරයන් කෙරෙහි සොමනස්සහගත විචාරය වෙයි. සතිස් ප්‍රථම පදයන් කෙරෙහි සොමනස් සහගත නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කළ සපදයෙයා් වෙත් යයි. මේ ' ඔතරණ ' හාර යි.

13. එහි ' සොධනහාර ' කවරෙ යත් : යම් අර්ථයක් අරභයා මේ සූත්‍රය දෙසන ලද ද, ඒ අර්ථය දක්වන ලද, සූත්‍රය තෙල කරුණ සඳහා යි. මේ ' සොධන ' හාර යි.

14. එහි ' අධිට්ඨානහාර ' කවරෙ යත් : '' මනොපුබ්බඞ්ගමා ධම්මා '' යනු වෙමත්ත පඤ්ඤත්ති යැ, එකත්වප්‍රඥප්ති නො වෙයි. '' ධම්මා '' යනු ඒකත්තතා යැ, වෙමත්ත පඤ්ඤත්ති නො වෙයි, '' මනසා චෙ පසන්නෙන '' යනු ඒ ප්‍රසාදය අව්‍යාපාදවිෂ්කම්භණ යෙන් අධ්‍යාත්මයෙහි ප්‍රසාදය ද ඔකප්පනවශයෙන් බාහිරප්‍රසාදය දැයි දෙවැදෑරුම් වෙයි. ඒ අධ්‍යාත්මප්‍රසාදය සමුද්ඝාතප්‍රසාද ය ද විෂ්කම්භණප්‍රසාදය දැයි දෙවැදෑරුම් වෙයි. (බ්‍යා පාද පරියුට්ඨානං . . . . . විඝාතෙන ?)

'' තතො නං සුඛමන්වෙති '' යනු සුඛය කායික චෛතසික වෙයි. අප්‍රියයන්ගේ විප්‍රයොගය ද ප්‍රියයන්ගේ සම්ප්‍රයොගය ද නෛෂ්ක්‍රම්‍යසුඛය ද පෘථග්ජනසුඛය ද ප්‍රීති සම්බොධ්‍යඞ්ගය ද චෛතසිකසුඛ යැ, සැහැල්ලු වූ කය ඇතියේ යම් සුවයක් විඳී ද, එ ද කායිකසුඛ යැ, බොධ්‍යඞ්ගයෝ චෛතසිකසුඛ යැ, සැහැල්ලු වූ කය ඇතියේ යම් සුවයක් විඳී ද ඒ සුවය ද ප්‍රඥප්තියෙන් සුඛයට පදට්ඨාන වූ යථොක්ත වූ ඒ සුඛය කුශලධර්මයන් විසින් අපරාමෘෂ්ට යැ, ' අන්වෙති ' යනු අර්පණාව දක්නා ලැබෙයි. මෙය පාත්‍රවූයේ පනා ද අනුව යෙයි. මේ සූත්‍රය පහන් සිත් ඇති යමෙක් වේ ද මේ හේතු වශයෙන් ද, දුක්ඛවෙදනීය වූ යමෙක් වේ ද හේ විපාක වශයෙන් දැයි දෙ ආකාරයෙකින් අධිෂ්ඨානවෘ යි.

15. '' පරික්ඛාර '' යනු : භාග්‍යවත්හු පන්සියක් භික්ෂුසඞ්ඝයා සමග රජගහනුවරට පිවිසෙන සේක. එහි පිනිස් පුහුලෙක් භාග්‍යවතුන් වලඳවයි, ඔහුට ප්‍රසාදය උපන, කුසල්මුල් ඇති පූර්වයෝගාවචර වූ ද හෙතෙම අනායතනට ද කියයි, මේ වදන් පවසයි : ' යම් කෙනකුන්ගේ නිවෙස්නට බුදුහු පිවිසෙත් ද, ඔවුනට ලාභයෙක, අපට ද ඉදින් (පදයධර්මයෙක්) වී නම් ඇපිදූ භාග්‍යවතුන් වහන්සේගේ සම්ප්‍රසාදය ලබන්නම්හ ' යි. භාග්‍යවත්හු යම් තැනෙක ද එ තැන්හි ඇඳිලිබැඳ ' භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වෙව්. භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වෙව ' යි අව්‍යාපාද සිත් ඇතියේ එක්පසෙක සිටියේය, ඊට අනතුරුව බුදුහු මේ සූත්‍රය වදළහ : '' මනොපුබ්බඞ්ගමා ධම්මා '' යි. සියලු සූත්‍රය (දූෂ්වියයුතු) එහි යමක් පරහට කියා ද, මෙය වාක්කර්ම යැ, යම් ඇඳිලි බැඳීමෙක් ඇද්ද මේ කායකර්ම යැ, යම මනඃප්‍රසාදයෙක් ඇද්ද මේ මනඃකර්ම යැ, එහි යමක් මෙරපාහට පවසා ද ' බුදුහු යම් කෙනකුන්ගේ නිවෙස්නට වඩිති, ගුණ කියා ද, සියල්ල ඔහුගේ අලොභකුශලමූල යැ, භාග්‍යවතුන් කෙරෙහි යම් මෛත්සිතක් ඇද්ද එය ඔහුගේ අදෙසකුසලමූල යැ, ඇඳිලිබැඳීම යැ යන යමක් ඇද්ද මානයන් නිග්‍රහ කෙරේ ද එහි දී ඔහුට අමොහකුසලමූලය හභළ වෙයි, යම් උදර ප්‍රඥවක් උපදවාද මේ ඔහුගේ

ඉදමස්ස දිට්ඨිවිපල්ලාසප්පහානං. යො[1] තථායෙව සංවරො හොති, ඉදමස්ස සඤ්ඤාවිපල්ලාසප්පහානං, යං මනසො පසාදනං, ඉදමස්ස චිත්තවිපල්ලාසප්පහානන්ති අකුසලවිපල්ලාසානං වික්ඛම්භනං පහානං පච්චයො

තීණි කුසලමූලානි යො අනාවිලචිත්තසඞ්කප්පො, සො තස්ස මනසිකාරොති වුච්චති, යං කිලෙසෙහි වික්ඛම්භනං ඉති විපල්ලාසා ච ආරම්මණා සප්පච්චයතාය පච්චයො, කුසලමූලානි ච සන්නිස්සයතාය[2] පච්චයො, සො ච මනසිකාරො හෙතුනා ඉමිනා පච්චයෙන චිත්තං උප්පන්නං. තත්ථ යං සත්ථාරම්මණං චිත්තං පවත්තං අයං බුද්ධානුස්සති. යම්පි භගවතො ගුණෙ මනසිකරොති, අයමස්ස ධම්මානුස්සති. තත්ථ සතිසම්පජඤ්ඤං හෙතු, අයං ච පච්චයො, වාචා පඤ්ඤාහෙතු, විතක්කවිචාරා පච්චයො. කායසඞ්ඛාරා කම්මස්ස අභිසඞ්ඛාරො නාම හෙතු වා අප්පච්චයො සුඛවෙදනීයස්ස කම්මස්ස උපචයො හෙතුකා කම්මස්ස පච්චයො.

16. තත්ථ කතමො සමාරොපනො හාරො: මනසායෙව පසන්නෙන සන්තොයෙවෙත්ථ පසන්නො අපිච චිත්තවොදනා සත්තා විමුච්චන්තීති තෙන සත්තා චිත්තපුබ්බඞ්ගමා චිත්තෙන පසන්නෙන චෙතනාපි තත්ථ චිත්තභූතා භවන්තීති පටිඝා අයං චෙතනානං පසාදෙන කායො චස්ස පසාදෙ සො ච ආරභති පසාදෙන පසන්නො සඤ්ඤානන්ති චස්ස අවිපරීතා, සො පඤ්චවිධො වික්ඛම්භනා, කායපස්සම්භනායෙවාපසාදෙ චිත්තයිතො, චිත්තං පන පුබ්බංයෙව පසන්නං. අයං සමාරොපනා. එවං පඤ්චින්නම්පි පසාදෙ. "තතො නං සුඛමන්වෙතීති කතමං භගවා නිද්දිසති: න හි අත්තසච්චං තස්ස කම්මස්ස විපාකො අන්වෙති, තස්ස උපායො අනුභවජති, යදා සිතපච්චයා උප්පජ්ජතෙ සොමනස්සං අවිප්පටිසාරොපි අන්වෙති. අයං සමාරොපනො හාරො

7 - 5

මහානාම සක්කස්ස සුත්තං.

1. "ඉමම්හි චාහං[3] සමයෙ (අසතො[4] අසම්පජානො) කාලං කරෙය්‍යං[5] කා මමස්ස ගති[6] කො අභිසම්පරායොති[7] මා භායි මහානාම මා භායි මහානාම, අපාපකං තෙ මරණං භවිස්සති අපාපිකා කාලකිරියා, යස්ස කස්සචි මහානාම දීඝරත්තං සද්ධාපරිභාවිතං චිත්තං,[8] සීලපරිභාවිතං සුතපරිභාවිත"න්ති) (විත්ථාරෙන කාතබ්බං.)

---

1. යං – මජසං.
2. සන්දිස්සයතාය – ම.
3. තස්මිං චෙ – ම.
4. අස්සතො – ම.
5. කාලංකරෙය්‍ය – ම.
6. කා මෙ භවති – ම.
7. අස්සතො අභිසමාකාරො යො – ම.
8. යං තං චිත්තං දීඝරත්තං – ම.

දිට්ඨිවිපල්ලාසය ප්‍රහීණවීම යැ, එසේ මැ යම් සංවරයෙක් වේ ද, මේ ඔහුගේ සඤ්ඤාවිපල්ලාසය ප්‍රහීණවීම යැ, චිත්තයාගේ යම් පැහැදීමක් ඇද්ද මේ ඔහුගේ චිත්තවිපල්ලාසය ප්‍රහීණවීම යැයි. අකුශලවිපර්‍යාසයන්ගේ විෂ්කම්භණය ප්‍රහාණයට ප්‍රත්‍යය වේ.

තුන් කුශලමූලයෝ වෙති, යම් අනාවිල චිත්තසංකල්පයෙක් වේ ද එය ඔහුගේ මනසිකාර යයි කියනු ලැබේ. ක්ලේශයන්ගේ (ක්ලෙසෙහි ?) යම් විෂ්කම්භණයක් වේ ද, මෙසේ විපල්ලාසයෝ ද ආලම්බනප්‍රත්‍යයතායෙන් ප්‍රත්‍යය වෙයි. කුසලමූලයෝ ද සන්නිශ්‍රයතායෙන් ප්‍රත්‍යය වෙයි, ඒ මනසිකාරය ද මේ හේතුයෙන් ප්‍රත්‍යයෙන් උපන් වෙයි, එහි ශාස්තෘන් වහන්සේ අරමුණු කොට යම් සිතක් පවතී ද, මේ බුද්ධානුස්මෘති යැ, යම් භාග්‍යවතුන් වහන්සේගේ ගුණයන් මෙනෙහි කෙරේ ද, මේ ඔහුගේ ධර්මානුසමෘති යැ, එහි සතිසම්පජඤ්ඤය හේතු යැ, මේ ප්‍රත්‍යය ද වෙයි, වචනය ප්‍රඥාවට හේතු යැ, විතර්ක විචාරයෝ ප්‍රත්‍ය යැ, කායසංස්කාරයෝ කර්මයාගේ අභිසංස්කාර නම, හෙතු හෝ යි.

16. එහි ' සමාරොපන ' හාරය කවරෙ යැ : පහන්වූ සිත මැ හෙතු කොටගෙන මෙහි විද්‍යමානවූ මැ ප්‍රසාදය වෙයි, තවද චිත්තයාගේ ව්‍යවදානයෙන් සත්වයෝ විමුක්ත වෙත් නුයි සත්වයෝ පහන් සිතින් සිත පෙරදැරි කොට ඇත්තාහු වෙති. (චෙතනාපි තත්ථ. . . . එවං පඤ්චන්නම්පි පසාදෙ ? මේ වාක්‍ය ප්‍රදෙශය අතිශයින් ව්‍යාකූලව ඇත.)

'' තතො නං සුඛමන්වෙති '' යි බුදුහු කවරකු දක්වනසේක් ද යත් : (අත්තසවචං ?) ඒ කර්මයාගේ විපාකය නො මැ අනුව යෙයි, ඔහුගේ උපාය අනුව යෙයි ? යම් කලෙක සිතායිම් හේතුයෙන් සොම්නස උපදී ද එකල අවිප්‍රතිසාරය ද ඔහු අනුව යෙයි. මේ ' සමාරොපනහාර ' යි.

## 7 – 5.

### මහානාම සූත්‍රය

(වගන්ස ) මෙසමයෙහි මම් සමෘති රහිතයෙම් සම්‍යග්ඥන නැතියෙම් කලුරිය කෙරෙම් නම් මාගේ ගති කවරක් වෙයි ද පරලොව කුමක් වේ දැ' යි. ' මහානාමය නාහමක් බියපත් ව මහානාමය නහමක් බියපත් ව, තොපගේ මරණය අලාමක වන්නේ යැ. කාලක්‍රියාව අලාමක වන්නී යැ, මහානාමය යම් කිසිවක්හුගේ චිත්තය දීර්ඝරාත්‍රයෙහි ශ්‍රද්ධායෙන් පරිභාවිත (වඩනලද) ද ශීලයෙන් පරිභාවිත ද ශ්‍රැතයෙන් පරිභාවිත දැ ' යි (විස්තරයෙන් දක්වියැ යුතු.)

1. චාගෙන ච පඤ්ඤාය ච කිං දස්සෙති: යා සද්ධා සො චෙතසො පසාදො, යා අනාවිලසඞ්කප්පතා සා සද්ධා, කිං කාරණා: අනාවිල-ලක්ඛණත්තා,[1] අනාවිලලක්ඛණා හි සද්ධා, අපරෙ ආහු, ගුණපාරිසුද්ධි-නිට්ඨාගමනලක්ඛණා, යං ච අපරෙ වා, වචනපටිග්ගහලක්ඛණා සද්ධා.

අපරො පරියායො: අත්තානං යදි එවං ඔකප්පෙති "නාහං කිඤ්චි ජානාමීති, එසො අහං තත්ථ අනුඤ්ඤතත්තා අනඤ්ඤට්ඨා[2]ති අයං සද්ධාති. අපරො පරියායො: එකසට්ඨියා දිට්ඨිගතානං ආදීනවානුපස්සනා අනිච්චං දුක්ඛමනත්තා'ති. තෙන ච පදිට්ඨං භවති යථා ගම්භීරෙ උදපානෙ උදකං චක්ඛුනා පස්සති න ච කායෙන අභිසම්භුනාති, එවමස්ස අරියා නිජ්ඣානක්ඛන්තියා දිට්ඨි භවති, න ච සමජීකතා, අයං වුච්චති සද්ධා. සා ච ලොකිකා. අපරො පරියායො: බමතී පුථුජ්ජනභූතස්ස විසති ජාතිකො සක්කායාධීනා න නිවෙසො, එතං එකානති නායසඤ්ඤ යථාභූතං දිට්ඨියා තු බලූ මුදූහි පඤ්චහි ඉන්ද්‍රියෙහි දස්සනම්ගෙන පහීනා භවන්ති. දිට්ඨෙක්කට්ඨා ච කිලෙසා, අයං සද්ධා.

සොතාපත්තඞ්ගමුද්දක්ඛායං භූමියං පරිපුණ්ණා වුච්චති. තස්මිංයෙව භූමියං සෙක්ඛසීලං අරියා ධාරයන්ති[3] වුච්චති, තස්මිංයෙව භූමියං මුදුපඤ්ඤා පඤ්ඤින්ද්‍රියන්ති වුච්චති, තස්මිංයෙව භූමියං බන්ධෙහි අනපි-කතා, අයං චාගො. තස්මා සද්ධා චාගාධිට්ඨානෙන නිද්දිසිතබ්බා. යතිතෙන හියෙය්‍යා මනෙන සා හිස්ස විපරීතා දිට්ඨිතා අසද්ධා, සා නායතඋපසීසු සමත්තා[4] සමාදින්නා තත්ථ සද්ධින්ද්‍රියං යො කාමං පරි-විසති[5] ඉති සන්තපාපපටිනිස්සග්ගා න චාගාධිට්ඨානං, පඤ්ඤින්ද්‍රියෙන පඤ්ඤාධිට්ඨානං, සීලෙන උපසමාධිට්ඨානං. ඉමෙ චත්තාරො ධම්මා සීලං පරිභාවයන්ති සද්ධා සීලං චාගො ච පඤ්ඤාති.

තත්ථ සද්ධාය ඔඝං තරති. යං සීලං, අයං අප්පමාදො, යො චාගො, ඉදං පඤ්ඤාය කම්මං. යා පඤ්ඤා, ඉදං පඤ්ඤින්ද්‍රියං, තත්ථ යං පඤ්ඤින්ද්‍රියං, තං තීසු අවෙච්චපසාදෙසු. යං සීලං තං සද්ධින්ද්‍රියෙසු. යො චාගො සො චතූසු ඣානෙසු. යා පඤ්ඤා, සා සච්චෙසු. සති සබ්බත්ථගාමිනී. තස්ස සෙක්ඛස්ස භද්දිකා ගති[6] භද්දිකො අභිසම්පරායො.

තස්ස සම්මුට්ඨසතිකස්ස සීලං කරොන්තස්ස න කාය සම්මුට්ඨගතී-තාය තානි වා ඉන්ද්‍රියානි තං වා කුසලමූලං කම්මවිපාකං භවති. තස්ස තිකස්ස අත්ථනිද්දෙසො: තත්ථ සද්ධා සීලං චාගො පඤ්ඤා චත්තාරො ධම්මා යා සද්ධා යා ච පඤ්ඤා ඉදං මනොසුචරිතං, යං සීලං, ඉදං කායිකං වාචසිකං සුචරිතං. යො චාගො ඉදං චෙතසිකං අලොභො සුචරිතං, ඉති ඒතෙන ගහිතෙ පඤ්චක්ඛන්ධා ගහිතා භවන්ති. ඉමෙහි ධම්මෙහි සුචරිතං ඉදං දුක්ඛං ච අරියසච්චං පදට්ඨානං මග්ගස්ස.

1. අනාවිලලක්ඛණ - ම.
2. අනඤ්ඤතා - මජසං.
3. ධාරන්ති - මජසං.
4. පමත්තා - මජසං.
5. පරිවිස්සන්ති - මජසං.
6. හති - මජසං.

1. ත්‍යාගයෙන් ද ප්‍රඥයෙන් ද කුමක් දක්වා ද යත් : යම් ශ්‍රද්ධාවක් ඇද්ද ඕ චිත්තයාගේ ප්‍රසාදය යැ. යම් අනාවිලසංකල්පනාවයක් ඇද්ද ඕ ශ්‍රද්ධා යැ කරුණු කිම යත් : අනාවිලලක්ෂණ ඇති බැවිනි, එසේ මැය ශ්‍රද්ධාව අනාවිලලක්ෂණ ඇත්තී යැ අන්‍යයෝ මෙසේ කීහු : ගුණපාරිශුද්ධිය නිෂ්ඨා කොට දැනීම ලක්ෂණ වන්නී යැයි නොහොත් අන්‍යයෝ ශ්‍රද්ධාව වචන පිළිගැනීම ලක්ෂණ කොට ඇත්තී යයි කියත්.

අන්‍යත් පර්‍යායයෙකි : ඉදින් තමා මෙසේ අවකල්පන කෙරේ ද 'මම කිසිවක් නො දනිමි. තෙල මම එහි (අනුඤ්ඤත්තා අනඤ්ඤාථා ?) මේ ශ්‍රද්ධා වේ යයි. අනිත් පරියායකුදු වෙයි : එක් සැටක් දෘෂ්ටිගතයන්ගේ ආදීනව නුවණින් දැකීමෙන් අනිත්‍ය යැ දුඃඛ යැ අනාත්ම යැයි මොනවට දක්නා ලද වෙයි, යම්සේ ගැඹුරු කූපයෙක ජලය ඇසින් දකී ද නො ද කයින් අවබොධ කෙරේ ද එපරිද්දෙන් ඔහුට ආර්‍ය . . . .

නො ද ප්‍රත්‍යක්ෂ කරනලද වෙයි. මේ ශ්‍රද්ධා යයි කියනු ලැබේ. එ ද ලෞකික ශ්‍රද්ධා යි. අනිත් පර්‍යායයෙක් වෙයි : (මෙ ද ආකූල තැනෙකි.)

ඒ සොතාපත්ති භූමියෙහි මැ මෘදු වූ ප්‍රඥව පඤ්ඤින්ද්‍රිය යි කියනු ලැබේ. ඒ භූමියෙහි මැ ස්කන්ධයන්ගෙන් අනත්ථික බව වෙයි, මේ ත්‍යාගය යැ, එහෙයින් ශ්‍රද්ධාව ත්‍යාගාධිෂ්ඨාන යෙන් දක්වියැ යුත්තී යැ. (යතිකෙන හියෙහ මනෙන ?) ඒ ඔහුගේ විපරීත දෘෂ්ටි ඇති බව අශ්‍රද්ධා යැ. (සා නයනළපදීසු ?) රැස්කරනලද සමාදන් කොට ගන්නා ලද වෙයි. එහි සද්ධින්ද්‍රියය යමෙක් කාමය දුරලා ද මෙසේ විද්‍යමාන පාපය දුරලීමෙන් ත්‍යාගාධිෂ්ඨාන නො වෙයි. පඤ්ඤින්ද්‍රියයෙන් පඤ්ඤාධිට්ඨාන වෙයි සීලයෙන් උප සමාධිට්ඨාන වෙයි, ශ්‍රද්ධා ශීල ත්‍යාග ප්‍රඥ යන මේ සතර ධර්මයෝ ශීලය පරිභාවන කෙරෙත්.

එහි ශ්‍රද්ධායෙන් චතුරොඝය තරණය කෙරෙයි යම් සීලයක් ඇද්ද මේ අප්‍රමාද යැ. යම් ත්‍යාගයෙක් ඇද්ද මේ ප්‍රඥවගේ කර්ම යැ, යම් ප්‍රඥවක් ඇද්ද මේ පඤ්ඤින්ද්‍රිය යැ, එහි යම් පඤ්ඤින්ද්‍රියයෙක් ඇද්ද එය තුන් අවෙත්‍යප්‍රසාදයන්හි වෙයි, යම් ශීලයක් ඇද්ද එය සද්ධින්ද්‍රියයෙහි වෙයි. යම් ත්‍යාගයෙක් ඇද්ද හේ සතර ධ්‍යානයන්හි වෙයි, යම් ප්‍රඥවක් ඇද්ද ඒ සත්‍යයන්හි වේ. සමෘතිය සර්වත්‍රගාමිනී වේ. ඒ ශෛක්ෂයාගේ ගතිය භද්‍ර (සොඳුරු) වන්නීය, අභිසම්පරාය (පරලොව) භද්‍ර වන්නේ යි.

ඒ මුළා සිහි ඇත්තහුගේ සීලය හෝ ඒ මුළා සිහි ඇතිබව හේතු කොටගෙන ඒ ඉන්ද්‍රිය හෝ ඒ කුශලමූලය හෝ කර්මවිපාක නොවේ. ඒ ත්‍රිකයාගේ මේ අර්ථනිර්දේශ යැ : එහි ශ්‍රද්ධා සීල ත්‍යාග ප්‍රඥ යන සතර ධර්මයෝ වෙති, එහි යම් ශ්‍රද්ධාවකුත් යම් ප්‍රඥවකුත් ඇද්ද මේ මනොසුචරිත යැ, යම් ශීලයක් ඇද්ද මේ කායික වාචසික සුචරිත යැ, යම් ත්‍යාගයෙක් ඇද්ද මේ චෛතසික වූ අලොභ සංඛ්‍යාත සුචරිත යැ, මෙසේ චිත්තය ගත් කල්හි පඤ්චස්කන්ධයෝ ගන්නාලද්දහු වෙති. මේ ධර්මයන්ගෙන් සුචරිතය ගන්නාලද වෙයි, මේ දුඃඛාර්‍යසත්‍යය ද මාර්ගයට පදට්ඨාන ද වේ.

2. තත්ථ කතමො විචයො හාරො: යා ච සද්ධා යං ච සීලං, තං කිස්ස කාරොති. යා සද්ධාය භගවන්තං අනුස්සරති[1] මනෙනාපි භත්තිං සමාගතො[2], අස්සගොකුක්කරෙහි[3] සබ්බං සීලෙන නප්පටිපජ්ජති කායෙන වා වාචාය වා, ඨානං විසාරදෙ භවතීති අවිප්පටිසාරී, පඤ්ඤා යස්ස පඤ්ඤත්තං උපට්ඨපෙති, තස්ස අඛණ්ඩස්ස සීලං යං න පච්ඡිමස්සමෙමොහස්ස අකුසලචිත්තං උප්පජ්ජති මිච්ඡාදිට්ඨිසහගතං වා, අයං විචයො හාරො.

3. ධම්මවාදිනො භාද්දිකාගති[4] භවිස්සති අත්ථි එසා යුත්ති.

4. තත්ථ කතමො පදට්ඨානො හාරො: යම්දං චිත්තං දීඝරත්තං පරිභාවිතං සද්ධාය සීලෙන චාගෙන පඤ්ඤාය සමාධිනා පඨමජ්ඣානස්ස පදට්ඨානං, යා සද්ධා අස්ස අනාවිලසඞ්කප්පා[5] තං දුතියජ්ඣානස්ස පදට්ඨානං, තීණි ච අවෙච්චප්පසාද, යං සීලං තං අරියකන්තං තං සීලක්ඛන්ධස්ස පදට්ඨානං. යා පඤ්ඤා සා පඤ්ඤාක්ඛන්ධස්ස පදට්ඨානං. ඉමෙ ච ධම්මා ඉදං ච චිත්තං එකොදිභූතසමාධිස්ස පදට්ඨානං. සද්ධා සද්ධින්ද්‍රියස්ස පදට්ඨානං. චාගො සමාධින්ද්‍රියස්ස පදට්ඨානං. පඤ්ඤා පඤ්ඤින්ද්‍රියස්ස පදට්ඨානං, සද්ධා ච පඤ්ඤා ච විපස්සනාය පදට්ඨානං. සීලං ච චාගො ච සමථස්ස පදට්ඨානං. සද්ධා ච පඤ්ඤා ච අවිජ්ජා-විරාගාය පඤ්ඤාවිමුත්තියා පදට්ඨානං, සීලං ච චාගො ච රාගවිරාගාය චෙතොවිමුත්තියා පදට්ඨානං.

5. තත්ථ කතමො, ලක්ඛණො හාරො: විඤ්ඤාණෙ වුත්තෙ සද්ධා සති භාවිතා[6] සබ්බෙ පඤ්චක්ඛන්ධා වුත්තා භවන්ති, සද්ධාය භණිතාය සබ්බානි සත්තධනානි භණිතානි හොන්ති. සද්ධාධනං -පෙ- සීලක්ඛන්ධෙ වුත්තෙ සමාධික්ඛන්ධො ච පඤ්ඤාක්ඛන්ධො ච වුත්තා භවන්ති, යං තං චිත්තං දීඝරත්තං පරිභාවිතං, පච්ඡිමකෙ කාලෙ[7] න තදනුපරිවත්ති භවිස්සතීති නෙතං ඨානං විජ්ජති. යත්ථ පඤ්ඤාපි තදනුපරි-වත්තිනී භවති. යෙපි තජ්ජාතිකා ධම්මා, තෙපි තදනුපරිවත්තිනො[8] භවන්ති, රූපපඤ්ඤා රූපසඤ්ඤාවතනානුපස්සනමනසිකාරො, එවං ඡන්නං ආයතනානං විඤ්ඤාණකායෙ. අයං ලක්ඛණො හාරො.

6. තත්ථ කතමො චතුබ්යූහො හාරො: ඉධ සුත්තෙ භගවතො කො අධිප්පායො: යෙ භද්දිකං[9] ගතිං[10] ආකඞ්ඛෙය්‍යුං,[11] භද්දිකඤ්ච-අභිසම්පරායං, තෙ සද්ධං සීලං චාගං පඤ්ඤං ච මනසි කරිස්සන්ති. අයං අධිප්පායො, යෙ චඤ්ඤෙපි සත්තා තථාගතස්ස සම්මුඛං න පටිපුජ්ජනෙන ඉමං ධම්මං සොතා අවිප්පටිසාරකං කාලං කරිස්සන්තීති. අයං අධිප්පායො.

---

1. අනුසරති - මජසං.
2 සමාගතා - මජසං.
3. ගොකුක්කුරා - මජසං ලොකුත්තරා - PTS.
4. රාති - මජසං. PTS.
5. සඞ්කප්පො - මජසං.
6. භාවිතෙ - මජසං, PTS.
7. කාලෙන - මජසං, PTS.
8. පරිවත්තිනී - මජසං.
9. භද්දිකං - PTS.
10. ගතිං - මජසං, PTS
11. ආකඞ්ඛෙය්‍යු - මජසං, PTS.

2. එහි ' විචයහාර ' කවරෙ යත් : යම් ශ්‍රද්ධාවකුත් ශීලයකුත් ඇද්ද, එයින් කුමක් කෙරෙයි යත් : ශ්‍රද්ධායෙන් භාග්‍යවතුන් වහන්සේ සිහි කෙරෙයි, මතැතක්හු සමග එක්වූයේ අශ්ව ගව ශුනකයන් සමග එක්වූයේ සියල්ල ශීලය හේතු කොටගෙන (තප්පටි පජ්ජති ?) කයින් හෝ වචනයෙන් හෝ විශාරද වේ නුයි අවිප්‍රතිසාරී වේ (පඤ්ඤ යස්ස තස්සං මොහස්ස ?) අකුශලචිත්තය උපදී, මිථ්‍යාදෘෂ්ටිසහගත චිත්තය හෝ උපදී. මෙ විචයහාර යි.

3. ධර්මවාදීහුගේ භද්‍ර වූ ගති වන්නීයැ යන තෙල යුක්තිය ඇති.

4. එහි ' පදට්ඨානහාර ' කවරෙ යැ : යම් සිතක් දීර්ඝරාත්‍රයෙහි ශ්‍රද්ධායෙන් ශීලයෙන් ත්‍යාගයෙන් ප්‍රඥයෙන් සමාධියෙන් පරිභාවිත ද ඒ සිත ප්‍රථමධ්‍යානයට පදට්ඨාන යැ, යම් ශ්‍රද්ධාවක් අනාවිල සංකල්ප වේ ද එය ද්විතීයධ්‍යානයට පදට්ඨාන යැ, තුන් අවේත්‍ය ප්‍රසාදයෝ ද වෙති. යම් ශීලයක් ඇද්ද, එය ආයතිකාන්ත යැ, එය ශීලස්කන්ධයට පදට්ඨාන යැ, යම් ප්‍රඥවක් ඇද්ද එය ප්‍රඥස්කන්ධයට පදට්ඨාන යැ, මේ ධර්මයෝ ද මේ චිත්තය ද එකොදිභූත සමාධියට පදට්ඨාන යැ, ශ්‍රද්ධාව සද්ධින්ද්‍රියට පදට්ඨාන යැ, ත්‍යාගය සමාධින්ද්‍රියට පදට්ඨාන යැ, ප්‍රඥව පඤ්ඤින්ද්‍රියට පදට්ඨාන යැ, ශ්‍රද්ධාවත් ප්‍රඥවත් විදර්ශනාවට පදට්ඨාන යැ, ශීලයත් ත්‍යාගයත් සමථයට පදට්ඨාන යැ, ශ්‍රද්ධාවත් ප්‍රඥවත් අවිද්‍යාවිරාග ප්‍රඥවිමුක්තියට පදට්ඨාන යැ, ශීලයත් ත්‍යාගයත් රාගවිරාග චෙතො විමුක්තියට පදට්ඨාන යි.

5. ' එහි ලක්ඛණහාර ' කවරෙ යැ : විඥානය කී කල්හි සද්ධා සති දෙකින් භාවිත වූ සියලු පඤ්චස්කන්ධයෝ කියනලද්දහු වෙති, ශ්‍රද්ධාව කී කල්හි සද්ධාධනය . . . . යන සියලු සප්ත ධනයෝ කියනලද්දහු වෙති, ශීලස්කන්ධය කී කල්හි සමාධිස්කන්ධය ද ප්‍රඥස්කන්ධය ද කියනලද්දහු වෙත්.

යම් සිතක් දීර්ඝරාත්‍රයෙහි පරිභාවිත ද පශ්චිම කාලයෙහි තදනුපරිවර්ති නො වන්නේය යන තෙල කරුණ නො වේ. එහි සංඥව ද තදනුපරිවර්තිනී වෙයි, තත්ස්වභාව ඇති යම් ධර්ම කෙනෙකුත් ඇද්ද ඔහුද තදනුපරිවර්තිහු වෙත්. රූපසංඥව රූපසඤ්චෙතනානු දර්ශන මනසිකාර යැ, ෂඩායතනයන්ගේ විඥානකායයෙහි ද මෙසේ යි. මේ ' ලක්ඛණහාර ' යි.

6. එහි ' චතුබ්‍යුහ ' හාර කවරෙ යත් : මේ සූත්‍රයෙහි භාග්‍යවතුන් වහන්සේගේ අධිප්‍රාය කවරෙ යත් : යම් කෙනෙක් භද්‍ර (සොඳුරු) වූ ගතිය ද භද්‍ර වූ අභිසම්පරාය (පරලොව) ද කැමැතිවන්නාහු නම් ඔහු ශ්‍රද්ධාව ශීලය ත්‍යාගය ප්‍රඥව ද මෙනෙහි කරන්නාහු යැ, මේ අධිප්‍රාය යැ, (අදහස යැ.) යම් අන්‍ය සත්ව කෙනෙකුද තථාගතයන් වහන්සේගේ සම්මුඛයට නො පැමිණියාහු ද ඔහු මේ ධර්මය අසා විපිළිසර රහිත වැ කලුරියකරන්නාහු යැ යනු භාග්‍යවතුන් වහන්සේගේ මේ අදහස යි.

7. තත්ථ කතමො ආවට්ටො හාරො: ඉදම්පි චත්තාරො ධම්මා; සද්ධා ච පඤ්ඤා ච අස්සද්ධියං ච අවිජ්ජං ච හනන්ති. සීලං ච චාගො ච තණ්හං ච[1] දොසං ච හනන්ති. තස්ස ද්වෙ මූලානි පහීයන්ති, දුක්ඛං නිවත්තෙන්ති, අප්පහීනභූමියං ච ද්විමූලානි පඤ්චක්ඛන්ධා. ද්වෙ අරියසච්චානි සමථො ච විපස්සනා ච. ද්වින්නං මූලානං පහානං. ඉමානි ද්වෙ සච්චානි නිරොධො ච මග්ගො ච. අයං ආවත්තො හාරො.

8. තත්ථ කතමා[2] විභත්ති: යං තං චිත්තං සද්ධාපරිභාවිතං -පෙ- සචෙ පුථුජ්ජනස්ස තස්සපි භද්දිකා ගති[3] භවිස්සතීති න එකංසෙන, තස්ස කම්මං දිට්ඨෙයෙව ධම්මෙ විපාකන්ති පච්චෙස්සති. අපරම්හි වා පරියායෙ භවිස්සති. යං වා අතීතං විපාකාය පච්චුපට්ඨිතං, තප්පච්චයානි චෙතනානි යෙ යථා මහාකම්මවිභඞ්ගෙ තෙනායං විභජ්ජ බ්‍යාකරණීයො නිද්දෙසො ධම්මචාරිනො යා භද්දිකා ගතීති.

9. තත්ථ කතමා පරිවත්තනා: අස්සද්ධියං දුස්සීල්‍යං මච්ඡෙරං දුප්පඤ්ඤං[4] ච පටිපක්ඛෙන පහීනා භවන්ති, අයං පරිවත්තනා.

10. තත්ථ කතමං වෙවචනං: යං තං චිත්තං දීඝරත්තං පරිභාවිතං චිත්තං මනො විඤ්ඤාණං -පෙ- යා සද්ධා සා[5] සද්ධාබලං සද්ධින්ද්‍රියං යං සීලං, තං සුචරිතං, සංයමො නියමො දමො ඛන්ති, ඉමානි තස්ස වෙවචනානි. යො චාගො සො පටිනිස්සග්ගො අලොභො වොස්සග්ගො[6] චාගාධිට්ඨානං[7] යා පඤ්ඤා සා පජානනා[8] පඤ්ඤාපභා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං.

11. තත්ථ කතමා පඤ්ඤත්ති: යං තං චිත්තං බීජපඤ්ඤත්තියා පඤ්ඤත්තං, පරිභාවනා වාසනාපඤ්ඤත්තියා පඤ්ඤත්තං[9] සද්ධා පසාදපඤ්ඤත්තියා පඤ්ඤත්තා, සීලං සුචරිතපඤ්ඤත්තියා පඤ්ඤත්තං චාගො පුඤ්ඤකිරියපඤ්ඤත්තියා පඤ්ඤත්තො. පඤ්ඤා වීමංසාපඤ්ඤත්තියා පඤ්ඤත්තා. ඉමෙ තයො ධම්මා සද්ධා සීලං චාගො පඤ්ඤවතො පාරිසුද්ධිං ගච්ඡන්ති.

12. තත්ථ කතමො ඔතරණො: යං චිත්තං තං ඛන්ධෙසු විඤ්ඤාණක්ඛන්ධො. ධාතූසු මනොවිඤ්ඤාණධාතු, ආයතනෙසු මනායතනං. යෙ චත්තාරො ධම්මා තෙ ඛන්ධෙසු සඞ්ඛාරක්ඛන්ධෙ පරියාපන්නා -පෙ- ධාතූසු ආයතනෙසු.

13. තත්ථ කතමො සොධනො හාරො: ඉදං භගවතො භාසිතං මහානාමෙන සක්කෙන පුච්ඡිතෙන, සබ්බං තං නිය්‍යුත්තං.

14. තත්ථ කතමො අධිට්ඨානො: ඉදං චිත්තං වෙමත්තතාය පඤ්ඤත්තං, අකුසලෙහි චිත්තෙහි අපරිභාවිතෙහි, පරිභාවිතන්ති යානි

1. තණ්හා ච - මජ්සං, PTS.
2. කතමො - මජ්සං, PTS
3 භති - මජ්සං, PTS.
4. දුප්පඤ්ඤයං - PTS.
5. යං - මජ්සං, PTS.
6. වොසග්ගො - මජ්සං.
7. චාගොධිට්ඨානං - මජ්සං. චාගොදිට්ඨානං - PTS
8. පඤ්ඤත්තා - මජ්සං.
9. පඤ්ඤත්ති - මජ්සං, PTS.

7. එහි ' ආවට්ටහාර ' කවරෙ යැ : මෙ ද සතර ධර්ම කෙනෙක් වෙති, ශ්‍රද්ධාව ද ප්‍රඥාව ද යන දෙදෙන අශ්‍රද්ධාවත් අවිද්‍යාවත් නසති. ශීලය ද ත්‍යාගය ද යන දෙදෙන තෘෂ්ණාවත් ද්වේශයත් නසති. ඔහුගේ (ලොභ දෙස යන) මූලයෝ දෙදෙන ප්‍රහීණ වෙති. දුක නවතාලයි, අප්‍රහීණ භූමියෙහිදූ (ද්විමූලානි පඤ්චක්ඛන්ධා ?) සමථය ද විපස්සනාව ද ආර්‍යසත්‍යයෝ දෙදෙනෙක් වෙති. එය (ලොභ දෙස යන) දෙ මූලයන්ගේ ප්‍රහාණය වෙයි. මේ නිරොධය ද මාර්ගය ද යන සත්‍යයෝ දෙදෙන වෙත්. (මේ විවරණය ව්‍යාකූලය ?) මේ ආවත්තහාර යි.

8. එහි ' විභත්ති ' කවර යැ : යම් සිතක් ශ්‍රද්ධායෙන් පරිභාවිත ද . . . . . ඉදින් ඒ පුහුදුන්හුගේ ද භද්‍ර වූ ගතිය වන්නේ යැ යනු ඒකාන්ත නො වේ. ඔහුගේ කර්මය ඉහාත්ම යෙහි මැ විපාක ඇතැයි කැමැති වන්නේය, අපරපරියාය භවයෙහි හෝ වන්නේ යැ, යම් අතීත කර්මයක් හෝ විපාක පිණිස එළඹැ සිටියේ ද, චේතනාවෝ එය ප්‍රත්‍යය කොට ඇත්තාහු යැ, යම් (නිර්දේශ කෙනෙක්) මහාකර්මවිභඞ්ගයෙහි ආවාහු ද, එකරුණෙන් ' ධර්මචාරීහුගේ යම් භද්‍ර වූ ගති වෙයි,' යන මේ විභාග කොට ප්‍රකාශ කළයුතු නිර්දේශයෙකි.

9. එහි ' පරිවත්තනා ' කවර යත් : ශ්‍රද්ධා රහිතබව ද දුශ්ශීලබව ද මසුරුබව ද දුෂ්ප්‍රාඥ බව ද (යන මේ) ප්‍රතිපක්ෂභාවයෙන් ප්‍රහීණ වූවාහු වෙත්. මේ ' පරිවත්තනා ' යි.

10. එහි ' වෙවචන ' කවරෙ යත් : යම් සිතක් දීර්ඝරාත්‍රයෙහි පරිභාවිත ද එය චිත්ත යැ නම යැ විඤ්ඤාණ යැ . . . . යම් ශ්‍රද්ධාවක් ඇද්ද එය සද්ධාබල යැ සද්ධින්ද්‍රිය යැ . . . . යම් සීලයක් ඇද්ද එය සුචරිත යැ සංයම යැ නියම යැ දම යැ බන්ධනා යැ, මොහු ඒ සීලයට වෙවචන යැ, යම් ත්‍යාගයෙක් ඇද්ද එය පටිනිස්සග්ග යැ අලොභ යැ වොසස්සග්ග යැ චාගාධිට්ඨාන යැ යනු වෙවචන යි. යම් ප්‍රඥාවක් ඇද්ද එය පඤ්ඤනා යැ පඤ්ඤප්පභා යැ පඤ්ඤින්ද්‍රිය යැ පඤ්ඤාබල යැ යනු වෙවචන යි.

11. එහි ' පඤ්ඤත්ති ' කවර යැ : යම් සිතක් ඇද්ද එය වීජපඤ්ඤත්තියෙන් පනවන ලද, පරිභාවනාව වාසනාපඤ්ඤත්තියෙන් පනවනලද, ශ්‍රද්ධාව පසාදපඤ්ඤත්තියෙන් පනවනලද, සීලය සුචරිතපඤ්ඤත්තියෙන් පනවනලද, ත්‍යාගය පුණ්‍යක්‍රියාපඤ්ඤත්ති යෙන් පනවන ලද, ප්‍රඥාව වීමංසාපඤ්ඤත්තියෙන් පනවන ලද, සද්ධා සීල චාග යන මේ තුන් ධර්මයෝ ප්‍රඥාවත්හුගේ පාරිශුද්ධියට යෙත්.

12. එහි ' ඔතරණ ' හාර කවරෙ යැ : යම් චිත්තයක් ඇද්ද එය ස්කන්ධයන් කෙරෙහි ' විඤ්ඤාණක්ඛන්ධ යැ, ධාතූන් කෙරෙහි මනොවිඤ්ඤාණධාතු යැ, ආයතනයන් කෙරෙහි මනායතන යි. යම් සතර ධර්ම කෙනෙක් වෙත් ද ඔහු ස්කන්ධයන් කෙරෙහි සංස්කාර ස්කන්ධ පර්‍යාපන්නයෝ යැ . . . . ධාතූන් කෙරෙහි ආයතනයන් කෙරෙහි (?)

13. එහි ' සොධන ' හාර කවරෙ යැ : මහානාම ශාක්‍යයා විසින් පුළුවුස්නාලදූ වැ මේ භාග්‍යවතුන් වහන්සේගේ භාසිත වෙයි. ඒ සියල්ල (සියලු පුච්ඡිතය) නියුක්ත යි.

14. එහි ' අධිට්ඨාන ' හාර කවරෙ යැ : මේ චිත්තය අපරිභාවිත වූ අකුශල චිත්තයන් හෙතු කොට විශෙෂතායෙන් පනවන ලද, ' පරිභාවිතං ' යී යළි අන්‍යයන්ගේ ද පරිභාවිත වූ

පුන පරිභාවිතානි, අඤ්ඤඤ්ඤසම්පි[1] තත්‍ථ උපාදය පඤ්ඤත්තං, සබ්බෙපිමෙ චත්තාරො ධම්මා එකත්තතාය පඤ්ඤත්තා, හද්දිකා ගතීති[2] කාම-භොගිනො, නෙව[3] රූපධාතු අරූපධාතු. මනුස්සාති, සබ්බා හද්දිකා ගති[4] තදෙව කථාය පඤ්ඤත්තං, අයං පඤ්ඤත්ති.

15. තත්‍ථ කතමො පරික්ඛාරො: චිත්තස්ස ඉන්ද්‍රියානි පච්චයො ආධිපතෙය්‍යපච්චයතාය, මනසිකාරො හෙතුපච්චයතාය පච්චයො. සද්ධාය ලොකිකා පඤ්ඤා හෙතුපච්චයතාය පච්චයො යොනිසො ච මනසිකාරො පච්චයො. සීලස්ස පතිරූපදෙසවාසො පච්චයො. අත්ත-සම්මාපණිධානං ච හෙතු. චාගස්ස අලොභො හෙතු, අවිප්පටිසාරො ච හෙතුපච්චයො. පඤ්ඤාය[4] පරතො ච ඝොසො අජ්ඣත්තං ච යොනි-සොමනසිකාරො හෙතුපච්චයො.

16. තත්‍ථ කතමො සමාරොපනො: යං තං චිත්තං දීඝරත්තං පරිභාවිතන්ති චෙතසිකාපි. එත්‍ථ සබ්බෙ ධම්මා පරිභාවිතා හද්දිකා තෙති[5] භවිස්සති, හද්දකො[5] උප්පත්තිකො අභිසම්පරායො. ඉති යෙ කෙචි මානුසකා[6] උපභොගපරිභොගා, සබ්බෙ හද්දිකා ගතියෙව. අයං සමාරොපනො.

## 7 - 6

“උද්ධං අධො සබ්බධි විප්පමුත්තො”ති[7] ගාථා: තත්‍ථ කිං උද්ධං නාම, යං ඉතො උද්ධං භවිස්සති අනාගාමී, ඉදං උද්ධං, අධො නාම, යමතික්කන්තමතීතං, ඉදමෙවාච උදන්තන්ති[8] තත්‍ථ අතීතෙන සස්සත-දිට්ඨි පුබ්බන්තකප්පිකානං[9] අපරන්තදිට්ඨී කෙනඤ්චි, උච්ඡෙදදිට්ඨිං යං වුත්තන්තකප්පිකානං ඉමා චෙව දිට්ඨියො උච්ඡෙදදිට්ඨි ච සස්සතදිට්ඨි ච.

තත්‍ථායං සස්සතදිට්ඨි: ඉමානි පන්නරසපදානි සක්කායදිට්ඨි සස්සතං භජන්ති: රූපවන්තං මෙ අත්තා, අත්තනි මෙ රූපං, රූප-සිම්ං[10] මෙ අත්තා’ති යදුච්චතෙ පඤ්ඤං පරිදහන්ති.(?) යා උච්ඡෙදදිට්ඨි සා පඤ්ච පදානි[11] උච්ඡෙදං භජන්ති තං’තං ජීවං තං සරීර’න්ති පස්සන්ති, රූපං මෙ අත්තා’ති තථාරූපා චතුබ්බිධා සක්කායදිට්ඨි උච්ඡෙදෙන ච සස්සතෙන ච, එවං පඤ්චසු ඛන්ධෙසු විසතිවත්ථුකාය දිට්ඨියා පන්නරස පදානි පුබ්බන්තං භජන්ති සස්සතදිට්ඨියා පඤ්ච පදානි අපරන්තං භජන්ති උච්ඡෙද දිට්ඨියා.

---

1. අඤ්ඤඤ්ඤසන්ති - මජසං.
2. ගති - මජසං, PTS.
3. තෙච - මජසං, PTS.
4. පඤ්ඤා - මජසං, PTS.
5. හද්දිකා - මජසං, PTS.
6. මනුස්සකා - මජසං, PTS.
7. වීතරාගොති - මජසං, PTS.
8. අපදන්තන්ති - මජසං.
9. පුබ්බන්තා කප්පිකානං - මජසං.
10. රූපං මෙ - මජසං, PTS.
11. පඤ්චපදානි - මජසං, PTS.

යම් සිතක් ඇද්ද එය නිසා පනවන ලද. මේ සියලු මැ ශ්‍රද්ධාදී සතර ධර්මයෝ එකත්තතා (සාමාන්‍යභාව) යෙන් පනවන ලදහු යැ. ' භද්දිකා ගති ' යී කාමභොගීහුගේ ගති යයි. රූපධාතු අරූපධාතු නො මැ වෙයි. ' මනුස්සා ' යනු සියලු මිනිස්ගතිය භද්‍ර වෙයි. එය මැ (කථාය පඤ්ඤත්තං ?) මේ ' පඤ්ඤත්ති ' හාර යි.

15. එහි ' පරික්ඛාරහාර ' කවරෙ යැ : චිත්තයට ඉන්ද්‍රියයෝ ආධිපතෙය්‍යප්‍රත්‍යතා යෙන් ප්‍රත්‍ය වෙයි, මනසිකාරය හේතුප්‍රත්‍යතායෙන් ප්‍රත්‍යය වෙයි, ශ්‍රද්ධාවට ලෞකික ප්‍රඥව හේතුප්‍රත්‍යතායෙන් ප්‍රත්‍ය වෙයි, යෝනිසොමනසිකාරය ද ප්‍රත්‍ය වෙයි. සීලයට පතිරූපදේසවාසය ප්‍රත්‍ය වෙයි, අත්තසම්මාපණිධානය ද හේතු වෙයි, ත්‍යාගයට අලොභය හේතු යැ, අවිප්පටිසාරය ද හේතුප්‍රත්‍ය වෙයි. ප්‍රඥවට පරතොඝොසය ද අධ්‍යාත්මයෙහි යොනිසොමනසිකාරය ද හෙතු ප්‍රත්‍යය වේ.

16. එහි ' සමාරොපන ' හාර කවරෙ යැ : '' යං තං චිත්තං දීඝරත්තං පරිභාවිතං '' යී චෛතසිකයෝ ද කියනලදහු වෙත්. මෙහි සියලු (ශ්‍රද්ධාදි) ධර්මයෝ වඩනලද්දහු තොපගේ ගතිය භද්‍ර වන්නීය, උපප්‍රාප්තික වූ පරලොකය භද්‍ර වන්නේ යැ. මෙසේ මානුෂ්‍යක වූ යම් කිසි උපභොග පරිභොගයෝ වෙත් ද, ඒ සියල්ල භද්‍ර වූ ගති මැ වේ යයි. මේ ' සමාරොපන ' හාර යි.

7 — 6.

'' උද්ධං අධො සබ්බධි විප්පමුත්තො '' යන ගාථාව යැ :

එහි ' උද්ධ ' නම් කිමැ : මේ කාමධාතුයෙන් උඩ යම් අනාගාමී රූපාරූපධාතුයෙක් වේ ද මේ උද්ධ නමැ. ' අධො ' නම් යමක් ඉක්මැ වූයේ අතීත වේ ද (බුදුහු) මේ උදාන පාළිය වදළහ. එහි අතීතයෙන් පූර්වාන්තකල්පිකයන්ගේ ශාශ්වතදෘෂ්ටිය ද කිසි කෙනකුන්ගේ අපරාන්තදෘෂ්ටිය ද. (යං වුත්තකප්පිකානං ?) මේ දෘෂ්ටිහු ද උච්ඡෙද දෘෂ්ටිය ද ශාස්වත දෘෂ්ටිය ද වෙත්.

එහි මේ ශාශ්වත දෘෂ්ටී යැ : සක්කායදෘෂ්ටි වූ මේ පසළොස් පදයෝ ශාශ්වතදෘෂ්ටිය බෙජෙති : මාගේ ආත්මය රූපවත් යැ, මාගේ ආත්මයෙහි රූපය ඇත, රූපයෙහි මාගේ ආත්මය ඇතැයි (යදුච්චතෙ පඤ්ඤං පරිදහන්ති ?) යම් උච්ඡෙදදෘෂ්ටියක් ඇද්ද, එය පඤ්චපද කෙනෙක් උච්ඡෙදය බෙජෙත්. ඔහු ' ජීවයත් එය යැ, ශරීරයත් එය ' යි දකිත්. රූපය මාගේ යැ, මාගේ ආත්මය යි කියා යි. එබඳු උච්ඡෙදයෙන් ද ශාශ්වතයෙන් ද යුක්තව සත්කායදෘෂ්ටිය චතුර්විධ යැ, මෙසේ පඤ්චස්කන්ධයෙහි විංශද්වස්තුක දෘෂ්ටියෙන් පසළොස් පද කෙනෙක් ශාශ්වතදෘෂ්ටියෙන් පූර්වාන්තය බෙජෙති. පස් පද කෙනෙක් උච්ඡෙදදෘෂ්ටියෙන් අපරාන්තය බෙජෙත්.

තත්ථ අයමහමස්මීති පස්සන්තො[1] රූපං අත්තතො සමනුපස්සති, සො උච්ඡෙදවාදී, රූපවිනාසඤ්ච අත්තනාසං, අත්තනි ච රූපං රූපස්මිං වා අත්තා'ති සො පස්සති වාති ඉති උච්ඡෙදදිට්ඨි ච, අත්තතො පටිසරති සක්කායදිට්ඨි පුබ්බන්තතො ච පටිසරති. අයමහමස්මී'ති න සමනුපස්සති. තස්ස දිට්ඨාසවා පහානං ගච්ඡන්ති. සො[2] තීසු අද්ධාසු පුබ්බන්තෙ ච අපරන්තෙ ච තෙන තෙන නිද්දිට්ඨානෙව. උද්ධං අධො සබ්බධි විතරණො 'අහමස්මී'ති න අනුපස්සතීති ඉමිනා ආකාරෙන ඉමිනා පයොගෙන ඉමිනා උපායෙන. ඉදං දස්සනභූමි ච සොතාපත්තිඵලං ච. සො අරියො පයොගො අනභාවංගතෙන සංසාරෙන, අපුනබ්භවායාති[3] යො කොචි අරියො පයොගො අපුනබ්භවාය[4] මුදූනි වා පඤ්චින්ද්‍රියානි මජ්ඣානි අධිමත්තානි වා සබ්බං පුනබ්භවපහානාය[5] සංවත්තන්ති. 'අහ'න්ති දිට්ඨාසවො කාමාසවො භවාසවො අවිජ්ජාසවො ච ඔධිසො.

1. තත්ථ **දෙසනාහාරෙන** චත්තාරි සච්චානි. පඤ්චහි ඉන්ද්‍රියෙහි සොතාපත්තිඵලෙන ච ද්වෙ සච්චානි මග්ගො ච නිරොධො ච. සක්කායසමුදයෙන ද්වෙ සච්චානි දුක්ඛං ච සමුදයො ච, අයං **දෙසනා** හාරො.

2. තත්ථ කතමො **විචයො**: 'අයමහමස්මී'ති අසමනුපස්සන්තො තීණි දස්සනා පහාතබ්බානි[6], සංයොජනානි පජහති, අයං විචයො.

3. තත්ථ කතමා **යුත්ති**: තිවිධා පුග්ගලා, කොචි උග්ඝටිතඤ්ඤූ කොචි විපඤ්චිතඤ්ඤූ කොචි නෙය්‍යො, උග්ඝටිතඤ්ඤූ තික්ඛින්ද්‍රියො ච තතො විපඤ්චිතඤ්ඤූ මුදින්ද්‍රියො තතො මුදින්ද්‍රියො[7] නෙය්‍යො.

තත්ථ උග්ඝටිතඤ්ඤූ තික්ඛින්ද්‍රියත්තා දස්සනභූමිමාගම්ම සොතාපත්තිඵලං පාපුණාති, එකබීජකො භවති. අයං පඨමො සොතාපන්නො. විපඤ්චිතඤ්ඤූ මුදූහි ඉන්ද්‍රියෙහි දස්සනභූමිමාගම්ම සොතාපත්තිඵලං පාපුණාති, කොලංකොලො ච හොති. අයං දුතියො සොතාපන්නො, තත්ථ නෙය්‍යො දස්සනභූමිමාගම්ම සොතාපත්තිඵලං පාපුණාති සත්තක්ඛත්තුපරමො ච භවති. අයං තතියො සොතාපන්නො.

තත්ථ එසා යුත්ති මුදුමජ්ඣාධිමත්තෙහි ඉන්ද්‍රියෙහි මුදුමජ්ඣාධිමත්තං භූමිං සච්ඡිකරෙය්‍ය, සක්කායදිට්ඨිප්පහානෙන වා දිට්ඨිගතානි පජහති. අයං යුත්ති.

4. තත්ථ කතමො **පදට්ඨානො**: තත්ථ සක්කායදිට්ඨි සබ්බමිච්ඡාදිට්ඨියා පදට්ඨානං, සක්කායො නාමරූපස්ස පදට්ඨානං, නාමරූපං සක්කායදිට්ඨියා පදට්ඨානං, පඤ්ච ඉන්ද්‍රියානි රූපීනි රූපරාගස්ස පදට්ඨානං, සළායතනං අහඞ්කාරස්ස පදට්ඨානං.

---

1. පස්සන්තා – මජ්සං, PTS
2. යො – PTS.
3. අපුනබ්භවාති - මජ්සං, PTS.
4. පුනබ්භවාය – මජ්සං, PTS.
5. අපුනබ්භවප්පහානායං – මජ්සං.
6. දස්සනප්පහාතබ්බානි – මජ්සං
7. මුදින්ද්‍රියෙහි – මජ්සං, PTS.

එහි ' මේ මම වෙමි ' දක්නේ රූපය ආත්මවශයෙන් දෘෂ්ටිසමනුපස්සනායෙන් දකී, හේ උච්ඡේදවාදී වෙයි. ආත්මය රූපවත් යයි ද ආත්මයෙහි රූපය ඇතැයි ද රූපයෙහි ආත්මය ඇතැයි හෝ දකී, (හේ ශාශ්වතවාදී වෙයි.) මෙසේ උච්ඡේදදෘෂ්ටිය ද (අත්තතො පටිස්සරති සස්සතදිට්ඨි පුබ්බත්තතො ච පටිස්සරති ?) 'මේ මම වෙමි ' (විප්පමුත්ත මහණ) නො දකී, ඔහුට දෘෂ්ටි–ආස්‍රවයෝ ප්‍රහාණයට යෙති. හේ කාලත්‍රයෙහි ද පූර්වාන්ත යෙහි ද අපරාන්තයෙහි ද ඒ ඒ (නිද්දිට්ඨානෙන ?) උඩ රූපාරූපධාතුයෙහි ද යට කාම ධාතුයෙහි ද සියලු ත්‍රෛධාතුක ලෝකයෙහි වීතරාග වූයේ ' මම වෙමි.' මේ ද්වාරයෙන් මේ ප්‍රයොගයෙන් මේ උපායෙන් නො දකී යයි. මේ දර්ශන භූමි ද සොතාපත්ති ඵලය ද වෙයි. (ඒ ආයර්‍යප්‍රයොගය අනභාවයට ගිය සංසාරයෙන් යුක්ත වූයේ ?) '' අපුනබ්භවාය '' යනු යම් කිසි ආයර්‍යප්‍රයොගයෙක් ? පුනර්භව නොවනු පිණිස වේ ද, මෘදු වූ හෝ මධ්‍ය වූ හෝ අධිමාත්‍ර වූ හෝ පඤ්චෙන්ද්‍රියයෝ සියලු පුනර්භව ප්‍රහාණය පිණිස පවත්නාහුය. ' අහං ' යනු අවධිවශයෙන් දිට්ඨොසය කාමොසය භවොසය අවිජ්ජාසය ද වෙයි.

1. එහි දේසනාහාරයෙන් චතුස්සත්‍යයෝ (දුක්ඛිය යුත්තාභ.) පඤ්චෙන්ද්‍රියයන් ගෙන් ද සොතාපත්තිඵලයෙන් ද මාර්ගසත්‍යය ද නිරොධසත්‍යය ද යන සත්‍යයෝ දෙදෙන වෙති. සක්කායසමුදයෙන් දුඃඛසත්‍යය ද සමුදයසත්‍යය ද යන සත්‍යයෝ දෙදෙන වෙත්. මේ ' දෙසනාහාර ' යි.

2. එහි ' විචයහාර ' කවරෙ යත් : ' මේ මම වෙමි ' නොදක්නේ දර්ශනයෙන් ප්‍රහාතව්‍ය වූ තුන් සංයොජනයන් දුරු කෙරෙයි. මේ ' විචය ' හාර යි.

3. එහි ' යුත්ති ' කවර යත් : පුද්ගලයෝ ත්‍රිවිධ වෙත් : කිසිවෙක් උග්ඝටිතඤ්ඤු යැ කිසිවෙක් විපඤ්චිතඤ්ඤු යැ කිසිවෙක් නෙය්‍ය යැ. උද්ඝටිතඥ පුද්ගල තික්ඛින්ද්‍රිය ද වෙයි, විපඤ්චිතඥ පුද්ගල ඊට වඩා මුදින්ද්‍රිය යැ, නෙය්‍ය පුද්ගල ඊට වඩා මුදින්ද්‍රිය යි.

එහි උග්ඝටිතඤ්ඤු පුද්ගල තික්ඛින්ද්‍රියතායෙන් දර්ශනභූමියට පැමිණ සොතාපත්ති ඵලයට පැමිණෙයි, ඒකබීජී වෙයි. මේ පළමුවන සොතාපන්න යැ. විපඤ්චිතඤ්ඤු පුද්ගල මෘදු වූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගෙන් දර්ශනභූමියට පැමිණ සොතාපත්තිඵලයට පැමිණෙයි, කොලංකොල ද වෙයි, මේ දෙවැනි සොතාපන්න යැ, එහි නෙය්‍ය පුද්ගල දර්ශනභූමියට පැමිණ සොතාපත්තිඵලයට පැමිණෙයි. සත්තක්ඛත්තුපරම ද වෙයි. මේ තුන්වැනි සොතාපන්න පුද්ගල යි.

එහි තෙල යුක්ති ඇත, මෘදු-මධ්‍යාධිමාත්‍ර වූ ඉන්ද්‍රියයන්ගෙන් මෘදු මධ්‍ය අධිමාත්‍ර වූ භූමිය පයක් කරන්නේ යැ, පනාහොත් සත්කායදෘෂ්ටි ප්‍රහාණයෙන් දෘෂ්ටිගතයන් දුරු කරන්නේ යි. මේ ' යුක්තිහාර ' යි.

4. එහි ' පදට්ඨාන ' කවරෙ යැ : එහි, සත්කායදෘෂ්ටිය සියලු මිත්‍ථ්‍යාදෘෂ්ටියට පදට්ඨාන යැ, සත්කායදෘෂ්ටිය නාමරූපයට පදට්ඨාන යැ, නාමරූපය සක්කායදිට්ඨියට පදට්ඨාන යැ. රූපී පඤ්චෙන්ද්‍රියයෝ රූපරාගයට පදට්ඨාන යැ, ෂඩායතනය අහඞ්කාර යට පදට්ඨානයි. (මේ පදට්ඨාන යි.)

5. තත්ථ කතමො ලක්ඛණො: ද්වීසු දිට්ඨීසු පහීනාසු තත්ථ එකසට්ඨි[1] දිට්ඨිගතානි පහානං ගච්ඡන්ති, උද්ධං ච අධො ච වීතරාගො සබ්බරජනීයෙසු වීතරාගො හොති. තජ්ජා පරභූමියං, ඉදං පච්චයන්ති යථාභූතං පස්සති. සො සබ්බපටිච්චසමුප්පාදං ආමසති. අයං ලක්ඛණො හාරො.

6. තත්ථ කතමො චතුබ්‍යූහො හාරො: ඉමම්හි සුත්තෙන භගවතො කො අධිප්පායො: යෙ සත්තා යෙනාභිරමිස්සන්ති, තෙ දිට්ඨිප්පහානාය වායමිස්සන්ති. අයමෙත්ථ භගවතො අධිප්පායො, අයං චතුබ්‍යූහො හාරො.

7. තත්ථ කතමො ආවට්ටො හාරො: යානිමානි මුදූනි පඤ්චින්ද්‍රියානි තානි ඔරම්භාගියානි පඤ්චින්ද්‍රියානි, සබ්බෙන සබ්බං සමූහනන්ති අභිජ්ඣා බ්‍යාපාදෙ ච භාවනාවසෙන[2] න සෙඛාය[3] විමුත්තියා බලං සද්ධා, උද්ධම්භාගියානි දිට්ඨිවසෙන බලං සද්ධා විරියින්ද්‍රියං[4] ආරභිතත්තා[5] සතින්ද්‍රියං මග්ගහිතත්තා අච්චන්තං නිරොධං ගච්ඡන්ති. තත්ථ යානි ඉන්ද්‍රියානි, අයං මග්ගො, සංකිලෙසප්පහානං අයං නිරොධො, ආයතිං අනුප්පාදධම්මො, ඉදං දුක්ඛං, අයං ආවට්ටො හාරො.

8. තත්ථ කතමො විභත්තිහාරො: 'අයමහමස්මී'ති යො සමනුපස්සති, සො ච ඛො අධිමත්තෙන ලොකිකායං භූමියං න තු අරියෙන පයොගෙන සො සක්කායදිට්ඨිං[6] පජහති. යං වුච්චති තජ්ජාය භූමියං අධිමත්තාය. තත්ථ තජ්ජාය භූමියං පඤ්චහි ආකාරෙහි අධිමත්තතං පටිලභති: සීලෙන වතෙන බාහුසච්චෙන සමාධිනා නෙක්ඛම්මසුඛෙන. තත්ථ අප්පත්තෙන[7] පත්තසඤ්ඤී අධිමානං ගණ්හාති. එතස්මිං යෙව වත්ථුප්පත්තියං භගවා ඉදං සුත්තං භාසති, 'සීලවා වතමත්තෙනා'ති. තත්ථ යො අප්පත්තෙන[7] පත්තසඤ්ඤී තස්ස යො සමාධි සො සාමිසො කාපුරිසසෙවිතො පන සො, කාපුරිසා වුච්චන්ති පුථුජ්ජනා. ආමිසං යං ච අරියමග්ගමාගම්ම ලොකිකං[8] අනරියං තෙන සමාධි හොති අනරියො කාපුරිසසෙවිතො, යො පන අරියාකාරෙන යථාභූතං න ජානාති න පස්සති, සො අධිගමනං පජහති යො අරියෙන සමාධිනා අකාපුරිස-සෙවිතෙන නිරාමිසෙන නීයාති,[9] තත්ථ අකාපුරිසා වුච්චන්ති අරියපුග්ගලා. යො තෙහි සෙවිතො සමාධි, සො අකාපුරිසසෙවිතො. තස්මා එතං විභජ්ජ ව්‍යාකරණීයං අයමහමස්මී'ති අනානුපස්සි තථාගතොති[10].

9. තත්ථ කතමා පරිවත්තනා: ඉමාය දස්සනභූමියා කිලෙසා පහාතබ්බා, තෙහි පහීයන්ති අනිද්දිට්ඨාපි භගවතා නිද්දිසිතබ්බායො.

---

1. එකා දිට්ඨි – මජසං.
2. භාවනාකාරෙන – මජසං.
3. සෙක්ඛාය – මජසං.
4. විරියින්ද්‍රියං – මජසං.
5. සරසිතත්ථා – PTS.
   සරසිතත්තා – මජසං.
6. සක්කායදිට්ඨි – මජසං, PT
7. අපතෙන – මජසං, PTS.
8. ලොකිකා – මජසං, PTS.
9. නීයති – මජසං, PTS
10. අසමනුපස්සන්තො තථා පාතෙති – මජසං, PTS.

5. එහි ' ලක්ඛණහාර ' කවරෙ යැ : ශාශ්වත උච්ඡෙද යන දෘෂ්ටි දෙක ප්‍රහීණ කල්හි එහි එක්සැටක් දෘෂ්ටිගතයෝ ප්‍රහාණයට යෙති. උඩ ද යට ද වීතරාග වූයේ සියලු රජනීය ධර්මයන්හි විගතරාග වෙයි. තද්ජනිත වූ පරභූමියෙහි මේ ප්‍රත්‍ය යයි ඇතිසැටියෙන් දකී, හේ සියලු ප්‍රතීත්‍යසමුත්පාදය ආමර්ෂණ කෙරෙයි. මේ ' ලක්ඛණ ' හාර යි.

6. එහි ' චතුබ්‍යූහ ' හාර කවරෙ යැ : මේ සූත්‍රයෙහි ලා භාග්‍යවතුන් වහන්සේගේ අදහස කවරෙ යැ : යම් සත්ව කෙනෙක් යම් කරුණෙකින් අභිරමණය කරන්නාහු ද, ඔහු දෘෂ්ටිප්‍රහාණය පිණිස වැයම් කරන්නාහු යැ, මේ මෙහි භාග්‍යවතුන් වහන්සේගේ අදහස යි. මේ ' චතුබ්‍යූහ ' හාර යි.

7. එහි ' ආවට්ටහාර ' කවරෙ යැ : යම් මේ මෘදු වූ පඤ්චින්ද්‍රිය කෙනෙක් වෙත් ද, ඔහු ඔරම්භාගිය පඤ්චින්ද්‍රියයෝ යි. අභිධ්‍යාව හා ව්‍යාපාදය ද සියල්ලෙන් සියල්ල සමූහනය කෙරෙත්. භාවනාවශයෙන් ශෛක්ෂවිමුක්තිහුගේ ශ්‍රද්ධාබලය වේ. (උද්ධංභාගියානි දිට්ඨිවසෙන බලං සද්ධා ?) විරියින්ද්‍රිය ආරබ්ධ බැවින් ද සතින්ද්‍රිය මාර්ගයට හිත බැවින් ද අත්‍යන්තනිෂ්ඨාවට යෙති. එහි යම් ඉන්ද්‍රිය කෙනෙක් ඇද්ද මේ මාර්ග යැ, සංකිලෙස ප්‍රහාණය නිරොධ යැ, මතුයෙහි අනුත්පාදස්වභාව යන මේ දුක්ඛ යැ. (?) මේ ' ආවට්ටහාර ' යි.

8. එහි ' විභත්ති ' හාර කවරෙ යැ : '' මේ මම් වෙමී '' යමෙක් (දිට්ඨි විසින්) දකී ද, හේ වූ කලි අධිමාත්‍ර වූ ලෞකික භූමියෙහි යැ, හේ ආර්‍යප්‍රයොගයෙන් සක්කායදිට්ඨිය නො හරී, අධිමාත්‍ර වූ තජ්ජනිත භූමියෙහි යම් ප්‍රහාණයෙක් කියනුලැබේ ද එය යි. (?) එහි පස් ආකාරයෙකින් තජ්ජනිත භූමියෙහි අධිමාත්‍ර බව ලබයි : ශීලයෙන් ව්‍රතයෙන් බහුශ්‍රුත බැවින් සමාධියෙන් නෛෂ්ක්‍රම්‍යසුඛයෙන් යන පස්අයුරෙනි. එහි නොපත් මාර්ගයෙහි ප්‍රාප්ත යැ යන සංඥ ඇතියේ අධිමානය ගනී. මේ වස්තුහුගේ උත්පත්තියෙහි ලා බුදුහු මේ සූත්‍රය වදරති : '' ව්‍රතමාත්‍රයෙන් සිල්වත් වේ '' යයි. එහි යමෙක් අප්පත්ත යෙහි පත්තසඤ්ඤී වේ ද, ඔහුගේ යම් සමාධියෙක් වේ ද ඒ සමාධිය සාමිස යැ යළි ඒ සමාධිය කාපුරුෂසේවිත යැ, ' කාපුරිය ' යි පෘථග්ජනයෝ කියනු ලැබෙත්. ආර්‍යමාර්ග යට පැමිණ යම් ආමිසයක් (?) ලෞකික අනාර්‍ය වේ ද, එහෙයින් සමාධිය අනාර්‍ය කාපුරුෂසෙවිත වෙයි, යළි යමෙක් ආර්‍යාකාරයෙන් යථාභූත වැ නො දනී ද නො දකී ද, හේ අධිගමය දුරුකෙරෙයි, යමෙක් අකාපුරුෂසේවිත වූ නිරාමිස වූ ආර්‍යසමාධියෙන් නිර්යාණය කෙරේද එහි ' අකාපුරිස ' යි ආර්‍යපුද්ගලයෝ කියනු ලැබෙත්. ඒ ආර්‍යයන් විසින් සෙවුනාලද යම් සමාධියෙක් වේ ද, ඒ සමාධිය ' අකාපුරිස සෙවිත ' නම් වේ. එහෙයින් තෙල ' අයමහමස්මීති අනානුපස්සී තථාගතො ' යනු විභාග කොට ප්‍රකාශ කළයුතු යි. මේ ' විභත්තිහාර ' යි.

9. එහි '' පරිවත්තනහාර '' කවරෙ යැ : මේ දර්ශනභූමියෙන් ක්ලේශයෝ ප්‍රහීණ කළයුත්තාහුය, (තෙහි ?) ප්‍රහීණ කරනු ලැබෙත්. භාග්‍යවතුන් විසින් නොදක්වන ලද්දහු නමුදු දක්වියැයුත්තාහුය.

17—ඒ 078576

10. තත්ථ කතමං වෙවචනං: යා සක්කායදිට්ඨියා අත්තදිට්ඨියා. අයං භූමි, යෙ කිලෙසා පහාතබ්බා, තෙ අප්පහීයන්ති. අනිද්දිට්ඨාපි භගවතා සස්සතදිට්ඨි ච උච්ඡෙදදිට්ඨි ච, සා පරියන්තදිට්ඨි ච. යා අපරියන්තදිට්ඨි ච, සා සස්සතදිට්ඨි ච, යා උච්ඡෙදදිට්ඨි සා නත්ථිකාදිට්ඨි. යා සස්සතදිට්ඨි, සා අකිරියදිට්ඨි, ඉදං වෙවචනං.

11. තත්ථ කතමා පඤ්ඤත්ති: තණ්හා සංයොජනපඤ්ඤත්තියා පඤ්ඤත්තා, මග්ගො පටිලාභපඤ්ඤත්තියා පඤ්ඤත්තො. ඉන්ද්‍රියා පටිලාභපඤ්ඤත්තියා පඤ්ඤත්තාති.

12. තත්ථ කතමො ඔතරණො: සක්කායො දුක්ඛං දස්සනා පහාතබ්බා[1]. සමුදයො මග්ගො ඉන්ද්‍රියානි තානි ච නිද්දිට්ඨානි ඛන්ධධාතු-ආයතනෙසු.

13. තත්ථ කතමො සොධනො හාරො: යදත්ථි ආරබ්භ භගවතා ඉදං සුත්තං භාසිතං, සො ආරම්භො[2] නිද්දිට්ඨො.

15. තත්ථ කතමො පරික්ඛාරො: නාමරූපස්ස හෙතු පච්චයොපි විඤ්ඤාණං හෙතු බීජං. තෙන අවිජ්ජා ච සඞ්ඛාරා ච පච්චයො. නිවත්තන්තියො[3] න අපරො පරියායො සබ්බභවො, යෙ ච සබ්බ-භවස්ස හෙතු පරභණ්ඩපච්චයො, (?) ඉති සම්මාදිට්ඨියා[4] පරතො ච ඝොසො යොනිසො ච මනසිකාරො පච්චයො. යා පඤ්ඤා උප්පාදෙති. එසා හෙතු සම්මාදිට්ඨියා, සම්මාසඞ්කප්පො භවති, යා සම්මාසමාධි. අයං පරික්ඛාරො.

16. තත්ථ කතමො සමාරොපනො: 'අයමහමස්මී'ති අසමනුපස්සී දුක්ඛතො රොගතො -පෙ- (පන්නරස පදානි.)

## 7 - 7

"සීලානි භන්තෙ, කිමත්ථියානි කිමානිසංසානී? සීලානි ආනන්ද, අවිප්පටිසාරත්ථානි" යාව විමුත්ති.

තත්ථ දුවිධො අත්ථො: පුරිසත්ථො ච වචනත්ථො ච.

තත්ථ කතමො පුරිසත්ථො: යායං න පච්ඡානුතාපිතා, අයං අවිප්පටිසාරො, අයං පුරිසත්ථො. යථා කොචි බ්‍රූහයති ඉමමත්ථ මාසෙවති සො භණෙය්‍ය, 'කිඤ්චි මමෙත්ථ අධීනං තස්සත්ථාය ඉදං කිරියං ආරභාමී'ති. අයං පුරිසත්ථො.

---

1. දස්සනප්පහාතබ්බා - මජසං. / දස්සනපහාතබ්බා - PTS.
2. ආරබ්භ - මජසං, PTS.
3. නිවත්තිතයො - මජසං.
4. සම්මාදිට්ඨි - මජසං, PTS.

10. එහි ' වේවචන ' කවරැ : සත්කායදෘෂ්ටියට ආත්මදෘෂ්ටියට යම් මේ භූමියක් ඇද්ද, යම් ක්ලේශ කෙනෙක් ප්‍රහීණ කළ යුත්තාහු ද, ඔහු ප්‍රහීණ නොවෙත්. (?) (අනිද්දිට්ඨාපි භගවතා . . . . සා අකිරියදිට්ඨී ? ව්‍යාකුල තැනෙකි) මේ වේවචන යි.

11. එහි ' පඤ්ඤත්ති ' කවරැ : තණ්හාව සංයොජනපඤ්ඤත්තියෙන් පනවන ලදු, මාර්ගය ප්‍රතිලාභපඤ්ඤත්තියෙන් පනවනලද. ඉන්ද්‍රියයෝ ප්‍රතිලාභපඤ්ඤත්තියෙන් පනවන ලදහු යැ.

12. එහි ' ඔතරණ ' කවරෙ යැ : සත්කායය දුඃඛසත්‍ය යැ, දර්ශනයෙන් ප්‍රහීණ කළයුත්තේ යැ. සමුදය ද මාර්ගය ද ඉන්ද්‍රියයෝ ද ස්කන්ධ ධාතු ආයතනයන්හි ලා දක්වනලද්දහු යි.

13. එහි ' සොධනහාර ' කවරෙ යැ : යම් කරුණක් අරබයා භාග්‍යවතුන් විසින් මේ සූත්‍රය වදරන ලද ද, ඒ (දනගනු කැමැති අර්ථ සංඛ්‍යාත) ආරම්භය දක්වන ලදි.

15. එහි ' පරික්ඛාර ' කවරෙ යැ : නාමරූපයට විඥානය හේතු ද ප්‍රත්‍යය ද වෙයි. (තණ්හා සංඛ්‍යාත) බීජය හේතු යැ, එහෙයින් අවිද්‍යාව ද සංස්කාරයෝ ද ප්‍රත්‍ය ය,. (නිබත්තනියො . . . . පරභණ්ඩපච්චයො ?) මෙසේ සම්මාදිට්ඨියට පරතොඝොසය ද යොනිසොමනසිකාරය ද ප්‍රත්‍යය වෙයි. යම් ප්‍රඥවක් උපදවා ද, තෙල ප්‍රඥව සම්මා දිට්ඨියට හේතු යැ, එයින් සම්මාසංකප්ප උපදී. (යා සම්මාසමාධි ?) මේ පරික්ඛාර යි.

16. එහි ' සමාරොපන ' කවරෙ යත් : '' මේ මම් වෙමි '' දෘෂ්ටිවශයෙන් නො දක්තේ දුක්ඛ වශයෙන් රොග වශයෙන් දකී. (පසළොස් පදයෝ දක්විය යුත්තාහු ය .)

7 — 7.

''ස්වාමීනි, (කුශල) ශීලයෝ කුමක් අර්ථ කොට ඇත්තාහු ද ? කුමක් අනුසස් කොට ඇත්තාහු ද ? ආනන්දය, ශීලයෝ අවිප්‍රතිසාරය අර්ථ කොට ඇත්තාහු යැ.'' විමුක්තිය දක්වා විස්තර යි. (දසකඞ්ගුත්තරයෙහි සූත්‍රය.)

එහි පුරුෂාර්ථය ද වචනාර්ථය දැයි අර්ථය දෙවැදෑරුම් වෙයි.

එහි පුරුෂාර්ථ කවරෙ යැ ; යම් මේ පසුවැ නො තැවෙනබවක් ඇද්ද, මේ අවිප්පටි සාර යැ, මේ පුරුෂාර්ථ යි. යම්සේ කිසිවෙක් (යමක්) වඩා ද, මේ අර්ථය ආසෙවන කෙරේ ද, හෙතෙම මෙසේ කියන්නේ යැ : ' මෙහි ලා කිසිවක් මා අයත් වේ ද, ඒ සඳහා මේ ක්‍රියාව ආරම්භ කෙරෙමි යි, මේ පුරුෂාර්ථ යි.

තත්ථ කතමො වණ්ණනත්ථො: සීලානි කායිකං වා වාචසිකං වා සුචරිතං. අවිප්පටිසාරොති තත්ථ සීලස්ස වතස්ස ච භාසො යෙව අනඤ්ඤා සුකතකම්මතා සුචරිතං, අයං අවිප්පටිසාරො. එවං යාව විමුත්තීති එකමෙකස්මිං පදෙ ද්වෙ අත්ථා, පුරිසත්ථො ච වචනත්ථො ච. යථා ඉමම්හි සුත්තෙ එවං සබ්බෙසු සුත්තෙසු. ද්වෙ ද්වෙ අත්ථා. පරමත්ථො[1] උත්තමත්ථො ච.

යං නිබ්බානසච්ඡිකං නිස්සාය යං සතං සච්ඡිකාතබ්බං භවති, සො වුච්චති කතත්තබ්බස්ස කතාති[2]. අයං පුන වෙවචනං සම්පජානාති. ඉමිනා නියුත්තත්ථමභිලබ්භන්ති වචනත්ථො.

තත්ථ යං අත්ථං සාවකො අභිකඞ්ඛති, තස්ස යො පටිලාභො, අයං පුරිසත්ථො. යං යං භගවා ධම්මං දෙසෙති, තස්ස තස්ස ධම්මස්ස යා අත්ථවිඤ්ඤත්ති, අයං අත්ථො.

තත්ථ සීලානං අවිප්පටිසාරෙ අත්ථොපි ආනිසංසොපි. එසො ච ආනිසංසො යං දුග්ගතිං න ගච්ඡති, යථා තං භගවතා.[3]

"එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ.

න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී" අයං අත්ථො.

යං පුරිසො භාවනාභූමියං සීලානි ආරබ්භ සීලෙන සංයුත්තො හොති, එවං යාව විමුත්ති යථා[4] සීලක්ඛන්ධො.

තත්ථ යො ච අවිප්පටිසාරො අනුසයවසෙන නිද්දිට්ඨො, තං ච සීලං, අයං සීලක්ඛන්ධො. පාමොජ්ජපීතිපස්සද්ධීති ච සමාධින්ද්‍රියෙන, අයං සමාධික්ඛන්ධො. යං සමාහිතො යථාභූතං පජානාති, අයං පඤ්ඤාක්ඛන්ධො. ඉමෙ තයො ඛන්ධා සීලං සමාධි පඤ්ඤා ච.

තථා සීලං පරිපූරෙතී යං විරියින්ද්‍රියං තෙන කාරණෙන සො සීලං පරිපූරෙති, අනුප්පන්නස්ස ච අකුසලස්ස අනුප්පාදාය වායමති. උප්පන්නස්ස ච පහානාය. අනුප්පන්නස්ස ච කුසලස්ස උප්පාදාය, උප්පන්නස්ස ච කුසලස්ස භිය්‍යොභාවාය, ඉති විරියින්ද්‍රියං නිද්දිට්ඨං. තත්ථ යො සමාධික්ඛන්ධො, ඉදං සමාධින්ද්‍රියං. පඤ්ඤාක්ඛන්ධො පඤ්ඤින්ද්‍රියං. තං චතූසු සම්මප්පධානෙසු දට්ඨබ්බං. තථා යො අනුප්පන්නස්ස ච අකුසලස්ස අනුප්පාදාය වායමති, ඉදං පඨමං සම්මප්පධානං. යං උප්පන්නස්ස ඉදං දුතියං, චත්තාරි සම්මප්පධානානි චතූසු ඣානෙසු පස්සිතබ්බානි. තථා සීලක්ඛන්ධෙන නෙක්ඛම්මධාතු ච ආදිකා.[5]

තයො ච විතක්කා නෙක්ඛම්මවිතක්කො අබ්‍යාපාදවිතක්කො අවිහිංසාවිතක්කො ච සාධාරණභූතා යා පීතායමානස්ස පාමොජ්ජෙන ඉදං කායිකං සුඛං ආහිතං අතියමීති පෙමෙන? ඉදං දුක්ඛං. යො තත්ථ අවික්ඛෙපො, අයං සමාධි. ඉදං පඤ්චඞ්ගිකං පඨමං ඣානං,

1. අයං හි පරමත්ථො – මජසං.
2. කතස්ස කතත්ථොති – ම.
3. භගවා – මජසං, PTS.
4. තථා – මජසං, PTS.
5. අධිකා – මජසං.

එහි චචනාර්ථ කවරෙ යැ : සීලයෝ නම් : කායික හෝ වාචසික හෝ සුචරිත යැ. ' අවිප්පටිසාර ' යනු : එහි ශීලයාගේ ද ව්‍රතයාගේ ද භාසය (දීප්තිය ?) මැ යැ, අනෙකක් නො වේ. සුකෘත කර්ම ඇතිබව සුචරිත යැ, මේ අවිප්පටිසාර යි. මෙසෙ ' විමුත්ති ' යනු දක්වා එකෙකි පදයෙහි පුරුෂාර්ථ ද චචනාර්ථ දූයි අර්ථයෝ දෙදෙනෙක් වෙති. මේ සූත්‍රයෙහි යම් සේ ද, එපරිද්දෙන් සියලු සූත්‍රයන්හි පරමාර්ථ ද උත්තමාර්ථ දූයි දෙ දෙ අර්ථයෝ වෙත්.

(යං නිබ්බානසච්ජිකං . . . . වචනත්ථො ? මුළු වාක්‍යය ම ව්‍යාකූලය. විමසන්නේ මැනැවි.)

එහි යම් අර්ථයක් ශ්‍රාවකා කැමැති වේ ද, ඔහුගේ යම් ප්‍රතිලාභයෙක් වේ ද, මේ පුරුෂාර්ථ යැ, බුදුහු යම් යම් දහමක් දෙසන සේක් ද, ඒ ඒ ධර්මයාගේ යම් අර්ථවිඥප්තියක් ඇද්ද, මේ අර්ථ යැ.

එහි ශීලයන්ගේ අවිප්‍රතිසාරය අර්ථ ද ආනිසංස ද වෙයි. තෙල ආනිසංසය ද දුගතියට නොයෙයි යන යමක් ඇද්ද එය යි. භාග්‍යවතුන් විසින් එය මෙසේ වදරන ලද :

" දන සීලාදි කුශල ධර්මය පරිචිත කල්හි තෙල අනුසස් වෙයි : ධර්මචාරී පුද්ගල නිරයාදි දුගතියට නො යේ යයි. මේ අර්ථ යි.

යම් හෙයකින් පුරුෂ භාවනාභූමියෙහි සිල් අරබයා සීලයෙන් යුක්ත වූයේ වේ ද, ශීල ස්කන්ධ යම්සේ ද එපරිදි විමුක්තිය දක්වා (විස්තර යි.)

එහි යම් අවිප්පටිසාරයෙක් අනුයය වශයෙන් දක්වන ලද ද, ඒ සීලය ද (අවිප්පටිසාර විසින් දක්වන ලදි. මේ ශීලස්කන්ධ යි. පාමොජ්ජ පීති පස්සද්ධි යනු ද සමාධීන්ද්‍රිය යෙන් (සංගෘහිත යැ.) මේ සමාධිස්කන්ධ යි. යම් හෙයෙකින් සමාහිත වූයේ තත්වාකාර යෙන් දූනගනී ද, මේ ප්‍රඥාස්කන්ධ යි. ශීල සමාධි පඤ්ඤා යන මේ තුන් ස්කන්ධයෝ යි.

එපරිද්දෙන් යම් විරියිඉන්ද්‍රියයක් ඇද්ද (එයින්) සිල් පුරයි. එ කරුණෙන් මෙ සිල් පුරයි : නූපන් අකුශලයාගේ නො ඉපැදීම පිණිස වැයම් කරයි, උපන් අකුශලයාගේ ප්‍රහාණය පිණිස ද නූපන් කුශලයාගේ ඉපැදීම පිණිස ද උපන් කුශලයාගේ බහුලභාවය පිණිස ද වැයම් කරයි. මෙසේ විරියින්ද්‍රිය දක්වන ලදි. එහි යම් සමාධිස්කන්ධයෙක් ඇද්ද මේ සමාධින්ද්‍රිය යි. ප්‍රඥාස්කන්ධය පඤ්ඤින්ද්‍රිය යි. එය සතර සම්‍යක්ප්‍රධාන යෙහි ලා දතයුතු. එසේ ම යමෙක් නූපන් අකුශලයාගේ නො ඉපැදීම පිණිස වැයම් කෙරේ ද, මේ පළමුවන සම්මප්පධාන යැ, උපන් අකුශලයාගේ . . . . මේ දෙවැන්න යැ. සතර සම්‍යක්ප්‍රධානයෝ සතර ධ්‍යානයන්හි දක්කයුත්තාහු යැ. එසේ මැ ශීලස්කන්ධ යෙන් නෙක්ඛම්මධාතුව ද ආදිය වේ.

නෙක්ඛම්මවිතක්ක යැ අව්‍යාපාදවිතක්ක යැ අවිහිංසාවිතක්කය දූයි සාධාරණ වූ තුන් විතර්කයෝ වෙති. (යා පියායමානස්ස . . . . ඉදං දුක්ඛං ?) එහි යම් අවික්ෂෙපයෙක් වේ ද මේ සමාධි යැ, මේ පඤ්චාංගික ප්‍රථමධ්‍යාන යි.

යා[1] චෙතසිකා පස්සද්ධි සවිතක්කං සවිචාරං විරොධානං.[2] යො කිලෙසො ච පරිදාහො, සො පඨමෙ ඣානෙ නිරුද්ධො. තත්ථ[3] යා ච කිලෙසපස්සද්ධි යා ච විතක්කවිචාරානං පස්සද්ධි, උභයෙපි එතෙ ධම්මෙ පස්සද්ධියං.[4] තත්ථ කායස්ස චිත්තස්ස ච සුඛං සුඛායනා, අයං පීතිසුඛිනො පස්සද්ධි, යොපි එකොදිභාවො චිත්තස්ස, තෙන එකොදිභාවෙන යං චිත්තස්ස අජ්ඣත්තං සම්පසාදනං, ඉදං චතුත්ථං ඣානඞ්ගං. ඉති අජ්ඣත්තං ච සම්පසාදො චෙතසො ච එකොදිභාවො පීති ච සුඛං ච, ඉදං දුතියං ඣානං චතුරඞ්ගිකං.

යො පස්සද්ධකායො සුඛං වෙදෙති, තෙන අභිසන්නෙන සුඛෙන ඵරිත්වා[6] සුඛං චෙතසිකං යං, සො පීතිවිතරාගො, එවං තස්ස පීතිවිතරාගතාය උපෙක්ඛං පටිලභති, සො පීතියා ච විරාගා උපෙක්ඛං පටිලභති, සුඛං ච පටිසංවෙදෙති, සති ච සම්මප්පඤ්ඤාය[7] පටිලභති, සචෙ සති එකග්ගතා, ඉදං පඤ්චඞ්ගිකං තතියං ඣානං.

යං සුඛිනො චිත්තං සමාධියති, අයං එකග්ගතාය පරවිධානො, විධානභාගියා[8] පඨමෙ ඣානෙ අත්ථි චිත්තෙකග්ගතා නො චක්ඛුස්ස වෙදනා, සබ්බං පාරිපූරිං ගච්ඡති. යථා චතුත්ථෙ ඣානෙ තථා යා උපෙක්ඛා පස්සම්භායං සතිසම්පජඤ්ඤං චිත්තෙකග්ගතා ච, ඉදං චතුත්ථං ඣානං.

යථා සමාධි දස්සයිතබ්බො[9] තථා පඤ්ඤින්ද්‍රියං තං චතුසු අරියසච්චෙසු පස්සිතබ්බං. යං සමාහිතො යථාභූතං පජානාති, සා පජානනා චතුබ්බිධා : අසුභතො අනිච්චතො දුක්ඛතො අනත්තතො ච, යදාරම්මණං තං දුක්ඛං අරියසච්චං, යං පජානන්තො නිබ්බින්දති විමුච්චති අයං මග්ගො[10] තථා යං කාමාසවස්ස පහානං භවාසවස්ස දිට්ඨාසවස්ස අවිජ්ජාසවස්ස, අයං නිරොධො, අප්පහීනභූමියං ආසවා සමුදයො[11] ඉමානි චත්තාරි අරියසච්චානි යථා පඤ්ඤින්ද්‍රියං පස්සිතබ්බං යථායං සමාහිතො යථාභූතං පජානාති, අයං දස්සනභූමි, සොතාපත්තිඵලං ච. යථාභූතං පජානන්තො නිබ්බින්දතීති ඉදං තනුකං ච කාමරාගබ්‍යාපාදං සකදාගාමිඵලං ච. යං නිබ්බින්දති විරජ්ජති, අයං පඨමජ්ඣානභාවනාභූමි ච රාගවිරාගා චෙතොවිමුත්ති අනාගාමිඵලං ච. යං විමුත්ති වුච්චති,[12] අයං අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්ති අරහත්තං ච.

---

1. තා – PPS.
2. විරොධනං – මජසං.
3. තථා – මජසං.
4. පස්සද්ධායං – මජසං, PTS.
5. ඉදං – මජසං, PTS.
6. චරිත්වා - PTS.
7. සම්මාපඤ්ඤාය – මජසං. / සමාපඤ්ඤාය – PTS.
8. පරාවිධානභාගියා – මජසං.
9. දස්සයිතබ්බං – මජසං, PTS
10. අයං මග්ගො – ඉති පොත්ථකෙසු නත්ථි
11. ආසවසමුදයො – මජසං, PTS.
12. විමුච්චති – මජසං.

යම් චෛතසික පස්සද්ධියක් ඇද්ද, සවිතර්ක වූ සවිචාර වූ (විරොධානං ?) පරිදහ වූ යම් ක්ලේශයෙකුත් ඇද්ද, එය ප්‍රථමධ්‍යානයෙහි නිරුද්ධ යැ. එහි යම් කිලෙසපස්සද්ධිය කුත් ඇද්ද විතක්ක විචාරයන්ගේ යම් පස්සද්ධියකුත් ඇද්ද, තෙල දහම් දෙක මැ පස්සද්ධි වේ. (?) එහි කායයාගේ ද චිත්තයාගේ ද යම් සුවයෙක් සුඛාකාරයෙක් ඇද්ද, මේ ප්‍රීතිසුඛ ඇත්තහුගේ පස්සද්ධි වෙයි. චිත්තයාගේ යම් එකොදිභාවයෙක් ඇද්ද ඒ එකොදිභාවය හේතු කොට චිත්තයාගේ අධ්‍යාත්මයෙහි යම් සම්ප්‍රසාදයෙක් වේ ද, මේ සතරවැනි ධ්‍යානාඞ්ග යැ, මෙසේ අධ්‍යාත්මයෙහි සම්ප්‍රසාදය ද චිත්තයාගේ එකොදිභාවය ද ප්‍රීතිය ද සුඛය ද යන මේ දෙවැනි ධ්‍යානය සතර අංගයෙන් ඇත්තේ යැ.

යමෙක් සැහැල්ලු වූ කය ඇතියේ සුව විඳී ද, ඒ අයිමාත්‍ර වූ සුඛයෙන් පැතිරැ යම් චෛතසික සුඛයක් විඳී ද, ඒ ප්‍රීතිවිරාගය යි. මේ මෙසේ ඒ ප්‍රීතිවිරාගතායෙන් උපෙක්ෂාව ලබයි. හේ ප්‍රීතියගේ ද විරාගයෙන් උපෙක්ෂාව ලබයි. කායික සුවය ද විඳී, සම්‍යක් ප්‍රඥායෙන් සමෘතිය ද ලබයි. (සවෙ යති එකග්ගතා ?) මේ පඤ්චාඞගික වූ තෘතීය ධ්‍යාන යි.

යම්මහයෙකින් සුව ඇතියහුගේ සිත සමාධියට යේ ද, මේ ඒකාග්‍රතායෙන් (පරාවිධානො විධානාභාගියා ?) ප්‍රථමධ්‍යානයෙහි චිත්තෙකාග්‍රතා ඇත, චක්ෂුස්හුගේ වෙදනා නො වේ. සියල්ල පිරිමට යෙයි. (?) චතුර්ථධ්‍යානයෙහි යම්සේ ද, එපරිද්දෙන් යම් උපෙක්ෂාවක් ඇද්ද, එය යටපත් නොකරමින් සතියම්පජඤ්ඤය ද චිත්තෙකග්ගතාව ද වේ. මේ චතුර්ථ ධ්‍යාන යි.

යම්සේ සමාධි දක්වියැයුත්තේ ද, එසෙයින් පඤ්ඤින්ද්‍රිය දක්වියැ යුතු. එය සතර ආයර්‍යසත්‍යයෙහි ලා දක්ක යුතු. සමාහිත වූයේ යම් දහමක් යථාභූත වැ දනගනී ද, ඒ පජානනය සිව්වැදෑරුම් වෙයි : අශුභවශයෙන් දුඃඛවශයෙන් අනිත්‍යවශයෙන් අනාත්ම වශයෙන් දුයි කියායි. යම් ආලම්බනයෙක් ඇද්ද, එය දුඃඛායර්‍යසත්‍ය යැ, යමක් දන ගනිමින් නිර්වෙදයට පැමිණේ ද විමුක්ත වේ ද, මේ මාර්ගසත්‍ය යැ, යම් කාමාස්‍රවයාගේ ප්‍රහාණයෙක් භවාසව – දිට්ඨාසව – අවිජ්ජාසවයාගේ ප්‍රහාණයෙක් ඇද්ද, මේ නිරොධ යැ, අප්‍රහීණභූමියෙහි ආස්‍රවයෝ සමුදයසත්‍ය යැ. මේ සතර ආයර්‍යසත්‍යයෝ යි. යම්සේ පඤ්ඤින්ද්‍රිය දක්කයුතු ද, යම්සේ මේ (පුද්ගල) සමාහිත වූයේ යථාභූත වැ දනගනී ද, මේ දර්ශනභූමි ද සොතාපත්තිඵලය ද වේ. යථාභූතව විදසුන් නැණින් දනගන්නේ නිර්වෙදයට පැමිණෙයි යන මෙය තුනී වූ කාමරාගව්‍යාපාදය ද සකදාගාමිඵලය ද වෙයි. නිර්වේදයට විරාගයට පැමිණෙයි යන මෙය ප්‍රථමධ්‍යාන භාවනාභූමි ද රාගවිරාගචෙතො විමුක්ති ද අනාගාමිඵල ද වෙයි. යමක් ' විමුක්ති ' යී කියනු ලැබේ ද, මේ අවිජ්ජා විරාග පඤ්ඤාවිමුක්ති ද රහත් ඵල ද වේ.

ඉමෙ අවිප්පටිසාරා ච විරියින්ද්‍රියං ච චත්තාරො සම්මප්පධානා අවිප්පටිසාරා, තං ච උපරි යාව සමාධි, ' එවං තෙ චත්තාරි ඣානානි සමාධින්ද්‍රියං ච, යං සමාහිතො යථාභූතං පජානාති. ඉමෙ චත්තාරො සතිපට්ඨානා සීලපාරිපූරිමුපාදාය වාගසංහිතෙන ච නිබ්බෙධිකානං ච නිමිත්තානං අනාවිලමනා,[1] ඉදං සතින්ද්‍රියං චත්තාරො සතිපට්ඨානා. යං පුන ඉමාය ධම්මදෙසනාය තීසු ඨානෙසු දිට්ඨාගමනකින්ද්‍රියං කිලෙසපහානෙන ච සෙක්ඛසීලං, ඉදං සද්ධින්ද්‍රියං චත්තාරි ච සොතාපත්තියඞ්ගානි එලානි. සමාධින්ද්‍රියානි සොපතියාහාරිනී සබ්බසුතෙසු නිද්දිසිතබ්බානි යං ඣානං පටිලභනං විරියගහිතං යෙව සඤ්ඤං පටිස්සරතො, අයං සුතමයී පඤ්ඤා යො සමාධි පුබ්බාපරනිමිත්තාභාසො අනොමගතිතාය යථාකාමො, අයං චින්තාමයී පඤ්ඤා. යං තථා සමාහිතො යථාභූතං පජානාති, අයං භාවනාමයී පඤ්ඤා. අයං සුත්තනිද්දෙසො.

ඉමං සුත්තං නිබ්බෙධභාගියං බුජ්ඣිතාරධිකං බුජ්ඣිතබ්බං. යෙහි අඞ්ගෙහි සමන්නාගතා[2]. තං බුජ්ඣිස්සනාති තස්ස අඞ්ගානි බුජ්ඣිස්සනාති, තෙන බොජ්ඣඞ්ගා. තථා ආදිතො යාව සීලං චතං චෙතනා කරණීයා, තිස්ස සීලානි පරිපූරෙති.

අනුප්පන්නස්ස ච අකුසලස්ස අනුප්පාදාය උප්පන්නස්ස ච අකුසලස්ස පහානාය අනුප්පන්නස්ස කුසලස්ස උප්පාදාය උප්පන්නස්ස ච කුසලස්ස භීයොභාවාය, ඉදං විරියං තස්ස තස්ස බුජ්ඣනකස්ස අඞ්ගන්ති. අයං විරියසම්බොජ්ඣඞ්ගො. ඉමිනා විරියෙන ද්වෙ ධම්මා ආදිතො අවිප්පටි-සාරො පාමොජ්ජඤ්ච යා පුන පීති අවිප්පටිසාරපච්චයා පාමොජ්ජපච්චයා, අයං පීතිසම්බොජ්ඣඞ්ගො, ' යං පීතිමනස්ස කායො පස්සම්භති, අයං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො. තෙන කායිකසුඛමානීතං යං සුඛිනො චිත්තං සමාධියති, අයං සමාධිසම්බොජ්ඣඞ්ගො. යං සමාහිතො යථාභූතං පජානාති අයං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො. යා සීලමුපාදාය පඤ්චන්නං බොජ්ඣඞ්ගානං උපාදායානුලොමතා නිමිත්තායනා පීතිභාගියානං ච විසෙසභාගියානං ච අපිලාපනතාසහගතා හොති, අනවමග්ගො අයං සතිසම්බොජ්ඣඞ්ගො. යං යථාභූතං පජානාති අච්චාරද්ධවිරියං කරෙති, උද්ධච්චභූමිති කත්වා අභිපත්ථිතං පෙසෙති, කොසජ්ජභූමිති ගරහිතො රහිතෙහි අඞ්ගෙහි බුජ්ඣති යං චක්ඛුසම්පථං, සා උපෙක්ඛාති. තෙන සා උපෙක්ඛා තස්ස බොජ්ඣඞ්ගස්ස අඞ්ගන්ති කරිත්වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගොති වුච්චතෙ, එසො සුත්තනිද්දෙසො.

1. තත්ථ කතමා දෙසනා[3]: අස්මිං සුත්තෙ චත්තාරි අරියසච්චානි දෙසිතානි.

2. තත්ථ කතමො විචයො: "සීලවතො අවිප්පටිසාරො" නාව විභූතති, ඉමිස්සාය පුච්ඡාය මීතිකිමත්ථස්සමීති'? ද්වෙ පදානි පුච්ඡා, ද්වෙ පදානි විසජ්ජනානි, ද්වීහි පදෙහි ද්වෙ අභිඤ්ඤා ද්වීහි චෙව පදෙහි විසජ්ජනා, කිං පුච්ඡති, නිබ්බාධිකං කායභූමිං[4]. තම්මස්ස තථා හි පතිට්ඨා ච අසෙක්ඛ ධම්මෙ උප්පාදෙති.

---

1. ආවිලමනා – PTS.
2. සමන්නාගතං – මජ්සං, PTS.
3. දෙසනා කතමං – PTS.
4. කායභූමි – PTS.

**මෙ අවිප්පටිසාරයෝ ද විරියින්ද්‍රිය ද සතර සම්‍යක්ප්‍රධානයෝ ද, අවිප්පටිසාරයෝ යි. එ ද මතුයෙහි සමාධිය දක්වා වෙයි. (ඉමෙ අවිප්පටිසාරා ච . . . එසො සුත්තනිද්දෙසො ? මෙහි දක්වන විස්තරය බෙහෙවින් ආකුලව ඇත. විමසන්නේ මැනැවි.)**

මේ අප්පටිසාරයෝද, විරිය ඉන්ද්‍රිය ද, සතර සම්ප්‍රදානයෝද, අප්පටිසාරයෝම වෙති. එය මත්තෙහි සමාධිය දක්වා වේ. මෙසේ ඒ ධ්‍යාන සතරද සමාධි ඉන්ද්‍රිය ද, සන්සිඳුනා වූ යමක් වේ ද එයද යථා පරිද්දෙන් දැන ගන්නේය. මේ සතර සතිපට්ඨානයෝ ශීලය සම්පූර්ණ කිරීමේ සිට පරිත්‍යාගයෙන් යුක්ත වූවන්ට ද, තියුණු අවබෝධයෙන් යුක්ත වූවන්ට ධ නිමිති වූ නොකැලැල් සිත් ඇත්තේමය. මේ සතින්ද්‍රියයෙහි සතර සති පටඨාන යයි. මේ ධර්ම දේශනාවෙන්, යමක් වනාහී ත්‍රිවිධ ස්ථානයන්හි ඉන්ද්‍රිය කෙලෙස් ප්‍රහාණයෙන් ශෛක්‍ෂ ශීලය වඩාද මෙය සද්ධා ඉන්ද්‍රිය වේ. සෝතාපත්ති අංග සතරෙහි ඵලයෝය. සමාධි ඉන්ද්‍රිය සියළු සූත්‍රයන්හිත් නිර්දේශ කර දක්වන ලද්දේ වෙයි. යම් ධ්‍යානයක් ලබන්නේ වීර්යයෙන් ගන්නා ලද ඥාණයම ශ්‍රැතමය ප්‍රඥාව වේ. පූර්වාපර නිමිති නමැති ආලෝකයෙන් යම් සමාධියක් කැමති පරිදි ලබන්නේ ද එය ලාමක නොවන ගති ඇත්තේය. මෙය චින්තාමය ප්‍රඥාව හෙවත් සිතීමෙන් ඇති කරගන්නා වූ නුවණය. එසේ සන්සිඳුනු සිතින් යමක් ඇති පරිද්දෙන් දැන ගන්නේ ද මෙය භාවනාමය ප්‍රඥාවයි. මෙය සූත්‍රවල දක්වා ඇති ආකාරයයි.

මේ සූත්‍ර ධර්මය තියුණු අවබෝධ ඇති, අවබෝධ කර ගැනීමෙහි සමත් ඇත්තන් විසින්ම අවබෝධ කරගත යුතුයි. යම් අංගයන්ගෙන් යුක්ත වූ එය අවබෝධ කර ගන්නහු ද එහි කොටස් අවබෝධ කර ගන්නහු ද එය බෝධි අංග නම් වේ. එසේ මුල සිට සීලය දක්වා සිතිවිල්ල කළ යුතුය. ආදියේ පටන් සීල චේතනා පුහුණු නො කරන්නේ නම් කෙසේ සිල් පිරෙන්නේද
නූපන්නා වූ අකුසලයන්ගේ නො ඉපදීම පිණිසද, උපන්නා වූ අකුසලයන් ගේ ප්‍රහාණය පිණිසද, නූපන්නා වූ කුසලයන්ගේ ඉපදීම පිණිසද, උපන්නා වූ කුසලයන් ගේ වැඩි දියුණුව පිණිසද, මේ වීර්යය ය අවබෝධ කරගන්නා ගේ අංගයෝ වෙති. මේ වීර්යය බෝධි අංගයයි. මෙම වීර්යයෙන් විපිළිසරට පත් නොවීම ද ප්‍රමුදිත බවද මුල සිටම පවත්නේමය.

විපිළිසරට පත් නොවීමෙන් හා ප්‍රමුදිත බවින් යුක්තවේ ද එය ප්‍රීති සම්බෝධි අංගයයි. යම් ප්‍රීති සහගත වූ මනසකින් සන්හුන් වේ ද නිවියේද මේ පස්සද්ධි බෝධි අංගයයි. ඔහු විසින් ශාරීරික සුවය එළවන ලද්දේද සැපවත් වූ සන්සුන් වූ සතකින් යුත්ත වේ ද එය සමාධි බෝධි අංගයයි. සමාහිත වූ සිතක් ඇති තැනැත්තේ එය යථා පරිදි දැන ගනී ද මේ ධම්මවිචය බෝධ්‍යංගයයි. සීලයේ පටන් බෝධි අංග පහක් දක්වා ගැලපෙන නිමිති ග්‍රහණය කරන්නන්ගේ ද, ප්‍රීතියෙන් යුත්ත වන්නන්ගේ ද විශේෂතාවයන්ගෙන් නො ඉලිප්පෙන ස්වභාවයක් වේද, නොමගට නොයමක් වේද, මෙය සති බෝධි අංගයයි. යමක් ඇති පරිද්දෙන් දැනගනු ලබන්නේද දැඩි වීර්යයෙන් ක්‍රියාත්මක කරන්නේද, උද්ධච්ච භූමිය සඳහා ප්‍රාර්ථනා කරන ලද්දේද එම ප්‍රාර්ථනා වෙන කොසජ්ජ භූමිය ගර්හා කරන ලද්දේද වේ. චක්ඛු සම්පස්සජයෙන් යමක් අවබෝධ කර ගනීද එය උපේක්‍ෂාවයි. එයින් එම උපේක්‍ෂාව නම් වූ බෝධි අංගයෙහි කොටසක් ලෙස ගෙන උපෙක්ඛා බෝධි අංගයයි කියන ලදි. මෙය සූත්‍ර නිර්දේශයයි.

**මෙම කොටස බුද්ධජයන්ති ත්‍රිපිටක පළමුවන මුද්‍රණයේ දී සිංහලට පරිවර්තනය කර නොතිබිණි. මෙම කොටස බෞ. සං. ම. මගින් බුද්ධජයන්ති ත්‍රිපිටක පුනර්මුද්‍රණය සඳහාම පරිවර්තනය කර ඇතුළත් කරන ලදි.**

**1. එහි ' දේසනා ' කවර : මේ සූත්‍රයෙහි සතර ආර්‍ය්‍යසත්‍යයෝ දෙසනලද්දාහු යැ.**

**2. එහි ' විචය ' කවරෙ යැ : ' සිල්වත්හට අවිප්පටිසාරය වෙයි, විමුක්තිය යනු දක්වා විස්තර යැ. මේ පුච්ඡායෙහි (මිනි කිමත්ථස්ස මීති ?) පුච්ඡා පද දෙකෙකි, විසඳුම් පද දෙකෙකි. දෙපදයෙකින් දතයුතු දෙයෙකි, දෙපදයෙකින් විසඳුම් වෙති. කුමක් පුළුවුයි යැ යත් : කර්මයාගේ නිර්බාධ වූ කායභූමිය විචාරයි. ඒ එසේ මැ යැ. අශෛක්‍ෂ ධර්මයෙහි ප්‍රතිෂ්ඨාව ද උපයයි.**

3. තත්ථ කතමා යුත්ති: "සීලවතො අවිප්පටිසාරෙ භවති", කිං නිච්ඡන්දස්ස ච විරාගො අත්ථි, එසා යුත්ති.

4 තත්ථ කතමං පදට්ඨානං: විරියං[1] විරියින්ද්‍රියස්ස පදට්ඨානං. සමාධි සමාධින්ද්‍රියස්ස පදට්ඨානං.

5. තත්ථ කතමො, ලක්ඛණො: සීලක්ඛන්ධෙ වුත්තෙ සබ්බෙ තයො ඛන්ධා වුත්තා භවන්ති සීලම්හි වුත්තෙ සෙසධම්මානං සීලං හෙතු ච පච්චයො ච, තෙ සබ්බෙ ධම්මා වුත්තා හොන්ති, එකම්හි බොධිපක්ඛියධම්මෙ වුත්තෙ සබ්බෙ බොධඞ්ගමනීයා[3] ධම්මා වුත්තා භවන්ති.

6. තත්ථ කතමො චතුබ්‍යූහො හාරො: ඉමස්මිං[4] සුත්තෙ භගවතො කො අධිප්පායො: යෙ අවිප්පටිසාරෙන ඡන්දිකා තෙ සීලපාරිපූරී භවන්ති, පාමොජ්ජච්ඡන්ද[5] අවිප්පටිසාරී පාරිපූරී. අයං එත්ථ භගවතො අධිප්පායො. -පෙ- අයං චතුබ්‍යූහො හාරො.

7. තත්ථ කතමො ආවට්ටො: ඉදං සුත්තං නිබ්බෙධභාගියං, යො නිබ්බෙධො අයං නිරොධො, යෙන නිබ්බින්දති, සො මග්ගො, යං නිරුජ්ඣති, තං දුක්ඛං, යං නිබ්බෙධගාමිනා මග්ගෙන පහීයති, සො සමුදයො, අයං ආවට්ටො.

8. තත්ථ කතමා විභත්ති: "සීලවතො අවිප්පටිසාරො"ති විභජ්ජ බ්‍යාකරණීයං, පරමසන්තස්ස නත්ථි අවිප්පටිසාරො, යාව දෙසන්තං කායෙන වා වාචාය වා අකුසලං ආරභති, කිඤ්චි'පිස්ස එවං හොති, සුකතං එතං සුචරිතං එතං නොච'ස්ස තෙන අවිප්පටිසාරෙන පාමොජ්ජං ජායති, යාව විමුත්ති, තස්ස සීලවතො අවිප්පටිසාරොති විභජ්ජබ්‍යාකරණීයං, අයං 'විභත්තිහාරො'.

9. තත්ථ කතමො පරිවත්තනො[6]: ඉමෙහි සත්තහි උපනිස්සය සම්පත්තීහි එකාදස උපනිසා විභත්තියං පජහන්ති, අයං පරිවත්තනො.[6]

10. තත්ථ කතමො වෙවචනො[8]: ඉමෙසං අරියධම්මානං බල බොජ්ඣඞ්ගවිමොක්ඛසමාධිසමාපත්තීනං ඉමානි වෙවචනානි.

11. තත්ථ කතමා පඤ්ඤත්ති: සීලවතො අවිප්පටිසාරොති සීලක්ඛන්ධො[9] නෙක්ඛම්මපඤ්ඤත්තියා පඤ්ඤත්තං, නිස්සජ්ජපඤ්ඤත්ති ච* එවං දස අඞ්ගානි ද්වීහි ද්වීහි අඞ්ගෙහි පඤ්ඤත්තානි.

---

1. විරියං - මජසං.
2. සීලං වුත්තෙ - PTS.
3. බොධඞ්ගමනීයා - PTS
4. ඉමම්හි - PTS.
5. -- ඡන්දිකා - PTS.
6. පරිවත්තනා - P.T.S
7. උපනිස්සාය - PTS.
8. වෙවචනා - PTS.
9. සීලක්ඛන්ධෙ - PIS.

* පුප්ඵලක්ඛණන්තරිතභාගො ඡට්ඨසංගීතිකාරකානං පොත්ථකෙ නදිස්සති.

3. එහි ' යුක්ති ' කවර : සිල්වත්හට අවිප්පටිසාරය වෙයි, කිම නිච්ඡන්ද වූවහුට විරාගය ඇද්ද, තෙල යුත්ති යැ.

4. එහි ' පදට්ඨාන ' කවරෙ යැ : වීර්‍ය්‍යය විරියින්ද්‍රියට පදට්ඨාන යැ, සමාධිය සමාධින්ද්‍රියට පදට්ඨාන යැ, ප්‍රඥව පඤ්ඤින්ද්‍රියට පදට්ඨාන යැ, වීර්‍ය්‍යය අද්වෙසයට පදට්ඨාන යැ, සමාධිය අලොභයට පදට්ඨාන යැ, ප්‍රඥව අමොහයට පදට්ඨාන යැ, විරියින්ද්‍රිය සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව යන තුන් මාර්ගාඞ්ගයන්ට පදට්ඨාන යැ, සමාධින්ද්‍රිය සම්මාසංකප්ප සම්මාවායාම සම්මාසමාධි යන තුන් මාර්ගාඞ්ග යන්ට පදට්ඨාන යැ, පඤ්ඤින්ද්‍රිය සම්මාසති සම්මාදිට්ඨි යන දෙ මාර්ගාඞ්ගයන්ට පදට්ඨාන යි.

5. එහි ' ලක්ඛණ ' කවරෙ යැ : ශීලස්කන්ධය කී කල්හි සියලු තුන් ස්කන්ධයෝ කියන ලද්දහු වෙති, ශීලය කී කල්හි ශේෂ ධර්මයන්ට ශීලය හේතු ද ප්‍රත්‍යය ද වෙයි, (එහෙයින්) ඒ සියලු ධර්මයෝ කියන ලද්දහු වෙත්. එක් බොධිපාක්ෂික ධර්මයක් කී කල්හි සියලු මාර්ගඥන බෝධියට යන ධර්මයෝ කියනලද්දහු වෙත්.

6. එහි ' චතුබ්‍යූහ ' හාරය කවරෙ යත් : මේ සූත්‍රයෙහි ලා භාග්‍යවතුන් වහන්සේගේ අදහස කවරෙ යැ : යම් කෙනෙක් අවිප්පටිසාරයෙහි ඡන්දය ඇත්තාහු ද, ඔහු සිල් පූරන්නාහු වෙති, ප්‍රාමොද්‍යයෙහි ඡන්දය ඇත්තාහු අවිප්‍රතිසාරය පූරන්නාහු වෙත්. මේ මෙහි භාග්‍යවතුන් වහන්සේගේ අදහස යැ . . . . මේ චතුබ්‍යූහ හාර යි.

7. එහි ' ආවට්ට ' හාර කවරෙ යැ : මේ සූත්‍රය නිබ්බෙධභාගිය යැ, යම් නිර්වෙදයෙක් වේ ද මෙ නිරොධ යැ, යමක් හෙතු කොට නිර්වෙදයට යේ ද, ඒ මාර්ග යැ, යමක් නිරුද්ධ වේ ද ඒ දුඃඛ යැ, යමක් නිර්වෙදගාමී මාර්ගයෙන් ප්‍රහීණ වේ ද, හේ සමුදය යැ, මේ ආවට්ටහාර යි.

8. එහි ' විභත්ති ' කවර යත් : " සීලවතො අවිප්පටිසාරො " යනු විභාග කොට ප්‍රකාශ කළයුතු යැ, (දෘෂ්ටි විසින්) පරාමර්ශ කරන්නහුට අවිප්පටිසාරයෙක් නැත, යම්තාක් කයින් හෝ වචනයෙන් හෝ ද්වෙශසහගත අකුශලය අරඹා ද, එතෙකුදු වත් ඔහුට මේ සිත වෙයි, ' තෙල සුකෘත යැ තෙල සුචරිත යැයි.' ඔහුගේ ඒ අවිප්පටිසාරයෙන් ප්‍රාමොද්‍යය නො ද උපදී, විමුක්ති දක්වා විස්තර යි. ඒ සිල්වත්හට අවිප්පටිසාරය වෙයි යනු විභාග කොට පැවැසියැ යුතු. මේ ' විභත්තිහාර ' යි.

9. එහි ' පරිවත්තහාර ' කවරෙ යැ : මේ සත්වැදෑරුම් උපනිශ්‍රය සම්පත්තීන්ගෙන් එකොළොස් කරුණක් දුරුකෙරෙති, මේ ' පරිවත්තන ' හාර යි.

10. එහි ' වෙවචන ' කවරෙ යත් : මේ ආර්‍ය්‍යධර්ම වූ බල–බොජඣඞ්ග–විමොක්ඛ–සමාධි – සමාපත්තීන්ට මේ වෙවචනයෝ යි.

11. එහි ' පඤ්ඤත්ති ' කවර යත් : " සීලවතො අවිප්පටිසාරො " යි ශීලස්කන්ධය නෙක්ඛම්මපඤ්ඤත්තියෙන් පනවනලද, (නිස්සජ්ජපඤ්ඤත්ති ච ?) මෙසේ දස අඞ්ගයෝ දෙ දෙ අඞ්ගයෙකින් පනවනලදහ.

12. තත්ථ කතමො ඔතරණො: ඉදං නිබ්බෙධභාගියං සුත්තං පඤ්චසු ඔතිණ්ණං යථායං පඨමං නිද්දිට්ඨං එවං ඉන්ද්‍රියාදිඛන්ධධාතු-ආයතනෙසු නිද්දිසිතබ්බානි.

13. තත්ථ කතමො සොධනො හාරො: සීලවතො අවිප්පටිසාරොති න තාව සුද්ධො ආරම්භො, අවිප්පටිසාරිනො පාමොජ්ජන්ති න තාව සුද්ධො ආරම්භො, යානි එකාදස පදානි දෙසිතානි යදා, තදා සුද්ධො ආරම්භො, අයං සොධනො.

14. තත්ථ කතමො අධිට්ඨානො: සීලං වෙමත්තතාය පඤ්ඤත්තං, එවං දසපදානං.

15. සබ්බානි සීලක්ඛන්ධස්ස ආනිසංසො, තෙ ච පතිරූපදෙසවාසො ච පච්චයො. අත්තසම්මාපණිධානං[1] ච හෙතු සමාධික්ඛන්ධස්ස සුඛං හෙතු, පස්සද්ධි පච්චයො, යෙන ඣානසහජාති ච ඨානං හි ඣානඞ්ගා. අපරො පරියායො: කාමෙසු ආදීනවානුපස්සිතා සමාධිනො පච්චයො, නෙක්ඛම්මෙ ආනිසංසදස්සාවිතා හෙතු.

16. තත්ථ කතමො සමාරොපනො[2]: යං විරියින්ද්‍රියං සො සීලක්ඛන්ධො, යං සීලං තං[3] චත්තාරො සම්මප්පධානා[4] යං ධම්මානුධම්ම-පටිපත්ති සො පාතිමොක්ඛසංවරො.

## 7 - 8

යස්ස සෙලූපමං චිත්තන්ති ගාථා:

සෙලූපමන්ති උපමං යථා සෙලො වාතෙන න කම්පති න උණ්හෙන න සීතෙන සංකම්පති, යථා අනෙකෙ අචෙතනා තෙ උණ්හෙන මිලායන්ති, සීතෙන අවසුස්සන්ති, වාතෙන භිජ්ජන්ති, න එවං සෙලො, පඤ්ඤා පඤ්ඤින්ද්‍රියස්ස පදට්ඨානං. විරියං[5] අදොසස්ස පදට්ඨානං. සමාධි අලොභස්ස පදට්ඨානං, පඤ්ඤා අමොහස්ස පදට්ඨානං. විරියින්ද්‍රියං තිණ්ණං මග්ගඞ්ගානං පදට්ඨානං. සම්මාවාචාය, සම්මාකම්මන්තස්ස, සම්මාආජීවස්ස. සමාධින්ද්‍රියං තිණ්ණං මග්ගඞ්ගානං පදට්ඨානං: සම්මා-සඞ්කප්පස්ස සම්මාවයාමස්ස[6] සම්මාසමාධිනො. පඤ්ඤින්ද්‍රියං ද්වින්නං මග්ගඞ්ගානං පදට්ඨානං: සම්මාසතියා සම්මාදිට්ඨියා ච. යථා සෙලො සබ්බපච්චත්ථිකෙහි අහාරණීයො එවං තං චිත්තං සබ්බකිලෙසෙහි න කම්පතීති, අයං අමොහො. "විරත්තං රජනීයෙසූ"[7]ති අයං අලොභො. "කොපනෙය්‍යෙ[8] න කුප්පතී"ති අයං අදොසො. තත්ථ පඤ්ඤා අමොහො

1. සමාපණිධානං - PTS.
2. සමාරොපනා - PTS
3. තෙ - PTS.
4. ධම්මපධානා - PTS.
5. විරියං - මජ්සං.
6. සම්මාවාචාය - මජ්සං, PTS.
7. රජ්ජනීයෙ - PTS.
8. කුප්පනීයෙ - PTS.

12. එහි ' ඔතරණ ' කවරෙ යත් : මේ නිබ්බෙබධභාගිය සූත්‍ර යැ, පඤ්ච ධර්මයන්හි අවතීර්ණ යැ, යම්සේ මෙය පළමු නිර්දේශ කරනලද ද, එපරිදි ඉන්ද්‍රියාදියෙහි ද ඛන්ධ – ධාතු – ආයතනයන් ද දක්වියැ යුත්තාහ.

13. එහි ' සොධනහාර ' කවරෙ යැ : '' සීලවතො අවිප්පටිසාරො ' යී තව (දැනගනු රිසි අර්ථය නො නිමියෙන්) ආරම්භය ශුද්ධ නො වෙයි, '' අවිප්පටිසාරිනො පාමොජ්ජං '' යී තව ආරම්භය ශුද්ධ නො වෙයි, යම් එකොළොස් පදයෝ දෙසන ලද්දහු ද එකල්හි දැනගනු රිසි අර්ථ සංඛ්‍යාත ආරම්භය ශුද්ධ වේ. මේ ' සොධන ' හාර යි.

14. එහි ' අධිට්ඨාන ' හාර කවරෙ යැ : සීලය වෙමත්තතායෙන් පනවන ලද, මෙසේ දසපදයන්ගේ පඤ්ඤත්ති දතයුතු.

15. සියල්ල ශීලස්කන්ධයාගේ අනුසස් යැ, (තෙ ච ?) ඔවුනට පතිරූපදෙසවාසය ප්‍රත්‍ය යැ, ආත්මසම්‍යක්ප්‍රණිධානය හෙතු යැ. සමාධිස්කන්ධයට සුඛය හෙතු යැ, පස්සද්ධිය ප්‍රත්‍ය යැ. යම්හෙයෙකින් ධ්‍යානසහජාත වූ කාරණය මැ ධ්‍යානාඞ්ග වේ ද එහෙයිනි. අන් පරියායෙක් වෙයි : කාමයන්හි ආදීනව දක්නාබව සමාධියට ප්‍රත්‍යය වේ. නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස්දක්නා බව හේතු යි.

16. එහි ' සමාරොපණ ' කවරෙ යත් : යම් විරියින්ද්‍රියයෙක් ඇද්ද, හේ සීල ස්කන්ධ යැ, යම් සීලයක් ඇද්ද එය සතර සම්‍යක්ප්‍රධානයෝ යැ, යම් ධම්මානුධම්ම පටිපත්තියක් ඇද්ද, ඒ පාතිමොක්ඛසංවර යි.

## 7 – 8

'' යස්ස සෙලූපමං චිත්තං '' යන (උදාන) ගාථාව.

'' සෙලූපමං '' යි උපමා යැ, යම්සේ ශෛල පර්වතයෙක් වාතයෙන් නො සැලේ ද, උණුසුමින් නො තැවේ ද, සීතයෙන් නො හැකිළේ ද, අතිශයින් නො සැලේ ද, යම්සේ නොයෙක් අචෙතනයෝ උණුසුමින් මැලවෙත් ද සීතයෙන් හැකිළෙත් ද, ශෛලපර්වතය එසේ නො වේ. යම්සේ ශෛලය (වාතාදි) විරුද්ධ හෙතූන් විසින් නො මැඩලියැහේ ද, එසෙයින් ඒ (සෙලූපම) සිත සියලු කෙලෙසුන් විසින් නො සැලේ යන මේ අමොහ යැ, '' විරත්තං රජනීයෙසු '' යන මේ අලොභ යැ, '' කොපනෙය්‍යෙ න කුප්පති '' යන මේ

කුසලමූලං, අලොභො අලොභො යෙව, අදොසො අදොසො යෙව. ඉමෙහි තීහි කුසලමූලෙහි සෙක්ඛභූමියං ඨිතො අසෙඛමග්ගං[1] උප්පාදෙති. සෙඛභූමි සමත්තකම්මා[2] ධම්මෙ උප්පාදෙති, සා ච සම්මා විමුත්ති, යං ච විමුත්තිඤාණදස්සනං ඉමෙ දස අසෙඛානං[3] අරහතං[4] ධම්මා.

තත්ථ අට්ඨඞ්ගිකෙන මග්ගෙන චතුබ්බිධා භාවනාපි ලබ්භති: සීලභාවනා කායභාවනා චිත්තභාවනා පඤ්ඤාභාවනා ච. තත්ථ සම්මාකම්මන්තෙන සම්මාආජීවෙන ච කායො භාවිතො, සම්මාවාචාය සම්මාවායාමෙන ච සීලං භාවිතං. සම්මාසඞ්කප්පෙන සම්මාසමාධිනා ච චිත්තං භාවිතං. සම්මාදිට්ඨියා සම්මාසතියා ච පඤ්ඤා භාවිතා, ඉමාය චතුබ්බිධාය භාවනාය ද්වෙ ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති: චිත්තං පඤ්ඤා ච, චිත්තභාවනාය[5] සමථො පඤ්ඤාභාවනාය විපස්සනා.

තත්ථ පඤ්ඤා අවිජ්ජාපහානෙන චිත්තං උපක්කිලෙසෙහි අභිසඞ්-කතන්ති පඤ්ඤාභාවනාය චිත්තභාවනං යෙව පරිපූරෙති. එවං යස්ස සුභාවිතං චිත්තං කුතො නං දුක්ඛමෙස්සතීති. අපි ච ඛො පන තස්ස ආයස්මතො අබ්‍යාපාදධාතු අවිමුත්තා, න සො පෙතං සම්පත්තො තස්ස සඞ්ඛාපහාරං දෙති (?), සඞ්ඛාවිතක්කිතෙ සරීරෙ දුක්ඛං න වෙදියති. අයං සුත්තත්ථො.

1. තත්ථ කතමා දෙසනා: ඉමම්හි සුත්තෙ දස අසෙඛා[6] අරහත්ත-ධම්මා දෙසිතා, අප්පමාණා ච සමාධිභාවනා[7].

2. තත්ථ කතමො විචයො: සෙලූපමතා යෙ යෙ ධම්මා වෙදනීය සුඛදුක්ඛාපගතා, තෙ සබ්බෙ නිරූපං චානුපස්සන්තානං චූපගතො කායතො වෙදයිතපරික්ඛාරො අප්පවත්තිගො දුක්ඛං න වෙදියති.

3. තත්ථ කතමා යුත්ති: යස්සෙවං භාවිතං චිත්තං කුතො නං දුක්ඛමෙස්සතීති.

4. තීසු භාවනාසු දුක්ඛං නක්ඛමති චිත්තං චිත්තභාවනාය ච නිරොධභාවනාය ච ආනන්තරිකා සමාධිභාවනාය ච. ඉති "යස්සෙවං භාවිතං චිත්ත"න්ති සමාධි ඵලස්ස පදට්ඨානං.

5. තත්ථ කතමො ලක්ඛණො: "යස්සෙවං භාවිතං චිත්ත"න්ති චිත්තානි භාවිතානි යථා පඨමං නිද්දිට්ඨානි: පඤ්ඤා සීලං කායො චිත්තං. සීලම්පි සුභාවිතං කායිකචෙතසිකං ච ඨිතත්තා නානුපකම්පතීති වෙදනාපි තථා සඤ්ඤාපි සඞ්ඛාරාපි. කුතො නං දුක්ඛමෙස්සතීති සුඛම්පි නානුගච්ඡති, අදුක්ඛමසුඛම්පි නාගච්ඡන්ති.

---

1. අසෙක්ඛමග්ගං - ම.
2. සම්පත්තිකම්ම - මජසං. / සමත්තිකම්ම - PTS.
3. අසෙක්ඛානං - ම.
4. අරහත්තං - මජසං, PTS
5. චිත්තං භාවනාය - මජසං, PTS.
6. අසෙක්ඛා - මජසං, PTS.
7. සම්මාවිභාවනා - මජසං.

අදෙස යි. එහි ප්‍රඥව අමොහකුසලමූල යැ, අලොභය අලොභකුසලමූලය මැය, අදෙසය අදෙසකුසලමූල මැයි. මේ තුන් කුසල මූලයන්ගෙන් ශෛක්ෂභූමියෙහි සිටියේ අශෛක්ෂමාර්ගය උපදවයි. සෙබභූමිය ඉක්මවා ධර්මයන් උපදවයි. ඒ සම්මා විමුත්තිය ද යම් විමුක්තිරසඥනදර්ශනයෙක් වී නම් එ ද යන මේ දසය අශෛක්ෂ වූ රහතුන්ගේ ධර්මයෝ යි.

එහි අෂ්ටාඞ්ගිකමාර්ගයෙන් සීලභාවනා කායභාවනා චිත්තභාවනා පඤ්ඤාභාවනා ද යන සිව්වැදූරුම් භාවනා ද ලැබෙයි. එහි සම්‍යක් කර්මාන්තයෙන් ද සම්‍යගාජීවයෙන් ද කය භාවිත වෙයි, සම්‍යග්වචනයෙන් ද සම්‍යග්ව්‍යායාමයෙන් ද සීලය භාවිත යැ, සම්‍යක් සංකල්පයෙන් ද සම්‍යක්සමාධියෙන් ද චිත්තය භාවිත යැ, සම්මාදිට්ඨියෙන් ද සම්මාසති යෙන් ද ප්‍රඥව භාවිත යි. මේ චතුර්විධ භාවනායෙන් චිත්තය ප්‍රඥව ද යන ධර්මයෝ දෙදෙනා භාවනායෙන් පිරිමට යෙත්, චිත්තභාවනායෙන් සමථය ද පඤ්ඤාභාවනායෙන් විදර්ශනා ද වෙයි.

එහි ප්‍රඥව අවිද්‍යාප්‍රහාණයෙන් සිත උපක්ලේශයන්ගෙන් වෙන්කරනලද නුයි ප්‍රඥ භාවනායෙන් චිත්තභාවනාව මැ පරිපූරණය කෙරෙයි. මෙසේ යමක්හුගේ සිත මොනවට වඩනලද ද, කුමක් හෙයින් ඔහු කරා දුක පැමිණේ ද' යි, තවද ඒ ආයුෂ්මත්හට අව්‍යාපාද ධාතුව අවිමුක්ත යැ, හේ තෙල සමවතට නො සමවත් නමුදු ඔහුට (සඞ්බාපහාරං දෙති ?) තුවණින් දුන විතර්කිත වූ සිරුර ඇති කල්හි දුක් වෙදනා නො වෙ. මේ සූත්‍රාර්ථ යි.

1. එහි දෙයනා කවරැ : මේ සූත්‍රයෙහි දශ අශෛක්ෂ වූ අර්හත්වධර්මයෝ ද, අප්‍රමාණ වූ සමාධිභාවනා ද වදරනලද්දහු යැ.

2. එහි ' විචය ' කවරෙ යත් : ශෛලොපපමාබට ඇති යම් යම් ධර්ම කෙනෙක් වින්ද යුතු වූ සුවදුක් දෙකට පැමිණියාහු ද ඒ සියලු දහම්හු රූප නැත්තකු මෙන් දක්නවුන්ට කයින් වෙන්ව ගිය වෙදනාහෙතුව නො පවත්නා හෙයින් (?) දුක නො විඳී.

3. එහි ' යුත්ති ' කවරැ : යමක්හු විසින් මෙසේ සිත භාවිත ද කුමක් හෙයින් ඔහු කරා දුක පැමිණේ දැයි.

4. චිත්තභාවනා නිරොධ භාවනා ආනන්තරික සමාධි භාවනා ද යන තුන් භාවනා වන්හි චිත්තය දුක නො ඉවසයි. මෙසේ '' යසෙසවං භාවිතං චිත්තං '' යනු සමාධි ඵලයට පදට්ඨාන යි.

පළමු දුක්වූ පරිදි සිත් භාවිත වූවාහු පඤ්ඤ සීල කාය චිත්ත යන මේ වඩන ලද වෙයි. (සීලම්පි සුභාවිතං . . . . නාගච්ඡන්ති ?)

5. එහි ලක්ඛණ කවරෙ යැ; යස්සෙවං භාවිතං චිත්තං යනු,

6. තත්ථ කතමො චතුබ්‍යූහො හාරො : ඉධ භගවතො කො අධිප්පායො : යෙ දුක්ඛෙන අට්ටිතා[1] භාවිස්සන්ති තෙ එවරූපානි සමාපත්තීනි විහරිස්සන්ති[2]. අයමෙත්ථ භගවතො අධිප්පායො. යෙ ච අප්පසන්නා, තෙ හි[3] භවිස්සන්ති. පසන්නානං ච පීතිපාමොජ්ජං භවිස්සති, අයමෙත්ථ[4] භගවතො අධිප්පායො.

7. ආවට්ටොති : තත්ථ ආවට්ටනස්ස භූමි.

8. විභත්තීති : "යස්සෙවං භාවිතං චිත්තං කුතො නං දුක්ඛ-මෙස්සතී"ති දුවිධො නිද්දෙසො : දුක්ඛහෙතුනිද්දෙසො ච, පටිපක්ඛ-නිද්දෙසො ච. කො සො දුක්ඛහෙතු. යතො දුක්ඛං ආගච්ඡති. පටිපක්ඛනිද්දෙසො ච. කුතො එවරූපස්ස දුක්ඛං න ආගමිස්සතීති[5] නිද්දිට්ඨං.

9. පරිවත්තනොති : කුතො නං දුක්ඛමෙස්සතීති යං චෙතසිකං සුඛං අනුපාදිසෙසා අයං නත්ථි, සොපාදිසෙසා අයං අත්ථි. පුන එවමාහංසු : තං ඛණං තංමුහුත්තං උභයමෙව අවෙදයිතං සොපාදිසෙසං යං ච අනුපාදිසෙසං යං ච තං ඛණං තංමුහුත්තං අනුපාදිසෙසං යං ච සොපාදිසෙසං ච අවෙදයිතං. සුඛමාපන්නස්ස අනාවත්තිකානනි. අයමෙත්ථ විසෙසො. පරිවත්තනො.

10. තත්ථ කතමො වෙවචනො : යස්සෙවං භාවිතං චිත්තං වා භාවිතං සුභාවිතං අනුවසිතං වත්ථුකතං සුසමාරද්ධං. චිත්තන්ති මනො විඤ්ඤාණං මනින්ද්‍රියං මනොවිඤ්ඤාණධාතු.

11. තත්ථ කතමා පඤ්ඤත්ති : චිත්තං මනොසඞ්ඛාරා වූපසම-පඤ්ඤත්තියා පඤ්ඤත්තා[6], සමාධි අසෙඛපඤ්ඤත්තියා පඤ්ඤත්තො, දුක්ඛං උච්ඡින්නපඤ්ඤත්තියා පඤ්ඤත්තං

12. තත්ථ කතමො ඔතරණො : චිත්තෙන නිද්දිට්ඨෙන පඤ්චක්ඛන්ධා නිද්දිට්ඨා හොන්ති, අයං ඛන්ධෙසු ඔතරණො. මනොවිඤ්ඤාණධාතුයා නිද්දිට්ඨාය අට්ඨාරස ධාතුයො නිද්දිට්ඨා හොන්ති, අයං ධාතුසු ඔතරණො, මනායතනෙ නිද්දිට්ඨෙ සබ්බානි ආයතනානි නිද්දිට්ඨානි හොන්ති, තත්ථ මනායතනං නාමරූපස්ස පදට්ඨානං, නාමරූපපච්චයා සළායතනං, තථා පටිච්චසමුප්පාදෙ, අයං ඔතරණො.

13. තත්ථ කතමො සොධනො : සුද්ධායෙව ආරම්භො.

14. තත්ථ කතමො අධිට්ඨානො : ජළින්ද්‍රියං භාවනා එකත්තතායං[7] පඤ්ඤත්ති, ජවිතෙන කායො එකත්තතාය[7] පඤ්ඤත්තො.

---

1. අධිතා - මජසං, PTS.
2. විරහිස්සන්ති - මජසං.
3. තෙහි - මජසං, PTS.
4. අයං තත්ථ - මජසං, PTS.
5. ආගමිස්සතීති - මජසං.
6. පඤ්ඤත්තං - මජසං, PTS.
7. එකත්තතාය - PTS. / එකත්තතායං - මජසං.

6. එහි ' චතුබ්‍යූහ ' හාර කවරෙ යැ : මෙහි භාග්‍යවතුන් වහන්සේගේ අදහස කවරෙ යැ : යම් කෙනෙක් දුකින් පීඩිත වන්නාහු ද ඔහු මෙබඳු සමවතින් යුක්ත වැ වාස කරන්නාහ, යන මේ මෙහි ලා භාග්‍යවතුන් වහන්සේගේ අදහස යි. යම් කෙනෙක් නො පහන් වූවාහු ද ඔහු ප්‍රසන්නයෝ වන්නාහ, ප්‍රසන්න වූවන්ගේ ද ප්‍රිතිප්‍රාමොද්‍යය වන්නේය. මේ මෙහි ලා භාග්‍යවතුන් වහන්සේගේ අදහස යි.

7. ' ආවට්ටො ' යනු : (මෙහි) ආවට්ටහාරයට භූමි නැති.

8. '' විභත්ති '' යනු : '' යස්සෙවං භාවිතං චිත්තං කුතො නං දුක්ඛමෙස්සති '' යනු : දුක්ඛහෙතු නිද්දෙස යැ, පටිපක්ඛනිද්දෙසය දැයි නිර්දෙශය ෛවැදැරුම් යැ. ඒ දුක්ඛ හෙතු කවරෙ යැ, යම් හෙතුයෙකින් දුක පැමිණේ ද, ප්‍රතිපක්ෂ නිර්දෙශ ද වෙයි. කුමක් හෙයින් මෙබඳු පුඟුල්හට දුක නො එන්නේ දැයි දක්වනලදි.

9. '' පරිවත්තන '' යනු : '' කුතො නං දුක්ඛමෙය්සති '' යනු : යම් චෛතසික සුඛයක් අනුපාදිසෙස වී ද මෙය නැත, සොපාදිසෙස වූ මේ සුවය ඇත, යළි මෙසේ කීහු : ඒ ඇසිල්ලෙහි ඒ මොහොතෙහි ඒ දෙක මැ අවෙදයිත යැ, සොපාදිසෙස යි. අනුපාදිසෙස වූ යම් සුවයකුත් ඇද්ද, යම් සුවයකුත් එකෙණෙහි ඒ මොහොතෙහි අනුපාදිසෙස සොපාදි සෙස වූ අවෙදයිත වූ සුවයට පැමිණියහුගේ සුවය අනාවත්තික යැ, යන මේ මෙහි විසෙස යි. මේ පරිවත්තනා යි.

10. එහි ' වෙවචන ' කවරෙ යැ : මෙසේ යමක්හුගේ භාවිත චිත්තය වේ ද එය භාවිත යැ සුභාවිත යැ අනුටයිත යැ වත්ථුකත යැ සුසමාරද්ධ යැ. ' චිත්තං ' යනු : මන යැ විඤ්ඤාණ යැ මනින්ද්‍රිය යැ මනොවිඤ්ඤාධාතු යැ යනු වෙවචන යි.

11. එහි ' පඤ්ඤත්ති ' කවරෙ : චිත්ත යැ මනොසංඛාරයෝ යැ යන මොහු ව්‍යුපශම ප්‍රඥප්තියෙන් පනවනලදහ, සමාධිය අසෙඛපඤ්ඤත්තියෙන් පනවනලද, දුක්ඛය උච්ඡින්නපඤ්ඤත්තියෙන් පනවන ලදි.

12. එහි ඔතරණ කවරෙ යැ : චිත්තය නිර්දිෂ්ට කල්හි පඤ්චස්කන්ධයෝ දක්වන ලද්දහු වෙති, මේ ස්කන්ධයන්හි අවතරණ යැ, මනොවිඤ්ඤාණධාතුව දක්වනලද කල්හි අටළොස් ධාතුහු දක්වන ලද්දහු වෙති. මේ ධාතූන් කෙරෙහි අවතරණ යැ, මනායතනය නිර්දිෂ්ට කල්හි සියලු ආයතනයෝ දක්වනලද්දහු වෙති. එහි මනායතනය නාමරූපයට පදට්ඨාන යැ, නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතනය වෙයි. එපරිද්දෙන් පටිච්චසමුප්පාදයෙහි පදට්ඨාන වෙයි. මේ ඔතරණ හාර යි.

13. .එහි ' සොධන ' කවරෙ යැ : ආරම්භය සුද්ධ මැ යි.

14. එහි ' අධිට්ඨාන ' කවරෙ යැ : ෂඩින්ද්‍රියය භාවනාඑකත්තතායෙහි පඤ්ඤත්ති යැ, (ජවයීතෙන ?) එය එකත්තතායෙන් පනවන ලද.

15. තත්ථ කතමො පරික්ඛාරො : චිත්තස්ස පුබ්බහෙතු සමුප්පාදය මනසිකාරො ච තප්පොණතා ච යං අසමාහිතභූයං ච විසෙසධම්මානං අභාවිතත්තා චිත්තසන්තතං ගච්ඡති, සචෙ සමාධිනො සුඛං හෙතු, අවිප්පටිසාරො පච්චයො, අයං හෙතු අයං පච්චයො. පරික්ඛාරො.

16. තත්ථ කතමා සමාරොපනා : යස්සෙවං භාවිතන්ති තස්ස ධම්මා සමාරොපයිතබ්බා, කායො සීලං පඤ්ඤා භාවිතා[1] චිත්තන්ති, අනභිරතං අනාසන්නං අනෙකං අනූනං අනාපජ්ජාසත්තං අයං සමඤ්ඤායතනා න තස්ස සෙක්ඛස්ස සම්මාසමාධි, සබ්බෙ අසෙක්ඛා දස අරහත්තං[2] ධම්මා නිද්දිට්ඨා හොන්ති.

අසෙඛභාගියානි සුත්තානි.

## 7 - 9

"යස්ස නූන භන්තෙ කායෙ කායගතාසති අනුපට්ඨිතා අස්ස[3] සො ඉධ[4] අඤ්ඤතරං සබ්‍රහ්මචාරිං[5] ආසජ්ජ අප්පටිනිස්සජ්ජ[6] චාරිකං[7] පක්කමෙය්‍ය"*.

සො ආයස්මා ඉමස්මිං විප්පටිජානාති ද්වෙ පජානි පටිජානාති චිත්තභාවනායං ච දිට්ඨියා පහානං, කායභාවනායං ච දිට්ඨිප්පහානං, කායභාවනායං ච තණ්හාපහානං, යං පඨමං උපමං කරොති. අසුචිනාපි සුචිනාපි පඨවි[8] නෙව අට්ටීයති.[9] න ජිගුච්ඡති න පීති-පාමොජ්ජං පටිලභති එවමෙව හි පඨවිසමෙන සො චෙතසා විපුලෙන[10] අප්පමාණෙන[11] අවෙරෙන අබ්‍යාපජ්ඣෙන[12] විහරාමීති.

ඉති සො ආයස්මා කිං පටිජානාති : කායභාවනාය සුඛින්ද්‍රියපහානං පටිජානාති, චිත්තභාවනාය සොමනස්සින්ද්‍රියපහානං පටිජානාති, කායිකා වෙදනා රාගානුසයමනුගතානං සුඛින්ද්‍රියං පටික්ඛිපති. න හි වෙදනාක්ඛන්ධං යා චෙතසිකා සුඛවෙදනා, තත්ථ අයං පටිලාභපච්චයා උප්පජ්ජති සුඛං සොමනස්සං. සො තං පටික්ඛිපති, න හි මනො-සම්ඵස්සජං වෙදනං. තත්ථ චතූසු මහාභූතෙසු රූපක්ඛන්ධස්ස අනුසය-පටිඝප්පහානං භණති. කාමෙ රූපං ච තං ච අසෙඛභූමියං.

කායෙ කායානුපස්සනා දිට්ඨධම්මසුඛවිහාරං ච. බලෙන ච උස්සාහෙන ච සබ්බං මනසි කතත්තානං පහානං? මෙදකථාලිකාය[13] ච පුරිසෙන ච මණ්ඩනකජාතිකෙන එතෙහි ඉමස්ස මාතාපිතුසම්භූතං පච්චවෙක්ඛණං, සො කායෙන ච කායානුපස්සනාය ච චිත්තෙන ච චිත්තානුපස්සනාය ච ද්වෙ ධම්මෙ ධාරෙති. කායකිලෙසචත්තුං චිත්තෙන ච චිත්තසන්නිස්සයෙ චිත්තෙන සුභාවිතෙන සන්තත්තං ච සමාපත්තීනං විහරිතුං පටිජානාති.

---

1. භාවිතං - PTS.
2. අරහත්ත - මජසං, PTS.
3. අභාවිතා - මජසං, PTS.
4. අයං සො - මජසං, PTS
5. සබ්‍රහ්මචාරිනං - සයා.
6. අප්පටිනිස්සජ්ජ - මජසං, PTS
7. ජනපදචාරිකං - මජසං, PTS.

* නවකඞ්ගුත්තර - සීහනාදවග්ග.

8. පඨවි - මජසං, PTS.
9. අට්ටීයති - මජසං, PTS.
10 අබ්‍යාපජ්ජෙන - මජසං, PTS.
11. අණ්ඩයෙන - මජසං, PTS.
12. අප්පකෙන - මජසං, PTS.
13. මෙදං කතාලිකාය-මජසං, PTS.

15. එහි ' පරික්ඛාර ' කවරෙ යැ : චිත්තයාගේ පූර්වහෙතු සමුත්පාදය පිණිස මනසිකාරය ද තත්ප්‍රවණබව ද අසමාහිත භූමියෙහිදු විශෙෂධර්මයන් අභාවිත බැවින් (චිත්ත සතතං ගච්ඡති ?) ඉදින් සමාධියට සුඛය හේතු යැ, අවිප්පටිසාරය ප්‍රත්‍යය වෙයි. මෙ හෙතු යැ, මේ ප්‍රත්‍ය යි. ' පරික්ඛාර ' හාර යි.

16. එහි ' සමාරොපනා ' කවරැ : ' යස්සෙවං භාවිතං ' යනු : ඔහුට කාය යැ සීල යැ පඤ්ඤා යැ භාවිතචිත්ත යැ යන දහම්හු සමාරොපණය කළයුත්තාහු යැ. (අනභිරතං . . . . න තස්ස ?) සියලු අශෛක්ෂ වූ රහතුන්ගේ දස දහම්හු දක්වනලද්දහු වෙත්.

අසෙඛභාගිය සූත්‍රයෝ යි.

7 — 9

'' ස්වාමීනි, එකැතින් යම් මහණක්හට කයෙහි කාගියාසී නො එළඹසිටියා ද, හේ මෙහි එක්තරා සබ්‍රම්සරකු ගටා ඇවත නො දෙසා චාරිකාවට නික්මයන්නේ යැ.''

ඒ ආයුෂ්මත් මෙහි විරුද්ධ වැ පිළිත කෙරෙයි, (ද්වෙ පජානි පටිජානාති ?) චිත්ත භාවනායෙහි දෘෂ්ටිප්‍රහාණය ද කායභාවනායෙහි දෘෂ්ටිප්‍රහාණය ද කායභාවනායෙහි තෘෂ්ණාප්‍රහාණය දැයි. පළමු කොට යම් උපමාවක් කෙරේ ද, එහි පොළොව අසුචියෙනුදු සුචියෙනුදු නො මැ පීඩිත වෙයි, ජුගුප්සා නො කෙරෙයි, ප්‍රීතිප්‍රමොද්‍යය නො ලබයි, එසෙයින් ම හේ පෘථිවී සමවූ මහත් වූ අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ සිතින් යුක්ත වැ වෙසෙමී.

මෙසේ ඒ ආයුෂ්මත් (ශාරිපුත්‍රයන් වහන්සේ) කුමක් පිළිත කෙරෙති යත් : කාය භාවනායෙන් දුඃඛින්ද්‍රියයාගේ ප්‍රහාණය පිළිත කෙරෙති, චිත්තභාවනායෙන් සොමනස්සි-න්ද්‍රියප්‍රහාණය පිළිත කෙරෙති, කායික වේදනාව රාගානුසය අනුව ගියවුන්ගේ දුඃඛි-න්ද්‍රිය ප්‍රතික්ෂේප කෙරෙති, යම් කායික දුඃඛවෙදනාවක් ඇද්ද එය වෙදනාස්කන්ධ නො මැ වෙයි. එහි මේ ප්‍රතිලාභ හේතුයෙන් සුව සොම්නස් උපදී. හේ එය ප්‍රතික්ෂේප කෙරෙයි. මනොසම්ඵස්සයෙන් උපන් වෙදනාව නො මැ වෙයි. එහි සතර මහාභූතයන් කෙරෙහි රූපස්කන්ධයාගේ අනුශය ප්‍රතිසප්‍රහාණය ප්‍රකාශ කෙරෙයි. කාමභවයෙහි රූපය ද (. . . . ?) එ ද අශෛක්ෂභූමියෙහි යැ.

කයෙහි කායනුපස්සනාව ඉහාත්මසුඛවිහරණය ද (බලෙන ච උස්සාහෙන ච සබ්බං මනසිකතත්තානං පහානං ?) මෙදකථාලිකා – උපමායෙන් ද මණ්ඩනස්වභාව ඇති පුරුෂයාගේ උපමායෙන් ද යන මෙයින් මේ මාතෘපිතෘසම්භූත වූ කය ප්‍රත්‍යවෙක්ෂා කිරීම වෙයි. හේ කයින් ද කායානුපස්සනායෙන් ද සිතින් ද චිත්තානුපස්සනායෙන් ද සත් සමාපත්තීන්ට සමවැද විසීමට පිළිත කෙරෙයි.

ගහපතිපුත්තොපමතාය ච යථා ගහපතිපුත්තස්ස නානාරත්තානං වත්ථානං කරණ්ඩකො[1] පුණ්ණො භවෙය්‍ය, සො යං යදෙව වත්ථයුගං පුබ්බන්හසමයෙ ආකඞ්ඛති, පුබ්බන්හසමයෙ නිබ්බාපෙති: එවං මජ්ඣන්හසමයෙ[2] සායන්හසමයෙ, එවමෙව ඛො ආයස්මා චිත්තස්ස සුභාවිතත්තා යථාරූපෙන විහාරෙන ආකඞ්ඛති පුබ්බන්හසමයං විහරිතුං, තථාරූපෙන පුබ්බන්හසමයං විහරති. මජ්ඣන්හසමයෙ[2] සායන්හසමයෙ, තෙන චෙස ආයස්මතා උපමාය මෙ ආසිතාය පඨවි වා අනුත්තරා ඉද්ධියභාවනා භාවිතවිතෙත්තන, තෙන සො ආයස්මා ඉදං අට්ඨවිධං භාවනං පටිජානාති. චතූසු මහාභූතෙසු කායභාවනං, උපකවණ්ඩාලං පුරිසමෙදකථාලිකාසු[3] චිත්තභාවනං, ඉමාහි භාවනාහි තාය භාවනාය ච සමථා පාරිපූරිං ගච්ඡන්ති ඉමෙහි චතූහි පඤ්ඤාපාරිපූරිං ගච්ඡන්ති.

කථං උපකවණ්ඩාලං පටිකූලෙසු ධම්මෙසු අප්පටිකූලසඤ්ඤී විහරති: කායො පකතියා අප්පටිකූලං, කායෙ උද්ධුමාතකසඤ්ඤා සඞ්ඛිත්තෙන නාව සඤ්ඤා ඉමෙ පටිකූලා ධම්මා, චෙසො ආයස්මා පටිකූලතො අජිගුච්ඡිතො කායගතාසතියා භාවනානුයොගමනුයුත්තො විහරති, න හි තස්ස ජිගුච්ඡිතාය[4] චිත්තං පටිකූලති.

කථං අප්පටිකූලෙසු ධම්මෙසු පටිකූලසඤ්ඤී විහරතීති: කායො සබ්බලොකස්ස අප්පටිකූලො, තං සො ආයස්මා අසුභසඤ්ඤාය විහරති. එවං අප්පටිකූලෙසු ධම්මෙසු පටිකූලසඤ්ඤී විහරති.

කථං පටිකූලෙසු ච අප්පටිකූලෙසු ච අප්පටිකූලසඤ්ඤී විහරතීති: අපි සබ්බා'යං ලොකස්ස යදිදං මුණ්ඩො පත්තපාණි කුලෙසු පිණ්ඩාය විචරති, තෙන ච සො සුවණ්ණදුබ්බත්තෙන අප්පටිකූලසඤ්ඤී චිත්තෙන ච කායෙන නිබ්බිදාසහගතෙන අප්පටිකූලසඤ්ඤී. එවං පටිකූලෙසු අප්පටිකූලෙසු ච ධම්මෙසු අප්පටිකූලසඤ්ඤී විහරති.

කථං පටිකූලෙසු ච ධම්මෙසු අප්පටිකූලසඤ්ඤී විහරති: අප්පටි-කූලෙසු ච ධම්මෙසු සුභසඤ්ඤිනො ඉට්ඨරූපෙ, පටිකූලෙසු ච ජිගුච්ඡිනො විනීලකවිපුබ්බකෙ, තත්ථ සො ආයස්මා අප්පටිකූලසඤ්ඤී[5] විහරති.

කථං පටිකූලෙසු ධම්මෙසු තදුභයං අභිනිවජ්ජයිත්වා උපෙක්ඛකො විහරති සතො ච සම්පජානො ච: අප්පටිකූලෙසු ච ධම්මෙසු සුභසඤ්ඤිනො ඉට්ඨරූපෙ පටිකූලෙසු ච ජිගුච්ඡිනො විනීලකවිපුබ්බකෙ තදුභයං අභිනිවජ්ජයිත්වා 'නෙතං මම නෙසො'හමස්මි නෙසො මෙ අත්තා'ති විහරති. එවං තදුභයං අභිනිවජ්ජයිත්වා උපෙක්ඛකො විහරති සතො සම්පජානො.

---

1. කරණ්ඩිකො – PTS.
2. මජ්ඣන්තිකසමයෙ – මජ්සං, PTS.
3. පුරිසමෙත්තකං භවතලාකාසු – මජ්සං, PTS.
4. ජිගුච්ඡප්පහාය – මජ්සං, PTS.
5. පටිකූලසඤ්ඤී – මජ්සං, PTS.
6. පටිකූලෙසු – මජ්සං, PTS.

ගෘහපතිපුත්‍රොපමායෙහි යම්සේ ගෘහපතිපුත්‍රයක්හුගේ නානාවර්ණ ඇති වස්ත්‍රයෙන් පිරුණු පේළායෙක් වේ ද, හේ යම් යම් වස්ත්‍රයුගලයෙක් පෙරවරුයෙහි රිසි වේ නම් එය පෙරවරුයෙහි (නිබ්බාපෙති ?) හඳියි. මැදිදවල්හිදු සවස්හිදු එසේ මැය. එපරිද්දෙන් ඒ ආයුෂ්මත් සිත සුභාවිත හෙයින් යම්බඳු විහරණයෙකින් පෙරවරුයෙහි වාසය කරන්නට රිසිවේ නම් පෙරවරුයෙහි ඒ විහරණයෙන් වෙසෙයි, මධ්‍යාහ්නයෙහිදු සවස්හිදු එපරිදි වෙසෙයි, (තෙන වෙස . . . . භාවිතචිත්තෙන ?) එහෙයින් ඒ ආයුෂ්මත් මේ අටවැදෑරුම් භාවනාව පිළිත කෙරෙයි. සතර මහාභූතයන්හි කායභාවනාව ද, උපකචණ්ඩාල පුරුෂ මේදස් පිරූ සැළිය යන මෙහි චිත්තභාවනාව ද වෙයි. (ඉමාහි භාවනාහි . . . . පාරිපූරි මන්තෙහි ?)

උපකචණ්ඩාලොපමාව ? කිසෙයින් ප්‍රතිකූලධර්මයන්හි අප්‍රතිකූලසංඥා ඇතිව වෙසෙයි යත් : කය පියෙවින් අප්‍රතිකූල යැ, කයෙහි උද්ධුමාතකසංඥාව ද සැකෙවින් නව සංඥාවෝ ද යන මේ ප්‍රතිකූල ධර්මයෝ තෙල ආයුෂ්මත් පිළිකුල් විසින් ජුගුප්සා නොකරනු යේ කායගතාසති භාවනානුයෝගයෙහි යෙදී වාස කෙරෙයි. ඔහුගේ සිත ජුගුප්සනායෙන් නො මැ ප්‍රතිකූල වෙයි.

කිසෙයින් අප්පටිකූල දහම්හි පටිකූල සංඥා ඇති වැ වෙසෙයි යත් : කය සියලු ලෝවැසි යාට අප්‍රතිකූල යැ, ඒ ආයුෂ්මත් කයෙහි අශුභසංඥායෙන් යුතු වැ වාසය කෙරෙයි. මෙසේ අප්‍රතිකූලධර්මයන්හි ප්‍රතිකූලසංඥා වැ වාස කෙරෙයි.

කිසෙයින් ප්‍රතිකූලධර්මයන්හි ද අප්‍රතිකූල ධර්මයන්හි ද අප්‍රතිකූලසංඥා වැ වාස කෙරෙයි යත් : යම් හෙයකින් මේ ආයුෂ්මත් මුඩු කළ හිස ඇති වැ අතින් ගත් පාත්‍ර ඇති වැ කුල යන්හි පිඩු සිඟා හැසිරේ ද, එයින් හේ සුවර්ණදුර්වර්ණයෙන් අප්‍රතිකූල සංඥා ඇති වැ නිර්වෙද සහගත වූ සිතින් ද කයින් ද යුක්ත වැ අප්‍රතිකූල සංඥා ඇති වෙයි, මෙසේ ප්‍රතිකූල වූ ද අප්‍රතිකූල වූ ද දහම්හි අප්‍රතිකූල සංඥා ඇති වැ වාස කෙරෙයි.

කිසෙයින් ප්‍රතිකූල ධර්මයන්හි අප්‍රතිකූලසංඥා වැ වෙසෙයි යත් : අප්‍රතිකූල ධර්මයන්හි ස්ත්‍රීරූපයෙහි ශුභසංඥා ඇත්තහුට ද විනීලක විපුබ්බක අශුභයන්හි ජුගුප්සා ඇත්තහුට ද (අප්පටිකූල සංඥා වෙයි.) එහි ඒ ආයුෂ්මත් (ධාතුමනසිකාර වශයෙන්) අප්‍රතිකූලසංඥා ඇති වැ වෙසෙයි.

කිසෙයින් ප්‍රතිකූලධර්මයන්හි (පටිකූල අප්පටිකූල යන) දෙක දුරුකොට සිහි නුවණ ඇති වැ උපෙක්ෂක වැ වෙසෙයි යත් : ස්ත්‍රීරූපයෙහි ශුභසංඥා ඇතියේ අප්‍රතිකූල ධර්මයන්හි ද විනීලක විපුබ්බක කයෙහි ජුගුප්සා ඇතියේ ප්‍රතිකූල ධර්මයන්හි ද එ දෙක දුරුකොට '' තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වේ '' යයි සලකා වෙසෙයි. මෙසේ (පටිකූල අප්පටිකූල යන) දෙක දුරුලා සිහි නුවණ ඇතියේ උපෙක්ෂක වැ වෙසේ.

අපරො පරියායො: තෙධාතුකෙ ලොකසන්නිවාසෙ[1] සබ්බබාලපුථුජ්ජනානං අප්පටිකූලසඤ්ඤා. තත්ථ ච ආයස්මා සාරිපුත්තො පටිකූලසඤ්ඤී[2] විහරති. එවං අප්පටිකූලෙසු ධම්මෙසු පටිකූලසඤ්ඤී විහරති.

කථං පටිකූලෙසු ධම්මෙසු අප්පටිකූලසඤ්ඤී විහරති: පටිකූලසඤ්ඤිනො සබ්බසෙඛා. ඉධ (කා) තෙධාතුකෙ සබ්බලොකෙ. තත්ථ කතමො භූමිප්පත්තො සමාධිඵලෙ සච්ඡිකතො අප්පටිකූලසඤ්ඤී විහරති. කිං කාරණං; න හි තං අත්ථි යස්ස ලොකස්ස පහානාය පටිකූලසඤ්ඤං උප්පාදෙය්‍ය.

කථං පටිකූලෙසු ච අප්පටිකූලෙසු ච ධම්මෙසු පටිකූලසඤ්ඤී විහරති: තෙධාතුකෙ ලොකසන්නිවාසෙ යාව කාමලොකභූමිතො හි රාගානං වීතරාගානං පටිකූලසම්මතා, රූපාරූපධාතුං අප්පටිකූලසම්මතා තත්ථ ච ආයස්මා සාරිපුත්තො පටිකූලසඤ්ඤී විහරති. එවං පටිකූලෙසු ච අප්පටිකූලෙසු ච ධම්මෙසු පටිකූලසඤ්ඤී විහරති.

කථං පටිකූලෙසු ච අප්පටිකූලෙසු ච ධම්මෙසු අප්පටිකූලසඤ්ඤී විහරති: යං කිඤ්චි පරතො දුරුත්තානං දුරාගතානං වචනපථානං තං වචනං අප්පටිකූලං යාවතා වාචසො අප්පතිරූපා[3] තථා ජනස්ස අප්පටිකූලසඤ්ඤා. තත්ථ ආයස්මා සාරිපුත්තො අභිඤ්ඤාය සච්ඡිකතො අප්පටිකූලසඤ්ඤී විහරති, එවං පටිකූලෙසු ච අප්පටිකූලෙසු ච ධම්මෙසු අප්පටිකූලසඤ්ඤී විහරති.

කථං පටිකූලෙසු ච අප්පටිකූලෙසු ච ධම්මෙසු තදුභයං අභිනිවජ්ජයිත්වා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො: යං ච තෙසං සමනුපස්සති යෙ ධම්මා දුච්චරිතා, තෙ ධම්මා අප්පටිකූලා, තත්ථ ආයස්මා සාරිපුත්තො ඉති පටිසඤ්චික්ඛති යෙ ධම්මා දුච්චරිතා තෙ ධම්මා අනිට්ඨවිපාකා, යෙ ධම්මා සුචරිතා, තෙ ආචයගාමිනො. සො ච සුචරිතං ආචයගාමිනිං කරිත්වා, දුච්චරිතං අනිට්ඨවිපාකං කරිත්වා තදුභයං අභිනිවජ්ජයිත්වා උපෙක්ඛකො විහරති.

අථ පටිකූලෙසු ච ධම්මෙසු අප්පටිකූලෙසු ච පටිකූලසඤ්ඤී විහරති. තණ්හා පටිකූලධම්මා, කිං කාරණං: තණ්හාවසෙන හි සත්තා ද්වීහි ධම්මෙහි සත්තා කබළීකාරෙ ආහාරෙ රසතණ්හාය සත්තා, ඵස්සෙ සුඛසඤ්ඤාය සත්තා. තත්ථායස්මා සාරිපුත්තො කබළීකාරෙ ච ආහාරෙ පටිකූලසඤ්ඤී විහරති, ඵස්සෙ ච දුක්ඛසඤ්ඤී විහරති. එවං පටිකූලෙසු ච අප්පටිකූලෙසු ච පටිකූලසඤ්ඤී විහරති.

කථං පටිකූලෙසු ච ධම්මෙසු අප්පටිකූලෙසු ච ධම්මෙසු අප්පටිකූලසඤ්ඤී විහරති: තණ්හාක්ඛයං අනුත්තරං නිබ්බානං, තථා බාලපුථුජ්ජනානං පටිකූලසඤ්ඤා පහතසඤ්ඤා ච. තත්ථායස්මතො සාරිපුත්තස්ස අප්පටිකූලසඤ්ඤා අබ්‍යාපාදසඤ්ඤා ච නාමං පඤ්ඤාය පස්සිත්වා, එවං පටිකූලෙසු ච ධම්මෙසු අප්පටිකූලසඤ්ඤී විහරති.

1. තෙධාතුකො ලොකසන්නිවාසො - මජසං, PTS.
2. අප්පටිකූලසඤ්ඤී - මජසං, PTS.
3. අප්පරූපා - PTS.

අන්‍යත් පරියායයෙක් වෙයි : ත්‍රෛධාතුක ලොකසන්නිවාසයෙහි සියලු බාලපෘථග්ජන යනට අප්‍රතිකූලසංඥා වෙයි. එහිදු ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ ප්‍රතිකූලසංඥා ඇති වැ වාසයකරනසේක. මෙසේ අප්‍රතිකූලධර්මයන්හි ප්‍රතිකූලසංඥා ඇති වැ වෙසෙයි.

කිසෙයින් ප්‍රතිකූල ධර්මයන්හි අප්‍රතිකූලසංඥා වැ වෙසෙයි යත් : සියලු ශෛක්ෂයෝ මේ ත්‍රෛධාතුක සර්වලෝකයෙහි ප්‍රතිකූලසංඥා ඇත්තාහුය. (තත්ථ කතමො . . . . උප්පාදෙය්‍ය ?)

කිසෙයින් ප්‍රතිකූල වූ ද අප්‍රතිකූල වූද ධර්මයන්හි ප්‍රතිකූලසංඥා ඇති වැ වෙසෙයි යත් : ත්‍රෛධාතුක ලොකසන්නිවාසයෙහි යම්තාක් කාමලොකභූමිය වේ ද, (එහි) රාගීන්ට ද වීතරාගීන්ට ද ප්‍රතිකූලසමතාව වෙයි. රූපාරූපධාතුයෙහි අප්‍රතිකූලසමතා වෙයි. එහිදු ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ ප්‍රතිකූලසංඥා ඇති වැ වෙසෙති. මෙසේ ප්‍රතිකූල වූ ද අප්‍රතිකූල වූ ද ධර්මයන්හි ප්‍රතිකූලසංඥා ඇති වැ වෙසෙයි.

කිසෙයින් ප්‍රතිකූල වූ ද අප්‍රතිකූල වූ ද ධර්මයන්හි අප්‍රතිකූලසංඥා ඇති වැ වෙසෙයි යත් : (යංකිඤ්චි පරතො . . . . ජනස්ස අප්පටිකූලසඤ්ඤා ?) එහි ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ නුවණින් දුන ප්‍රත්‍යක්ෂ කළාහු අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙති. මෙසේ ප්‍රතිකූල වූ ද අප්‍රතිකූල වූ ද ධර්මයන්හි අප්‍රතිකූලසංඥා ඇති වැ වෙසෙයි.

කිසෙයින් ප්‍රතිකූල වූ ද අප්‍රතිකූල වූ ද ධර්මයන්හි ඒ ප්‍රතිකූල අප්‍රතිකූල දෙක දුරුකොට සිහි නුවණ ඇති වැ උපේක්ෂක වැ වෙසෙයි යත් : යම් දුශ්චරිත ධර්ම කෙනෙක් වෙත් ද ඒ ධර්මයෝ ඔවුන්ට අප්‍රතිකූල වූවාහු දකී ද, එහි ලා ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ මෙසේ සලකති : ' යම් ධර්ම කෙනෙක් දුශ්චරිත වෙත් ද, ඒ දහම්හු අනිෂ්ටවිපාකයෝ යැ, යම් සුචරිත ධර්ම කෙනෙක් වෙත් ද ඔහු ආචයගාමීහු යැයි. ඒ ශාරිපුත්‍රයන් වහන්සේ සුචරිතය ආචයගාමිනී කොට දුශ්චරිතය අනිෂ්ට විපාක කොට එ දෙක දුරුකොට උපෙක්ෂක වැ වාසය කෙරෙත්.

ඉක්බිති ප්‍රතිකූල වූ ද අප්‍රතිකූල වූ ද ධර්මයන්හි ප්‍රතිකූලසංඥා ඇති වැ වෙසෙයි. තෘෂ්ණාව ප්‍රතිකූල ධර්ම යැ, කරුණු කිම යත් : ඒ එසේ මැය, සත්වයෝ තෘෂ්ණා වශයෙන් ධර්ම දෙකෙකින් ඇලුණාහුය, කවලීකාරාහාරයෙහි රසතෘෂ්ණාවෙන් ඇලුණාහු යැ, ස්පර්ශාහාරයෙහි සුඛසංඥාවෙන් ඇලුණාහු යැ, එහි ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ කවලීකාරාහාරයෙහි ප්‍රතිකූලසංඥා ඇති වැ වෙසෙති, ස්පර්ශයෙහි ද දුඃඛසංඥා ඇති වැ වෙසෙත්. මෙසේ ප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලයෙහි ද ප්‍රතිකූලසංඥා වැ වෙසෙයි.

කිසෙයින් ප්‍රතිකූලධර්මයන්හි ද අප්‍රතිකූලධර්මයන්හි ද අප්‍රතිකූලසංඥී වැ වෙසෙයි යත් : තෘෂ්ණාක්ෂය සංඛ්‍යාත නිර්වාණය අනුත්තර යැ, එනෙකුදුවත් බාල පුහුදුනන්ට ප්‍රතිකූල සංඥා ද (පහතසඤ්ඤා ච ?) එහි ලා ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේට තුමූ මැ ප්‍රඥායෙන් දුක අප්‍රතිකූලසංඥා ද අව්‍යාපාදසංඥා ද වෙයි. මෙසේ ප්‍රතිකූල ධර්මයන්හිදු අප්‍රතිකූල සංඥා ඇති වැ වෙසෙයි.

කථං පටිකූලෙසු ච අප්පටිකූලෙසු ච ධම්මෙසු අප්පටිකූලසඤ්ඤී විහරති : තතියෙ ච නිබ්බානෙන පටිකූලසඤ්ඤිනො යසෙන ච කිත්තියා ච[1] අප්පටිකූලසඤ්ඤිනො. තත්ථායස්මා සාරිපුත්තො අස්සාදං ච ආදීනවං ච නිස්සරණං ච යථාභූතං සම්මප්පඤ්ඤාය[2] පටිජානන්තො පටිකූලං ච අප්පටිකූලං ච ධම්මං තදුභයං අභිනිවජ්ජයිත්වා අප්පටිකූල-සඤ්ඤී විහරති.

කථං පටිකූලං ච අප්පටිකූලං ච ධම්මං තදුභයං අභිනිවජ්ජයිත්වා උපෙක්ඛකො විහරති සතො ච සම්පජානො ච : යං ච සමනුපස්සති අනුනයො අප්පටිකූලො ධම්මො, පටිඝො ච පටිකූලො ධම්මො, තත්ථායස්මා සාරිපුත්තො අනුනය[3] පටිඝපහීනත්තා උපෙක්ඛකො විහරති සතො සම්පජානො ච. යඤ්චස්ස සමනුපස්සති, අයං පඤ්චවිධා අනුත්තරා ඉන්ද්‍රියභාවනා අයං සුත්තනිද්දෙසො.

1. තත්ථ කතමො දෙසනාහාරො : ඉමම්හි සුත්තෙ කිං දෙසිතං.[4] තත්ථ වුච්චතෙ– ඉමම්හි සුත්තෙ දිට්ඨධම්මසුඛවිහාරො දෙසිතො, තථා විමුත්තං චිත්තා පච්චවෙක්ඛණා ච අධිපඤ්ඤාධම්මං දෙසිතං.

2. තත්ථ කතමො විචයො : යෙ කායෙ කායානුපස්සිනො විහරන්ති තෙසං චිත්තං අනුනයපටිඝෙන න විහරති, අනුනයපටිඝෙන චා'භි-රමමානස්ස[5] චිත්තං සම්මග්ගතං[6] භවිස්සතීති භාවනාය ඵලමෙතං[7] අයං විචයො හාරො.

3. තත්ථ කතමො යුත්තිහාරො : කායභාවනාය ච චිත්තභාවනාය ච න කිඤ්චි සබ්‍රහ්මචාරී අතිමඤ්ඤිස්සතීති අත්ථි එසා යුත්ති. අයං යුත්තිහාරො

4. තත්ථ කතමො පදට්ඨානො හාරො : කායභාවනාය පඨමස්ස සති උපට්ඨානස්ස පදට්ඨානං. යා පඨවීසමචිත්තතා සා අනිච්චානු-පස්සනාය පදට්ඨානං.

5. තත්ථ කතමො ලක්ඛණො : යං පඨවීසමෙන චෙතසා විහරති අත්තානුපස්සී, පඨවීසමෙන ඨිති විහරති. කො අත්ථො පඨවීසමෙනාති : යථා යෙ ච සෙලොපමතාය අකම්මඤ්ඤතා, එවමෙව පඨවීසමො අයං ඨිරියතාය, අයං ලක්ඛණො.

6. තත්ථ කතමො චතුබ්‍යූහො හාරො : ඉමම්හි බ්‍යාකරණෙ කො තස්ස ආයස්මතො අධිප්පායො : යෙ කෙචි අරහන්තා ඉන්ද්‍රියභාවනං ආකඞ්ඛන්ති[8] තෙ පඨවීසමං උප්පාදයිස්සන්තීති· අයං අධිප්පායො.

7. තත්ථ කතමො ආවට්ටොති : තත්ථ ආවට්ටස්ස භූමි.

---

1. කිත්තිනි ච - මජසං, PTS.
2. සම්මාපඤ්ඤාය – මජසං.
3. අනුනයස්ස – මජසං, PTS.
4. දෙසිතබ්බං – මජසං, PTS.
5. – රම්මමානස්ස – PTS.
6. සමග්ගතං – මජසං, PTS.
7. බලවෙතං – මජසං.
8. ආකඞ්ඛියන්ති – මජසං, PTS

කිසෙයින් ප්‍රතිකූල වූ ද අප්‍රතිකූල වූ ද ධර්මයන්හි අප්‍රතිකූලසංඥ වැ වෙසෙයි යත් : (තතියෙ ච නිබ්බානෙ යසෙනු ච කිත්තියා ච අප්පටිකූලසඤ්ඤීනො ?) එහි ලා ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද තතුයේ සම්‍යක්ප්‍රඥයෙන් දන්නාසේක් ප්‍රතිකූල වූ ද අප්‍රතිකූල වූ ධර්මය එ දෙක දුරුකොට අප්‍රතිකූල සංඥ ඇති වැ වාසය කරනසේක.

කිසෙයින් ප්‍රතිකූල වූ ද අප්‍රතිකූල වූ ද ධර්මය ඒ දෙක දුරුකොට සිහි නුවණ ඇතියේ උපේක්ෂක වැ වෙසෙයි යත් : අනුනය අප්‍රතිකූල ධර්මයෙකැයි ද ප්‍රතිඝය ප්‍රතිකූල ධර්ම යෙකැයි ද යම් හෙයෙකින් දකී ද, එහි ලා ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ අනුනය ප්‍රතිඝ දෙක ප්‍රහීණ කළ හෙයින් සිහි නුවණ ඇති වැ උපෙක්ෂක වූවාහු වාසය කෙරෙති. යම් සමනුපස්සනාවක් වේ ද මේ අනුත්තර වූ පඤ්චවිධ ඉන්ද්‍රියභාවනා යි. මේ සූත්‍රනිර්දේශ යි.

1. එහි දෙසනාහාර කවරෙ යැ : මේ සූත්‍රයෙහි කුමක් දේශිත ද : එහි ලා කියනු ලැබෙ. මේ සූත්‍රයෙහි දිට්ඨධම්මසුඛවිහරණය දෙසනලද්දේය. එසේ මැ විමුක්ත චිත්තය ද ප්‍රත්‍යවෙක්ෂාව ද අධිප්‍රඥධර්මය ද දෙසනලද්දේ යි.

2. එහි විචය කවරෙ යැ : යම් කෙනෙක් කයෙහි කායානුදර්ශී වැ වෙසෙත් ද, ඔවුන්ගේ සිත අනුනය ප්‍රතිඝයෙන් යුක්තව නො පවතී, අනුනය ප්‍රතිඝ දෙකින් (අභිරමමානස්ස ?) සිත සම්‍යග්ගත වන්නේනුයි තෙල භාවනා ඵල යි. මේ විචයහාර යි.

3. එහි යුක්තිහාර කවරෙ යැ : කායභාවනායෙන් ද චිත්තභාවනායෙන් ද කිසි සබ්‍රහ්ම චාරී කෙනෙක් ඉක්මවා නො සිතන්නාහු යැ යන තෙල යුක්ති ඇත. මේ යුක්ති හාර යි.

4. එහි පදට්ඨානහාර කවරෙ යැ : කායභාවනාව පළමුවන සතිපට්ඨානයට පදට්ඨාන යැ, යම් පෘථිවීසම චිත්තතාවක් ඇද්ද ඕ අනිත්‍යානුදර්ශනාවට පදට්ඨාන යි.

5. එහි ලක්ඛණහාර කවරෙ යැ : යමෙක් ආත්මානුදර්ශී වැ පඨවීසම සිතින් යුක්ත වැ වෙසේ ද, ගෘහී තෙම පඨවීසම සිතින් යුක්ත වැ වෙසෙයි, ' පඨවීසමෙන ' යනු කවර අර්ථ යැ : යම්සේ යම් කෙනෙක් ශෛලොපමභාවයෙන් ක්‍රියායෙහි නොයෙදුණාහු ද, එසෙයින් මැ පඨවීසම වූයේ (අයං හිරියතාය ?) මේ ලක්ඛණහාර යි.

6. එහි චතුබ්‍යූහහාර කවරෙ යැ : මේ වෙය්‍යාකරණයෙහි ඒ ආයුෂ්මත්හුගේ අභිප්‍රාය කවරේ යැ : යම් රහත් කෙනෙක් ඉන්ද්‍රියභාවනාව කැමැති වෙත් ද, ඔහු පඨවීසම (චිත්තය) උපදවන්නාහු යැ යන මේ අභිප්‍රාය යි.

7. එහි ආවත්තහාර කවරෙ යැ : එහි ආවත්තහාරයට භූමි නැති.

8. තත්ථ කතමා විභත්ති: යො කායානුපස්සී විහරති, සො පඨවිසමං චිත්තං[1] පටිලභිස්සතීති න එකංසෙන, කිං කාරණං: යෙ බන්ධනාදිජිත්තකාදිකම්මකාරිනො න තෙ[2] පඨවිසමචිත්තං[3] පටිලභන්ති. සබ්බා කායගතාසති[4] සෙඛභාවනාය නිබ්බානං ඵලං. අයං විභත්ති.

9. තත්ථ කතමො පරිවත්තනො හාරො: යෙ කායානුපස්සිනො විහරිස්සන්ති, තෙසං යෙව කායපච්චයා උප්පජ්ජෙය්‍යුං[5] ආසවා විඝාතපරිළාහා. අයං පරිවත්තනො හාරො.

12. තත්ථ කතමො ඔතරණො: සන්තෙතසු ච[6] පඤ්චක්ඛන්ධා අවිතිණ්ණා බාවීසතින්ද්‍රියානි, තත්ථ යං මතින්ද්‍රියං තං මනොධාතු මනායතනං ච. යං සමාධින්ද්‍රියං තං ධම්මධාතු ධම්මායතනං ච. අයං ඔතරණො හාරො.

13. තත්ථ කතමො සොධනො හාරො: යෙ ච මනසා චත්තාරො භාවෙතබ්බා, තෙ සබ්බෙ භාවිතා, යං තං මනෙන පහීනෙ පත්තබ්බං සබ්බත්ථ එතස්ස ච අත්ථාය ආරම්භො, සො අත්ථො සුද්ධො. අයං සොධනො හාරො.

14. තත්ථ කතමො අධිට්ඨානො: අයං සමාධි එකත්තතාය පඤ්ඤත්තො ජ කායො එකත්තතාය පඤ්ඤත්තා පඤ්චින්ද්‍රියානි රූපීනි රූපකායො. ජ වෙදනාකායා වෙදනාකායො. ජ සඤ්ඤාකායා සඤ්ඤාකායො. ජ චෙතනාකායා චෙතනාකායො ජ විඤ්ඤාණකායා විඤ්ඤාණකායො. සබ්බෙපි එතෙ ධම්මා ධම්මකායොති යෙව සඞ්ඛං ගච්ඡන්ති. අයං අධිට්ඨානො.

15. පරික්ඛාරොති: සමාපත්තිකොසල්ලං ච විපිකොසල්ලං ච හෙතු. යං ච ගොචරකොසල්ලං යං ච කල්ලතාකොසල්ලං[7] පච්චයො. වොදානකොසල්ලං හෙතු, කල්ලතාකොසල්ලං[8] පච්චයො. සුඛං හෙතු, අබ්‍යාපජ්ඣං[9] පච්චයො. අයං පරික්ඛාරො.

16. තත්ථ කතමො සමාරොපනො: යථා පඨවි සුචිම්පි නික්ඛිපනෙන අසුචිම්පි නික්ඛිපනෙන තාදිසායෙව,[10] එවං කායො මනාපිකෙහිපි එසෙහි අමනාපිකෙහිපි එසෙහි තාදිසොයෙව, පටිඝසම්ඵස්සෙන වා සුඛාය වෙදනාය තාදිසං යෙව චිත්තං. ඉදං සුත්තං විභත්තං සඋපමං[11] උග්ඝටිතඤ්ඤුස්ස පුග්ගලස්ස විභාගෙන. තත්ථ සමාරොපනාය අවකාසො නත්ථි.

---

1. සමචිත්තතං - මජසං.
2. ජිත්තකාදිනො - මජසං.
3. චිත්තතං - මජසං.
4. සබ්බකායගතාසති - PTS.
5. උප්පජ්ජෙය්‍යු - මජසං, PTS.
6. සන්තෙතසු ච - මජසංපොත්ථකෙ නත්ථි.
7. කල්ලං තං කොසල්ලං - මජසං. / කල්ලතාකො - PTS
8. කල්ලං - මජසං, PTS.
9. අබ්‍යාපජ්ජං - මජසං, PTS.
10. තාදිසෙ - මජසං, PTS.
11. ඔපම්මං - මජසං.

8. එහි විභත්තිහාර කවරෙ යැ : යමෙක් කායානුදර්ශී වැ වෙසේ ද, හේ පර්‍යවීසම චිත්තය ලබන්නේ යැ යනු ඒකාන්තයෙන් නැත. කරුණු කිම යත් : යම් කෙනෙක් බණ්ඩකාදි ඡන්නකාදි කර්ම කරන්නාහු වෙත් ද ඔහු පර්‍යවීසම චිත්තය නො ලබති. සියලු කායගතාසතිය ශෛක්ෂභාවනායෙහි නිර්වාණඵලය වේ. මේ විභත්තිහාර යි.

9. එහි පරිවත්තනහාර කවරෙ යැ : යම් කෙනෙක් කායානුදර්ශී වැ වාසයකරන්නාහු ද, ඔවුන්ට මැ කායප්‍රත්‍යයෙන් විඝාතපරිදාහකර වූ ආස්‍රවයෝ උපදනාහුය. මේ පරිවත්තන හාර යි.

12. එහි ඔතරණහාර කවරෙ යැ : සත්වයන් කෙරෙහිදු පඤ්ච ස්කන්ධයෝ අවිතීර්ණ වූවාහු දෙව්සි ඉන්ද්‍රියයෝ වෙත්. එසේ මැ යම් මනින්ද්‍රියයෙක් ඇද්ද එය මනොධාතු මනායතන ද වෙයි, යම් සමාධින්ද්‍රියයක් ඇද්ද එය ධම්මධාතු ධම්මායතන ද වේ. මේ ඔතරණහාර යි.

13. එහි සොධනහාර කවරෙ යැ : යම් සතර ධර්ම කෙනෙක් සිතින් වැඩිය යුත්තාහු ද, ඔහු සියල්ලෝ වඩනලද්දහු යමක් සිතින් (පහීනෙ පත්තබ්බතං ?) සියලු තැන්හි මෙ ද සඳහා ආරම්භය වෙයි. ඒ අර්ථය ශුද්ධ යැ. මේ සොධනහාර යි.

14. එහි අධිට්ඨානහාර කවරෙ යැ : මේ සමාධිය එකත්තතා සංඛ්‍යාත සාමාන්‍යයෙන් පනවනලද, ෂට්කායයෝ ඒකත්තතායෙන් පනවනලදහ. රූපී පඤ්චෙන්ද්‍රියයෝ රූප කාය යැ, ෂඩ්වෙදනාරාශිය වෙදනාකාය යැ, ෂට්සංඥාරාශිය සංඥාකාය යැ, ෂට්චෙතනාවෝ චෙතනාකාය යැ, ෂඩ්විඥානයෝ විඥානකාය යැ, තෙල සියලු මැ ධර්මයෝ ධර්මකාය යී මැ ගිණීමට යෙත්. මේ අධිට්ඨානහාර යි.

15. පරික්ඛාර යනු : සමාපත්ති කෞශල්‍යය ද ව්‍යුට්ඨානකෞශල්‍යය ද හේතු යැ, ගොචර කෞශල්‍යය ද කල්‍යතා (වශීභාවයෙහි) කෞශල්‍යය ද ප්‍රත්‍ය යැ. ව්‍යවදානකෞශල්‍යය හේතු යැ, කල්‍යතාකෞශල්‍යය ප්‍රත්‍යයැ, සුඛය හේතු යැ, නිදුක්ඛව ප්‍රත්‍ය යැ, මේ පරික්ඛාර හාර යි.

16. එහි සමාරොපන කවරෙ යැ : යම්සේ පෘථිවිය පවිත්‍ර ද බහාලන කල්හිදු අපවිත්‍ර ද බහාලන කල්හිදු එබඳු මැ වේ ද, එසෙයින් කය මනවඩන පහසින් ද අමනාපික පහසින් ද එබදු මැ වෙයි. පටිසසමඵස්සයෙන් හෝ සුඛවෙදනාවෙන් හෝ සිත එබඳු මැ වේ. උපමා සහිත වූ මේ සූත්‍රය උද්ඝටිතඥ පුද්ගලයාගේ විභාගයෙන් විභාග කරනලදි. එහි සමාරොපනයට අවකාශයෙක් නැති.

## 7 - 10

තත්ථ කතමං සුත්තං සඞ්කිලෙසභාගියං: යතො ච කුසලෙහි ධම්මෙහි න විරොධති, න වඩ්ඪති, ඉමං ආදීනවං භගවා දෙසෙති, "තස්මා ඡන්නං විවරෙථ,[1] එවං තං[2] නාතිවස්සති", තතො ආදීනවතො විවරෙය්‍යාති තං තීහි ධම්මෙහි නාභිධංසියාති අසුභසඤ්ඤාය රාගෙන නාභිධංසියති මෙත්තාය දොසෙන නාභිධංසියති, විපස්සනාය මොහෙන නාභිධංසියති. එවං ච සො[3] යො යො ධම්මො පටිපක්ඛො තම්හි තම්හි ධම්මෙ පරිපූරිස්සති. යො තස්ස ධම්මස්ස අකුසලො ධම්මො පටිපක්ඛො තෙන නාධිවාසියති.

අපරො පරියායො: යෙ ඉමෙ ධම්මා අත්ථානා න සක්කොති දිට්ඨානං තෙ එතෙ ධම්මා දෙසිතා ඡන්නමභිවස්සන්තීති. තෙහි විතක්කං යෙන ච සක්කා පුන දෙසිතං චිත්තං විභාවෙතුං පරියොදපෙතුං විවෙකනින්නස්ස විවෙකපොණස්ස විවෙකපබ්භාරස්ස වුද්ධිං විරූළ්හිං වෙපුල්ලතං ආපජ්ජති කුසලෙසු ධම්මෙසු, සෙය්‍යථාපි නාම උප්පලං වා කුමුදං වා පදුමං වා උදකෙ සුක්කපක්ඛෙ චන්දෙ යාව රත්ති යාව දිවසො ආගච්ඡති, තස්ස වුද්ධියෙව පාටිකඞ්ඛිතබ්බා, න පරිහානි එවං විධං තං චිත්තං නාභිධංසියති.

අපරොපෙත්ථ යො අසඨො අකුටො අමායාවී උජු පුරිසො යථාභූතං අත්තානං ආවිකරොති. තත්ථ යො ඡාදෙති, තස්ස අකුසලා ධම්මා චිත්තං අනුබන්ධෙන්ති[4] විවටං නාතිවස්සතීති[5] යො පන හොති අසඨො අකුටො අමායාවී උජු පුරිසො යථාභූතං අත්තානං ආවිකරෙති, තස්ස චිත්තං අකුසලෙහි ධම්මෙහි න විද්ධංසියති. අයං සුත්තත්ථො.

1 තත්ථ කතමා දෙසනා: ඉධ දෙසිතා දස අකුසලකම්මපථා අධිවස්සනතාය, දස කුසලකම්මපථා අධිවස්සනතාය[6] අකුසලෙහි න විසුජ්ඣති යථා වුත්තං භගවතා "චිත්තසඞ්කිලෙසා භික්ඛවෙ සත්තා සඞ්කිලිස්සන්තී"ති.

2. තත්ථ කතමො විචයො: යස්සෙවං චිත්තං අවිද්ධංසියති,[7] තස්ස බුජ්ඣිතස්ස යං භවෙය්‍ය කුටෙය්‍යං, තං ආනන්තරියෙනපි සත්ථරි වා ගුණානුකම්පනතාය. අයං විචයො.

3. තත්ථ කතමා යුත්ති[8]: එවං අවිද්ධංසියන්තං[9] චිත්තං වුට්ඨාති, වුට්ඨිතං පතිට්ඨහති කුසලෙසු ධම්මෙසූති අත්ථි එසා යුත්ති.

---

1. විවරෙය්‍ය – මජ්ඣං, PTS.
2. විවටං – මජ්ඣං, PTS.
3. චස්ස – මජ්ඣං, PTS.
4. අනුධාවන්ති – මජ්ඣං, PTS.
5 ඡන්නමතිවස්සතීති – මජ්ඣං, PTS
6. අනභිවස්සනතාය – මජ්ඣං, PTS
7. අධිවාසියති – මජ්ඣං, PTS
8. යුත්තීති – මජ්ඣං, PTS
9. අනධිවසියන්තං – මජ්ඣං, PTS.

## 7 – 10

එහි සංකිලෙසභාගිය සූත්‍රය කවරෙ යැ : යම් හෙයකින් කුශලධර්මයන් හා විරුද්ධ නො වෙද, නො වැඩේ ද, බුදුහු මේ ආදීනවය දෙසනසේක. " එහෙයින් පිළිසන් වූ ඇවත ප්‍රකට කරන්නෝ යැ, මෙසේ ඒ ඇවැත් ඇතියහු කෙලෙස්වැයි අතිශයින් නො තෙමයි." ඒ ආදීනව හෙයින් විවෘත කරන්නෝ යයි හේ තුන් දහමකින් නො මඩනා ලද වෙයි. අශුභසංඥාවෙන් රාගය විසින් නො මඩනාලැබෙයි. මෛත්‍රීභාවනායෙන් ද්වේෂය විසින් නො මඩනාලැබෙයි, විදර්ශනායෙන් මොහය විසින් නො මඩනා ලැබේ. මෙසේ හෙතෙම යම් යම් ධර්මයෙක් ප්‍රතිපක්ෂ වේ නම් ඒ ඒ ධර්මයෙහි පරිපූර්ණ වන්නේය. ඒ ධර්මයට යම් අකුශලධර්මයෙක් ප්‍රතිපක්ෂ වේ නම් (තෙන නාධිවායියති ?)

අනෙකුදු පරියායයෙක් වෙයි : යම් මේ ධර්ම කෙනෙක් තමා විසින් නැඟීසිටීමට නො හැකි වෙත්ද, තෙල ධර්මයෝ දෙසනලදහ. " ජන්නමතිවස්සති " යි. (තෙහි විතක්කං ?) යමකු විසින් යළි දෙසනලද චිත්තය දක්වන්නට පිරිසිදු කරන්නට හැකි වෙද, විවෙකයට නැමුණු විවෙකයට ප්‍රවණ වූ විවෙකයට බරවූවහුගේ සිත කුශලධර්මයන්හි වැඩීමට මහත්බවට පැමිණෙයි. යම්සේ ජලයෙහි හටගත් උපුලක් හෝ කුමුදක් හෝ පියුමක් හෝ ශුක්ලපක්ෂයෙහි චන්ද්‍රයා යම් රැයකට යම් දිනයකට පැමිණේ නම් (එකල්හි) ඒ පද්මයාගේ වැඩීමම කැමැතිවිය යුත්තී ද, පරිහානියෙක් නොවේ ද, එබඳු ව ඒ සිත නො මඩනාලැබෙයි.

මෙහි අනාය වූද යමෙක් සය නොවූයේ කූට නොවූයේ මායා රහිත වූයේ වේ ද ඍජු පුරුෂවූ හෙතෙම ඇතිසැටියෙන් තමා ප්‍රකාශ කෙරෙයි. එහි යමෙක් (ඇවත) වසා නම් අකුශල ධර්මයෝ ඔහුගේ සිත වනසති. " විවටං නාතිවස්සති " යනු වැලි යමෙක් සය නොවේ ද, කූට නොවේ ද, මායා රහිත වෙද, ඍජු පුරුෂ වූයේ යථාභූත වැ තමා ප්‍රකාශ කෙරේද, ඔහුගේ සිත අකුශලධර්මයන් විසින් නො මඩනාලැබේ. මේ සූත්‍රාර්ථ යි.

1. එහි දේශනා කවර යැ : මෙහි අධිවස්සනතායෙන් දශ අකුශලකර්මපථයෝ දෙසනලද්දහු ය, අනාධිවස්සනතායෙන් දශ කුශලකර්මපථයෝ දෙසනලද්දහු ය, (ක්ලෙශ යන්ගේ) අධිවර්ෂණභාවයෙන් අකුශලයන්ගෙන් විශුද්ධ නොවේ. භාග්‍යවතුන් විසින් වදරනලද මැය : " මහණෙනි සිත කිලිටිවීමෙන් සත්වයෝ කෙලෙසෙන්නාහුය" යි.

2. එහි විචය කවරෙ යැ : මෙසේ යමකුගේ සිත (කෙලෙසුන් විසින්) නො මඩනා ලැබේ ද, (තස්ස බුජ්ඣිතස්ස . . . . සත්ථරි වා ගුණානුකම්පනතාය ?) මේ විචය යි.

3. එහි යුක්ති කවර යැ : මෙසේ නො මඩනාලබන සිත කෙලෙසුන් කෙරෙන් නැඟිසිටී, නැඟිසිටියේ කුශලධර්මයන්හි පිහිටා යයි. මේ යුක්ති ඇත.

4. පදට්ඨානන්ති : "ඡන්නමතිවස්සතී"ති ඡන්නං අසංවරානං පදට්ඨානං, "විවටං නාතිවස්සතී"ති අච්ඡන්නං සංවරණානං "තස්මා ඡන්නං විවරෙථ විවටං නාතිවස්සතී"ති දෙසනාය පදට්ඨානං.

5. ලක්ඛණොති : "ඡන්නමතිවස්සතී"ති යෙ කෙචි විච්ඡන්නෙන ඡන්නෙන එකලක්ඛණා ධම්මා සබ්බෙ තෙ විද්ධංසියන්ති.[1] "තස්මා ඡන්නං විවරෙථ විවටං නාතිවස්සතී"ති යෙ කෙචි තෙන අච්ඡන්නෙන එකලක්ඛණා ධම්මා සබ්බෙ තෙ නාතිවස්සන්තී"ති. ලක්ඛණො හාරො.

6. තත්ථ කතමො චතුබ්‍යූහො හාරො ; ඉමම්හි සුත්තෙ භගවතො කො අධිප්පායො : යෙසං කෙසඤ්චි චිත්තං අකුසලා ධම්මා අධිපටිදෙසිතා තෙ යථාධම්මං පටිකරිස්සන්තීති අයං තත්ථ භගවතො අධිප්පායො, අයං චතුබ්‍යූහොහාරො.

7. ආවට්ටොති : යං ඡන්නං තං දුවිධං කම්පමානං[2] සමුච්ඡිතබ්බං, ආනන්තරියසමාධිනං. තත්ථ පස්සද්ධියං ච මානො ආසවෙ වඩ්ඪෙති. අස්සද්ධියෙන ච පමාදං ගච්ඡති. පමාදෙන ඔනමති, උන්නලභාවං ගච්ඡති. වුත්තං හෙතං භගවතා "උන්නළානං පමත්තානං තෙසං වඩ්ඪන්ති ආසවා"ති. චත්තාරි තානි උපාදානානි, යානි චත්තාරි උපාදානානි තෙ පඤ්චුපාදානක්ඛන්ධා භවන්ති. ඉමානි සච්චානි දුක්ඛං ච සමුදයො ච. "තස්මා ඡන්නං විවරෙථා"ති යෙන හෙතුනා තෙ ආසවා වඩ්ඪන්ති, තෙසං පහීනත්තා ආසවා පහීයන්තෙ, තත්ථ අප්පමාදෙන අස්සද්ධියං පහීයති, උද්ධච්චකුක්කුච්චප්පහානෙන ඔළාරිකතා, තස්ස ද්වෙ ධම්මා සමථො ච භාවනා ච පාරිපූරිං ගච්ඡන්ති. යො තෙසං ආසවානං ඛයො, අයං නිරොධො. ඉමානි චත්තාරි සච්චානි. අයං ආවට්ටො.

8. තත්ථ කතමො විභත්තිහාරො : "ඡන්නමතිවස්සතී"ති න එකංසො, කිං කාරණං : යස්ස අස්සා නිවත්තනා යථාපි සෙඛානං, යථා වුත්තං භගවතා :

"කිඤ්චාපි සො කම්මං කරොති පාපකං*
කායෙන වාචා[3] උද චෙතසා වා
අභබ්බො[4] සො තස්ස පටිච්ඡාදාය[5]
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා"ති.[6]

කිඤ්චාපි තෙසං නිවාරණං චිත්තං හොති, අපි තු අප්පච්චයා සමායෙ ච තෙ නිද්දිසිතබ්බා. අයං විභත්තිහාරො.

9 තත්ථ කතමො පරිවත්තනො හාරො : "ඡන්නමතිවස්සතී"ති යස්ස යෙ ධම්මා සබ්බං අනවිවටං අතිවස්සියන්ති විවටං නාතිවස්සති අවගුණ්ඨනං නාතිවස්සති. අයං පරිවත්තනො හාරො.

---

1. අවිද්ධංසියන්ති – මජසං, PTS.
*. සුත්තනිපාත – රතනසුත්ත.
2 කම්මමානං – PTS.,
4. අභබ්බො හි – මජසං, PTS.
3. වාචාය – මජසං, PTS.
5. පරිගුහනාය – ම, PTS.
6. හොතීති – මජසං, PTS.

4. පදට්ඨාන යනු : '' ඡන්නමතිවස්සති යනු : ඇවැත් වැසීම අසංවරයන්ට පදට්ඨාන යැ, '' විවටං නාතිවස්සති '' යනු : නො වැසීම සංවරයන්ට පදට්ඨාන යැ, තස්මා ඡන්නං විවරෙථ විවටං නාතිවස්සති '' යනු දෙසනාවට පදට්ඨාන යි.

5. ලක්ඛණ යනු : '' ඡන්නමතිවස්සති '' යනු : විචිත්‍ර වූ ඡන්නයෙන් සමාන ලක්ෂණ වූ යම් කිසි ධර්ම කෙනෙක් ඇද්ද ඒ සියල්ලෝ මඩනාලැබෙත්. '' තස්මා ඡන්නං විවරෙථ විවටං නාතිවස්සති '' යනු : ඒ නො වැසීමෙන් සමාන ලක්ෂණ වූ යම් කිසි ධර්ම කෙනෙක් ඇද්ද ඒ සියලු ධර්මයෝ (කෙලෙසුන් විසින්) අතිශයින් නො තෙමෑ යයි. ලක්ඛණහාර යි.

6. එහි චතුබ්‍යූහහාර කවරෙ යැ : මේ සූත්‍රයෙහි ලා භාග්‍යවතුන් වහන්සේගේ අභිප්‍රාය කවරෙ යැ : යම් කිසි කෙනකුන්ගේ සිත අකුශලධර්මයෝ (අධිපටිදෙසිතා ?) ඔහු දහම් වූ පරිදි පිළියම් කරන්නාහුය යන මේ එහි භාග්‍යවතුන් වහන්සේගේ අභිප්‍රාය යි. මේ චතුබ්‍යූහහාර යි.

7. ' ආවත්ත ' යනු : ඡන්න වූ යම් (සිතක්) ඇද්ද එය ද්විවිධ යැ, (කම්පමානං . . . . පස්සද්ධියං ච ?) මානය ආස්‍රවයන් වඩයි. අශ්‍රද්ධායෙන් ප්‍රමාදයට යෙයි, ප්‍රමාදයෙන් අවනමිත වෙයි, උද්ගත මානනළ ඇති බවට යෙයි, භාග්‍යවතුන් විසින් තෙල වදරනලද මැය : '' උද්ගත මානනළ ඇති ප්‍රමත්ත වූ ඔවුන්ට ආස්‍රවයෝ වැඩෙත් '' යයි. ඒ ආස්‍රවයෝ සතර උපාදන වෙති, ඔහු පඤ්ච උපාදනස්කන්ධයෝ වෙත්. මේ දුක්ඛ සමුදය යන සත්‍යයෝ යි. '' තස්මා ඡන්නං විවරෙථ '' යනු : යම් හෙයකින් ඒ ආස්‍රවයෝ වැඩෙත් ද, ඔවුන් ප්‍රහීණ හෙයින් ආස්‍රවයෝ ප්‍රහීණ වෙත්. එහි අප්‍රමාදය හේතු කොට අශ්‍රද්ධාව ප්‍රහීණ වෙයි. උද්ධච්ච කුක්කුච්චයන්ගේ ප්‍රහාණයෙන් ඖදරික බව ප්‍රහීණ වෙයි, ඔහුට සමථය ද භාවනා ද යන ධර්මයෝ දෙදෙන පිරීමට යෙත්. ඒ ආස්‍රවයන්ගේ යම් ගෙවීමෙක් වේද මේ නිරොධ යැ, මේ සතර සත්‍යයෝ යි. මේ ආවට්ටහාර යි.

8. එහි විභත්තිහාර කවරෙ යැ : '' ඡන්නමතිවස්සති '' යනු ඒකාන්ත නො වෙයි. කරණු කිම යත් : (යස්ස අස්සා නිවත්තනා යථාපි සෙඛානං ?) භාග්‍යවතුන් විසින් වදරනලද :

ශෛක්ෂ පුද්ගල යම් හෙයකින් කයින් වචනයෙන් සිතින් හෝ අකුශලයක් කරන්නේ නමුදු ඒ පාපය සැඟවීමට හේ අභව්‍ය වෙයි. දක්නාලද නිර්වාණපද ඇත්තහුගේ (පාපය සැඟවීමෙහි) අභව්‍යබව වේ යයි. යම් හෙයකින් ඔවුන්ගේ නිවාරණ චිත්තය වේ ද, එතෙකුදුවත් (අප්පච්චයා සමායෙ ච ?) ඔහු දුක්විය යුත්තාහුය. මේ විභත්තිහාර යි.

9. එහි පරිවත්තනහාර කවරෙ යත් : '' ඡන්නමතිවස්සති '' යනු : යමකුගේ (යෙධම්මා ?) සියලු අකුශලය අවිවෘත වේ ද, හේ කෙලෙස්වැස්සෙන් අතිශයින් තෙමනු ලැබෙයි. විවෘත කළ ඇවැත් ඇත්තහු අතිශයින් නො තෙමයි. (අවගුණං තං නාති වස්සති ?) මේ පරිවත්තනහාර යි.

10. තත්ථ කතමො වෙවචනො හාරො: ජහානාති ආවුතං නිවුතං පිහිතං පටිකුජ්ජිතං සඤ්ඡන්නං පරොධං, විවටං නාතිවසන්තී''ති යස්ස තෙ ධම්මා පබ්බජ්ජිතා විනොදං නාධිවසිතා එතාතිකතාති.[1] අයං වෙවචනො හාරො:

11. තත්ථ කතමො පඤ්ඤත්ති හාරො: ''ජහාමතිවසන්තී''ති කිලෙසභාගියපඤ්ඤත්තං. 'විවටං නාතිවසන්තී'ති සධම්මසච්චං යං පටිපදපඤ්ඤත්තියා පඤ්ඤත්තං ''තස්මා ඡන්නං විවරෙථ,''ති අනුසාසනපඤ්ඤත්තියා පඤ්ඤත්තං. ''විවටං නාතිවස්සතී''ති නික්ඛෙප[2]පඤ්ඤත්තියා පඤ්ඤත්තං. අයං පඤ්ඤත්ති හාරො.

12. තත්ථ කතමො ඔතරණො හාරො: 'ජහාමතිවසන්තී'ති තයො කිලෙසා. රාගො දොසො මොහො, තෙසු[3] ජහනසු සඞ්ඛාරක්ඛන්ධො -පෙ- තෙ පුරා යථා නිද්දිට්ඨං ඛන්ධධාතුආයතනෙසු අයං ඔතරණො හාරො.

13. තත්ථ කතමො සොධනො හාරො: යෙනාරම්භෙන ඉදං සුත්තං භාසති සො ආරම්භො නියුත්තො.

14. අධිට්ඨානොති: 'ජහාමතිවසන්තී'ති එකත්තතාය පඤ්ඤත්තං, කිං කාරණං: ඉදං හි අතිවස්සතීති ඉමස්ස ච අතිවස්සති එවං ච අතිවස්සතීති අයං වෙමත්තතාය යා පුනසාධාරණෙහි ලක්ඛණෙහි පඤ්ඤපියති. සා එකත්තපඤ්ඤත්ති

15 තත්ථ කතමො පරික්ඛාරො: යං ච තං අතිවස්සීයන්ති, තස්ස ද්වෙ හෙතු ද්වෙ පච්චයා අකුසලපසුතෙව වාචකත්තාභිරති ච. ඉමෙ ද්වෙ අයොනිසොමනසිකාරො ච. කුසලා ධම්මා වොපසග්ගා ච. ඉමෙ ද්වෙ පච්චයා.

16. තත්ථ කතමො සමාරොපනො: ''ජහාමතිවස්සතී''ති වෙමති පස්සතීති ජහනං යං පරිගහිතුං යං අදෙසිතුං අප්පස්සුතං යං කථංකථා විභූතෙන අකුසලමූලෙන යං තණ්හාය ච තෙ වඩ්ඪන්ති ඡදනාති සභාගිකා, තෙ අප්පහක්ඛයෙන සඞ්ඛාරා සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, අයං සමාරොපනො. යං පුන තථා දෙසනා, තස්සෙව කුසලා[4] ධම්මා වුද්ධිං විරූළ්හිං වෙපුල්ලතමාපජ්ජති. තස්ස සඞ්ඛාරනිරොධා[5] අයං සමාරොපනො

## 7 - 11

''චත්තාරො පුග්ගලා: තමො තමපරායනො''ති[a] -පෙ- තත්ථ කතමො වුච්චතෙ තමො නාම: යො තමො අන්ධකාරො, යථාවුත්තං භගවතා 'යථා අන්ධකාරො තස්මිං භයානකෙ සකම්පිධාතුපුරිසො න පස්සති එවමෙව අඤ්ඤාණතො තමො පනන්ධකාරො පාපකානකම්මනවිපාකං න සන්ධො හොති (?) ඉති එවං ලක්ඛණතො අඤ්ඤාණං තමො අවිජ්ජා මොහො, යෙන සත්තා යථාභූතං නප්පජානන්ති, ඉති වුච්චති තමො'ති.

---

1. එතන්කතා'ති – මජසං, PTS.
2. ජද්ධාන – මජසං, PTS.
3. තෙ – මජසං, PTS.
4. අකුසලා – මජසං, PTS.
5. සංඛාරා නිරොධා – මජසං, PTS.
a. අඞ්ගුත්තර.

10. එහි වෙවචනහාර කවරෙ යැ : '' ඡන්නං '' යනු : ආවුත යැ නිවුත යැ පිහිත යැ පටිකුජ්ජිත යැ සඤ්ඡන්න යැ පරොධ යැ (මේ වෙවචන යැ) '' විවටං නාතිවස්සති '' යනු : (යස්ස තෙ . . . . වන්තිකතාති ?) මේ වෙවචනහාර යි.

11. එහි පඤ්ඤත්තිහාර කවරෙ යැ : '' ඡන්නමතිවස්සති '' යනු : කෙලෙස් කොටසින් පනවනලද, '' විවටං නාතිවස්සති '' යනු : (සධම්මකිච්චං යං ?) ප්‍රතිපද ප්‍රඥප්තියෙන් පනවන ලද, '' තස්මා ඡන්නං විවරෙථ '' යනු : අනුශාසනා ප්‍රඥප්තියෙන් පනවන ලද, '' විවටං නාතිවස්සති '' යනු : නික්ෂෙපප්‍රඥප්තියෙන් පනවන ලදී. මේ ප්‍රඥප්තිහාර යි.

12. එහි ඔතරණහාර කවරෙ යැ : '' ඡන්නමතිවස්සති '' යනු : රාග දෙස මොහ යන තුන් ක්ලේශයෝ යැ, ඔවුන් වැසුණු කල්හි සංඛාරක්ඛන්ධ වෙයි, . . . . ඔහු ඛන්ධ ධාතු ආයතනයන්හි පළමු දක්වනලද පරිදි වෙත්. මේ ඔතරණහාර යි.

13. එහි සොධනහාර කවරෙ යත් : යම් ආරම්භයෙකින් මේ සූත්‍රය වදරත්ද, ඒ ආරම්භය දක්වන ලදී.

14. අධිට්ඨාන යනු : '' ඡන්නමතිවස්සති '' යනු : එකත්තතා (සාමාන්‍යයෙන්) පනවනලද, කරණු කිම යත් : '' අතිවස්සති '' යන මේ යම් හෙයකින් වැසුණු ඇවැත් ඇති මොහු කෙලෙස්වැයි අතිශයින් තෙමයි, මෙසේත් අතිශයින් තෙමා යයි මේ වෙමත්තතා යෙන් වදරනලද ද එහෙයිනි, යම් ප්‍රඥප්තියක් සාධාරණ ලක්ෂණයෙන් පනවනු ලබා ද ඒ ඒ පැනැවීම එකත්තපඤ්ඤත්ති වේ.

15. එහි පරික්ඛාර කවරෙ යත් : (යං ච තං අතිවස්සියන්ති . . . . ඉමෙ දෙව පච්චයා ? මෙහි වාක්‍යය මුළුල්ල ව්‍යාකුල යැ.)

16. එහි සමාරොපන කවරෙ යත් : '' ඡන්නමතිවස්සති '' යනු : (වෙමත්ත පස්සතීති . . . . අප්පසක්ඛයෙන සංඛාරා ? මේ වාක්‍යය ද අතිශයින් ව්‍යාකුල යි.) සංඛාරප්‍රත්‍ය යෙන් කර්මවිඥානය වෙයි. මේ සමාරොපන යැ, යළි (තථා දෙසනා ?) ඔහුට මැ කුශලධර්මයෝ වැඩීමට නැඟීමට විපුලබවට පැමිණෙයි. ඔහුට සංඛාරනිරොධයෙන් (කර්මවිඥානයාගේ නිරොධය වෙයි.) මේ සමාරොපන යි.

7 — 11

පුද්ගලයෝ සතරදෙනෙකි : (නීචකුලයෙහි ඉපදීම් ආදි) අඳුරෙන් යුක්ත වූ (කාය දුශ්චරිතාදියෙන් යළි) නිරයඅඳුරට යන පුහුලා යැ . . . . (යනාදි චතුක්කංගුත්තරයෙහි සූත්‍රය.) එහි ' තම ' නම් කවරෙ යැ : යම් තමසෙක් අන්ධකාරයෙක් වේ ද එය යි. භාග්‍යවතුන් විසින් මෙසේ වදරනලද : '' බිය එළවන ඒ අඳුරෙහි පුරුෂ ස්වකීය ස්වභාවය පවා නො දකී ද, එසෙයින් ම නො දැනීමෙන් තම සංඛ්‍යාත මොහඳුර ඇතියෙ සවිපාක වූ ලාමක අකුශලකර්මය නො දකී ? මෙබඳු ලක්ෂණ ඇති අවිජ්ජා මොහ නම්වූ නො දැනීම ' තම ' නම් වේ. යම් හෙයකින් සත්වයෝ යථාභූත වැ (ඇතියැටීයෙන්) නො දනිත්ද, එහෙයින් ' තම ' යයි කියනු ලැබේ.

සො තිණ්ණං චක්ඛූනං තමො: මංසචක්ඛුනො දිබ්බචක්ඛුනො පඤ්ඤාචක්ඛුනො, ඉමෙසං චක්ඛූනං ඉධ තමො නිද්දිසියති[1] අඤ්ඤාණන්ති.

තත්ථ කතමං අඤ්ඤාණං අදස්සනං: අථ තිස්සයෙ යං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං, හෙතුම්හි අඤ්ඤාණං පච්චයම්හි අඤ්ඤාණං තස්ස අඤ්ඤාණිනො සමාධිභූතස්ස එසො නිස්සන්දො: යං න ජානාති ඉදං සෙවිතබ්බං ඉදං න මනසිකාතබ්බන්ති. සො තෙන තමෙන නිද්දිසියති, තමොපි යථා වුච්චති. මූළ්හොති එවං චෙතනා, තෙන තමෙන සො පුග්ගලො වුච්චති තමොති, සො තෙන තමෙන අසමූහතෙන අසමුච්ඡින්නෙන තප්පරමො භවති තප්පරායනො, අයං වුච්චති පුග්ගලො තමො තම-පරායනොති. පරායනොයෙව ධම්මා මනසිකාතබ්බා යො තමො දහති අඤ්ඤාචිත්තං උපට්ඨපෙති, තෙ චස්ස ධම්මා නිජ්ඣානං ඛමන්ති.[2] සො සුතමයාය පඤ්ඤාය සමනුපස්සති:

තත්ථ කතමො තමො ජොතිපරායනො, සො තෙන පඤ්ඤාවසෙන ඉරියති[3] එවං තස්සෙව ඉරියන්තස්ස පරායනො භවති. අයං වුච්චතෙ පුග්ගලො තමො ජොතිපරායනො.

තත්ථ කතමො පුග්ගලො තමො ජොතිපරායනො: තත්ථ වුච්චති ජොති නාම: යං තස්සෙව තමස්ස පටිපක්ඛෙන යෙ ච ධම්මා[4] අනන්තමසො ඤාණාලොකො, සො සුතධම්මො[5] පුග්ගලො තමො ජොති-පරායනො, තත්ථ වුච්චතෙ: සො'යං පුග්ගලො තමො ජොතිපරායනො, සො යදි තථාරූපං කල්‍යාණමිත්තං[6] පටිලභති, යො නං අකුසලතො ච නිවාරෙති භාවිතකුසලතාව භාවී (?) නියොජෙතීති.

එවං ච සද්ධම්මං දෙසෙති: ඉමෙ ධම්මා කුසලා, ඉමෙ ධම්මා අකුසලා, ඉමෙ ධම්මා සාවජ්ජා, ඉමෙ ධම්මා අනවජ්ජා, ඉමෙ ධම්මා සෙවිතබ්බා, ඉමෙ ධම්මා න සෙවිතබ්බා, ඉමෙ ධම්මා භජිතබ්බා, ඉමෙ ධම්මා න භජිතබ්බා, ඉමෙ ධම්මා උපසම්පජ්ජ විහාතබ්බා, ඉමෙ ධම්මා න උපසම්පජ්ජ විහාතබ්බා, ඉමෙ ධම්මා මනසිකාතබ්බා, ඉමෙ ධම්මා න මනසිකාතබ්බාති. පච්චතෙ සඤ්ඤාය යථා සඤ්ඤායති සතින්ද්‍රියානි (?) සො එවං පජානාති: ඉමෙ ධම්මා කුසලා ඉමෙ ධම්මා අකුසලා. ඉමෙ ධම්මා සාවජ්ජා, ඉමෙ ධම්මා අනවජ්ජා, ඉමෙ ධම්මා සෙවිතබ්බා, ඉමෙ ධම්මා න සෙවිතබ්බා. ඉමෙ ධම්මා භාවෙතබ්බා, ඉමෙ ධම්මා න භාවෙතබ්බා, ඉමෙ ධම්මා උපසම්පජ්ජ විහාතබ්බා, ඉමෙ ධම්මා න උපසම්පජ්ජ විහාතබ්බා. ඉමෙ ධම්මා මනසිකාතබ්බා, ඉමෙ ධම්මා න මනසිකාතබ්බාති. සො තෙ ධම්මෙ සුස්සූසති[7] සොතං ඔදහති, අඤ්ඤාචිත්තං[8] උපට්ඨාපෙති,[9] තෙ චස්ස ධම්මා නිජ්ඣානං ඛමන්ති, සො සුතමයාය පඤ්ඤාය සමන්නාගතො, සො තෙන පච්චයවසෙන ඉරියති[10] එවං සො ඉරියන්තො[11] තප්පරමො භවති තප්පරායනො. අයං වුච්චතෙ පුග්ගලො තමො ජොතිපරායනො.[12]

1. නිද්දිසියති – ම, PTS.
2. නිජ්ඣානක්ඛමන්ති – මජසං, PTS.
3 ඉරියති – ම, PTS.
4. යෙ ච ධම්මෙ – මජසං, PTS.
5. සුණධම්මො – මජසං, PTS.
6. කල්‍යාණමිත්තං – මජසං, PTS.
7 { සුසූය්‍යති – මජසං. / සුය්‍යති – PTS.
8. අඤ්ඤ චිත්තං – මජසං, PTS.
9. උපට්ඨපෙති – මජසං, PTS.
10. ඉරියති – මජසං, PTS.
11. තස්සෙව ඉරියන්ති – මජසං, PTS.
12. ජොතිජොතිපරායනො – මජසං, PTS

එය මංසචක්ඛු දිබ්බචක්ඛු පඤ්ඤචක්ඛු යන තුන් චක්ෂුන්ගේ අඳුර යැ, මෙහි මේ තුන් චක්ෂුන්ගේ නො දැනීම ' තම ' යයි දක්වනුලැබේ.

එහි අඤ්ඤාණ සංඛ්‍යාත අදර්ශනය කවරේ යැ : (අඨ නිස්සයෙ ?) පූර්වාන්තයෙහි නොදැනීම යැ අපරාන්තයෙහි නො දැනීම යැ පූර්වාන්තාපරාන්තයෙහි නො දැනීම යැ, හෙතුයෙහි නො දැනීම යැ ප්‍රත්‍යයෙහි නො දැනීම යැ යන යම් නො දැනීමෙක් ඇද්ද එයයි. ඒ නො දන්නහුගේ (සමාධිභූතස්ස ?) තෙල එලය වෙයි : මේ සෙවියැ යුතු යැ, මේ නො මෙනෙහි කළයුතු යැයි යම් නො දැනීමක් ඇද්ද ඒ පුද්ගල ඒ නොදැනීම හෙතුකොට තමසින් යුක්ත යයි දක්වනු ලැබේ. (සො තෙ නමෙන .... වුච්චති තමොති ?) හෙතෙම නො නසනලද සමුච්ජෙද නො කරනලද ඒ තමස හේතු කොට එය (නොදැනීම) පරම කොට ඇත්තේ එය පරායන කොට ඇත්තේ වෙයි. මේ පුද්ගල ' තමොතමපරායන ' යයි කියනු ලැබේ. (පරායනො යෙව ධම්මො මනසිකාතබ්බො ?) යමෙක් තම සංඛ්‍යාත නො දැනීම දුරුකෙරේ ද දැනීමට සිත එළවා ද ඔහුට ඒ ධර්මයෝ දර්ශනය වටහත්. හෙතෙම ශ්‍රුතමය ප්‍රඥයෙන් දකී.

එහි ' තමොජොතිපරායන ' පුද්ගල කවරෙ යත් : හෙතෙම ඒ ප්‍රඥවශයෙන් පවතී. මෙසේ පවත්නාවූ ඔහුට (ස්වර්ග සංඛ්‍යාත අලොකය) පරායන වෙයි. මේ පුද්ගල (අඳුරෙන් එළියට යන) තමොජොතිපරායන යයි කියනුලැබේ.

එහි ජොතිජොතිපරායන (එළියෙන් එළියට යන) පුද්ගල කවරෙ යත් : එහි ලා කියනු ලැබේ. ජොති නම් : ඒ තමසට ප්‍රතිපක්ෂවශයෙන් යම් ධර්ම කෙනෙක් වෙත් ද, යටත් පිරිසෙයින් ඥනාලොකය යි. ඒ ඇසූ දහම් ඇති පුද්ගල ' තමොජොතිපරායන ' යැ, එහි මේ පුද්ගල තමොජොතිපරායන යයි කියනු ලැබේ. හේ ඉදින් එබඳු වූ කලණ මිතුරකු ලබා ද, යමෙක් ඔහු අකුශලයෙන් වළකා ද භාවිතකුශලතායෙහි යොදවා ද, එබඳු වූ කලණ මිතුරෙකි.

මෙසේත් සදහම් දෙසයි : ' මේ දහම් කුසල් යැ මේ දහම් අකුසල් යැ මේ දහම් සාවද්‍ය යැ මේ දහම් අනවද්‍ය යැ මේ දහම් සෙවියැයුතු යැ මේ දහම් නො සෙවියැයුතු යැ මේ දහම් භජනය කළයුතු යැ මේ දහම් භජනය නො කළයුතු යැ මේ දහම් උපදවා විසියැයුතු යැ මේ දහම් උපදවා නො විසියැයුතු යැ මේ දහම් මෙනෙහි කළයුතු යැ මේ දහම් නො මෙනෙහි කළයුතු යැ ' යි (පච්චතෙ සඤ්ඤය යථා සඤ්ඤයති සතින්ද්‍රියානි ?) හේ මෙසේ දැනගනී : ' මේ දහම්හු කුශලයෝ යැ මේ දහම්හු අකුශලයෝ යැ මේ දහම්හු සාවද්‍යයෝ යැ මේ දහම්හු අනවද්‍යයෝ යැ මේ දහම්හු සෙවිතව්‍යයෝ යැ මේ දහම්හු න සෙවිතව්‍යයෝ යැ මේ දහම්හු වැඩියයුත්තාහු යැ මේ දහම්හු නො වැඩියැයුත්තාහු යැ මේ දහම්හු උපදවා විසියයුත්තාහු යැ මේ දහම්හු උපදවා නො විසියැයුත්තාහු යැ මේ දහම්හු මෙනෙහි කළ යුත්තාහු යැ මේ දහම්හු නො මෙනෙහි කළයුත්තාහු යැ' යි. හේ ඒ දහම් අසනු කැමැති වෙයි. ඇසීමට කන නමයි, දැනගැනීමට සිත එළවයි. ඔහුට ඒ ධර්මයෝ දැනීම වටහත්. හේ ශ්‍රුතමයඥනයෙන් සමන්විත වූයේ, හේ ඒ ප්‍රත්‍යය වශයෙන් පවතී. මෙසේ පවත්නාවූ හෙතෙම එය පරම කොට ඇත්තේ එය පිහිට කොට ඇත්තේ වෙයි. මේ පුද්ගල තමො ජොතිපරායන යයි කියනු ලැබේ.

තත්ථ කතමො පුග්ගලො ජොති තමපරායණො: ජොති නාම යං තස්සෙව තමස්ස පටිපක්ඛෙන යෙ ධම්මා අනන්තමසො ඤාණාලොකො, සො සුතධම්මො[1] කතමො උච්චතෙ පඤ්ඤායතෙ පණ්ඩිතොති වුච්චතෙ, සො එවං පජානාති: ඉමෙ ධම්මා කුසලා, ඉමෙ ධම්මා අකුසලා, ඉමෙ ධම්මා සාවජ්ජා, ඉමෙ ධම්මා අනවජ්ජා, ඉමෙ ධම්මා සෙවිතබ්බා, ඉමෙ ධම්මා න සෙවිතබ්බා, ඉමෙ ධම්මා භාවෙතබ්බා[3]. ඉමෙ ධම්මා න භාවෙතබ්බා, ඉමෙ ධම්මා උපසම්පජ්ජ විහාතබ්බා, ඉමෙ ධම්මා න උපසම්පජ්ජ විහාතබ්බා, ඉමෙ ධම්මා මනසිකාතබ්බා, ඉමෙ ධම්මා න මනසිකාතබ්බාති. ඉධ පන පාපමිත්තසංසෙවනො පාපමිත්තවසානුගො අකුසලෙ ධම්මෙ අභිවඩ්ඪෙති, කුසලෙ ධම්මෙ පජහති සො තෙන පමාදෙන පච්චයසඤ්ඤා අමනසිකාරා අසති[4] අසම්පජඤ්ඤං ආසෙවති. තයා යො පටිපක්ඛො තමො, සො තං[5] පවඩ්ඪෙති. සො තමාභිභූතො තමපරායණො[6] තමපරමො චෙව භවති. අයං වුච්චති පුග්ගලො ජොති තමපරායණො.

තත්ථ කතමො පුග්ගලො ජොති ජොතිපරායණො: තත්ථ වුච්චතෙ: සොයං පුග්ගලො කල්‍යාණමිත්තස්ස සන්නිස්සිතො භවති සක්කා සංයොගී (?) කුසලං ගවෙසී සො කල්‍යාණමිත්තෙන උපසඞ්කමිත්වා පරිපුච්ඡති, පරිපඤ්හයති, කිං කුසලං? කිං අකුසලං? කිං සාවජ්ජං, කිං අනවජ්ජං? කිං සෙවිතබ්බං, කිං න සෙවිතබ්බං? කිං භාවෙතබ්බං[7] කිං න භාවෙතබ්බං? කිං උපසම්පජ්ජ විහාතබ්බං, කිං න උපසම්පජ්ජ විහාතබ්බං? කිං මනසිකාතබ්බං, කිං න මනසිකාතබ්බං? කථං සංකිලෙසො හොති, කථං වොදානං හොති? කථං පවත්ති හොති කථං නිවත්ති හොති? කථං බන්ධො[8] හොති, කථං මොක්ඛො හොති? කථං සක්කායසමුදයො හොති, කථං සක්කායනිරොධො හොතීති?

සො එත්ථ දෙසිතං යථා උපට්ඨිතං තථා සම්පටිපජ්ජන්තො සො එවං පජානාති: ඉමෙ ධම්මා කුසලා ඉමෙ ධම්මා අකුසලා – පෙ එවං[9] සක්කායසමුදයො හොති, එවං[9] සක්කායනිරොධො හොතීති. (විත්ථාරෙන කාතබ්බං.) සො තෙ ධම්මෙ අභිපාටිකඞ්ඛති, එවං ලක්ඛණං ඤාණං විජ්ජාආලොකං වඩ්ඪෙති සො පුග්ගලො තපපරමො භවති තපපරායණො. අයං වුච්චතෙ පුග්ගලො ජොති ජොතිපරායණො.

තත්ථ කතමො පුග්ගලො තමො තමපරායණො: යො අකුසලං ධම්මං දීපෙති, තං භාවනාය හීනාසු ගතීසු උප්පත්තිං[10] දසෙසති, තපපරමො භවති තපපරායණො. අයං වුච්චතෙ පුග්ගලො තමො තමපරායණො.

තත්ථ යො පුග්ගලො තමො ජොතිපරායණො, සො තමෙන අකුසලස්ස කම්මස්ස විපාකං දස්සෙති. තමෙති යං චක්ඛු කල්‍යාණ-මිත්තස්ස වසෙන[11] අකුසලෙ ධම්මෙ පජහති කුසලෙ ධම්මෙ අභිවඩ්ඪෙති.

1. පුනධම්මො – මජ්සං, PTS.
2. තමොතමපරායණො – මජ්සං, PTS.
3. භාවිතබ්බා – මජ්සං, PTS.
4. අසති – මජ්සං, PTS.
5. සො – මජ්සං, PTS.
6. පරායණො – මජ්සං, PTS.
7. භාවිතබ්බං – ම, PTS.
8. බන්ධො – මජ්සං, PTS.
9. කථං – මජ්සං, PTS.
10. උප්පත්තිං – මජ්සං, PTS.
11. යෙන – මජ්සං, PTS.

එහි ජොතිතමපරායන පුද්ගල කවරෙ යත් : ' ජොති ' නම්, යම් කරුණෙකින් ඒ තමසට මැ ප්‍රතිපක්ෂ වශයෙන් යම් ධර්ම කෙනෙක් වෙත් ද, යටත්පිරිසෙයින් ඥානාලොකය වේ ද එයයි. ඒ ඇසූ දහම් ඇති පුද්ගල (පඤ්ඤායතො ?) පණ්ඩිත යයි කියනු ලැබේ. හේ මෙසේ දැනගනී : මේ දහම් කුසල් යැ මේ දහම් අකුසල් යැ මේ දහම් සාවද්‍ය යැ මේ දහම් අනවද්‍ය යැ මේ දහම් සෙවියැයුතු යැ මේ දහම් නො සෙවියැයුතු යැ මේ දහම් වැඩියැයුතු යැ මෙ දහම් නො වැඩියැයුතු යැ මේ දහම් උපදවා විසියැයුතු යැ මෙ දහම් උපදවා නො විසියැයුතු යැ මේ දහම් මෙනෙහි කළයුතු යැ මේ දහම් නො මෙනෙහි කළයුතු යැයි. මෙහි වැලිත් පාපමිත්‍රයන් සේවනය කරනුයේ පාපමිත්‍රයන්ගේ වසයට පැමිණියේ අකුශලධර්මයන් වඩයි. කුශලධර්මයන් දුරුකෙරෙයි, හේ ඒ ප්‍රමාදය හේතු කොටගෙන (පච්චයසඤ්ඤ ?) මෙනෙහි නො කොට අසති අසම්පජඤ්ඤය ඇසුරු කෙරෙයි, (තයා ?) ඊට ප්‍රතිපක්ෂ වූ යම් තමසෙක් වේද හේ ඒ තමස (අඳුර) වඩයි, හේ ඒ තමසින් මඩනාලදුයේ තමස පරායන කොට ඇත්තේ තමස පරම කොට ඇත්තේ ද වෙයි. මේ පුද්ගල ' ජොතිතමපරායන ' යයි කියනුලැබේ.

එහි ' ජොතිජොතිපරායන ' පුද්ගල කවරෙ යැ : එහි ලා කියනු ලැබේ : මේ පුද්ගල කල්‍යාණමිත්‍රයකුගේ නිශ්‍රය ඇත්තේ වෙයි. (සක්කා සංයොගී ?) කුශලය සොයන්නාවූ හේ කලණමිතුරන් කරා එළැඹ පුළුවුස්සි, ප්‍රශ්න කෙරෙයි : කුසල් කිමැ ? අකුසල් කිමැ ? සාවද්‍යය කිමැ ? අනවද්‍යය කිමැ ? කුමක් සෙවියැයුතු යැ ? කුමක් නො සෙවියැ යුතු යැ ? කුමක් වැඩියැයුතු යැ ? කුමක් නො වැඩියැයුතු යැ ? කුමක් උපදවා විසියැ යුතු යැ ? කුමක් උපදවා නො විසියැයුතු යැ ? කුමක් මෙනෙහි කළයුතු යැ ? කුමක් නො මෙනෙහි කළයුතු යැ ? කිසෙයින් කෙලෙසීම වේ ද ? කිසෙයින් පිරිසිදු වේ ද ? කිසෙයින් (සසර) පැවැත්ම වේ ද ? කිසෙයින් නැවැත්ම වේ ද ? කිසෙයින් බැඳුණේ වේ ද ? කිසෙයින් මිදීම වේ ද ? කිසෙයින් සත්කායසමුදය වේ ද ? කිසෙයින් සත්කාය නිරොධය වේ දැ'යි.

හේ මෙහි දෙසනලද්ද යම්සේ අවබොධ කෙරේ ද එසේ මොනොවට පිළිපදනේ හේ මෙසේ දැනගනී : මේ දහම් කුසල් යැ මේ දහම් අකුසල් යැ . . . . මෙසේ සත්කායසමුදය වෙයි, මෙසේ සත්කායනිරොධය වේ යයි. (විස්තරයෙන් ප්‍රකාශ කළයුතු.) හේ ඒ ධර්මයන් (අධිපාටිසාඩ්ඩාති ?) මෙබඳු ලක්ෂණ ඇති ඥානය මාර්ගඥානවිද්‍යාලොකය වඩයි. ඒ පුද්ගල තත්පරම වූයේ තත්පරායන වූයේ වේ. මේ පුද්ගල ජොතිජොති පරායනයයි කියනු ලැබේ.

එහි තමොතමපරායන පුද්ගල කවරෙ යැ : යමෙක් අකුශලධර්මය දක්වා ද ඒ අකුශලය වැඩීමෙන් අපායාදි හීනගතියෙහි උත්පත්තිය ලබයි. ඒ අකුශලය පරම කොට ඇත්තේ තත්පරායන වූයේ වෙයි. මේ පුද්ගල ' තමොතමපරායන ' යයි කියනුලැබේ.

එහි යම් පුහුලෙක් ' තමොජොතිපරායන ' වේ ද, හේ තමයින් අකුශලකර්මයාගේ විපාකය දක්වයි, (තමෙති ?) හේ කල්‍යාණමිත්‍රයාගේ වශයෙන් අකුශලධර්මයන් දුරු කෙරෙයි, කුසල්දහම් වඩයි.

තත්ථ යො ච පණීතාසු ගතීසු උප්පත්තිං දස්සෙති, තප්පරමො තෙන වුච්චතෙ තමො ජොතිපරායනො

තත්ථ යො පුග්ගලො ජොතී තම්පරායනො කුසලස්ස කම්මවිපාකං දස්සෙති. යං චක්ඛු පාපමිත්තසංසග්ගෙන පාපමිත්තූපසෙවනෙන[1] පාපමිත්තවසානුගො අකුසලං ධම්මං අභිවඩ්ඪෙති. තං භාවනාය හීනාසු ගතීසු උප්පත්තිං දස්සෙති. තප්පරමො තෙන වුච්චතෙ ජොතී තම්පරායනො.

තත්ථ යො පුග්ගලො ජොතී ජොතිපරයනො, සො ජොති තභාවනාය යාව පණීතාසු ගතීසු උප්පත්ති. දස්සෙති තප්පරමො. තෙනාහ ජොති ජොතිපරායනො.

ජොතිතම්පරයනෙන දසඅකුසලානං ධම්මානං උදයං දස්සෙති. තමෙන පුග්ගලෙන අකුසලානං කම්මානං විපාකං දස්සෙති න අකුසලානං ධම්මානං විපාකං දස්සෙති. තමෙන අට්ඨ මිච්ඡත්තානි දස්සෙති. ජොතිනා අට්ඨ සම්මත්තානි දස්සෙති ජොතිනා තම්පර-යනෙන දස අකුසලකම්මපථෙ දස්සෙති. ජොතිනා පණීතත්තං දස්සෙති. තමෙන ජොතිපරයනෙන අතපනීයං ධම්මං දස්සෙති. ජොතිනා තම්පරයනෙන තපනීයං ධම්මං දස්සෙති. අයං සුත්තත්ථො.

1 තත්ථ කතමො දෙසනාහාරෙ : ඉමම්හි සුත්තෙ කිං දෙසිතං. තත්ථ වුච්චතෙ : ඉමම්හි සුත්තෙ කුසලාකුසලා ධම්මා දෙසිතා. කුසලාකුසලානං ච ධම්මානං විපාකො දෙසිතො. හීනප්පණීතානං ච සත්තානං ගතිනානාකරණං[2] දෙසිතං. අයං දෙසනාහාරො.

2. 3 : තත්ථ කතමො විචයො හාරො. අකුසලස්ස කම්මස්ස යො විපාකං පච්චනුභොති, තත්ථ හීනො අකුසලෙ ධම්මෙ උප්පාදියති විචයං තං යුජ්ජති. කුසලස්ස කම්මස්ස යො විපාකං පච්චනුභොති, තත්ථ හීනො කුසලෙ ධම්මෙ උප්පාදියති විචයං තං යුජ්ජති. අයං විචයො යුත්ති ච.

4. තත්ථ කතමො පදට්ඨානො හාරො : යො පුග්ගලො ජොති, සො පච්චවෙක්ඛණාය පදට්ඨානං, යො පුග්ගලො තමො, සො තමාදිත්තං, වානුපස්සනාය පදට්ඨානන්ති දස්සෙති. තමෙන ජොතිපරයනෙන අප්පමාදස්ස පදට්ඨානං දස්සෙති. තමො අවිජ්ජාය ච දිට්ඨියා ච පදට්ඨානං දස්සෙති, ජොතිනා තම්පරායනෙන පමාදස්ස ච දිට්ඨියා ච පදට්ඨානං දස්සෙති. අයං පදට්ඨානො.

5. තත්ථ කතමො ලක්ඛණො හාරො : තමෙන තම්පරායනෙන අවිජ්ජාය නිද්දිට්ඨාය සබ්බකිලෙසධම්මා නිද්දිට්ඨා හොන්ති. තමෙන ජොතිපරායනෙන ජොති විජ්ජාය නිද්දිට්ඨාය සබ්බෙ බොධිපක්ඛිය-ධම්මා නිද්දිට්ඨා හොන්ති. ජොතිතම්පරායනෙන පමාදෙ නිද්දිට්ඨො හොති. තමෙන ජොතිපරායනෙන අප්පමාදෙ නිද්දිට්ඨො හොති අයං ලක්ඛණො හාරෙ.

---

1. සෙවෙන - මජසං, PTS.
2. නානාකාරණං - මජසං.

එහි යමෙක් ප්‍රණීතගතියෙහි උත්පත්තිය දක්වා ද එය පරම කොට ඇත්තේ වේ ද, එහෙයින් ' තමොජොතිපරායන ' යයි කියනුලැබෙ.

යම් පුහුලෙක් ජොතිතමපරායන වූයේ කුශලකර්මයාගේ විපාකය දක්වා ද, (යම් ඇසක් ?) පාපමිත්‍රසංසර්ගයෙන් පාපමිත්‍රසෙවනයෙන් පාපමිත්‍රයන්ගේ වශයට පැමිණියේ අකුශලධර්මය වඩයි. එය වැඩීමෙන් හීනගතීන්හි උත්පත්තිය දක්වයි. එය පරම කොට ඇත්තේ වෙයි, එයින් ජොතිතමපරායන යයි කියනුලැබෙ.

එහි යම් පුහුලෙක් ජෝතිජෝතිපරායන වේ ද, හේ ජෝතිතභාවයෙන් එය පරම කොට ඇත්තේ ප්‍රණීත ගතීන්හි උපත දක්වයි. එයින් ජෝතිජෝතිපරායන යයි වදළහ.

ජොතිතමපරායන වීමෙන් දසඅකුශල ධර්මයන්ගේ උදය දක්වයි, තම පුද්ගලයාගෙන් අකුශලකර්මයන්ගේ විපාකය දක්වයි, අකුශලධර්මයන්ගේ විපාකය නො දක්වයි. තමසින් අටවැදෑරුම් මිච්ඡත්තයන් දක්වයි, ආලෝකයෙන් අටවැදෑරුම් සම්මතයන් දක්වයි, ජොතිතමපරායනයෙන් දස අකුශලකර්මපථයන් දක්වයි. ආලොකයෙන් ප්‍රණීත බව දක්වයි, තම ජොතිපරායනයෙන් අතපනීය ධර්මය දක්වයි, ජොතිතමපරායන යෙන් තපනීය ධර්මය දක්වයි, මේ සූත්‍රාර්ථ යි.

1. එහි දෙසනාහාර කවරෙ යැ : මේ සූත්‍රයෙහි කුමක් දෙසන ලද ද, එහි ලා කියනු ලැබෙ : මේ සූත්‍රයෙහි කුශලාකුශල ධර්මයෝ දේශිතයහ, කුශලාකුශලධර්මයන්ගේ විපාකය ද දේශිත යැ. හීනප්‍රණීත සත්වයන්ගේ ගතිනානාත්වය ද දෙසන ලදී. මේ දෙසනාහාර යි.

2 – 3. එහි විචයහාර කවරෙ යැ : යමෙක් අකුශලකර්මයාගේ විපාකය විඳී ද, එහි සිටියේ අකුශලධර්මයන් උපදවයි යන විචය යෙදෙයි. යමෙක් කුශලකර්මයාගේ විපාකය විඳී ද, එහි සිටියේ කුශලධර්මයන් උපදවයි යන විචය යෙදෙයි. මේ විචය ද යුත්ති ද වේ.

4. එහි පදට්ඨානහාර කවරෙ යැ : යම් ජොතිපුද්ගල්යෙක් වේ ද, හේ ප්‍රත්‍යවෙක්ෂාවට පදට්ඨාන යැ, යම් තමපුද්ගල්යෙක් වේ ද හේ (තමාදින්නං ?) අනුපස්සනාවට පදට්ඨාන යයි දක්වයි. ජොතිපරායන වූ තමසින් අප්‍රමාදයට පදට්ඨාන දක්වයි, තමස අවිද්‍යාවට ද දෘෂ්ටියට ද පදට්ඨාන දක්වයි. තමපරායන වූ ජොති (ආලොක) යෙන් ප්‍රමාදයට ද දෘෂ්ටියට ද පදට්ඨාන දක්වයි. මේ පදට්ඨානහාර යි.

5. එහි ලක්ඛණහාර කවරෙ යැ : තමපරායන වූ තමසින් ' තමො ' යී අවිද්‍යාව දක්වූ කල්හි සියලු කෙලශධර්මයෝ දක්වනල්ද්දහු වෙති, ජොතිපරායන වූ තමසින් ' ජොති ' යී විද්‍යාව නිර්දිෂ්ට කල්හි සියලු බොධිපාක්ෂික ධර්මයෝ දක්වනල්ද්දහු වෙති, ජොතිතම පරායනයෙන් ප්‍රමාදය දක්වනලද වෙයි, තමොජොතිපරායනයෙන් අප්‍රමාදය නිර්දිෂ්ට වේ. මේ ලක්ඛණහාර යි.

6. තත්ථ කතමො චතුබ්‍යූහො හාරො: ඉමම්හි සුත්තෙ භගවතො කො අධිප්පායො: යෙ සත්තා නීචකුලීනා, න තෙ ඉමං සුත්වා කුසලෙ ධම්මෙ සමාදාය වත්තිස්සන්ති, යෙ සත්තා උච්චකුලීනා, තෙ ඉමං ධම්මදෙසනං සුත්වා භිය්‍යොසොමත්තාය කුසලෙ ධම්මෙ සමාදාය වත්තිස්සන්තීති. අයං චතුබ්‍යූහො හාරො, භූමියං උපදෙසො.

7. තත්ථ කතමො ආවට්ටො හාරො: යා අවිජ්ජාතොපපභුති තණ්හා, අයං සමුදයො. යො[1] තමොතමපරායනො, ඉදං දුක්ඛං, ඉමානි ද්වෙ සච්චානි දුක්ඛං ච සමුදයො ච. ජොති සෙන සුත්තෙන ධම්මෙන පඤ්ඤපීයති, යො ධම්මො පඤ්ඤින්ද්‍රියස්ස පදට්ඨානං. තෙන අමොහෙන තීණි කුසලමූලානි පාරිපූරිං ගච්ඡන්ති, මග්ගස්ස පදට්ඨානං.

8 - 9 තත්ථ කතමො විභත්ති: තමොතමපරායනොති න එකංසෙන, කිං කාරණං: අත්ථි තමො ච භවො අපරාපරියවෙදනීයෙන ච කුසලෙන ජොතිනා පුග්ගලෙන සභොපපත්තිභාවෙ, අත්ථි ජොති ච භවො අපරාපරියවෙදනීයෙන ච අකුසලෙන තමෙන පුග්ගලෙන සභොපපත්තිභාවෙ, පරිවත්තනා තමෙසු පටිපක්ඛොති ජොතිනා තමපරායනො.

10. තත්ථ කතමො වෙවචනො: යො තමො නො එවං අත්තව්‍යාබාධාය[2]. පටිපන්නො, සො අස්සද්ධාය බාලො අකුසලො අව්‍යත්තො[3] අනාදීනවදස්සී. යො ජොති යො අත්තහිතාය පටිපන්නො පණ්ඩිතො කුසලො ව්‍යත්තො ආදීනවදස්සී. අයං වෙවචනො.

11. තත්ථ කතමො පඤ්ඤත්ති: යො පුග්ගලො විපාකපඤ්ඤත්තියා පඤ්ඤපීයති[4] ජොති කුසලධම්මූපපත්තිපඤ්ඤත්තියා පඤ්ඤපීයති.[4] කුසලධම්මවිපාකපඤ්ඤත්තියා චාති.

12. ඔතරණොති: යෙ අවිජ්ජාපච්චයා සඞ්ඛාරා යං ච ජරාමරණං යා ච අවිජ්ජා, තං පදට්ඨානං. නිද්දෙසෙන (?) විජ්ජුප්පාද අවිජ්ජානිරොධො, යො යාව ජරාමරණනිරොධො[5]. ඉමෙ ද්වෙ ධම්මා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා. ධම්මධාතු ධම්මායතනං ච පදට්ඨානං, නිද්දෙසෙන ධාතුසු.

13. තත්ථ කතමො සොධනො: ඉමස්ස සුත්තස්ස දෙසිතස්ස ආරම්භො. (සුද්ධො.)

14. අධිට්ඨානොති: තමොති භගවා බ්‍රවීති, න එකං පුග්ගලං දෙසෙති. යාවතා සත්තානං ගති, තත්ථ යෙ දුච්චරිතධම්මෙන උපපන්නා, තෙ බහුලාධිවචනෙන තමො නිද්දිසති. යා ජොති සබ්බසත්තෙසු කුසලධම්මූපපත්ති[6] සබ්බං තං ජොතීති අභිලපති, අයමෙත්ථ පච්චයො යොනිසොමනසිකාරපඤ්ඤත්ති චතුන්නං මහාභූතානං පුග්ගලානං.

---

1. සො - මජසං.
2. අත්තබ්‍යාපාදාය - මජසං, - PTS.
3. අබ්‍යත්තො - මජසං, PTS
4. පඤ්ඤපීයති - මජසං, PTS.
5. ජරාමරණෙ නිරොධො - PTS.
6. ධම්මොපපත්ති - ම. PTS.

6. එහි චතුබ්‍යූහහාර කවරේ යැ : මේ සූත්‍රයෙහි භාග්‍යවතුන් වහන්සේගේ අභිප්‍රාය කවරේ යැ : නීචකුලීන වූ යම් යම් සත්ව කෙනෙක් ඇද්ද ඔහු මේ ධර්මය අසා කුශල ධර්මයන් සමාදන්වගෙන පවත්නාහු යැ, යම් සත්ව කෙනෙක් උච්චකුලීන වෙත් ද, ඔහු මේ ධර්මදේශනාව අසා අධිකප්‍රමාණයෙන් කුශලධර්මයන් සමාදන් වැ පවත්නාහු යයි. මේ චතුබ්‍යූහහාර යි. (භූමියං උපදෙසො ?)

7. එහි ආවත්තහාර කවරේ යැ : අවිද්‍යායෙහි පටන් යම් තෘෂ්ණාවක් ඇද්ද, මේ සමුදය යැ. යම් තමොතමපරායනයෙක් ඇද්ද, මේ දුක්ඛ යැ. මේ දුක්ඛය ද සමුදය ද යන සත්‍ය දෙක යැ. යම් සූත්‍රයෙකින් ධර්මයෙකින් ජොති (ආලොකය) පනවනු ලැබේ ද ඒ ධර්මය පඤ්ඤින්ද්‍රියට පදට්ඨාන යැ, ඒ අමොහය හෙතු කොට ත්‍රිවිධ කුශලමූලයෝ පිරිමට යෙත්. එය ස්වර්ගයට පදට්ඨාන යි.

8 – 9. එහි විභත්ති කවරැ : තමොතමපරායනො (යනු) ඒකාන්තයෙන් නොවේ. කාරුණු කිම යත් : තම (අඳුරුවූ) භවය ද ඇත, අපරාපරිය වෙදනීය කුශලයක් හෙතුකොට ජොති පුද්ගලයකු සමග (සහොපත්ති භාවෙ ?) ජොති භවයෙක් ද ඇත. අපරාපරියවෙදනීය අකුශලයක් හෙතු කොට තම පුද්ගලයකු සමග (සහොපත්ති භාවෙ ?)

10. එහි වෙවචන කවරේ යැ : යම් තමසෙක් වේ ද හේ මෙසේ ආත්මවධය පිණිස පිළිපන්නේ වෙයි. හේ අශ්‍රද්ධායෙන් යුත් බාල අදක්ෂ වූයේ අව්‍යක්ත වූයේ ආදීනව නො දක්නේ වෙයි. යමෙක් ජොති වූයේ ද හේ ආත්මහිතයට පිළිපන්නේ පණ්ඩිත වූයේ දක්ෂ වූයේ ව්‍යක්ත වූයේ ආදීනව දක්නාසුලු වේ. මේ වෙවචන යි.

11. එහි පඤ්ඤත්ති කවරැ : යම් පුග්ගලෙක් විපාකප්‍රඥප්තියෙන් ජොති වූ හේ කුශල ධර්මයන්ට පැමිණීමෙන් කුශලධර්මයන්ගේ විපාකප්‍රත්‍යයෙන් ද පනවනුලැබේ යයි.

12. ඔතරණ යනු : අවිද්‍යාප්‍රත්‍යයෙන් යම් සංස්කාර කෙනෙක් ඇද්ද, යම් ජරාමරණය කුත් යම් ආවිද්‍යාවකුත් ඇද්ද, එය පදට්ඨාන යැ, නිර්දෙශයෙන් (?) විදොපාත්පාදය අවිද්‍යා නිරොධය වෙයි. ජරාමරණනිරොධය දක්වා (කියයුතු යැ.) මේ ධර්මයෝ දෙදෙන සංස්කාරස්කන්ධපයණාපන්නයෝ යැ, ධර්මධාතු ද ධර්මායතන ද පදට්ඨාන යි. (නිද්දෙසෙන ධාතුසු ?)

13. එහි සොධන කවරේ යැ : දේසිත වූ මේ සූත්‍රයාගේ ආරම්භය (ශුද්ධ යැ.)

14. ' අධිට්ඨාන ' යනු : භාග්‍යවතුන් වහන්සේ ' තමො ' යි වදරති. එක් පුද්ගලයකු නො දෙසනසේක. සත්වයන්ගේ ගතිය යම්තාක් වේ ද, එහි යම් කෙනෙක් දුශ්චරිත ධර්මයෙන් යුක්ත වූවාහු ද බහුලාධිවචනයෙන් තමස දක්වයි, යම් ජොතියෙක් වේ ද (එය) සියලු සත්වයන් කෙරෙහි කුශලධර්මයන්ගේ ඉපදීම යැ, ඒ සියල්ල ජොති යයි පවසයි. (අයමෙකතාපච්චයො ?) සතර මහාභූත ඇති ? පුද්ගලයන්ගේ යොනිසොමනසිකාර පඤ්ඤත්ති යැ.

15. තත්ථ කතමො පරික්ඛාරො: අකුසලස්ස පාපමිත්තතා පච්චයො, අයොනිසොමනසිකාරො හෙතු. කුසලස්ස කල්‍යාණමිත්තතා පච්චයො, යොනිසොමනසිකාරො හෙතු.

16. තත්ථ කතමා සමාරොපනා[1]: "ඉධෙකච්චො නීචෙ කුලෙ පච්චාජාතො[2] හොතී"ති නීචෙ කුලෙ පච්චාජාතො රූපෙසු සද්දෙසු ගන්ධෙසු රසෙසු ඵොට්ඨබ්බෙසු, සො අනුප්පන්නො[3] සබ්බම්හි මානුස්සකෙ උපභොගපරිභොගෙ. *ජොති පණීතෙසු කුලෙසු උප්පන්නො සබ්බම්හි මානුස්සකෙ උපභොගපරිභොගෙ උප්පන්නොති.

## 7-12

තත්ථ කතමං සංකිලෙසභාගියං නිබ්බෙධභාගියං ච සුත්තං: "න තං දළ්හං බන්ධනමාහු ධීරා"ති ගාථා. කෙන කාරණෙන තං බන්ධනං දළ්හං, චතුහි කාරණෙහි ඉස්සරියෙන සක්කා මොචෙතුං ධනෙන වා අක්කන්දන වා යාචනාය වා පරායනෙන වා, යෙසු ච අයං රාගො මණිකුණ්ඩලෙසු පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා, ඉදමස්ස චෙතසිකබන්ධනං, තං න සක්කා ඉස්සරියෙන වා ධනෙන වා අක්කන්දන වා යාචනාය වා පරායනෙන වා මොචෙතුං, න ච තත්ථ කොචි අත්ථි පාටිභොගො. ඉමිනා බන්ධනෙන මොචයිත්වා[4] දෙවො වා මනුස්සො වා යදිදං බන්ධනං රාගානුසයෙන ච ඡසු බාහිරෙසු ච ආයතනෙසු බජ්ඣති.[5] රූපෙසු රූපතණ්හා බන්ධති, යාව ධම්මෙසු ධම්මතණ්හා, යො ඉධ ලොකෙ බද්ධො[6] පරලොකස්මිං බද්ධො නීයති, සො බද්ධො ජායති, බද්ධො මීයති, බද්ධො අස්මා ලොකා පරං ලොකං ගච්ඡති, න සක්කා මොචෙතුං අඤ්ඤත්‍ර අරියධම්මෙන ඉමං ච බන්ධනං. මරණභවං ච[7] උප්පත්තිභවං ච භයතො විදිත්වා ඡන්දරාගං පජහති. සො ඉමං ඡන්දරාගං පජහිත්වා අතික්කමති ඉමං ච ලොකං[8] ඉතො පරං දුතියං[9].

තත්ථ යං බන්ධනා සබ්බාරුනං පහානං ඉදං වුච්චති උභයෙසු ඨානෙසු විරියං[10] ගන්ධපරිචාතො[11] සුඛුනි නොපලිප්පති[12] තථෙව පරිග්ගහෙසු පුත්තෙසු දාරෙසු ච අබ්බුළ්හා[13] සල්ලොති තස්සායෙව[14]

---

1. සමාරොපනාති - ම. PTS.
2. පච්ජාජාතො - PTS.
3. උප්පන්නො - මජසං, PTS.
* මජසං පොත්ථකෙ ඌනං
4. මොචයිත්වාති - මජසං, මොචයිතත්වාති - PTS.
5. බන්ධති - මජසං, PTS.
6. බන්ධො - මජසං, PTS.
7. භාවං ච - ම. PTS.
8. අයං ච ලොකො - මජසං, PTS.
9. දුතියො - මජසං, PTS.
10. විරියං - මජසං.
11. ගන්ථපරිචයො PTS. - ගන්ථපරිවුතො - ක.
12. නොපලිම්පති - මජසං. - සුපත්නොපලිම්පති - PTS.
13 අබ්බුළ්හො - මජසං, PTS.
14. තස්සෙව - ම. PTS.

15. එහි පරික්ඛාර කවරේ යැ : අකුශලයට පාපමිත්‍රයන් ඇතිබව ප්‍රත්‍ය යැ, අයෝනිසො මනසිකාරය හේතු යි. කුශලයට කල්‍යාණමිත්‍රයන් ඇතිබව ප්‍රත්‍ය යැ, යොනිසොමනසිකාරය හෙතු යි.

16. එහි සමාරොපනා කවරැ : "මෙලොවැ කිසිවෙක් නීචකුලයෙහි උපන්නේ වේ" යයි නීචකුලයෙහි උපන්නේ රූප සද්ද ගන්ධ රස ඵස්සයන්හි ද හේ සියලු මානුසික උපභොග පරිභොගයෙහි ද සමෘද්ධ නො වූයේ වෙයි. ජොති පුද්ගල ප්‍රණීත කුලයන්හි උපන්නේ සියලු මානුසික උපභොග පරිභොගයෙහි සමෘද්ධ වූයේ යයි.

7 – 12

එහි සංකිලෙසභාගිය වූ ද නිබ්බෙධභාගිය වූ ද සූත්‍රය කවරේ යැ : " න තං දළහං බන්ධනමාහු ධීරා " යන (කොසලසංයුත්තයෙහි) ගාථාව යැ. කවර කරුණෙකින් ඒ බන්ධනය දැඩි වේ ද : සතර කරුණෙකිනි, අධිපතිබැවින් මුදන්නට හැකි යැ, ධනයෙන් හෝ අන්ලෙසකින් හෝ අයැදීමෙන් හෝ ගැතිබැවින් හෝ මුදන්නට හැකි යැ, මේ රාගය යම් මිණිකොඩොල්හි දු දරුවන් කෙරෙහි දු දරාවන් කෙරෙහි දු යම් අපෙක්ෂාවක් ඇද්ද, මේ ඔහුගේ චෛතසික බන්ධනය වෙයි. එය අධිපතිබැවින් හෝ ධනයෙන් හෝ අනෙකෙකින් හෝ යැදීමෙන් හෝ ගැතිවීමෙන් හෝ මුදන්නට නො හැක්ක, එහි කිසි ඇපයෙක් නො ද ඇති. යම් මේ බන්ධනයක් රාගානුසයෙන් ද ෂඩ්බාහිර ආයතනයන්හි ද බැඳේ නම් මේ බැඳුමෙන් රූපතණ්හාව රූපයන්හි බඳියි, ධර්මයන්හි ධර්මතෘෂ්ණාව දක්වා (විස්තර කළයුතු.) යමෙක් මෙලොවැ බැඳුණේ පරලොවත් බැඳුණේ පමුණුවනු ලැබේ ද, හේ බැඳුණේ උපදියි, බැඳුණේ මියැයෙයි, බැඳුණේ මෙලොවින් පරලොවට යයි. මේ බන්ධනය ද ආර්‍යධර්මයෙන් හැර මුදන්නට නො හැක්ක. මරණභවය ද උපප්‍රාප්ති භවය ද භයවශයෙන් දුන ඡන්දරාගය දුරුකෙරෙයි. හේ මේ ඡන්දරාගය හැරපියා මේ ලොකය ද මෙයින් මත්තෙහි දෙවැනි ලොකය ද ඉක්මවයි.

එහි බන්ධනයෙන් සංස්කාරයන්ගේ යම් ප්‍රහාණයක් ඇද්ද, මෙය (කායික චෛතසික) උභයස්ථානයෙහි, වීර්‍ය යයි කියනු ලැබේ. (ගන්ධපරිවාතො සුමුනි ?) නො තැවැරෙයි. එසේ මැ පරිග්‍රහවස්තූන්හිදු අඹුදරුවන් කෙරෙහිදු උපුළ ගල්‍ය ඇත්තේ යයි ඒතෘෂ්ණාවගේ

තණ්හාය පහානං දස්සෙති. අයං තණ්හාමූලස්ස පහානා චරෙථ[1] අප්පමත්තොති කාමෙ පමාදවත්ථූති පහානාය නෙක්ඛම්මාභිරතො අප්පමාදවිහාරී භවති. තස්ස ආසයං පහානාය නෙව ඉමං ලොකං ආසිංසති[2] න පරං ලොකං[3] න ඉධලොකනිස්සිතං පියරූපං සාතරූපං ආකඞ්ඛති, නාපි පරලොකනිස්සිතං පියරූපං සාතරූපං ආකඞ්ඛති. තෙන වුච්චතෙ "නාසිංසතෙ[4] ලොකමිමං පරං[5] චා"ති.

යං තස්ස පහානං තං ඡෙදනං අට්ඨකවග්ගියෙසු මුනිනා නිද්දිට්ඨං.[6] සො ඉධ විරොධො අට්ඨකවග්ගියෙසු නාසිංසනං[7] ඉධ අනාථො[8] තථායං තණ්හා,[9] තස්ස පරිග්ගහස්ස වත්ථුකාමස්ස එකගාථාය එතෙ සබ්බෙ කාමා දස්සිතා. තෙන භගවා දෙසෙති :

"එතම්පි ජෙත්වාන පරිබ්බජන්ති.

අනපෙක්ඛිනො සබ්බකාමෙ[10] පහායා"ති.

ඉමිස්සා ගාථාය දුවිධො නිද්දෙසො : සංසන්දනනිද්දෙසො ච සමයනිද්දෙසො ච, යථා අයං ගාථා සංකිලෙසභාගියං ච, එවං තාය ගාථාය සංකිලෙසභාගියං ච නිබ්බෙධභාගියං ච විසජ්ජනා. යථායං ගාථා එවං[11] සබ්බගාථාසු ව්‍යාකරණෙසු වා, නිද්දිට්ඨං සුත්තං.

1. තත්ථ කතමා දෙසනා : ඉමං සුත්තං කෙනාධිප්පායෙන දෙසිතං, යෙ රාගචරිතා සත්තා, තෙ කාමෙ පජහිස්සන්තීති අයං තත්ථ භගවතො අධිප්පායො.

2. තත්ථ කතමො විචයො : යස්ස දසවත්ථුකා කිලෙසා උත්තිණ්ණා වන්තා විදිතා. කතමෙ දසවිධාති : කිලෙසකාමා ච ඔරම්භාගිය-උද්ධම්භාගියා ච සඤ්ඤොජනා දසවත්ථුකානි ආයතනානි. අයං විචයො.

3. තත්ථ කතමා යුත්ති : යෙ සාරත්තා තෙ දළ්හබන්ධනෙන[12] බජ්ඣන්ති[13] අත්ථි එසා යුත්ති.

4 තත්ථ කතමො පදට්ඨානො : සාරත්තා මණිකුණ්ඩලෙසූති මමඞ්කාරස්ස පදට්ඨානං, අපෙක්ඛාති අතීතවත්ථුස්ස සාරාගස්ස පදට්ඨානං. එතම්පි ජෙත්වාති භාවනාය පදට්ඨානං.

---

1. අහනාචරෙ – PTS. – අහනාචරෙථ – ස.
2. ආසීසති – ම.
3 පරලොකං – මජසං, PTS.
4. නාසීසතෙ – මජසං.
5. පරං ලොකං – මජසං, PTS.
6. මුනි නිද්දිට්ඨො – මජසං, PTS.
7. නාසීසනං – මජසං, PTS.
8. අනාථා – මජසං, PTS.
9 තණ්හාය – ම PTS.
10. කාමසුඛං – ම. PTS.
11. එවං ගාථා – මජසං, PTS.
12. ගාළ්හබන්ධනෙන – මජසං.
13. බජ්ඣන්ති – මජසං, PTS.

මැ ප්‍රහාණය දක්වයි. මේ තෘෂ්ණාමූලයාගේ (පහානා වරෙ ?) අප්‍රමත්ත වූයේ යයි (කාමෙ පමාද වත්තති ?) ප්‍රහාණය පිණිස නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණේ අප්‍රමාදවිහාරී වෙයි. ඒ ප්‍රමාදයාගේ ආශයප්‍රහාණයෙන් මෙලොව ද පරලොව ද ආශංසනය නො කෙරෙයි. මෙලොව ඇසිරිකළ ප්‍රියරූප මධුරරූප නො කැමැති වෙයි. පරලොව ඇසිරිකළ ප්‍රියරූප සාතරූප ද නො කැමැති වෙයි. එයින් කියනු ලැබේ : " නාසිංසතෙ ලොකමිමං පරං ච " යි.

ඒ ආකාඞ්ක්ෂාවගේ යම් ප්‍රහාණයෙක් ඇද්ද, එය මුනිහු විසින් අෂ්ටකවර්ගයෙහි ' ජෙදනං ' යි දක්වනලදි. අෂ්ටකවර්ගයෙහි ඒ විරොධය වෙයි. මේ (කොසලසංයුත්ත යෙහි) " නාසිංසනං " යි අන් පරිද්දෙකින් එයි. එසෙයින් මේ තෘෂ්ණාව ඊට පරිග්‍රහ වූ වස්තුකාමය එක් ගාථායෙහි මේ සියලු කාමයෝ දක්වනලදහ. බුදුහු එයින් වදරති :

වස්තුකාම ක්ලෙශකාමයෙහි අපෙක්ෂා නැත්තාහු තෙල බන්ධනය සිඳපියා කම්සුව හැරපියා ගිහිගෙන් නික්මැ යෙත් යයි.

මේ ගාථායෙහි දෙපරිද්දෙකින් නිර්දේශය වෙයි : සංසන්දනා නිර්දෙශය ද සමය නිර්දෙශය දයි, යම්සේ මේ ගාථාව සංකිලෙසභාගියත් නිබ්බෙධභාගියත් වේ ද, එසෙයින් ඒ ගාථායෙහි සංකිලෙසභාගිය වූ ද නිබ්බෙධභාගිය වූ ද විසඳුම වෙයි. මේ ගාථාව යම්සේ ද සියලු ගාථාවන්හිදු වෙය්‍යාකරණයන්හිදු මෙසේ යි. සූත්‍රය නිර්දිෂ්ට යි.

1. එහි දෙසනා කවරැ : මේ සූත්‍රය කවර අදහසකින් දෙසනලද ද යත් : යම් රාගචරිත සත්ව කෙනෙක් වෙද්ද ඔහු කාමයන් දුරුකරන්නාහයි මේ එහි භාග්‍යවතුන් වහන්සේගේ අදහස යි.

2. එහි විචය කවරෙ යැ : යමක්හු විසින් දසවස්තුක ක්ලේශයෝ උත්තීර්ණ වූවාහු මුදනලද්දහු දන්නාලද්දහු වෙත් ද, කවර දසවිධ වූවාහු ද යත් : ක්ලේශකාමයෝ ද ඔරම්භාගිය උද්ධම්භාගිය සංයොජනයෝ ද දසවස්තුක ආයතනයෝ ද යන මොහු යි. මේ විචය යි.

3. එහි යුක්ති කවරැ : යම් කෙනෙක් ක්ලේශකාමයෙන් වස්තුකාමයෙහි ඇලුණාහු ද, ඔහු දුඩි බැඳුමෙන් බැඳුණාහු වෙත්. තෙල යුක්ති ඇත.

4. එහි පදට්ඨාන කවරෙ යැ : මිණිකොඬොල්හි ඇලුමෙණ් මමංකාරයට පදට්ඨාන යැ, ' අපෙක්ඛා ' යනු අතීත වස්තුක වූ රාග ඇත්තහුට පදට්ඨාන යැ, ' එතම්පි ඡෙත්වා ' යනු භාවනාවට පදට්ඨාන යි.

5. තත්ථ කතමො ලක්ඛණො : සාරත්තචිත්තො මණිකුණ්ඩලෙසු යො අහඞ්කාරෙ විසත්තො මමඞ්කාරෙ විසත්තො, සො[1] පුත්තදාරෙ සාරත්තො ඛෙත්තවත්ථුස්මිං සාරත්තො. අයං ලක්ඛණො හාරො.

6. තත්ථ කතමො චතුබ්‍යූහො හාරො : ඉධ සුත්තෙ භගවතො කො අධිප්පායො : යෙ නිබ්බානෙන ඡන්දිකා භවිස්සන්ති තෙ පුත්තදාරෙසු[2] තණ්හං පජහිස්සන්ති, අයං තත්ථ භගවතො අධිප්පායො. අයං චතුබ්‍යූහො හාරො.[3]

7. තත්ථ කතමො ආවට්ටො : යා පුත්තදාරෙසු[4] තණ්හා අයං සමුදයො. යෙ උපාදින්නක්ඛන්ධා තෙ යෙ ච බාහිරෙසු රූපෙසුපරිග්ගහො,[5] ඉදං දුක්ඛං. යං තත්ථ ඡෙදනීයං, අයං නිරොධො. යෙන ඡිජ්ජති, අයං මග්ගො. ඉමානි චත්තාරි සච්චානි.

8. විභත්තීති : නත්ථි විභත්තියා භූමි.

9. පරිවත්තනොති : පටිපක්ඛො නිද්දිට්ඨො.

10. තත්ථ කතමො වෙවචනො : නිද්දිට්ඨො වෙවචනො.

11. තත්ථ කතමො ඔතරණො : අත්ථි තණ්හා එකො සත්තො ඔතිණ්ණො තප්පච්චයා විඤ්ඤාණං, යාව ජරාමරණං. යා තත්ථ වෙදනා අයං අවිජ්ජා, විජ්ජුප්පාදා අවිජ්ජානිරොධො, යාව ජරාමරණනිරොධො.

12. තත්ථ කතමො සොධනො : සුද්ධො ගාථාය ආරම්භො.

13. තත්ථ කතමො අධිට්ඨානො : “න තං දළ්හං බන්ධනමාහු ධීරා”ති එකත්තතාය පඤ්ඤත්තා, න වෙමත්තතාය. චත්තාරො රාගා : කාම-රාගො රූපරාගො භවරාගො දිට්ඨිරාගො චා'ති එකත්තතාය පඤ්ඤත්තා.

14. තත්ථ කතමො පරික්ඛාරො : යෙසං රාගො මණිකුණ්ඩලෙසු තස්ස සුභසඤ්ඤා හෙතු, අනුබ්‍යඤ්ජනසො ච නිමිත්තග්ගාහො පච්චයො. යාය තෙ ජහාති තස්ස අසුභසඤ්ඤා හෙතු, නිමිත්තග්ගහනඅනු-බ්‍යඤ්ජනග්ගහනවිනොදනං පච්චයො.

15 තත්ථ කතමො සමාරොපනො : සාරත්තො මණිකුණ්ඩලෙසු සම්මූළ්හවිධො දුට්ඨාතිපි එතම්පි[6] ඡෙත්වාන පරිබ්බජන්තීති තං පරිඤ්ඤ-ත්ථං පරිවජ්ජිතත්ථං පජහිතා. අයං සමාරොපනො.

---

1. යො – මජසං, PTS.
2. පුත්තදාරෙ – මජසං, PTS.
3. ඉමානි චත්තාරි සච්චානි – මජසං, PTS.
4. පුත්තදාරෙ – මජසං, PTS.
5. රූපපරිග්ගහො – මජසං; රූපෙසු රූපපරිග්ගහො – PTS.
6. එවම්පි – මජසං, PTS.

5. එහි ලක්ඛණ කවරෙ යැ : යමෙක් මිණිකොඩොල්හි ඇලුණු සිත් ඇත්තේ අහංකාර යෙහි වෙසෙසින් ඇලුණේ ද මමංකාරයෙහි වෙසෙසින් ඇලුණේ ද හේ අඹුදරුවන් කෙරෙහි ඇලුණේ කෙත්වත්හි ඇලුණේ වෙයි. මේ ලක්ඛණහාර යි.

6. එහි චතුබ්‍යුහහාර කවරෙ යැ : මේ සූත්‍රයෙහි භාග්‍යවතුන් වහන්සේගේ අභිප්‍රාය කවරෙ යැ : යම් කෙනෙක් නිවනෙහි රුචි ඇත්තාහු වෙත් ද, ඔහු අඹුදරුවන් කෙරෙහි තෘෂ්ණාව හරනාහු යැ. මේ එහි භාග්‍යවතුන් වහන්සේගේ අභිප්‍රායයි. මේ චතුබ්‍යුහ හාර යි.

7. එහි ආවත්තහාර කවරෙ යැ : අඹුදරුවන් කෙරෙහි යම් තෘෂ්ණාවක් ඇද්ද මේ සමුදය යැ, යම් උපාදින්නස්කන්ධ කෙනෙක් ඇද්ද ඔහු ද යම් බාහිර රූපයන්හි පරිග්‍රහයෙක් ඇද්ද, මේ දුක යැ, එහි යම් සිඳියැයුත්තෙක් ඇද්ද, මේ නිරොධ යැ, යමකින් බිඳේ ද මේ මාර්ග යැ. මේ සතර සත්‍යයෝ යි.

8. විභත්ති යනු : මෙහි විභත්තිහාරයට භූමි නැති.

9. පරිවත්තන යනු : ප්‍රතිපක්ෂය දක්වන ලද්දේය.

10. එහි වෙවචනහාර කවරෙ යැ : වේවචන දක්වනලද්දේ යි.

11. එහි ඔතරණ කවරෙ යැ : තෘෂ්ණාව ඇත, සත්ව තෘෂ්ණායෙන් මඩනාලද්දුයේ වෙයි, ඒ තෘෂ්ණාප්‍රත්‍යයෙන් වේදනය වෙයි, ජරාමරණ දක්වා (කියැයුතු) එහි යම් වෙදනා වක් ඇද්ද මේ අවිද්‍යා යැ. මාර්ගඥනවිද්‍යාව ඉපදීමෙන් අවිද්‍යානිරොධය වෙයි. ජරා මරණනිරොධය දක්වා කියැයුතු.

12. එහි සොධනහාර කවරෙ යැ : ගාථායෙහි ආරම්භය ශුද්ධ යි.

13. එහි අධිට්ඨාන කවරෙ යැ : '' න තං දළ්හං බන්ධනමාහු ධීරා '' යනු එකත්තතා (සාමාන්‍ය) යෙන් පනවනලද්දු, වෙමත්තතායෙන් නොවේ. කාමරාග රූපරාග භවරාග දිට්ඨිරාග යන සතර රාගයෝ එකත්තතායෙන් පනවනලද්දහු යි.

14. එහි පරික්ඛාර කවරෙ යැ : මණිකුණ්ඩලයන්හි යම් කෙනකුන්ගේ රාගය වේ ද, ඒ රාගයට ශුභසංඥව හෙතු යැ, අනුව්‍යඤ්ජනවශයෙන් නිමිත්තග්‍රාහය ප්‍රත්‍ය යි. යම් කරුණෙකින් ඒ මිණිකොඩොල් දිරුවාහු ද ඊට අශුභසංඥව හෙතු යි. නිමිත්තග්‍රහණ අනුව්‍යඤ්ජනග්‍රහණය දුරැලීම ප්‍රත්‍ය යි.

15. එහි සමාරොපන කවරෙ යැ : මණිකුණ්ඩලයන්හි ඇලුණේ සම්මූළ වූයේ වෙයි. (දුට්ඨාතිපි ?) තෙල බන්ධනය ද සිඳපියා නික්මැයෙත් යයි. (තං පරිඤ්ඤතත්ථං පරිවජ්ජිතත්ථං පජහිතා ?) මේ සමාරොපනහාර යි.

## 7 - 13

"යං චෙතෙති යං පකප්පෙති යං අනුසෙති"* විත්ථාරෙන පච්චයො යං වා චෙතසිකං කායිකං ච වාචසිකං ච කම්මං.[1] කිං කාරණා: චෙතසිකා හි චෙතනා මනොකම්මන්ති[2] වුච්චතෙ, යං චෙතනාකම්මං තං[3] චෙතසිකං ඉමං කායිකං ච වාචසිකං ච ඉමානි තීණි කම්මානි නිද්දිට්ඨානි.

කායකම්මවචීකම්මානි ච[4] තානි කුසලානිපි යං කායෙන ච වාචාය ච ආරභති පරාමසති, අයං වුච්චති සීලබ්බතපරාමාසො.

සඞ්කප්පනා තෙ තිවිධා සඞ්ඛාරා පුඤ්ඤමයා අපුඤ්ඤමයා ආනෙඤ්ජමයා, තප්පච්චයා විඤ්ඤාණං තෙ ආරම්මණඅමතං හොති විඤ්ඤාණස්ස ඨිතියා.

යා සුභසඤ්ඤා සුඛසඤ්ඤා අත්තසඤ්ඤා ච ඉදං චෙතසිකං. යං රූපූපගං විඤ්ඤාණං තිට්ඨති රූපාරම්මණං රූපපතිට්ඨිතං නන්දූපසෙචනං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලතං ගච්ඡති, අයං සඞ්කප්පනා. ඉති යං විඤ්ඤාණට්ඨිතීසු ඨිතං පඨමාභිනිබ්බත්ති ආරම්මණවසෙන උපාදානං. ඉදං වුච්චති චෙතසිකන්ති.

තත්ථ ඨිතස්ස අරූපස්ස යා නිකන්ති අජ්ඣොසානං, ඉදම්පි සකම්පිතං. මනාපිකෙසු රූපෙසු පියරූපසාතරූපෙසු ආභොගො, ඉදං චෙතසිකං.

යං චෙතෙති සතෙතසු[5] මනාපිකෙසු අභිජ්ඣාකායගන්ථො. පටිඝානු-සයෙසු බ්‍යාපාදකායගන්ථො. සබ්බෙ චත්තාරො ගන්ථා, අයං පඤ්චසු කාමගුණෙසු පඨමාභිනිපාතො චිත්තස්ස. යා චෙතනා යස්ස තත්ථ අස්සාදානුපස්සිස්ස අනෙකා පාපකා අකුසලා ධම්මා චිත්තං අරූපවත්තියො හොන්ති. (?) පුග්ගලො රාගානුබද්ධභූතො[6] තෙහි කිලෙසකාමෙහි යථාකාමකරණීයො, අයං වුච්චතෙ කාමෙසු පකප්පනා. එවං සබ්බෙ චත්තාරො ඔඝා.

යං තෙහි කාමෙහි සංයුත්තො විහරති භාවිතො අජ්ඣොසන්තො, අයං චෙතනා. යස්ස තථායං අවීතරාගස්ස අවිගතපෙමස්ස[7] තස්ස විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති[8] සොකපරිදෙවදුක්ඛදොමනස්සු-පායාසා. දුක්ඛානුපරිවත්තිතං විඤ්ඤාණං හොති, සරිතස්ස චයධම්ම-සමුප්පාදෙ චිත්තං පරියාදියති. ඉදං වුච්චති පකප්පිතන්ති.

---

1. චෙතසිකං කම්මං - මජසං, PTS.
2. මනොකම්මානි - මජසං, PTS.
* අයං පාඨො - මජසං, PTS. පොත්ථකෙසු විසදිසො. (අභිසමයසංයුත්ත - කළාරඛත්තියවග්ග)
3. යා චෙතනාකම්මං යං - මජසං, PTS.
4. කායකම්මං වචීකම්මං ච - මජසං, PTS.
5. සතතසු - PTS.
6. රාගානුබන්ධභූතො - මජසං, PTS.
7. අධිගතපෙමස්ස - මජසං, PTS
8. උපපජ්ජන්ති - PTS.

7 – 13

'' යම් අරමුණක් සිතා ද සිත්හි ලා පවත්වා ද අනුශය වශයෙන් පවතී ද '' (අභිසමය සංයුත්ත – කළාරඛත්තියවග්ග – චෙතනා සූත්‍රය) විස්තරයෙන් කියැයුතු යම් චෛතසික කර්මයක් හෝ වේ ද, එය කායිකකර්ම ද වාචසිකකර්ම ද වෙයි. කරුණු කිම යත් : ඒ එසේ මැය, සිත්හි උපදනා චෙතනා මනොකම්ම යයි කියනුලැබේ. යම් චෙතනාකර්මයක් ඇද්ද එය චෛතසික කර්ම යැ, මේ කායකර්මය ද වාක්කර්මය දැයි මේ තුන් කර්මයෝ දක්වනලද්දහු යැ.

ඒ කායකර්ම වාක්කර්මයෝ ද කුශල වූවාහු ද වෙති. යම් කර්මයක් කයිනුදු වචනයෙනුදු කෙරේ නම්, දැඩිව ගනී නම්, මේ සීලබ්බතපරාමාස යයි කියනු ලැබේ.

ඒ සංකල්පනයෝ ද පුණ්‍යමය අපුණ්‍යමය ආනෙඤ්ජමය යන ත්‍රිවිධ සංස්කාරයෝ වෙති. ඒ සංස්කාරප්‍රත්‍යයෙන් කර්මවිඥානය වෙයි. කර්මවිඥානයාගේ සිටීමට තෙල අරමුණ වේ.

යම් ශුභසංඥවක් සුඛසංඥවක් ආත්මසංඥවක් ඇද්ද මේ චෛතසිකකර්ම යැ, රූපභව යට පමුණුවන යම් කර්මවිඥානයක් රූපය අරමුණු කොට රූපය පිහිට කොට සිටී ද, නන්දි සංඛ්‍යාත තෘෂ්ණායෙන් තෙත් වූයේ වැඩීමට පිහිටීමට විපුලබවට යේ ද, මේ සංකල්පනා යැ. මෙසේ විඥානස්ථිතීන්හි සිටී ආලම්බන වශයෙන් ප්‍රථමාභිනිෂ්පත්ති වූ යම් උපාදානයක් ඇද්ද, මේ චෛතසික යයි කියනුලැබේ යි.

එහි සිටී අරූපයාගේ යම් නිකාන්තියක් බැසැගෙන සිටීමක් ඇද්ද, මෙද සකම්පිත යැ. ප්‍රියස්වභාව මධුරස්වභාව වූ මනවඩන රූපයන්හි යම් අභොගයෙක් ඇද්ද, මේ චෛතසික කර්ම යි.

යම් චෙතනාවක් කෙරේ ද එය මනවඩන සත්ත්වයන් කෙරෙහි අභිධ්‍යාකායග්‍රන්ථ වෙයි, ප්‍රතිඝානුශයෙහි ව්‍යාපාදකායග්‍රන්ථ වෙයි, සියලු සතර ග්‍රන්ථයෝ වෙත්. මේ පඤ්චකාමගුණයන්හි චිත්තයාගේ ප්‍රථමාභිනිපාතය යි. යමක්හුගේ යම් චෙතනාවක් ඇද්ද, එහි ආස්වාද වශයෙන් දක්නහුට නොයෙක් ලාමක අකුශලධර්මයෝ වෙත්. (චිත්තං අරූපවත්තියො හොන්ති ?) රාගයෙන් බැඳුණු පුද්ගල ඒ ක්ලේශකාමයන් විසින් රිසිසේ කළහැකි වෙයි. මේ කාමයන්හි ප්‍රකල්පනා යයි කියනු ලැබේ. සියලු සතර ඕඝයෝ මෙසේ යි.

යමෙක් ඒ කාමයන් විසින් සංයුක්ත වූයේ භාවිත වූයේ බැසගන්නාලදූයේ වාස කෙරේද, මේ චෙතනා යැ. එසේ මැ යමකුට මේ කාමචෙතනා වේ ද අවීතරාග වූ අවිගත වූ ප්‍රෙම ඇති ඔහුට ඒ කාමයන්ගේ විපරිනාමයෙන් අන්‍යථාභාවයෙන් සොක පරිදෙව දුක් දෙම්නස් උපායාසයෝ උපදිත්. දුක අනුව පවත්නා විඥානය වෙයි, (සරිතස්ස ?) ව්‍යයධර්මයන් ගේ ඉපදීම සිත හාත්පසින් මැඩගනී. මේ ප්‍රකල්පිත යයි කියනු ලැබේ.

20—ඒ 078576

එවමෙතස්ස[1] චෙතෙති ච පකප්පෙති ච විඤ්ඤාණස්ස ඨිති යා හොති, සා ච ඨිති දුවිධා: ආරම්මණට්ඨිති ච ආහාරට්ඨිති ච, තත්‍ථ යා ආරම්මණට්ඨිති, අයං නාමරූපස්ස පච්චයො, යා ආහාරට්ඨිති යා පුනබ්භවාභිනිබ්බත්තිකා ඨිති යා ච පොනොභවිකා ඨිති, අයං වුච්චති ආරම්මණං, තං හොති විඤ්ඤාණස්ස ඨිතියා තස්ස විඤ්ඤාණපච්චයා නාමරූපං යාව ජරාමරණං ච චෙතෙති.

අථ ච පුන පත්‍ථයතෙ යතො න පොනොභවිකා[2] අනාගතවත්‍ථුම්හි. අයං පරිපෙක්ඛා නිද්දිට්ඨො, න චෙතෙති න පත්‍ථයති අථ ච දූසෙතීති දුවිධො නිද්දෙසො. අස්ස පුබ්බෙ හොති තං චෙතයිතං තං පකප්පිතං අසමූහතං තප්පච්චයා. අයං විඤ්ඤාණස්ස ඨිති හොති.

අථවා තස්ස අනුසයා ආවිභවන්ති තප්පච්චයා තස්ස පුනබ්භවො නිබ්බත්තති. අථවා තං සංකියතෙ අප්පෙතු ආගාරෙ වා. සුඛුමා වා සන්ති වා න සංකියතෙ කාමෙ තං එවං නිවෙචසුපි ආගාරෙසු ජාතො හොති. තං නයති යං නො කප්පෙතුං එවං සංඛාරා චෙතිතා පකප්පිතා ච ආරම්මණභූතා හොන්ති. (?) යා ච චෙතනා යා ච පකප්පනා යං ච වත්‍ථු නිබ්බත්තනං. උභොපි එතෙ ආරම්මණං විඤ්ඤාණස්ස, තථා චෙතනාය ච සංකප්පනාය ච පත්‍ථනාය ච භූතා සත්තා චෙතෙති ච සඞ්කප්පෙති ච. යං සභවෙසනා[3] න ච චෙතෙති න ච සඞ්කප්පෙති. කතමෙ ච සත්තා භූතා: යෙ ච තනුජාතා අණ්ඩජාපි අණ්ඩකා අනු-භින්නා සංසෙදජා න ච සම්භින්නා, ඉමෙ භූතා, කතමෙ සම්භවෙසිනො: ගබ්භගතා අණ්ඩගතා සංසරන්තා ඉමෙ න චෙතෙන්ති[4] න පත්‍ථෙන්ති න ච සඞ්කප්පෙන්ති[4] අනුසයෙන ච පුනබ්භවො නිබ්බත්තතීති.

යෙ භූතා සත්තා යෙ සම්භවෙසිනො, තෙ ථාවරා. යෙ වා සත්තා[5] චෙතෙන්ති පත්‍ථෙන්ති ච තෙ ථාවරා, තෙ න ච චෙතෙන්ති න ච පත්‍ථෙන්ති න ච සඞ්කප්පෙන්ති අනුසයෙන ච සංසරන්ති.

අපරො පරියායො: යෙ අරියපුග්ගලා සෙඛා, තත්‍ථ තෙ න ච චෙතෙන්ති, න ච සඞ්කප්පෙන්ති, අනුසයෙන පුන උප්පජ්ජන්ති.

අපරො පරියායො: යෙ සුඛුමා පාණා භූමිගතා උදකගතා චක්ඛුනො ආපාථං[6] නාගච්ඡන්ති, තෙ න ච චෙතෙන්ති න ච සඞ්කප්පෙන්ති, අනුසයෙන ච සංසරන්ති.

අපරො පරියායො: බාහිකා (?) සබ්බෙ භික්ඛූ අභිමානිකා, තෙ න ච චෙතෙන්ති. න ච පත්‍ථයන්ති, අනුසයෙන ච සංසරන්ති. න ච චෙතෙන්ති න ච සඞ්කප්පෙන්ති න ච අනුසෙන්ති. ආරම්මණමෙතං න හොති විඤ්ඤාණස්ස ඨිතියා.

1. එකමෙතස්ස - මජ්ඣං.
2. පොනොබ්භවිකා - PTS.
3. ගවෙසනා - මජ්ඣං, PTS.
4. චෙතෙති - මජ්ඣං, PTS.
5. සත්තො - මජ්ඣං, PTS.
6. ආපාතං - තත්‍ථි.

(එවංමකස්ස චෙතෙති ච පකප්පෙති ච ?) විඥනයාගේ යම් සිටීමක් වේද, ඒ ස්ථිතිය අරම්මණවයිති යැ ආහාරවයිති යැයි දෙපරිදි වෙයි : එහි යම් ආලම්බනස්ථිතියක් වේ ද මේ නාමරූපයට ප්‍රත්‍යය වෙයි. යම් ආහාර ස්ථියක් වේ ද, පුනර්භවයෙහි උපත ඇතිකරන පුනර්භවයට හිත වූ යම් ස්ථිතියකුත් වේද, මේ ආලම්බන යයි කියනු ලැබේ. එය කර්ම විඥනයාගේ ස්ථිතිය පිණිස වෙයි. ඒ විඥනප්‍රත්‍යයෙන් නාමරූපය වෙයි. ජරාමරණ දක්වා චෙතනා කෙරෙයි.

යළි යම්හෙයකින් අනාගත වස්තුවිෂයෙහි පුනර්භවය ඇතිකරන ප්‍රාර්ථනා නොවේද, මේ ප්‍රතිපක්ෂභාවය දක්වන ලදි. චෙතනා නො කෙරෙයි, ප්‍රාර්ථනා නො කෙරෙයි, එකෙකුදුවත් දූෂණ කෙරේ නුයි දෙවැදෑරුම් නිර්දේශය වේ. (අස්ස පුබ්බෙ .... අසමූහිතං තප්පච්චයා ?) කර්මවිඥනයාගේ මේ ස්ථිතිය වේ.

නොහොත් ඔහුට අනුසයයෝ පහළවෙති, ඒ හේතුයෙන් ඔහුට පුනර්භවය උපදී, නොහොත් (නංසංකීයතෙ .... ආරම්මණභූතා හොන්ති ?) යම් චෙතනාවකුත් යම් ප්‍රකල්පනයකුත් වේද, උපන් යම් වස්තුවකුත් ඇද්ද මේ දෙක මැ විඥනයට අරමුණු වෙයි. එසේ මැ චෙතනාවට ද සංකල්පනාවට ද ප්‍රාර්ථනාවට ද අරමුණු වේ. භූත (උපන්) සත්ත්වයෝ චෙතනා ද සංකල්පනා ද කෙරෙයි, සම්භවය සොයන සත්ත්ව නො ද සිතයි නො ද සංකල්පන කෙරෙයි. උපන් සත්වයෝ කවරහ : යම් තැනුබවට ගිය අණ්ඩජයෝ ද අණ්ඩකොෂයෙන් නික්මුණාහු ද සම්භෙදයට නොගිය සංසෙදජයෝ ද යන මොහු භූතයෝ යි. සම්භවෙයිහු කවරහ : ගර්භගතවැ අණ්ඩකොෂගතවැ හැසිරෙන යම් සත්ත්ව කෙනෙක් ඇද්ද මොහු චෙතනා නො කෙරෙති, ප්‍රාර්ථනා නො කෙරෙති, සංකල්පනා නො කෙරෙත්. අනුසය හෙතුකොට (ඔවුන්ට) පුනර්භවය උපදී යයි.

යම් උපන් සත්ව කෙනෙක් ඇද්ද යම සම්භවෙයිහු වෙත් ද ඔහු ථාවරයෝ යැ, යම් සත්ව කෙනෙක් සිතත් ද පතත් ද යම් ථාවර සත්ව කෙනෙක් වෙත් ද ඔහු නො ද සිතති, නො ද පතති, නො ද සංකල්පනා කෙරෙත්. අනුසයහෙතුයෙන් සංසරණය කෙරෙත්.

අන්‍යත් පරියායයෙකි : යම් ශෛක්ෂ ආයුෂ්පුද්ගල කෙනෙක් වෙත් ද, ඔහු නො ද චෙතනා කෙරෙති, නො ද සංකල්පන කෙරෙති, අනුසය වශයෙන් යළි උපදිත්.

අන්‍යත් පරියායයෙකි : භූමිගත වූ උදකගත වූ යම් සියුම් ප්‍රාණීහු ඇස්හමුවට නො පැමිණෙත් ද, ඔහු නො ද චෙතනා කෙරෙති, සංකල්පන නො ද කෙරෙති, අනුසය වශයෙන් සැරිසරත්.

අනිකුදු පරියායයෙකි : (බාහිකා ?) සියලු භික්ෂුහු අධිගතාභිමාන ඇත්තාහු වෙති, ඔහු නො ද චෙතනා කෙරෙහි නො ද ප්‍රාර්ථනා කෙරෙති, අනුසයහෙතුයෙන් සැරිසරත්. නො ද චෙතනා කෙරෙත් ද නො ද සංකල්පන කෙරෙත් ද, අනුසය නො වෙත් ද, තෙල අරමුණ ද විඥනයාගේ ස්ථිතිය පිණිස නො වේ.

න ච චෙතෙතීති: පරියුට්ඨානසමුග්ඝාතං දෙසෙති. න ච අනුසෙතීති: අනුසයසමුග්ඝාතං දෙසෙති. න ච චෙතෙතීති ඔළාරිකානං කිලෙසානං පහානං දෙසෙති. න ච අනුසෙතීති: සුඛුමානං කිලෙසානං පහානං දෙසෙති. න ච චෙතෙතීති: යෙන (?) භූමි ච. න ච පත්ථයතී[1]ති: සකදාගාමී අනාගාමී. න ච අනුසෙතීති අරහා.[2] න ච චෙතෙතීති සීලක්ඛන්ධස්ස පටිපක්ඛෙන පහානං දෙසෙති. න ච පත්ථයතීති සමාධික්ඛන්ධස්ස පටිපක්ඛෙන පහානං දෙසෙති. න ච අනුසෙතීති පඤ්ඤාක්ඛන්ධස්ස පටිපක්ඛෙන පහානං දෙසෙති. න ච චෙතෙතීති අපුඤ්ඤමයානං සඞ්ඛාරනං පහානං දෙසෙති. න ච අනුසෙතීති ආනෙඤ්ජමයානං සඞ්ඛාරානං පහානං දෙසෙති. න ච චෙතෙතීති අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං, න ච පත්ථයතීති අඤ්ඤින්ද්‍රියං, න ච අනුසෙතීති අඤ්ඤාතාවිනො ඉන්ද්‍රියං. න ච චෙතෙතීති මුදුකා ඉන්ද්‍රියභාවනා, න ච පත්ථයතීති මජ්ඣඉන්ද්‍රියභාවනා, න ච අනුසෙතීති අධිමත්තා ඉන්ද්‍රියභාවනා. අයං සුත්තත්ථො.

1. තත්ථ කතමා දෙසනා: ඉධ සුත්තෙන චත්තාරි සච්චානි දෙසිතානි.

2-3. යං ච චෙතයිතං යං ච පකප්පිතං අත්ථි එතං ආරම්මණං විතනං පතිට්ඨාති[3] විචිනාති[4] යුජ්ජති. න ච චෙතෙතීති න ච පත්ථයතීති අත්ථි එතං[5] ආරම්මණං අනුසයෙ විඤ්ඤාණම්හි විචිනයති[6] යුජ්ජති න ච චෙතෙති න ච පත්ථයති. අනුසයප්පහානා විඤ්ඤාණට්ඨිතිං න ගවෙසන්ති. විචයනතං[7] යුජ්ජති. අයං යුත්ති විචයො.

4. තත්ථ කතමො පදට්ඨානො: චෙතනාපරියුට්ඨානං චෙතනාපරියුට්ඨානස්ස පදට්ඨානං. සඞ්කප්පනං උප්පාදනස්ස පදට්ඨානං. අනුසයො පරියුට්ඨානස්ස පදට්ඨානං, තෙසං ඡන්දරාගවිනයාය භාවනා භවරාගස්ස පහානං.

5. තත්ථ කතමො ලක්ඛණො: යං චෙතසිකානන්ති වෙදයිතං පකප්පිතං උග්ගහිතං විඤ්ඤාතං තං විඤ්ඤාණං[8] ආරම්මණම්පි පච්චයොපි.

6. තත්ථ කතමො චතුබ්‍යූහො: ඉධ සුත්තෙන භගවතො කො අධිප්පායො: යෙ පුනබ්භවං න ඉච්ඡන්ති, තෙ න චෙතයිස්සන්ති න ච පත්ථයිස්සන්තීති. අයං අධිප්පායො.

7. ආවට්ටොති: යා ච චෙතනා පත්ථනා ච අනුසයො ච විඤ්ඤාණට්ඨිති පහානා ච, ඉමානි ද්වෙ සච්චානි.

8. විභත්තීති: නත්ථි විභත්තියා භූමි.

9. පරිවත්තනා පන පටිපක්ඛං සුත්තං.

---

1. පත්ථයන්ති – මජසං, PTS.
2. අරහං – මජසං, PTS.
3. පතිට්ඨති – ම.
4. විචිනති – මජසං.
5. එවං – ම, PTS.
6. විචිනියති – මජසං.
7. විචයනන්තං – මජසං.
8. තබ්බිඤ්ඤාණං – මජසං, PTS.

' න ච චෙතෙති ' යි (ක්ලෙශ) පරියුට්ඨානයාගේ නැසීම දක්වයි, ' න ච අනුසෙ'ති යි අනුසයයන්ගේ නැසීම දක්වයි, ' න ච චෙතෙති ' යි ඖදරික ක්ලේශයන්ගේ ප්‍රහාණය දක්වයි, ' න ච අනුසෙති ' යි සියුම් කෙලෙසුන්ගේ ප්‍රහාණය දක්වයි, ' න ච චෙතෙති ' යි (සෙත භූමි ච ?) ' න ච පත්ථයති ' යි සකදගාමී අනාගාමී භූමි ද, ' න ච අනුසෙති ' යි රහත්භූමි ද (දක්වයි,) ' න ච චෙතෙති ' යි ශීලස්කන්ධයට ප්‍රතිපක්ෂයන්ගේ ප්‍රහාණය දක්වයි. ' න ච පත්ථයති ' යි සමාධිස්කන්ධයට ප්‍රතිපක්ෂයන්ගේ ප්‍රහාණය දක්වයි. ' න ච අනුසෙති ' යි ප්‍රඥස්කන්ධයට ප්‍රතිපක්ෂයන්ගේ ප්‍රහාණය දක්වයි. ' න ච චෙතෙති ' යි අපුණ්‍යමය සංඛාරයන්ගේ ප්‍රහාණය දක්වයි. ' න ච පත්ථයති ' යි පුණ්‍යමය සංස්කාරයන්ගේ ප්‍රහාණය දක්වයි. ' න ච අනුසෙති ' යි ආනෙඤ්ජමය සංස්කාරයන්ගේ ප්‍රහාණය දක්වයි. ' න ච චෙතෙති ' යි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය ද, ' න ච පත්ථයති ' යි අඤ්ඤින්ද්‍රිය ද, ' න ච අනුසෙති ' යි අඤ්ඤාතාවින්ද්‍රිය ද දක්වයි. ' න ච චෙතෙති ' යි මෘදු වූ ඉන්ද්‍රියභාවනාව ද ' න ච පත්ථයති' යි මධ්‍ය වූ ඉන්ද්‍රියභාවනාව ද ' න ච අනුසෙති ' යි අධිමාත්‍ර වූ ඉන්ද්‍රියභාවනාව ද දක්වයි. මේ සූත්‍රාර්ථ යි.

1. එහි දේසනාහාර කවරෙ යැ : මේ සූත්‍රයෙහි චතුස්සත්‍යය දේශිත යි.

2 – 3. යම් චෙතයිතයකුත් යම් පකප්පිතයකුත් ඇද්ද, යම් තැනෙක සිත පිහිටා නම් විචිනනය කෙරේ නම් තෙල අරමුණ ඇත. (එයින් දේශනාව) යෙදෙයි. න ච චෙතෙති න ච පත්ථයති, යි තෙල අරමුණ ඇත. අනුසය ඇති කල්හි කර්මවිඥානය වේ යයි විචිනනය කෙරෙයි යනු යෙදෙයි. නො ද චෙතනා කෙරෙයි, නො ද පතයි, අනුශය ප්‍රහාණයෙන් විඥානස්ථිතිය ගවේෂණය නො කෙරෙත්. ඒ විචය යෙදෙයි. මේ යුක්ති හා විචය යි.

4 එහි පදට්ඨාන කවරෙ යැ : චෙතනාපරියුට්ඨානය චෙතනාපරියුට්ඨානයට පදට්ඨාන යැ, සංකල්පනය උපාදානයට පදට්ඨාන යැ, අනුසය පරියුට්ඨානයට පදට්ඨාන යැ, ඔවුන්ගේ ඡන්දරාග විනාශය පිණිස භාවනාව භවරාගයාගේ ප්‍රහාණය වේ.

5. එහි ලක්ඛණ කවරෙ යැ : 'චෙතසික යයි වෙදයිතයක් ප්‍රකල්පනයක් දැඩිව ගන්නා ලද්දක් විඥානයක් ඇද්ද ඒ විඤ්ඤාණය ආලම්බන ද ප්‍රත්‍යය ද වේ.

6. එහි චතුබ්‍යූහ කවරෙ යැ : මේ සූත්‍රයෙහි, භාග්‍යවතුන් වහන්සේගේ අදහස කවරෙ යැ : යම් කෙනෙක් පුනර්භවය නො කැමැති වෙත් නම් ඔහු චෙතනා නො කරන්නාහු යැ, නො ද ප්‍රාර්ථනා කරන්නාහු යැ යන මේ අධිප්‍රාය යි.

7. ආවත්ත යනු : යම් චෙතනාවක් ප්‍රාර්ථනාවක් අනුශයක් වේ ද, යම් විඥානස්ථිති ප්‍රහාණයකුත් වේ ද, ඔහු සත්‍යයෝ දෙදෙනෙකි.

8. විභත්ති යනු : මෙහි විභත්තිහාරයට භූමි නැති.

9. පරිවත්තනා වැළින් ප්‍රතිපක්ෂ සූත්‍රය යි.

10. තත්ථ කතමො වෙවචනො: චෙතනා රූපසඤ්චෙතනා යාව ධම්මසඤ්චෙතනා. යො අනුසයො තෙ සත්ත අනුසයා.

11. පඤ්ඤත්තීති: චෙතනා පරියුට්ඨාන[2]පඤ්ඤත්තියා පඤ්ඤත්තා. සඞ්කප්පනං උපාදානපඤ්ඤත්තියා පඤ්ඤත්තං. අනුසයො හෙතුපඤ්ඤත්තියා පඤ්ඤත්තා. විඤ්ඤාණට්ඨිති උපපත්තිහෙතුපඤ්ඤත්තියා පඤ්ඤත්තා. චෙතනා සඞ්කප්පනා අනුසයො සමුච්ඡෙදෙ ඡන්දරාගවිනයපඤ්ඤත්තියා පඤ්ඤත්තො. පඨමෙ තෙව ද්වීහි පරිවත්තනකෙහි පටිච්චසමුප්පාදෙ ඉදප්පච්චයතාය මජ්ඣපඤ්ඤත්ති. (?)

12. ඔතරණොති: ද්වීහි පරිවත්තනකෙහි[3] දුක්ඛං ච සමුදයො ච, මජ්ඣිමකෙහි මග්ගො ච නිරොධො ච.

13. සොධනොති: සුත්තෙන සුත්තස්ස ආරම්භො.

14. අධිට්ඨානොති: යං චෙතසිකං සබ්බං අධිට්ඨානෙන එකත්තතාය[4] පඤ්ඤත්තං. 'සඞ්කප්පිත'න්ති උපාදානෙකත්තතාය පඤ්ඤත්තං. විඤ්ඤාණං එකත්තතාය පඤ්ඤත්තං

15. පරික්ඛාරොති: සුභං ච ආරම්මණං අයොනිසො මනසිකාරො චෙතනා හෙතුපච්චයතාය පච්චයො. විඤ්ඤාණස්ස පතිට්ඨානො ධම්මො ආරම්මණපච්චයතාය පච්චයො. තස්ස මනසිකාරො හෙතුපච්චයතාය පච්චයො.

16. තත්ථ කතමො සමාරොපනො: ඉදං සුත්තං සඤ්ඤීතං (?) තත්ථ චෙතෙති විසජ්ජනා ඉති නිද්දිසිතබ්බා, තස්ස දිට්ඨියා විඤ්ඤාණපච්චයා නාමරූපං යාව ජරාමරණං. අයං සමාරොපනො.

ආරම්මණමෙතං න හොති විඤ්ඤාණස්ස ඨිතියා. විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො. නාමරූපනිරොධා යාව ජරාමරණනිරොධො.

## 7 - 14

තත්ථ කතමං සංකිලෙසභාගියං ච නිබ්බෙධභාගියං ච අසෙඛභාගියං ච සුත්තං: "අයං ලොකො සන්තාපජාතො"* යාව "යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා භවෙන භවස්ස විප්පමොක්ඛමාහංසු". සංකිලෙසභාගියං "උපධිහි[4] පටිච්ච දුක්ඛමිදං සම්භොති," (යා තා පන "භවතණ්හා පහීයති,[5] විභවං[6] නාභිනන්දති"ති අයං නිබ්බෙධො,[7] "තස්ස නිබ්බුතස්ස[8]භික්ඛුනො අනුපාදානා[9] පුනබ්භවො න හොති" උපච්චගා සබ්බභවානි තාදී"ති අසෙඛභාගියං.

---

1. චෙතනාපරියුට්ඨානං-මජසා, PTS.
2. පරිවත්තිකෙහි - PTS.
3. එකත්තතාය - ම, PTS.
*. උදානපාළි, නන්දවග්ග.
4. උපාධිං හි - මජසං, PTS.
5. තණ්හා පහීයතායි-මජසං, PTS.
6. භවං - මජසං, PTS.
7. නිබ්බෙධස්ස - මජසං, PTS.
8. නිබ්බුතස්ස - මජසං, PTS.
9. අනුපාදාය - මජසං, PTS.

10. එහි වෙවචන කවරෙ යැ : රූපසංචෙතනාව පටන් ධම්මසංචෙතනා දක්වා චෙතනා යැ, යම් අනුසයයෙක් ඇද්ද ඔහු සප්ත අනුශයෝ යි.

11. පඤ්ඤත්ති යනු : චෙතනාව පරියුට්ඨානපඤ්ඤත්තියෙන් පනවනලද්‍ද. සංකල්පනය උපාදනපඤ්ඤත්තියෙන් පනවනලද, අනුසය හෙතුපඤ්ඤත්තියෙන් පනවනලද, විඤ්ඤාණට්ඨිතිය උපප්‍රාප්තිහෙතු ප්‍රඥප්තියෙන් පනවනලද්‍ද, චෙතනා සංකල්පනා අනුශය සමුච්ඡෙදය ඡන්දරාගවිනයප්‍රඥප්තියෙන් පනවනලද, (පයමෙ කෙවි .... ඡ්ඡඛපඤ්ඤත්ති ?)

12. ඔතරණ යනු : පරිවත්තක දෙකකින් දුඃඛසත්‍යය ද සමුදයසත්‍යය ද, මධ්‍යම පරිවර්තකයන්හෙත් මාර්ගසත්‍යය ද නිරොධසත්‍යය ද දක්වනලද වේ.

13. සොධන යනු : සූත්‍රයෙහි ලා සූත්‍රයාගේ ආරම්භය (දැනගනුකැමැති අර්ථය) වේ.

14. අධිට්ඨාන යනු : යම් චෙතයිතයෙක් ඇද්ද සියල්ල අධිට්ඨානහාරයෙන් ඒකත්තතා සංඛ්‍යාත සාමාන්‍යයෙන් පනවනලද. 'සංකප්පිතං' යනු උපාදනඑකත්තතා යෙන් පනවනලද, සර්මවිඥානය ඒකත්තතායෙන් පනවන ලදි.

15. පටික්ඛාර යනු : සුඛාරම්මණය ද අයොනිසොමනසිකාරය චෙතනා යන මේ හේතුප්‍රත්‍යතායෙන් ප්‍රත්‍යය වෙයි. විඥනයට ප්‍රතිෂ්ඨා වූ ධර්මය ආලම්බන ප්‍රත්‍යතායෙන් ප්‍රත්‍යය වෙයි. ඒ ධර්මයාගේ මනසිකාරය හේතුප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

16. එහි සමාරොපනහාර කවරෙ යැ : මේ සූත්‍රය (සඤ්ඤිතං ?) එහි චෙතනා කෙරෙයි (යනු) වියදුම යයි දක්වියයුත්තිය (?) (තස්ස දිට්ඨයා ?) විඥනප්‍රත්‍යයෙන් නාමරූපය වෙයි, ජරාමරණ දක්වා විස්තර කළයුතු යැ. මේ සමාරොපනහාර යි.

තෙල ආරම්මණය සර්මවිඥනයාගේ ස්ථිතිය පිණිස නො වෙයි. විඥනයාගේ නිරොධයෙන් නාමරූපනිරොධය වෙයි. නාමරූපනිරොධයෙන් ජරාමරණනිරොධය දක්වා විස්තර කළයුතු.

## 7 – 14

එහි සංකිලෙසභාගිය නිබ්බෙධභාගිය අසෙඛභාගිය ද වූ සූත්‍රය කවරෙ යැ : " මේ සත්ව ලොක මෙතමේ (ඥතිව්‍යසනාදීන්) උපන් ශොකසන්තාප ඇත්තේ " යැ යනු පටන් " යම් කිසි මහණ කෙනෙක් වේවයි බමුණුකෙනෙක් වේවයි රූපභවයෙන් හෝ අරූප භවයෙන් භවයාගේ නොහොත් භවදෘෂ්ටියෙන් භවයාගේ මිදීම (ශුද්ධිය) කියත් ද " යනු දක්වා සංකිලෙසභාගිය වෙයි. " බන්ධාදි " උපධීන් නිසා මේ සසරදුක හටගනී " (යනු සංකිලෙස යි.) " භවතෘෂ්ණාව ප්‍රහීණ වෙයි, උච්ඡෙදය ද නො කැමැති වෙයි " යන මේ නිබ්බෙධ යැ. " ඒ කෙලෙස්පිරිනිවනින් නිවුණු මහණහට උපාදන රහිත හෙයින් පුනර්භවය නො වේ." " සුඛදුක්ඛාදියෙහි තාදී වූයේ සියලු භවයන් ඉක්මැවූයේ යැ " යනු ආසෙඛභාගිය යි.

තත්ථ "සන්තාපජාතො"ති: රාගජො සන්තාපො දොසජො මොහජොති තෙසං සන්තාපානං ඨානං දෙසෙති. "ලොකො සන්තාප-ජාතො"ති එසො තිවිධො: සුඛවෙදනීයො දුක්ඛවෙදනීයො අදුක්ඛම-සුඛවෙදනීයො. තත්ථ සුඛවෙදිනීයො එසො රාගසන්තාපො, දුක්ඛවෙදනීයො දොසසන්තාපො, අදුක්ඛමසුඛවෙදනීයො මොහ-සන්තාපො. යථා ච භගවා ආහ. හත්ථකස්ස ආලවකස්ස[1] ගොමයෙ[2] "යෙහි ගහපති පුත්තා[3] රාගජෙහි දොසජෙහි මොහජෙහි සන්තාපෙහි දුක්ඛං සුපති, තෙ මම සන්තාපා න සන්ති".

"රොදං වදති[4] අත්තතො"ති: තෙහි සන්තාපෙහි සන්තාපිතො තිවිධං විපල්ලාසං පටිලභති: සඤ්ඤාවිපල්ලාසං චිත්තවිපල්ලාසං දිට්ඨිවිපල්ලාසං. තත්ථ අසුභෙ සුභන්ති සඤ්ඤාවිපල්ලාසො, දුක්ඛෙ සුඛන්ති චිත්තවිපල්ලාසො, අනිච්චෙ නිච්චන්ති අනත්තනි අත්තාති දිට්ඨිවිපල්ලාසො.

යථා චිත්තස්ස විපල්ලාසො සඤ්ඤා-දිට්ඨි තෙ තිවිධා විතක්කා: චිත්තවිතක්කා විපල්ලාසො, සඤ්ඤාවිතක්කා විපල්ලාසො, දිට්ඨිවිතක්කා විපල්ලාසොපි. තත්ථ අවිජ්ජා විපල්ලාසො ගොචර ගතිපත්තෙය්‍යභූමි, (?) යථා හි තං සඤ්ජානාති යථා විජානාති යථා සඤ්ජානාති ච විජානාති ච. යථා ඛනති චෙතෙති ඉමෙ චත්තාරො විපල්ලාසා. සත්තා යෙහි චතුබ්බිධං අත්තභාවවත්ථුං රොගභූතං ගණ්ඩභූතං 'අත්තා'ති වදන්ති. "රොදං[5] වදති අත්තතො"ති අයං ආවෙටො.

"යෙන යෙන හි මඤ්ඤති තතො තං හොති[6] අඤ්ඤථා"ති 'සුභ'න්ති මඤ්ඤති න තථා හොති. එවං 'සුඛ'න්ති 'නිච්චං අත්තා'ති සො අඤ්ඤථා භවමෙව සන්තං අනාගතං භවං පත්ථෙති. තෙන වුච්චති භවරාගො'ති භවමෙවාභිනන්දතීති[7] යං අභිනන්දති තං දුක්ඛන්ති, පඤ්චක්ඛන්ධෙ නිද්දිසති[8] යං ච තප්පච්චයා සොකපරිදෙවදුක්ඛං තස්ස හි භාවෙස්සති. එත්තාවතා සංකිලෙසො හොති. පහානත්ථං ඛො පන බ්‍රහ්මචරියං වුස්සති තිණ්ණං සන්තාපානං, ඡන්දරාගවිනයො හොති.

"උපධීහි[9] පටිච්ච දුක්ඛමිදං සම්භොතී"ති[10] යෙ භවමෙවාභිනන්දන්ති තං භයං, යස්ස භායති[11] තං දුක්ඛං, තස්ස දුක්ඛස්ස පහානමාහ. සබ්බසො උපාදානානං ඛයා[12] නත්ථි දුක්ඛස්ස සම්භවොති.

---

1. පඨමකස්ස වලාහකස්ස – මජසං, PTS.
2. කො මග්ගෙ – PTS.
3. ගහපතිපුත්ත – ම, PTS.
4. රොගං වදති – ම, PTS.
5. රොගං – ම, PTS.
6. තං හොති – ම, PTS.
7. භවමෙවාභිනන්දති – ම, PTS.
8. නිද්දිසියති – ම, PTS.
9. උපධිං හි – ම.
10. භවතීති – ම, PTS
11. භාවෙස්සති – ම, PTS.
12. උපාදනං ච යං – ම, PTS.

එහි " සන්තාපජාතො " යනු : රාගයෙන් උපන් සන්තාප යැ ද්වේෂයෙන් මොහයෙන් උපන් සන්තාප යි. " ලොකො සන්තාපජාතො " යි ඒ සත්වයන්ගේ ස්ථානය දක්වයි. ඵස්සය තෙවැදෑරුම් යැ : සුඛවෙදනීය යැ දුක්ඛවෙදනීය යැ අදුක්ඛමසුඛවෙදනීය යි. එහි සුඛවෙදනීය ඵස්සය රාගසන්තාප යැ, දුක්ඛවෙදනීය ඵස්සය දෙසසන්තාප යැ, අදුක්ඛම සුඛවෙදනීය ඵස්සය මොහසන්තාප යි. ගෝමගැ වැඩහුන් බුදුහු හත්ථකආලවක කුමරුට මෙසේ වදළහ : " ගැහැවිපුත් රාගයෙන් උපන් ද්වේෂයෙන් උපන් මෝහයෙන් උපන් යම් සන්තාපයකින් දුකසේ හොවී ද ඒ සන්තාපයෝ මට නො වෙති."

" තමා විසින් පහස්නාලද දුක (මෙබන්දක් සතුරකුටත් නො වේව ' යි) වැලැපෙමින් කියයි. (' රොගං ' යන පාඨයෙහි පහස් හේතුයෙන් උපදනා වෙදනා සංඛ්‍යාත රොගය ආත්මවශයෙන් කියයි.) යනු : ඒ සන්තාපයන් විසින් තවනලදුයේ සඤ්ඤාවිපල්ලාස චිත්තවිපල්ලාස දිට්ඨිවිපල්ලාස යන ත්‍රිවිධ විපර්‍යාසයට පැමිණෙයි. එහි අශුභයෙහි ශුභ යයි සඤ්ඤාවිපල්ලාස යැ, දුඃඛයෙහි සුඛ යයි චිත්තවිපල්ලාස යැ, අනිත්‍යයෙහි නිත්‍ය යැ අනාත්මයෙහි ආත්ම යයි දිට්ඨිවිපල්ලාස යි.

චිත්තසඤ්ඤාදිට්ඨි යම්සේ විපල්ලාස වෙත් ද, ඔහු ත්‍රිවිධ විතර්කයෝ වෙති, චිත්තවිතර්කය විපල්ලාස යැ, සංඥවිතර්කය විපල්ලාස යැ, දෘෂ්ටිවිතර්කය විපල්ලාස යි. එහි අවිජ්ජාවිපල්ලාසය (ගොචරා ගතිපතෙය්‍යභූමි ?) යම් සේ ඒ අවිද්‍යාව හැඳිනගනී ද වෙසෙසින් දැනගනී ද යම්සේ හඳුනත්තේත් දැනගත්තේත් වේ ද යම්සේ රුචිකෙරේ ද සිතා ද මේ සතර විපල්ලාසයෝ යැ. සත්වයෝ යම් විපල්ලාසයකින් රොගයක් බඳු වූ ගඩක් බඳු වූ සිවවැදෑරුම් ආත්මභාවවස්තුව ආත්මයයි කියත් ද එබඳු විපල්ලාසයෝ යි. " රොදං වදති අත්තතො " යි මේ ආවට්ට යි.

" යම් යම් පරිද්දෙකින් තමාගේ දුකට පිළියම් සිතත් ද ඒ දුකට එයින් අන්පරිද්දෙකින් පිළියම් කටයුතු වෙයි " යනු ' ශුභ ' යයි සිතයි, එපරිදි ශුභ නො වෙයි, එසෙයින් සුඛ යැ නිත්‍ය යැ ආත්ම යයි සිතයි, (එපරිදි නො වේ.) හේ අන්පරිද්දෙකින් වන්නාවූ මැ අනාගත භවය පතයි. එයින් කියනු ලැබේ, " භවරාග " යයි. " භවමෙවාභිනන්දති " යනු : යමක් අභිනන්දනා කෙරේ ද එය දුක යයි පඤ්ච ස්කන්ධයන් දක්වයි. ඒ හේතුයෙන් යම් ශෝක පරිදේව දුඃඛයක් වේද ඔහුට ඒ දුක වන්නේය (තස්ස හි භායෙස්සති ?) මෙතෙකින් සංක්ලෙසය වේ. තුන් සන්තාපයන්ගේ ප්‍රහාණය පිණිස මගබඹසර වෙසෙයි, (එයින්) ඡන්දරාගවිනය වේ.

" උපධී හි පටිච්ච දුක්ඛමිදං භවති " යනු : යම් කෙනෙක් භවය මැ කැමැති වෙත් ද, එය (විපරිනාමස්වභාව හෙයින්) බියෙකි. යම් (ජරාමරණාදියෙකින්) බිය වේද, එය දුකෙකි. ඒ දුඃඛයාගේ ප්‍රහාණය වදළහ, සර්වප්‍රකාරයෙන් උපාදනයන්ගේ ක්ෂය වීමෙන් දුඃඛයාගේ සම්භවයෙක් නැතැ' යි.

චත්තාරො විපල්ලාසා යථා නිද්දිට්ඨඋපාදානමාහ. තත්ථ[1] පඨමො විපල්ලාසො කාමුපාදානං, දුතියං දිට්ඨුපාදානං, තතියං සීලබ්බතුපාදානං, චතුත්ථං අත්තවාදුපාදානං. තෙසං යො ඛයො නත්ථි දුක්ඛස්ස සම්භවො, උපධිපහානා[2] දුක්ඛනිරොධමාහ.

එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො.

භවතණ්හා පහීයති[3] විභවං නාභිනන්දතීති.

දස්සනභූමිං මඤ්ඤන්ති, "සබ්බසො තණ්හානං ඛයා[4] නිබ්බාන"න්ති ද්වෙ විමුත්තියො කථෙති: රාගවිරාගං ච අවිජ්ජාවිරාගං ච. "තස්ස භික්ඛුනො"ති අනුපාදිසෙසනිබ්බානධාතුං මඤ්ඤන්ති. අයං සුත්තස්ස අත්ථනිද්දෙසො.

2-3 තත්ථ කතමො විචයො: යස්ස යත්ථ පරිළාහෙති[5] තස්ස පරිඩය්හන්තස්ස[6] නො යථාභූතං නත්ථි නිබ්බින්දති ච, අයං විචයො ච යුත්ති ච.

4. පදට්ඨානො: රාගජො පරිළාහො[7] සුඛින්ද්‍රියස්ස සොමනස්සින්ද්‍රියස්ස[8] ච පදට්ඨානං, දොසජො පරිළාහො දුක්ඛින්ද්‍රියස්ස දොමනස්සින්ද්‍රියස්ස ච පදට්ඨානං. මොහජො පරිළාහො[9] උපෙක්ඛින්ද්‍රියස්ස දොමනස්සින්ද්‍රියස්ස ච පදට්ඨානං.

5. තත්ථ කතමො ලක්ඛණො හාරො: ඵස්සපරෙතො වෙදනාපරෙතො සඤ්ඤාපරෙතොපි සඞ්ඛාරපරෙතොපි යෙන යෙන මඤ්ඤති[10] යදි සුභනිමිත්තෙන යදි සුඛනිමිත්තෙන යදි නිච්චනිමිත්තෙන යදි අත්තනිමිත්තෙන අසුභෙ සුභන්ති[11] මඤ්ඤති, එවං සබ්බං, රාගජෙ පරිළාහෙ වුත්තෙ චත්තාරො පරිළාහා වුත්තා භවන්ති. රාගජො දොසජො මොහජො දිට්ඨිජො ච, රාගං වදාමීති අත්තතො වදති. සබ්බානි පත්ථරසපදනි, අනිච්චං දුක්ඛන්ති.

6. තත්ථ කතමො චතුබ්‍යූහො: ඉධ සුත්තෙ භගවතො කො අධිප්පායො: යෙ පරිළාහෙන[12] න ඉච්ඡන්ති[13] තෙ භවං නාභිනන්දන්ති. යෙ භවං නාභිනන්දන්ති[14] තෙ පරිනිබ්බායන්ති. අයං අධිප්පායො.

7 තත්ථ කතමො ආවට්ටො: සඞ්කිලෙසභාගියෙන දුක්ඛං ච සමුදයං ච නිද්දිසති. නිබ්බෙධභාගියෙන මග්ගං ච නිරොධං ච.

8. තත්ථ කතමො විභත්ති හාරො: සන්තාපජාතො රොගජාතො, රොදං වදති අත්තනො, තං න එකංසෙන හොති අමනසිකාර සන්තාපජාතො ඛො න ච රොදං අත්තනො වදති.

---

1. තස්ස - මජසං, PTS.
2. උපධිනිදානං - මජසං, PTS.
3. විභවතණ්හා න හොති-ම, PTS.
4. තණ්හක්ඛයං - ම, PTS.
5. පරිදහෙති - PTS.
6. පරිදහන්තස්ස - PTS.
7. රාගපරිදහො - PTS.
8. දොමනස්සින්ද්‍රියස්ස - මජසං, PTS.
9. පරිදහො - PTS.
10. යෙන නමඤ්ඤති - PTS.
11. සුභෙ සුභන්ති - PTS.
12. යෙන, පරිදහෙන - PTS.
13 අවජ්ජන්ති-PTS.- ආවජ්ජන්ති මජසං.
14. භගවා නාභිනන්දන්ති - PTS.

සතර විපල්ලාසයෝ යථානිර්දිෂ්ට වූ උපාදානය කියති. එහි ප්‍රථම විපල්ලාසය කාමූපාදාන යැ, දෙවැන්න දිට්ඨූපාදාන යැ, තෙවැන්න සීලබ්බතූපාදාන යැ, සතරවැන්න අත්තවාදූපාදාන යි. ඔවුන්ගේ යම් ක්ෂයවීමෙක් ඇද්ද (එකල්හි) දුඃඛයාගේ සම්භවයෙක් නැත. උපධීන්ගේ ප්‍රහාණයෙන් දුක්ඛනිරෝධය වදළහ.

මෙසේ (ත්‍රිලක්ෂණප්‍රතිවේධාකාරයෙන්) තෙල භව යයි කියනලද පඤ්චස්කන්ධය තත්වූපරිදි විදර්ශනාසහිත මාර්ගඥානයෙන් දක්නහුට භවතෘෂ්ණාව ප්‍රහීණ වෙයි, විභව සංඛ්‍යාත උච්ඡේදය ද නො කැමැති වේ ' යයි.

දර්ශනභූමිය පවසයි. සර්වප්‍රකාරයෙන් තෘෂ්ණාවන්ගේ ක්ෂය වීමෙන් නිර්වාණය වේ යයි රාගවිරාගචෙතොවිමුත්තිය ද අවිජ්ජාවිරාගපඤ්ඤාවිමුත්තිය ද යන දෙවැදෑරුම් විමුක්ති වදරති. '' තස්ස භික්ඛුනො '' යී අනුපාදිසෙස නිර්වාණධාතුව වදරත්. මේ සූත්‍රයාගේ අර්ථනිර්දෙශ යි.

2 – 3. එහි විචය කවරෙ යැ : යම් නැනෙක යමකුට පරිදාහය වේ ද, දවෙන්නාවූ ඔහුට (සො යථාභූතං නන්ථි ?) නිර්වෙදයට පැමිණෙන්නේ ද වෙයි. මේ විචය ද යුක්ති ද වේ.

4. පදට්ඨාන කවරෙ යැ : රාගයෙන් උපන් පරිදාහය සුඛින්ද්‍රියට ද සොමනස්සින්ද්‍රියට ද පදට්ඨාන යැ, දෙසජපරිළාහය දුක්ඛින්ද්‍රියට ද දෙමනස්සින්ද්‍රියට ද, පදට්ඨාන යැ, මෝහයෙන් උපන් පරිළාහය උපෙක්ඛින්ද්‍රියට ද දෙමනස්සින්ද්‍රියට ද පදට්ඨාන යි.

5. එහි ලක්ඛණහාර කවරෙ යැ : එස්සයෙන් මඩනා ලදුයේ වෙදනායෙන් – සංඥයෙන් – සංස්කාරයෙන් ද මඩනාලදුයේ යම් යම් පරිද්දෙකින් ඉදින් ශුභනිමිත්ත වශයෙන් හෝ සුඛනිමිත්තවශයෙන් හෝ නිත්‍යනිමිත්තවශයෙන් හෝ ආත්මනිමිත්ත වශයෙන හෝ (තෘෂ්ණා විසින්) සිතා ද, අශුභයෙහි ශුභ යයි සිතයි, මෙසේ සියල්ල කි යැයුතු. රාගජපරිළාහය කී කල්හි සතර පරිදාහයෝ කියනලද්දහු වෙති. රාගජ යැ දෙසජ යැ මොහජ යැ දිට්ඨිජ යැ යන සතර යි. '' රාගං වදමි '' යනු ආත්මවශයෙන් කියයි. සියලු පසළොස් පදයෝ වෙති. (අනිච්චං දුක්ඛන්ති ?)

6. එහි චතුබ්‍යූහහාර කවරෙ යැ : මේ සූත්‍රයෙහි භාග්‍යවතුන් වහන්සේගේ අදහස කවරෙ යැ : යම් කෙනෙක් පරිදාහයෙන් නො පිරි වෙත් ද, ඔහු භවය නො කැමැති වෙති, යම් කෙනෙක් භවය නො කැමැති වෙත් ද ඔහු පිරිනිවෙත්. මේ භාග්‍යවතුන් වහන්සේගේ අදහස යි.

7. එහි ආවට්ටහාර කවරෙ යැ : සංකිලෙසභාගිය සූත්‍රයෙන් දුක්ඛය ද සමුදය ද දක්වයි, නිබ්බෙධභාගියසූත්‍රයෙන් මග්ගය ද නිරොධය ද දක්වයි.

8. එහි විභත්තිහාර කවරෙ යැ : භවගත් සන්තාප ඇතියේ භවගත් රොග ඇතියේ යැ, '' රොදං වදති අත්තනො '' යනු : එය ඒකාන්තයෙන් නො වෙයි. නො මෙනෙහි කිරීම හෙතු කොට උපන් සන්තාප ඇතියේ වැලැපෙමින් තමහට වන් දුක නො ද කියයි.

9. තත්ථ කතමො පරිවත්තනො : පක්ඛපටිපක්ඛනිදස්සනත්ථං භූමි පරිවත්තනාය,

10 තත්ථ කතමො වෙවචනො හාරො : රොගං ච අත්තතො වදති, සල්ලං අත්තතො වදති. පන්නරස පදානි සබ්බානි වත්තබ්බානි.

11. තත්ථ කතමා පඤ්ඤත්ති : සත්තාපජාතො'ති දොමනස්සපදට්ඨානං, සබ්බ වචනපඤ්ඤත්තියා පඤ්ඤපෙති. රොගං වදති අත්තතො, විපල්ලාසො සබ්බකිලෙසපඤ්ඤත්තියා පඤ්ඤපෙති. යං අභිනන්දති[1] -පෙ- තං දුක්ඛන්ති විපල්ලාසනික්ඛෙපපඤ්ඤත්තියා පඤ්ඤත්තා, තෙ අකතත්තසත්තා ලොකා මජ්ඣෙන වෙමත්තතාය පඤ්ඤත්තා.

12 තත්ථ කතමො ඔතරණො : සත්තාපජාතො'ති තීණි අකුසලමූලානි, තෙ සංඛාරා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා, ධාතූසු ධම්මධාතු, ආයතනෙසු ධම්මායතනං, ඉන්ද්‍රියෙසු ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ච පදට්ඨානං.

13. තත්ථ කතමො සොධනො : සුද්ධො සුත්තස්ස ආරම්භො.

14. තත්ථ කතමො අධිට්ඨානො හාරො : පරිළාහො'ති[2] යෙ සත්තා ලොකා එකත්තපඤ්ඤත්තියා පඤ්ඤත්තා, තෙ අකතත්තසත්තා ලොකා මජ්ඣෙන වෙමත්තතාය පඤ්ඤත්තා.

15. තත්ථ කතමො පරික්ඛාරො : 'සත්තාපජාතො'ති අයොනිසොමනසිකාරො හෙතු, විපල්ලාසං ච පච්චයො. තත්ථ ද්වීහි ධම්මෙහි අත්තා අභිනිවිට්ඨො චිත්තං ච චෙතසිකං ච ධම්මෙ උභයානි තස්ස විපරීතෙන පරාමසතො.

අපරො පරියායො : චෙතසිකෙහි ධම්මෙහි අත්තසඤ්ඤා අනත්තසඤ්ඤං[3] සමුග්ඝාතෙති. අපරො පරියායො : අනිච්චසඤ්ඤා චෙතසිකෙසු ධම්මෙසු, න තු අත්තසඤ්ඤා. ඉදං වුච්චති චිත්තන්ති වා මනොති වා විඤ්ඤාණන්ති වා, ඉදං දීඝරත්තං අබ්භුග්ගතං එතං මම, එසො 'හමස්මි, එසො මෙ අත්තා'ති. තත්ථ චෙතසිකා ධම්මානුපස්සනා, එසාපි ධම්මසඤ්ඤා. තස්ස කො හෙතු, කො පච්චයො. අහඞ්කාරො හෙතු, මමඞ්කාරො පච්චයො.

16. තත්ථ කතමො සමාරොපනො : අයං ලොකො සත්තාපජාතො'ති අකුසලං මනොනති, විඤ්ඤාණං නාමරූපස්ස පච්චයො, යාව ජරාමරණන්ති. අයං සමාරොපනො.

'එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති' අකුසලමූලානං පහානං. තත්ථ අවිජ්ජානිරොධා, අවිජ්ජානිරොධා යාව ජරාමරණනිරොධො. අයං සමාරොපනො.

1. නාභිනන්දති - මජ්ඣං, PTS.
2. පරිදහෙති - PTS.
3. අනත්තසඤ්ඤා - මජ්ඣං, PTS.

9. එහි පරිවත්තන කවරෙ යැ : පක්ෂ ප්‍රතිපක්ෂ දැක්වීම සඳහා පරිවත්තනහාරයට භූමි වෙයි.

10. එහි වෙවචනහාර කවරෙ යැ : රොගය ආත්මයෙහයිත් කියයි. සල්‍යය ආත්මයෙහයිත් කියයි. සියලු පසළොස් පදයෝ කියැයුත්තාහු යි.

11. එහි පඤ්ඤත්ති කවර : ' සත්තාපජාතො ' යනු දෙම්නසට පදට්ඨාන යැ, සියල්ල වචනපඤ්ඤත්තියෙන් (?) පනවයි, ' රොගං වදති අත්තතො ' යනු : විපල්ලාස යැ (එය) සංකිලෙසපඤ්ඤත්තියෙන් පනවයි, '' යං අභිනන්දති –පෙ– තං දුක්ඛං ' යනු විපල්ලාසනික්ඛෙපපණ්ණත්තියෙන් පනවනලද. (තෙ අකතසත්තා . . . . . . පඤ්ඤත්තා ?)

12. එහි ඔතරණහාර කවරෙ යැ : ' සත්තාපජාතො ' යනු : තුන් අකුශලමූලයෝ යැ, ඒ සංස්කාරයෝ සංස්කාරස්කන්ධයෙහි බැසගෙන සිටියාහු යැ, ධාතූන් කෙරෙහි ධම්මධාතු යැ ආයතනයන් කෙරෙහි ධම්මායතන යැ ඉන්ද්‍රියයන් කෙරෙහි ඉත්ථීන්ද්‍රිය පුරිසින්ද්‍රිය ද වෙයි. මේ පදට්ඨාන යි.

13. එහි සොධන කවරෙ යැ : සූත්‍රයාගේ ආරම්භය ශුද්ධ යි.

14. එහි අධිට්ඨානහාර කවරෙ යැ : ' පරිළාහො ' යනු : යම් ලෝවැසි සත්ව කෙනෙක් එකත්ව (සාමාන්‍ය) ප්‍රඥප්තියෙන් පනවනලද්දහු ද ඔහු (අකතසත්තා ලොකාමජ්ඣෙන ?) වෙමත්තතායෙන් පනවනලද්දහු යි.

15. එහි පරික්ඛාර කවරෙ යැ : ' සත්තාපජාතො ' යනු : අයොනිසො මනසිකාරය හෙතු යැ, විපල්ලාසය ප්‍රත්‍ය යැ, එහි ධර්ම දෙකකින් (අත්තා අභිනිවිට්ඨා . . . . පරාමසතො ?)

අන්‍ය පරියායයෙකි : චෛතසිකධර්මයන් හෙතු කොට ආත්මසංඥව අනාත්මසංඥව නසයි. අන්‍යත් පරියායයෙකි : චෛතසිකධර්මයන්හි අනිත්‍යසංඥව වෙයි. ආත්මසංඥව නොවේ. මෙය චිත්ත යැ හෝ මනො යැ හෝ විඤ්ඤාණ යැ හෝ යයි කියනුලැබෙ. ' තෙල මාගේ යැ තෙලෙ මම් වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ ' යන මෙ දීර්ඝකාලයෙහි උපන්නේ යැ, එහි චෛතසික වූ ධම්මානුපස්සනාව යැ, මෙ ද ධර්ම සංඥ වෙයි, ඊට හෙතු කවරෙ යැ, ප්‍රත්‍යය කවරෙයැ : අහංකාරය හෙතු යැ, මමංකාරය ප්‍රත්‍යය යි.

16. එහි සමාරොපන කවරෙ යැ : ' අයං ලොකො සත්තාපජාතො ' යී අකුශලය කියයි. විඤ්ඤාණය නාමරූපයට ප්‍රත්‍යය වෙයි. ' ජරාමරණං ' යනු දක්වා කියැයුතු, මෙ සමාරොපන යි.

'' එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති '' යනු : අකුශලමූලයන්ගේ ප්‍රහාණ යැ, එහි අවිජ්ජානිරොධය වෙයි. අවිජ්ජානිරොධයෙන් ජරාමරණනිරොධය දක්වා කියැයුතු, මෙ සමාරොපනහාර යි.

## 7 - 15

"චත්තාරො පුග්ගලා : අනුසොතගාමී පටිසොතගාමී ඨිතත්තො තිණ්ණො පරගතො[1] ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො''ති.*

තත්ථ යො අනුසොතගාමී, අයං කාමෙ සෙවති, පාපං ච කම්මං කරොති, යාව කාමෙ පටිසෙවති. ඉදං ලොභො අකුසලමූලං, සො යෙව තණ්හා. සො තෙහි කාමෙහි වුය්හති අනුසොතගාමීති වුච්චති. යො පුග්ගලො තාහි ගමිතො තප්පච්චයා තස්ස හෙතු අකුසලකම්මං කරොති කායෙන ච වාචාය ච. අයං වුච්චති පාපකම්මං කරොතීති. තස්ස තීණි සොතානි : සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො. ඉමෙහි තීහි සොතෙහි තිවිධධාතුයං උප්පජ්ජති, කාමධාතුයං රූපධාතුයං අරූපධාතුයං.

තෙන පටිපක්ඛෙන යො කාමෙ න පටිසෙවති : යො සීලවතං න පරාමසති, යො සක්කායදිට්ඨීනං පහානාය කාමෙසු යථාභූතං ආදීනවං පස්සති, සො න ච[2] තෙ ධම්මෙ පටිසෙවති, යං ච තප්පච්චයා (?) තිට්ඨති. "බ්‍රාහ්මණො''ති අරහා[3] කිර, තත්ථ අරහා[3] තස්ස පාරගතො[4] හොති පාරගතස්ස ථලෙ තිට්ඨතීති[5]. සොපාදිසෙසා නිබ්බානධාතු.

අනුසොතගාමී'ති[6] දස්සනප්පහාතබ්බානං සංයොජනානං අප්පහානමාහ. 'පටිසොතගාමීති[6] දිට්ඨෙකට්ඨානං ච කිලෙසානං පහානමාහ. ඨිතත්තෙන[7] පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පහානමාහ. තත්ථ අනුසොතගාමිනා මග්ගරූපිමාහ (?) පටිසොතගාමිනා ඨිතත්තෙන ච මග්ගමිතිමාහ'' පාරගතෙන[8]. සාවකා අසෙඛා ච සම්මාසම්බුද්ධා ච වුත්තා. අනුසොතගාමිනා සක්කායසමුදයගාමිනිං පටිපදමාහ. පටිසොතගාමිනා ඨිතත්තෙන සක්කායනිරොධගාමිනිං පටිපදමාහ. පාරගතෙන දස අසෙඛා අරහත්තධම්මා[9] වුත්තා අයං සුත්තත්ථො.

1. තත්ථ කතමා දෙසනා : ඉමස්මිං හි සුත්තෙ චත්තාරි අරියසච්චානි දෙසිතානි. තෙධාතුකලොකසමතික්කමනං ච.

2. තත්ථ කතමො විචයො හාරො : යො කාමෙ පටිසෙවති, සො පාපකම්මං[10] කරෙය්‍යාති, යො ච කාමෙ න පටිසෙවති, සො පාපකම්මං න කරෙය්‍යාති, යො ච ඉමෙහි ද්වීහි භූමීහි උත්තිණ්ණො පාරගතොති යා වීමංසා අයං විචයො.

3. යුත්තීති : යුජ්ජති සුත්තෙසු, න යුජ්ජතීති යා වීමංසා අයං යුත්ති.

---

1. පාරඞ්ගතො - ම, PTS.
*. චතුක්කඞ්ගුත්තර භණ්ඩගාමවග්ග.
2. සෙන ච - මජසං, PTS.
3. ආරහා - ම, PTS.
4. පරඞ්ගතො - ම, PTS.
5. තිට්ඨති - මජසං.
6. ගාමිනීති - මජස, PTS.
7. ථලෙ ඨිතත්තෙන - මජසං.
8. පාරඞ්ගතෙන - ම, PTS.
9. අරහත්තා ධම්මා - මජසං, PTS,
10. පාපනං - මජසං, PTS.

7 – 15

'' පුද්ගලයෝ සතරදෙනෙකි : අනුසොතගාමී යැ පටිසොතගාමී යැ ඨිතත්ත යැ ඔඝ තරණය කළ පරතෙරට ගිය නිවන්තෙලෙහි සිටුනා ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ යි.

එහි යමෙක් අනුසොතගාමී වේ ද, මෙතෙම පස්කම් සේවනය කෙරෙයි, පව්කම් ද කෙරෙයි, යම් කාමසේවනයක් ඇද්ද මේ ලොභඅකුශලමූල යැ, ඒ ලොභය මැ තණ්හා යැ, හේ ඒ කාමයන් විසින් ගෙනයනුලැබෙයි, එහෙයින් අනුසොතගාමී යයි කියනුලැබේ. යම් පුහුලෙක් ඒ තෘෂ්ණාවන් විසින් ගෙනයනුලබන්නේ ඒ කාමහේතුයෙන් කයිනුදු බයිනුදු පව්කම් කෙරේ ද, මේ තෙමේ පව්කම් කෙරේ යයි කියනු ලැබේ. ඔහුට සක්කාය දිට්ඨි යැ, විචිකිච්ඡා යැ සීලබ්බතපරාමාස යැ යන තුන් ස්‍රොතස්හු වෙති. මේ තුන් ස්‍රොතසුන් කරණ කොට කාමධාතු රූපධාතු අරූපධාතු යන ත්‍රිවිධ ධාතුයෙහි උපදී.

ඒ ප්‍රතික්ෂෙපයෙන් යමෙක් කාමයන් සේවනය නො කෙරේද, යමෙක් ශීලව්‍රත පරාමර්ශ නො කෙරේ ද, යමෙක් සත්කායදෘෂ්ටිප්‍රහාණය පිණිස කාමයන්හි යථාභූත ව ආදීනව දකී ද, හේ ඒ (අකුශල) ධර්මයන් නො ද සේවනය කෙරෙයි, ඒ හෙතුයෙන් නිවන්තෙලෙහි සිටී. 'බ්‍රාහ්මණ' යනු රහත්හු යැ, එහි රහත්හු ඒ ඔඝයාගේ පාරයට ගියාහු වෙති. පාරයට ගියහුගේ 'ථලෙ තිට්ඨති' යනු සොපාදිසෙසනිබ්බානධාතු යි.

'අනුසොතගාමී' යයි දර්ශනයෙන් ප්‍රහාතව්‍ය වූ සංයොජනයන්ගේ අප්‍රහාණය කීහ. 'පටිසොතගාමී' යයි දෘෂ්ටිය හා එකත්වයට ගිය ක්ලේශයන්ගේ ප්‍රහාණය වදළහ. ඨිතත්ත පුද්ගලයාගෙන් පඤ්ච ඔරම්භාගිය සංයොජනයන්ගේ ප්‍රහාණය වදළහ. එහි අනුසොතගාමී පුද්ගලයාගෙන් (මග්ගරූපිමාභ ?) පටිසොතගාමීහුගෙන් ද සිට්පියවි ඇතියහුගෙන් ද මාර්ගය වදළහ. පාරයට ගියහුගෙන් අශෛක්ෂ ශ්‍රාවකයෝ ද සම්‍යක් සම්බුද්ධහු ද වදරනලද්දහු යැ. අනුසොතගාමීහුගෙන් සත්කායසමුදයගාමිනී ප්‍රතිපදාව වදළහ. පටිසොතගාමීහුගෙන් සිට්පියවි ඇතියහුගෙන් ද සත්කායනිරොධගාමිනී ප්‍රතිපදාව වදළහ. පාරයට ගියහුගෙන් අශෛක්ෂ වූ දස අර්හත්වධර්මයෝ වදරනලද්දහ. මේ සූත්‍රාර්ථ යි.

1. එහි දේශනා කවරි : මේ සූත්‍රයෙහි සතර ආර්‍යසත්‍යයෝ ද ත්‍රෛධාතුක ලොකය ඉක්මැවීම ද දෙසන ලදහ.

2. එහි විචයහාර කවරෙ යැ : යමෙක් කාමයන් සෙවනය කෙරේද හේ පව්කම් කරන්නේ යයි ද යමෙක් කාමයන් නො සෙවුනේ ද හේ පව්කම් නො කරන්නේ යයි ද යමෙක් මේ දෙ භූමියෙන් උත්තීර්ණ වූයේ පාරයට ගියේ යයි ද යම් විමංසාවක් ඇද්ද මේ විචය යි.

3. යුත්ති යනු : සූත්‍රයන්හි ලා යෙදේ ද නොයෙදේ දැයි යම් විමංසාවක් ඇද්ද, මේ යුත්තිහාර යි.

4. පදට්ඨානොති: අනුසොතගාමිනො සත්තන්නං සංයොජනානං පදට්ඨානං. අකුසලස්ස කිරියා අකුසලස්ස මූලානං පදට්ඨානං. පටිසොතගාමිනො යථාභූතදස්සනස්ස පදට්ඨානං. ඨිතත්තෙන අසංහාරියාය[1] පදට්ඨානං. පාරගතොති[2] තතාවි භූමියා[3] පදට්ඨානං.

5. තත්ථ කතමො ලක්ඛණො හාරො: යො අනුසොතං ගච්ඡති තණ්හාවසෙන සබ්බසම්පි කිලෙසානං වසෙන ගච්ඡති. යො පටිසොතං වායමති තණ්හාය සබ්බසම්පි සො කිලෙසානං වායමති පටිසොතං. යො අත්තනා ඨිතො කායෙනපි සො ඨිතො වාචාචිත්තෙනපි සො ඨිතො. අයං ලක්ඛණො හාරො.

6. තත්ථ කතමො චතුබ්‍යූහො: ඉධ සුත්තෙ භගවතො කො අධිප්පායො: යෙ අනුසොතගාමිනියා පටිපදාය නාභිරමිස්සන්ති, තෙ පටිසොතං වායමිස්සන්තීති යාව තදවි භූමියං. (?) අයං අධිප්පායො.

7. ආවට්ටොති: ඉධ සුත්තෙ චත්තාරි සච්චානි දෙසිතානි.

8. තත්ථ කතමො විභත්තිහාරො: යො කාමෙ පටිසෙවති, පාපං ච කම්මං කරොති, සො අනුසොතගාමීති න එකංසෙන, සොතාපන්නොපි කාමෙ පටිසෙවති, තංභාගියං ච පාපකම්මං කරොති, "කිඤ්චාපි සෙබොපි[4] කරෙය්‍ය පාපං"* යථා සුත්තෙ නිද්දිට්ඨො, න ච සො අනුසොතගාමී, ඉදං විභජ්ජ බ්‍යාකරණීයං. න ච කාමෙ පටිසෙවති න ච පාපකම්මං කරොති පටිසොතගාමී න ච එකංසෙන, සබ්බා[5] බාහිරකො කාමෙසු වීතරාගො න ච කාමෙ පටිසෙවති, තෙ න ච පාපකම්මං කරොන්ති[6] අනුසොතගාමී පටිසොතගාමී. අයං විභත්ති.

9 තත්ථ කතමො පරිවත්තනො හාරො: නිද්දිට්ඨො පටිපක්ඛො.

10. වෙවචනොති: කාමෙසු, වත්ථුකාමාපි කිලෙසකාමාපි රූපසද්දගන්ධරසඵස්සපුත්තදාරදාසකම්මකර[7]පොරිසං ච පරිග්ගහා.

11 පඤ්ඤත්තීති: සබ්බෙ පුථුජ්ජනා එකත්තාය පඤ්ඤත්තා. 'අනුසොතගාමී'ති කිලෙසසමුදාචාරපඤ්ඤත්තියා පඤ්ඤත්තා. යෙ පන සෙඛා පුග්ගලා තෙ නිබ්බානපඤ්ඤත්තියා පඤ්ඤත්තා. යෙ පන අනාගාමී තෙ අසංහාරියපඤ්ඤත්තියා පඤ්ඤත්තා. අයං පඤ්ඤත්ති.

12 ඔතරණොති: යො අනුසොතගාමී, සො දුක්ඛං. යෙ තස්ස ධම්මා, තෙ දුක්ඛස්ස සමුදයො. යං රූපං අයං රූපක්ඛන්ධො, එවං පඤ්චපි ඛන්ධා පටිච්චසමුප්පාදෙ. තෙ කිලෙසා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා, ධම්මායතනං ධම්මධාතු ඉන්ද්‍රියෙසු ච පඤ්ඤත්තා.

---

1. අසංහාරියාය – මජසං, PTS.
2. පාරංගතොති – මජසං, PTS.
3. තදවි භූමියා – මජසං, PTS.
4. සෙක්ඛොපි – ම, PTS.
* "කිඤ්චාපි සො කම්මං කරොති පාපකං" ?
5. සබ්බෙ – ම, PTS.
6. කරොති – මජසං, PTS.
7. කම්මකාර – PTS.

4. පදට්ඨාන යනු : අනුසොතගාමී යනු සත් සංයොජනයන්ට පදට්ඨාන යැ, අකුසල් කිරීම අකුශලමූලයන්ට පදට්ඨාන යැ, පටිසොතගාමී යනු යථාභූතදර්ශනයට පදට්ඨාන යැ, ඨිතත්ත යනු අසංහාරි ය(පෙරළා නො එන ?) මාර්ගයට පදට්ඨාන යැ, පාරගතො යනු ක්ෂීණාශ්‍රවභූමියට පදට්ඨාන යි.

5. එහි ලක්ඛණහාර කවරෙ යැ : යමෙක් තෘෂ්ණාවශයෙන් අනුසොතයට යේ ද, (හේ) සියලු මැ ක්ලෙශයන්ගේ වශයෙන් යෙයි. යමෙක් තණ්හායෙන් පටිසොතයට (යැමට) වෑයම් කෙරේ ද හේ සියලු මැ ක්ලෙශයන්ගේ පටිසොතයට වෑයම් කෙරෙයි, යමෙක් තමා සිටීයේ කයිනුදු හේ සිටීයේ යැ වචනයෙන් හා චිත්තයෙනුදු හේ සිටීයේ යි. මෙ ලක්ඛණ හාර යි.

6. එහි චතුබ්‍යූහහාර කවරෙ යැ : මේ සූත්‍රයෙහි භාග්‍යවතුන් වහන්සේගේ අදහස කවරෙ යැ : යම් කෙනෙක් අනුසොතගාමීනී පටිපදයෙහි නො ඇලෙන්නාහු ද, ඔහු පටිසොතයට වෑයම් කරන්නාහු යයි (යාව කදව් භූමියං ?) මේ අදහස යි.

7. ආවට්ට යනු : මේ සූත්‍රයෙහි චතුරාර්‍ය්‍යසත්‍යයෝ දේශනාකරනලද්දහු යැ.

8. එහි විභත්තිහාර කවරෙ යැ : යමෙක් කාමයන් සෙවනය කෙරේ ද පවකමුදු කෙරේ ද, හේ අනුසොතගාමී යයි ඒ කාන්තයෙන් නො වේ. සෝවන් පුහුල් ද කාමයන් සේවනය කෙරෙයි, තද්භාගිය වූ පවකමුදු කෙරෙයි, '' කිඤ්චාපි සො කම්මං කරොති පාපකං '' යි සූත්‍රයෙහි දක්වූ පරිදි හේ නො ද අනුසොතගාමී වෙයි. මෙය විභාග කොට ප්‍රකාශ කළයුතු යැ. කාමයන් නො ද සෙවුනෝ යැ, පවකම් නො ද කෙරෙයි, (එහෙත්) ඒකාන්තයෙන් පටිසොතගාමී නො ද වෙයි. කාමයන්හි වීතරාග වූ ශාසනයෙන් බැහැර වූ සියලු දෙනෙ නො ද කාමයන් සේවනය කෙරෙයි, ඔහු නො ද පවකම් කෙරෙති, (ඔහු) අනුසොතගාමී පටිසොතගාමී ද වෙත්. මේ විභත්තිහාර යි.

9. එහි පරිවත්තනහාර කවරෙ යැ : ප්‍රතිපක්ෂය දක්වන ලද්දේ යි.

10. වෙවචන යනු : කාමයන් කෙරෙහි වස්තුකාමයෝ ද ක්ලෙශකාමයෝ ද වෙති, රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ පුත්‍රදර දස කම්කරු පුරුෂයෝ ද අයැතියෝ යි.

11. පඤ්ඤත්ති යනු : සියලු පුහුදුන්හු ඒකත්තතායෙන් පනවන ලදහු යැ, ' අනුසොත ගාමී ' යනු ක්ලේශසමුදවාරප්‍රඥප්තියෙන් ප්‍රඥප්ත යැ, යම් ශෛක්ෂ පුද්ගල කෙනෙක් වෙද්ද ඔහු නිබ්බාන පඤ්ඤත්තියෙන් ප්‍රඥප්ත යැ, යම් අනාගාමීහු වෙද්ද ඔහු අසංහාරිය පඤ්ඤත්තියෙන් පනවනලදහු යි. මේ පඤ්ඤත්තිහාර යි.

12. ' ඔතරණ ' යනු : යමෙක් අනුසොතගාමී වේ ද හේ දුක්ඛ යැ, ඒ අනුසොතගාමීහු ගේ යම් ධර්ම කෙනෙක් ඇද්ද ඒ ධර්මයෝ දුක්ඛසමුදය යැ, යම් රූපයක් ඇද්ද මේ රූප ස්කන්ධ යැ, මෙසේ පඤ්චස්කන්ධයෝ මැ පටිච්චසමුප්පාද යැ, ඒ ක්ලෙශයෝ සංස්කාර ස්කන්ධයෙහි බැසගත්තාහු යැ, ධම්මායතන ධම්මධාතු ඉන්ද්‍රියයන්හි ද ප්‍රඥප්තයෝ යි.

13. සොධනොති : යෙනාරම්භෙන ඉදං සුත්තං දෙසිතං, සො ආරම්භො සබ්බො සුද්ධො.

14. අධිට්ඨානොති : පටිසොතගාමිනො[1] සබ්බෙ සොතාපන්නා එකත්තෙන ච නිද්දිට්ඨා, රාගානුසයපටිසොතගාමිනො සෙඛා ච මග්ගා ච සෙඛො ච පුග්ගලො. 'ඨිතත්තො'ති : වීතරාගො එකත්තතාය[2] පඤ්ඤත්තො. 'පාරගතො'ති සබ්බෙ අරහන්තො සබ්බෙ පච්චෙකබුද්ධා සම්මාසම්බුද්ධා ච එකත්තතාය[2] පඤ්ඤත්තා.

15 පරික්ඛාරොති : අනුසොතගාමිනො පාපමිත්තපච්චයො, කාම-පරියුට්ඨානං හෙතු. පටිසොතගාමිනො ද්වෙ හෙතු, ද්වෙ පච්චයා ච, යාව සම්මාදිට්ඨියා උප්පාදාය දිට්ඨි[3] තස්ස පටිලද්ධමග්ගො හෙතු, ආරම්භො පච්චයො, කායිකො චෙතසිකස්ස කොට්ඨාසො ච.

16. සමාරොපනොති : විභත්ති ඉදං සුත්තං නත්ථි සමාරොපනාය භූමි.

## 7 - 16

"චත්තාරො ආනිසංසා[4] සොතානුධතානං[5] යාව දිට්ඨියා සුප්පටි-විද්ධානං"* සුත්තං විත්ථාරෙන කාතබ්බං. යුඤ්ජතො ඝටෙන්තස්ස වායමතො ගිලානො මරණකාලෙ දෙවභූතො පච්චෙකබොධිං පාපුණාති.

'සොතානුධතා'ති[6] සද්ධම්මසවනෙන[7] කතං හොති. න ච අධි-පඤ්ඤාධම්මවිපස්සනාය තස්ස චිත්තං තසිතං හොති, න ච නිබ්බිද්ධත්තං,[8] ඉදං ච සුත්තං පඤ්චන්නං පුග්ගලානං දෙසිතං : සද්ධානුසාරිනො මුදින්ද්‍රියස්ස තික්ඛින්ද්‍රියස්ස ච ධම්මානුසාරිනො තික්ඛින්ද්‍රියස්ස මුදින්ද්‍රියස්ස ච, යො පන මොහචරිතො[9] පුග්ගලො න සක්කොති යුඤ්ජිතුං ඝටිතුං වායමිතුං යථාභූතං යථාසමාහිතා විමුත්ති තං ඛණං තං ලයං තං මුහුත්තං ඵලං දස්සති. සාධු පරිහායති පරෙ තං දූසති, නො තු සුඛඅවිපාකිනී භවති. තස්ස දිට්ඨෙව ච ධම්මෙ උපපජ්ජඅපරාපරිය-වෙදනීයං.

තත්ථ යො පුග්ගලො ධම්මානුසාරී, තස්ස යදි සොතානුධතා ධම්මා හොන්ති, සො යුඤ්ජන්තො පාපුණාති. යො ධම්මානුසාරී මුදින්ද්‍රියො, සො ගිලානො පාපුණාති. යො සද්ධානුසාරී තික්ඛින්ද්‍රියො සො මරණ-කාලසමයෙ පාපුණාති. යො මුදින්ද්‍රියො සො දෙවභූතො පාපුණාති.

1. පටිසොතගාමිනා - මජසං, PTS.
2. එකත්තතාය - මජ්ඣං, PTS.
3. උප්පාදාය දිට්ඨි - PTS.
4. පඤ්චානිසංසා - මජසං, PTS.
5. සොතානුගතානං - මජසං, PTS.
* චතුක්කඞ්ගුත්තර මහාවග්ග.
6. සොතානුගතානි - මජසං, PTS.
7. සද්ධම්මස්සවනෙන - මජ්ඣං.
8. අනිබ්බිද්ධත්තං - මජසං, PTS.
9. යො පඤ්ච මොහචරිතො - PTS.

13. 'සොධන' යනු : යම් ආරම්භයෙකින් මේ සූත්‍රය දේශනා කරන ලද ද ඒ සියලු ආරම්භය ශුද්ධ යි.

14. 'අධිට්ඨාන' යනු : පටිසොතගාමී වූ සියලු සෝවන්හු එකත්වයෙන් දක්වන ලද්දහුය, (රාගානුසය . . . . සෙඩො ච පුක්ගලො ?) 'ඨිතත්තො' යි වීතරාග පුද්ගල එකත්තතායෙන් පනවනලද. 'පාරගතො' යි සියලු රහත්හු ද සියලු පසේබුදුහු ද සම්‍යක්සම්බුද්ධයෝ ද එකත්තතායෙන් පනවනලදහු යි.

15. 'පරික්ඛාර' යනු : අනුසොතගාමීහට පාපමිත්‍රයන් ඇතිබව ප්‍රත්‍ය යැ, කාම පරියුට්ඨානය හේතු යි. පටිසොතගාමීහට හේතු දෙකක් ද ප්‍රත්‍යය දෙකක් ද වෙති, සම්මාදිට්ඨිය ඉපදීම දක්වා (දිට්ඨී . . . . කොට්ඨාසො ච ?)

16. 'සමාරොපන' යනු : (විභත්ති ?) මේ සූත්‍රයෙහි සමාරොපනයට භූමි නැති.

7 – 16

"කනින් අසා ධරනලද ධර්මයන්ගේ සතර අනුසස් කෙනෙක් වෙති." "දිට්ඨියා සුප්පටිවිද්ධානං" යනු දක්වා සූත්‍රය විස්තර කළයුතු. යොගයෙහි යෙදෙන උත්සාහ කරන වෑයම් කරනුවහු මරණකාලයෙහි ගිලන් වූයේ (මරණින් මතු) දෙව් වූයේ (යළි) පසේබුදුබවට පැමිණෙයි.

'සොතානුධතා' යනු : සද්ධර්මශ්‍රවණයෙන් කරනලද වෙයි, අධිපඤ්ඤාධම්මවිපස්සනා නො ද කරනලද වෙයි. ඔහුගේ සිත හටගත් තෘෂ්ණා ඇති වෙයි, නිර්වෙදබවට නො ද යෙයි. මේ සූත්‍රය වැලිත් පුඟුලන් පස්දෙනකුන්ට දෙසන ලදි : සද්ධානුසාරී වූ මුදින්ද්‍රියහට ද තික්ඛින්ද්‍රියහට ද ධම්මානුසාරී වූ තික්ඛින්ද්‍රියහට ද මුදිඉන්ද්‍රියහට ද යම් මොහචරිත පුද්ගලයෙක් ඇද්ද (හේ) යථාභූත වැ සමාධියට අනුරූප වූ විමුක්තියෙහි යෙදෙන්නට ගැටෙන්නට වෑයම් කරන්නට නො හැකි වෙයි. එකෙණෙහි ඒ ඇසිල්ලෙහි ඒ මොහොතෙහි ඵලය දක්වයි, (?) (සාධු ?) පිරිමෙහයි. අනිකෙක් එය කෙලසයි ? (නො තු . . . . අපරාපරියවෙදනීයං ?)

එහි යම් ධම්මානුසාරී පුද්ගලයෙක් වේ ද ඉදින් ඔහුට ශ්‍රැතයෙන් ධැරූ ධර්මයෝ වෙත් නම් හේ (යොගයෙහි) යෙදෙනුයේ ඵලයට පැමිණෙයි, යමෙක් ධම්මානුසාරී මුදින්ද්‍රිය වේ ද හේ ගිලන් වූයේ පැමිණෙයි, යමෙක් සද්ධානුසාරී තික්ඛින්ද්‍රිය වේ ද හේ මරණ කාලයෙහි පැමිණෙයි, යමෙක් මුදින්ද්‍රිය වේද හේ දෙව්වූයේ පැමිණෙයි, යම් කලෙක

යදා දෙවභූතො න පාපුණාති, සො[1] තෙනෙව ධම්මරාගෙන තාය ධම්මනන්දියා පච්චෙකබොධිං පාපුණාති, යො සොතානුධතෙසු යුඤ්ජති ඝටෙති වායමති, සො පුබ්බාපරෙන[2] විසෙසං සඤ්ජානාති, සඤ්ජානන්තො පාපුණාති. සචෙ පන ගිලානස්ස මනසිකාරෙ හොති, තත්ථ යුඤ්ජන්තො පාපුණාති සචෙ පනස්ස මරණකාලෙ සංවිග්ගො හොති, තත්ථ යුඤ්ජන්තො පාපුණාති. සචෙ පන න කත්ථචි[3] සංවෙගො හොති, තස්ස දෙවභූතස්ස සුඛිනො ධම්මභූතා පාදා එවං අවිලපති (?) සො එවං ජානාති : 'අයං සො ධම්මවිනයො යත්ථ මයං පුබ්බෙ මනුස්සභූතා බ්‍රහ්මචරියං චරිම්හා'ති. අථ දෙවභූතො පාපුණාති. දිබ්බෙසු වා පඤ්චසු කාමගුණෙසු අජ්ඣොසිතො හොති පමාදවිහාරී, සො තෙන කුසලමූලෙන පච්චෙකබොධිං පාපුණාති.

යා[4] පරතොඝොසෙන වචසා සුපරිචිතා[5] අයං සුතමයී පඤ්ඤා. යෙ පන ධම්මා හොන්ති මනසා අනුපෙක්ඛිතා, අයං චින්තාමයී පඤ්ඤා. යා[6] දිට්ඨියා සුප්පටිවිද්ධා, අයං භාවනාමයී පඤ්ඤා. යං සොතානුධතා මනසා පරිචිතා හොන්ති, (?) යො ච දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායී, අයං අරහා[7] පුග්ගලො. යො උපපජ්ජති දෙවභූතො පාපුණාති, තත්ථ ච පරිනිබ්බායති, අයං අනාගාමී. යො තෙන කුසලමූලෙන පච්චෙකබොධිං පාපුණාති, අයං පුබ්බයොගසම්භාරසම්භූතො පුග්ගලො.

“සොතානුධතා ධම්මා'ති පඨමං විමුත්තායතනං, වචසා පරිචිතා'ති දුතියං තතියං ච විමුත්තායතනං, මනසානුපෙක්ඛිතා'ති චතුත්ථං විමුත්තායතනං, දිට්ඨියා සුප්පටිවිද්ධා'ති පඤ්චමං විමුත්තායතනං.

සොතානුධතාය විමුත්තියා වචසා යා වාචා සුප්පටිවිද්ධා අනුපුබ්බ-ධම්මස්ස සොතෙන සුත්වා සීලක්ඛන්ධෙ පරිපූරෙති, මනසා අනුපෙක්ඛිතා සමාධික්ඛන්ධං පරිපූරෙති, දිට්ඨියා සුප්පටිවිද්ධා පඤ්ඤාක්ඛන්ධං පරිපූරෙති.

'සොතානුධතා ධම්මා බහුස්සුතා හොන්තී'ති විත්ථාරෙන කාතබ්බං, ඉදං පඨමං සද්ධාපදානං. 'මනසා අනුපෙක්ඛිතා'ති පටිසල්ලානබහුලො විහරති, විත්ථාරෙන කාතබ්බං. ඉදං දුතියං සද්ධාපදානං. 'දිට්ඨියා සුප්පටිවිද්ධා'ති අනාසවා චෙතොවිමුත්ති[8], 'නාපරං ඉත්ථත්තායා'ති පජානාතී'ති ඉදං තතියං සද්ධාපදානං.

'සොතානුධතා ධම්මා'ති සෙඛං සත්ථා දස්සෙති. 'මනසා අනු-පෙක්ඛිතා'ති අරහන්තං[9] සත්ථා දස්සෙති. දිට්ඨියා සුප්පටිවිද්ධා'ති තථාගතං අරහන්තං සම්මාසම්බුද්ධං සත්ථා දස්සෙති.

---

1. න සො මජසං, PTS.
2. පුබ්බාපනෙතන – මජසං, PTS
3. කත්ථ – PTS.
4. යො – PTS.
5. වා තස්ස සුපරිචිතෙන – PTS.
6. යං – මජසං, PTS.
7. අරහං – ම.
8. චෙතොවිමුත්තියා – මජසං, PTS.
9. අරහත්තං – මජසං, PTS.

දෙව් වූයේ නො පැමිණේ ද හේ එමැ ධම්මරාගයෙන් ඒ ධම්මනන්දියෙන් පසේබුදුබවට පැමිණෙයි. යමෙක් ශ්‍රැතයෙන් ධැරූ දහම්හි යෙදේද ගැවෙද වෑයම් කෙරේද, හේ පූර්වාපර විශේෂය අවබෝධ කෙරෙයි, අවබෝධ කරනුයේ පැමිණෙයි. ඉදින් ගිලන් වූවහුට මනසිකාරය වේද එහි යෙදෙනුයේ පැමිණෙයි, ඉදින් ඔහුට මරණකාලයෙහි සංවේගයට පැමිණියේ වේ ද, එහිදී යෙදෙනුයේ පැමිණෙයි. ඉදින් කිසිතැනකදීත් සංවේග නො වේද, දෙව් වූ සුවයට පැමිණි ඔහුට (ධම්මහූතා පාද එවං අවිලපති ?) දහම්පද මෙසේ වටහා ද ? හේ මෙසේ දනගනී : 'යම් සසුනෙක පෙර මිනිස්වූ අපි බඹසර වුසුම් ද මේ ඒ ධර්මවිනය ' යි. එකල්හි දෙව්වූ හේ (ඵලයට) පැමිණෙයි. නොහොත් දිව්‍යමය පඤ්චකාමගුණයෙහි බැසගත්නාලදුයේ ප්‍රමාදවිහාරී වේද, හෙතෙම ඒ කුශල මූලය හෙතු කොටගෙන පසේබුදුබවට පැමිණේ.

පරතෝඝෝසයෙන් වචනයෙන් මනාකොට උපදවනලද යම් ප්‍රඥවක් ඇද්ද මේ සුතමයී පඤ්ඤ නමු. යළි සිතින් විමසනලද යම් ධර්ම කෙනෙක් වෙත්ද මේ චින්තාමයී පඤ්ඤ නමු. නුවණින් මොනවට අවබෝධ කළ යම් ප්‍රඥවක් වේද මේ භාවනාමයී පඤ්ඤා නමු. (යං සොතානුධතා මනසා පරිචිතා හොන්ති ?) යමෙක් ඉහාත්මයෙහි මැ පිරිනිවේ ද මේ රහත් පුද්ගල යි. යමෙක් (දෙව්බවට) පැමිණේ ද දෙව්වූයේ ඵලයට පැමිණේ ද එහිදී පිරිනිවේ ද මේ අනාගාමී යැ. යමෙක් ඒ කුශලමූලයෙන් පසේබුදුබවට පැමිණේ ද, මේ පූර්වයොගසමභාරයෙන් උපන් පුබ්බයොගාවචර පුද්ගල යි.

'සොතානුධතා ධම්මා ' යනු පළමුවන විමුත්තායතන යැ, ' වචසා පරිචිතා ' යනු දෙවැනි තෙවැනි විමුත්තායතන යැ, ' මනසානුපෙක්ඛිතා ' යනු සතරවැනි විමුත්තා යතන යැ. ' දිට්ඨියා සුප්පටිවිද්ධා ' යනු පස්වැනි විමුත්තායතන යි.

ශ්‍රැතයෙන් ධරන ලද විමුක්තිය පිළිබඳ යම් වචනයක් මැනැවින් අවබෝධ කරන ලද ද අනුපූර්වධර්මය කනින් අසා ශීලස්කන්ධය පුරයි, සිතින් විමසනලද්දහු සමාධිස්කන්ධය පුරයි, නුවණින් අවබෝධ කරනලද්දහු ප්‍රඥස්කන්ධය පුරයි.

ශ්‍රැතයෙන් ධරනලද දහම් ඇත්තාහු බහුශ්‍රැත වෙත් යයි විස්තර කළයුතු යැ. මේ පළමුවන ශ්‍රද්ධාචරිතය යැ, ' මනසා අනුපෙක්ඛිතා ' යනු විවෙකය බහුල කොට ඇතියේ වෙසේ යයි විස්තර කළයුතු යැ. මේ දෙවැනි ශ්‍රද්ධාචරිතය යි. ' දිට්ඨියා සුප්පටිවිද්ධා ' යනු අනාස්‍රව චෙතොවිමුත්ති යැ, ' නාපරං ඉත්ථත්තායාති පජානාති ' යනු මේ තෙවැනි ශ්‍රද්ධාචරිත යි.

' සොතානුධතා ධම්මා ' යි බුදුහු ශෛක්ෂපුද්ගලයා දක්වනසේක. ' මනසා අනු පෙක්ඛිතා ' යි බුදුරජාණන් වහන්සේ රහත්හු දක්වනසේක, ' දිට්ඨියා සුප්පටිවිද්ධා ' යි බුදුහු තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ දක්වනසේක.

'සොතානුධතා ධම්මා'ති කාමානං නිස්සරණං දස්සෙති, මනසා අනුපෙක්ඛිතා'ති රූපධාතුයා නිස්සරණං දස්සෙති, 'දිට්ඨියා සුප්පටි-විද්ධා'ති තෙධාතුකානං නිස්සරණං දස්සෙති. අයං සුත්තත්ථො.

1. තත්ථ කතමො දෙසනාහාරො[1] : ඉමම්හි සුත්තෙ තයො එසනා දෙසිතා, සොතානුධතෙහි ධම්මෙහි වචසා පරිචිතෙහි කාමෙසනාය සමථමඝො. දිට්ඨියා සුප්පටිවිද්ධෙහි බ්‍රහ්මචරියෙසනාය සමථමඝො.

2. විචයොති යථා සුත්තං මනසිකරොන්තො චින්තෙන්තො සුතමයීපඤ්ඤං පටිලභති. යථා ච සො මනසිකරොතීති යථා සුතධම්මා තද චින්තාමයී පඤ්ඤං පටිලභති. යථා දිට්ඨෙව ධම්මෙ මනසිකරොති තද භාවනාමයී පඤ්ඤං පටි ලභති, අයං විචයො.

3. සුතෙන සුතමයී පඤ්ඤං පටිලභති, චින්තාය චින්තාමයී පඤ්ඤං පටිලභති, භාවනාය භාවනාමයී පඤ්ඤං පටිලභති අත්ථි එසා යුත්ති.

4. පදට්ඨානොති : සොතානුධතා ධම්මා'ති ධම්මසවනස්ස[2] පදට්ඨානං. 'වචසා පරිචිතා'ති සුඤ්ජනාය පදට්ඨානං, 'මනසා අනුපෙක්ඛිතා'ති[3] ධම්මානුධම්මාය විපස්සනාය පදට්ඨානං. දිට්ඨියා සුප්පටිවිද්ධා'ති පඤ්ඤායපි. ( ? ) පදට්ඨානං.

( 5. ලක්ඛණොති : ) (එත්ථ ලක්ඛණහාරෙ පොත්ථකෙසු ඌනො විය දිස්සති )

6. චතුබ්‍යූහොති : ඉමම්හි සුත්තෙ භගවතො කො අධිප්පායො : යෙ ඉමාහි ද්වීහි පඤ්ඤාහි සමන්නාගතා තෙ හි. . . . . යන්ති නිය්‍යානිකං සාසනන්ති. අයං අධිප්පායො.

7. (ආවට්ටොති : අස්සවනෙන ච අමනසිකාරෙන ච අප්පටිවෙධෙන ච සක්කායසමුදයගාමිනී පටිපදා වුත්තා. සවනෙන ච මනසිකාරෙන ච පටිවෙධෙන ච සක්කායනිරොධගාමිනී පටිපදා වුත්තා. අයං ආවට්ටො.

8 විභත්තීති : එකංසබ්‍යාකරණීයො. නත්ථි තත්ථ විභත්තියා භූමි.

9. පරිවත්තනොති : යෙ චත්තාරො ආනිසංසා[4] පඤ්චාදිනා පටිපක්ඛෙන (?) තෙනෙව දිට්ඨෙව ධම්මෙ පාපුණන්ති, තං උප පජ්ජමානා අපරො පරියායො (?).

10. වෙවචනන්ති : සොතානුධතා[5] ධම්මාති යං වුත්තං දිට්ඨිමපි පඤ්ඤින්ද්‍රියං විඤ්ඤුතම්පි.[6] දිට්ඨියා සුප්පටිවිද්ධම්පි විභාවිතම්පි ?

---

1. කතමා දෙසනා – PTS.
2. ධම්මස්සවනස්ස – මජසං, PTS.
3. අනුපෙක්ඛිතාති – PTS.
4. පඤ්චානිසංසා – මජසං, PTS.
5. සොතානුගතා – මජසං, PTS.
6. විඤ්ඤුතතම්පි – මජසං, PTS.

'සොතානුධතා ධම්මා' යි කාමයන්ගේ නිස්සරණය දක්වනසේක, 'මනසා අනුපෙක්ඛිතා' යි රූපධාතුහුගේ නිස්සරණය දක්වති, 'දිට්ඨියා සුප්පටිවිද්ධා' යි ත්‍රෛධාතුකයන්ගේ නිස්සරණය දක්වනසේක. මේ සූත්‍රාර්ථ යි.

1. එහි දේසනාහාර කවරෙ යැ : මේ සූත්‍රයෙහි තුන් එසනා දෙසනලද්දහු යැ. ශ්‍රුතයෙන් ධරනලද වචනයෙන් පුහුණුකළ ධර්මයන්ගෙන් කාමෙසනාවට සමථමාර්ගය වෙයි, නුවණින් මැනැවින් අවබොධ කළ ධර්මයන්ගෙන් බ්‍රහ්මචරියෙසනාවට සමථමාර්ගය වේ.

2. විචය යනු : සූත්‍රය වූ පරිදි මෙනෙහි කරනුයේ විමසනුයේ සුතමයී ප්‍රඥව ලබයි. 'යථා ච යො මනසිකරොති' යනු : ඇසූ දහම් ඇතියේ මෙනෙහි කෙරේ ද ? එකල්හි චින්තාමයී ප්‍රඥව ලබයි, යම්සේ ඉහාත්මයෙහි මැ මෙනෙහි කෙරේද එකල්හි භාවනාමයී ප්‍රඥව ලබයි, මේ විචයහාර යි.

3. ශ්‍රුතයෙන් සුතමයී ප්‍රඥව ලබයි, චින්තායෙන් චින්තාමයී ප්‍රඥව ලබයි, භාවනායෙන් භාවනාමයී ප්‍රඥව ලබයි, තෙල යුත්ති ඇත.

4. පදට්ඨාන යනු : 'සොතානුධතා ධම්මා' යනු ධර්මශ්‍රවණයට පදට්ඨාන යැ, 'වචසා පරිචිතා' යනු (යොගයෙන්) යෙදීමට පදට්ඨාන යැ, 'මනසා අනුපෙක්ඛිතා' යනු ධම්මානුධම්මවිපස්සනාවට පදට්ඨාන යැ, 'දිට්ඨියා සුප්පටිවිද්ධා' යනු . . . . ප්‍රඥවට ද පදට්ඨාන යි.

5. (ලක්ඛණහාරය ගිලිහී ගොස් ඇත.)

6. චතුබ්‍යූහ යනු : මේ සූත්‍රයෙහි භාග්‍යවතුන් වහන්සේගේ අදහස කවරෙ යැ : යම් කෙනෙක් මේ දෙවැදෑරුම් ප්‍රඥයෙන් සමන්විත වූවාහු ද ඔහු . . . . ශාසනය නෛර්‍යාණික යයි (නිෂ්ඨාවට ?) යෙත්. මේ අයිප්‍රාය යි.

7. (ආවට්ට යනු :) අශ්‍රවණයෙන් ද අමනසිකාරයෙන් ද අප්‍රතිවෙධයෙන් ද සත්කාය සමුදයගාමිනී ප්‍රතිපදව වදරනලදූ. ශ්‍රවණයෙන් ද මනසිකාරයෙන් ද ප්‍රතිවෙධයෙන් ද සත්කායනිරොධගාමිනී ප්‍රතිපදව වදරනලද්දී ය. මේ ආවට්ටහාර යි.

8. 'විභත්ති' යනු : (මේ සූත්‍රය) එකංසව්‍යාකරණීය වෙයි. එහි විභත්තිහාරයට භූමි නැති.

9. 'පරිවත්තන' යනු : යම් සතර අනුසස්කෙනෙක් වදරනලද්දහු ද, (පඤ්චාදිනා . . . . අපරො පරියායො ?).

10. 'වෙවචන' යනු : 'සොතානුධතා ධම්මා' යි යමක් වදරනලද ද 'දිට්ඨිය ද විඤ්ඤාතය ද පඤ්ඤින්ද්‍රිය යැ, ප්‍රඥයෙන් මැනැවින් අවබොධ කරනලද්ද ද (විභාවිතම්පි ?)

11. පඤ්ඤත්තීති : සොතානුධතා[1] ධම්මාති දෙසනා අවිජ්ජා පඤ්ඤත්තියා පඤ්ඤත්තං, මානසිකාරො පාමොජ්ජපඤ්ඤත්තියා පඤ්ඤත්තො දිට්ඨධම්මාපි ආනිසංසපඤ්ඤත්තියා පඤ්ඤත්තා.

12. ඔතරණොති : තිඝසා පඤ්ඤා වචසා පරිචිතෙසු සුතමයීපඤ්ඤා, මනසා අනුපෙක්ඛිතෙසු චින්තාමයීපඤ්ඤා, දිට්ඨියා සුප්පටිවිද්ධෙසු භාවනාමයීපඤ්ඤා, ඉමානි අරියසච්චානි ඉන්ද්‍රියානි විජ්ජුප්පාද අවිජ්ජානිරොධො පටිච්චසමුප්පාදෙ, ඉන්ද්‍රියෙසු තීණි ඉන්ද්‍රියානි, ආයතනෙසු ධම්මායතනපරියාපන්නා, ධාතුසු ධම්මධාතුපරියාපන්නාති.

13 සොධනොති : ආරම්භො[2] සුත්තස්ස පවෙසො නිසුෂතතා.

14. අධිට්ඨානොති : චත්තාරො ආනිසංසාති[3] වෙමත්තතාය පඤ්ඤත්තා ආනිසංසා, සොතානුධතාති : වෙමත්තතාය අරියවොහාරො පඤ්ඤත්තො ධම්මෙ ච සවනන්ති එකත්තතාය පඤ්ඤත්තං.

15. පරික්ඛාරොති : ධම්මසවනස්ස[4] පයිරුපාසනා[5] පච්චයො, සද්ධා හෙතු. මනසා අනුපෙක්ඛනාති : අත්ථපටිසංවෙදිතා[6] පච්චයො, ධම්මපටිසංවෙදිතා හෙතු. දිට්ඨියා සුප්පටිවිද්ධාති : සද්ධම්මසවනං ච මනසිකාරො ච පච්චයො, සුතමයී චින්තාමයී පඤ්ඤා හෙතු.

16. සමාරොපනොති : විභත්තං සුත්තං, අපරො පරියායො නිබ්බත්තිඑලෙ නත්ථි[7]. තත්ථ සමාරොපනාය භූමි.

## 7 - 17

තත්ථ කතමං වාසනාභාගියං ච නිබ්බෙධභාගියං ච සුත්තං :

“දදතො පුඤ්ඤං පවඩ්ඪතී”ති ගාථා* දදතොති : දානමයිකපුඤ්ඤකිරියවත්ථු වුත්තං. සංයමතො වෙරං න චීයතී”ති : සීලමයිකපුඤ්ඤකිරියවත්ථු වුත්තං. “කුසලො ච ජහාති පාපක”න්ති : ලොභස්ස ච මොහස්ස ච බ්‍යාපාදස්ස ච පහානමාහ. “රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො”ති : ලොභස්ස ච මොහස්ස ච බ්‍යාපාදස්ස ච ඡන්දරාග විනයමාහාති.

“දදතො පුඤ්ඤං පවඩ්ඪතී”ති අලොභො කුසල මූලං භවති. ‘සංයමතො වෙරං න චීයතී’ති අදොසො කුසලමූලං භවති, ‘සංයමතො වෙරං න චීයතී’ති අවෙරා අසපත්තං අබ්‍යාපාදතාය සදා, ‘කුසලො ච ජහාති පාපක’න්ති ඤාණුප්පාද අඤ්ඤාණනිරොධො.

1. සොතානුගතා - මජසං, PTS.
2. යො ආමෙහා – මජසං.
3. පඤ්චානිසංසාති – මජසං, PTS.
4. ධම්මස්සවනස්ස – මජසං.
5. පතිරූපාසනා - මජසං.
6. අත්ථප්පටිසංවෙදිතා – මජසං.
7. නිබ්බත්ති බලෙ නත්ථි – මජසං.

* උදාන පාළි - චුන්දසුත්ත.

11. ' පඤ්ඤත්ති ' යනු : ' සොතානුධතා ධම්මා ' යන දේශනාව අවිජ්ජාපඤ්ඤත්තියෙන් පනවන ලද, මනසිකාරය පාමොජ්ජපඤ්ඤත්තියෙන් පනවනලද, ඉහාත්මඵලය ආනිසංසපඤ්ඤත්තියෙන් පනවනලදි.

12. ' ඔතරණ ' යනු : තුන් ප්‍රඥයෙකි, වචනයෙන් පුහුණුකරන ලදුයෙහි සුතමයී ප්‍රඥව යැ, සිතින් විමසනලදුයෙහි චින්තාමයී ප්‍රඥව යැ, නුවණින් ප්‍රතිවෙධ කරනලදුයෙහි භාවනාමයී ප්‍රඥව යි. මෙ ආයඞසත්‍යයෝ ද ඉන්ද්‍රියයෝ ද වෙති, මාර්ගඥන විද්‍යාව ඉපැදීමෙන් අවිද්‍යානිරොධය වෙයි. පටිච්චසමුප්පාද යැ, ඉන්ද්‍රියයන් කෙරෙහි තුන් ඉන්ද්‍රිය කෙනෙක් වෙති, ආයතනයන් කෙරෙහි ධර්මායතනපයඞාපන්න යැ, ධාතූන් කෙරෙහි ධර්මධාතුපයඞාපන්න යි.

13. ' සොධන ' යනු : සූත්‍රයාගේ ආරම්භය (පවෙසො ?) යොදන ලදි.

14. ' අධිට්ඨාන ' යනු : ' චත්තාරො ආනිසංසා ' යී අනුසස්හු වෙමත්තතායෙන් පනවනලදහු යැ, ' සොතානුධතා ' යී වෙමත්තතායෙන් ආයඞව්‍යවහාරය පනවන ලද්දේ යැ, (ධම්මෙ ච සවනන්ති ?) එකත්තතායෙන් පනවනලදි.

15. ' පරික්ඛාර ' යනු : ධර්මශ්‍රවණයට පයුරුපාසනය ප්‍රත්‍යය වෙයි, ශ්‍රද්ධාව හෙතු යි. ' මනසා අනුපෙක්ඛිතා ' යනු : අර්ථය දන්නාබව ප්‍රත්‍යය වෙයි, පාළිධර්මය දන්නාබව හෙතු යි. ' දිට්ඨියා සුප්පටිවිද්ධා ' යනු සද්ධර්මශ්‍රවණය ද මනසිකාරය ද ප්‍රත්‍ය යැ, සුතමයී චින්තාමයී ප්‍රඥව හෙතු යි.

16. ' සමාරොපන ' යනු : සූත්‍රය විභාග කරනලද, (නිබ්බත්තිඵලෙ ?) එහි සමාරොපනයට භූමි නැති.

7 – 17

එහි වාසනාභාගිය ද නිබ්බෙධභාගිය ද සූත්‍රය කවරෙ යැ :

'' දදතො පුඤ්ඤං පවඩ්ඪති '' යන (උදාන) ගාථාව යැ. ' දදතො ' යී දානමය පුණ්‍ය ක්‍රියාවස්තුව කියන ලද, ' සංයමතො වෙරං න චීයති ' යී සීලමයපුණ්‍ය ක්‍රියාවස්තුව කියන ලද, ' කුසලො ච ජහාති පාපකං ' යී ලොභයාගේ ද මොහයාගේ ද ව්‍යාපාදයාගේ ද ප්‍රහාණය වදළහ. ' රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො ' යී ලොභයාගේ ද මොහයාගේ ද ව්‍යාපාදයාගේ ද ඡන්දරාගවිනය වදළහ යි.

' දදතො පුඤ්ඤං පවඩ්ඪති ' යී අලොභකුශලමූලය වෙයි, ' සංයමතො වෙරං න චීයති, යී අදෙසකුශලමූලය වෙයි. ' සංයමතො වෙරං න චීයති ' යී හැම කල්හි අව්‍යාපාදභාවයෙන් (පුද්ගල අකුශල) වෛර නැත්තාහු සතුරන් නැත්තාහු වෙති. ' කුසලො ච ජහාති පාපකං ' යී ඥනොත්පාදයෙන් අඥනනිරොධය වෙයි.

ස නිබ්බුතො'ති : මග්ගඵලං අනුපාදිසෙසං ච නිබ්බානධාතුං මඤ්ඤෙති. දානෙන ඔළාරිකානං කිලෙසානං පහානං මඤ්ඤෙති. සීලෙන මජ්ඣිමානං පඤ්ඤාය සුඛුමකිලෙසානං (පහානං) මඤ්ඤෙති. 'රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො'ති තතා ච භූමි.

'දදතො පුඤ්ඤං පවඩ්ඪති සංයමතො වෙරං න චීයති, කුසලො ච ජහාති පාපක'න්ති මග්ගො වුත්තො. 'රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො'ති මග්ගඵලමාහ.

'දදතො පුඤ්ඤං පවඩ්ඪති, සංයමතො'ති තීහි පදෙහි ලොකියං කුසලමූලං වුත්තං, රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො'ති ලොකුත්තරං කුසලමූලං වුත්තං.

'දදතො පුඤ්ඤං පවඩ්ඪති– සංයමතො වෙරං න චීයතී'ති : පුථුජ්ජනභූමිං මඤ්ඤෙති. ''කුසලො ච ජහාති පාපක''න්ති සෙඛභූමිං මඤ්ඤෙති. රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො''ති : අසෙඛභූමි වුත්තා.[1]

''දදතො පුඤ්ඤං පවඩ්ඪති– සංයමතො වෙරං න චීයතී''ති : මග්ගනියා පටිපද වුත්තා. ''කුසලො ච ජහාති පාපක''න්ති : සෙඛ-විමුත්ති. ''රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො''ති : අසෙඛවිමුත්ති.

''දදතො පුඤ්ඤං පවඩ්ඪති– සංයමතො වෙරං න චීයතී''ති : දානකථං සීලකථං සග්ග කථං[2] ලොකියානං ධම්මානං දෙසනමාහ. ''කුසලො ච ජහාති පාපක''න්ති : ලොකෙ ආදීනවානුපස්සනා. 'රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො'ති : සාමුක්කංසිකාය ධම්මදෙසනායපි පටිවිද්ධා.

'දදතො පුඤ්ඤං පවඩ්ඪතී'ති : පාණානං අභයදානෙන පාණාතිපාතා වෙරමණියා සත්තානං[3] අභයං දෙති. එවං සබ්බානි සික්ඛාපදානි කාතබ්බානි 'සංයමතො වෙරං න චීයතී'ති : සීලෙ පතිට්ඨාය චිත්තං සංයමෙති, තස්ස සංයමතො පාරිපූරිං ගච්ඡති. 'රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො'ති : ද්වෙ විමුත්තියො. අයං සුත්තනිද්දෙසො.

1. තත්ථ කතමා දෙසනා : ඉමම්හි සුත්තෙ කිං දෙසිතං : ද්වෙ සුගතියො දෙවා ච මනුස්සා ච දිබ්බා ච පඤ්චකාමගුණා මානුස්සකා ච. ද්වීහි පදෙහි නිද්දෙසො. 'දදතො පුඤ්ඤං පවඩ්ඪති, සංයමතො වෙරං න චීයති, කුසලො ච ජහාති පාපක'න්ති මග්ගො වුත්තො. 'රාග-දොසමොහක්ඛයා ස නිබ්බුතො'ති ද්වෙ නිබ්බානධාතුයො දෙසිතා සොපාදිසෙසා ච අනුපාදිසෙසා ච. අයං දෙසනා.

2. විචයොති : 'දදතො පුඤ්ඤං පවඩ්ඪතී'ති ඉමිනා පඨමෙන පදෙන දානමයිකපුඤ්ඤකිරියවත්ථු වුත්තං, තෙනස්ස ආනන්තරියානං කුසලානං ධම්මානං [උප්පාදෙ වුත්තො ?] දුතියෙන පදෙන .....* චතුත්ථෙන රාගදොසමොහක්ඛයෙන රාගවිරාගා චෙතොවිමුත්ති, මොහක්ඛයෙන අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්ති. අයං විචයො.

1. අසෙක්ඛභූමිං – PTS.
2. මග්ගකථං – මජසං, PTS.
3. වෙරමණිසත්තානං – මජසං, PTS.

* එත්ථ ඌනතා දිස්සති.

'ස නිබ්බුතො ' යී මාර්ගඵලය ද අනුපාදිසෙසනිබ්බානධාතුව ද ප්‍රකාශ කෙරෙයි. දානයෙන් ඖදරික ක්ලේශයන්ගේ ප්‍රහාණය වදරයි, ශීලයෙන් මධ්‍යම ක්ලේශයන්ගේ ද ප්‍රඥයෙන් සියුම් ක්ලේශයන්ගේ ද ප්‍රහාණය වදරති. රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො' යී (කතා ච භූමි ?) තෘෂ්ණාක්ෂය සංඛ්‍යාත අර්හත්වභූමිය වදරනසේක.

'' දදතො පුඤ්ඤං පවඩ්ඪති සංයමතො වෙරං න චීයති, කුසලො ච ජහාති පාපකං '' යී මාර්ගය වදරන ලද්දේ ය, ' රාගදෙසමොහක්ඛයා ස නිබ්බුතො ' යී මාර්ගඵල වදළහ.

' දදතො පුඤ්ඤං පවඩ්ඪති සංයමතො ' යන තුන් පදයෙන් ලෞකික කුශලමූලය වදරනලද, රාගදෙසමොහක්ඛයා ස නිබ්බුතො ' යී ලොකොත්තර කුශලමූලය වදරනලදී.

' දදතො පුඤ්ඤං පවඩ්ඪති සංයමතො වෙරං න චීයති ' යී පෘථග්ජනභූමිය පවසති, ' කුසලො ච ජහාති පාපකං ' යී ශෛක්ෂභූමිය පවසති, ' රාගදෙසමොහක්ඛයා ස නිබ්බුතො ' යී අශෛක්ෂභූමිය වදරනලද්දීය.

' දදතො පුඤ්ඤං පවඩ්ඪති සංයමතො වෙරං න චීයති ' යී (මග්ගතියා ?) මාර්ගයට හෙතු වූ ප්‍රතිපත් වදරන ලද්දීය. ' කුසලො ච ජහාති පාපකං ' යී සෙඛවිමුත්ති ද ' රාග දෙසමොහක්ඛයා ස නිබ්බුතො ' යී අසෙඛවිමුත්ති ද වදරනලදී.

' දදතො පුඤ්ඤං පවඩ්ඪති සංයමතො වෙරං න චීයති ' යී දානකථාව ද සීලකථාව ද සග්ගකථාව ද යන ලෞකික ධර්මදේශනාව වදළහ. ' කුසලො ච ජහාති පාපකං ' යී ලොකයෙහි ආදීනවදර්ශනය ද ' රාගදෙසමොහක්ඛයා ස නිබ්බුතො ' යී සාමුක්කංසික ධර්මදෙශනාප්‍රතිවෙධය ද වදළහ.

' දදතො පුඤ්ඤං පවඩ්ඪති ' යී ප්‍රාණීන්ට අභයදානයෙන් ප්‍රාණවධයෙන් වෙන්වීමෙන් සත්වයන්ට අභයදානය කෙරෙයි, මෙසේ සියලු ශික්ෂාපද දක්වියයුතු. ' සංයමතො වෙරං න චීයති ' යී සීලයෙහි පිහිටා සිත සංයම කෙරෙයි, සංවර වූ ඔහුට (ශික්ෂාපද) පිරිමට යෙයි. රාගදෙසමොහක්ඛයා ස නිබ්බුතො ' යී රාගවිරාග චෙතොවිමුත්තිය අවිජ්ජාවිරාග පඤ්ඤාවිමුත්තියද යන දෙවැදෑරුම් විමුක්තිහු වදරනලද්දහු වෙති. මෙ සූත්‍රනිර්දේශ යි.

1. එහි ' දේසනා ' කවරැ : මේ සූත්‍රයෙහි කුමක් දෙසනලද ද යත් : දිව්‍ය මනුෂ්‍ය යන දෙවැදෑරුම් සුගතිහු ද දිව්‍යපඤ්චකාමගුණයෝ ද මනුෂ්‍යපඤ්චකාමගුණයෝ ද දෙයිත දෙපදයෙන් නිර්දෙශය වේ (?) ' දදතො පුඤ්ඤං පවඩ්ඪති, සංසමතො වෙරං න චීයති, කුසලො ච ජහාති ස නිබ්බුතො ' යී සොපාදිසෙස අනුපාදිසෙස යන නිර්වාණධාතු දෙක දෙසනලදහ. මේ දෙසනා යි.

2. ' විචය ' යනු : ' දදතො පුඤ්ඤං පවඩ්ඪති ' යන මේ පළමුවන පදයෙන් දානමය පුණ්‍යක්‍රියාවස්තුව වදරනලද, එයින් ඔහුට ආනන්තරිය කුශලධර්මයන්ගේ (උත්පාදය වදරන ලද,) දෙවැනි පදයෙන් . . . . සතරවැනි පදයෙන් රාගදෙසමොහක්ෂයෙන් රාග විරාග චෙතොවිමුත්තිය ද මොහක්ෂයෙන් අවිජ්ජාවිරාග පඤ්ඤාවිමුත්තිය ද වදරනලද වෙයි. මේ විචයහාර යි.

3. යුත්තීති : දානෙ සීලො උභයං හි පරිපූරෙති. මච්ඡරියං ච පජහති, පුඤ්ඤං ච පවඩ්ඪති. අත්ථි එසා යුත්ති

4. පදට්ඨානන්ති : 'දදතො පුඤ්ඤං පවඩ්ඪතී'ති චාගාධිට්ඨානස්ස පදට්ඨානං. 'සංයමතො වෙරං න චීයතී'ති පඤ්ඤාධිට්ඨානස්ස පදට්ඨානං. 'කුසලො ච ජහාති පාපක'න්ති සච්චාධිට්ඨානස්ස පදට්ඨානං. 'රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො'ති උපසමාධිට්ඨානස්ස පදට්ඨානං. අයං පදට්ඨානො.

5. තත්ථ කතමො ලක්ඛණො : දදතො පුඤ්ඤං පවඩ්ඪති සංයමතො වෙරං න චීයති. දදතොපි වෙරං න කරීයති[1] කුසලො ච ජහාති පාපකං. රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො' රූපක්ඛයාපි වෙදනාක්ඛයාපි[2] යෙන රූපෙන දිට්ඨං, තෙන තථාගතො පඤ්ඤපෙන්තො පඤ්ඤපෙය්‍ය[3] රූපස්ස ඛයා විරාගනිරොධාති. එවං පඤ්චක්ඛන්ධා.

6 චතුබ්‍යූහොති : ඉධ භගවතො කො අධිප්පායො : යෙ මහාභොගානං පත්ථයිස්සන්ති, තෙ දානං දස්සන්ති පරික්ඛයපහානාය, යෙ අවෙරාභිච්ඡන්දකා, තෙ පඤ්ච වෙරානි පජහිස්සන්ති, යෙ කුසලාභිච්ඡන්දකා, තෙ අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සන්ති අට්ඨන්නං මිච්ඡත්තානං පහානාය, යෙ නිබ්බායිතුකාමා, තෙ රාගදොසමොහං පජහිස්සන්තීති අයං භගවතො අධිප්පායො.

7. ආවට්ටොති : යං ච අදදතො මච්චරියං යං ච අසංයමතො වෙරං, යං ච අකුසලස්ස පාපස්ස අප්පහානං, අයං දුක්ඛනිද්දෙසො න සමුදයො. අලොභෙන ච අදොසෙන ච අමොහෙන ච කුසලෙන ඉමානි තීණි කුසලමූලා, තෙසං පච්චයො අට්ඨ සම්මත්තානි, අයං මග්ගො. තෙසං රාගදොසමොහානං ඛයා, අයං නිරොධො.

8 විභත්තීති : 'දදතො පුඤ්ඤං පවඩ්ඪතී'ති න එකංසෙන, යො රාජදණ්ඩභයෙන දෙති, යො ච අකප්පියස්ස පරිභොගෙන සීලවන්තෙසු දෙති, න තස්ස පුඤ්ඤං පවඩ්ඪතීති, සො චෙතං දානං අකුසලෙන දෙති. දණ්ඩදානං සත්ථදානං අපුඤ්ඤමයං පවඩ්ඪති, න පුඤ්ඤං. 'සංයමතො වෙරං න චීයතී'ති න එකංසෙන කිං කාරණං : යං ච යො වධං[4] දිට්ඨධම්මිකං පස්සති, යදි මම රාජානො ගහෙත්වා හත්ථං වා ඡින්දෙය්‍යුං[5] -පෙ- න තෙන සංයමෙන වෙරං න කරොති. යො තු එවං සමාදියති : පාණාතිපාතස්ස පාපකො විපාකොති. දිට්ඨෙ යෙව ධම්මෙ අභිසම්පරායෙ ච එවං සබ්බස්ස අකුසලස්ස හෙතුතො ආරති. ඉමිනා සංයමෙන වෙරං න චීයති.

9. පරිවත්තනොති[6] : 'දදතො පුඤ්ඤං පවඩ්ඪතී'ති : අදදතො පුඤ්ඤං න පවඩ්ඪති, යං දානමයං තං. 'සංයමතො වෙරං න චීයතී'ති[7] අසංයමතො වෙරං කරීයති. කුසලො ච ජහාති පාපකං අකුසලො න ජහාති. 'රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො'ති : .... නිබ්බුතො, අසෙඛස්ස නත්ථි නිබ්බුති. (?)

---

1. කරීයාති - මජසං, PTS.
2. වෙදනක්ඛයාපි - මජසං.
3. පඤ්ඤපෙය්‍ය - මජසං.
4. පදං - මජසං, PTS.
5. ඡින්දෙය්‍ය - මජසං, PTS.
6. පරිවත්තනාති - මජසං, PTS.
7. න චීයති - මජසං, PTS.

3. 'යුත්ති' යනු : දානයෙහි සිටියේ දෙකරුණ මැ සපුරාලයි : මසුරුබව ද දුරලයි, පින ද වඩයි. තෙල යුත්ති ඇති.

4. 'පදට්ඨාන' යනු : 'දදතො පුඤ්ඤං පවඩ්ඪති' යනු : ත්‍යාගාධිෂ්ඨානයට පදට්ඨාන යැ, 'සංයමතො වෙරං න චීයති' යනු ප්‍රඥාධිෂ්ඨානයට පදට්ඨාන යැ, 'කුසලො ච ජහාති පාපකං' යනු සත්‍යාධිෂ්ඨානයට පදට්ඨාන යැ, 'රාගදොස මොහක්ඛයා ස නිබ්බුතො' යනු උපශමාධිෂ්ඨානයට පදට්ඨාන යැ, මේ පදට්ඨාන යි.

5. එහි 'ලක්ඛණ' කවරෙ යැ : 'දදතො පුඤ්ඤං පවඩ්ඪති, සංයමතො වෙරං න චීයති' දෙන්නාහුට ද වෛර නො කරනුලැබෙයි, 'කුසලො ච ජහාති පාපකං, රාගදොස මොහක්ඛයා ස නිබ්බුතො' යම් රූපයකින් දක්නාලද ද ඒ රූපක්ෂයෙන් ද වෙදනාක්ෂයෙන් ද එයින් සත්ත්ව පනවනුයේ නම් ඒ රූපයාගේ ක්ෂය වීමෙන් විරාගයෙන් නිරොධයෙනැයි මෙසේ පඤ්චස්කන්ධයෝ දක්වියයුත්තාහ. (?)

6. 'චතුබ්‍යූහ' යනු : මේ සූත්‍රයෙහි භාග්‍යවතුන් වහන්සේගේ අධිප්‍රාය කවරෙ යැ : යම් කෙනෙක් මහාභොගයන් ප්‍රාර්ථනා කරන්නාහු ද ඔහු දන් දෙන්නාහු යැ, උපද්‍රව ප්‍රහාණය පිණිස යි. යම් කෙනෙක් අවෛර කැමැති වන්නාහු ද ඔහු පඤ්ච අකුශල වෛරයන් දුරලන්නාහු යැ, යම් කෙනෙක් කුශලච්ඡන්ද ඇත්තාහු ද ඔහු අෂ්ටමිථ්‍යාත්වයන් ප්‍රහාණය පිණිස අෂ්ටාංගික මාර්ගය වඩන්නාහු යැ, යම් කෙනෙක් පිරිනිවෙනු කැමැත්තාහු ද ඔහු රාග දෙස මොහ දුරලන්නාහු යැ යන මේ භාග්‍යවතුන් වහන්සේගේ අදහස යි.

7. 'ආවට්ට' යනු : නො දෙන්නාහුට යම් මාත්සය්‍ර්‍යයක් ඇද්ද, සංයම නැත්තහුට යම් වෛරයක් ඇද්ද, අකුශල වූ පාපයාගේ යම් අප්‍රහාණයක් ඇද්ද, මේ දුඃඛනිර්දේශ යැ, සමුදය නොවේ. අලොභ අදෙස අමොහකුසලයෙන් මේ තුන් කුශලමූලයෝ වෙති. අට්ඨසම්මත්තයෝ ඒ කුශලමූලයන්ට ප්‍රත්‍ය යැ. අට්ඨ සම්මත්තයෝ මාර්ග යැ, ඒ රාග දෙසමොහයන්ගේ ක්ෂය වීම නිරොධ යි.

8. 'විභත්ති' යනු : 'දදතො පුඤ්ඤං පවඩ්ඪති' යනු ඒකාන්තයෙන් නො වෙයි, යමෙක් රාජදණ්ඩභයින් දේද, යමෙකුත් අකප්පියපරිභොගයෙන් සිල්වතුන් කෙරෙහි දේද ඔහුට පින් නො වැඩේ යයි. භෙ ද තෙල දානය අකුශල සිතින් දෙයි. දණ්ඩදානය ශස්ත්‍රදානය අකුශලය වඩයි. පින් නො වැඩෙයි, 'සංයමතො වෙරං න චීයති' යනු ඒකාන්තයෙන් නොවෙයි, කරුණු කිම යත් : යමෙක් ඉහාත්මයෙහි යම් වධයක් දකී ද, ඉදින් රජවරු (සොරෙකැයි) ගෙන මාගේ අත හෝ සිඳුවන්නාහු යැ . . . . ඒ සංයමය හේතු කොට අකුශලවෛරය නො කරන්නේ නොවෙයි. යමෙක් වනාහි මෙසේ සමාදානය කෙරේ ද, ඉහාත්මයෙහි ද පරලොව දී ද, ප්‍රාණඝාතයාගේ ලාමක වූ විපාකය වන්නේයැ යි මෙසේ සියලු අකුශලයාගේ හේතුයෙන් වෙන්වෙයි. මේ සංයමය හේතු කොට වෛරය රැස් නොකෙරේය යි.

9. 'පරිවත්තන' යනු : 'දදතො පුඤ්ඤං පවඩ්ඪති' යනු නො දෙන්නාහුට යම් දානමය පිනක් ඇද්ද ඒ පින නො වැඩෙයි. 'සංයමතො වෙරං න චීයති' යනු සංයම නැතියහුට වෛරය කෙරෙයි. 'කුසලො ච ජහාති පාපකං' යනු : ප්‍රඥා රහිත වූයේ (පවකම්) නො හරී. 'රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො' යනු : නිවියේ වෙයි. (අසෙඛස්ස නත්ථි නිබ්බුති ?)

[අම්හෙහි ගන්ත්වාපි න භගවා ආනීතො, දූතං පෙසෙත්වාපි න පක්කොසාපිතො, සයමෙව පන මහාභික්ඛුසඞ්ඝපරිවාරො අම්හාකං වසනට්ඨානං සම්පත්තො, අම්හෙහි ච සන්ථාගාරසාලා කාරිතා, එත්ථ මයං දසබලං ආනෙත්වා මඞ්ගලං භණාපෙමාති චින්තෙත්වා උපසඞ්කමිංසු. 'යෙන සන්ථාගාරං තෙනුපසඞ්කමිංසූ'ති තං දිවසං කිර සන්ථාගාරෙ චිත්තකම්මං නිට්ඨාපෙත්වා අට්ටකා මුත්තමත්තා හොන්ති. බුද්ධා නාම අරඤ්ඤජ්ඣාසයා අරඤ්ඤාරාමා අන්තොගාමෙ වසෙය්‍යුං වා නො වා'ති, තස්මා භගවතො මතං ජානිත්වා ච පටිජග්ගිස්සාමාති චින්තෙත්වා තෙ භගවන්තං උපසඞ්කමිංසු. ඉදානි පන මතං ලභිත්වා පටිජග්ගිතුකාමා යෙන සන්ථාගාරං තෙනුපසඞ්කමිංසු.

සබ්බසන්ථරි'න්ති යථා සබ්බං සන්ථතං හොති එවං, 'යෙන භගවා තෙනුපසඞ්කමිංසූ'ති එත්ථ පන තෙ මල්ලරාජානො සන්ථාගාරං පටිජග්ගිත්වා නගරවීථියොපි සම්මජ්ජාපෙත්වා ධජෙ උස්සාපෙත්වා ගෙහද්වාරෙ පුණ්ණඝටෙ ච[1] කදලියො ච ඨපාපෙත්වා සකලනගරං දීපමාලාහි විප්පකිණ්ණතාරකං විය කත්වා 'ඛීරපකෙ ඛීරං පායෙථ, දහරකුමාරෙ[2] ලහුං ලහුං භොජෙත්වා සයාපෙථ, උච්චාසද්දං මා කරිත්ථ[3] අජ්ජ එකරත්තිං සත්ථා අන්තොගාමෙ[4] වසිස්සති, බුද්ධා නාම අප්පසද්දකාමා හොන්තී'ති භෙරිං චරාපෙත්වා සයං දණ්ඩකදීපිකා ආදාය යෙන භගවා තෙනුපසඞ්කමිංසු.

'භගවන්තං යෙව පුරක්ඛත්වා'ති භගවන්තං පුරතො කත්වා, තත්ථ භගවා භික්ඛූනං චෙව උපාසකානං ච මජ්ඣෙ නිසින්නො අතිවිය විරොචති සමන්තපාසාදිකො සුවණ්ණවණ්ණො අභිරූපො දස්සනීයො. පුරත්ථිමකායතො සුවණ්ණවණ්ණාරස්මි උට්ඨහිත්වා අසීතිහත්ථට්ඨානං[5] ගණ්හාති, පච්ඡිමකායතො දක්ඛිණහත්ථතො වාමහත්ථතො සුවණ්ණවණ්ණාරස්මි උට්ඨහිත්වා අසීතිහත්ථට්ඨානං ගණ්හාති, [උපරි කෙසන්තතො පට්ඨාය සබ්බකෙසාමන්තෙහි මොරගීවවණ්ණරස්මි උට්ඨහිත්වා ගගනතලෙ අසීතිහත්ථට්ඨානං ගණ්හාති,] හෙට්ඨා පාදතලෙහි පවාළවණ්ණරස්මි උට්ඨහිත්වා ඝනපඨවිං[6] අසීතිහත්ථට්ඨානං ගණ්හාති, එවං සමන්තා අසීතිහත්ථමත්තට්ඨානං ඡබ්බණ්ණබුද්ධරස්මියො විජ්ජොතමානා පිප්ඵන්දමානා[7] විධාවන්ති සබ්බෙ දිසාභාගා සුවණ්ණචම්පකපුප්ඵෙහි විකිරියමානා විය. සුවණ්ණඝටතො නික්ඛන්ත සුවණ්ණරසධාරාහි සිඤ්චමානා විය පසාරිතසුවණ්ණපටපරික්ඛිත්තා විය වෙරම්භවාතසමුද්ධුත[8]කිංසුකකණිකාර[9]පුප්ඵචුණ්ණසමොකිණ්ණා[10] විය විප්පකාසන්ති[11] භගවතොපි අසීති-

1. සුවණ්ණඝටි ම, PT*.
2. දහරෙ කුමාරෙ – මජසං, PTS.
3. මා කරි – මජසං, PTS.
4. අන්තොගාමෙව – ම, PTS.
5. ගගනතලෙ අසීති හත්ථං ඨානං – ම, PTS.
6. පඨවියං – ම, PTS.
7. විතණ්ඩමානා – ම.
8 සමුට්ඨිත – ම
9. කිංසුකකිංසුකාරකණිකාරං ච.
10. සමොකිණ්ණා – ම.
11. විප්පකාසන්තං – ම.

අප විසින් බුදුහු සමීපයට ගොස් නො පවරනලද්දහු වෙති, දූතයකු යවාත් නො කැඳවන ලද්දහු වෙති, යළි තමන් වහන්සේ මැ මහාභික්ෂුසඞ්ඝයා විසින් පිරිවරනලද්දහු අප වාසය කරන තැනට වැඩියාහු වෙත්. අප විසිනුදු සන්ථාගාරශාලාව කරවනලදු. අපි මෙහි දසබලයන් වහන්සේ වැඩමවා මංගල දෙසවම්හ ' යි සිතා බුදුරදුන් වෙත එළැඹියාහු යැ. ' යෙන සන්ථාගාරං තෙනුපසංකමිංසු ' යනු එදවස වැලිත් සන්ථාගාරයෙහි සිත්කම් නිමවා අවලු මුදහළමතු වෙත්. බුදුවරයෝ නම් අරණෙහි වසන සිත් ඇත්තාහු අරණෙහි ඇලුණාහු වෙති, ඇතුළුගමැ වසන්නාහු හෝ නො වසන්නාහු හෝ යයි. එහෙයින් භාග්‍යවතුන් වහන්යේගේ සිත දැනැගෙන මැ පිළිදුගුම් කරම්හ යි සිතා ඔහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹුණහ. දැන් වූකලි සිත් ලබාගෙනැ පිළිදුගුම් කරනු කැමැත්තාහු සන්ථාගාරය වෙත එළැඹියාහු යැ.

' සබ්බසන්ථරිං ' යනු : යම්සේ අතුරනලද වේද එසෙයින් අතුරා, ' යෙන භගවා තෙනුපසඞකමිංසු ' යනු : මෙහි වනාහි ඒ මල්ලරජදරුවෝ සන්ථාගාරය පිළිජැගැ නුවර වීථී න් ද හමදවා දද නඟවා ගෙදෙරෙහි පුන්කලය ද කෙහෙල් ද තබවා සියලු නුවර පහන් පෙළින් විසුරුණු තරු ඇතිකලක් මෙන් කරවා ' කිරි බොන ළදරුවන් කිරි පොවවු, දහර කුමරුන් වහවහා වලදවා නිදිගන්වවු, උස්හඬ නහමක් කරවු. ශාස්තෘන් වහන්සේ අද එක් රැයක් ඇතුළුගමැ වසන්නාහ. බුදුවරු නම් නිහඬ රිසි වන්නාහ ' යි බෙර හසුරුවා තුමූ දඬුවැටපහන් ගෙන බුදුන් කරා එළැඹියහ.

' භගවන්තං යෙව පුරක්ඛත්වා ' යනු : බුදුන් පෙරටු කොට, එහි භාග්‍යවත්හු භික්ෂූන්ගේ ද උපාසකයන්ගේ ද මධ්‍යයෙහි වැඩහුන්නාහු හාත්පසින් ප්‍රසාද එළවන්නාහු රන්වන්ව අභිරූපව දර්ශනීය වූවාහු අතිශයින් බබළන සේක. පූර්වශරීරයෙන් රන්වන් රස් නැඟී අහස්තෙලෙහි අසූරියන් තැන් ගනී, පශ්චිමශරීරයෙන් දක්ෂිණහස්තයෙන් වාමහස්තයෙන් රන්වන් රස් නැඟී අසූරියන් තැන් ගනී, මතු කේශාන්තයෙහි පටන් සියලු කේශාවර්තයන්ගෙන් මොණරගෙල පැහැති රස් නැඟී අහස්තෙලෙහි අසූරියන් තැන් ගනී, යට පාදතලයෙන් පබළුවන් රස් නැඟී බොල්පොළොව අසූරියන් තැන් ගනී, මෙසේ හාත්පසින් අසූරියන් පමණ තැන් සවනක් බුදුරස්හු දිලෙමින් ලෙලෙමින් දිවෙත්. සියලු දික්හු රන්සපුමල් විසුරුවන කලක් මෙන් රන්කලසින් නික්මුණු රන්රසධාරා ඉසින කලක් මෙන් විදහාලූ රන්පිළියෙන් පිරිකෙවකළ කලක් මෙන් වේරම්බවාතයෙන් නඟන ලද කැල කිණිහිරි මල්රොන් ගැවැසුණු කලක් මෙන් දිලියෙත්. භාග්‍යවතුන් වහන්සේගේ ද අසූ අනුව්‍යඤ්ජනයෙන් ව්‍යාමප්‍රභායෙන් දෙතිස් වරපුරුෂලක්ෂණයෙන් සමුජ්වලිත වූ

අනුබ්‍යඤ්ජනබ්‍යාමප්පභාද්වත්තිංසවරලක්ඛණසමුජ්ජලං සරීරං සමුග්ගත-තාරකං විය ගගනතලං විකසිතමිව පදුමවනං සබ්බඵාලිඵුල්ලො විය යොජනසතිකො පාරිච්ඡත්තකො පටිපාටියා ඨපිතානං ද්වත්තිංසචන්දානං ද්වත්තිංසසූරියානං ද්වත්තිංසචක්කවත්තීනං ද්වත්තිංසදෙවරාජානං ද්වත්තිංසමහාබ්‍රහ්මානං [සිරියා සිරිං අභිභවමානං විය විරොචති පරිවාරෙත්වා නිසින්නභික්ඛූපි සබ්බෙව අප්පිච්ඡා සන්තුට්ඨා පවිවිත්තා අසංසට්ඨා ආරද්ධවීරියා වත්තාරො වචනක්ඛමා චොදකා පාපගරහිනො සීලසම්පන්නා සමාධිසම්පන්නා -පෙ-] (සඞ්ගීතිසුත්තවණ්ණනා.*)

නිබ්බුතො, අසෙඛස්ස නත්ථි නිබ්බුති. (?)

10. වෙවචනොති[1] : දදතො පුඤ්ඤං පවඩ්ඪති, අනුමොදතොපි පුඤ්ඤං පවඩ්ඪති. චිත්තස්ස සමාදහතොපි වෙය්‍යාවච්චකිරියායපි පුඤ්ඤං පවඩ්ඪතීති.

11. පඤ්ඤත්තීති : 'දදතො පුඤ්ඤං පවඩ්ඪතී'ති අලොභස්ස පටිනිස්සග්ගානුපඤ්ඤත්තියා පඤ්ඤත්තං. 'සංයමතො වෙරං න චීයතී'ති අදොසස්ස පටිනිස්සග්ගානුපඤ්ඤත්තියා පඤ්ඤත්තං. කුසලො ච ජහාති පාපක'න්ති අමොහස්ස පටිනිස්සග්ගානුපඤ්ඤත්තියා පඤ්ඤත්තං.

12. ඔතරණොති : පඤ්චසු ඉන්ද්‍රියෙසු දදතො පුඤ්ඤං පවඩ්ඪති. සංයමතො වෙරං න චීයති, සංයමෙන සීලක්ඛන්ධො ඔතිණ්ණො, ඡසු ඉන්ද්‍රියෙසු සංවරො, අයං සමාධික්ඛන්ධො. යං කුසලො ච ජහාති පාපකං අයං පඤ්ඤාක්ඛන්ධො. රාගදොසමොහක්ඛයා ස නිබ්බුතොති විමුත්තික්ඛන්ධො. ධාතූසු ධම්මධාතු, ආයතනෙසු මනායතනං.

13 සොධනොති : යෙනාරම්භෙන ඉදං සුත්තං දෙසිතං, සො ආරම්භො සුද්ධො.

14. අධිට්ඨානොති : දානන්ති එකත්තතාය[2] පඤ්ඤත්තං. චාගො පරිච්චාගො ධම්මදානං ආමිසදානං අට්ඨ දානානි විත්ථාරෙන කාතබ්බානි, අයං වෙමත්තතා. න ච දදතො එකත්තපඤ්ඤත්තියා පඤ්ඤත්තං ධනානි අනවජ්ජනාති[3] පඤ්ඤත්තියා පඤ්ඤත්තං. 'රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො'ති රොධ[4]වීරියපඤ්ඤත්තියා පඤ්ඤත්තා.

15. පරික්ඛාරොති : දානස්ස පාමොජ්ජං පච්චයො, අලොභො හෙතු. සංයමතො යොනිසොමනසිකාරො හෙතු, පරිච්චාගො පච්චයො. 'කුසලො ච ජහාති පාපක'න්ති යථාභූතදස්සනං පච්චයො, ඤාණ-පටිලාභො[5] හෙතු. 'රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො'ති පරතො ච ඝොසො අජ්ඣත්තං ච යොනිසො මනසිකාරො ධම්මො ච හෙතු ච පච්චයො ච.

---

* සංගීති සුත්තවණ්ණනාපාඨො'යං පරිවත්තනහාරසම්පාතට්ඨානෙ කිමත්ථමාරොපිතොති න ඤායතෙ.
1. වෙවචනන්ති – මජසං.
2. එකත්තාය – PTS.
3. අනාවජ්ජනාති – PTS.
4. යොධ – PTS.
5. ඤාණප්පටිලාභො – මජසං.

ශරීරය සමුද්ගත තාරකා ඇති ආකාශතලය සෙයින් විකසිත වූ පියුම්වනයක් සෙයින් මුල සිට අග දක්වා පිපුණු සියක්යොදුන් පරසතුරුක සෙයින් පිළිවෙලින් තබන ලද දෙතිස් චන්ද්‍රකෙතකුන්ගේ දෙතිස් සූර්‍ය්‍යකෙතකුන්ගේ දෙතිස් සක්විතිකෙතකුන්ගේ දෙතිස් දිව්‍යරාජකෙතකුන්ගේ දෙතිස් මහාබ්‍රහ්මකෙතකුන්ගේ සොභාව තමන් වහන්සේගේ සොභායෙන් අභිභවනය කරන කලක් මෙන් බබළා. පිරිවරා වැඩහුන් වහන්ද ද සියල්ලෝ මැ අල්පේච්ඡ වූවාහු සන්තුෂ්ට වූවාහු ප්‍රවිවික්ත වූවාහු (කුලයා කෙරෙහි ගණයා කෙරෙහි) අසංසෘෂ්ට වූවාහු ආරබ්ධවීර්‍ය්‍ය වූවාහු වක්තෘ වූවාහු වචනක්ෂම වූවාහු චොදක වූවාහු පාපගර්හී වූවාහු ශීලසම්පන්න සමාධිසම්පන්න වූවාහු වෙති . . . . සංගීති සූත්‍රවර්ණනා යි.

10. ' වෙවචන ' යනු : ' දදතො පුඤ්ඤං පවඩ්ඪති ' අනුමොදන් වන්නාහුට ද පින් වැඩෙයි, සිත පිහිටුවන්නාහුට ද වතාවත් කිරීමෙනුදු පින් වැඩෙ යයි.

11. ' පඤ්ඤත්ති ' යනු : ' දදතො පුඤ්ඤං පවඩ්ඪති ' යනු අලොභයට විරුද්ධ නිශ්‍රයඝාත ප්‍රඥප්තියෙන් පනවන ලද, ' සංයමතො වෙරං න චීයති ' යනු අද්වේෂයට විරුද්ධ හෙතුඝාතප්‍රඥප්තියෙන් පනවනලද, ' කුසලො ච ජහාති පාපකං ' යනු අමොහයට විරුද්ධ හෙතුන්ගේ විඝාතප්‍රඥප්තියෙන් පනවන ලදි.

12. ' ඔතරණ ' යනු : පඤ්චෙන්ද්‍රියයන් කෙරෙහි දෙන්නහුට පින් වැඩෙයි, සංයම යෙන් වෛරය නො කෙරෙයි, සංයමයෙන් ශීලස්කන්ධය අවතීර්ණ යැ, (චක්ෂුරාදි) ෂඩින්ද්‍රියන්හි සංවරය වෙයි, මේ සමාධිස්කන්ධ යැ, දක්ෂ වූයේ පව් දුරලයි යන යමක් ඇද්ද මේ ප්‍රඥාස්කන්ධ යැ, ' රාගදෙසමොහක්ඛයා ස නිබ්බුතො ' යනු විමුක්තිස්කන්ධ යැ, ධාතුන් කෙරෙහි ධර්මධාතු යැ, ආයතනයන් කෙරෙහි මනායතන යි.

13. ' සොධන ' යනු : යම් ආරම්භයෙකින් මේ සූත්‍රය දෙසන ලද ද, ඒ ආරම්භය ශුද්ධ යි.

14. ' අධිට්ඨාන ' යනු : ' දන ' යනු ඒකත්තතායෙන් පනවනලද, චාග පරිච්චාග ධම්මදන ආමිසදන යැ, අටවැදෑරුම් දනයෝ විස්තර කළයුත්තාහු යැ, මේ වෙමත්තතා යි. ' දදතො ' යනු එකත්වප්‍රඥප්තියෙන් නො ද පනවනලද, ඛින්තිය අනවද්‍යප්‍රඥප්තියෙන් පනවනලද, ' රාගදෙසමොහක්ඛයා ස නිබ්බුතො ' යනු රොධ (?) විරියපඤ්ඤත්තියෙන් පනවන ලදහු යි.

15. ' පරික්ඛාර ' යනු : දනයට ප්‍රාමොද්‍යය ප්‍රත්‍ය යැ, අලොභය හේතු යි. සංයමයට යොනිසොමනසිකාරය හේතු යැ, පරිත්‍යාගය ප්‍රත්‍යයයි, ' කුසලො ච ජහාති පාපකං ' යනු යථාභූතඥානදර්ශනය ප්‍රත්‍ය යැ, ඥානප්‍රතිලාභය හෙතු' යි. ' රාගදෙසමොහක්ඛයා ස නිබ්බුතො ' යනු පරතෝඝෝසය ද අධ්‍යාත්මයෙහි යෝනිසෝමනසිකාරය ද හෙතු ද ප්‍රත්‍යය ද වේ.

16. **සමාරොපනොති :** ‘දදතො පුඤ්ඤං පවඩ්ඪතී’ති ගාථා තස්ස සීලම්පි වඩ්ඪති, සංයමො’පි වඩ්ඪති. ‘සංයමතො වෙරං න චීයතී’ති අඤ්ඤෙපි කිලෙසා න චීයන්ති, යෙපිස්ස තප්පච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතා, තෙපිස්ස න උප්පජ්ජන්ති. ‘රාගදොසමොහක්ඛයා ස නිබ්බුතො’ති රාගදොසස්සාපි ඛයා රාගානුසයස්සා’පි ඛයා දොසස්ස මොහස්සාපි, ‘ස නිබ්බුතො’ති සොපාදිසෙසා නිබ්බානධාතු අනුපාදිසෙසාපි. අයං සමාරොපනො.

**ථෙරස්ස මහාකච්චායනස්ස පෙටකොපදෙසෙ**
**හාරස්ස සම්පාතභූමි සමත්තා.**

16. 'සමාරෝපන' යනු : 'දදතො පුඤ්ඤං පවඩ්ඪති' යනු ඔහුට සීලය ද වැඩෙයි, සංයමය ද වැඩෙයි. 'සංයමතො වෙරං න චීයති' යනු අන්‍ය ක්ලෙශයෝ ද නූපදිති, ඒ හෙතුයෙන් ඔහුට උපදුව උපදවන යම් ආස්‍රව කෙනෙකුත් උපදනාහු නම් ඒ ආස්‍රවයෝ ද ඔහුට නූපදිත්. 'රාගදෙසමොහක්ඛයා ස නිබ්බුතො' යනු රාගදෙසයන්ගේ ක්ෂය වීමෙන් ද රාගානුසයාගේ ක්ෂය වීමෙන් ද දෙසයාගේ හා මොහයාගේ ක්ෂය වීමෙන් ද, 'ස නිබ්බුතො' යනු සොපාදිසෙසනිබ්බානධාතුව ද අනුපාදිසෙසනිබ්බානධාතුව ද වේ. මේ සමාරෝපන යි.

**මහාකච්චායන ස්ථවිරයන් වහන්සේගේ පෙටකොපදෙසයෙහි හාරසම්පාත භූමිය සමාප්තයි.**

# 8. සුත්තවෙභඞ්ගියං

පුබ්බාකොටි න පඤ්ඤායති අවිජ්ජාය ච භවතණ්හාය ච. තත්ථ අවිජ්ජානීවරණං තණ්හාසංයොජනානං සත්තානං පුබ්බාකොටි න පඤ්ඤායති. තත්ථ යෙ සත්තා තණ්හාසංයොජනා තෙ අජ්ඣොසානබහුලා මන්දවිපස්සකා යෙ පන උස්සන්නදිට්ඨිකා සත්තා, තෙ විපස්සනාබහුලා. මන්දජ්ඣොසානා.

1. තත්ථ තණ්හාචරිතා සත්තා සත්තසඤ්ඤාභිනිවිට්ඨා, අනුප්පාදවයදස්සිනො තෙ පඤ්චසු ඛන්ධෙසු අත්තානං සමනුපස්සන්ති: "රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තාන"න්ති එවං පඤ්චක්ඛන්ධා. අඤ්ඤෙහි ඛන්ධෙහි අත්තානං සමනුපස්සන්ති, තත්ථ[1] උස්සන්නදිට්ඨිකා සත්තා විපස්සමානා ඛන්ධෙ උජුං අත්තතො සමනුපස්සන්ති. තෙ රූපං අත්තතො සමනුපස්සන්ති. යං රූපං, සො අත්තා, යො අහං, තං රූපං. සො රූපවිනාසං පස්සති, අයං උච්ඡෙදවාදී, ඉති පඤ්චන්නං ඛන්ධානං පඨමාභිනිපාතා සක්කායදිට්ඨියො පඤ්ච උච්ඡෙදං භජන්ති.

තං ජීවං තං සරීරන්ති, එකමෙකම්හි ඛන්ධෙ තීහි පදෙහි පච්ඡිමකෙහි සස්සතං භජති. අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති. ඉතො බහිද්ධා තෙ පබ්බජිතා තණ්හාචරිතා කාමසුඛල්ලිකානුයොගමනුයුත්තා විහරන්ති, තෙන යෙව[2] නිස්සන්දෙන. දිට්ඨිචරිතා අත්තකිලමථානුයොගමනුයුත්තා විහරන්ති, තෙන යෙව දිට්ඨිසුඛෙන එත්තාවතා බාහිරකො පයොගො.

තත්ථ දිට්ඨිචරිතා සත්තා යෙ අරියංධම්මවිනයං[3] ඔතරන්ති, තෙ ධම්මානුසාරිනො හොන්ති යෙ තණ්හාචරිතා සත්තා අරියං ධම්මවිනයං ඔතරන්ති, තෙ සද්ධානුසාරිනො හොන්ති.

තත්ථ යෙ දිට්ඨිචරිතා, තෙ කාමෙසු දොසදිට්ඨී, න ච යෙ කාමෙසු අනුසයා සමූහතා, තෙ අත්තකිලමථානුයොගමනුයුත්තා විහරන්ති. තෙසං සත්ථා ධම්මං දෙසෙති, අඤ්ඤො වා සාවකො කාමෙහි නත්ථි අත්ථොති තෙ ච පුබ්බෙයෙව කාමෙහි අනත්ථිකා, ඉති කාමෙ අප්පකසිරෙන පටිනිස්සජ්ජන්ති[4] තෙ චෙතසිකෙන දුක්ඛෙන අනජ්ඣොසිතා. තෙන වුච්චති, සුඛා පටිපදා'ති. යෙ පන තණ්හාචරිතා සත්තා, තෙ කාමෙසු අජ්ඣොසිතා, තෙසං සත්ථා වා ධම්මං දෙසෙති, අඤ්ඤතරෙ වා භික්ඛු, කාමෙහි නත්ථි අත්ථො'ති. තෙ පියරූපං දුක්ඛෙන පටිනිස්සජ්ජන්ති,[4] තෙන වුච්චති දුක්ඛා පටිපදා'ති. ඉති ඉමෙ සබ්බසත්තා ද්විසු පටිපදාසු සමොසරණං ගච්ඡන්ති දුක්ඛායං ච සුඛායං ච.

---

1. තස්ස - මජසං, PTS.
2. යෙ ච - මජසං, PTS.
3. අරියධම්මවිනයං - මජසං, PTS.
4. නිස්සජ්ජන්ති - මජසං, PTS.

# 8. සූත්‍රවිභඞගය

අවිද්‍යාවගේ ද භවතෘෂ්ණාවගේ ද පූර්වාන්තය නො පැනෙයි. එහි අවිද්‍යානිවරණ ඇති තෘෂ්ණාසංයොජන ඇති සත්වයන්ගේ පූර්වාන්තය නො පැනෙයි, එහි යම් සත්වකෙනෙක් තෘෂ්ණාසංයොජන ඇත්තාහු ද ඔහු ගැලීසිටීම බහුල කොට ඇත්තාහු මඳ වූ විදර්ශනා ඇත්තාහු යැ. යළි උත්සන්න වූ දෘෂ්ටි ඇති යම් සත්වකෙනෙක් ඇද්ද ඔහු විදර්ශනා බහුල කොට ඇත්තාහු අල්ප වූ ගැලීසිටීම ඇත්තාහු වෙත්.

1. එහි තෘෂ්ණාචරිත ඇති සත්වසංඥයෙහි බැසගත්තාහු උත්පාදව්‍යය නො දක්නාහු වෙති, ඔහු පඤ්චස්කන්ධයෙහි ආත්මය ඇතැයි දකිති, ආත්මය රූපවත් යයි හෝ, ආත්ම යෙහි රූපය ඇතැයි හෝ, රූපයෙහි ආත්මය ඇතැයි හෝ යි. මෙසේ පඤ්චස්කන්ධයෝ (කියැයුත්තාහ.) අන්‍යස්කන්ධයන්ගෙන් ආත්මය දකිත්. එහි උත්සන්න වූ දෘෂ්ටි ඇති සත්වයෝ විමසන්නාහු ස්කන්ධයන් සෘජුව ආත්මවශයෙන් දකිත්. ඔහු රූපය ආත්ම විසින් දකිත්. 'යම් රූපයක් ඇද්ද හේ ආත්ම යැ, යමෙක් මම වෙම් ද ඒ රූප යැ, හෙතෙම රූපයාගේ විනාශය දකී. මේ උච්ඡෙදවාදී යැ. මෙසේ පඤ්චස්කන්ධයන්ගේ ප්‍රථමාභි නිපාතයෙන් සත්කායදෘෂ්ටීහු පස්දෙනෙක් උච්ඡෙදය භජනය කෙරෙත්.

එය ජීව යැ එය ශරීරයැ' යි එක් එක් ස්කන්ධයෙහි පශ්චිම වූ තුන් පදයෙන් ශාස්වතය භජනය කෙරෙයි. ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි. මේ ශාසනයෙන් බැහැර වූ ඒ පැවිද්දෝ තෘෂ්ණාචරිත ඇත්තාහු ඒ හේතුයෙන් ම කාමසුඛල්ලිකානුයොගයෙහි යෙදී වෙසෙත්. දෘෂ්ටිචරිත ඇත්තාහු ඒ දෘෂ්ටිසුඛයෙන් ම අත්තකිලමථානුයොගයෙහි යෙදුණාහු වාසය කෙරෙත්. මෙතෙකින් බාහිර වූ ප්‍රයොගය වේ.

එහි යම් දෘෂ්ටිචරිත ඇති සත්වකෙනෙක් ආර්‍ය්‍යධර්මවිනයට බැසගනිත් ද ඔහු ධම්මානුසාරි වෙති, යම් තෘෂ්ණාචරිත ඇති සත්වකෙනෙක් ආර්‍ය්‍යශාසනයට බැසගනිත් ද ඔහු සද්ධානුසාරී වෙත්.

එහි යම් දිට්ඨිචරිත සත්වකෙනෙක් ඇද්ද ඔහු කාමයන්හි දෙස දක්නාහු යැ, යම් කෙනෙක් කාමයන්හි අනුශය නො ද නසනලද්දහු ද ඔහු අත්තකිලමථානුයොගයෙහි යෙදී වෙසෙති. ඔවුන්ට ශාස්තෘන් වහන්සේ හෝ අන්‍ය ශ්‍රාවකයෙක් හෝ ' කාමයන්ගෙන් අර්ථයෙක් නැතැ ' යි දහම් දෙසති, ඔහුදු පෙර මැ කාමයන් නොරිසි වූවාහු යැ, එහෙයින් නිදුකින් කාමයන් දුරු කෙරෙති, ඔහු චෛතසික දුකින් නො මඩනාලද්දහු යැ. එහෙයින් ' සුඛා පටිපද ' යී කියනුලැබේ. වැලි යම් තණ්හාචරිත සත්ව කෙනෙක් ඇද්ද ඔහු කාමයන්හි බැසගත්තාහු යැ, ඔවුනට ශාස්තෘන් වහන්සේ හෝ අන් පැවිදිකෙනෙක් හෝ ' කාමයන් ගෙන් අර්ථ නැතැ ' යි දහම් දෙසති. ඔහු ප්‍රියස්වභාව වස්තුව දුකසේ දුරලති, එයින් ' දුක්ඛා පටිපද ' යි කියනු ලැබේ. මෙසේ මේ සියලු සත්වයෝ දුඃඛ වූ සුඛ වූ දෙවැදෑරුම ප්‍රතිපදවන්හි සමොසරණයට යෙත්.

තත්ථ යෙ දිට්ඨිචරිතා සත්තා, තෙ දුවිධා: මුදින්ද්‍රියා ච තික්ඛින්ද්‍රියා ච. තත්ථ යෙ දිට්ඨිචරිතා සත්තා තික්ඛින්ද්‍රියා සුඛෙන පටිනිස්සජ්ජන්ති. ඛිප්පං ච අභිසමෙන්ති, තෙන වුච්චති ඛිප්පාභිඤ්ඤා සුඛා පටිපදා'ති, තත්ථ යෙ දිට්ඨිචරිතා සත්තා මුදින්ද්‍රියා පඨමං තික්ඛින්ද්‍රියං උප්පාදය දන්ධතරං අභිසමෙන්ති, තෙ සුඛෙන පටිනිස්සජ්ජන්ති, දන්ධං ච අභිසමෙන්ති. තෙන වුච්චති සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා'ති. තත්ථ තණ්හාචරිතා සත්තා දුවිධා: තික්ඛින්ද්‍රියා ච මුදින්ද්‍රියා ච. තත්ථ යෙ තණ්හාචරිතා සත්තා තික්ඛින්ද්‍රියා දුක්ඛෙන පටිනිස්සජ්ජන්ති, ඛිප්පං ච අභිසමෙන්ති. තෙන වුච්චති. දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා'ති. තත්ථ යෙ තණ්හාචරිතා සත්තා මුදින්ද්‍රියා පඨමං තික්ඛින්ද්‍රියං උප්පාදය දන්ධතරං අභිසමෙන්ති, තෙ දුක්ඛෙන පටිනිස්සජ්ජන්ති, දන්ධං ච අභිසමෙන්ති, තෙන වුච්චති: දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා'ති. ඉමා චතස්සො පටිපදායො අපඤ්චමා අජට්ඨා යෙ හි කෙචි[1] නිබ්බුතා නිබ්බායිස්සන්ති වා, ඉමාහි චතූහි පටිපදාහි අනඤ්ඤාහි. අයං පටිපදාචතුක්කෙන කිලෙස නිද්දිසති. යා චතුක්කමග්ගෙන අරියධම්මෙසු නිද්දිසිතබ්බා.

අයං වුච්චති සීහවික්කීළිතො නාම නයො.

2. තත්‍රිමෙ චත්තාරො ආහාරා, චත්තාරො විපල්ලාසා, උපාදානා, යොගා, ගන්ථා, ආසවා, ඔඝා, සල්ලා, විඤ්ඤාණට්ඨිතියො, අගතිගමනා'ති. එවං ඉමානි සබ්බානි දස පදානි. අයං සුත්තස්ස සංසන්දනා.

චත්තාරො ආහාරා: තත්ථ යො ච කබළිඞ්කාරො[2] ආහාරො යො ච ඵස්සො ආහාරො, ඉමෙ තණ්හාචරිතෙන පහාතබ්බා, තත්ථ යො ච මනොසඤ්චෙතනාහාරො යො ච විඤ්ඤාණාහාරො, ඉමෙ දිට්ඨිචරිතෙන පහාතබ්බා.

පඨමො ආහාරො පඨමො විපල්ලාසො, දුතියො ආහාරො දුතියො විපල්ලාසො, තතියො ආහාරො තතියො විපල්ලාසො, චතුත්ථො ආහාරො චතුත්ථො විපල්ලාසො. ඉමෙ චත්තාරො විපල්ලාසා අපඤ්චමා, අජට්ඨා. ඉදං ච පමාණං චත්තාරො ආහාරා.

තත්ථ පඨමෙ විපල්ලාසෙ ඨිතො කාමෙ උපාදියති, ඉදං කාමුපාදානං. දුතියෙ විපල්ලාසෙ ඨිතො අනාගතං භවං උපාදියති, ඉදං සීලබ්බතුපාදානං. තතියෙ විපල්ලාසෙ ඨිතො විපරිතං[3] දිට්ඨිං[4] උපාදියති, ඉදං දිට්ඨුපාදානං. චතුත්ථෙ විපල්ලාසෙ ඨිතො ඛන්ධෙ අත්තතො උපාදියති, ඉදං අත්තවාදුපාදානං.

තත්ථ කාමුපාදානෙ ඨිතො කාමෙ අභිජ්ඣායති ගන්ථති, අයං අභිජ්ඣාකායගන්ථො. සීලබ්බතුපාදානෙ ඨිතො බ්‍යාපාදං ගන්ථති, අයං බ්‍යාපාදකායගන්ථො. දිට්ඨුපාදානෙ ඨිතො පරාමාසං ගන්ථති, අයං පරාමාසකායගන්ථො. අත්තවාදුපාදානෙ ඨිතො පපඤ්චෙන්තො ගන්ථති, අයං ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො.

---

1. යෙහි කෙහිචි – PTS.
2. කබළීකාරො – මජසං, PTS.
3. විපරීතො – මජසං, PTS.
4. දිට්ඨි – PTS.

එහි යම් දිට්ඨිචරිත සත්වකෙනෙක් වෙද්ද ඔහු මුදින්ද්‍රිය ද තික්ඛින්ද්‍රිය දුයි දෙපරිදි වෙති. එහි යම් තික්ඛින්ද්‍රිය වූ දිට්ඨිචරිත සත්වකෙනෙක් සුවසේ කාමයන් දුරලත් ද වහා අභිසමය කෙරෙත් ද එයින් ' ඛිප්පාභිඤ්ඤා සුඛා පටිපද ' යි කියනු ලැබේ. එහි යම් මුදින්ද්‍රිය වූ දිට්ඨිචරිත සත්වකෙනෙක් වෙත් ද පළමු තික්ඛින්ද්‍රියයා ගෙන ඉතා ලැසිවැ අභිසමය කෙරෙත් ද, ඔහු සුවසේ කාමයන් දුරලති, ලැසිවැ අභිසමය කෙරෙත්. එයින් ' සුඛා පටිපද දන්ධාභිඤ්ඤා ' යි කියනු ලැබෙත්. එහි තණ්හාචරිත සත්වයෝ තික්ඛින්ද්‍රිය ද මුදින්ද්‍රිය දුයි දෙපරිදි වෙති. එහි යම් තික්ඛින්ද්‍රිය වූ තණ්හාචරිත සත්වකෙනෙක් දුකසේ කාමයන් දුරලත් ද වහා අභිසමය කෙරෙත් ද එයින් ' දුක්ඛා පටිපද ඛිප්පාභිඤ්ඤා ' යි කියනු ලැබෙත්. එහි යම් මුදින්ද්‍රිය වූ තණ්හාචරිත සත්වකෙනෙක් වෙත් ද පළමු තික්ඛින්ද්‍රියයා ගෙන ඉතා ලැසිවැ අවබෝධ කෙරෙත් ද ඔහු දුකසේ කාමයන් දුරලති ලැසිවැ අභිසමය කෙරෙත්. එයින් ' දුක්ඛා පටිපද දන්ධාභිඤ්ඤා ' යි කියනු ලැබේ. මේ සතර ප්‍රතිපද වෙති, පයක් නොවෙති, සයක් නොවෙත්. යම්කෙනෙක් නිවියාහු හෝ නිවෙන්නාහු හෝ වෙත් ද මේ සතර ප්‍රතිපදයෙනි, අනෙකකින් නොවෙත්. යම් ප්‍රතිපදවක් චතුෂ්කමාර්ගයෙන් ආයඖධර්මයන්හි දුක්වියයුත්තී ද, මෙය ප්‍රතිපදචතුෂ්කයෙන් ක්ලෙශයන් දක්වයි.

මේ සීහවික්කීළිතනය නමැයි කියනුලැබේ.

2. එහි මේ සතර ආහාරයෝ යැ සතර විපල්ලාසයෝ යැ උපාදානයෝ යැ යොගයෝ ගන්ථයෝ යැ ආසවයෝ යැ ඕඝයෝ යැ සල්ලයෝ යැ විඤ්ඤාණට්ඨිතිහු යැ (සතර) අගතිගමනයෝ යි මෙසේ මේ සියලු දසපදයෝ වෙත්. මේ සූත්‍රයාගේ සංසන්දනා යි.

සතර ආහාරයෝ වෙති : එහි යම් කබලිංකාරාහාරයෙකුත් යම් ඵස්සාහාරයෙකුත් වෙත් ද මොහු තණ්හාචරිතයා විසින් ප්‍රහාතව්‍ය යැ, එහි යම් මනොසඤ්චතනාහාර යෙකුත් යම් විඤ්ඤාණාහාරයෙකුත් වෙත් ද මොහු දිට්ඨිචරිතයා විසින් ප්‍රහාතව්‍ය යි.

ප්‍රථම ආහාරය ප්‍රථම විපල්ලාස යැ, දෙවැනි ආහාරය දෙවැනි විපල්ලාස යැ, තෙවැනි ආහාරය තෙවැනි විපල්ලාසය යැ, සතරවැනි ආහාරය සතරවැනි විපල්ලාස යි. මේ සතර විපල්ලාසයෝ යැ, පස්වැන්නක් නැත, සවැන්නක් නැති. මෙ ද සතර ආහාරයෝ ප්‍රමාණ කොට ඇත්තාහ.

එහි ප්‍රථම විපල්ලාසයෙහි සිටියේ කාමයන් දඩිව ගනී. මේ කාමූපාදන යැ, දෙවැනි විපල්ලාසයෙහි සිටියේ අනාගත භවය දැඩිවැ ගනී, මේ සීලබ්බතූපාදන යැ, තෙවැනි විපල්ලාසයෙහි සිටියේ විපරීත දෘෂ්ටිය දැඩිවගනී, මේ දිට්ඨූපාදන යැ. සතර වැනි විපල්ලාසයෙහි සිටියේ ස්කන්ධයන් ආත්මවශයෙන් දැඩිවැ ගනී, මේ අත්තවාදූපාදන යි.

එහි කාමූපාදනයෙහි සිටියේ වස්තුකාම ක්ලේශකාමයන් අභිධ්‍යා කෙරෙයි, (නාමකය හා) ග්‍රන්ථනය කෙරෙයි. මේ අභිධ්‍යාකායග්‍රන්ථ යැ, සීලබ්බතූපාදනයෙහි සිටියේ ව්‍යාපාදය ග්‍රන්ථනය කෙරෙයි, මේ ව්‍යාපාදකායග්‍රන්ථ යැ, දිට්ඨූපාදනයෙහි සිටියේ දෘෂ්ටි පරාමර්ශය ග්‍රන්ථනය කෙරෙයි, මේ පරාමාසකායග්‍රන්ථ යැ, ආත්මවාදූපාදනයෙහි සිටියේ අනුප්‍රබන්ධ වශයෙන් සසර සිටුනේ (නාමකය) ග්‍රන්ථනය කෙරෙයි. මේ ඉදංසච්චාභිනිවෙසකායග්‍රන්ථ යි.

තස්ස ගන්ථිතා කිලෙසා ආසවන්ති, කිඤ්චි පන වුච්චති විප්පටිසාරො, යෙ විප්පටිසාරා[1] තෙ අනුසයා. තත්ථ අභිජ්ඣාකායගන්ථෙන කාමාසවො, බ්‍යාපාදකායගන්ථෙන භවාසවො, පරාමාසකායගන්ථෙන දිට්ඨාසවො, ඉදංසච්චාභිනිවෙසකායගන්ථෙන අවිජ්ජාසවො.

තෙ චත්තාරො ආසවා වෙපුල්ලභාවං ගතා ඔඝා හොන්ති, තෙන වුච්චන්ති[2]. ඔඝා'ති. තත්ථ කාමාසවො කාමොඝො, භවාසවො භවොඝො, අවිජ්ජාසවො අවිජ්ජොඝො, දිට්ඨාසවො දිට්ඨොඝො.

තෙ චත්තාරො ඔඝා ආසයමනුපවිට්ඨා අනුසයසහගතා වුච්චන්ති 'සල්ලා'ති හදයමාහච්ච තිට්ඨන්තා. තත්ථ කාමොඝො රාගසල්ලං, භවොඝො දොසසල්ලං, අවිජ්ජොඝො මොහසල්ලං, දිට්ඨොඝො දිට්ඨිසල්ලං

ඉමෙහි චතූහි සල්ලෙහි පරියාදින්නං විඤ්ඤාණං චතූසු ධම්මෙසු තිට්ඨති, රූපෙ වෙදනාය සඤ්ඤාය සඞ්ඛාරෙසු ඉමා චතස්සො විඤ්ඤාණට්ඨිතියො. තත්ථ රාගසල්ලෙන නන්දූපසෙවිතං රූපූපගං විඤ්ඤාණං තිට්ඨති. දොසසල්ලෙන වෙදනූපගං, මොහසල්ලෙන සඤ්ඤූපගං, දිට්ඨිසල්ලෙන නන්දූපසෙවිතං සඞ්ඛාරූපගං විඤ්ඤාණං තිට්ඨති.

චතූහි, විඤ්ඤාණට්ඨිතීහි චතුබ්බිධං අගතිං ගච්ඡන්ති: ඡන්දා දොසා භයා මොහා. රාගෙන ඡන්දා අගතිං ගච්ඡන්ති, දොසෙන දොසා අගතිං ගච්ඡති, මොහෙන මොහා අගතිං ගච්ඡති, දිට්ඨියා භයා අගතිං ගච්ඡති. ඉති ඉදං ච කම්මං ඉමෙ ච කිලෙසා, අයං සංසාරස්ස හෙතු.

තත්ථිමා චතස්සො දිසා: කබළීකාරො[3] ආහාරො, 'අසුභෙ සුභ'න්ති විපල්ලාසො, කාමුපාදානං, කාමයොගො, අභිජ්ඣාකායගන්ථො, කාමාසවො, කාමොඝො, රාගසල්ලං රූපූපගා විඤ්ඤාණට්ඨිති, ඡන්දා අගතිගමනං. අයං පඨමා දිසා.

ඵස්සො ආහාරො, 'දුක්ඛෙ සුඛ'න්ති විපල්ලාසො, සීලබ්බතුපාදානං, භවයොගො, බ්‍යාපාදො කායගන්ථො, භවාසවො, භවොඝො, දොසසල්ලං, වෙදනූපගා විඤ්ඤාණට්ඨිති, දොසා අගතිගමනං, අයං දුතියා දිසා.

මනොසඤ්චෙතනාහාරො, 'අනත්තනි අත්තා'ති විපල්ලාසො, දිට්ඨුපාදානං, දිට්ඨියොගො, පරාමාසකායගන්ථො, දිට්ඨාසවො, දිට්ඨොඝො, දිට්ඨිසල්ලං, සඤ්ඤූපගා විඤ්ඤාණට්ඨිති, භයා අගතිගමනං. අයං තතියා දිසා.

විඤ්ඤාණාහාරො, 'අනිච්චෙ නිච්ච'න්ති විපල්ලාසො, අත්තවාදුපාදානං, අවිජ්ජායොගො, ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො, අවිජ්ජාසවො, අවිජ්ජොඝො, මොහසල්ලං, සඞ්ඛාරූපගා විඤ්ඤාණට්ඨිති, මොහා අගතිගමනං අයං චතුත්ථී දිසා. ඉති ඉමෙසං දසන්නං සුත්තානං පඨමෙන පදෙන පඨමාය දිසාය ආලොකනං, අයං වුච්චති දිසාලොකනා.

---

1. යො විප්පටිසාරො – PTS,
2. වුච්චති – මජසං.
3. කබළීකාරො – මජසං, PTS.

ඔහුට ග්‍රන්ථිත වූ ක්ලේශයෝ ආස්‍රවභාවයෙන් පවතිත්. (කිඤ්චි පන ?) විප්‍රතිසාර යයි කියනුලැබේ. යම් විප්‍රතිසාරයෙකෙනෙක් වෙත් ද ඔහු අනුසය වෙති. එහි අභිධ්‍යාකාය ග්‍රන්ථයෙන් කාමාස්‍රවය වෙයි. ව්‍යාපාදකායග්‍රන්ථයෙන් භවාස්‍රවය වෙයි. පරාමාසකාය ග්‍රන්ථයෙන් දෘෂ්ටි – ආස්‍රවය වෙයි. ඉදංසත්‍යාභිනිවෙසකායග්‍රන්ථයෙන් අවිද්‍යාස්‍රවය වේ.

ඒ සතර ආස්‍රවයෝ විපුලබවට ගියාහු ඔඝයෝ වෙති : එයින් ' ඔඝයෝ ' යයි කියනු ලැබෙත්. එහි කාමාසවය කාමොඝ යැ, භවාසවය භවොඝ යැ, අවිජ්ජාසවය අවිද්‍යොඝ යැ, දිට්ඨාසවය දෘෂ්ටි - ඔඝ යි.

ඒ සතර ඔඝයෝ ආසයට පැමිණියාහු අනුසහගත වූවාහු ළෙහි ගැවී සිටුනාහු ශල්‍යයෝ යයි කියනු ලැබෙත්. එහි කාමොඝය රාගශල්‍ය යැ, භවොඝය දෙසශල්‍ය යැ, අවිද්‍යොඝය මොහශල්‍ය යැ, දෘෂ්ටි - ඔඝය දෘෂ්ටිශල්‍ය යි.

මේ සතර ශල්‍යයන්ගෙන් මැඩගන්නාලද විඥනය රූප වෙදනා සඤ්ඤා සංඛාර යන සතර ධර්මයන්හි සිටීත්. මොහු සතර විඤ්ඤාණට්ඨිතිහු යි. එහි රාගශල්‍යයෙන් නන්දි සංඛ්‍යාත තෘෂ්ණායෙන් තෙත්කළ රූපයට පමුණුවන විඥනය සිටී. දෙසශල්‍යයෙන් වෙදනූපග වූ ද, මොහශල්‍යයෙන් සඤ්ඤූපග වූ ද, දෘෂ්ටිශල්‍යයෙන් තෘෂ්ණායෙන් තෙත් කළ සංඛාරූපග වූ විඥනය සිටී.

සතර විඥනස්ථිතීන් හේතු කොට ඡන්දයෙන් දෙසයෙන් භයින් මෝහයෙන් චතුර්විධ අගතියට යෙති, රාගය හෙතු කොට ඡන්දයෙන් අගතියට යෙයි, දෙසය හෙතු කොට ද්වෙෂයෙන් අගතියට යෙයි, මෝහය හෙතු කොට මෝහයෙන් අගතියට යෙයි, දෘෂ්ටිය හේතු කොට භයින් අගතියට යෙයි. මෙසේ මේ කර්මය ද මේ ක්ලේශයෝ ද වෙත්. මේ සංසාරයට හේතු යි.

එහි මේ සතර දිසාවෝ යැ : කබළිංකාරාහාර යැ අශුභයෙහි ශුභ යැ යන විපල්ලාස යැ කාමුපාදන යැ කාමයොග යැ අභිධ්‍යාකායග්‍රන්ථ යැ කාමාසව යැ කාමොඝ යැ රාග සල්ල යැ රූපූපගවිඤ්ඤාණට්ඨිති යැ ඡන්දයෙන් අගතිගමන යැ. මේ පළමුවන දිසාව යැ.

ඵස්සාහාර යැ දුඃඛහි සුව යැ යන විපල්ලාස යැ සීලබ්බතුපාදන යැ භවයොග යැ ව්‍යාපාදකායග්‍රන්ථ යැ භවාසව යැ භවඔඝ යැ දෙසසල්ල යැ වෙදනූපගවිඤ්ඤාණට්ඨිති යැ දෙසයෙන් අගතිගමන යැ. මේ දෙවැනි දිසාව යැ.

මනොසඤ්චෙතනාහාර යැ අනාත්මයෙහි ආත්ම යැ යන විපල්ලාස යැ දිට්ඨි-උපාදන යැ දිට්ඨියොග යැ පරාමාසකායග්‍රන්ථ යැ දිට්ඨාසව යැ දිට්ඨි - ඔඝ යැ දිට්ඨිසල්ල යැ සඤ්ඤූපග විඤ්ඤාණට්ඨිති යැ භයින් අගතියට යෑම යැ. මේ තෙවැනි දිසාව යැ.

විඤ්ඤාණාහාර යැ අනිත්‍යයෙහි නිත්‍ය යැ යන විපල්ලාස යැ අත්තවාදූපාදන යැ අවිජ්ජා යොග යැ ඉදංසච්චාභිනිවෙස කායග්‍රන්ථ යැ අවිජ්ජාසව යැ අවිජ්ජා - ඔඝ යැ මොහ සල්ල යැ සංඛාරූපග විඤ්ඤාණට්ඨිති යැ මොහයෙන් අගතිගමන යැ. මේ සතරවැනි දිසාව යි. මෙසේ මේ දස සූත්‍රයන්ගේ පළමුවන පදයෙන් ප්‍රථම දිශාව බැලීම වේ. මේ දිසාලොකනා යි කියනුලැබේ.

චතූහි විපල්ලාසෙහි අකුසලපක්ඛෙ දිසාවිලෝකනා කිලෙසං සංයොජෙත්වා අයං අකුසලපක්ඛෙ දිසාවිලොකනාය භූමි.

පඤ්චන්නං දසන්නං[1] සුත්තානං යානි පඨමානි පදානි ඉමෙසං ධම්මානං කො අත්ථො, එකො අත්ථො, බ්‍යඤ්ජනමෙව නානං. එවං දුතියා, එවං තතියා, එවං චතුත්ථී. අයං පඨමා සංසන්දනා. ඉමිනා පෙය්‍යාලෙන සබ්බෙ කිලෙසා චතූසු පදෙසු පක්ඛිපිතබ්බා.

තතො කුසලපක්ඛෙ චතස්සො පටිපදා, චත්තාරි ඣානානි, චත්තාරො සතිපට්ඨානා චත්තාරො විහාරා: දිබ්බො බ්‍රහ්මා අරියො ආනෙඤ්ජො, චත්තාරො සම්මප්පධානා, චත්තාරො අච්ඡරියා අබ්භුතධම්මා, චත්තාරො අධිට්ඨානා, චත්තාරො සමාධයො: ඡන්දසමාධි වීරියසමාධි චිත්තසමාධි වීමංසාසමාධි, චත්තාරො ධම්මා සුඛභාගියා නාඤ්ඤත්‍ර බොජ්ඣඞ්ගා නාඤ්ඤත්‍ර තපසා නාඤ්ඤත්‍රින්ද්‍රිය සංවරා නාඤ්ඤත්‍ර සබ්බනිස්සග්ගා චත්තාරි අප්පමාණානි.

තත්ථ දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා භාවියමානා බහුලීකරියමානා පඨමං ඣානං පරිපූරෙති, පඨමං ඣානං පරිපුණ්ණං පඨමං සතිපට්ඨානං පරිපූරෙති, පඨමං සතිපට්ඨානං පරිපුණ්ණං පඨමං විහාරං පරිපූරෙති, පඨමො විහාරො පරිපුණ්ණො, පඨමං සම්මප්පධානං පරිපූරෙති. පඨමං සම්මප්පධානං පරිපුණ්ණං පඨමං අච්ඡරියං අබ්භුතං ධම්මං පරිපූරෙති, පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො පරිපුණ්ණො පඨමං අධිට්ඨානං පරිපූරෙති.

පඨමං අධිට්ඨානං පරිපුණ්ණං ඡන්දසමාධිං පරිපූරෙති, ඡන්දසමාධි පරිපුණ්ණො ඉන්ද්‍රියසංවරං පරපූරෙති. ඉන්ද්‍රියසංවරො පරිපුණ්ණො පඨමං මෙත්තාඅප්පමාණං පරිපූරෙති. එවං යාව සබ්බනිස්සග්ගො චතුත්ථං අප්පමාණං පරිපූරෙති.

තත්ථ පඨමා ච පටිපදා පඨමං ච ඣානං පඨමං ච සතිපට්ඨානං පඨමො ච විහාරො පඨමං ච අප්පමාණං පඨමො ච අච්ඡරියො අබ්භුතො ධම්මො සච්චාධිට්ඨානං ච ඡන්දසමාධි ච ඉන්ද්‍රියසංවරො ච මෙත්තා ච අප්පමාණං, අයං පඨමාදිසා.

දුතියා ච පටිපදා[2] දුතියං ඣානං දුතියං ච සතිපට්ඨානං දුතියො ච විහාරො දුතියං ච සම්මප්පධානං දුතියො ච අච්ඡරියො අබ්භුතො ධම්මො චාගාධිට්ඨානං චිත්තසමාධි තපො ච[3] කරුණා ච අප්පමාණං. අයං දුතියා දිසා.

තතියා පටිපදා[4] තතියං ච ඣානං තතියං ච සතිපට්ඨානං තතියො ච විහාරො තතියං ච සම්මප්පධානං තතියො ච අච්ඡරියො අබ්භුතො ධම්මො පඤ්ඤාධිට්ඨානං ච විරියසමාධි ච බොජ්ඣඞ්ගා ච මුදිතා ච අප්පමාණං අයං තතියා දිසා.

---

1. පඤ්චදසන්නං – PTS.
2. දුක්ඛා ච පටිපදා ඛිප්පාභිඤ්ඤා – මජසං, PTS.
3. චත්තාරො ඉද්ධිපාදා – ම.
4. සුඛා ච පටිපදා දන්ධාභිඤ්ඤා – ම.

සතර විපල්ලාසයන්ගෙන් අකුශල පක්ෂයෙහි ක්ලේශ සංයොග කොට දිසා විලොකනය වේ. මේ අකුශල පක්ෂයෙහි දිසාවිලොකනයාගේ භූමි වේ.

පඤ්ච සූත්‍රයන්ගේ ද දස සූත්‍රයන්ගේ ද යම් පළමුවන පදකෙනෙක් වෙත් ද, මේ ධර්මයන් ගේ අර්ථ කවරෙ යැ : අර්ථය එකෙකි, ව්‍යඤ්ජනය මැ නානා වෙයි. දෙවන දිසාව ද තෙවන දිසාව ද සතරවන දිසාව ද මෙසේ යි. මේ පළමුවන සංසන්දනා යි. මේ පෙයාාල යෙන් සියලු ක්ලේශයෝ සතර පදයන්හි බහාලියැයුත්තාහු යි.

ඉක්බිති කුශලපක්ෂයෙහි සතර පටිපද යැ සතර ධ්‍යානයෝ යැ සතර සතිපට්ඨානයෝ යැ දිව්‍ය බ්‍රහ්ම ආර්‍ය්‍ය ආනෙඤ්ජ යන සතර විහරණයෝ යැ සතර සම්‍යක්ප්‍රධානයෝ යැ සතර අච්ඡරිය අබ්භුත ධර්මයෝ යැ සතර අධිෂ්ඨානයෝ යැ ඡන්දසමාධි විරියසමාධි චිත්ත සමාධි වීමංසාසමාධි යන සතර සමාධීහු යැ බොධ්‍යඞගයන්ගෙන් බැහැර තපසින් බැහැර ඉන්ද්‍රියසංවරයෙන් බැහැර සර්වනිස්සජනයෙන් බැහැර නො ලැබෙන සතර සුබභාගිය ධර්මයෝ යැ සතර අප්‍රාමණ්‍යයෝ යි.

එහි දුක්ඛපටිපද ඇති දන්ධාභිඤ්ඤාව වඩනුලබන්නී බහුල කරනුලබන්නී ප්‍රථමධ්‍යානය පරිපූර්ණ කෙරෙයි, ප්‍රථමධ්‍යානය පරිපූර්ණ වූයේ ප්‍රථම සතිපට්ඨානය පුරයි, පළමුවන සතිපට්ඨානය පරිපූර්ණ වූයේ ප්‍රථම විහරණය පුරයි. ප්‍රථම විහරණය පරිපූර්ණ වූයේ ප්‍රථම සම්‍යක්ප්‍රධානය පරිපූර්ණ කෙරෙයි, ප්‍රථම සම්‍යක්ප්‍රධානය පරිපූර්ණ වූයේ ප්‍රථම ආශ්චර්‍ය්‍ය අද්භුත ධර්මය පරිපූර්ණ කෙරෙයි, ප්‍රථම ආශ්චර්‍ය්‍ය අද්භුතධර්මය පරිපූර්ණ වූයේ ප්‍රථම අධිෂ්ඨානය පුරයි, ප්‍රථම අධිෂ්ඨානය පරිපූර්ණ වූයේ ඡන්දසමාධිය පුරයි, ඡන්දසමාධිය පිරුණේ ඉන්ද්‍රියසංවරය පුරයි, ඉන්ද්‍රියසංවරය පිරුණේ ප්‍රථම මෛත්‍රී අප්‍රාමාණ්‍යය පරිපූර්ණ කෙරෙයි. මෙසේ සබ්බනිස්සග්ගය දක්වා සතරවැනි අප්‍රාමාණ්‍යය පරිපූර්ණ කෙරේ.

එහි ප්‍රථම ප්‍රතිපද යැ ප්‍රථමධ්‍යාන යැ පළමුවන සතිපට්ඨාන යැ ප්‍රථම විහාර යැ ප්‍රථම අප්‍රාමාණ්‍ය යැ ප්‍රථම ආශ්චර්‍ය්‍ය අද්භූතධර්ම යැ සත්‍යාධිෂ්ඨාන යැ ඡන්දසමාධි යැ ඉන්ද්‍රිය සංවර යැ මෛත්‍රීඅප්‍රාමණ්‍ය යැ යන මේ පළමුවන දිසාව යැ.

ද්විතීය ප්‍රතිපද යැ ද්විතීයධ්‍යාන යැ දෙවැනි සතිපට්ඨාන යැ ද්විතීය විහාර යැ දෙවැනි සම්‍යක්ප්‍රධාන යැ දෙවැනි ආශ්චර්‍ය්‍ය අද්භුතධර්ම යැ ත්‍යාගාධිෂ්ඨාන යැ චිත්තසමාධි යැ (ඉද්ධිපාදසංඛ්‍යාත) තපස යැ කරුණා අප්‍රාමාණ්‍ය යැ යන මේ දෙවැනි දිසාව යැ.

තෘතීය ප්‍රතිපදව යැ තෘතීයධ්‍යාන යැ තෙවැනි සතිපට්ඨාන යැ තෙවැනි විහාර යැ තෙවැනි සම්‍යක්ප්‍රධාන යැ තෙවැනි ආශ්චර්‍ය්‍ය අද්භුතධර්ම යැ ප්‍රඥාධිෂ්ඨාන යැ වීර්‍ය්‍යසමාධි යැ බොධ්‍යඞගයෝ යැ මුදිතා අප්‍රාමාණ්‍ය යැ යන මේ තෙවැනි දිසාව යැ.

චතුත්ථා ච පටිපදා[1] චතුත්ථං ඣානං චතුත්ථං ච සතිපට්ඨානං චතුත්ථො ච විහාරො චතුත්ථං ච සම්මප්පධානං චතුත්ථො ච අච්ඡරියො අබ්භුතො ධම්මො උපසමාධිට්ඨානං ච වීමංසාසමාධි ච සබ්බනිස්සග්ගො ච උපෙක්ඛා අප්පමාණං ච අයං චතුත්ථා[2] දිසා ඉමාසං චතස්සන්නං දිසානං ආලොකනා. අයං වුච්චති දිසාලොකනො නාම නයො.

තත්‍ථායං යොජනා : චත්තාරො ච ආහාරා, චත්තාරො ච පටිපදා, චත්තාරො ච විපල්ලාසා, චත්තාරො ච සතිපට්ඨානා, චත්තාරි ච උපාදානානි, චත්තාරි ච ඣානානි, චත්තාරො ච යොගා, විහාරා ච, ගන්ථා ච, සම්මප්පධානා ච, ආසවා ච අච්ඡරියා අබ්භුතා ධම්මා ච, ඔඝා ච, අධිට්ඨානානි ච, සල්ලා ච, සමාධයො, විඤ්ඤාණට්ඨිතියො, චත්තාරො ච සුඛභාගියා ධම්මා, චත්තාරි ච අගතිගමනානි, චත්තාරි ච අප්පමාණානි ඉති කුසලාකුසලානං පටිපක්ඛවසෙන යොජනා. අයං වුච්චති දිසාලොකනො නයො.

තස්ස චත්තාරි සාමඤ්ඤඵලානි පරියොසානං යො ච ධම්මො කුසලාකුසලනිද්දෙසෙ පඨමො දිසානිද්දෙසො ඉමස්ස සොතාපත්තිඵලං පරියොසානං, දුතියං සකදාගාමිඵලං, තතියං අනාගාමිඵලං, චතුත්ථං අරහත්තඵලං.

තත්ථ කතමො තිපුක්ඛලො නයො : යෙ ච දුක්ඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය ඛිප්පාභිඤ්ඤාය ච නිය්‍යන්ති ද්වෙ පුග්ගලා, යෙ ච සුඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය ඛිප්පාභිඤ්ඤාය ච නිය්‍යන්ති ද්වෙ පුග්ගලා.

ඉමෙසං චතුන්නං පුග්ගලානං යො පුග්ගලො සුඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය නිය්‍යාති, යො ච පුග්ගලො දුක්ඛාය පටිපදාය ඛිප්පාභිඤ්ඤාය නිය්‍යාති, ඉමෙ ද්වෙ පුග්ගලා භවන්ති. තත්ථ යො සුඛාය පටිපදාය ඛිප්පාභිඤ්ඤාය නිය්‍යාති, අයං උග්ඝටිතඤ්ඤූ, යො පච්ඡිමො පුග්ගලො සාධාරණො, අයං විපඤ්චිතඤ්ඤූ 'යො පුග්ගලො දුක්ඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය නිය්‍යාති, අයං නෙය්‍යො. ඉමෙ චත්තාරො භවිත්වා තිණ්ණි හොන්ති. තත්ථ උග්ඝටිතඤ්ඤුස්ස සමථපුබ්බඞ්ගමා විපස්සනා, නෙය්‍යස්ස විපස්සනාපුබ්බඞ්ගමො සමථො, විපඤ්චිතඤ්ඤුස්ස සමථවිපස්සනා යුගනද්ධා.

උග්ඝටිතඤ්ඤුස්ස මුදුකා දෙසනා, නෙය්‍යස්ස තික්ඛා දෙසනා, විපඤ්චිතඤ්ඤුස්ස තික්ඛමුදුකා දෙසනා.

උග්ඝටිතඤ්ඤුස්ස අධිපඤ්ඤාසික්ඛා, නෙය්‍යස්ස අධිචිත්තසික්ඛා, විපඤ්චිතඤ්ඤුස්ස අධිසීලසික්ඛා ඉති ඉමෙසං පුග්ගලානං චතූහි පටිපදාහි නිය්‍යානං.

තත්‍ථ අයං සංකිලෙසො : තීණි අකුසලමූලානි, තයො එසනා, තිස්සො වෙදනා, තයො උපවිචාරා, තයො සංකිලෙසා, තයො විතක්කා, තයො පරිළාහා, තීණි සඞ්ඛතලක්ඛණානි, තිස්සො දුක්ඛතා.

1. සුඛා ච පටිපදා ඛිප්පාභිඤ්ඤා - මජ්ඣං, PTS.
2. චතුත්ථී - මජ්ඣං, PTS.

චතුර්ථ ප්‍රතිපදව යැ චතුර්ථධ්‍යාන යැ සතරවැනි සතිපට්ඨාන යැ සතරවැනි විහරණ යැ සතරවැනි සම්‍යක්ප්‍රධාන යැ සතරවැනි ආශ්චර්ය්‍ය අද්භූතධර්ම යැ උපසමාධිෂ්ඨාන යැ විමංසාසමාධි යැ සබ්බනිස්සග්ග යැ උපෙක්ෂා - අප්‍රාමාණ්‍ය යැ යන මේ සතරවැනි දිසාව යි, මේ සතර දිසාවන්ගේ අවලොකනය යි. මේ දිසාලොචනනය නමැයි කියනු ලැබේ.

එහි මේ යොජනා යැ : සතර ආහාරයෝ යැ සතර පටිපද යැ, සතර විපල්ලාසයෝ යැ සතර සතිපට්ඨානයෝ යැ, සතර උපාදානයෝ යැ සතර ධ්‍යානයෝ යැ, සතර යොගයෝ යැ සතර විහරණයෝ යැ, ග්‍රන්ථයෝ යැ සම්‍යක් ප්‍රධානයෝ යැ, ආස්‍රවයෝ යැ ආශ්චර්ය්‍ය අද්භූතධර්මයෝ යැ, ඔඝයෝ යැ අධිෂ්ඨානයෝ යැ, ශල්‍යයෝ යැ සමාධිහු යැ, විඤ්ඤාණට්ඨිතිහු යැ සතර සුඛභාගිය ධර්මයෝ යැ, සතර අගතිගමනයෝ යැ සතර අප්‍රාමාණ්‍යයෝ යැයි මෙසේ කුශලාකුශලයන්ට ප්‍රතිපක්ෂවශයෙන් යොජනා යි. මේ දිසාලොචනනය යි කියනුලැබේ.

සතර ශ්‍රාමණ්‍යඵලයෝ ඒ නයයාගේ පර්‍ය්‍යවසානය වෙයි. යම් ධර්මයෙක් කුශලාකුශල නිර්දෙශයෙහි ප්‍රථම දිසානිර්දෙශය වේ ද ස්‍රොතාපත්තිඵලය මේ නිර්දෙශයාගේ පර්යව සානය වෙයි, දෙවැන්න සකෘදගාමිඵල යැ, තෙවැන්න අනාගාමිඵල යැ, සතරවැන්න අර්හත්ඵල යි.

3. එහි තිපුක්ඛලනය කවරෙ යැ : යම් කෙනෙක් දුඃඛප්‍රතිපත්ඇති දන්ධාභිඥයෙන් ද ක්ෂිප්‍රාභිඥයෙන් ද නිර්‍ය්‍යාණය කෙරෙත් ද මේ පුද්ගලයෝ දෙදෙනෙකි. යම් කෙනෙක් සුඛප්‍රතිපත්ඇති දන්ධාභිඥයෙන් ද ක්ෂිප්‍රාභිඥයෙන් ද නිර්‍ය්‍යාණය කෙරෙත් ද මේ පුද්ගලයෝ දෙදෙනෙකි.

මේ සතර පුද්ගලයන් අතුරෙන් යම් පුද්ගලයෙක් සුඛ ප්‍රතිපත් ඇති දන්ධාභිඥයෙන් නිර්‍ය්‍යාණය කෙරේ ද යම් පුද්ගලයෙකුත් දුඃඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥයෙන් නිර්යාණය කෙරේ ද මොහු පුද්ගලයෝ දෙදෙනෙක් වෙති. එහි යමෙක් සුඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥයෙන් නික්මැයේ ද මේ තෙම උද්ඝටිතඥ යැ, සාධාරණ වූ යම් පශ්චිම පුද්ගලයෙක් වේ ද මේ විපඤ්චිතඥ යැ, යම් පුද්ගලයෙක් දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥයෙන් නික්මැයේ ද මේතෙම නෙය්‍ය යැ. මොහු සතරදෙනෙක් වැ තිදෙනෙක් වෙති. එහි උද්ඝටිතඥයාට සමථපූර්වඞ්ගම වූ විදර්ශනාව වෙයි, නෙය්‍යපුද්ගලයාහට විදර්ශනාපූර්වඞ්ගම සමථය වෙයි. විපඤ්චිතඥයාහට සමථ විදර්ශනා දෙක යුගනද්ධ වූවාහු වෙත්.

උද්ඝටිතඥ පුද්ගලහට මෘදු වූ දේශනාව වෙයි, නෙය්‍යපුද්ගලහට තියුණු දේශනාව වෙයි, විපඤ්චිතඥයාහට තියුණු මෘදු දේශනාව වේ.

උද්ඝටිතඥයාහට අධිප්‍රඥශික්ෂා යැ, නෙය්‍යපුද්ගලහට අධිචිත්තශික්ෂා යැ, විපඤ්චිතඥ පුද්ගලහට අධිශීලශික්ෂා යි. මෙසේ සතර ප්‍රතිපදයෙන් මේ පුද්ගලයන්ගේ නිර්යාණය වේ.

එහි මේ සංකිලෙස යැ : තුන් අකුශලමූලයෝ යැ තුන් ස්පර්ශයෝ යැ තුන් වෙදනා යැ තුන් උපවිචාරයෝ යැ තුන් සංක්ලෙශයෝ යැ තුන් විතර්කයෝ යැ තුන් පරිදහයෝ යැ තුන් සංඛත ලක්ෂණයෝ යැ තුන් දුඃඛතා යි.

තීණි අකුසලමූලානීති : ලොභො අකුසලමූලං, දොසො අකුසලමූලං මොහො අකුසලමූලං. තයො ඵස්සාති : සුඛවෙදනීයො ඵස්සො, දුක්ඛවෙදනීයො ඵස්සො, අදුක්ඛමසුඛවෙදනීයො ඵස්සො, තිස්සො වෙදනාති : සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා. තයො උපවිචාරාති : සොමනස්සොපවිචාරො, දොමනස්සොපවිචාරො, උපෙක්ඛාපවිචාරො. තයො සංකිලෙසාති ; රාගො, දොසො, මොහො. තයො විතක්කාති : කාමවිතක්කො ව්‍යාපාදවිතක්කො, විහිංසාවිතක්කො, තයො පරිළාහාති : රාගජො, දොසජො, මොහජො පරිළාහො. තීණි සඞ්ඛතලක්ඛණානීති : උප්පාදො, ඨිති, වයො. තිස්සො දුක්ඛතාති : දුක්ඛදුක්ඛතා, විපරිණාමදුක්ඛතා, සඞ්ඛාරදුක්ඛතා.[1]

තත්ථ ලොභො අකුසලමූලං කුතො සමුට්ඨිතං : තිවිධං ආරම්මණං, මනාපිකං අමනාපිකං උපෙක්ඛාට්ඨානියං ච. තත්ථ මනාපිකෙන ආරම්මණෙන ලොභො අකුසලමූලං සමුට්ඨහති. ඉති මනාපිකා ආරම්මණා සුඛවෙදනීයො ඵස්සො, සුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජතෙ සුඛවෙදනා, සුඛවෙදනං පටිච්ච උප්පජ්ජතෙ සොමනස්සූපවිචාරො, සොමනස්සූපවිචාරං පටිච්ච උප්පජ්ජතෙ රාගො රාගං පටිච්ච උප්පජ්ජතෙ කාමවිතක්කො, කාමවිතක්කං පටිච්ච උප්පජ්ජතෙ රාගජො පරිළාහො, රාගජං පරිළාහං පටිච්ච උප්පජ්ජතෙ උප්පාදො සඞ්ඛතලක්ඛණො, උප්පාදං සඞ්ඛතක්ඛණං පටිච්ච උප්පජ්ජතෙ විපරිණාමදුක්ඛතා.

දොසො අකුසලමූලං කුතො සමුට්ඨිතං : අමනාපිකෙන ආරම්මණෙන දොසො අකුසලමූලං සමුට්ඨිතං, ඉති අමනාපිකා ආරම්මණා දුක්ඛවෙදනීයො ඵස්සො, දුක්ඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජතෙ දුක්ඛවෙදනා දුක්ඛවෙදනං පටිච්ච උප්පජ්ජතෙ දොමනස්සූපවිචාරො, දොමනස්සපවිචාරං පටිච්ච උප්පජ්ජතෙ දොසො, දොසං පටිච්ච උප්පජ්ජතෙ බ්‍යාපාදවිතක්කො, බ්‍යාපාදවිතක්කං පටිච්ච උප්පජ්ජතෙ දොසජො පරිළාහො, දොසජං පරිළාහං පටිච්ච උප්පජ්ජතෙ ඨිතස්ස අඤ්ඤථත්තං සඞ්ඛතලක්ඛණං, ඨිතස්ස අඤ්ඤථත්තං සඞ්ඛතලක්ඛණං පටිච්ච උප්පජ්ජතෙ දුක්ඛදුක්ඛතා.[2]

මොහො අකුසලමූලං කුතො සමුට්ඨිතං : උපෙක්ඛාට්ඨානියෙන ආරම්මණෙන මොහො අකුසලමූලං සමුට්ඨිතං, ඉති උපෙක්ඛාට්ඨානියා ආරම්මණා අදුක්ඛමසුඛවෙදනීයො ඵස්සො, අදුක්ඛමසුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජතෙ අදුක්ඛමසුඛා වෙදනා, අදුක්ඛමසුඛං වෙදනං පටිච්ච උප්පජ්ජතෙ උපෙක්ඛූපවිචාරො, උපෙක්ඛූපවිචාරං පටිච්ච උප්පජ්ජතෙ මොහො, මොහං පටිච්ච උප්පජ්ජතෙ විහිංසාවිතක්කො, විහිංසාවිතක්කං පටිච්ච උප්පජ්ජතෙ මොහජො පරිළාහො, මොහජං පරිළාහං පටිච්ච උප්පජ්ජතෙ වයො සඞ්ඛතලක්ඛණං, වයං සඞ්ඛතලක්ඛණං, පටිච්ච උප්පජ්ජතෙ සඞ්ඛාර[3]දුක්ඛතා, ඉති අයං තිණ්ණං කිලෙසානං නිද්දෙසො. අයං වුච්චතෙ අකුසලපක්ඛෙ[4] තිපුක්ඛලො නයො.

1. සඞ්ඛතදුක්ඛතා - මජසං, PTS.
2. දුක්ඛදුක්ඛතා වෙදනා - මජසං, PTS.
3. සඞ්ඛත - මජසං, PTS.
4. කුසලපක්ඛෙ - මජසං, PTS.

තුන් අකුශලමූල යනු : ලොභඅකුශලමූල යැ ද්වෙෂඅකුශලමූල යැ මොහඅකුශල මූල යි. තුන් ස්පර්ශ යනු : සුඛවෙදනීය ස්පර්ශ යැ දුඃඛවෙදනීය ස්පර්ශ යැ අදුක්ඛම සුඛවෙදනීය ස්පර්ශ යි. තුන් වෙදනා යනු : සුඛවෙදනා යැ දුක්ඛවෙදනා යැ අදුක්ඛම-සුඛවෙදනා යි. තුන් උපවිචාර යනු : සොමනස්ස - උපවිචාර යැ දොමනස්ස - උප විචාර යැ උපෙක්ඛා - උපවිචාර යි. තුන් සංකිලෙස යනු : රාග යැ දෙස යැ මොහ යි. තුන් විතර්ක යනු : කාමවිතර්ක යැ ව්‍යාපාදවිතර්ක යැ විහිංසා විතර්ක යි. තුන් පරිදහ යනු : රාගජ ද්වෙෂජ මොහජ - පරිදහ යි. තුන් සංඛත ලක්ෂණ යනු : උත්පාද යැ ස්ථිති යැ ව්‍යය යයි. තුන් දුඃඛතා යනු : දුක්ඛදුක්ඛතා යැ විපරිණාමදුක්ඛතා යැ සංඛාර දුක්ඛතා යි.

එහි ලොභඅකුසලමූලය කොයින් උපන්නේ ද යත් : ආලම්බනය ත්‍රිවිධ යැ : මනාපික යැ අමනාපික යැ උපෙක්ෂාස්ථානීය දයි. එහි මනාපික ආලම්බනයෙන් ලොභ අකුශලමූලය උපදී, මෙසේ මනාපික වූ ආලම්බනයෙන් සුඛවෙදනීය ස්පර්ශය වෙයි, සුඛවෙදනීය පහස නිසා සුඛවෙදනාව උපදී, සුඛවෙදනාව නිසා සොමනස්සූපවිචාරය උපදී. සොමනස්සූපවිචාරය නිසා රාගය උපදී. රාගය නිසා කාමවිතර්කය උපදී. කාම විතර්තය නිසා රාගජපරිදහය උපදී. රාගජපරිදහය නිසා උත්පාද සංඛතලක්ෂණය උපදී. උත්පාදසංඛතලක්ෂණය නිසා විපරිණාමදුක්ඛතාව උපදී.

ද්වෙශඅකුශලමූලය කොයින් උපන යත් : අමනාපික වූ ආලම්බනයෙන් දෙසඅකුසල මූලය උපන, මෙසේ අමනාපික වූ ආලම්බනයෙන් දුක්ඛවෙදනීය පහස වෙයි, දුක්ඛ වෙදනීය ඵස්සය නිසා දුක්ඛවෙදනාව උපදී, දුක්ඛවෙදනාව නිසා දෙමනස්සූපවිචාරය උපදී, දෙමනස්සූපවිචාරය නිසා ද්වෙෂය උපදී, ද්වෙෂය නිසා ව්‍යාපාදවිතර්කය උපදී, ව්‍යාපාදවිතර්කය නිසා ද්වෙෂජ පරිදහය උපදී, ද්වෙෂජ පරිදහය නිසා සිටියහුගේ අන්‍යථාත්ව සංඛත ලක්ෂණය උපදී, සිටියහුගේ අන්‍යථාත්ව සංඛත ලක්ෂණය නිසා දුක්ඛදුක්ඛතාව උපදී.

මොහඅකුශලමූලය කොයින් උපන යත් : උපෙක්ෂාස්ථානීය වූ ආලම්බනයෙන් මොහඅකුශලමූලය උපන, මෙසේ උපෙක්ෂාවට කාරණ වූ ආලම්බනයෙන් අදුක්ඛමසුඛ වෙදනීය වූ ඵස්සය වෙයි, අදුක්ඛමසුඛවෙදනීය ඵස්සය නිසා අදුක්ඛමසුඛවෙදනාව උපදී, අදුක්ඛමසුඛවෙදනාව නිසා උපෙක්ඛා - උපවිචාරය උපදී, උපෙක්ඛා - උපවිචාරය නියා මොහය උපදී, මොහය නිසා විහිංසාවිතර්කය උපදී, විහිංසාවිතර්කය නිසා මොහජ පරිදහය උපදී, මොහජ පරිදහය නිසා වයසංඛතලක්ෂණය උපදී, වයසංඛත ලක්ෂණය නිසා සංඛාරදුක්ඛතාව උපදී. මෙසේ මෙ තුන් ක්ලෙශයන්ගේ නිර්දෙශ යි. මෙ අකුශලපක්ෂයෙහි තිපුක්ඛල නාය යී කියනු ලැබෙ.

ඉති තීණි අකුසලමූලානි ච චත්තාරි ච පඤ්චමානි, තයො එස්සාති : තිස්සො වෙදනා යාව සඞ්ඛාරදුක්ඛතාති[1] යො කොචි අකුසලපක්ඛො, සබ්බො සො තීසු අකුසලමූලෙසු සමොසරති.

තත්ථ කතමො කුසලපක්ඛො : තීණි කුසලමූලානි, තිස්සො පඤ්ඤා : සුතමයී පඤ්ඤා චින්තාමයී පඤ්ඤා භාවනාමයී පඤ්ඤා. තයො සමාධී : සවිතක්කසවිචාරො -පෙ- තිස්සො සික්ඛා : අධිසීලසික්ඛා -පෙ- තීණි නිමිත්තානි : සමථනිමිත්තං පග්ගහනිමිත්තං උපෙක්ඛානිමිත්තං, තයො විතක්කා : නෙක්ඛම්මවිතක්කො -පෙ- අවිහිංසාවිතක්කො, තීණි ඉන්ද්‍රියානි : අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියන්ති (විත්ථාරො) තයො උපවිචාරා : නෙක්ඛම්මූපවිචාරො අව්‍යාපාදූපවිචාරො අවිහිංසූපවිචාරො. තිස්සො එසනා : කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා, තයො ඛන්ධා : සීලක්ඛන්ධො සමාධික්ඛන්ධො පඤ්ඤාක්ඛන්ධො.

තත්ථ යං අලොභො කුසලමූලං, තං සුතමයිපඤ්ඤං පරිපූරෙති, සුතමයී පඤ්ඤා පරිපූරා සවිතක්කං සවිචාරං සමාධිං පරිපූරෙති, සවිතක්කො සවිචාරො සමාධි පරිපුණ්ණො අධිචිත්තසික්ඛං පරිපූරෙති, අධිචිත්තසික්ඛා පරිපුණ්ණා සමථනිමිත්තං පරිපූරෙති, සමථනිමිත්තං පරිපුණ්ණං නෙක්ඛම්මවිතක්කං පරිපූරෙති, නෙක්ඛම්මවිතක්කො පරිපුණ්ණො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං පරිපූරෙති, අනඤ්ඤාතඤ්ඤස්සා-මීතින්ද්‍රියං පරිපුණ්ණං නෙක්ඛම්මූපවිචාරං පරිපූරෙති, නෙක්ඛම්මූපවිචාරො පරිපුණ්ණො කාමෙසනං පජහති, කාමෙසනප්පහානං සමාධික්ඛන්ධං පරිපූරෙති.

අදොසො කුසලමූලං චින්තාමයිපඤ්ඤං පරිපූරෙති, චින්තාමයී පඤ්ඤා පරිපුණ්ණා අවිතක්කවිචාරමත්තං සමාධිං පරිපූරෙති, අවිතක්ක-විචාරමත්තො සමාධි පරිපුණ්ණො අධිසීලසික්ඛං පරිපූරෙති, අධිසීල-සික්ඛා පරිපුණ්ණා උපෙක්ඛානිමිත්තං පරිපූරෙති, උපෙක්ඛානිමිත්තං පරිපුණ්ණං අව්‍යාපාදවිතක්කං පරිපූරෙති, අව්‍යාපාදවිතක්කො පරිපුණ්ණො අඤ්ඤින්ද්‍රියං පරිපූරෙති, අඤ්ඤින්ද්‍රියං පරිපුණ්ණං අව්‍යාපාදූ-පවිචාරං පරිපූරෙති, අව්‍යාපාදූපවිචාරො පරිපුණ්ණො භවෙසනං පජහති, භවෙසනප්පහානං සීලක්ඛන්ධං පරිපූරෙති.

අමොහො කුසලමූලං භාවනාමයිපඤ්ඤං පරිපූරෙති, භාවනාමයී පඤ්ඤා පරිපුණ්ණා අවිතක්කඅවිචාරං සමාධිං පරිපූරෙති, අවිතක්කො අවිචාරො සමාධි පරිපුණ්ණො අධිපඤ්ඤාසික්ඛං පරිපූරෙති, අධිපඤ්ඤා-සික්ඛා පරිපුණ්ණා පග්ගහනිමිත්තං පරිපූරෙති, පග්ගහනිමිත්තං පරිපුණ්ණං අඤ්ඤාතාවිනො ඉන්ද්‍රියං පරිපූරෙති, අඤ්ඤාතාවිනො ඉන්ද්‍රියං පරිපුණ්ණං අවිහිංසූපවිචාරං පරිපූරෙති, අවිහිංසූපවිචාරො පරිපුණ්ණො බ්‍රහ්මචරියෙසනං පරිපූරෙති, බ්‍රහ්මචරියෙසනා පරිපුණ්ණා පඤ්ඤාක්ඛන්ධං පරිපූරෙති.

ඉති ඉමෙ තයො ධම්මා කුසලපක්ඛිකා, සබ්බෙ කුසලා ධම්මා තිහි තිකනිද්දෙසෙහි නිද්දිසීයන්ති, තීණි විමොක්ඛමුඛානි තස්ස පරියොසානං. තත්ථ පඨමෙන අප්පණිහිතං[2] දුතියෙන සුඤ්ඤතං. තතියෙන අනිමිත්තං.[3] අයං වුච්චති දුතියො තිපුක්ඛලො නාම නයො.

---

1. සඞ්ඛතදුක්ඛතා – මජසං, PTS. 2. අප්පණිහිතෙන – PTS.
3. – තෙන – PTS.

මෙසේ අකුශලමූලයෝ තිදෙනෙක් වෙති, සතරක් නොවේ පස්වැන්නෙකුත් නැති. 'තයො ඵස්සා' යනු : තුන් වේදනා පටන් 'සඞ්ඛාර දුක්ඛතා' යනු දක්වා යම් කිසි අකුශලපක්ෂයෙක් වේ ද ඒ සියල්ල තුන් අකුශලමූලයන්හි සමොසරණය වේ.

එහි කුශලපක්ෂය කවරෙ යත් : කුශලමූලයෝ තිදෙනෙක් වෙති, සුතමයී පඤ්ඤා යැ චින්තාමයී පඤ්ඤා යැ භාවනාමයී පඤ්ඤා යැයි ප්‍රඥ තුනෙකි, සවිතක්කසවිචාර යැ . . . . සමාධි තුනෙකි, අධිසීලසික්ඛා යැ . . . . ශික්ෂා තුනෙකි, සමථනිමිත්ත යැ පග්ගහනිමිත්ත යැ උපෙක්ඛානිමිත්ත යැයි නිමිති තුනෙකි, නෙක්ඛම්මවිතක්ක යැ . . . . අවිහිංසාවිතක්ක යැයි විතර්කයෝ තිදෙනෙක් වෙති. ඉන්ද්‍රියයෝ තිදෙනෙකි : අනඤ්ඤා තඤ්ඤස්සාමීතින්ද්‍රිය යැයි (විස්තර වෙයි.) නෙක්ඛම්මූපවිචාර යැ අව්‍යාපාදූපවිචාර යැ විහිංසූපවිචාර යැයි උපවිචාරයෝ තිදෙනෙකි, කාමෙසනා භවේසනා බ්‍රහ්මචරියෙසනා යී එසනා තුනෙකි, සීලක්ඛන්ධ යැ සමාධික්ඛන්ධ යැ පඤ්ඤාක්ඛන්ධ යැයි ස්කන්ධයෝ තිදෙනෙක් වෙත්.

එහි යම් අලොභකුශලමූලයෙක් වේ ද එය සුතමයී ප්‍රඥව පුරාලයි, සුතමයී පඤ්ඤව පරිපූර්ණ වූවා සවිතර්ක සවිචාරසමාධිය පුරයි. සවිතර්කසවිචාර සමාධිය පරිපූර්ණ වූයේ අධිචිත්ත ශික්ෂාව, පුරාලයි, අධිචිත්ත ශික්ෂාව පරිපූර්ණ වූවා සමථනිමිත්ත පුරයි. සමථනිමිත්ත පරිපූර්ණ වූයේ නෛෂ්ක්‍රම්‍යවිතර්කය පුරයි. නෛෂ්ක්‍රම්‍යවිතර්කය පරිපූර්ණ වූයේ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය පුරයි. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය පරිපූර්ණ වූයේ නෙක්ඛම්මූපවිචාරය පරිපූර්ණ කෙරෙයි. නෙක්ඛම්මූපවිචාරය පරිපූර්ණ වූයේ කාමෙසනාව දුරුකෙරෙයි, කාමෙෂණප්‍රහාණය සමාධිස්කන්ධය පරිපූර්ණ කෙරෙයි.

අදෙසකුසලමූලය චින්තාමයී ප්‍රඥව පුරයි. චින්තාමයී ප්‍රඥව පරිපූර්ණ වූවා අවිතර්ක විචාරමාත්‍ර වූ සමාධිය පුරයි. අවිතර්කවිචාරමාත්‍ර සමාධිය පරිපූර්ණ වූයේ අධිශීලශික්ෂාව පුරයි. අධිශීලශික්ෂාව පරිපූර්ණ වූවා උපෙක්ෂානිමිත්ත පුරයි. උපෙක්ෂානිමිත්ත පරිපූර්ණ වූයේ අව්‍යාපාදවිතර්කය පුරයි. අව්‍යාපාදවිතර්කය පරිපූර්ණ වූයේ අඤ්ඤින්ද්‍රිය පුරයි. අඤ්ඤින්ද්‍රිය පරිපූර්ණ වූයේ අව්‍යාපාදූපවිචාරය පරිපූර්ණ කෙරෙයි. අව්‍යාපාදූප විචාරය පරිපූර්ණ වූයේ භවෙසනය දුරුකෙරෙයි. භවෙෂණප්‍රහාණය ශීලස්කන්ධය පරිපූර්ණ කෙරෙයි.

අමොහකුශලමූලය භාවනාමයී ප්‍රඥව පරිපූර්ණ කෙරෙයි. භාවනාමයී ප්‍රඥව පරිපූර්ණ වූවා අවිතර්ක අවිචාරසමාධිය පුරයි. අවිතර්ක අවිචාර සමාධිය පරිපූර්ණ වූයේ අධි ප්‍රඥශික්ෂාව පුරයි. අධිප්‍රඥශික්ෂාව පරිපූර්ණ වූවා ප්‍රග්‍රහනිමිත්ත පුරයි. ප්‍රග්‍රහනිමිත්ත පිරුණේ අඤ්ඤාතාවින්ද්‍රිය පුරයි. අඤ්ඤාතාවින්ද්‍රිය පරිපූර්ණ වූයේ අවිහිංසූපවිචාරය පුරයි. අවිහිංසූපවිචාරය පිරුණේ බ්‍රහ්මචරියෙසනාව පුරයි. බ්‍රහ්මචරියෙසනාව පරි පූර්ණ වූවා ප්‍රඥස්කන්ධය පරිපූර්ණ කෙරෙයි.

මෙසේ මේ තුන් ධර්මයෝ කුශලපක්ෂයෙහි වූවාහු යැ, සියලු කුශලධර්මයෝ තුන් වැදෑරුම් ත්‍රිකනිර්දේශයන්ගෙන් දක්වනු ලැබෙත්. තුන් විමොක්ෂමුඛයෝ ඔහුගේ පර්‍ය්‍යවසානය යි. එහි පළමුවැන්නෙන් අප්පණිහිත විමොක්ෂමුඛය වෙයි, දෙවැන්නෙන් සුඤ්ඤත යැ, තෙවැන්නෙන් අනිමිත්ත විමොක්ෂමුඛය වේ. මේ දෙවැනි තිපුක්ඛලනය නමැයි කියනු ලැබේ.

4. තත්ථ යෙ ඉමෙ[1] තයො පුග්ගලා: උග්ඝටිතඤ්ඤූ විපඤ්චිතඤ්ඤූ නෙය්‍යොති. ඉමෙසං තිණ්ණං පුග්ගලානං යෙ ච ද්වෙ[2] පුග්ගලා සුඛාය පටිපදාය ඛිප්පාභිඤ්ඤාය, සුඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය ච නිය්‍යන්ති, තෙ ද්වෙ පුග්ගලා. යෙ ච ද්වෙ පුග්ගලා දුක්ඛාය පටිපදාය ඛිප්පාභිඤ්ඤාය දුක්ඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය ච නිය්‍යන්ති, ඉමෙ චත්තාරො තෙන විසෙසෙන ද්වෙ භවන්ති: දිට්ඨිචරිතො ච තණ්හාචරිතො ච. ඉමෙ චත්තාරො භවිත්වා තයො භවන්ති, තයො භවිත්වා ද්වෙ භවන්ති. ඉමෙසං ද්වින්නං පුග්ගලානං අයං සංකිලෙසො: අවිජ්ජා ච තණ්හා ච, අහිරිකං ච අනොත්තප්පං ච, අසති ච අසම්පජඤ්ඤං ච, නීවරණානි ච සංයොජනානි ච, අජ්ඣොසානං ච අභිනිවෙසො ච, අහඞ්කාරො ච මමඞ්කාරො ච, අස්සද්ධියං ච දොවචස්සං ච, කොසජ්ජං ච අයොනිසො ච මනසිකාරො, විචිකිච්ඡා ච අභිජ්ඣා ච, අසද්ධම්මසවනං ච අසමාපත්ති ච.

තත්ථ අවිජ්ජා ච අහිරිකං ච අසති ච නීවරණානි ච අජ්ඣොසානං ච අහඞ්කාරො ච අස්සද්ධියං ච කොසජ්ජං ච විචිකිච්ඡා ච අසද්ධම්මසවනං ච. අයං එකා දිසා.

තණ්හා ච අනොත්තප්පං ච අසම්පජඤ්ඤං ච සංයොජනානි ච අභිනිවෙසො ච මමඞ්කාරො ච දොවචස්සතා ච අයොනිසො මනසිකාරො ච අභිජ්ඣා ච අසමාපත්ති ච. අයං දුතියා දිසා.

දසන්නං සුත්තානං දස පදානි පඨමානි කාතබ්බානි. සඞ්ඛිත්තෙන අත්ථං ඤාපෙන්ති පටිපක්ඛ කණ්හපක්ඛස්ස සබ්බෙසං සුත්තානං දස පදානි දුතියකානි. අයං දුතියා දිසා.

ඉති අකුසලානං ධම්මානං දුක්ඛනිද්දෙසො, අයං සමුදයො. යං තං ධම්මං අජ්ඣාවසති නාමං ච රූපං ච ඉදං දුක්ඛං. ඉති අයං ච සමුදයො, ඉදං ච දුක්ඛං ඉමානි ද්වෙ සච්චානි දුක්ඛං ච සමුදයො ච. නන්දියාවට්ටස්ස නයස්ස පඨමනිද්දෙසො

තත්ථ කතමො කුසලපක්ඛො: සමථො ච විපස්සනා ච, විජ්ජා ච චරණං ච, සති ච සම්පජඤ්ඤං ච, හිරි ච[3] ඔත්තප්පං ච අහඞ්කාරප්පහානං ච මමඞ්කාරප්පහානං ච, සම්මාවායාමො ච යොනිසො ච මනසිකාරො, සම්මාසති ච සම්මාසමාධි ච, පඤ්ඤා ච නිබ්බිදා ච, සමාපත්ති ච සද්ධම්මසවනං[4] ච, සොමනස්සං ච ධම්මානුධම්මපටිපත්ති ච.

තත්ථ සමථො ච විජ්ජා ච සති ච හිරි ච අහඞ්කාරප්පහානං ච සම්මාවායාමො ච සම්මාසති ච පඤ්ඤා ච සමාපත්ති ච සොමනස්සං ච ඉමෙ ධම්මා එකා දිසා.

විපස්සනා ච චරණං ච සම්පජඤ්ඤං ච ඔත්තප්පං ච මමඞ්කාරප්පහානං ච යොනිසො මනසිකාරො ච සම්මාසමාධි ච නිබ්බිදා ච සද්ධම්මසවනං ච ධම්මානුධම්මපටිපත්ති ච අයං දුතියා දිසා. ඉති කුසලපක්ඛො ච අකුසලපක්ඛො ච නන්දියාවට්ටස්ස පන නයස්ස චතස්සො දිසා.

1. යො ඉමෙ - PTS.
2. යෙ ච ඉමෙ - PTS.
3. හිරි ච - මජසං, PTS.
4. සද්ධම්මස්සවනං - මජසං.

4. එහි උග්ඝටිතඥ්ඥ යැ විපඤ්චිතඥ්ඥ යැ නෙයය යැ යන යම් මේ තුන් පුද්ගල කෙනෙක් වෙත් ද, මේ තුන් පුද්ගලයන් අතුරෙන් යම් පුද්ගලයෝ දෙදෙනෙක් සුඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥයෙන් ද, සුඛප්‍රතිපත් ඇති දන්ධාභිඥයෙන් ද නිර්යාණය කෙරෙත් ද ඔහු පුද්ගලයෝ දෙදෙනෙකි, යම් පුද්ගලයෝ දෙදෙනෙක් දුඃඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥයෙන් ද දුඃඛප්‍රතිපත් ඇති දන්ධාභිඥයෙන් ද නික්මැයෙත් ද මේ සතරදෙන එකී විශෙෂය හේතු කොටගෙන දිට්ඨිචරිත ද තණ්හාචරිත දැයි දෙදෙනෙක් වෙති. මොහු සතරදෙනෙක් වී තිදෙනෙක් වෙති, තිදෙනෙක් වී දෙදෙනෙක් වෙත්. මේ පුද්ගලයන් දෙදෙනාගේ මේ සංක්ලෙශ යැ : අවිජ්ජා තණ්හා ද, අහිරික අනොත්තප්ප ද, අසති අසම්පජඤ්ඤ ද, නීවරණ සංයොජනයෝ ද, අජ්ඣොසාන අභිනිවෙස ද, අහංකාර මමංකාර ද, අස්සද්ධිය දෙවචස්සතා ද, කොසජ්ජ අයොනිසො මනසිකාර ද, විචිකිච්ඡා අභිජ්ඣා ද, අසද්ධම්ම-සවන අසමාපත්ති ද යන මොහු යි.

එහි අවිද්‍යා යැ අහිරික යැ අසති යැ නීවරණ යැ අධ්‍යවසාන යැ අහංකාර යැ අස්සද්ධිය යැ කෞසීද්‍ය යැ විචිකිත්සා යැ අසද්ධර්මශ්‍රවණ යැ යන මේ එක් දිශායෙකි.

තෘෂ්ණා යැ අනොත්තප්ප යැ අසම්පජඤ්ඤ යැ සංයොජන යැ අභිනිවෙශ යැ මමංකාර යැ දුර්වචතා යැ අයොනිසොමනසිකාර යැ අභිධ්‍යා යැ අසමාපත්ති යැ යන මේ දෙවැනි දිසාව යි.

දසවිධ ද්‍රිකයන් අතුරෙහි පළමුවන දසපදයෝ කියැයුත්තාහ, (සංඛිත්තෙන අත්ථං ඤාපෙන්ති පටිපක්ඛෙ කණ්හපක්ඛස්ස ?) සියලු ද්‍රිකයන්ගේ යම් දෙවැනි දසපදයෝ වෙත් ද, මේ දෙවැනි දිසාව යි.

මෙසේ අකුශලධර්මයන්ගේ දුඃඛනිර්දේශය වෙයි. මේ සමුදය යැ. නාමයත් රූපයත් යම් ධර්මයෙක්හි පිවිසැගෙන සිටී ද, මේ ද්‍රික යැ. මෙසේ මේ සමුදය ද, මේ ද්‍රික ද වෙයි. මොහු දුක්ඛ යැ සමුදය යැ යන සත්‍යයෝ දෙදෙනා වෙත්. නන්දියාවට්ටනයාගේ ප්‍රථම නිර්දේශ යි.

එහි කුශලපක්ෂය කවරෙ යත් : සමථ යැ විදර්ශනා යැ විද්‍යා යැ චරණ යැ ස්මෘති යැ සම්ප්‍රජන්‍ය යැ හිරි යැ ඔත්තප්ප යැ අහංකාරප්‍රහාණ යැ මමංකාරප්‍රහාණ යැ සම්මා වායාම යැ යොනිසො මනසිකාර යැ සම්මාසති යැ සම්මාසමාධි යැ ප්‍රඥා යැ නිබ්බිද යැ සමාපත්ති යැ සද්ධර්මශ්‍රවණ යැ සෞමනස්‍ය යැ ධර්මානුධර්මප්‍රතිපත්ති ද වේ.

එහි සමථ යැ විද්‍යා යැ සති යැ හිරි යැ අහංකාරප්‍රහාණ යැ සම්‍යග්ව්‍යායාම යැ සම්‍යක් ස්මෘති යැ ප්‍රඥා යැ සමාපත්ති යැ සෞමනස්‍ය යැ යන මේ ධර්මයෝ එක් දිසායෙකි.

විදර්ශනා යැ චරණ යැ සම්ප්‍රජන්‍ය යැ ඔත්තප්ප යැ මමංකාරප්‍රහාණ යැ යොනිසොමනසිකාර යැ සම්‍යක්සමාධි යැ නිබ්බිද යැ සද්ධර්මශ්‍රවණ යැ ධර්මානුධර්මප්‍රතිපත්ති යැ යන මේ දෙවැනි දිසාව යැ. මෙසේ කුශලපක්ෂයෙහි ද අකුශලපක්ෂයෙහි ද නන්දියාවට්ටනයාගේ සතර දිසාවෝ වෙත්.

තාසු යානි අකුසලපක්ඛස්ස පඨමානි පදානි අකුසලානි කුසලෙහි පහානං ගච්ඡන්ති, තානි කුසලපක්ඛෙ දුතියෙහි දුතියෙහි පදෙහි පහානං ගච්ඡන්ති. තෙසං පහානා රාගවිරාගා චෙතොවිමුත්ති, යානි අකුසලපක්ඛස්ස දුතියානි අකුසලපදානි පහානං ගච්ඡන්ති, තානි කුසලපක්ඛස්ස පඨමෙහි පදෙහි පහානං ගච්ඡන්ති. තෙසං පහානා අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්ති පරියොසානං. ඉමෙසං තිණ්ණං නයානං පඨමො නයො සීහවික්කීළිතො නාම.

5. අට්ඨ පදානි චත්තාරි ච කුසලානි චත්තාරි ච අකුසලානි ඉමානි අට්ඨ පදානි මූලපදානි, අත්ථනයෙන දුතියො තිපුක්ඛලො. සො ඡහි ධම්මෙහි නෙති, කුසලමූලානි ච නෙති, අකුසලමූලානි ච. ඉති ඉමානි ඡ පදානි පුරිමකානි ච අට්ඨ මූලපදානි ඉමානි චුද්දස පදානි අට්ඨාරසන්නං මූලපදානං. තත්ථ යො පච්ඡිමකො නයො නන්දියාවට්ටො සො චතූහි ධම්මෙහි නෙති අවිජ්ජාය ච තණ්හාය ච සමථෙන ච විපස්සනාය ච. ඉමෙ චත්තාරො ධම්මා, ඉමානි අට්ඨාරස මූලපදානි තීසු නයෙසු නිද්දිට්ඨානි.

තත්ථ යානි නව පදානි කුසලානි, තත්ථ සබ්බං කුසලං සමොසරති. තෙසං ච නවන්නං පදානං චත්තාරි පදානි සීහවික්කීළිතනයෙ තීණි තිපුක්ඛලෙ ද්වෙ නන්දියාවට්ටෙ. කුසලස්ස පක්ඛා. තත්ථ යානි නව පදානි කුසලානි තත්ථ සබ්බං කුසලං යුජ්ජති. තත්ථ සීහවික්කීළිතෙ නයෙ චත්තාරි පදානි, තීණි තිපුක්ඛලෙ, ද්වෙ නන්දියාවට්ටෙ. ඉමානි නව පදානි කුසලානි නිද්දිට්ඨානි.

තත්ථ යානි නන්දියාවට්ට නයෙ චත්තාරි පදානි, තත්ථ අට්ඨාරස මූලපදානි, සමොසරන්ති, යථා කථං: සමථො ච අලොභො ච අදොසො ච අසුභසඤ්ඤා ච දුක්ඛසඤ්ඤා ච ඉමානි කුසලපක්ඛෙ පඤ්ච පදානි සමථං භජන්ති. විපස්සනා ච අමොහො ච අනිච්චසඤ්ඤා ච අනත්තසඤ්ඤා ච ඉමානි චත්තාරි පදානි විපස්සනං භජන්ති. ඉමානි නව පදානි කුසලානි ද්වීසු පදෙසු යොජිතානි.

තත්ථ අකුසලපක්ඛෙ නවන්නං අකුසලපදානං යා ච තණ්හා යො ච ලොභො යො ච දොසො යා ච සුභසඤ්ඤා යා ච සුඛසඤ්ඤා, ඉමානි පඤ්ච පදානි තණ්හං භජන්ති. යා ච අවිජ්ජා යො ච මොහො යා ච නිච්චසඤ්ඤා යා ච අත්තසඤ්ඤා, ඉමානි චත්තාරි පදානි අවිජ්ජං භජන්ති. එතානි නව පදානි අකුසලානි සුසඛිතතානි. ඉති තයො නයා එකං නයං න පවිට්ඨා. එවං අට්ඨාරස මූලපදානි නන්දියාවට්ටනයෙ නිද්දිසිතබ්බානි.

6. කථං අට්ඨාරස මූලපදානි තිපුක්ඛලෙ නයෙ යුජ්ජන්ති: නවන්නං පදානං කුසලානං විපස්සනා ච අමොහො ච අනිච්චසඤ්ඤා ච අනත්තසඤ්ඤා ච ඉමානි චත්තාරි පදානි. අමොහො (?) ච සමථො ච අලොභො ච අසුභසඤ්ඤා ච ඉමානි චත්තාරි පදානි. ලොභො ච දොසො ච එවං ඉමානි නව පදානි තීසු කුසලෙසු යොජෙතබ්බානි.

තත්ථ නවන්නං පදානං අකුසලානං තණ්හා ච ලොභො ච සුභසඤ්ඤා ච සුඛසඤ්ඤා ච ඉමානි චත්තාරි පදානි ලොභො අකුසලමූලානං.

ඔවුන් කෙරෙහි අකුශලපක්ෂයාගේ යම් පළමුවැනි අකුශලපදකෙනෙක් කුශලයන්ගෙන් ප්‍රහාණයට යෙත් ද, ඔහු කුශලපක්ෂයෙහි දෙවැනි දෙවැනි පදයන්ගෙන් ප්‍රහාණයට යෙති, ඔවුන්ගේ ප්‍රහාණයෙන් රාගවිරාගචෙතොවිමුත්තිය වේ. අකුශලපක්ෂයාගේ යම් දෙවැනි අකුශල පදකෙනෙක් ප්‍රහාණයට යෙත් ද, ඔවුන්ගේ ප්‍රහාණයෙන් අවිද්‍යාවිරාගපඤ්ඤා විමුත්තිය පයඵ්වසානය වේ. මේ තුන් නය සීහවික්කීළිත නම් පළමුවැනි නය යි.

5. කුශලපද සතරක් ද අකුශලපද සතරක් දැයි පද අටක් වෙති. මේ අට පදයෝ මූලපද වෙත්. අර්ථනය විසින් දෙවැනි වූයේ තිපුක්ඛල නය යැ, එය ධර්ම සයකින් කුශලමූලයන් ද අකුශලමූලයන් ද පමුණුවයි. මෙසේ මේ ෂට්පදයෝ ද පළමු කී අෂ්ටමූල පදයෝ ද යන මේ තුදුස් පදයෝ අටළොස් මූලපදයන් අතුරෙහි වෙති. එහි පශ්චිම වූ යම් නන්දිවට්ටනයෙක් වේ ද එය අවිද්‍යා තෘෂ්ණා සමථ විදර්ශනා යන සතර ධර්මයෙන් නයනය කෙරෙයි. මේ සතර ධර්මයෝ යැ, මේ අටළොස් මූලපදයෝ තුන් නයෙහි දක්වන ලද්දහු යි.

එහි යම් කුශල නවපදකෙනෙක් වෙත් ද එහි සියලු කුශලය බැසගනී. ඒ නවපදයන් අතුරෙහිදු සතර පදයෙක් සීහවික්කීළිතනයෙහි යැ, තිපුක්ඛලයෙහි පද තුනෙකි, නන්දියා වට්ටයෙහි පද දෙනෙකි. මේ කුශල නව පදයෝ දක්වනලද්දහුය.

එහි නන්දියාවට්ටනයෙහි යම් සතර පදකෙනෙක් වෙත් ද, එහි අටළොස් මූලපදයෝ මුළු වෙති, කිසෙයැ යත්: සමථ යැ අලොභ යැ අදෙස යැ අසුභසඤ්ඤා යැ දුක්ඛසඤ්ඤා යැ යන මේ කුශලපක්ෂයෙහි පඤ්චපදයෝ සමථය භජනය කෙරෙති. විපස්සනා යැ අමොහ යැ අනිච්චසඤ්ඤා යැ අනත්තසඤ්ඤා යැ යන මේ සතරපදයෝ විදර්ශනාව බෙජෙති. මේ කුසල නවපදයෝ (සමථ විපස්සනා යන) දෙපදයෙහි යොදන ලද්දහුය.

එහි අකුශලපක්ෂයෙහි නව අකුශලපදයන් අතුරෙන් තණ්හා යැ ලොභ යැ දෙස යැ සුභසඤ්ඤා යැ සුඛසඤ්ඤා යැ යන මේ පස් පදයෝ තෘෂ්ණාව බෙජෙති. අවිජ්ජා යැ මොහ යැ නිච්චසඤ්ඤා යැ අත්තසඤ්ඤා යැ යන මේ සතර පදයෝ අවිද්‍යාව බෙජෙති. තෙල අකුශල නවපදයෝ ඉතා සංක්ෂිප්ත කරනලද්දහු යැ. මෙසේ තුන් නය එක් නයකට පිවිසියාහු යි. මෙසේ අටළොස් මූලපදයෝ නන්දියාවට්ටනයෙහි ලා දක්වාලියැ යුත්තාහු යි.

6. අටළොස් මූලපදයෝ තිපුක්ඛලනයෙහි කිසෙයින් යෙදෙති යත්: කුශල නවපදයන් අතුරෙහි විපස්සනා යැ අමොහ යැ අනිච්චසඤ්ඤා යැ අනත්තසඤ්ඤා යැ යන මේ සතර පදයෝ ද, අමොහ යැ (?) සමථ යැ අලොභ යැ අසුභසඤ්ඤා යැ යන මේ සතර (?) පදයෝ ද ලොභය ද දෙසය දැයි මෙසේ මේ නවපදයෝ කුශලත්‍රයෙහි යෙදියැයුත්තාහු යැ.

එහි අකුශල නවපදයන් අතුරෙන් තණ්හා යැ ලොභ යැ සුභසඤ්ඤා යැ සුඛසඤ්ඤා යැ යන මේ සතර පදයෝ ලොභඅකුශලමූල යැ, අාවිජ්ජා යැ මොහ යැ නිච්චසඤ්ඤා යැ

අවිජ්ජා ච මොහො ච නිච්චසඤ්ඤා ච අත්තසඤ්ඤා ච අයං මොහො, දොසො[1] අයං දොසො. යෙ ච ඉමානි නව පදානි තීසු අකුසලෙසු යොජිතානි එවං අට්ඨාරස මූලපදානි, කුසලෙසු ච යොජෙත්වා තිපුක්ඛලෙන නයෙන නිද්දිසිතබ්බානි.

කථං අට්ඨාරස මූලපදානි සීහවික්කීළිතෙ නයෙ යුජ්ජන්ති : තණ්හා ච සුභසඤ්ඤා ච අයං පඨමො විපල්ලාසො. ලොභො ච සුඛසඤ්ඤා ච අයං දුතියො විපල්ලාසො. අවිජ්ජා ච නිච්චසඤ්ඤා ච අයං තතියො විපල්ලාසො. මොහො ච අත්තසඤ්ඤා ච අයං චතුත්ථො විපල්ලාසො. ඉති නව පදානි අකුසලමූලානි චතූසු පදෙසු යොජිතානි.

තත්ථ නවන්නං මූලපදානං කුසලානං සමථො ච අසුභසඤ්ඤා ච ඉදං පඨමං සතිපට්ඨානං. අලොභො ච දුක්ඛසඤ්ඤා ච ඉදං දුතියං සතිපට්ඨානං. විපස්සනා ච අනිච්චසඤ්ඤා ච, ඉදං තතියං සතිපට්ඨානං. අමොහො ච අනත්තසඤ්ඤා ච ඉදං චතුත්ථං සතිපට්ඨානං. ඉමානි අට්ඨාරස මූලපදානි සීහවික්කීළිතනයං අනුපවිට්ඨානි.

ඉමෙසං තිණ්ණං නයානං යා භූමි[2] යො රාගො ච යො දොසො ච එකං නයං පවිසති. එකස්ස නයස්ස අකුසලෙ වා ධම්මෙ කුසලෙ වා ධම්මෙ විඤ්ඤුතෙ පටිපක්ඛො[3] අන්වෙසිතබ්බො. පටිපක්ඛෙ අන්වෙසිත්වා යො නයො නිද්දිසිතබ්බො, තම්හි නයෙ නිද්දිට්ඨෙ.[4] යථා එකම්හි නයෙ සබ්බෙ නයා පවිට්ඨා තථා නිද්දිසිතබ්බා. එකම්හි ච නයෙ අට්ඨාරස මූලපදානි පවිට්ඨානි, තම්හි ධම්මෙ විඤ්ඤුතෙ සබ්බෙ ධම්මා විඤ්ඤුතා හොන්ති.

ඉමෙසං තිණ්ණං නයානං සීහවික්කීළිතනයස්ස චත්තාරි ඵලානි පරියොසානං. පඨමාය දිසාය පඨමං ඵලං, දුතියාය දිසාය දුතියං ඵලං, තතියාය දිසාය තතියං ඵලං, චතුත්ථාය දිසාය චතුත්ථං ඵලං.

තිපුක්ඛලස්ස නයස්ස තීණි විමොක්ඛමුඛානි පරියොසානං පඨමාය දිසාය අප්පණිහිතං, දුතියාය දිසාය සුඤ්ඤතං, තතියාය දිසාය අනිමිත්තං.

නන්දියාවට්ටස්ස නයස්ස රාගවිරාගා චෙතොවිමුත්ති අවිජ්ජාවිරාගා ච පඤ්ඤාවිමුත්ති පරියොසානං. පඨමාය දිසාය රාගවිරාගා චෙතොවිමුත්ති, දුතියාය දිසාය අවිජ්ජාවිරාගා පඤ්ඤා විමුත්ති.

ඉමෙ තයො නයා, ඉමෙසං තිණ්ණං නයානං අට්ඨාරසන්නං මූලපදානං ආලොකනා, අයං වුච්චති දිසාලොචනො[5] නයො.

ආලොකෙත්වාන ජානාති 'අයං ධම්මො ඉමං ධම්මං භජතී'ති සම්මායොජනා. කුසලපක්ඛෙ අකුසලපක්ඛෙ ච. අයං නයො අඞ්කුසො නාම. ඉමෙ පඤ්ච නයා.

---

1. දොසො – මුද්දිතපොත්ථකෙසු න දිස්සති.
2. භූමි ච – මජසං.
3. පටිපක්ඛ – PTS.
4. නිද්දිට්ඨා – මජසං, PTS.
5. ආලොකනො – මජසං PTS.

අත්තසඤ්ඤා යැ යන මේ මොහ අකුශලමූල යැ, දෙස යැ යන මෙය දෙසඅකුශලමූල යි. යම් මේ නව පදකෙනෙක් වෙත්ද, ඔහු තුන් අකුශලයන්හි යොදනලද්දහු යැ, මෙසේ අටළොස් මූලපදයෝ කුශලයන්හි ද යොදු තිපුක්ඛලනයෙන් දක්වියැයුත්තාහු යි.

කිසෙයින් අටළොස් මූලපදයෝ සීහවික්කීළිතනයෙහි යෙදෙති යත් : තණ්හා යැ සුභසඤ්ඤා යැ යන මේ පළමුවන විපල්ලාස යි, ලොභ යැ සුඛසඤ්ඤා යැ යන මේ දෙවැනි විපල්ලාස යි. අවිජ්ජා යැ නිච්චසඤ්ඤා යැ යන මේ තෙවැනි විපල්ලාස යි. මොහ යැ අත්තසඤ්ඤා යැ යන මේ සතරවැනි විපල්ලාස යි. මෙසේ අකුශලමූල වූ නව පදයෝ සතර පදයන්හි යොදනලද්දහු යි.

එහි නව කුශලමූලපදයන් කෙරෙහි සමථ යැ අසුභසඤ්ඤා යැ යන මේ පළමුවන සතිපට්ඨාන යි. අලොභ යැ දුක්ඛසඤ්ඤ යැ යන මේ දෙවැනි සතිපට්ඨාන යි. විපස්සනා යැ අනිච්චසඤ්ඤා යැ යන මේ තෙවැනි සතිපට්ඨාන යි. අමොහ යැ අනත්ත සඤ්ඤා යැ යන මේ සතරවැනි සතිපට්ඨාන යි. මේ අටළොස් මූලපදයෝ සීහවික්කීළිත නයෙහි පිවිසියාහු යි.

මේ තුන් නයට යම් භූමියක් වේ ද එහි රාගය ද දෙසය ද යන දෙක එක් නයකට පිවිසෙයි. එක් නයක් පිළිබඳ වැ කුශලධර්මය හෝ අකුශලධර්මය හෝ දත් කල්හි ප්‍රතිපක්ෂය සෙවියැයුතු, ප්‍රතිපක්ෂයන් විමසා යම් නයෙක් දක්වියැයුත්තේද ඒ නය දක්වූකල්හි යමසේ එක් නයෙක්හි සියලු නය පිවිසියාහු ද එපරිද්දෙන් දක්වියැයුත්තාහ. තව ද එක් නයෙක්හි අටළොස් මූලපදයෝ පිවිසියාහු යැ, ඒ ධර්මය විඥත කල්හි සියලු ධර්මයෝ විඥත වෙත්.

මේ තුන් නය අතුරෙහි සීහවික්කීළිතනයෙහි සතර ඵලයෝ පර්‍ය්‍යවසානය වෙති. ප්‍රථම දිසායෙහි ප්‍රථම ඵලය වෙයි, දෙවැනි දිසායෙහි දෙවැනි ඵලය වෙයි, තුන්වැනි දිසායෙහි තුන්වැනි ඵලය වෙයි, සතරවැනි දිසායෙහි සතරවැනි ඵලය වේ.

තිපුක්ඛලනයෙහි තුන් විමොක්ෂමුඛයෝ පර්‍ය්‍යවසානය වෙයි. ප්‍රථම දිසායෙහි අප්‍රණිහිත විමොක්ෂමුඛ යැ, දෙවැනි දිසායෙහි ශුන්‍යතවිමොක්ෂමුඛ යැ, තෙවැනි දිසායෙහි අනිමිත්ත විමොක්ෂමුඛ යි.

නන්දියාවට්ටනයයාගේ රාගවිරාගචෙතොවිමුත්තිය ද අවිජ්ජාවිරාගපඤ්ඤාවිමුත්තිය ද පර්යවසානය වෙයි. ප්‍රථම දිසායෙහි රාගවිරාගචෙතොවිමුත්ති යැ, දෙවැනි දිසායෙහි අවිජ්ජාවිරාගපඤ්ඤාවිමුත්ති යයි.

මේ තුන් නය වෙති, මේ තුන් නයයන්ගේ අටළොස් මූලපදයන්ගේ අවලොකනය වේ. මේ දිසාලොචනනය යී කියනුලැබේ.

අවලොකනය කොට මේ ධර්මය මෙනම් ධර්මය බෙජේ යයි දනගනී. කුශලපක්ෂයෙහි ද අකුශලපක්ෂයෙහි ද මනාකොට යෙදීම වේ. මේ නය අංකුස නම් වේ. මේ පඤ්ච නය යි.

තත්ථිමා උද්දානගාථා :

1. "තණ්හා ච අවිජ්ජාපි ච - ලොභො දොසො තථෙව මොහො ච
චත්තාරො ච විපල්ලාසා - කිලෙසභූමි නව පදානි.

2. යෙ ච සතිපට්ඨානා - සමථො ච විපස්සනා කුසලමූලා
එතං සබ්බං කුසලං - ඉන්ද්‍රියභූමි නව පදානි.

3. සබ්බං කුසලං[1] නවහි පදෙහි යුජ්ජති - චෙව අකුසලං
එතෙ තෙ මූලපද - උභතො අට්ඨාරස පදානි.

4. තණ්හා චෙව අවිජ්ජා ච - සමථො ච විපස්සනා
යො නෙති සච්චෙසු[2] යොගයුත්තො - අයං නයො නන්දියාවට්ටො.

5. යො අකුසලෙ සමූලෙහි[3] - නයති කුසලො කුසලමූලෙහි
භූතං තථං අවිතථං - තිපුක්ඛලං තං නයං ආහු.

6. යො නෙති විපල්ලාසෙහි - කිලෙසෙ ඉන්ද්‍රියෙහි සද්ධම්මෙ
එතං නයං නයවිදූ - සීහවික්කීළිතං ආහු.

7. වෙය්‍යාකරණෙ වුත්තා - කුසලතාහි අකුසලතාහි ච
මනසා[4] ආලොකයති - අයං නයො දිසාලොචනො නාම.

8. ඔලොකෙත්වා දිසාලොචනෙන - උක්ඛිපිය යං සමානෙති
සබ්බෙ කුසලාකුසලෙ - අයං නයො අංකුසො නාම.

නයසමුට්ඨානං.

පෙටකොපදෙසෙ මහාකච්චායනස්ස ථෙරස්ස
සුත්තවිභඞ්ගස්ස දස්සනං සමත්තං

1. සබ්බකුසලං - මජසං, PTS.
2. සබ්බෙසු - මජසං, PTS.
3. යං කුසලමූලෙහි - මජසං, PTS.
4. කුසලා - මජසං, PTS.
5. නයො - මජසං,

එහි මේ උද්දානගාථා වෙති :

1. තණ්හා යැ අවිජ්ජා යැ ලොභ යැ දෙස යැ එසේ ම මොහය ද සතර විපල්ලාසයෝ ද යන නව පදයෝ ක්ලෙශ (අකුශල) භූමි යැ.

2. සතර සතිපට්ඨානයෝ යැ සමථ යැ විපස්සනා යැ තුන් කුශලමූලයෝ යැ යන තෙල සියලු කුශලය (සංග්‍රහ වූ) නව පදයෝ ඉන්ද්‍රිය (කුශල) භූමි යැ.

3. සියලු කුශලය නව (කුශල) පදයන් සමග ද සියලු අකුශලය නව (අකුශල) පදයන් සමග ද යෙදෙයි. දෙපක්ෂයෙහි තෙල මූලපදයෝ අටළොසක් වෙත්.

4. යම් නයෙක් තණ්හාව හා අවිජ්ජාව ද සමථය හා විපස්සනාව ද සත්‍යයන්හි යෝග යෙන් යුක්ත වූයේ කුශලාකුශලයන්හි පමුණුවා ද මේ නය නන්දියාවට්ට නම් වෙයි.

5. යම් නය විශේෂයෙක් අකුශලධර්මයන් අකුශලමූලයන් සමග ද චාතුර්භූමක කුශලයන් කුශලමූලයන් සමග ද භූත තථ අවිතථ කොට චතුස්සත්‍යද්වාරයෙන් සූත්‍රාර්ථය පමුණුවා ද ඒ නයවිශෙෂය ' තිපුක්ඛල ' නමැයි කීහු.

6. යම් වර්ණනාවිශේෂයෙක් සතර විපල්ලාසයන් සමග සංක්ලේශධර්මයන් ද ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් සමග සද්ධර්ම හෙවත් වොදානපක්ෂයෙහි ධර්මයන් ද සියුසස් සමග යොදා වර්ණනාවිෂය කෙරේ ද නය දන්නාහු තෙල නය සීහවික්කීළිත නමැයි කීහු.

7. වෙය්‍යාකරණයෙහි කුශලත්‍රයෙන් ද අකුශලත්‍රයෙන් ද කියනලද ධර්ම කෙනෙක් වෙත් ද ඒ ධර්මයන් ප්‍රථමදිශාදි වශයෙන් සිතින් අවලෝකනය කෙරෙයි. මේ නය දිසාලොචන නම් වේ.

8. දිසාලොචන නයින් ප්‍රථමාදි දිශාභාවයෙන් සිතින් අවලෝකනය කොට සූත්‍රයෙන් නඟාගෙන කුශලාකුශලධර්මයන් ඒ ඒ නයයෝජනා වශයෙන් යම් සමානයනයෙක් වේ ද මේ නය අංකුස නම් වේ.

නයසමුට්ඨාන යි

මහාකච්චායන තෙරණුවන්ගේ පෙටකොපදෙසයෙහි සූත්‍රවිභංගදර්ශනය

සමාප්ත යි.

යානි චතුක්කානි අකුසලානි කුසලානි ච සීහවික්කීළිතෙ නයෙ නිද්දිට්ඨානි, තිකානි කුසලානි ච අකුසලානි ච තිපුක්ඛලෙ නයෙ නිද්දිට්ඨානි, දුකානි කුසලානි ච අකුසලානි ච නන්දියාවට්ටෙ නයෙ නිද්දිට්ඨානි, යෙසු දිසු ධම්මෙසු කුසලෙසු (?) සො අත්ථො තීතෙසු විභජ්ජමානස්ස භවභූමි. අථ ච සබ්බො ච අත්ථො තීහි බ්‍යඤ්ජනෙහි නිද්දිසති. තත්තකානි වුච්චති. යො අත්ථො චතූහි පදෙහි අට්ඨවීසති- භාගෙහි තත්ථ භූමි නිද්දිසිතුං. අවචරනෙනාව චතූහි පදෙහි නිද්දිසති. ඉති යං යථා, නිද්දිට්ඨස්ස අවිකොපනා (?) ඉදං පමාණං.

යථා සබ්බෙ සමාධයො තීසු සමාධිසු පරියෙසිතබ්බා, සවිතක්ක- සවිචාරෙ අවිතක්කවිචාරමත්තෙ අවිතක්කඅවිචාරෙ, ඉදං පමාණං, නත්ථි චතුත්ථො සමාධි.

තථා තිස්සො පඤ්ඤා, චින්තාමයී සුතමයී භාවනාමයී, සබ්බාසු පඤ්ඤාසු නිද්දසනානි[1] නත්ථි චතුත්ථී පඤ්ඤා, න චින්තාමයී න සුතමයී න භාවනාමයී පඤ්ඤා. තාස්ස නත්ථි ඉමෙසං ධම්මානං යා අවිකොප- නා, ඉදං වුච්චති පමාණන්ති.

ථෙරස්ස මහාකච්චායනස්ස ජම්බුවනවාසිනො

පෙටකොපදෙසො සමත්තො

පෙටකොපදෙසො නිට්ඨිතො.

1. නිද්දිසති – මජසං, PTS.

කුශල වූ ද අකුශල වූ ද යම් චතුෂ්කකෙනෙක් වෙත් ද ඔහු සීහවික්කීළිත නයෙහි දක්වන ලද්දහුය, කුශලවූ ද අකුශල වූ ද ත්‍රිකයෝ තිපුක්ඛල නයෙහි දක්වනලද්දහු යැ, කුශල වූ ද අකුශල වූ ද ද්විකයෝ නන්දියාවට්ටනයෙහි දක්වනලද්දහු යි. (යෙසු ද්වීසු ධම්මෙසු කුසලෙසු ?) ඒ අර්ථය ත්‍රිකයන්හි විභාග කරනුලබන්නාහුගේ හවභූමි වෙයි (?) එතෙකුදු වත් සියලු අර්ථය ව්‍යඤ්ජනත්‍රයෙන් දක්වනු ලැබෙයි. (යො අත්ථො . . . . අවි කොසතා ?) මේ ප්‍රමාණ යි.

සියලු සමාධිහු සවිතර්කසවිචාර යැ, අවිතර්කවිචාරමාත්‍ර යැ, අවිතර්කඅවිචාර යැ, යන තුන් සමාධියෙහි සෙවියැයුත්තාහු යැ. මේ ප්‍රමාණ යි. සතරවැනි සමාධියෙක් නැති.

එසේ මැ චින්තාමයී සුතමයී භාවනාමයී යන තුන් ප්‍රඥාවෝ සියලු ප්‍රඥාවන්හි දක්වනු ලැබෙත්. සතරවැනි ප්‍රඥාවක් නැත. (න චින්තාමයී . . . . ?) මේ ධර්මයන්ගේ යම් අවික්ෂෙපණයක් වේ ද, එය නැති. (?) මේ ප්‍රමාණ යයි කියනුලැබේ.

**ජම්බුවනවාසී මහාකච්චායන තෙරණුවන්ගේ පෙටකොපදෙසය සමාප්ත යි.**

**පෙටකොපදෙසය නිමි.**

## පෙටකොපදෙස

## ගාථාදිපාද — අනුක්කමණිකා

### ( උද්ධෘතස්ථාන සහිත යි )

### ‘ අ ’


| | පිටුව |
|---|---|
| අචරිත්වා බ්‍රහ්ම චරියං<br>( ධම්මපද - ජරාවග්ග ) | 10 |
| අඤ්ඤථා භාවී භවසත්තො<br>( උදාන පාළි - නන්දවග්ග ) | 36 |
| අත්ථං ගතස්ස න පමාණමත්ථි<br>( සුත්ත නිපාත - පාරායනවග්ග - උපසීව සුත්ත ) | 16 |
| අනුප්පාදය බුද්ධවචනං<br>( ) | 84 |
| අන්තො ජටා බහි ජටා<br>( දෙවතා සංයුත්ත ) | 112 |
| අප්පමාදො අමතපදං<br>( ධම්මපද - අප්පමාද වග්ග ) | 122, 132 |
| අප්පහාය පඤ්ච වේරානි<br>( පඤ්චකඞ්ගුත්තර - උපාසක වග්ග ) | 64, 82 |
| අප්පං වත ජීවිතං ඉදං<br>( සුත්ත නිපාත - ජරා සුත්ත ) | 14 |
| අභබ්බො හි තස්ස<br>( සුත්ත නිපාත - රතන සුත්ත ) | 254 |
| අයසාව මලං සමුට්ඨිතං<br>( ධම්මපද මල වග්ග ) | 12, 66 |
| අයං ලොකො සන්තාපජාතො<br>( උදාන පාළි - නන්ද වග්ග ) | 36 |
| අවිජ්ජාය නිවුතො ලොකො<br>( සුත්ත නිපාත - පාරායණ වග්ග - අජිත සුත්ත ) | 18, 30 |
| අවීත රාගො කාමෙසු<br>( ඡක්කඞ්ගුත්තර - ධම්මික සුත්ත ) | 94 |
| අසන්දිට්ඨං ච භණති<br>( අට්ඨකඞ්ගුත්තර - මහා වග්ග ) | 114 |

අසුභානුපස්සිං විහරන්තං 86, 96
( ධම්මපද - යමක වග්ග )

ආකඞ්ඛතො තෙ නරදම්මසාරථි 94
( )

ආදානස්ස භයං ඤත්වා 62, 76
( )

ආරභථ නික්කමථ 94
( බ්‍රහ්මසංයුත්ත - අරුණවතී සුත්ත )

ආසා පිහා ච අභිනන්දනා ච 24, 30
( )

‘ ඉ ’

ඉධ සොචති පෙච්ච සොචති 10, 18
( ධම්මපද - යමක වග්ග )

‘ උ ’

උග්ඝටිතම්හි තම්හි 142
( )

උග්ඝටිතම්හි පාර
( )

උච්ඡින්නභවතණ්හස්ස 20
( සුත්තනිපාත - ද්වයතානුපස්සනා සුත්ත )
( උදානපාළි - මෙඝියවග්ග )

උද්ධං අධො සබ්බධි විප්පමුත්තො 34, 56
( උදානපාළි - චූළවග්ග )

උන්නළානං පමත්තානං 124
( )

‘ එ ’

එකම්පි චෙ පාණමදුට්ඨචිත්තො 86
( ඉතිවුත්තක - එකක නිපාත - තතියවග්ග )

එකම්හි පදට්ඨානෙ 122
( )

එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති 268
( )

එතං දළ්හං බන්ධනමාහු ධීරා 34
( කොසලසංයුත්ත - බන්ධන වග්ග )
ජාතක පාළි - දුක නිපාත - බන්ධනාගාර ජාතක
ධම්මපද - තණ්හා වග්ග )

එතං විසෙසතො ඤත්වා 134
( ධම්මපද - අප්පමාද වග්ග )

එවමෙතං යථාභූතං 36, 282
( උදානපාළි - නන්ද වග්ග )

එතානිසංසො ධම්මෙ සුචිණ්ණෙ 228
(  )

එසොව මග්ගො නත්ථඤ්ඤො 14, 68, 78
( ධම්මපද මග්ගවග්ග )

' ඔ '

ඔලොකෙත්වා දිසාලොචනෙන 328

' ක '

කථංසු තරති ඔඝං 112
( සුත්තනිපාත - ආලවක සුත්ත
යක්ඛසංයුත්ත )

කම්මාරානං යථා උක්කා 12, 18
( ජාතක පාළි - උම්මග්ග ජාතක )

කාමච්ඡන්දං උපාදාය 76
(  )

කාමන්ධා ජාලසඤ්ඡන්නා 32, 56
( උදානපාළි - චූළවග්ග )

කාමං කාමයමානස්ස 60
( සුත්තනිපාත කාමසුත්ත )

කාමා හි චිත්‍රා විවිධා මනොරමා 62
( මජ්ඣිමනිකාය : රට්ඨපාල සුත්ත
අපදාන පාළි : රට්ඨපාලත්ථෙරාපදානං )

කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හා 12
( සුත්තනිපාත - ගුහට්ඨක සුත්ත )

කාමෙසු වෙ හඤ්ඤරෙ බජ්ඣරෙ ච 60
( ජාතක 1 - 498 පිට )

කාමෙසු සත්තා කාමසඞ්ගසත්තා 14, 68, 78
( උදානපාළි - ජච්චන්ධ වග්ග )

කායෙන කුසලං කයිරා 76, 78, 90, 96
(  )

කායෙන සංවරො සාධු 74, 78
( කොසල සංයුත්ත - බන්ධනවග්ග
ධම්මපද භික්ඛු වග්ග )

කිඤ්චාපි සො කම්මං කරොති පාපකං 254
( සුත්තනිපාත - රතනසුත්ත )

කුම්භූපමං කායමිමං - යං න තුම්හාකං ජහථ 30
(  )

කුම්භූපමං කායමිමං විදිත්වා 20
( ධම්මපද - චිත්තවග්ග )

කුසලා ච අකුසලා ච 106
( )

කෙනස්සු නිවුතො ලොකො 108
( සුත්තනිපාත - පාරායන වග්ග )

'ච'

චක්ඛුං සොතං ච ඝානං ච 14, 18
( )

චත්තාරො චෙ'ව පුග්ගලා 56
( )

චතු චක්කං නවද්වාරං 114
( දෙවතා . . . දෙවපුත්ත සංයුත්තක )

'ඡ'

ඡන්ද දොසා භයා මොහා 84
( චතුක්කඞ්ගුත්තර - චර වග්ග )

ඡන්නමති වස්සති 34, 252
( උදානපාළි - සොණවග්ග )

ඡෙත්වා නද්ධිං වරත්තං ච 114
( දෙවතා . . . . . දෙවපුත්ත සංයුත්තක )

'ත'

තණ්හා යස්ස පුරක්ඛතා 128
( )

තණ්හා ච අවිජ්ජාපි ච 6, 328
( )

තණ්හා චෙ'ව අවිජ්ජා ච 328
( )

තස්ස චෙ කාමයානස්ස 12
(සුත්තනිපාත : කාමසුත්ත )

තස්ස නිබ්බුතස්ස භික්ඛුනො 36
( උදාන පාළි : නන්ද වග්ග )

තුලමතුලං ච සම්භවං 90
( දීඝනිකාය : මහා පරිනිබ්බාන සුත්ත
ඉද්ධිපාද සංයුත්ත : චාපාල වග්ග
අට්ඨකඞ්ගුත්තර : භූමිචාල වග්ග
උදානපාළි : ජච්චන්ධ වග්ග )

'ද'

දදතො පුඤ්ඤං පවඩ්ඪති 38
( උදාන පාළි : පාටලිගාමිය වග්ග : චුන්ද සුත්ත )

දදං පියො හොති භජන්ති නං බහූ 80
( පඤ්චකඞ්ගුර : සුමනා වග්ග )

දිසාලොචනමාහංසු 6
(  )

දුක්ඛං දිට්ඨී ච උප්පන්නං 30
(  )

දෙසනා විචයො යුත්ති 4
(  )

‘ ධ ’

ධම්මං දෙසෙති ජිනො 116
(  )

ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං 58
( ජාතක – දසක : මහා ධම්මපාල ජාතක
ජාතක – වීසති : අයොඝර ජාතක )

‘ න ’

න තං දළ්හං බන්ධනමාහු ධීරා 34
( කොසල සංයුත්ත : බන්ධන වග්ග
ජාතක පාළි – දුක නිපාත : බන්ධනාගාර ජාතක
ධම්මපද : තණ්හා වග්ග )

නත්ථි පුත්ත සමං පෙමං 72, 74
( දෙවතා සංයුත්ත )

නන්දති පුත්තෙහි පුත්තිමා 72
( දෙවතා සංයුත්ත )

නව හි ච පදෙහි කුසලං 6
(  )

න හි පාපං කතං කම්මං 64, 76
(ධම්මපද : බාලවග්ග )

නිරුත්ති අධිප්පායො ච 120
(  )

නෙලඞ්ගො සෙතපච්ඡාදො 66, 76
( චිත්ත සංයුත්ත –
උදාන පාළි : චූල වග්ග )

‘ ප ’

පඤ්ඤාචෙව සති ච 110
( සුත්ත නිපාත : පාරායන වග්ග )

පඤ්ඤා හි සෙට්ඨා ලොකස්මිං 68, 88, 96
( ඉතිවුත්තක : දුතිය වග්ග )

24—ඒ 078576

පඨමො නන්දියා වට්ටො 6
( )

පදං පඤ්හා ච පුච්ඡා ච 108
( )

පසන්නනෙත්තො සුමුඛො 66
( සුත්ත නිපාත : සෙල සුත්ත )

පුරිමානං අපකඩ්ඪං 104
( )

‘ ඵ ’

ඵෙණපිණ්ඩූපමං රූපං 76
( )

‘ ම ’

මග්ගානට්ඨඞ්ගිකො සෙට්ඨො 74
( ධම්මපද : මග්ගවග්ග )

මනෙන කුසලං කයිරා 92, 96
( )

මනොපුබ්බඞ්ගමා ධම්මා 32, 204, 208
( ධම්මපද : යමක වග්ග )

මමායිතෙ පස්සථ ඵන්දමානෙ 10
( සුත්ත නිපාත : ගුහට්ඨක සුත්ත )

‘ ය ’

යථාපි කුම්භකාරස්ස 10
( සුත්තනිපාත : සල්ල සුත්ත )

යමෙකරත්තිං පඨමං 10, 18
( ජාතක - වීසති නිපාත : අයොඝර ජාතක )

යමෙතං පඤ්හං අපුච්ඡි 110
( සුත්ත නිපාත : පාරායන වග්ග )

යම්හි න මායා වසතී න මානො 14, 18
( උදාන පාළි : නන්ද වග්ග )

යං ච කාමසුඛං ලොකෙ 74, 78
( උදාන පාළි : මුචලින්ද වග්ග )

යං පත්තං යං ච පත්තබ්බං 72, 78
( )

යං නිස්සිතස්ස චලිතං 30
( )

යස්ස සද්ධා තථාගතෙ 92, 96
(චතුක්කඞ්ගුත්තරෙ : පුඤ්ඤාභිසන්ද වග්ග
පඤ්චකඞ්ගුත්තරෙ : මුණ්ඩරාජ වග්ග )

යස්ස සෙලූපමං චිත්තං 34
( උදාන පාළි : මේඝිය වග්ග )

යස්සින්ද්‍රියානි සමථං ගතානි 64
( ධම්මපද : අරහන්ත වග්ග )

යස්සින්ද්‍රියානි සුභාවිතානි 70
( සුත්ත නිපාත : සභිය සුත්ත )

යස්සකායගතා සති 56
( )

යස්සේ'වං භාවිතං චිත්තං 240
( උදාන පාළි : )

යානි කරොති පුරිසො 62, 76
( ජාතක – දුක නිපාත : චූල නන්දිය ජාතක )

යානි සොතානි ලොකස්මිං 24, 110
( සුත්ත නිපාත – පරායන වග්ග : අජිත සුත්ත )

යෙ එවං පටිපජ්ජන්ති 70
( )

යෙ කෙචි භූතා භවිස්සන්ති 72
( උදාන පාළි : සොණ වග්ග )

යෙ කෙචි සොකා පරිදෙවිතා වා 20
( උදාන පාළි : පාටලිගාම වග්ග )

යෙ ච සඞ්ඛාත ධම්මාසෙ 110
( අභිසමය සංයුත්ත : කළාර ඛත්තිය වග්ග
සුත්තනිපාත : පාරායන වග්ග )

යෙ ච සතිපට්ඨානා 328
( )

යෙ ධම්මා හෙතුප්පභවා 16, 18
( විනය පිටක : මහාවග්ග පාළි )

යෙපි ච සතිපට්ඨානා
( )

යෙසං ච සුසමාරද්ධා
( ධම්මපද : පකිණ්ණක වග්ග )

යෙ සතිපට්ඨානා – සමථො ච විපස්සනා කුසලමූලා 328
( )

යො අකුසලෙ සමූලෙති 328
( )

යො කාමෙ පරිවජ්ජෙති 60
( සුත්තනිපාත : කාමසුත්ත )

යොගස්ස කාලං න නිවත්තියා ච 122
( )

යො වෙ න ව්‍යථති පත්වා 114
( අට්ඨකඞ්ගුත්තර : මහාවග්ග )

යො නෙති විපල්ලාසෙහි 328
( )

යො දුක්ඛමද්දක්ඛි යතො නිදානං 22
( මාරසංයුත්ත : දුතිය තතිය වග්ග )

යො පාණමතිපාතෙති 64, 82
( පඤ්චකඞ්ගුත්තර : උපාසක වග්ග )

යො වෙ ත ව්‍යථති පත්වා 114
( අට්ඨකඞ්ගුත්තර : මහා වග්ග )

'ර'

රූපං වෙදයිතං සඤ්ඤා 70, 78
( මාරසංයුත්ත : රජ්ජවග්ග )

'ල'

'ව'

වචසා මනසා ච කම්මුනා ච 70, 78
( සුත්තනිපාත : සම්මාපරිබ්බාජනිය සුත්ත )

වාචානුරක්ඛී මනසා සුසංවුතො 92
(ධම්මපද : මග්ගවග්ග )

විතක්කපමථිතස්ස ජන්තුනො 80, 96
(ධම්මපද : තණ්හාවග්ග )

වුත්තම්හි එකධම්මෙ 118
( )

වෙවචනෙහි අනෙකෙහි 126
( )

වෙවචනො ච පඤ්ඤත්ති 4
( )

වෙය්‍යාකරණෙ වුත්තා 328
( )

'ස'

සඞ්කප්පෙහි පරෙතො සො 12
( සුත්තනිපාත : තිස්සමෙත්තෙය්‍ය සුත්ත )

සඞ්ඝෙ පසාදො යස්සත්ථි 92
( පඤ්චකඞ්ගුත්තර : මුණ්ඩරාජ වග්ග )

සචෙ ච පාපකං කම්මං 58
( උදානපාළි : සොණ වග්ග )

සචෙ පි දස පජ්ජොතා (තෙ) 104
( වන සංයුත්ත : කස්සපගොත්ත සුත්ත )

සචෙ භායථ දුක්ඛස්ස 56, 58, 76
( උදානපාළි : සොණ වග්ග )

සට්ඨි වස්ස සහස්සානි 66, 76
( ජාතක – චතුක්ක නිපාත : ලෝහකුම්භි ජාතක )

සතං ආසි අයෝසඞ්කු 12, 18
( මජ්ඣිම නිකාය : මාරතජ්ජනීය සුත්ත
මහා මොග්ගල්ලානත්ථෙර ගාථා )

සතං චේව සහස්සානං 84, 96
( )

සති කායගතා උපට්ඨිතා 22
( උදානපාළි : නන්ද වග්ග )

සතීමතො සදා භද්දං 94, 96
( යක්ඛ සංයුත්ත : ඉන්දක වග්ග )

සත්තියා විය ඔමට්ඨෝ 64, 76
( දේවතා සංයුත්ත : සත්ති වග්ග )

සද්ධා චෙ නන්දීකා ආරා 92
( )

සද්ධා සති ච විරියං
( )

සබ්බපාපස්ස අකරණං 72, 78
( ධම්මපද : බුද්ධ වග්ග
දීඝ නිකාය : )

සබ්බං කුසලං 328
( )

සබ්බෙ ධම්මා අනත්තාති 68, 68, 76
(ධම්මපද : මග්ග වග්ග )

සබ්බෙ සත්තා මරිස්සන්ති 14, 18
( කෝසල : සංයුත්ත )

සබ්බෙසං හාරානං 116
( )

සමථෝ ච විපස්සනා ච 6
( )

සයං කතෙන කම්මෙන 26
( )

සවන්ති සබ්බධි සෝතා
( සුත්ත නිපාත : පාරායන වග්ග )

සංකප්පෙහි පරෙතො සො 12
( සුත්තනිපාත : තිස්ස මෙත්තෙය්‍ය සුත්ත )

සංඝෙ පසාදෙ යස්සත්ථි 92
( පඤ්චකඞ්ගුත්තර : මුණ්ඩරාජ වග්ග )

සාමිං තෙන කුතො රාජ 10, 18
( )

සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො 58
( දෙවතා සංයුත්ත : සත්ති වග්ග
බ්‍රාහ්මණ සංයුත්ත : අරහන්ත වග්ග )

සුඛා විරාගතා ලොකෙ 65
( උදාන පාළි : මුචලින්ද වග්ග )

සුඛො විපාකො පුඤ්ඤානං 62
(                    )

සුඛො විවෙකො තුට්ඨස්ස 62, 66
( උදාන පාළි : මුචලින්ද වග්ග )

සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු 60, 76
( සුත්ත නිපාත - පාරායන වග්ග : මොඝරාජ සුත්ත )

සුපිනෙන යථා'පි සංගතං 12, 18
( සුත්ත නිපාත : ජරා සුත්ත )

සුභාසිතං උත්තමමාහු සන්තො 92
( සුත්ත නිපාත : සුභාසිත සුත්ත )

සොචති පුත්තෙහි පුත්තිමා 72
( දෙවතා - දෙවපුත්ත සංයුත්ත
සුත්ත නිපාත :                    )

සොළස හාරා නෙත්ති 4

'හ'

හඤ්ඤතෙ සබ්බා මුච්චෙච 76
(                    )

# සඤ්ඤානාමානුක්කමණිකා

පිට්ඨඞ්කං

‘ අ ’

අජිත — — 18, 24, 108, 110, 112
ආනන්ද — — — 10, 34, 58, 116

‘ උ ’

උපසීව — — — 16

‘ ක ’

කස්සපගොත්තො — — 104

‘ ච ’

චෙතං — — — 104

‘ ත ’

තිම්බරුකො පරිබ්බාජකො — — 22

‘ ද ’

දළ්හනෙමියානකාරො — — 24
දෙවානමින්දො — — — 72

‘ න ’

නන්දියො සක්කො — — 60

‘ ම ’

මහානාමො සක්කො — — 32, 64, 212
මොඝ රාජ — — — 60

‘ ස ’

සාරිපුත්තො — — — 34, 104, 126

# විසෙසපදානුක්කමණිකා


| | පිට්ඨඞ්කා |
|---|---|
| අකතඤ්ඤුතා | 284 |
| අකරණීයානි | 74 |
| අකිරියං | 54 |
| අකුසල කම්ම පථා | 252 |
| අකුසල මූලං | 30, 52, 194, 318 |
| අකුසලා ධම්මා | 100 |
| අකුසල පක්ඛා | 158 |
| අගතිං | 312 |
| අගතිගමනානි | 64 |
| අග්ගානි | 74 |
| අඞ්ගුලියො | 104 |
| අඞ්කුසො | 6 |
| අජ්ඣත්ත පසාදෙ | 210 |
| අජ්ඣත්තරතො | 90 |
| අජ්ඣත්ත සංයොජනං | 194 |
| අජ්ඣත්ත චතුක්කො | 112 |
| අජ්ඣත්තං යොනිසො මනසිකාරො | 2 |
| අජ්ඣත්තා තණ්හා | 202 |
| අඤ්ඤාතාවින්ද්‍රියං | 88 |
| අඤ්ඤථා | 100 |
| අඤ්ඤාණ නිරොධො | 296 |
| අඤ්ඤාණමූලප්පභවා | 24 |
| අඤ්ඤාණං | 258 |
| අඤ්ඤින්ද්‍රියං | 88, 136 |
| අට්ඨඞ්ගසම්මත්තානි | 206 |
| අට්ඨඞ්ගිකො මග්ගො | 148 |
| අට්ඨමිච්ඡත්තානි | 138, 262 |
| අට්ඨවිධෙ සුත්ත සඞ්ඛෙපෙ | 56 |
| අට්ඨාරසමූලපදා | 4, 6 |
| අට්ඨාරසධාතුයො | 146 |
| අණ්ඩගතා | 274 |
| අත්තවාදුපාදානං | 118, 310 |
| අත්ත සඤ්ඤා | 6, 284, 326 |
| අත්තසම්මා පණිධි | 116 |
| අත්තානුදිට්ඨිං | 60 |
| අතිගණ්හනෙතා | 40 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| අතිණ්ණ පුබ්බං | 34 |
| අතිවත්තති | 84 |
| අතිධොනචාරිනං | 12 |
| අතුලං | 90 |
| අත්ථඞ්ගතස්ස | 16 |
| අත්ථපටිසංවෙදී | 4 |
| අත්ථපුථුත්තෙන | 8 |
| අත්ථානුපරිවත්ති | 112 |
| අද්ධා | 60 |
| අදෙසාධිට්ඨානා | 60 |
| අධිච්චසමුප්පන්න දිට්ඨි | 54 |
| අධිට්ඨානො | 198, 284 |
| අධිප්පායො | 62 |
| අධිමත්තො | 102 |
| අධිමුත්තා | 48 |
| අධිසත්තවෙට්ඨති | 98 |
| අධිපාටිකඛති | 260 |
| අනත්තවෙට්ඨා | 178 |
| අනපායිනී | 32 |
| අනභිලාපනං | 88 |
| අනපෙක්ඛිනො | 34 |
| අනත්ත සඤ්ඤා | 6, 164 |
| අනමතග්ගසංසාරං | 84 |
| අනානුපස්සී | 34 |
| අනාවිල ලක්ඛණා | 214 |
| අනියතො | 44 |
| අනිට්ඨ විපාකං | 246 |
| අනිච්ච සඤ්ඤා | 6, 164 |
| අනිමිත්තං | 330 |
| අනින්ද්‍රිය සරීරං | 130 |
| අනිස්සටා | 36 |
| අනිවෙසනො | 20 |
| අනුඤ්ඤාතං | 33 |
| අනුපුබ්බ සමාපත්තියො | 174 |
| අනුඤ්ඤාතබ්බම සුත්තං | 104 |
| අනුමිනිතබ්බං | 80 |
| අනුපාදිසෙසා නිබ්බානධාතු | 8, 110, 160, 174 |




25—ඒ 078576

| | පිට්ඨඞ්කා |
|---|---|
| අනුසයිතං | 36 |
| අනුසය සමුග්ඝාතං | 110 |
| අනුසොතගාමී | 286, 288 |
| අනුඤ්ඤුතං | 104 |
| අනුසයො | 90 |
| අනුප්පාදෙඤාණං | 88 |
| අනුපට්ඨිතා | 34 |
| අනෙකරූපං | 20 |
| අනොධිසො | 50, 104 |
| අනොතාරෙන්තා | 104 |
| අන්තොජටා | 112 |
| අන්ධකාර තිමිසා | 156 |
| අපණ්ණකං | 62, 64 |
| අපණ්ණකපසාදනීයං | 68 |
| අපකඩ්ඪිතබ්බා | 98, 100 |
| අපරිපක්ඛිතබ්බා | 98 |
| අප්පටිනිස්සජ්ජ | 34 |
| අප්පමාදෙ | 214 |
| අප්පමාද ධාතු | 138 |
| අප්පසුතෙන | 164 |
| අප්පණිහිතං | 320 |
| අප්පටිකූල සඤ්ඤී | 246 |
| අප්පිය සම්පයොගො | 10 |
| අපුනබ්භවාය | 34, 222 |
| අබ්‍යාපජ්ජං | 66 |
| අබ්‍යාපජ්ජභූමියං | 86 |
| අබ්‍යාපාද විතක්කො | 228 |
| අබ්භාචික්ඛන්ති | 12 |
| අභිජ්ඣාකායගන්ථො | 312 |
| අභිනන්දනා | 24 |
| අභිනිවිට්ඨා | 52 |
| අභිසමයං | 170 |
| අභිසම්බුද්ධො | 8 |
| අභිසන්දනාකාරෙන | 188 |
| අභිමානිකා | 274 |
| අභිසංඛරොති | 84 |
| අභිමත්ථමානං | 2 |
| අබ්භුට්ඨිතො | 10 |
| අමොහාධිට්ඨානං | 90 |
| අමොඝො | 236 |
| අමමො | 10 |
| අයසා | 66 |
| අයොසඞ්කු | 12 |
| අයොනිසො මනසිකාරො | 278 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| අරහත්තං | 238 |
| අරහත්ත ධම්මා | 286 |
| අරිය ධම්මා | 98, 234 |
| අරියස්ස සීලස්ස | 24 |
| අරියකන්තං | 92 |
| අරිය ධම්මෙසු | 8, 98, 100 |
| අරියං ධම්ම විනයං | 308 |
| අරිය මග්ග ධම්මා | 98 |
| අරියවොහාරො | 296 |
| අරියසච්චානි | 68 |
| අරිය පුග්ගලා | 224 |
| අලමරියඤාණදස්සනං | 4 |
| අවදූතියා | 12 |
| අවිජ්ජා | 150 |
| අවිනිපාත ධම්මො | 70, 168 |
| අවිපක්ක විපාක සමූහතා | 140 |
| අවිප්පටිසාරී | 58, 80, 232, 234 |
| අවිජ්ජණ්ඩකොසස්ස | 90 |
| අවිජ්ජාගතො | 52 |
| අවිජ්ජාය ඛෙත්තං | 142 |
| අවිප්පටිසාරො | |
| අවිපරීත දස්සනං | 88 |
| අවිපරීත ධම්මදෙසනං | 2 |
| අවිහිංසා විතක්කො | 228 |
| අවිසෙසභාගියං | 48 |
| අවෙච්චපසාදෙන | 96 |
| අසඞ්ඛත දස්සනාය | 100 |
| අසම්පජඤ්ඤං | 90 |
| අසඤ්ඤීසමාපත්තිං | 140 |
| අසංහාරියපඤ්ඤත්තියා | 288 |
| අසම්මානං | 54 |
| අස්සාදෙ | 32 |
| අස්සාදානුපස්සිනො | 16 |
| අසුභසඤ්ඤා | 164, 326 |
| අස්සුතපුබ්බා | 2 |
| අසෙඛභූමි | 298 |
| අසෙඛභාගියං | 32, 104 |
| අහංකාරො | 118, 158, 270, 322 |
| අංකුසො | 326 |

ආ

| | |
|---|---|
| ආචයගාමී | 140 |
| ආජීවකා | 54 |
| ආතාපී | 58, 72 |

| | පිට්ඨඞ්කං |
|---|---|
| ආදානස්ස | 62 |
| ආදීනවා | 190 |
| ආදීනවානුපස්සනා | 16, 298 |
| ආධිපතෙය්‍යභූමිං | 50 |
| ආනන්තරියං සමාධිං | 54 |
| ආනන්තරිය සමන්නාගතං | 104 |
| ආයතනසො | 148 |
| ආයසං | 34 |
| ආරද්ධවීරියං | 304 |
| ආරම්මණං | 274 |
| ආරම්භධාතු | 50 |
| ආලොකසභාගානි | 8 |
| ආවට්ටො | 4, 122 |
| ආවට්ටො හාරො | 196, 234 |
| ආවී | 56, 58 |
| ආසජ්ජ | 34, 94 |
| ආසත්තිං | 10 |
| ආසවක්ඛයො | 50 |
| ආසවා සත්ත | 100 |
| ආසාටිකං | 24 |

ඉ

| | |
|---|---|
| ඉට්ඨත්තාය | 88 |
| ඉතිවුත්තකං | 8 |
| ඉද්ධිපාටිහීරෙන | 104 |
| ඉන්ද්‍රිය භාවනං | 248 |
| ඉන්ද්‍රිය භූමි | 6 |
| ඉන්ද්‍රිය පරොපරියං | 104 |
| ඉන්ද්‍රියබල වෙමත්තඤාණං | 104 |
| ඉන්ද්‍රියාධිට්ඨානානි | 94 |
| ඉන්ද්‍රියානි - පඤ්ච | 96 |
| ඉන්ද්‍රියො තරණො | 198 |
| ඉරියං | 110 |

උ

| | |
|---|---|
| උක්කා | 12 |
| උග්ඝටිතඤ්ඤු | 222, 316 |
| උච්ඡෙදවාදී | 308 |
| උච්ඡෙද දිට්ඨියා | 220 |
| උජුභූතං දස්සනං | 92 |
| උත්තරිමනුස්සධම්මා | 4 |
| උත්තානීකිරියා | 2 |
| උත්තරාරණියා | 2 |

| | පිට්ඨඞ්කං |
|---|---|
| උදකප්පන සුත්තං | 10 |
| උද්ධං භාගියං | 100, 104, 174, 224 |
| උදයබ්බයං | 54 |
| උදුහු | 104 |
| උපක චණ්ඩාලං | 244 |
| උපසමාධිට්ඨානං | 300 |
| උපක්කිලෙසො | 54 |
| උපඝටනා | 142 |
| උපච්චගා | 36 |
| උපජීවමානො | 72 |
| උපවිචාරො | 318 |
| උප්පච්ච | 58 |
| උපපරික්ඛිතබ්බා | 98, 102 |
| උපපරික්ඛා | 62 |
| උපනිස්සය සම්පදා | 26 |
| උපනිසා | 188 |
| උපහඤ්ඤති | 94 |
| උපාදානං | 130, 150 |
| උපායාසො | 10 |
| උපෙක්ඛාසති පාරිසුද්ධිං | 184 |
| උපෙක්ඛකො | 244 |
| උභයමන්තරෙන | 26 |

එ

| | |
|---|---|
| එකත්තතා | 134 |
| එකාදස සීලමූලකා | 166 |
| එකබීජී | 42 |
| එකංසබ්‍යාකරණීයො | 294 |

ඔ

| | |
|---|---|
| ඔඝා | 68, 272, 312 |
| ඔතරණො | 4, 128, 132, 198, 202, 226, 288 |
| ඔධිසො | 104, 222 |
| ඔමට්ඨො | 64 |
| ඔරම්භාගියානං | 54, 104 |
| ඔරිමං | 74 |
| ඔභාරිනං | 34 |

ක

| | |
|---|---|
| කපණො | 12 |
| කබළිඞ්කාරෙ | 64 |
| කරණීයානි | 74 |
| කම්මසමාදානානං | 104 |

පිට්ඨඞ්කං

කම්මපථෙ 92
කම්මට්ඨානං 48, 90
කම්මාරානං 12
කලබකජ්ඣානො 192
කල්‍යාණමිත්තතා 22, 114, 266
කල්‍යාණො 80
කල්‍යාණකාරී 62
කාපුරිසා 222
කාමයානස්ස 12
කාමවිතක්කං 96
කාමාසවෙන 50
කාමෙසු සත්තා 194
කායකම්මපාරිසුද්ධි 92
කායකම්මාධිට්ඨානං 90
කායගතාසති 24, 120
කායසම්පීළනලක්ඛණං 8
කායානුපස්සනා 124, 242
කාවියං සුත්තං 68
කිච්චං 62
කිත්තිසද්දො 80
කිලෙසභූමි 6
කිලෙසවත්ථුපටිසෙවනාය 124
කුදස්සු 62
කුම්භූපමං 20
කුම්භාමුඛෙ 32
කුසලං 88
කුසලකිරියා 60
කුසලමූලං 8, 160, 194, 210, 214
කොපනෙය්‍ය 34
කොසල්ලා 250
කොලංකොලො 42

ඛ

ඛමං 104
ඛයෙඤාණං 88
ඛීණනිරයො 70
ඛීණපුනබ්භවො 26
ඛීරපකො 32

ග

ගතියො 62
ගන්ථා 272
ගන්ථ පරිවාතො 266

පිට්ඨඞ්කං

ගබ්භගතා 274
ගබ්භාගබ්භං 84
ගෙය්‍යං 8
ගොචරකුසලං 22
ගොපාලකූපම සුත්තං 22, 102
ගොමිකො 72
ගොසමිතං 72

ච

චක්කවත්ති 62
චත්තාරි අගතිගමනානි 64
චත්තාරි අප්පමඤ්ඤානි 314
චත්තාරි අරියසච්චානි 6, 16, 50, 148, 230
චත්තාරි ඣානානි 180
චත්තාරො ආසවා 14, 124
චත්තාරො පරිළාහා 282
චත්තාරො විපල්ලාසා 152, 280
චත්තාරො පුග්ගලා 256
චතස්සො අරියභූමියො 166
චතුබ්‍යූහො හාරො 200
චතුරඞ්ගිකං 230
චතුත්ථං ඣානං 230
චතු චක්කං 114
චතුබ්‍යූහො 4, 120, 122
චවනධම්මං 12
චිත්තභාවනා 58, 112, 238, 242
චිත්ත සමාධි 50, 314
චිත්තසම්පීළන ලක්ඛණං 8
චිත්තපුබ්බඞ්ගමා 212
චිත්තානුපස්සනා 124
චිත්ත සංකිලෙසා 252
චිත්තෙකග්ගතා 182
චින්තාමයී පඤ්ඤා 2
චුතූපපාත ඤාණං 26
චෙතසිකං 36
චෙතොසමාධිනා 100
චෙතනාභබ්බා 42
චෙතොවිමුත්ති 20, 24, 50
චෙතං 104
ඡත්තං 58
ඡන්දජාතස්ස 12
ඡන්දරාගො 142
ඡන්දරාගවිනයො 20, 276

පිට්ඨඞ්කා

ඡන්දසමාධි 50
ඡවං 58

ජ

ජටං 58
ජතාභිලෙපනං 18, 108
ජරා 152
ජාති 152
ජාතිමරණසම්භවො 62
ජාතිමරණසංඛයො 62, 88
ජාලසඤ්ඡන්නා 32
ජිණ්ණකොඤ්චා 10
ජොතිපරායනො 34, 258
ඣානකොසල්ලං 192
ඣාන පාරමිතා 194
ඣානපරිහායී 190
ඣානභූමි 186
ඣානඞ්ග ධම්මතා 186
ඣාන විසෙසා 188
ඣාන සම්භාරා 188

ඤ

ඤාණපටිලාභො 304

ඨ

ඨපනා 102
ඨපනීයො 108
ඨානසො 104

ත

තජ්ජාති 82
තණ්හාචරිතා 310
තණ්හාසංකිලෙසො 52
තණ්හාකායා 110
තදුට්ඨාය 66
තථාගතබලං 46
තමපරායනො 34, 264
තමො 258
තයො විහාරා 176
තයො ගිලානා 10
තාදිනො 64
තික්ඛින්ද්‍රියො 40, 310
තිබ්බරාගස්ස 80
තිම්බරූසකා 22
තිපුක්ඛලො 6

පිට්ඨඞ්කා

තිපුක්ඛලො නයො 316, 320
තිස්සො පඤ්ඤා 94, 320
තිස්සො මාරධීතරො 10
තීණි අකුසලමූලානි 152
තීණිදුච්චරිතානි 10
තූලං 90

ථ

ථාවරානි - චත්තාරි 8
ථිනං 176

ද

දණ්ඩනිරොධො 136
දද්දලා 38
දසවත්ථුකා කිලෙසා 268
දසපරිවඩ්ඪකා 28
දසමං තථාගතබලං 50
දස්සනභාගියං 52, 104
දස්සනභූමි 172
දස්සනෙන පහාතබ්බං 100
දල්හනෙමියානකාරො 24
දූනමිසිකං 80
දූනූපපත්තියො 10
දුරුජං 34
දිසාලොකනො 312
දිසානුලොචනො 6, 326
දිසාවිලොකනො 314
දිට්ඨධම්ම සුඛ විහාරං 242, 248
දිට්ඨිචරිතා 310
දිට්ඨිරාගො 100
දිවෙට්ඨසට්ඨානං 50
දිබ්බෙන විහාරෙන 178
දුක්කරකම්මකාරී 82
දුක්ඛං 2, 6, 8
දුක්ඛසමුදයො 6
දුක්ඛට්ඨො 178
දුක්ඛදුක්ඛතා 318
දුක්ඛදුක්ඛතා ලක්ඛණං 8, 106
දුක්ඛ සඤ්ඤා 164
දුක්ඛවෙදනීයෙන 64
දුක්ඛ නිරොධගාමිනී පටිපදා 6
දුග්ගහිතං 102
දුච්චරිතානි 52, 64
දුච්චින්තිතචින්තී 82
දුද්දසං 74

| | පිට්ඨඞ්කං |
|---|---|
| දුබ්භාසිතභාසී | 82 |
| දුවිධො පටිච්චසමුප්පාදො | 132 |
| ද්වෙ හෙතු | 2 |
| දුස්සීලො | 82 |
| දෙසනා | 4 |
| දෙසනා හාරො | 196, 294 |
| දෙසනා භිප්පායො | 122 |
| දෙසනානුරූපං | 102 |
| ද්වෙ ධම්මා | 160 |
| ද්වෙ රොගා සත්තානං | 160 |
| ද්වෙ භෙසජ්ජානි | 160 |
| ද්වෙමූල කිලෙසා | 154 |
| ද්වෙ'මා භික්ඛවෙ විමුත්තියො | 14 |
| ද්වාදස විපල්ලාසා | 156 |
| ද්වාදසායතනානි | 148 |
| දොමනස්සං | 82 |
| දොසො අකුසල මූලං | 154 |
| **ධ** | |
| ධනා | 38 |
| ධම්මකායො | 250 |
| ධම්මක්ඛෙත්තං | 128 |
| ධම්මකුසලො | 120 |
| ධම්මචක්කං | 8 |
| ධම්මචරියා | 60 |
| ධම්මචාරී | 58, 218 |
| ධම්ම ධාතු | 130, 248, 304 |
| ධම්මපස්සද්ධි | 86 |
| ධම්මපදානි | 70 |
| ධම්මවිපස්සනා | 158 |
| ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො | 134, 158 |
| ධම්මසඤ්ඤා | 164 |
| ධම්මරාගෙන | 292 |
| ධම්මානුපස්සනා | 124 |
| ධම්මානුසාරී | 40, 54, 290 |
| ධම්මායතනං | 130 |
| ධම්මා දිට්ඨානං | 32, 118 |
| ධම්මානුධම්මපටිපත්ති | 322 |
| ධම්මූපසංහිතං | 22 |
| ධාතුඅත්ථො | 146 |
| **න** | |
| නත්ථික දිට්ඨි | 54 |
| නයං | 70 |

| | පිට්ඨඞ්කං |
|---|---|
| නයවිත්ථාරෙන | 32 |
| නන්දියාවට්ටො | 6 |
| නාමරූපං | 150 |
| නික්ඛිත්තං | 84 |
| නිච්චසඤ්ඤා | 326 |
| නිපතො | 58 |
| නිද්දෙසො | 52 |
| නිස්සන්දො | 102, 130 |
| නිස්සන්දතො | 80, 102 |
| නිරුත්ති කොසල්ලං | 120 |
| නිබ්බානනිතො | 74 |
| නිබ්බෙධගාමිනී | 68, 88 |
| නිබ්බෙධභාගියෙ | 32, 50, 56, 234, 278 |
| නිග්ඝොසං | 12 |
| නිජ්ඣානක්ඛන්තියා | 214 |
| නිවුතො | 18 |
| නිස්සයා | 26 |
| නිස්සිතස්ස | 26 |
| නිරූපධි | 72 |
| නිවාරණං | 24 |
| නිවිට්ඨා | 12 |
| නිය්‍යානස්ස | 4 |
| නිරොධො | 2, 8 |
| නිරොධ සමාපත්ති | 174 |
| නිය්‍යානික ලක්ඛණො | 8 |
| නෙක්ඛම්මධාතු | 48 |
| නෙක්ඛම්ම විතක්කො | 228 |
| නෙත්ති | 4 |
| නෙය්‍යො | 40, 42, 316 |
| **ප** | |
| පකප්පිතං | 36 |
| පකිණ්ණක නිද්දෙසො | 28 |
| පග්ගහ නිමිත්තං | 320 |
| පජප්පිතා | 24 |
| පජ්ජොතො | 104 |
| පඤ්ඤා | 164 |
| පඤ්ච නයා | 4, 6 |
| පඤ්ච දිට්ඨියො | 168 |
| පඤ්චඞ්ගිකං | 230 |
| පඤ්චක්ඛන්ධා | 146, 156, 172 |
| පඤ්චකාම ගුණිකො | 114 |

| | පිට්ඨඞ්කං |
|---|---|
| පඤ්ච පුබ්බ නිමිත්තානි | 10 |
| පඤ්ච විමුත්තායතනානි | 26 |
| පඤ්චුපාදානක්ඛන්ධා | 8 |
| පඤ්ඤත්ති | 204 |
| පඤ්ඤත්ති හාරො | 128, 218, 226, 264 |
| පඤ්ඤාබලං | 218 |
| පඤ්ඤාක්ඛන්ධො | 150, 304, 320 |
| පඤ්ඤාභාවනා | 58, 112 |
| පඤ්ඤාධිට්ඨානං | 314 |
| පඤ්ඤාවිමුත්ති | 20, 24, 50, 160 230, 324 |
| පඤ්ඤාවෙමත්තතං | 56 |
| පඤ්ඤින්ද්‍රියං | 136, 264 |
| පඤ්ඤින්ද්‍රියෙන | 54, 128 |
| පටිබුද්ධො | 12 |
| පටිච්ච සමුප්පාදෙසු | 128, 278 |
| පටිසන්ධිනිබ්බත්තනලක්ඛණො | 8 |
| පටිපුච්ඡා බ්‍යාකරණීයො | 108 |
| පණීතාසු ගතීසු | 262 |
| පත්තං - පත්තබ්බං | 72, 78 |
| පතිට්ඨානට්ඨෙන | 140 |
| පතිස්සවනා | 100 |
| පතිරූපදෙසවාසො | 116, 166, 236 |
| පදට්ඨානො | 4, 116, 118, 206 |
| පනුණ්ණකොධො | 14 |
| පමත්තබන්ධනා | 32 |
| පමුට්ඨා | 12 |
| පමොහනං | 68 |
| පරම්පර හෙතු | 136 |
| පරම්පර පච්චයො | 102 |
| පරත්තානං | 50 |
| පරම්පරාය | 98 |
| පරවචනං | 32 |
| පරතො ඝොසො | 2, 4, 292 |
| පරිළාහො | 318 |
| පරිබ්බජෙ | 64 |
| පරිහානධම්මො | 42 |
| පරිපාකලක්ඛණා | 8 |
| පරික්ඛාරෙසු | 198, 204, 242 |
| පරික්ඛාරො හාරො | 142, 226 |
| පරිඤ්ඤා | 146 |
| පරිනිබ්බුතො | 8 |
| පරිවත්තනො | 4, 202, 288 |
| පරියොසානං | 102 |
| පරිවඩ්ඪතා | 28 |
| පරිසග්ගතො | 84 |
| පරෙතං | 36 |
| පල්ලලෙ | 10 |
| පසත්තනෙත්තා | 66 |
| පස්සද්ධි | 26 |
| පාණමතිපාතෙති | 82 |
| පාතුභාවලක්ඛණා | 8, 106 |
| පාපකං | 58 |
| පාපමිත්තතා | 266 |
| පාපකාරී | 62 |
| පාමොජ්ජපඤ්ඤත්තියා | 296, 304 |
| පාරගතො | 290 |
| පාරිමං | 74 |
| පාරිවජ්ජත්තතො | 60 |
| පාරිසුද්ධියො තිස්සො | 92 |
| පිටක සම්පදානෙන | 98 |
| පීතිමනො | 60 |
| පියවිප්පයොගො | 10 |
| පුග්ගලපරොපරියං | 104 |
| පුග්ගල පඤ්ඤත්තියා | 198 |
| පුඤ්ඤකිරියං | 80 |
| පුත්තිමා | 72 |
| පුනබ්භවො | 20, 84, 274 |
| පොනොභවිකා | 138, 140 |
| පුබ්බයොගසමන්නාගතො | 56 |
| පුබ්බයොගභාගියෙ | 56 |
| පුබ්බාපරසො | 98 |
| පුබ්බාකොටි | 308 |
| පුබ්බෙකත පුඤ්ඤතා | 166 |
| පුබ්බෙනිවාසඤාණ | 50 |
| පුරාණකාය රාජධානියා | 62 |
| පුරිසතෙජො | 226 |
| පුරෙ | 98 |
| පූතිභාවො | 74 |


## ඵ


| | |
|---|---|
| ඵස්ස පරෙතො | 36 |
| ඵස්සායතනෙසු | 22 |
| ඵස්සායතනිකා - නිරයා | 66 |
| ඵෙණපිණ්ඩො | 68 |

පිට්ඨඞ්කා

බ

බබ්බජං 34
බලධාතු 48
බහි ජටා 112
බහුස්සුතා 29, 38, 164, 292
බහුසිතො 52
බාරාණසියං 6
බාලලක්ඛණානි 82
බාලිසිකොපමසුත්තං 64
බාවීසති ඉන්ද්‍රියානි 132
බාහිර වත්ථුතො 112
බාහුසච්චෙන 224
බුද්ධානුස්සති 212
බුබ්බුළො 68
බ්‍යඤ්ජන පුබ්බුත්තෙන 8
බ්‍යාකරණං 16, 28, 100
බ්‍රහ්මචරියං 70
බ්‍රහ්මචරිය ඵලානි 70
බ්‍රහ්මචරියෙසනාය 294
බ්‍රහ්මා 66

භ

භවතණ්හා 18, 28, 36
භවනෙත්ති 24
භවරාග 276
භවිස්සන්තො 36
භග්ගවිජ්ජන්තො 64
භාවසද්දෙන 32
භාවනා 188
භාවනාභාගියං 50, 104
භාවනාය භූමි 100
භාවනා පහාතබ්බානි 54
භිය්‍යො 80
භූතා 72
භූතරතං 36

ම

මක්කටොපමත්තාය 142
මග්ගො 2, 8
මත්තඤ්ඤුතා 86
මාතාපිතු සම්භවං 242
මනාප සද්දන්ති 128
මනුස්සගාහො 74

පිට්ඨඞ්කා

මනොකම්මාධිට්ඨානං 92
මනො සුචරිතං 214
මනොරමා 62
මනොජවා 206
මණිකුණ්ඩලෙසු 34
මධුරා 62
මනොදුච්චරිතානි 52
මනොපුබ්බඞ්ගමා 32, 204
මනොවිඤ්ඤාණ ධාතු 218
මමඞ්කාර 118, 270, 322
මමායිතෙ 10
මමිඞ්කාරො 158
මරණං 152
මහාපදෙසෙ 100
මහාපුරිසස්ස 62
මහානාම 212
මහාසමණො 16
මිච්ඡත්තානි 28, 30, 52
මිච්ඡත්තනියතො 44, 46
මිද්ධං 176
මුදින්ද්‍රියො 40, 310
මුදුමජ්ඣාධිමත්තතායපි 304
මෙත්තායති 86
මෙත්තාචෙතොවිමුත්ති 86
මොහො අකුසලමූලං 154

ය

යථානිද්දිට්ඨං 84
යථාභූතං 104
යුත්ති හාරො 116
යොගාවචරො 150
යොනිසොමනසිකාරො 2, 4, 220

ර

රක්ඛණ භබ්බො 42
රජනීයෙසු 34
රජාකිණ්ණං 72
රසො 56, 58
රාගචරිතා 268
රාගවිරාගා 20
රාජාපරාධිකං 82
රූපසඤ්ඤුතා 22
රූපධාතු 150

පිට්ඨඞ්කා

රූපරාගො 54
රූපං අත්තතො සමනුපස්සති 52
රූපසඤ්චෙතනා 278

ල

ලක්ඛණො 4, 194, 234
ලක්ඛණනිද්දෙසො 8
ලක්ඛණො හාරො 200
ලාභාලාභ අට්ඨෙතෙ 62
ලාලප්පන ලක්ඛණො 8
ලොකිකං 32
ලොකාමිසා 14
ලොකියං සීලං 116
ලොකුත්තරං 32
ලොකුත්තරං සීලං 116
ලොභො අකුසලමූලං 154

ව

වචනත්ථො 226
වාචාකම්මාධිට්ඨානං 92
වාචා චතුත්ථං 8
වාදපථා 16
වාසනා 32, 34
වාසනාභාගියං 52, 296
විකම්පිණො 20
විගතසෙතභෙ 2
විචයො 4, 108, 200, 222, 232
විචාරො 182
විචිකිච්ඡා 168, 176, 200
විචිකිච්ඡිතබ්බං 100
විචිකිච්ඡිතං 54
විජ්ජුප්පාද 296
විඤ්ඤාණං 160
විඤ්ඤාණට්ඨිති 276
විඤ්ඤාණනිරොධ 278
විඤ්ඤාණබීජං 140
විතක්කො 180, 182
විනිබද්ධානං 46
විනොදනා 100
විපරීතගාහියා 28
විපරිණාම දුක්ඛං 318
විපරිණාම දුක්ඛතාය 106
විපඤ්චිතඤ්ඤූ 222, 316

පිට්ඨඞ්කා

විපල්ලාසො 28, 30, 138, 154, 194, 310
විපාක කම්මං 32
විභවං 36
විභජති 234
විභජති හාරො 202, 288
විභජ්ජ බ්‍යාකරණීයො 108
විමුත්තිඤාණ දස්සනං 26
විමුත්තායතනානි 26, 292
විමොක්ඛමුඛානි 50
විරිය සමාධි 50
විරියින්ද්‍රියං 164, 228
විරිය සම්බොජ්ඣඞ්ගො 232
විරියින්ද්‍රියාධිට්ඨානං 94
විවට්ටං 252
විවරණා 2
විවාද ලක්ඛණො 156
විවිච්ඡා 18
විරූපරූපෙන 62, 64
විසත්තිකං 60
විසම ලොභො 114
විසුද්ධියා මග්ගං 116
විසෙසභාගියං ඣානං 184
විහිංසා විතක්කො 318
වීතරාගො 224
වීතරාග භූමි 172
වීමංසා 106
වීමංසා සමාධි 50
වීමංසිතබ්බා 98
වෙදනාක්ඛන්ධො 146
වෙදනානු පස්සනා 124
වෙමත්තතං 102, 134 204 304
වෙවචනං 196, 226 256
වෙරානි 64 82
වෙවචනො හාරො 126
වෙය්‍යාකරණං 8 68, 102
වොදානං 50
වොරොපෙය්‍ය 82

ස

සත වචනං 32
සකදාගාමී 172
සක්කායදිට්ඨියා 54, 168, 220
සක්කාය නිරොධගාමිණී 294

| පිට්ඨඞ්කං | |
|---|---|
| සක්කාය සමුදයගාමිනී | 126 |
| සඞ්ගා | 22 |
| සච්චානුසන්ධි | 2, 4 |
| සච්චානුලොමො සොසො | 2, 4 |
| සචිත්තපරියොදපනං | 72, 120 |
| සජ්ජු | 64 |
| සඤ්ඤාවිපල්ලාසං | 280 |
| සත්ත ධනානි | 216 |
| සත්තතිංසබොධිපක්ඛිකාධම්මා | 148 |
| සත්තබොජ්ඣඞ්ගා | 148 |
| සත්තමං තථාගතබලං | 50 |
| සත්තවිස ආකාරෙ | 56 |
| සත්තහඞ්ගෙහි සමන්නාගතො | 58 |
| සත්තා | 68 |
| සත්තාදිට්ඨානං | 32, 118 |
| සති | 164 |
| සතිමතො | 94 |
| සති දොවාරිකෙන | 110 |
| සතිවොදනං | 56 |
| සති සම්පජඤ්ඤෙන | 182 |
| සත්ථාරො | 74 |
| සත්ථුසාසනකාරකා | 70 |
| සද්ධා පරිභාවිතං | 212 |
| සද්ධම්ම සවනං | 322 |
| සද්ධානුසාරී | 40, 54, 290 |
| සද්ධානුසාරිනො | 308 |
| සද්ධං | 86, 164 |
| සන්දස්සනා | 2 |
| සන්තාපජාතො | 36, 284 |
| සප්පුරිස සංසෙවො | 116 |
| සබ්බධි | 34 |
| සබ්බ බොධි | 174 |
| සබ්බනිස්සග්ගො | 314 |
| සභග්ගතො | 82 |
| සමත්තනියතො | 44, 46 |
| සමචරියා | |
| සමනන්තර පච්චයො | 102, 136 |
| සමථ විපස්සනා යුගනද්ධා | 172 |
| සමථො | 158 |
| සමතෙනසමානො | 98 |
| සමසීසී | 42 |
| සමයනිද්දෙසො | 268 |
| සමාධි | 50, 164, 330 |
| සමාධි තයො | 94 |

| පිට්ඨඞ්කං | |
|---|---|
| සමාධික්ඛන්ධං | 320 |
| සමාධි භාවනා | 238 |
| සමාරොපනො | 198, 204, 212, 226 |
| සමාහිතො | 60 |
| සමාරූළ්හා | 82 |
| සමාරොපනො හාරො | 4, 142 |
| සම්මාදිට්ඨියා උප්පාදය | 2 |
| සම්මප්පධානා | 96 |
| සම්මත්තානි | 88 |
| සම්පායිස්සති | 8 |
| සම්භවෙසිනො | 274 |
| සමුදයො | 2 |
| සමුද්දපරමා | 72 |
| සමුදානීතො | 28 |
| සමොසරණං | 28 |
| සරාගො චෙතනා | 130 |
| සල්ලවිද්ධො | 12 |
| සස්සතං | 308 |
| සහසච්චාභිසමයා | 172 |
| සළායතනං | 24 |
| සංකප්පනා | 272 |
| සංඛත ලක්ඛණං | 318 |
| සංකිලෙසො | 34, 40, 108 |
| සංකිලෙසභාගියං | 32, 38, 52, 98<br>104, 266 |
| සංකිලෙසපටිපක්ඛො | 100 |
| සංඛත ලක්ඛණානි | 106 |
| සංඛාරා | 138 |
| සංඛාරක්ඛන්ධො | 146 |
| සංචෙතනියං සුත්තං | 24 |
| සංයමතො | 38 |
| සංයොජනං | 18 |
| සංයොජනීයං | 18 |
| සංයොජනීයෙසු ධම්මෙසු | 16 |
| සංවරො | 74 |
| සංයොජනසඞ්ගසත්තා | 14 |
| සංවරණං | 102 |
| සංසාරෙන සුද්ධි | 54 |
| සංසාර ගාමිනො | 114 |
| සාමඤ්ඤං | 62 |
| සාමුක්කංසිකාය | 298 |
| සාසනං | 52 |
| සාසනපට්ඨානං | 32, 106 |

පිට්ඨඞ්කා

සීලබ්බතං 54
සීලබ්බත පරාමාසො 170
සීහවික්කීළිතො 6, 310, 324
සුක්ඛෙකට්ඨෙ 2
සුඛභාගියා ධම්මා 316
සුඛවෙදනීයෙන කම්මෙන 64
සුඛුම කිලෙසානං 298
සුචරිතානි 70, 90
සුඤ්ඤතො 60
සුඤ්ඤතං 320
සුඤ්ඤට්ඨො 176
සුතධම්මස්ස 65
සුතමයී පඤ්ඤා 2, 232
සුත්තං 8, 100
සුත්තං - පඤ්චවිධං 104
සුත්තසඞ්කරො 104
සුත්තවිචයො 98, 104
සුත්තාදිට්ඨානෙ 102, 106
සුදන්තා 64
සුභාසිතං 92
සුභානුපස්සිනො 80
සුම්භො 66

පිට්ඨඞ්කා

සුසංවුතං 86
සෙක්ඛසීලං 214, 232
සෙලූපමං 34, 236
සෙලං පබ්බතං 86
සෙසානුගො 104
සොකපරිදෙවො 20
සොතානි 110
සොතානුධතෙසු 88
සොධනො 290, 226
සොපාදිසෙස නිබ්බාණධාතු 174, 286
සොමනස්සින්ද්‍රියං 210
සොළස හාරා 4, 106

හ

හානභාගියං ඣානං 184
හාරසම්පාතස්ස 56
හාරවිචයො 106
හිමවන්තං 58
හීනප්පණීතතා 28
හුරං 26
හෙතුප්පභවා 16
හෙතුසො 104

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා - නැවත මුද්‍රණය

| | | |
|---|---|---|
| 1 | පාරාජිකා පාලි | |
| 2 | පාචිත්තිය පාලි | I |
| 3 | පාචිත්තිය පාලි | II |
| 4 | මහාවග්ග පාලි | I |
| 5 | මහාවග්ග පාලි | II |
| 6 | චුල්ලවග්ග පාලි | I |
| 7 | චුල්ලවග්ග පාලි | II |
| 8 | පරිවාර පාලි | I |
| 9 | පරිවාර පාලි | II |
| 10 | දීඝනිකාය 1 | |
| 11 | දීඝනිකාය 2 | |
| 12 | දීඝනිකාය 3 | |
| 13 | මජ්ඣිම නිකාය | I |
| 14 | මජ්ඣිම නිකාය | II |
| 15 | මජ්ඣිම නිකාය | III |
| 16 | සංයුක්ත නිකාය | I |
| 17 | සංයුක්ත නිකාය | II |
| 18 | සංයුක්ත නිකාය | III |
| 19 | සංයුක්ත නිකාය | IV |
| 20 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (1) | |
| 21 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (2) | |
| 22 | අංගුත්තර නිකාය | I |
| 23 | අංගුත්තර නිකාය | II |
| 24 | අංගුත්තර නිකාය | III |
| 25 | අංගුත්තර නිකාය | IV |
| 26 | අංගුත්තර නිකාය | V |
| 27 | අංගුත්තර නිකාය | VI |
| 28 | ඛුද්දක නිකාය - ඛුද්දකපාඨ - ධම්මපදපාළි - උදානපාළි - ඉතිවුත්තකපාළි | |

29 ඛුද්දක නිකාය - සුත්ත නිපාත

30 ඛුද්දක නිකාය - විමානවත්ථු - පේතවත්ථු

31 ඛුද්දක නිකාය - ථෙරගාථා පාළි - ථෙරීගාථා පාළි

32 ඛුද්දක නිකාය - ජාතක පාළි I

33 ඛුද්දක නිකාය - ජාතක පාළි II

34 ඛුද්දක නිකාය - ජාතක පාළි III

35 ඛුද්දක නිකාය - මහා නිද්දේස පාළි

36 ඛුද්දක නිකාය - චුල්ල නිද්දේස පාළි

37 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ I

38 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ II

39 ඛුද්දක නිකාය - අපදාන පාළි 1

40 ඛුද්දක නිකාය - අපදාන පාළි 2 - 1

41 ඛුද්දක නිකාය - අපදාන පාළි 2 - 2

42 ඛුද්දක නිකාය - බුද්ධවංසපාළි - චරියා පිටක පාළි

43 නෙත්තිප්පකරණය

44 පෙටකොපදේස

45 ධමමසංගනිප්පකරණ

46 විභංගප්පකරණ I

47 විභංගප්පකරණ II

48 කථාවත්ථුප්පකරණ I

49 කථාවත්ථුප්පකරණ II

50 කථාවත්ථුප්පකරණ III

51 ධාතුකථාප්පකරණ - පුගගලපඤඤතතිපපකරණ

52 යමකප්පකරණ I

53 යමකප්පකරණ 2 - I

54 යමකප්පකරණ 2 - II

55 පට්ඨාප්පකරණය I

56 පට්ඨානප්පකරණය II

57 පට්ඨානප්පකරණය III

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ සත්කාරයන් හා ආගමික සේවාවන්

1. රජය පිළිගත් පුණ්‍යායතනයක් වශයෙන් කටයුතු කිරීම.
2. බණ්ඩාරගම වීදාගම දරුවන් සියයක් සඳහා ධර්මචක්‍ර ළමා නිවාසය පිහිටුවා දැනට රදැවන් 50 දෙනෙකුට සෙවණ ලබාදීම.
3. පූර්ණ පහසුකම් සහිත නේවාසික පහසුකම් හා විධිමත් අධ්‍යාපනික පහසුකම් ලබාදීම.
4. ධර්මචක්‍ර ළමා නිවාස සංකීර්ණය තුළ විහාර මන්දිරය, චෛත්‍යය, බෝධිය, භාවනා කුටි හා භාවනා මන්දිරය තනා නිම කිරීම.
5. ලියෙන් සිං ළදරු පාසල ආරම්භ කොට පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය ආරම්භ කිරීම.
6. තණමල්විල ප්‍රදේශයේ ලියෙන් සිං ළදරු අධ්‍යාපන මධ්‍යස්ථාන කීපයක් ආරම්භ කිරීම.
7. දේශීය විදේශීය ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම.
8. පිරුවානා පොත් වහන්සේ මුද්‍රණය කොට සෑම නිවසකටම ලබාදීම සඳහා වසරින් වසර මුද්‍රණය කොට බෙදා දීම. දැනට පිටපත් ලක්ෂ දෙකක් බෙදා හැර ඇත.
9. වියතුන් විසින් රචිත සිංහල ධර්මග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කොට බෙදා හැරීම.
10. ජාතක පොත් වහන්සේ කාටූන් චිත්‍ර වශයෙන් කුඩා දරුවන් සඳහා සිංහල ඉංග්‍රීසි හා චීන භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීම.
11. වෛද්‍ය ශිෂ්‍යයන්, පාසල් දරුවන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන විදේශික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
12. දිළිඳු පවුල් සඳහා රෙදි පිළි හා අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීම.
13. 2003 ජල ගැල්මට ලක්වූ හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්කවල විහාරස්ථාන 63ක් සඳහා රුපියල් කෝටි 2 1/2ක මූල්‍යමය ආධාර සැපයීම.
14. 2004 සුනාමි විපතට භාජනය වූ පිරිස් සඳහා නිවාස දහසක් ඉදිකිරීම හා අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර සැපයීම.
15. වාර්ෂිකව විදේශීය හා දේශීය වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් වෛද්‍ය සායන පැවැත්වීම.
16. කැළණිය බොල්ලෑගල මානෙල්වතු විහාරයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීම.
17. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ නැවත මුද්‍රණය කොට නොමිලයේ බෙදා හැරීම.

### ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ නිර්මාතෘවරයාණෝ :

තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයේ අධිපති, තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ අනුශාසක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ සංස්කෘතික අංශයේ සභාපති, තායිවානයේ සමාධි අධ්‍යාපන සංගමයේ නිර්මාතෘ සහ අනුශාසක, මහා බෝධි චර්යා සංගමයේ නිර්මාතෘ සහ සභාපති,

රත්මලාන ශ්‍රී විජයාරාම වාසී

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේයි.**

# NAME OF SPONSOR
## 助印功德主名錄

**Book Title：SRI LANKA PALI BUDDHA JAYANTI TRIPITAKA SERIES,
Volume 29～Volume 44**

**書名：斯里蘭卡巴利文大藏經，第二十九冊～第四十四冊**
**Book Serial No., 書號：SR229～SR244**

**N.T. Dollars：**

321,100：美國淨宗學會, AMITABHA BUDDHIST SOCIETY OF USA
1,213,398：財團法人佛陀教育基金會

**Amount：N.T. Dollars 1,534,498；Print 1,000 sets**
**以上合計，新台幣 1,534,498 元；恭印壹仟套。**

回向：天下和順，日月清明，風雨以時，災厲不起，國豐民安，兵戈無用，崇德興仁，務修禮讓，國無盜賊，無有怨枉，強不凌弱，各得其所。
祝願法界一切有情，所有六道四生，宿世冤親，現世業債，咸憑法力，悉得解脫。
祝願現生者增福延壽，發菩提心，常隨佛學，勤修精進，利濟群生。
祝願已故者往生淨土，同出苦輪，共登覺岸，直證阿鞞跋致，圓滿無上菩提。

**附記：本會接受善信委託，代印經書、佛像，其必要之費用，皆經本會審慎評估；若有結餘，均續作本會之印(購)經書及運費使用，為施主廣積陰德；此印經案所需金額龐大，分四批出版，由本會發起印贈，捐助款項若有不足，則由本會負擔其餘之經費。**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.

Homage to Amita Buddha!

**NAMO AMITABHA**

南無阿彌陀佛

《斯里蘭卡巴利文大藏經 第四十四冊》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website: http://www.budaedu.org

**This book is strictly for free distribution, it is not for sale.**

නොමිලයේ බෙදාදීම පිණිසයි.

Printed in Taiwan

1,000 copies; October 2013

SR244 - 11597